භදන්තාචරිය බුද්ධඝෝෂ ස්ථවිරපාදයන් විසින් විරචිත

පරමත්ථ දීපනී නම් වූ
පඤ්චප්පකරණට්ඨකථා
I

(සිංහල පරිවර්තනය)



ප්‍රකාශනය
බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

පඤ්චපකරණට්ඨකථා පළමුවෙනි කොටස සිංහල පරිවර්තනය

පාලි අට්ඨකථා සිංහලට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉල්ලීම පරිදි, පඤ්චපකරණට්ඨකථා පළමුවෙනි කොටස පරිවර්තනය කරන ලද්දේ බී.එම්.පී. බාලසූරිය මහතා විසිනි.

බාලසූරිය මහතා ප්‍රාචීන පඬිවරයෙකි. ඔහු ප්‍රාචීන භාෂා ශාස්ත්‍ර හදාරන ලද්දේ විද්‍යෝදය පිරිවෙන මඟිනි. විද්‍යෝදය පිරිවෙනේ අවසාන විභාගයත්, ප්‍රාචීන පණ්ඩිත උපාධියත් තරුණ වියේදීම ලබාගත් බාලසූරිය මහතා, නීති විද්‍යාලයට ඇතුළත් වී නීතිඥයකු වශයෙන් ජීවිකා වෘත්තිය ඇරඹීය. බෞද්ධ ආරාමික දේපල සම්බන්ධයෙන් අධිකරණ නීන්දු ඇතුළත් නීති වාර්තා පරිවර්තනය ඒ මහතා ජනින් සිදුවිය. අනුරාධපුර බුද්ධ ශ්‍රාවක හිඤ්ඤු විශ්ව විද්‍යාලයේ සිවිල් නීතිය පිළිබඳ දේශකයකු වශයෙන් ද කලක සිට එතුමා සේවය කරයි.

පාලි අට්ඨකථා සිංහලට පරිවර්තන මණ්ඩලයේ පරිවර්තකයකු වශයෙන් සේවය කරන ඒ මහතාගේ පළමුවන පරිවර්තනය ''විභංගට්ඨ කථා'' වයි. පාලි පද්‍යකරණයේ විශේෂ දක්ෂතාවයක් උසුලන ඒ මහතා පාලි පද්‍ය ග්‍රන්ථ කීපයක් ද ලියා ඇත. බෞද්ධ ආගමික නීතිය නම් පොතද ඒ මහතාගේ කෘතියකි. පාලි-සිංහල පරිවර්තන පමණක් නොව, ඉංග්‍රීසි භාෂා පරිවර්ත-කයකු වශයෙන් ද තේ කටයුතු කරයි. චීන ජෝතිග් ශාස්ත්‍රය එතුමාගේ එවැනි පරිවර්තනයකි. පරිවර්තනයේ පමණක් නොව, දහම් කරුණු නිරවුල්ව විස්තර කිරීමේ දක්ෂතාවයද එතුමා සතුව පවතී.

Vol - xxxviii

භදන්තාචරිය බුද්ධඝෝෂ මහා ස්ථවිර පාදයන් විසින් විරචිත

පරමත්ථදීපනී නම් වූ

පඤ්චපපකරණට්ඨ කථා

(සිංහල පරිවර්තනය)

බුද්ධශාසන අරමුදලේ පූර්ණ අනුග්‍රහයෙනි.

පාලි අට්ඨකථා සිංහල පරිවර්තන - 31

භදන්තාචරිය බුද්ධඝෝෂ මහා ස්ථවිර පාදයන් විසින් විරචිත

පරමත්ථදීපනී නම් වූ

පඤ්චප්පකරණට්ඨ කථා

(සිංහල පරිවර්තනය)

සිංහල පරිවර්තනය

රාජකීය පණ්ඩිත - නීතිඥ

බී.එම්.පී. බාලසූරිය

අධීක්ෂණය

පී.ඇල්.කේ. පෙරේරා

ශාස්ත්‍රපති - තුලනාත්මක වාග් විද්‍යා - (බර්ලින්)

ප්‍රකාශනය

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.

දුරකථන: 2734256 ෆැක්ස්: 21736737

භදන්තාචරිය බුද්ධඝෝෂ මහා ස්ථවිර පාදයන් විසින් විරචිත

පරමත්ථදීපනී නම් වූ

පඤ්චපපකරණට්ඨ කථා

(සිංහල පරිවර්තනය)

ප්‍රථම මුද්‍රණය 2008

I S B N - 978-955-1604-28-8

පරිගණක අකුරුකරණය

උපමාලි කුලසේකර - කටුගස්තොට.

පිටකවරය

සුසිල් ජයශාන්ත පෙරේරා - මහරගම.

මුද්‍රණය

අපිත් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

342, පරණ කැස්බෑව පාර, රත්තනපිටිය, බොරලැස්ගමුව.

දුරකථනය: 0112517269

ප්‍රකාශනය

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.

දුරකථන: 2734256, 2728468, 2726234 ෆැක්ස්: 2736737

විද්‍යුත් තැපෑල: bcc456@sltnet.lk

www.buddhistcc.com

ප්‍රස්තාවනා (අට්ඨකථා)

පාළි භාෂාව මධ්‍යතන ඉන්දු ආර්ය පූර්ව අවධියට අයත් ප්‍රාකෘත විශේෂයක් බවත්, එම ප්‍රාකෘතය වූ කලී එකල උත්තර භාරතයේ ඒ ඒ ප්‍රදේශවල පැවති පොදු ජනයාගේ කථා ව්‍යවහාරය බවත්, පිළිගත් විද්වත් මතයයි. ප්‍රාකෘත ව්‍යවහාරය පොදු ජනතාවගේ හා ශ්‍රමණ සම්ප්‍රදාය ගරු කළ චින්තකයන්ගේ ද භාෂා මාධ්‍යය විය. එය උත්තර භාරතයේ පැතිරී ගිය ඉන්දු යුරෝපීය භාෂා ව්‍යවහාරයෙන් ජනිත වූවක් සේ සැලකිය යුතුය. මෙම ප්‍රාකෘත ව්‍යවහාරයේ ලිඛිත සාධක අනුව මූල අවස්ථාවක් සේ පෙනෙන පාළි භාෂාව උත්තර භාරතයේ කිසියම් විශේෂ ප්‍රදේශයක කථා ව්‍යවහාරයේ මාධ්‍යයක් විය.

1. පාළි භාෂාව ක්‍රි.පූ. 6 වැනි 7 වැනි සියවස්වල කොසොල් රට පැවති කථා ව්‍යවහාරය පදනම් කොට ඇති වූවෙකැයි ද එය නොයෙක් ජනපදවල ජනයාගේ පොදු භාෂා මාධ්‍යය වී යැයි ද මහාචාර්ය රීස් ඩේවිඩ්ස් තුමා පවසයි.

2. පාළිය උජ්ජයිනී ප්‍රදේශයේ භාෂාව යැයි වෙස්ටර් ගාඩ් සහ ඊ කුන් සහ ඔටෝ ප්‍රොන්කේ වැනි විචාරකයෝ පවසති.

3. පාළිය මගධයේ කථා ව්‍යවහාරයයි යන බුද්ධඝෝෂ හිමියන්ගේ මතය මහාචාර්ය ගෙගර් තුමා අනුමත කරයි.

4. බුදුරජාණන් වහන්සේ මුලදී කොසොල් රට බසින් දහම් දෙසන්නට ඇතැයි සලකන වින්ටර්නීට්ස් පාළි ත්‍රිපිටකයේ භාෂාව පැරණි මගධ ව්‍යවහාරය බව පදනම් කොට වෙනත් ප්‍රදේශ ව්‍යවහාරයන්ගේ සම්මිශ්‍රණයද ඇතිව ගොඩනැගුණු බෞද්ධයන්ගේ සාහිත්‍යයික භාෂාවකැයි පවසයි.

5. බුදුන් වහන්සේ ධර්ම ප්‍රචාරයේ යෙදුණු පන්සාළිස් වසින් වැඩි කොටසක් කොසොල් මගධ ප්‍රදේශවල සැරිසැරූ බව බෞද්ධ සාහිත්‍යයේ පෙනෙන බැවින් පාළි භාෂාව කොසොල් මගධ දෙරට

කථා ව්‍යවහාරය පදනම් කොටගෙන බිහි වූවාක් සේ සැලකීමට පුළුවන් බව ඊ කුන් නම් විචාරකයා පෙන්වා දෙයි.

මෙම විග්‍රහයන් ශාස්ත්‍රීය වශයෙන් වැදගත් වන අතර විශේෂයෙන් සැලකිය යුත්තේ බුදුන් වහන්සේගේ මතයයි. බුදුරජාණන් වහන්සේ දක්වා වදාළ ආකල්ප විග්‍රහ වන්නේ මජ්ඣිම නිකායේ අරණ විභංග සූත්‍රයෙනි. මෙම සූත්‍රයෙන් පෙන්වන්නේ උන්වහන්සේ භාෂා මාධ්‍යයෙහි අනවශ්‍ය ලෙස දෑඩිව එල්බ ගත් ශාස්තෘෘවරයෙකු නොවන බවයි. එකම දෙය විවිධ ජනපදවල නාම කීපයකින් හඳුන්වනු ලබන කල ඒ එක නාමයක් දෑඩිව අල්ලා නොගෙන ඒ ඒ ලෙසට ව්‍යවහාර කළ යුතු බවත් ලෝක ව්‍යවහාරය නොඉක්මවිය යුතු බවත් අරණ විභංග සූත්‍රයෙහි උගැන්වෙයි.

බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ත්‍රිපිටකය සංගීත වූ භාෂාව වන පාළි භාෂාව ථේරවාදීන්ගේ ආගමික භාෂාව විය. එය සමස්ත ත්‍රිපිටකය පුරා රැඳී ගියේය. ථේරවාදීන්ගෙන් බිඳී ගිය මහායානිකයෝ බුද්ධ ධර්මය සංස්කෘතයට පෙරළා ගත්හ. ඔවුන්ගේ සංස්කෘත සාහිත්‍යය දියුණුවීමත් මුස්ලිම් ආක්‍රමණ වැනි ආක්‍රමණත් මහායානික දර්ශනය විශ්ව විද්‍යාල මගින් රට මුළුල්ලෙහි බෙදා හැරීමත්, මහායානිකයන් ආමිස පූජා යන්ත්‍ර, මන්ත්‍ර ආදියෙන් පෘථග්ජන ප්‍රසාදය දිනාගැනීමත්, භික්ෂු විනය නීති ලිහිල් ලෙස මහායානිකයන් විසින් සකස් කිරීමත් ආදිය නිසා බුද්ධ ධර්මයත් පාළි භාෂාවත් බුද්ධජන්මභූමියෙන් අතුරුදහන් විය. එය ශ්‍රී ලංකාදීපයේ තහවුරු විය.

හෙළඅටුවා

සම්බුද්ධ පරිනිර්වාණයෙන් දෙසිය පන්තිස් වැන්නෙහි අශෝක අධිරාජයාගේ දායකත්වයෙන් පැලලුප් නුවරදී තුන්වන සංගායනාව පැවැත්විය. මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් රහතන් වහන්සේලා දාහක් සම්බන්ධ වෙමින් මෙම සංගායනාව පවත්වා ඇත. සාහස්සිකා නමින් හඳුන්වන මෙම සංගායනාව නව මසකින් සම්පූර්ණ විය.

තෘතිය සංගායනාවසානයේ දඹදිව ථේරවාදාචරිය පරම්පරාවේ අවසන් පුරුෂයා වූ මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේගේ ශිෂ්‍ය

මිහිඳු මහ රහතන් වහන්සේ විසින් තෘතීය සංගායනාවේදී තෝරා බේරා ගෙන සංග්‍රහ කළ, රේරවාදී ත්‍රිපිටකය ශ්‍රී ලංකාවට ගෙන එන ලදි. මිහිඳු හිමියන් විසින් ලක්දිවට ගෙන එන ලද පාළි ත්‍රිපිටකය මහා අරිට්ඨ රහතන් වහන්සේ ප්‍රමුඛ කොට ඇති සිංහල භික්ෂූන් වහන්සේලා උගත්හ. පාළියෙන් තිබූ ත්‍රිපිටකයේ ගැටලු තැන් සිංහල ජනතාවට පැහැදිළි කර දීම අවශ්‍ය විය. බුද්ධ කාලයේ සිට වාචනා මාර්ගයෙන්, ආචාර්ය පරම්පරා වලින් පැවත ආ අර්ථ විවරණ ක්‍රම මිහිඳු හිමියන්ගෙන් සිංහල භික්ෂූන් වහන්සේලා උගෙන ත්‍රිපිටකයේ ගැටලු තැන් හෙළ බසින් අරුත් විවරණය කළහ. හෙළටුවා නමින් මේවා හඳුන්වයි.

අටුවා වනාහි ත්‍රිපිටකයට අයත් පොත් වලට ලියා ඇති ව්‍යාඛ්‍යාන සංග්‍රහ සමූහයයි. අටුවාවල පරමාර්ථය පෙළෙහි ඇති දුරවබෝධ වචන සහ ධර්මයේ ගැඹුරු තැන් විස්තර කිරීමත් අවශ්‍ය තැන්වලදී විස්තරාර්ථ සැපයීමත්ය. මෙම පරමාර්ථයෙන් ලියන ලද හෙළටුවා නම්,

මහා අට්ඨකථා
කුරුන්දි අට්ඨකථා
පච්චරිය අට්ඨකථා නම් වේ.

හෙළ අටුවා අතුරින් ප්‍රමුඛ ස්ථානය දරුවේ මහා අට්ඨකථාව හෙවත් මූල අට්ඨ කථාවයි. බුද්ධඝෝෂ හිමියන්ගේ අට්ඨ කථා සියල්ලටම පාහේ ශරීරය කරගෙන ඇත්තේ මෙම අටුවාවයි. තුන් පිටකයටම අයත් අට්ඨ කථාවන්හි මහා අට්ඨකථාව ගැන සඳහන් වන බැවින් එය තුන්පිටකයම අළලා සකස් වුනු හෙළටුවාවක් වශයෙන් සැලකිය හැකිය. වස්තු විෂය අතින් සෙසු හෙළටුවාවන්ට වඩා පරිපූර්ණ වී තිබුණ මහා අට්ඨකථාවේ ලක්දිව සිදුවූ දේ පිළිබඳව බොහෝ වෘතාන්ත ද සඳහන්ව තිබුණ බව සිතා ගත හැකිය.

මහා පච්චරිය අට්ඨකථාවට එම නම ලැබුනේ පච්චරියක් හෙවත් පහුරක් උඩදී එය ලියන ලද බැවිනි. කුරුන්දිවේලු විහාරයේදී ලියන ලද හෙයින් කුරුන්දි අටුවා නම් විය.

මෙම ප්‍රධාන හෙළටුවාවන්ට අමතරව තවත් අටුවා කීපයක් දක්නට ඇත. අන්ධ අට්ඨකථාව එයින් එකකි. දකුණු ඉන්දියාවේ කාඤ්චිපුර

(කොන්ජිවරම්) යෙහි පැවති අටුවාවයි. එය ආන්ධ්‍රා භාෂාවෙන් ලියා ඇතැයි සැලකේ.

බුද්ධඝෝෂ හිමි

දඹදිව බෝමැඩට නුදුරු ඝෝෂ නම් ග්‍රාමයේ බමුණු කුලයක උපත ලද බුද්ධඝෝෂ වාදයෙහි දක්ෂ වූ රේවත නම් මහා තෙරපාණන් වෙත පැවිදි වූ බව ප්‍රචලිත මතයයි. බුද්ධඝෝෂ මහාබෝධි මණ්ඩපයට දකුණුදිග බමුණුගම උපන් බව සද්ධම්මසංගහ නම් පොතෙහි සඳහන් වේ. බෝමැඩට නුදුරෙහි ඝෝෂ නම් වූ ගමේ උපන් බව බුද්ධඝෝසුප්පත්ති නම් කථාවේ ද සඳහන් වේ. මෙවැනි විවිධ කරුණු විමංශනයෙන් පසුව බුද්ධඝෝෂ ජන්ම භූමිය මොරණ්ඩඛේටක නම් ගම බව පිළිගෙන ඇත. ආන්ධ්‍ර දේශයේ ගුන්ටූර් දිස්ත්‍රික්කයේ පාල්නාඩ් තලුන් පෙදෙසේ "කෝටනේමලි පුරිගුන්ඩ්ලු පල්ලි" යන ලඟ පිහිටි ගම් දෙක මොරන්ඩඛේටක යැයි පැවසේ. උන්වහන්සේ උපන් පෙදෙස මොරන්ඩඛේටක යැයි විසුද්ධි මග්ගයෙන් පෙනේ. මජ්ඣිමනිකායට්ඨ කථාවේ කර්තෘ සංදර්ශක ගාථාවක මයුර සුත්ත පට්ඨන හෝ මයුර රූප පට්ඨන සඳහන් වන බැවින් එතුමා එහි විසූ බව ද සිතිය හැකිය.

ව්‍යාකරණ විෂයෙහි ද දර්ශන ශාස්ත්‍රයෙහි ද වෛදික ග්‍රන්ථ විෂයෙහි ද ඉතිහාස පුරාවිද්‍යා විෂයෙහිද කාය ව්‍යවච්ඡේද විද්‍යාවන් හීද ලක්ෂණ ශාස්ත්‍රයෙහිද පැතිරී ගිය බුද්ධි ප්‍රභාවයක් එතුමා කෙරෙහි පැවති බව පැහැදිලිය. බුද්ධඝෝෂ හිමියන් ලංකාවට පැමිණීමට පෙර ඤාණෝදය නම් ධර්ම ප්‍රකරණයත් අත්ථසාලිනී අටුවාවත් දඹදිව දී කළ බවද සඳහන්ය. බුද්ධඝෝෂ හිමියන් කලින් සර්වාස්ති වාදියෙකුව සිට පසුව ථේරවාදී වූ බව ඇතැම් විචාරකයන්ගේ පිළිගැනීමයි.

බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට පැමිණියේ අනුරාධපුරය රාජධානිය කරගත් මහානාම රජ දවසය. බුද්ධවර්ෂ 953-975 අතර කාලයේය. උන්වහන්සේ ලංකාවට වඩින විට අට්ඨකථා සංහිතා කීපයක්ම මේ දිවයිනේ පැවති බවත් ඒවා හෙළ බසින්ම උගත් බවත් මෙයින් සමහරක් ග්‍රන්ථ ස්වරූපයෙන්ද සමහරක් පූර්වාචාර්යන්ගේ මතවාද ඇතුලත් වුන සාහිත්‍යය වශයෙන්ද පැවති බවත් ආචාර්ය අදිකාරම් මහතා පවසයි.

මිහිඳු හිමියන් දවසම ආරම්භ වූ සිංහල අටුවා කථා වසර 700ක පමණ කාලයක් සිංහල ත්‍රිපිටකය හෙළි පෙහෙළි කරමින් පැවතියහ. ත්‍රිපිටක පාළියට සිංහල අටුවා ලියා ඇති බව දඹදිව විසූ රේවත හිමියන්ද දැන ගැනීමෙන් සිංහල අටුවා පාළියට පරිවර්තනය කිරීම, බුදුදහම චිරස්ථායී වීමට හේතුවක් යැයි උන්වහන්සේ ද සලකා හෙළටුවා පාළියට පරිවර්තනය කිරීම සඳහා බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට එවන්න ඇතැයි සැලකිය හැකිය.

බුද්ධඝෝෂ හිමියන් මෙහි පැමිණ බුදුන් වදාල දෙලක්ෂ පන්සැත්තෑ දහස් දෙසියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් ඇති ආගමයට තුන්ලක්ෂ එක්සැට්දහස් සත්සියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් පමණ අටුවා කථා ලියා ආගමයෙහි පහන් නැගූ සේකැයි දත යුතු යැයි පූජාවලියේ සඳහන්ව තිබේ.

සංස්කාරකයෙකු හා අනුවාදයකු වශයෙන් බුද්ධඝෝෂ හිමියන්ගේ කාර්යය වූයේ තමන් ඉදිරියෙහි වූ හෙළටුවාවන්හි අන්තර්ගත වූ විවරණ වෙනස් කිරීම නොව, ඒවා සකස් කිරීම සහ අවශ්‍ය ස්ථාන පිඬු කරමින්, අවශ්‍ය ස්ථාන විස්තරාර්ථ දක්වමින්, විධිමත්ව සුගමව පාළි භාෂාවට නැගීමයි. බුද්ධඝෝෂ හිමියන්ට අට්ඨකථා සකස් කරන්නට මහාවිහාරයෙන් ඉඩ ලැබී ඇත්තේ මහාවිහාර වාචනා 'මාර්ගයට විරුද්ධ මත ඒවායේ ඇතුලත් නොවිය යුතුය' යන කොන්දේසිය ද සහිතවය.

"මහා අට්ඨකථාව ශරීරය කොටගෙන මහාපච්චරිය කුරුන්දි ආදී විශ්‍රැතඅර්ථ කථාවන්හි යම් විනිශ්චයක් වේද එහි යුක්තාර්ත සහ ඇතුලත් වන්නා වූ ස්ථවිර වාදයද අත්නොහරිමින් සංවර්ධනය හොඳින් ආරම්භ කරන්නෙමු."

තව ද එම අර්ථ කථාවලින් භාෂාන්තරය පමණක් අත්හැර විස්තර තැන් පිඬුකොට සියලුම විනිශ්චයන් ඇතුලත් කොට කිසිම තන්හි යුත් අත් නොඉක්මවා සංවර්ණනය කරන්නෙමු යි බුදුගොස් හිමියෝ පවසති.

බුද්ධඝෝෂ හිමියන් විසින් කරන ලද අට්ඨකථා සියල්ලම මිහිඳු මාහිමියන් විසින් ලක්දිවට ගෙන එන ලදුව මහා විහාරිකයන් විසින් ආරක්ෂා කරනු ලැබූ හෙළටුවාවන්හි පාළි අනුවාද බවත් මහා අට්ඨකථාවේ සාරය ගෙන පාළි අට්ඨකථා රචිත බවත් මෙම අට්ඨකථාවල සඳහන් වේ.

මේ අනුව බුදුගොස් හිමියන්ගේ කාර්යය වූයේ බුදුසමය පිළිබඳව අමුතුවෙන් පොත් ලිවීම නොව එතෙක් හෙළටුවාවන්හි ආ කරුණු විධිමත්ව හා සුගමව පාළි භාෂාවට නැගීම වෙයි. පාළි අටුවා පොත්වලින් අඩකටත් වඩා සපයා ඇත්තේ බුදුගොස් හිමියන් විසිනි. බෞද්ධ අට්ඨකථාචාරීන් අතුරෙන් එතුමා ශ්‍රේෂ්ඨතමයායි. එතුමාගේ ජීවන චරිතය වටා විවිධ ජනප්‍රවාද ගෙතී ඇත්තේ ඒ නිසාමය. එතුමා මෙලොව පහළ වූයේ බුදුදුන්ගේ පර්යාප්ති ශාසනය දීර්ඝ කාලයක් නිර්මලව පවත්වාගෙන යාම සඳහා පාළි අට්ඨකථා ලිවීමටමය යන ජන ජනප්‍රවාදයක් ද ඇත.

අටුවා විස්තරය

විනය පිටකය

	පෙළ	අටුවාව	කර්තෘ	කාලය
උභය විභංග	1 පාරාජිකා පාළි	1 ආණා දෙසනා	සමන්තපාසාදිකා	බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
	2 පාචිත්තිය පාළි	2 යථාපරාධ සාසන	විනය අට්ඨකථා		
ඛන්ධක	3 චුල්ල වග්ග පාළි	3 සංවරාසංවර කථා			
	4 මහාවග්ග පාළි				
පරිවාර	5 පරිවාර පාළි				
		භික්ඛුපාතිමොක්ඛ කඞ්ඛා විතරණී		බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
		භික්ඛුණී පාතිමොක්ඛ (මාතිකට්ඨ කථා)			

අභිධර්ම පිටකය

1 ධම්මසංගණිප්පකරණ	1 පරමත්ථ දේසනා	අත්ථසාලිනී	බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
2 විභංගප්පකරණ	2 යථාධම්ම සාසන	සම්මොහ විනෝදනී	බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
	3 නාමරූප පරිච්ඡේද කථා			
3 කථාවත්ථුප්පකරණ			බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
4 පුද්ගලපඤ්ඤත්තිප්පකරණ				
5 ධාතුකථාප්පකරණ	පරමත්ථදීපනී			
6 යමකප්පකරණ	පඤ්චප්පකරණට්ඨකථා			
7 පට්ඨානප්පකරණ				

සූත්‍ර පිටකය

1 දීඝනිකාය	1 බොහාරා දේශනා	සුමංගල විලාසිනී	බුද්ධඝෝෂ හිමි 5වන ශ.වි.
2 මජ්ඣිමනිකාය	2 යථානුලෝමසාසන	පපඤ්ච සූදනී	බුද්ධඝෝෂ හිමි 5වන ශ.වි.
3 සංයුක්තනිකාය	3 දිට්ඨි විනිවෙඨන කථා	සාරත්ථප්පකාසිනි	බුද්ධඝෝෂ හිමි 5වන ශ.වි.
4 අංගුත්තරනිකාය		මනෝරථපූරණී	බුද්ධඝෝෂ හිමි 5වන ශ.වි.
5 බුද්දක නිකාය			
1 බුද්දකපාඨ	පරමත්ථ ජෝතිකා		බුද්ධඝෝෂ හිමි 5වන ශ.වි.
2 ධම්මපද	ධම්මපදට්ඨ කථා		බුද්ධඝෝෂ හිමි 5වන ශ.වි.
3 උදාන	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.වි.
4 ඉතිවුත්තක	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.වි.
5 සුත්තනිපාත	පරමත්ථ ජෝතිකා		බුද්ධඝෝෂ හිමි 5වන ශ.වි.
6 විමානවත්ථු	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.වි.
7 පේත වත්ථු	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.වි.
8 ථේර ගාථා	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.වි.
9 ථෙරී ගාථා	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.වි.
10 ජාතක	ජාතකට්ඨකථා		බුද්ධඝෝෂ හිමි 5වන ශ.වි.
11 නිද්දේස (චුල්ල-මහා)	සද්ධම්ම ජෝතිකා		උපසේන ආචාර්ය 6වන ශ.වි.
12 අපදාන (ථේර-ථෙරී)	විසුද්ධ ජන විලාසනී		මහානාම ආචාර්ය 7වන ශ.වි.
13 පටිසම්භිදා මග්ග	සද්ධම්මප්පකාසිනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.වි.
14 බුද්ධවංස	මධුරත්ථප්පකාසිනී		බුද්ධදත්ත හිමි 5වන ශ.වි.
15 චරියාපිටක	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.වි.
	විසුද්ධි මග්ග		බුද්ධඝෝෂ හිමි 5වන ශ.වි.
නෙත්තිප්පකරණ	නෙත්ති අට්ඨකථා		ධර්මපාල ආචාර්ය 5වන ශ.වි.
චතුභාණවාරපාළි	චතුභාණවාර අට්ඨකථා		ආතන්ද වහරතන 8වන ශ.වි.

බුද්ධඝෝෂ හිමියන් විසින් පාළියට නොනගන ලද අට්ඨ කථා පාලියට නගන ලද්දේ බුද්ධදත්ත ධම්මපාල උපසේන සහ මහානාම තෙරවරුන් විසිනි.

බුද්ධදත්ත හිමි

බුද්ධඝෝෂ හිමියන්ගේ සමකාලීනයෙකි. මධුරත්ථ විලාසිනි නම් බුද්ධවංශ අටුවාව උන්වහන්සේ ලියා ඇත.

උපසේන හිමි

සද්ධම්මජෝතිකා නම් නිද්දේශ අට්ඨකථාව මහාපරිවේනවාසී උපසේන හිමියන් විසින් කරන ලදි.

මහානාම හිමි

පටිසම්භිදාමග්ග අට්ඨකථාව වන සද්ධම්මප්පකාසනිය මුන්වහන්සේ විසින් ලියන ලදී.

ධම්මපාල හිමි

පරමත්ථදීපනී අට්ඨකථා - උදාන - ඉතිවුත්තක - විමානවත්ථු - පේතවත්ථු - ථෙර ථෙරී ගාථා අට්ඨකථා මුන්වහන්සේ ලියන ලදී.

මෙම අට්ඨකථාවන් උගෙන ඒවා ආරක්ෂා කළ අය අට්ඨකථීකා නමින් හඳුන්වා ඇත. අට්ඨකථාචරියා යනු අට්ඨකථා සම්පාදනය කළ ආචාර්යවරයෝය. ආචරිය වාද, ආචරිය මත, ආචරිය වාද යන නම්වලින් කියවෙන්නේ අට්ඨකථාවන් මැයි.

අට්ඨකථාවන් පිළිබඳ විවිධ විවේචන හා මතවාද උගතුන් අතර පවතී. මෑතකාලීන වියතුන් අතුරින් අග්ගමහාපණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත හිමියෝ එවැනි විවේචකයෙකි. උන්වහන්සේගේ අටුවා පරීක්ෂණ නම් පොතෙන් එවැනි විවේචන ඉදිරිපත් කර ඇත. අටුවාකථා බුදුන් වහන්සේගේ දේශනා නොවන බව කවුරුත් පිළිගනිති. අටුවාචාරීන් වහන්සේලා අතරද විවිධ මතභේද තිබූ බව දක්නට ඇත. වසර හත්අට සියයක් ගෙන ආ ලිඛිතව නොතිබූ අර්ථ කථා සාහිත්‍යයට එවැනි දේ ඇතුළත් වන්නට පහසුකම් තිබේ. මිහිඳු හිමියන් විසින් ගෙන එන ලද පාළි විවරණ මහාවිහාරික භික්ෂූන් විසින් සිංහලට පරිවර්තනය කොට එම හෙළටුවා පස්වන සියවසේ බුද්ධඝෝෂ හිමියන් විසින් නැවත පාළි භාෂාවට පරිවර්තනය කළ බව පිළිගත් සම්ප්‍රදායයි. මේ තැන්වලදී එම මතිමතාන්තර ඇතුළත් වන්නට ඇති බව සිතිය යුතුය.

මහාවිහාරීය සම්ප්‍රදාය එකකි. අභයගිරි ජේතවන පරම්පරා හිද එවැනි සම්ප්‍රදායන් පැවතුණු බවට සැකයක් නැත. ස්වකීය පාරම්පරික මතවලට පටහැනි සූත්‍ර ධර්මයන් පෙළෙහි ඇති බව දැන දැනත් සිය මතය

තහවුරු කරනු සඳහා ඒවා මදකිනිදු වෙනස් නොකර, ඉවත් නොකර, සංගායනාවලදී පැවති තත්ත්වයෙන්ම ත්‍රිපිටකය රැකගෙන ඒම ගැන මහාවිහාරීය පරම්පරාවට බෞද්ධයාගේ ප්‍රණාම පූර්වක ගෞරවය හිමිවිය යුතුය.

මේ අන්දමින් පැවතගෙන ආ අට්ඨකථා අපේ හාමුදුරුවරු තවත් වර්ෂ සිය ගණනක් තම ආරාමවල පොත්ගුල්වල තබා පුස්තකාලවල තැන්පත්කොට උදේ සවස සුවඳ දුම් අල්ලා ධර්ම ගෞරවයෙන් ධර්ම රත්නය රැකගෙන ආහ. අනගාරික ධර්මපාලතුමාගේ ජාතික ආගමික වැඩපිළිවෙළ ආරම්භ වීමෙන් පසුව එතුමාගේම පවුලේ නෑයන් විසින් අට්ඨකථා මුද්‍රණය කිරීමේ වැඩපිළිවෙළ ආරම්භ කර ඇත. ඒ ධර්මපාලතුමා විසින් ඇතිකරන ලද ආගමික ප්‍රබෝධයේ එක් ආභාසයකි. 1916 ජූලි 05 දින **ත්‍රිපිටක** මුද්‍රණසභා නම් ආයතනයක් සයිමන් ඇලෙක්සැන්ඩර් හේවාවිතාරණ මහතුන්ගේ මැදහත්වීමෙන් කොල්ලුපිටියේ පාම් හවුස්හි පිහිටුවා ඇත. 1929 ජුනි 29 දින මෙම ත්‍රිපිටක සභාවේ රැස්වීමක් කොළඹ ඩික්මන් පාරේ තක්සලාහිදී පවත්වා තිබේ. මෙම රැස්වීමට අති පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල මහා නාහිමියන්ද, රත්මලානේ ශ්‍රී ධම්මානන්ද ධර්මාලෝක නායක හිමියන්ද ප්‍රධාන පණ්ඩිත ධර්මධර භික්ෂූන් වහන්සේලා 25 නමක් සහභාගී වූ බව සඳහන් වේ. අනගාරික ධර්මපාලතුමා ප්‍රධාන සාසනමාමක පිරිස්ද මෙම රැස්වීමට සහභාගී වී ඇත. මෙම නායක පණ්ඩිත ස්වාමීන් වහන්සේලා එක් එක් අටුවා ග්‍රන්ථ සංස්කරණය භාරගත් බවද සඳහන් වේ.

සවිමන් හේවාවිතාරණ මහතාගේ අභාවයෙන් පසුව සෝමලතා හේවාවිතාරණ ළමාතැනී විසින් ත්‍රිපිටක මුද්‍රණය සඳහා අරමුදල පිහිටුවිය. එම අරමුදල මගින් හේවාවිතාරණ අට්ඨකථා ග්‍රන්ථ සමූහය මුද්‍රණය කර ඇත. ආගම ධර්මය, ඉතිහාසය, පුරාවිද්‍යාව, සාහිත්‍යය ආදී ශ්‍රී ලංකා සංස්කරණ විවිධ ක්ෂේත්‍රයන් පර්යේෂණාත්මක අධ්‍යයනවලට යොමු කරමින් ශාස්ත්‍රීය පොතපත සපයා සංස්කෘතිය පිළිබඳව අවබෝධයක් ජනතාවට ලබාදීමේ අරමුණින් 1845 දී ආරම්භ කළ ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ සිංහල අට්ඨකථා සිංහලට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය මගින් පොත් දහයක් මුද්‍රණය කිරීම මහඟු කාර්යයකි.

අභාවයට යන පැරණි බෞද්ධ පොත්පත් හා අලුතින් ලියැවෙන බෞද්ධ පොත්පත් මුද්‍රණය කරවීමත් ඉංග්‍රීසි බෞද්ධ පොත්පත් සිංහලට

පරිවර්තනය කර මුද්‍රණය කිරීමත් පරපුරෙන් පරපුරට බුද්ධ ධර්මය ගෙන යාමත් බෞද්ධ සංස්කෘතියේ ආරක්ෂාවත් සඳහා පිහිටුවා ඇති අප ආයතනය වන බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය මගින් බුද්ධ ජයන්ති ත්‍රිපිටකයේ පුනර්මුද්‍රණය නිමවීමෙන් පසු අට්ඨකථා සිංහලට පරිවර්තනය කොට මුද්‍රණය කිරීමට ප්‍රතිපත්ති සකස් කරන ලදී. සිංහලෙන් මුද්‍රණය අවසන් කොට අටුවා කථා ඉංග්‍රීසියට පරිවර්තනය කර මුද්‍රණය කිරීම අපේ අදහසයි.

"කථා පවත්තිනී" නම් පාඨයක් ත්‍රිපිටකයේ අංගුත්තර නිකායේ සඳහන් වෙයි. ධර්මදේශකයා පෙළත් අටුවාවත් දනී නම් දහම් අසන්නා පෙළත් අටුවාවත් දනී නම් දහම් දෙසන්නාත් අසන්නාත් දෙදෙනාම පෙළත් අටුවාවත් දනිනම් එම ධර්ම දේශනාව සාර්ථක දේශනාවක් වන බව මෙහි සාමාන්‍ය අදහසයි. තථාගත ධර්මය වඩාත් ප්‍රකට වීම විවෘත වීම එහි පැවැත්මට හා උත්තරිතර භාවයට හේතුවන බව සඳහන්ය. මෙම කරුණු පිළිබඳ විමසිලිමත් වනවිට අට්ඨකථා පරිවර්තනයේ හා මුද්‍රණයේ අවශ්‍යතාව වඩාත් පැහැදිලි වන්නේය. එයට අමතරව විශ්ව විද්‍යාලවල පාළි හා බෞද්ධ අධ්‍යයනාංශවල උසස් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන්ට විෂය නිර්දේශානුකූල අට්ඨකථාවල සිංහල පරිවර්තන නොමැතිකමේ බාධාවද, එම ගුරු ශිෂ්‍ය දෙපිරිසටම මේ මගින් දුරු කිරීමද අපේ පරමාර්ථයකි.

අපගේ ඉල්ලීමද පූජ්‍ය රාජකීය පණ්ඩිත වැලමිටියාවේ කුසලධම්ම නාහිමියන්ගේ අනුශාසනාවද අනුව අටුවා කථා සිංහලට පරිවර්තනය කර මුද්‍රණය කරවීමේ භාරදූර කර්තව්‍යය ශ්‍රී ලංකා ජනරජයේ වර්තමාන ආගමික අමාත්‍යාංශය මගින් ඉතාම කෙටි කාලයක් තුළ අවසන් කිරීම සඳහා අපට පවරන ලදි. බුද්ධ ජයන්ති ත්‍රිපිටක පුනර් මුද්‍රණය මගින් අප දැක්වූ ආදර්ශයත් ගොඩනැගූ විශ්වාසයත් මෙයට හේතු වූ බව නිසැකය. මෙම කාර්යය අපට පැවරීම පිළිබඳව ශ්‍රී ලංකා ජනරජයේ ගරු ජනාධිපතිතුමන්ට, ගරු අගමැතිතුමන්ට, ගරු බුද්ධශාසන නියෝජ්‍ය ඇමතිතුමන්ට, ආගමික අමාත්‍යාංශයේ ලේකම් මහතාට සහ අමරඟේවා මද්දුම මහතාට ද අපේ කෘතඥතාවය, පුණ්‍යානුමෝදනාපූර්වකව පළකරමු.

අටුවා පරිවර්තනයේදී ආමිෂ ලාභයම නොව ශාසනික සේවයම සලකා එක් එක් පොත භාරගෙන මැනවින් සිංහලට පරිවර්තනය කරදුන් පණ්ඩිත ස්වාමීන් වහන්සේලාට ද, උගත් ගිහි මහතුන්ට ද අපගේ

කෘතඥතාව හිමිවේ. සිංහල අටුවා පරිවර්තන සමීක්ෂණය කළ උගත් ගිහි පැවිදි දෙපිරිසටම අපගේ කෘතඥතාව හිමිවේ.

අටුවා කථා පරිවර්තන කාර්යය සම්බන්ධීකරණය කරමින් කටයුතු කළේ විජිතනන්ද සරත්චන්ද්‍ර මහතාය. එම ග්‍රන්ථාවලිය මුද්‍රණය කරවීමේ කාර්යය භාරවූයේ අප ආයතනයේ මුද්‍රණ කටයුතු අධ්‍යක්ෂ පාලිත ලියනගේ මහතාටය. මෙම මහත්වරු දෙපළම ඉතා උනන්දුවෙන් මෙම කටයුතුවල නියැලීම පිළිබඳව එම මහත්වරුන්ටද මාගේ කෘතඥතාවය පළවේ. මෙයට අමතරව මෙම කාර්යයට හොඳහිතින් අවංකව සහාය දුන් සියලු දෙනාටම පින් පුරවමින් ආසිරි පතමිහ.

මෙයට,

ශාසනස්ථිතිකාමී,

කිරම විමලජෝති ස්ථවිර,
අධ්‍යක්ෂක, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය,
නැදිමාල, දෙහිවල.

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අට්ඨකථා පරිවර්තක මණ්ඩලය

පූජ්‍ය රාජකීය පණ්ඩිත අම්බලන්ගොඩ ශ්‍රී සුමංගල නායක මාහිම්පාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත යටගම ධම්මපාල අනුනායක මාහිම්පාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත ආදාවල දේවසිරි නායක මාහිම්පාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත තුඹුල්ලේ ධම්මානන්ද නායක මාහිම්පාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත යාලේගම චන්දකිත්ති හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදඋයන්ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත වටගෙදර විමලබුද්ධි හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත විදුරුපොල ආනන්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත හත්තොටුවේ ඉන්දරතන හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පල්ලේගම සමිත හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මාවනානේ සෝමින්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත බලපිටියේ සිරිසීවලී හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත බමුරුගම ධම්මවංස හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදගම්පිටියේ විජිතධම්ම හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පන්නල සුමේධ හිමිපාණන් වහන්සේ

රාජකීය පණ්ඩිත	කීර්ති නාරම්පනාව මහතා
ශාස්ත්‍රවේදී	ඇන්.එච්. පෙරේරා මහතා
පණ්ඩිත	ජේ.පී. නිමල්ලාල් රංජිත් මහතා
පණ්ඩිත	ටී.ජී. ජයතිලක මහතා
පණ්ඩිත	ඒ.ඇම්.ඩී.වයි. සරත්චන්ද්‍ර අමරතුංග මහතා
පණ්ඩිත	බී.ඇම්.පී. බාලසූරිය මහතා
පණ්ඩිත	සෝමරත්න ගම්ලත් වෙලගෙදර මහතා
පණ්ඩිත	දයා ගුණසේකර මහතා
පණ්ඩිත	ඩබ්ලිව්. ඇල්.පී. ධර්මදාස මහතා
පණ්ඩිත	ජිනදාස ගොඩකන්ද මහතා
පණ්ඩිත	ලසිත් නලන්ත මහතා
පණ්ඩිත	පී.ඇල්.කේ. පෙරේරා මහතා

සම්බන්ධීකරණය:- විජිතනන්ද සරත්චන්ද්‍ර මහතා

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අට්ඨකථා පරිවර්තක සමීක්ෂණ මණ්ඩලය

1. පූජ්‍ය මැදගම්පිටියේ විජිතධම්ම හිමිපාණන් වහන්සේ
(ජේරාදෙණිය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය)
2. පූජ්‍ය කොටියාගල උපරතන හිමිපාණන් වහන්සේ
(කැලණිය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය)
3. පූජ්‍ය මැදඋයන්ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ. (ශාස්ත්‍රපති)
4. පූජ්‍ය ඇස්වත්තේ රේවත හිමිපාණන් වහන්සේ. (ශාස්ත්‍රපති)
5. හේමචන්ද්‍ර දිසානායක මහතා. (ශාස්ත්‍රවේදී)
6. පණ්ඩිත දයා ගුණසේකර මහතා (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව)
7. පණ්ඩිත ඒ ලසිත් නලන්ත මහතා (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව)
8. පණ්ඩිත සිරිමෙවන් සේනක මහතා (ශාස්ත්‍රවේදී)
9. අභිධර්මාචාර්ය බුද්ධික විජේසිංහ මහතා (ශාස්ත්‍රවේදී-විද්‍යාවේදී)

සංඥාපනය

විජම් පිටකයේ ධම්මසංගණී, විභංග ප්‍රකරණ දෙක හැර ඉතිරි ධාතුකථා, පුග්ගලපඤ්ඤත්ති, කථාවත්ථු, යමක, පට්ඨාන ප්‍රකරණ, පංචකයේ ලීනාර්ථ විස්තර කිරීම සඳහා බුද්ධඝෝෂ මහා ස්ථවිරපාදයන් වහන්සේ විසින් පාලි භාෂාවට නගන ලද අර්ථ වර්ණනාව (අටුවාව) හඳුන්වා දී තිබෙන්නේ **පරමත්ථ දීපනී** නාමයෙනි. වර්ණනා කිරීම, ප්‍රකට කිරීම, විස්තර කිරීම යන අරුත් 'දීපනී' පදයෙහි ගැබ්ව ඇත්තේය. අභිධම්ම පිටකථා කථා, පඤ්චපකරණට්ඨ කථා නම්වලින් ද මෙම අටුවාව හැඳින්වේ. 'පඤ්චපකරණට්ඨ කථා' යන්න බහුල ව්‍යවහාරයයි. කාණ්ඩ දෙකකින් මුද්‍රිත මෙහි ප්‍රථම භාගයට ධාතුකථා, පුග්ගල පඤ්ඤත්ති, කථාවත්ථු ප්‍රකරණ තුනට ඇතුළත් විස්තර වර්ණනාව වේ. ද්විතීය භාගය ඉතිරි ප්‍රකරණ දෙකේ විස්තර ඇතුළත් වේ. ධම්මසංගණී, විභංග ප්‍රකරණ දෙකට ද පිළිවෙළින් අට්ඨසාලිනී, සම්මොහවිනෝදනී අර්ථ වර්ණනා ද බුදුගොස් හිමියන් විසින්ම සම්පාදනය කරනු ලැබ ඇත. ප්‍රථම භාගයට අයත් ප්‍රකරණ තුනට මෙහි සිංහල පරිවර්තනය සකසන ලදී.

පරමත්ථදීපනියේ ප්‍රථම භාගයට අයත් ප්‍රකරණ තුන සඳහා හැඳින්වීමක් (විශේෂයෙන් කථාවත්ථුව සඳහා) ඒවා සිංහල භාෂාවට පරිවර්තනය කළ වියත් ගණදෙටු නාහිමිවරුන් විසින් කරනු ලැබ ඇති බව ප්‍රකාශ කරමින් එකී ප්‍රකරණ සඳහා පරමත්ථදීපනී අර්ථ වර්ණනාවේ විශේෂ තැන් කීපයක් මෙම සංඥාපනයට ඇතුළත් වේ.

ධාතුකථා ප්‍රකරණයේ මාතිකා වර්ණනාවට ඇතුළත් සංගහ අසංගහ ආදි වශයෙන් මේ ප්‍රකරණය තුදුස් අයුරින් බෙදා දක්වන ලද අතර ඒ සියල්ල උද්දේස නිද්දේස වශයෙන් දෙපරිදි වන අයුරු පෙන්වයි. එය මාතිකා උද්දේසය, තයමාතිකා, අඛහනතර මාතිකා, නයමුඛ මාතිකා, ලකඛණ මාතිකා, බාහිර මාතිකා වශයෙන් පස් ආකාර වේ. ඒවායේ විස්තර පරිවර්තනයේ දී ඇත. සංගහ අසංගහ සම්පයුත්ත විප්පයුත්ත පද සතර පදම් කොට ස්කන්ධාදී ධාතු සම්බන්ධ බෙදීම් විස්තර ධාතු කථාවෙහි ඇතුළත් වේ.

පඤ්ඤත්ති යන වචනය ප්‍රඥප්තිය, පැණවීම, නියමය, ශික්ෂාපදය, ව්‍යවහාරය යනාදි අරුත්වල යෙදේ. මෙහිදී පැණවීම අරුත අභිමත වේ. පෙළෙහි 'බඤ්ඣ'දි පැණවීම් සය ද පෙළ හැර අටුවා නයින් 'විඤ්ඤමාන' පඤ්ඤත්ති ආදි සයද අටුවා හැර ආචාරිය ව්‍යාඛ්‍යාන වශයෙන් 'උපාදාන' පඤ්ඤත්ති ආදි සය ද තවත් ආචරිය ව්‍යාඛ්‍යාන වශයෙන් 'කිචල' පඤ්ඤත්ති ආදි සය ද තවත් ආචරිය ව්‍යාඛ්‍යාන වශයෙන් 'කිචල' පඤ්ඤත්ති ආදි සයද පුගගල පඤ්ඤත්ති මාතිකාව දක්වයි. එකේ සිට පිළිවෙළින් නිද්දේස දහයකින් බෙදා දක්වන විවිධ පුද්ගලයින් තුන්සිය අසූතුන් දෙනෙකු පිළිබඳ විස්තර සංග්‍රහ කිරීම එහි දැක්වේ. අට නවය නිද්දේස අමුතුවෙන් විස්තර නොකොට මුල නිද්දේසවලට සම්බන්ධ කර තිබේ. එක පුද්ගලයාගේ සිට ක්‍රමයෙන් වැඩිවන පුද්ගලයින් දෙදෙනා තුන්දෙනා ආදි වශයෙන් මේ නිද්දේස දහය අංගොතතර සඟියේ මෙන් දක්වා ඇත්තේය.

මෙහි වැඩි වශයෙන් සාකච්ඡාවට බඳුන් වී ඇත්තේ ධ්‍යාන මාර්ග ඵල ක්ෂේත්‍රවලට අයත් පුද්ගලයින් සම්බන්ධයෙනි. ආධ්‍යාත්ම විමුක්තිය අරබයා සිදුකරනු ලබන එම විස්තර නැවත නැවත කියවීමට තරම් ආශ්වාද ජනක වේ. ස්ථවිරවාදය ස්ථාවර වනසේ විස්තර කරන උභතොභාග විමුතත පුද්ගලයා ආදින් පිළිබඳව කෙටි සඳහනක් මෙහි තබමි.

උභතොභාග විමුතත නිද්දේසයෙහි, උභතොභාග විමුතත පුද්ගලයා කොටස් දෙකකින් වාර දෙකකදී මිදීම උභතොභාග විමුතත වේයයි දැක්වේ. මේ සම්බන්ධයෙන් ථෙරවාදයේ අදහස **තිපිටක චූළනාග** මහතෙරුන් සඳහන් කරන්නේ මෙසේය. 'සමාපත්තියෙන් විෂ්කම්භන විමොක්ෂයෙන් එක්වරක් මිදේ. (සෝවාන් ආදි) මාර්ගයෙන් සමුචෙඡද විමොක්ෂයෙන් දෙවෙනිවර මිදේ. **තිපිටක මහා ධම්මරක්ඛිත** මහතෙරහු මෙය නාම නිශ්‍රිතයයි අචචි යථා ආදි ගාථාව පෙන්වා 'නාමකයින් ද රූපකයින් ද මනාව මිදුනේ උභතොභාග විමුතත යයි කීහ. **තිපිටක** චූළාභය මහතෙරහු 'සමාපත්තියෙන් විෂ්කම්භන විමොක්ෂයෙන් එක්වරක් ද මාර්ගයෙන් සමුචෙඡද විමොක්ෂයෙන් එක්වරක් ද මිදුනේ උභතොභාග විමුතත යයි කීහ. මේ මහතෙරහු තිදෙනාම පඬිවරුහයි තිදෙනාගේ වාද සකරුණ යයි වාද තුනම පෙළබසට නගා තැබූහයි

බුදුගොස් හිමියෝ පවසති. එය සංක්ෂේපයෙන් අරූප සමාපත්තියෙන් රූපකායෙන් මිදීම ද මාර්ගයෙන් නාමකායෙන් මිදීම ද උභතොභාග විමුත්ත වේ.

සද්ධානුසාරී නිද්දේසයෙහි සද්ධානුසාරී යනු සෝවාන් මාර්ගයටම නමකි. සෝවාන් පලයට පැමිණියේ ධම්මානුසාරී වේ. මෙය සප්තවිධ ශෛක්ෂයන් සහ පෘථග්ජනයා සම්බන්ධව යෙදෙන ආකාරය මෙහි විස්තර වේ. සද්ධාධුර විඤ්ඤාධුර, සද්ධා විමුත්ත පඤ්ඤා විමුත්ත, කාය සක්ඛි, දිට්ඨිප්පත්ත අවස්ථා සහ ඒවා සද්ධා විඤ්ඤා ධුරවලින් වෙනස්වන ආකාරය සෝවාන් මඟ ඵල ඤාණවලදී පැහැදිලි කරයි. සෝවාන් පුද්ගලයා සත්‍යාවබෝධ සම්පූර්ණ කර රහත්බව ලබනතුරු සිටින එකබීජී, කොලංකොල, සත්තක්ඛත්තුපරම අවස්ථාවල යථා තත්ත්වය මෙහිදී පහදයි.

භයූපරක නිද්දේසයෙහි බියෙන් වෙන්වීම භයූපරත දෙපදයෙහි තේරුම වේ. සප්තවිධ ශෛක්ෂයින් සහ පෘථග්ජනයා බිය වී පවින් වෙන්වෙති. පව් නොකරති. බිය සතරක් දැක්වේ. දුගති, සසර, කෙලෙස්, උපවාද යනුවෙනි. මේ සතරින්ම බියවී පෘථග්ජනයා පව් නොකරයි. සෝවාන් සකෘදාගාමී අනාගාමී තිදෙනා දුගති බිය ඉක්ම වූ නිසා සෙසු තුනෙන් බියවී පවින් වැලකෙති. මාර්ගස්ථ ශෛක්ෂයා පැමිණීම් වශයෙන් හෝ විනාශ නොකළ බියෙන් හෝ භයූපරත වේ. ක්ෂීණාශ්‍රවයන් වහන්සේ මේ එකකින්වත් බිය නොවේ. උපවාද (දෝසාරෝපන) බිය නැතත් උපවාදයෙන් ආරක්ෂාවීම සුදුසු යයි දක්වා (දොණුපපලවාපිගාමෙ) දෝණ උපුල් වැවගම රහතන් වහන්සේ මෙන් යයි පෙන්වා දෙයි.

මෙහිදී කරුණු දෙකක් ගැන අවධානය යොමුකළ මනාය. බියවීම හෝ බියගැන්වීම මානසික වර්ධනයට බාධාවක් වේද යන්න හා තත්කාලීනව වැඩසිටි ආදර්ශ සම්පන්න වූ රහතන් වහන්සේලාගේ චරිත විස්තර ගිලිහී යෑමය. අපේ විහාරස්ථානවල අපාය විස්තර බිතුසිතුවමට නගන ලද්දේ දුගති බිය ඇතිකරනු සඳහා යයි සිතමි. ළමයින් ප්‍රධාන කවරකු තුළ වුවත් බිය ඇතිවීම මානසික වර්ධනය හීනවීමටත් නොයෙක් පසුබටතාවලට බලපාන බවටත් මනෝවිද්‍යාඥයන් ගේ මතයට මෙය පටහැනි වේද? එය එසේ නොවන්නේ මෙහි තමාම ඉන්ද්‍රිය ඤාණයෙන් ලබාගන්නා යථාර්ථයෙන් දුගති ආදි අවස්ථාවලට පත්කරන පසුක්‍රියාවන්

ගෙන් වෙන්වීම මානසික වර්ධනයට කිසිදු බාධාවක් නොවේ. මනෝ විද්‍යාඥයින් පෙන්වා දෙන්නේ තම අවබෝධයෙන් තොරව බාහිරව සිදුකරන බිය මානසික වර්ධනයට බලපාන බවය. මීට වඩා මේ පිළිබඳ විග්‍රහයක යෙදීමට මෙහිදී හැකි නොවේ.

දෙවැන්නා වූ රහත් චරිත පිළිබඳ තොරතුරු ගිලිහී යෑම සංවේගය දනවයි. උපවාදයෙන් වැලකීමට රහතන් වහන්සේගේ පවා චර්යාව සකස්වී තිබුණු ආකාරය ගමේ නමින් පමණක් හඳුන්වා ඇති රහත් චරිතයෙන් පෙන්වා දෙයි. සමහර තැනක ගමේ නම නැතිව ව්‍යවහාර කළ නමින් දක්වා ඇති රහත් චරිත ද මෙහි පෙනේ. සමසඝික නිද්දේසයෙහි දී සමසීසි යයි හඳුන්වන්නේ පෙරපසු නොවී එකවිට යන අර්ථයෙනි. ඉරියාපථ, රෝග, ජීවිත වශයෙන් සමසීසි අවස්ථා තුනක් සඳහන් වන අතර ඉරියාපථ අවස්ථාවේ සක්මන් කරමින් පිරිනිවන්පෑ 'පදුම' නම් රහතන් වහන්සේ සහ හිඳගෙන සිටි විදර්ශනා වඩා රහත්වී හිඳගෙන සිටියදී පිරිනිවන්පෑ කොටපව් වෙහෙර වැසි (කොට පබ්බත විහාරවාසී) තිසස රහතන් වහන්සේ යන දෙනමගේ වෙන කිසිදු විස්තරයක් සඳහන් නොවේ. හෙළටුවාවල මේ චරිත සවිස්තරව සඳහන් වන්නට ඇත.

ගිලානූපම නිද්දේසයෙහි පැවිදි ශිෂ්‍ය, සහෝදරයින් නැති තමාගේ ගිලන්බව නිසා යැපීමට නොහැකි භික්ෂූන් වහන්සේ රැකබලා ගැනීම මහා සංඝයාට පැවරී තිබුණු වගකීමක් ලෙස දක්වා තිබීම අදට වුව වලංගු විය යුතු මානුෂික කාර්යයක් කොට සැලකිය හැකිය. එසේ ගිලන්බවට පැමිණි භික්ෂූන් වහන්සේ කෙනෙකුන් උදෙසා එක් භික්ෂුවක් (වස් දහය නො ඉක්මවූ) හා සාමණේර නමක් උන්වහන්සේට උපස්ථාන කිරීමට අවසර ලබාගෙන මහා සංඝයා වහන්සේ විසින් ලබාදිය යුතුය. ගිලාන හා ඒ දෙදෙනාට අවශ්‍ය සියළු දේ සැපයීම භික්ෂු සංඝයාට භාර කටයුත්තක් විය. එය වඩා තහවුරුවීම සඳහා අටුවා පාඨය මෙහි බහාලමි. 'තඤ්ච ගිලානෙ අත්තනො ධම්මතාය යාපෙතුං අසක්කොනෙත භික්ඛු සංඝෙන තඤ්ච එකො භික්ඛු ච සාමණෙරො ච ඉමං පටිජගකාති අපලොකෙත්වා දාතබ්බා, යාව පන තෙ පටිජගගනති තාව ගිලානසස ච තෙසඤ්ච ජීවිතනං යෙනතෙථා සබ්බං භික්ඛු සංඝසෙස ච භාරො'

පංචක නිද්දේසයේ 'න ආරමහති න විපපටිසාරෝ හොති' පද වර්ණනාවේ ඇවැත්වලට පැමිණ නැති විපිළිසර නැති වීර්ය අත්හැර විදර්ශනා නොවඩා මෛත්‍රී බුදුරජාණන් වහන්සේගේ ශාසනයෙහි නිවන් දැකීමට සිතා සිටින භික්ෂූන් වහන්සේට සංවේග දනවා පෘථග්ජන භාවයේ අනිස්ථිර භාවය පහදා රහත්වීම සඳහා විදර්ශනා භාවනාව වැඩීමට උපදෙස් දීමෙන් පැහැදිළි කරන්නේ, මේ බුද්ධ ශාසනයේ ම නිවන් දැකිය හැකි බවයි. බුදුගොස් හිමියන් ලක්දිව වැඩසිටි සමයේ රහතන් වහන්සේගෙන් අඩුවක් නොවීය. එක් කලෙක රහත් නොවූ එකද භික්ෂූන් වහන්සේ නමක්වත් වැඩ නොසිටියහයි ද සඳහන් වේ. කම්ම, විපාක, කෙලෙස් ආවරණ රහිත පුද්ගලයන්ගෙන් ලෝකය හිස් නොවේ යනු මාගේ හැඟීමය.

චතුක්ක නිද්දේසයෙහි 'රූපපපමාණාදීසු සමපතතියුතතං' පද වර්ණනාවේ ජනයා පහදින කරුණු වශයෙන් රූපය, කීර්තිය, රූක්ෂභාවය, ධර්මය මේ සතර පෙන්වා දී ඒවා සඳහා පැහැදීමේ ප්‍රමාණය ද දක්වයි. සියළු සතුන්ගෙන් තුනෙන් දෙකක් රූපයට පැහැදේ. පහෙන් හතරක් කීර්තියට ද දහයෙන් නවයක් රූක්ෂ ප්‍රතිපදාවට ද ලක්ෂයෙන් එකක් ධර්මයට ද පැහැදේ යයි පෙන්වා දී තිබේ. බුදුන්වහන්සේ මේ කරුණු සතරින් ම පැහැදෙන්නවුන් අතර අග්‍ර පුද්ගලයා වන අතර මේ සතරින් ප්‍රමාණ කරන ලෝකයා මිටින් ගෙන මෙන් වැඩසිටිතියි පෙන්වා දෙයි. අද වුවද පැහැදීමේ තත්වය මීට වඩා වෙනසක් වේයයි සිතිය හැකි නොවේ.

කථාවත්ථුපකරණය සම්බන්ධයෙන් පරමත්ථදීපනී අටුවාව ද ඇසුරුකොට ප්‍රශස්ත හැඳින්වීමක් වියත් පඬිවර ලබුගම ලංකානන්ද නාහිමියන් විසින් බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාවේ කථාවත්ථුපකරණයේ පළමුවන කොටසේ දක්වා තිබේ. අටුවාව සම්බන්ධයෙන් කිවයුතු කරුණු ද එහි අන්තර්ගත නිසා අෂ්ටමුඛ වාද යුක්තිය සහ වාද ක්‍රමය පමණක් මෙහි දී සරලව ඉදිරිපත් කරනු ලැබේ. පරමත්ථදීපනී අටුවා නිදාන කථාවෙහි

පුග්ගල වාදෙ තාව චතූසු පඤ්හෙසු දට්ඨනං
පඤ්චකානං වසෙන අට්ඨමුඛවාදයුත්ති

පුද්ගල වාදයේ
ප්‍රශ්න සතරෙහිඃ-

1. පරමාර්ථ වශයෙන් පුද්ගලයකු ලැබේද?
2. හැම තැනම පරමාර්ථ වශයෙන් පුද්ගලයකු ලැබේද?
3. හැමදා පරමාර්ථ වශයෙන් පුද්ගලයකු ලැබේද?
4. හැම විෂයකම පරමාර්ථ වශයෙන් පුද්ගලයකු ලැබේද?

1. පරමාර්ථ වශයෙන් පුද්ගලයකු නොලැබේද?
2. හැමතැනම පරමාර්ථ වශයෙන් පුද්ගලයකු නොලැබේද?
3. හැමදා පරමාර්ථ වශයෙන් පුද්ගලයකු නොලැබේද?
4. හැම විෂයකම පරමාර්ථ වශයෙන් පුද්ගලයකු නොලැබේද?

හැමතැනම - සෑම ශරීරයකම
හැමදා - සියළු කාලවලම
හැම විෂයකම - සියලු විෂයවල එනම්,
ස්කන්ධ, ආයතන, ධාතු, ඉන්ද්‍රිය

5. ස්කන්ධ - රූප, වේදනා, සඤ්ඤා සංඛාර විඤ්ඤාණ

12 ආයතන

ආයතන -	චක්ඛු	සොත	ඝාන	ජිවහා	කාය	මන
	රූප	සද්ද	ගන්ධ	රස	පොට්ඨබ්බ	ධම්ම

18 ධාතු

චක්ඛු	රූප	චක්ඛු	විඤ්ඤාණ
සොත	සද්ද	සොත	විඤ්ඤාණ
ඝාණ	ගන්ධ	ඝාන	විඤ්ඤාණ
ජිවහා	රස	ජිවහා	විඤ්ඤාණ
කාය	පොට්ඨබ්බ	කාය	විඤ්ඤාණ
මනො	ධම්ම	මනො	විඤ්ඤාණ

22 ඉන්ද්‍රිය චක්ඛු සොත ඝාන ජිව්හා කාය මන ඉත්ථී
පුරිස ජීවිත සුඛ දුක්ඛ සොමනසස දොමනසස
උපෙක්ඛා සද්ධා විරිය සති සමාධි පඤ්ඤා
අනඤ්ඤතඤ්ඤාමීති අඤ්ඤා අනඤ්ඤදථා

දවිතතං පංචකානං

මෙහි සුද්ධ සචචකථාය පමණක් දැක්වේ. එහි අනුලෝම පචචතික පංචකය, පචචනිකානු ලොම පංචකය යයි පංචක දෙකක් වේ.

පළමුවැන්න	දෙවැන්න
අනුලෝම පචචනත පංචය	පචචනික අනුලෝම පංචකය
පටිකම්ම චතුක්කය	පටිකම්ම චතුක්කය
නිගහ චතුක්කය	නිගහ චතුක්කය
උපනයන චතුක්කය	උපනයන චතුක්කය
නිගමන චතුක්කය	නිගමන චතුක්කය

ඉහත කී පරමාර්ථ වශයෙන් පුද්ගලයකු ලැබේද නොලැබේද යන ප්‍රශ්න කොටස් දෙකෙහි එක ප්‍රශ්නයක එක බැගින් නිගයහ අටක් ලැබේ. ඒ අට අටයිමුබ වාදයුතනි වේ. පාළියෙහි අටයක නිගහ යයි හඳුන්වයි.

වාද ක්‍රමය - ඨපනා පාපනා ආරෝපනා

ඨපනා - විරුද්ධ මතය බිඳීමට ඉදිරිපත් කරන ප්‍රධාන තර්ක අංශය
පාපනා - ඨපනාවෙන් ලැබෙන ඵලය
ආරෝපන - ප්‍රතිවාදින් මත නැගෙන නිග්‍රහ පරාජය

යට සඳහන් කළ ප්‍රශ්න කොටස් දෙක වෙන් වෙන්ව දැක්වූයේ තේරුම් ගැනීමේ පහසුව සඳහාය. එහෙත් වාදයේදී එකට යෙදෙන ආකාරය පුද්ගල වාදයෙන් ම මෙස් පෙන්වා දිය හැකිය.

සකවාදියා පුචඡා - සත්‍යාර්ථ පරමාර්ථ වශයෙන් පුද්ගලයෙක් ලැබේද?
පරවාදියා පටික්ඛා - එසේය (ඔව්)
පර පටිකෙඛන - එසේ නොකිව යුතුය (නැත)
සක නිගගහය - නිග්‍රහය පිළිගන්න

අනුලෝම ඵපනා - පරමාර්ථ වශයෙන් පුද්ගලයකු ලැබේ නම්
අනු ඵපනා - ස්කන්ධ ආදි පරමාර්ථ ධර්ම වශයෙන් ඒ පුද්ගලයා ලැබෙන බව කිවයුතුය.
අනු ආරොචනා - පරමාර්ථ වශයෙන් ඒ පුද්ගලයා දන්නා ලැබේ යයි කිවයුතු යයි ද ස්කන්ධාදි පරමාර්ථ වේද, ඒ පරමාර්ථ වශයෙන් ඒ පුද්ගලයා දන්නා ලැබේ යයි නොකිවයුතු යයි ද ඔබ කියනවා නම් එය ඔබේ මිථ්‍යාවක්.

පටිලෝම ඵපනා - ස්කන්ධාදි පරමාර්ථ ධර්ම වේද, ඒ පරමාර්ථ ධර්ම වශයෙන් පුද්ගලයා දන්නා ලැබේ යයි නොකිව යුතු වේ නම් පරමාර්ථ වශයෙන් ඒ පුද්ගලයා දන්නා ලැබේ යයි නොකිව යුතුමය.

පටි පාපනා - පරමාර්ථ වශයෙන් පුද්ගලයා දන්නා ලැබේ යයිද.

පටි ආරෝපන - ස්කන්ධාදි පරමාර්ථ වේද, ඒ පරමාර්ථ මෙන් පුද්ගලයා දන්නා ලැබේ යයි නොකිවයුතු වේ යයි ද ඔබ කීවේ නම් එය මිථ්‍යාවකි.

අනුලෝම පංචකයයි.

මේ අනුව පටිකම්ම චතුකකය, නිගගහ චතුක්කය, උපනයන චතුකකය, නිගමන චතුක්කය සහ පචචතත පංචකය ද අවබෝධ කරගැනීමට අපහසු නොවේ යයි සිතමි.

පුගගල කථා වණණනාවේ සිට අපරිනිපපතත කථා වර්ණනාව දක්වා කථා වණණනා දෙසි තුදුසකින් පරිමිත කථාවසතු වණණනාවේ ථෙරවාදයට පටහැනි නිකායාන්තර ලබ්ධි ථෙරවාදී සූත්‍ර පදනම්කොට වාදයුක්ති මගින් බැහැර කරන අයුරු පෙනේ.

තත්කාලීන සමාජයේ ශාස්ත්‍රීය අධ්‍යාපනය මෙන්ම තාක්ෂණික අධ්‍යාපනය ද උසස් මට්ටමකින් පැවති බවට 'විජ්ජටඨානසපපායතනානි' පැහැදිලි කරයි.

බී.එම්.පී. බාලසූරිය

නො. 12,
කුලියාපිටිය පාර,
හෙට්ටිපොල.
දූ.ක. 037-2291175

පටුන

පිටු අංකය

ධාතු කථා වර්ණනා 1-22

මාතෘකා වර්ණනාව 1
අභ්‍යන්තර මාතෘකා 3
සංග්‍රහ අසංග්‍රහ පද 4
සංගෘහිතයෙන් අසංගෘහිත පද 7
අසංගෘහිතයෙන් සංගෘහිත පද 9
සංගෘහිතයෙන් සංගෘහිත පද 11
අසංගෘහිතයෙන් අසංගෘහිත පද 12
සම්ප්‍රයෝග විප්‍රයෝග පද 13
සම්ප්‍රයුක්තයෙන් විප්‍රයුක්ත පද 16
විප්‍රයුක්තයෙන් සම්ප්‍රයුක්ත පද 17
සම්ප්‍රයුක්තයෙන් සම්ප්‍රයුක්ත පද 18
විප්‍රයුක්තයෙන් විප්‍රයුක්ත පද 19
සංගෘහිතයෙන් සම්ප්‍රයුක්ත විප්‍රයුක්ත පද 19
සම්ප්‍රයුක්තයෙන් සංගෘහිත අසංගෘහිත පද 20
අසංගෘහිතයෙන් සම්ප්‍රයුක්ත විප්‍රයුක්ත පද 20
විප්‍රයුක්තයෙන් සංගෘහිත අසංගෘහිත පද 21

පුගල පඤ්ඤත්ති වර්ණනා

ඒකක නිද්දේසය 22-92
පුගල පඤ්ඤත්ති මාතෘකා 22
පළමුවන නිර්දේශය 27
දෙවැනි නිර්දේශය 48
තුන්වැනි නිර්දේශය 51
හතරවැනි නිර්දේශය 64
පස්වැනි නිර්දේශය 85
හයවැනි නිර්දේශය 89

හත්වැනි නිර්දේශය 89
දසවැනි නිර්දේශය 91

කථා වත්‍ථුපකරණ වර්ණනා

මහා වර්ගය
නිදාන කථාව 92
පුද්ගල කථා 98
පරිහානි කථා 122
බ්‍රහ්මචරිය කථා 126
ඕදිස කථා 128
ජහති කථා 129
සබ්බමත්‍ථි කථා 130
අතීත ඛන්ධාදි කථා 135
ඒකච්චං අත්‍ථීති කථා 136
සතිපට්ඨාන කථා 137
හෙවත්‍ථි කථා 138

දෙවෙනි වර්ගය
පරූපහාර කථා 139
අඤ්ඤාණ කංඛා කථා 139
වචී භේද කථා 140
දුක්ඛහාර කථා 141
චිත්තට්ඨිති කථා 141
කුක්කුළ කථා 142
අනුපුබ්බානි කථා 142
වොහාර කථා 144
නිරෝධ කථා 144

තුන්වැනි වර්ගය
බල කථා 145
අරියනති කථා 147
විමුත්‍තති කථා 148

විමුචචමාන කථා 148
අධ්‍යමක කථා 150
අධ්‍යමක ඉන්ද්‍රිය කථා 150
දිබ්බ චකඛු කථා 151
දිබ්බසොත කථා 152
යථා කම්මූපත ඤාණ කථා 152
සංවර කථා 153
අසඤ්ඤ කථා 154
නේවසඤ්ඤා නාසඤ්ඤායතන කථා 154

හතරවැනි වර්ගය
ගිහිසස අරහාති කථා 154
උප්පත්ති කථා 155
අනාසව කථා 155
සමනනාගත කථා 156
උපෙකඛා සමනනාගත කථා 157
බෝධියා බුදෙධාති කථා 157
ලකඛණ කථා 158
නියා මොකකනති කථා 159
අපරාසි සමන්නාගත කථා 159
සංයෝජන පහාන කථා 160

පස්වැනි වර්ගය
විමුක්ති කථා 160
අසෙකඛ කථා 161
විපරීත කථා 161
නියාමක කථා 162
පටිසම්භිදා කථා 163
සම්මුති ඤාණ කථා 164
චිත්තාරම්මණ කථා 165
පචචුපපනන ඤාණ කථා 165
එලෙ ඤාණ කථා 166

හයවැනි වර්ගය

නියාම කථා 167
පටිච්ච සමුත්පාද කථා 168
සච්ච කථා 168
ආරුප්ප කථා 169
නිරෝධ සමාපත්ති කථා 169
ආකාස කථා 170
ආකාස සනිදස්සන කථා 170
පඨවි ධාතු ධාතු 171

සත්වැනි වර්ගය

සංගෘහිත කථා 171
සම්පයුත්ත කථා 172
චෛතසික කථා 172
දාන කථා 172
පරිභෝගමය පුඤ්ඤ කථා 174
ඉතොදින්න කථා 175
පඨවි කම්ම විපාක කථා 176
ජරාමරණ විපාක කථා 177
අරිය ධම්ම විපාක කථා 178
විපාක ස්වභාව ධර්ම කථා 178

අටවැනි වර්ගය

ගති කථා 179
අන්තරාභව කථා 180
කාම ගුණ කථා 182
කාම කථා 183
රූප ධාතු කථා 183
අරූප ධාතු කථා 183
රූප ධාතු ආයතන කථා 184
ආරුපෙප රූප කථා 184
රූපං කම්මනති කථා 185

ජීවිතින්ද්‍රිය කථා 185
කම්ම හේතු කථා 187

නවවැනි වර්ගය
ආනිසංස කථා 187
අමතාරම්මණ කථා 188
රූපං සාරමනති කථා 189
අනුසයා අනාරම්මණාති කථා 189
ඤාණ අනාරම්මණ කථා 190
අතීතාරම්මණ කථා 190
විතක්කූපාදානුපත්ති කථා 190
විතකක විපඵාර සද්ද කථා 191
නයථා චිත්තසස වාචාති කථා 191
නයථා චිත්තසස කාය කම්මනති කථා 192
අතීතානාගත සමනනාගත කථා 192

දහවැනි වර්ගය
නිරෝධ කථා 193
රූප මගෙගාති කථා 193
පඤ්ච විඤ්ඤාණ මගගකථා 194
පඤ්ච විඤ්ඤාණ කුසලාපීති කථා 195
පංච විඤ්ඤාණ සාභොගාති කථා 196
ද්වීහි සීලෙහි කථා 196
සීලං අචෙතසිකනති කථා 197
සීලං න චිත්තානු පරිවත්තී කථා 197
හේතු සමාදාන හේතු කථා 197
විඤ්ඤත්ති සීලනති කථා 197
අවිඤ්ඤත්ති දූසසීල්‍යනති කථා 198

තෙවැනි පණ්ණාසකය.

එකොළොස්වැනි වර්ගය
තිසෙසා අනුසය කථා 198
ඤාණ කථා 199
ඤාණ චිත්ත විප්පයුත්ත කථා 199
ඉදං දුක්ඛනති කථා 200
ඉද්ධි බල කථා 200
සමාධි කථා 201
ධම්මට්ඨිතතා කථා 202
අනිච්චතා කථා 202

දොළොස්වැනි වර්ගය
සංවරෝ සම්මනති කථා 203
කම්ම කථා 203
සදෙදා විපාකොති කථා 204
සළායතන කථා 204
සත්තකඛත්තු පරම කථා 205
ජීවිතා පරම කථා 205
ජීවිතා වොරොපන කථා 206
දුගති කථා 206

දහතුන්වැනි වර්ගය
කපපටඨ කථා 207
කුසලචිත්ත කථා 207
අනන්තරාපයුත්ත කථා 208
නියාම කථා 209
නිවුත කථා 210
සම්මුඛී භූත කථා 210
ආශ්වාදන කථා 210
අසාතරාග කථා 211
ධම්ම තණ්හා අබ්‍යාකතා කථා 211
ධම්ම තණ්හා න දුක්ඛ සමුදය කථා

තුදුස්වැනි වර්ගය

කුසලාකුසල පටිසන්ධාන කථා 212
සළායතන උත්පත්ති කථා 213
අනන්තර පච්චය කථා 213
අරිය රූප කථා 214
අක්ඛණා අනුසයෝ කථා 214
පරියුට්ඨාන චිත්ත විප්පයුත්ති කථා 215
පරියාපන්න කථා 215
අබ්‍යාකත කථා 216
අපරියාපනන කථා 216

පසළොස්වැනි වර්ගය

පච්චය කථා 217
අඤ්ඤමඤ්ඤ පච්චය කථා 217
අද්ධා කථා 218
ඛණ ලය මුහුත්ත කථා 218
ආසව කථා 218
ජරා මරණ කථා 219
සඤ්ඤා වෙදයිත කථා 219
දුතිය සඤ්ඤා වෙදයිත කථා 219
තතිය සඤ්ඤා වෙදයිත කථා 220
අසඤ්ඤ සත්තූ පිකා කථා 220
කම්මූපචය කථා 221

සිව්වන පණ්ණාසකය.

සොළොස්වැනි වර්ගය

නිගණ්ඨ කථා 222
සුබානුපපදාන කථා 222
අධිගයහ මනසිකාර කථා 223
රූපං හෙතුනි කථා 224
රූපං කුසලා කුසලනති කථා 224

රූපං රූපාවචරං අරූපාවචරනති කථා 225
අරූප ධාතු පරියාපෙනති කථා 225

සතළොස්වැනි වර්ගය
අත්ථි අරහතො පුඤ්ඤූපචය කථා 225
නත්ථි අරහතො අකාලමරණ කථා 226
සබබමිදං කම්මතොනි කථා 227
ඉන්ද්‍රියබද්ධ කථා 228
ඨපෙත්වා අරිය මගගනති කථා 229
න වත්තබබා සංඝො දකඛිණං පතිගණ්හනති කථා 229
න වත්තබබං සංඝො දකඛිණං විසොධෙති කථා 230
න වත්තබබං සංඝො භුඤ්ජති කථා 230
න වත්තබබං සංඝසස දිනනං මහප්ඵලනති කථා 231
න වත්තබබං බුදධසස දිනනං මහප්ඵලනති කථා 231
දකඛිණ විසුද්ධි කථා 231

අටළොස්වැනි වර්ගය
මනුසස ලෝක කථා 232
ධම්මදෙසනා කථා 233
කරුණා කථා 233
ගන්ධ ජාත කථා 233
එක මගග කථා 234
ඣාන සංකනති කථා 234
ඣානනනතරික කථා 235
සමාපනන සදදං සුණාතීති කථා 236
චක්ඛුනා රූපං පසසතීති කථා 236

එකුන්විසි වර්ගය
කිලෙස ජහන කථා 237
සුඤ්ඤතා කථා 238
සාමඤ්ඤඵල කථා 238
පත්ති කථා 239

තථතා කථා 239
කුසල කථා 239
අචචනත නියම කථා 240
ඉන්‍ද්‍රිය කථා 241

විසිවැනි වර්ගය
අසඤ්ඤිච්ච කථා 241
ඤාණ කථා 242
නිරයපාල කථා 243
තිරච්ඡානගත කථා 243
මගග කථා 244
ඤාණ කථා 245

පස්වැනි පණ්ණාසකය.

විසිඑක්වැනි වර්ගය
සාසන කථා 245
අවිචිතත කථා 246
සඤ්ඤාජන කථා 246
ඉද්ධි කථා 246
බුද්ධ කථා 247
ධමම කථා 248
කමම කථා 248

විසිදෙවැනි වර්ගය
පරිනිබ්බාන කථා 249
කුසල චිතත කථා 249
ආනෙඤ්ජ කථා 250
ධම්මාභිසමය කථා 250
ආසෙවන පච්චය කථා 250
ඛණ්ඩික කථා 251

විසිතුන්වැනි වර්ගය

ඒකාධිපපාය කථා 251
අරහතත වණ්ණ කථා 252
ඉසසරිය කාම කාරිතා කථා 252
රාග පතිරූපකාදි කථා 252
අපරිනිපඵනන කථා 253

පරමත්ථදීපනී නම් වූ
පංචපකරණට්ඨ කථාව

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

ඒ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට
නමස්කාරය වේවා !

අටලොස් වැදෑරුම් - මර බිඳුම්වත විභඟය
මහවිරු මුනිසඳහු - දෙසා ඉන් අනතුරුවම

දෙසූ දා කතා නම් - පැවසෙන දාතු බේදය
එහි අරුත් පවසමි - එය'සනු සන්සුන් සිතින්

සංග්‍රහ අසංග්‍රහ යනාදි වශයෙන් මේ ප්‍රකරණය තුදුස් විදියකින් බෙදන ලදැයි කියන ලදී. ඒ සියල්ලම උද්දේස නිද්දේස වශයෙන් දෙයාකාරයකින් පවතී. එහි මාතෘකා උද්දේසය නය මාතෘකා, අභ්‍යන්තර මාතෘකා, නයමුඛ මාතෘකා ලක්ෂණ මාතිකා, බාහිර මාතිකා යයි එය පස්වැදෑරුම් වේ. එහි **සංගහ අසංගහෝ** -පෙ- **විපපයුතෙනන සංගහිත අසංගහිතං** යයි පද තුදුසකින් තබන ලද මෙය නය මාතෘකා නම් වේ. මෙය වනාහි මේ සංග්‍රහාදි නයින් ධාතුකථා ධර්ම බෙදන ලදැයි දැක්වීමට තබන ලද්දේ නය මාතෘකා යයි කියනු ලැබේ. මේ පදවලට මුල්වූ හෙයින් මුල් මාතෘකා යයි කීමට ද වටී.

පඤ්චකඛන්ධා -පෙ- මනසිකාරෝ යන පද එකසිය විසිපහකින් තබන ලද්දේ අභ්‍යන්තර මාතෘකා නම් වේ. මේ සියල්ල ද ධම්ම සංගණී ධාතු කථාවේ මාතෘකා යයි මෙසේ නොකියා සංග්‍රහ ආදි නයින් බෙදූ ස්කන්ධාදි ධර්මයන් ස්වරූපයෙන් දක්වා ධාතුකථාවේ අභ්‍යන්තරයේම තබන ලද හෙයින් අභ්‍යන්තර මාතෘකා යයි කියනු ලැබේ.

ස්කන්ධාදී පද ධම්ම සංගණී මාතෘකාවේ සංග්‍රහ නොවූ බැවින් ප්‍රකීර්ණක මාතෘකා යයි ද කීමට වටී.

නීහි සංගහෝ නීහි අසංගහෝ චතූහි සම්පයොගෝ චතූහි විපපයොගෝ යන මේ පද සතරින් තබන ලද බැවින් නය මුඛ මාතෘකා නම් වේ. මෙය වනාහි සියළුම පංචස්කන්ධාදියෙහි මෙන්ම කුසල ත්‍රිකාදියෙහි ද මාතෘකා ධර්මවල ස්කන්ධ ධාතු ආයතන පද තුනෙන්ම සංග්‍රහ අසංග්‍රහය ද යෙදිය යුතුය. එසේම සතර අරූපස්කන්ධවලින් සම්ප්‍රයෝග විප්‍රයෝගය ද යෙදිය යුතුය. මේවා මේ සංග්‍රහාදි නයවල මුඛ යයි දැක්වීමට තබන ලද බැවින් නයමුඛ මාතෘකා යට කියනු ලැබේ.

සහාග විසහාග දෙපදයෙන් තබන ලද්දේ ලක්ෂණ මාතෘකා නම් වේ. මෙය වනාහි සහාග ලක්ෂණ ධර්මවලින් සංග්‍රහ නය වේ. විසහාග ලක්ෂණවලින් අසංග්‍රහ නය වේ. එසේම සම්ප්‍රයෝග විප්‍රයෝග නය ද යෙදිය යුතු වේ. සහාග විසහාග ලක්ෂණ වශයෙන් සංග්‍රහාදි ලක්ෂණ දැක්වීමට තබන ලද බැවින් ලක්ෂණ මාතෘකා යයි කියනු ලැබේ. **සබ්බාපි ධම්මසංගණී ධාතුකථාය මාතිකා** යන මේ සසැටක් වූ තික පද මෙන්ම සියයක් වූ දුක පද ද හකුළුවා තබන ලද බැවින් බාහිර මාතෘකා නම් වේ. මෙය වනාහි පඤ්චකඛන්ධා -පෙ- මනසිකාරෝ යන මෙසේ ධාතු කථාවේ ඇතුළත නොකියා සබ්බාපි ධම්මසංගණී යන ධාතුකථාවේ මාතෘකාවලින් බාහිරව තබන ලද බැවින් බාහිර මාතෘකා යයි කියනු ලැබේ. මෙසේ මාතෘකාවෙහි පස් අයුරකින් සිටි බව දැන, දැන සංග්‍රහ අසංග්‍රහ යනාදියෙහි පළමුව සංග්‍රහය ජාති, සඤ්ජාති, ක්‍රියා, ගණන වශයෙන් සතරාකාර වේ.

එහි, සියළු ක්ෂත්‍රියෝ පැමිණෙත්වා. සියළු බ්‍රාහ්මණයෝ සියළු වෛශ්‍යයෝ, සියළු ශූද්‍රයෝ පැමිණෙත්වා. විසාඛ! යම් සම්‍යක් වචනයක්, සම්‍යක් කර්මාන්තයක්, සම්‍යක් ආජීවයක් වේද, ඒ සියල්ල සීල ස්කන්ධයෙහි

සංග්‍රහ වේ යන මෙය ජාති සංග්‍රහ නම් වේ. එක් ජාතියක් පැමිණේවා කියූ තැන මෙන් මෙහි සියළු ජාතිහු එක් සංග්‍රහයකට ඇතුළත් වූහ.

සියළු කොසොල් රටවැස්සෝ පැමිණෙත්වා, සියළු මගධ රටවැසියෝ පැමිණෙත්වා. සියළු භෘගුකච්ඡවාසීහු පැමිණෙත්වා. විසාඛ! යම් සමෘක් ව්‍යායාමයක්, සිහියක්, එකඟකමක් වේද, ඒ සියල්ල සමාධි ස්කන්ධයෙහි සංග්‍රහ වේය යන මෙය සඤ්ජාති සංග්‍රහ නම් වේ. එක් ස්ථානයක ඉපදුණු වැඩුණු තැනැත්තෝ පැමිණෙත්වා කියූ තැන මෙන් මෙහි හටගත් තැනින් විසූ තැනින් එක් සංග්‍රහයකට පැමිණියේය. සියළු ඇතරුවෝ පැමිණෙත්වා. සියළු අසරුවෝ පැමිණෙත්වා. සියළු රියරුවෝ පැමිණෙත්වා. විසාඛ, යම් සම්මා දිට්ඨියක්, සම්මා සංකප්පයක් වේද, මේ ධර්ම ප්‍රඥා ස්කන්ධයෙහි සංග්‍රහ වේය යන මෙය ක්‍රියා සංග්‍රහ නම් වේ. සියල්ලෝම තමාගේ ක්‍රියා කිරීමෙන් එක් සංග්‍රහයකට පැමිණියහ. චක්ඛු ආයතනය කුමන ස්කන්ධයට අයත්ද? චක්ඛු ආයතනය රූපස්කන්ධයට අයත්ය. ඒ නිසා චක්ඛු ආයතනය රූපස්කන්ධයෙහි සංග්‍රහ වේයයි කිවයුතු මෙය ගණන සංග්‍රහ නම් වේ. මෙය මෙහි අභිප්‍රේතය. ඊට ප්‍රතිපක්ෂ වශයෙන් අසංග්‍රහය දැනගත යුතුය. සංග්‍රහ කිරීමෙන් අසංග්‍රහාදිය ඒවායේ විකල්ප වශයෙන් දතයුතුය. එකට ඉපදීම, නිරුද්ධවීම, එක් වස්තුවක හා අරමුණක පැවතීම වශයෙන් සම්ප්‍රයෝගය වේ. ඊට ප්‍රතිපක්ෂ වශයෙන් විප්‍රයෝගය වේ. සම්ප්‍රයුක්තයෙන් විප්‍රයුක්තාදිය ඒවායේ විකල්ප වශයෙන් වේ. පංචස්කන්ධාදි ස්කන්ධ විභංගවල කියන ලද නයින්ම දතයුතුය. මෙහි ස්පර්ශ ආදිය වනාහි නිශ්චය වශයෙන් කියන ලද සියළු චිත්තුපපාද සාධාරණ ලෙස කියන ලදී.

මාතෘකා වර්ණනාව නිමා විය.

දැන් පංචස්කන්ධාදි වශයෙන් තබන ලද මාතෘකාව සංගහ අසංගහ ආදියෙන් නය මාතෘකා පද සමග දැක්වීමට **රූපකබන්ධො කතිහි බන්ධෙහි** යනාදි නයින් නිද්දේසවාරය අරඹන ලදී. එය එහි **සංගහො අසංගහො** යන නය මාතෘකා මුල්කොට කීය. **සංගහො තීහි අසංගහො** යන නය මුඛ මාතෘකා යම්සේ තබන ලදද, එහෙයින් රූපස්කන්ධාදියේ සංග්‍රහය

දැක්වීමට කතිහි බන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතුහි යන **ස්කන්ධ** ධාතු ආයතන පද තුන උපුටන ලදී. **චතසාරි සච්චානි** යනාදියෙහි එකකුදු පරාමර්ශනය නො කරන ලදී. **සභාගො විසභාගො** යන ලක්ෂණ මාත්‍රකා යම්සේ තබන ලද ද එහෙයින් මේ ප්‍රශ්නය විසඳීමෙහි **රූපකබන්ධො එකෙන බන්ධෙන** යනාදිය කියන ලදී. ඒවායේ සභාග වනාහි මේ ස්කන්ධාදියයි.

එහි **එකෙන බන්ධෙන** යනු රූපස්කන්ධයම වේ. යම්කිසි රූපයක් රූපස්කන්ධයට සභාග බැවින් රූපස්කන්ධයටම සංග්‍රහ වේනුයි රූපස්කන්ධයෙහිම ලා ගණන් ගන්නා ලදී. එය රූපස්කන්ධයෙන් ම බෙදන ලදී. **එකාදසහායතනෙහි** යනු මනායතනය අත්හැරීමෙන් යනු වේ. සියළු රූපස්කන්ධය වනාහි ආයතන දහයකි. ධම්මායතනයෙහි ඒක දේශයක් වේ. එනිසා එකොලොස් ආයතනයකින් ගණිත ලදී. වෙන්කරන ලදී. **එකාදසහි** ධාතුහි යනු විඤ්ඤාණ ධාතු හත අත්හැර එකොලහය. මේවායෙහි ඇතුළත් නොවූ රූපයක් නම් නැත. අසංග්‍රහ නය නිර්දේශයෙහි කතිහි අසංගහිතො යනු කෙටියෙන් ප්‍රශ්න කරන ලදී. විසඳීමෙහි වනාහි මේ රූපස්කන්ධයට විසභාග වූයේ අරූපස්කන්ධ සතර, මනායතනය හා විඤ්ඤාණ ධාතු හතය. ඒ නිසා චතුහි බන්ධෙහි යනාදිය කියන ලදී. සියළු පදවල සංග්‍රහ අසංග්‍රහ මේ නයින් දතයුතුය. මේ ස්කන්ධ නිර්දේශයෙහි **රූපකබන්ධො කතීහි** බන්ධෙහි යනාදියෙහි පළමුවෙන් ඒක මූලකයෙහි ප්‍රශ්න පහ සහ විසඳුම් පහ සංග්‍රහ නයෙහි ස්වරූපයෙන්ම දක්වන ලදී. අසංග්‍රහ නයෙහි ප්‍රශ්න පහ සහ විසඳුම් පහ කෙටියෙන් දක්වන ලදී. දුක මූලකාදියෙහි ද ප්‍රශ්න හා විසඳුම් මේ උපායෙන් දතයුතුය. මෙහි රූපස්කන්ධ මූලකයෙහි ද දුක තික චතුකක දක්වන ලදී. පංචකයෙහි වනාහි **රූපකබන්ධො ච -පෙ- විඤ්ඤාණකබන්ධොච** යන මෙසේ භේද වශයෙන් ද **පඤ්චකබන්ධා කතීහි** බන්ධෙහි යන මෙසේ අභේද වශයෙන් දැයි ප්‍රශ්න හා විසඳුම් දෙයාකාරයකින් කරන ලදී. මේ පාළි නය දතයුතුය.

අභ්‍යන්තර මාත්‍රකාවේ ස්කන්ධ පද නිර්දේශය නිමා විය.

ආයතන පද නිර්දේශාදියෙහි පළමුවෙන් ආයතන පද නිර්දේශය, **චකඛායතනං එකෙන බන්ධෙන** යන එක් රූපස්කන්ධයකින්ම එක් චක්ෂු ආයතනයකින්ම එක් චක්ෂු ධාතුවකින් ම සංග්‍රහ කරන ලදැයි දතයුතුය.

සෝතායතනාදියෙහි ද සංග්‍රහ අසංග්‍රහ මේ නයින් ම දතයුතුය. **අසංඛතං ඛන්ධතො යථෙච්ඡා** යන මෙහි වනාහි යම්සේ අසංඛත ධම්මායතනය නම් නිවණයි. එය ද ස්කන්ධ සංග්‍රහයට නොයේ. එනිසා ස්කන්ධවලින් හැර යයි කියන ලදී. **චතූහි ඛන්ධෙහි** යනු රූප වේදනා සඤ්ඤා සංස්කාර ස්කන්ධවලින්. නිවණ හැර ධම්මායතනය මේවායින් සංග්‍රහ කරන ලදී. විඤ්ඤාණ ස්කන්ධයෙන් ධම්මායතන ධම්මධාතු හැර සෙසු ආයතනවලින්ද එය සංග්‍රහ නොකරයි. එක් ස්කන්ධයකින් ආයතන එකොලහකින් ධාතු සතලොසකින් සංග්‍රහ නොකරන ලදැයි ඒ නිසා කියන ලදී. යට කියන ලද රූපස්කන්ධ මූලක නය මෙන් මෙහි චක්ෂු ආයතන මූලක නය ද දතයුතුය. දුක පමණක්ම පෙළෙහි දක්වා දොලොස් ආයතන අභේද වශයෙන් ම ප්‍රශ්න හා විසඳුම් කරන ලදී. ධාතු නිර්දේශයෙහි ද මෙම නයම වේ. සත්‍ය නිර්දේශයෙහි සියළු දුක තික චතුක්ක පෙළෙහි දක්වන ලදී. දුක තිකවල සමුදය සත්‍යයෙහි මෙන්ම මාර්ග සත්‍යයෙහි ද විසඳීම වේ. අනතුරුව ඒ සමුදය එනිසා කියන ලදී. ඉන්‍ද්‍රිය නිර්දේශයෙහි ද **ජීවිතින්ද්‍රියං දවීහි ඛන්ධෙහි** යන රූප ජීවිතේන්ද්‍රිය රූප ස්කන්ධයෙන්ද අරූප ජීවිතේන්ද්‍රිය සංස්කාර ස්කන්ධයෙන් ද සංග්‍රහ කරන ලදී. සෙස්ස කියන ලද ආකාරයෙන් ම දතයුතුය. පෙළෙහි ව්‍යවස්ථානයන් වනාහි මෙහි ආයතන ධාතු නිර්දේශවලට සමාන වේ.

පටිච්ච සමුපපාද නිර්දේශයෙහි අවිද්‍යාව ස්කන්ධ කීයකින්දැයි ප්‍රශ්නය නො අරඹා අවිද්‍යා එක් ස්කන්ධයකින් යයි විසඳුමට දක්වන ලදී. **එහි සංඛාර පච්චයා විඤ්ඤාණං** යන සියළුම විපාක විඤ්ඤාණ ප්‍රතිසන්ධිය පැවැත්මෙහි වන නිසා ධාතු සතකින් සංගෘහීත යයි කීය. නාමරූපද ප්‍රතිසන්ධි පැවැත්ම වශයෙන්ම දතයුතුය. එහෙයින්ම මෙහි ශබ්දායතනය ද සංග්‍රහ කොට ආයතන එකොලහකින් සංග්‍රහය දක්වන ලදී. ස්පර්ශ ආදියෙහි ස්කන්ධ භේදය දතයුතුය. අනික් ස්කන්ධයකින් ම ස්පර්ශය සංගෘහීතය. වේදනාව අනිත් එකකිනි. තෘෂ්ණා උපාදාන කර්මභව වනාහි සංස්කාර ස්කන්ධයෙන් ම සංග්‍රහ කරන ලදී. මෙහි භව පදයද කර්ම භවාදීන්ගේ වශයෙන් එකොලොස් ආකාරයට බෙදන ලදී. එහි කර්මභවය ස්පර්ශාදිය සමානව විසඳන ලද බැවින් ඒවා සමග එකට දක්වන ලදී. උත්පත්ති භව කාම භව සඤ්ඤා භව, පඤ්චවෝකාර භව ඔවුනොවුන් හා සමානව විසඳන ලද බැවින් එකට දක්වන ලදී. යම්සේ මේවා උපාදින්නක ධර්ම වේද, ඒ නිසා එකොලොස් ආයතනවලින් සතළොස් ධාතුවලින් කියන ලදී. ශබ්දායතනය අනුපාදින්න නිසා එය මෙහි නො ගන්නා ලදී.

රූප භව නිර්දේශයෙහි **පඤ්චායතනෙහි** චක්ඛු, සෝත, මන, රූප ධර්මායතනවලින්, අට්ඨහි ධාතූහි යන චක්ඛු, සෝත, චක්ඛු විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ, රූප, ධම්ම, මනෝධාතු, මනෝධාතු, මනෝ විඤ්ඤාණ ධාතුවලින් අරූප භවාදි තුන සමානව විසඳන ලද බැවින් එකට දක්වන ලදී. අසඤ්ඤ භව එක් ස්කන්ධයක් ඇති භව එසේය. **එහි දවීහායතනෙහි** යනු රූපායතන ධම්මායතනවලින් ධාතුවල ද මෙම නයමයයි. ඒකතල වාසීන්ට සහ සෙසු බ්‍රහ්මයින්ට චක්ඛු ඇති බැවින් ඊට අරමුණු වන බැවින් එහි රූපායතනය ද උදුරන ලදී. **ජාති දවීහි ඛන්ධෙහි** යනු රූප ජාති රූප ස්කන්ධයෙන් අරූප ජාති සංස්කාර ස්කන්ධයෙන් වේ. ජරාමරණවලද මෙම නයයි. සෝකාදියෙහි ද **එකෙන ඛන්ධෙන** යනු සෝක දුක් දොම්නස් වේදනා ස්කන්ධයෙන් වැලපීම රූප ස්කන්ධයෙන් උපායාසාදිය සංස්කාරා ස්කන්ධයෙන් යයි මෙසේ ස්කන්ධ විශේෂය දතයුතුය. **ඉදධිපාදෝ දවීහි** යනු සංස්කාර විඤ්ඤාණ ස්කන්ධවලින් මනායතන ධම්මායතනවලින් ධම්ම ධාතු මනෝ විඤ්ඤාණ ධාතුවලින්. **ඣාන දවීහි** යනු වේදනා ස්කන්ධය සංස්කාරා ස්කන්ධවලින් අපපමඤ්ඤාදිය සමානව විසඳන ලද නිසා එකට නිදසන ලදී. සිත වනාහි චේතනා අන්තරයෙහි තබන ලද බැවින් ද අසමානව විසඳන ලද බැවින් ද පසුව ගන්නා ලදී. එහි අපපමඤ්ඤාදියෙහි **එකෙන ඛන්ධෙන** යනු වේදනාව වේදනා ස්කන්ධයෙන් සංඥාව සංඥා ස්කන්ධයෙන් සෙසු ඒවා සංස්කාර ස්කන්ධයෙන් සංග්‍රහ කරන ලදැයි මෙසේ ස්කන්ධ විශේෂය දැනගත යුතුය.

මෙසේ අභ්‍යන්තර මාතෘකාවේ සංග්‍රහය දක්වා දැන් බාහිර මාතෘකාවේ සංග්‍රහය දැක්වීමට **කුසලා ධම්මා** යනාදිය අරඹන ලදී. එහි වේදනාත්‍රිකයෙහි **තීහි ධාතූහි** යනු කාය විඤ්ඤාණ, මනෝ විඤ්ඤාණ, ධම්ම ධාතුවලින්. **සත්තහි ධාතූහි** යනු චක්ඛු සෝත ඝාන ජිව්හා විඤ්ඤාණ ධාතුවද මනෝධාතු ධම්ම ධාතු මනෝවිඤ්ඤාණ ධාතුවලින්ද විපාක ත්‍රිකයෙහි අට්ඨ ධාතූහි යනු කාය විඤ්ඤාණ ධාතුව සමග මුලින් කී ඒවා සමග විපාක ධර්මයෝ වනාහි සංකිලිෂ්ට සංක්ලේශයන් සමග සමානව විසඳන ලද බැවින් එකට ගන්නා ලදී. යම්සේ මෙහි මෙසේ සියළු තික දුක පදවල යම් යම් පද යම් යම් පද සමග සමානව විසඳුම් වේද, ඒ ඒ උත්පටිපාටියෙන් ද ඒ ඒවා සමග විසඳන ලදී. එහි කියන ලද ආකාරයෙන්ම සංග්‍රහ අසංග්‍රහ නය දැනගත යුතුය.

සංග්‍රහ අසංග්‍රහ පද නිමා විය.

දැන් සංගෘහිතයෙන් අසංගෘහිත පද බෙදීම **චකඛායතනෙන** යනාදිය අරඹන ලදී. එය ලක්‍ෂණ මෙවාය. මේ වාරයෙහි යමක් ස්කන්ධ පදයෙන් සංගෘහිත වී ආයතන ධාතු පදවලින් අසංගෘහිතය. ස්කන්ධ ආයතන පදවලින් හෝ සංගෘහිත වී ධාතු පදයෙන් අසංගෘහිතය. එය ස්කන්ධාදියෙන් අසංග්‍රහය ප්‍රශ්නකොට විසඳීම කරන ලදී. එය වනාහි රූපස්කන්ධාදියෙහි නොයෙදේ. රූපස්කන්ධයෙන් රූපස්කන්ධයම සංගෘහිත විය. එය ද ආයතන ධාතු එකොලහ හමාරකින් අසංගෘහිත වූවක් නම් නැත. වේදනා ස්කන්ධයෙන් ද වේදනා ස්කන්ධයම සංගෘහිත විය. එය ද ධම්මායතන ධම්ම ධාතුවලින් අසංගෘහිත වූවක් නම් නැත. මෙසේ අසංගෘහිතයාගේ අභාවයෙන් මේ අන්‍ය වූ ම රූපයෙන් මනායතන ධම්මායතන ආදි පද මේ වාරයෙහි නොගන්නා ලදී. රූප ඒකදේසයක් වූ යම් පද වනාහි අරූපයෙන් අමිශ්‍ර වූ විඤ්ඤාණ ඒකදේසයක් ද අනිකකින් අසම්මිශ්‍ර යයි දක්වති. අවසානයෙහි ද,

දස ආයතන (සහ) සතළොස් ධාතු (සමගින්)
සත් ඉඳුරෝ අසන් - බව එක් කඳක් ඇති බව

වැලපුම සනිදසුන් - පටිනය සහ අනිදසුන්
පටිගය සමග (එය) - නැවත ලංකොට ගන්නේ

මෙසේ උදාන ගීය දක්වන ලද්දේමය. එහෙයින් ඒ විදියෙන් ම සංග්‍රහ අසංග්‍රහ දැනගත යුතුය. ප්‍රශ්න වශයෙන් මෙම වාරයෙහි ආයතන ධාතු වශයෙන් ද සමාන විසඳීමෙහි විසි දහම් හකුළුවා එක් ප්‍රශ්නයක් කරන ලදී. සත් විඤ්ඤාණ ධාතු සමෝධානය කොට එකක් වැලපුමෙන්ද සන්දර්ශන එකකි. පටිඝ සගති උපාදාය ධර්මවලින් ද එකකැයි ප්‍රශ්න කොට අටකි. ඒවායින් ස්කන්ධාදි විභාගය මෙසේ දතයුතුය.

කෙසේද? පළමුව පළමුවන ප්‍රශ්නයෙහි **චතුහිඛන්ධෙහි** යනු අරූප ස්කන්ධවලින්. **දවීහායතනෙහි** යනු චක්‍ෂු ආයතනාදියෙහි එක එකක් සමග මනායතනයෙන්. **අට්ඨහි ධාතූහි** යන චක්ඛු ධාතු ආදියෙහි එක එකක් සමග විඤ්ඤාණ ධාතු සතෙන්. මේ එහි නයයි. චක්‍ෂු ආයතනයෙන් ස්කන්ධ සංග්‍රහයෙන් රූපස්කන්ධය සංග්‍රහ කරන ලදී. රූපස්කන්ධයෙහි එය සංග්‍රහ කරන කල්හි ආයතන සංග්‍රහයෙන් චකඛායතන නම් වූ එකක්

සංග්‍රහ කරන ලදී. සෙසු දහය සංග්‍රහ නොකරන ලදී. ධාතු සංග්‍රහයෙන් ද ඒ චක්ඛු ධාතුවම එකක් සංග්‍රහ කරන ලදී. සෙසු දහය සංග්‍රහ නොකරන ලදී. මේ යම් මේ සංග්‍රහ නොකරන ලද දස ආයතන වේද ඒවා චක්ඛු ආයතන මනායතන දෙකෙන් ද සංග්‍රහ නොකරන ලදී. දස ධාතු සමග සංග්‍රහ නොවූ යමක් වේද ඒවා චක්ඛු ධාතුවෙන් ද විඤ්ඤාණ ධාතු සතෙන් ද සංග්‍රහ නොකරන ලදී. රූපායතනාදියෙහි ද මෙම නයම වේ.

දෙවන ප්‍රශ්නයෙහි යම්හෙයකින් යම්කිසි විඤ්ඤාණ ධාතුවකින් සංගෘහීත වූ විඤ්ඤාණ ස්කන්ධය මනායතනයෙන් අසංගෘහීත වූවක් නම් කම් නැත. එහෙයින් ආයතන සංග්‍රහයෙන් සංග්‍රහ කරන ලදැයි කියන ලදී. මෙහි වනාහි **චතූහි ඛන්ධෙහි** යනු රූපාදි සතරෙන් **එකාදසායතනානි** යනු මනායතනය හැරය. දවාදසහි ධාතූහි යනු විඤ්ඤාණ ධාතු හය ඉවත්කොට යථානුරූප වූ සෙසු දොලොසින්. චකඛු විඤ්ඤාණ ධාතුවෙන් චකඛු විඤ්ඤාණ ධාතුවම සංග්‍රහ කරන ලදී. ඉතිරි ඒවා සංග්‍රහ නොකරන ලදී. සෝත විඤ්ඤාණ ධාතු ආදියෙහි ද මෙම නයම වේ.

තුන්වන ප්‍රශ්නයෙහි චකඛු ඉන්ද්‍රියාදීන්ගේ විසඳීම චකඛු ආයතනාදියට සමාන වේ. ස්ත්‍රී ඉන්ද්‍රිය පුරුෂ ඉන්ද්‍රියවල වනාහි ධම්මායතනය සමග ආයතන දෙකකි. ධම්ම ධාතුව සමග ධාතු අටක් දත යුතුය.

සතරවන ප්‍රශ්නයෙහි **තීහායතනෙහි** යනු රූපායතන ධම්මායතන මනායතනවලින්. ඒ භවවල රූපායතන ධම්මායතන වශයෙන් ආයතන දෙකක් ඒවායින් අසංගෘහීත වේ. සෙසු රූපායතන නවය ඒවා සමග ද මනායතන දෙකින්දැයි තුනකින් අසංගෘහීත නම් වේ. **නවහි ධාතූහි** යනු රූප ධාතුව ධම්ම ධාතු සමග විඤ්ඤාණ ධාතු සතකින්.

පස්වන ප්‍රශ්නයෙහි **දවීයාතනෙහි** යනු පළමු පදය සඳහා ශබ්දායතන මනායතනවලින්. දෙවන පදය සඳහා රූපායතන මනායතනවලින්. ධාතුවල ද ඒවායේම එකිනෙක සමග විඤ්ඤාණ ධාතු සත දතයුතුය.

සවන ප්‍රශ්නයෙහි **දසායතනෙහි** යනු රූපායතන ධම්මායතන අත්හැර. **සොළසහි ධාතූහි** යනු රූප ධාතු ධම්ම ධාතු අත්හැරය. කෙසේද? අනිදර්ශන පටිඝයෙන් යුත් ධර්මයෝ නම් ඕලාරික ආයතන වෙති.

රූපස්කන්ධය ඒවායින් සංගෘහීත වූ කල්හි ආයතන සංග්‍රහයෙන් ඒ නව ආයතන ම සංගෘහීත වේ. රූපායතන ධම්මායතන අසංගෘහීත වේ. ධාතු සංග්‍රහයෙන් ද ඒ නව ධාතු සංගෘහීත වේ. රූප ධාතු ධම්ම ධාතු අසංගෘහීත වේ. මෙසේ අසංගෘහීත වූ යම් ආයතන දෙකක් වේද ඒවා රූපායතන අත්හැර ඕලාරිකායතන නවයෙන් හා මනායතනයෙන් දැයි දහයෙන් අසංගෘහීත වේ. යම් ඒ අසංගෘහීත වූ ධාතු දෙකක් වේද ඒවා රූපධාතුව හැර ඕලාරික ධාතු නවයෙන් සහ විඤ්ඤාණ ධාතු සතෙන්දැයි සොළසකින් අසංගෘහීත යයි දතයුතුය.

සත්වන ප්‍රශ්නයෙහි දවීභායතනෙහි යනු පටිඝය සහිත ධර්මයන් සඳහා ධම්මායතනය හැර, උපාදා ධර්ම සඳහා ස්පර්ශායතනය හැර ධාතුවල ද මෙම නයම වේ. මෙහි අර්ථ යෝජන යට කියන ලද ක්‍රමයෙන් ම දතයුතුය.

සංගෘහීතයෙන් අසංගෘහීත පද නිමා විය.

දැන් අසංගෘහීතයෙන් සංගෘහීත පද බෙදීමට වෙදනාකඛන්ධ යනාදිය ඇරැඹිය. එහි ලක්ඛණ මෙසේය. මෙම වාරයෙහි ස්කන්ධ පදයෙන් යමක් යමක් අසංගෘහීත වී ආයතන ධාතුපදවලින් සංගෘහීත වේ. ඒ ස්කන්ධාදියෙන් සංග්‍රහය අසා විසඳීම කරන ලදී. එය වනාහි රූප ස්කන්ධ විඤ්ඤාණ ස්කන්ධ ආයතනාදියෙහි නොයෙදේ. රූපස්කන්ධයෙන් ස්කන්ධ සතර ස්කන්ධ සංග්‍රහයෙන් අසංගෘහීතය. ඒවායින් එයින් එක ධර්මයකුදු ආයතන ධාතු සංග්‍රහයෙන් සංගෘහීත නම් නැත. වේදනාදිය ධම්මායතනයෙන් සංගෘහීත වූයේ නොවේද? සංගෘහීතය. රූපස්කන්ධය ධම්මායතනය නොවේ. රූපස්කන්ධයෙන් සුමුඛ රූප පමණක් ධම්මායතනය සෙවුනේය. එසේ හෙයින් ධම්මායතනයෙන් සංගෘහීත වූ යමක් රූපස්කන්ධයෙන් සංගෘහීත වූයේ නම් නොවේ. විඤ්ඤාණ ස්කන්ධයෙන් ද ඉතිරි ස්කන්ධ සතර අසංගෘහීතය. ඒවායින් ආයතන සංග්‍රහයෙන් එකකුදු සංගෘහීත වූයේ නම් නොවේ. මෙසේ සංගෘහීතභාවය අභාවයෙන් මේ අනිත් චකඛායතනාදී පද මේ වාරයෙහි නො ගන්නා ලදී. විඤ්ඤාණයෙන් හෝ ඕලාරික රූපයෙන් හෝ අසම්මිශ්‍ර වූ යම් පද ධම්මායතනයෙන් ඒක දේසයක් දක්වයි. ඒවා මෙහි ගන්නා ලදී. ඒවායෙහි මේ උදානයයි.

කඳු තුන එසේ සස් - ඉඳුරන් සොළොස යන ඒ
පස අයුරුව තුදුස් - පද උපරි ද තුදුස් වේ

පද සමතිසක් වේ - දස පොකුරකින් මෙහි වන
දෙකකි සුළු අන්තර - මහ අන්තර අටකි පද

මේ පදවල සමාන විසඳුම් පද එකතුකොට සියළු දොළොස් පැන කියන ලදී. ඒවායෙහි ස්කන්ධ විභාගය දතයුතුය. ආයතනවල වනාහි භේද නැත. එහි පළමු ප්‍රශ්නයෙහි මුලින්ම තිහි බඳෙහි යනු රූප සඤ්ඤා සංඛාර ස්කන්ධවලින්. ආයතන වනාහි ධම්මායතන ධම්ම ධාතු වශයෙන් දතයුතුය. මේ එහි නය වේ. වේදනා ස්කන්ධයෙන් නිවණ ද සුබුම රූප සංඛාර ද ස්කන්ධ සංග්‍රහයෙන් අසංඟහීත වී ආයතන ධාතු සංග්‍රහයෙන් සංඟහීත විය. ඒවායින් නිවණ ස්කන්ධ සංග්‍රහයට නොයේ. සෙසු රූප සඤ්ඤා සංඛාර ස්කන්ධවලින් සංග්‍රහ වේ. ආයතන ධාතු සංග්‍රහය වනාහි නිවණ ද යේමය. එනිසා කියන ලදී. 'ස්කන්ධවලින් අසංඛතය හැර ස්කන්ධ තුනෙන් එක් ආයතනයකින් එක් ධාතුවක් සංග්‍රහ කරන ලද්දේය.' මෙහි සඤ්ඤා ස්කන්ධ පක්ෂයෙහි වනාහි සඤ්ඤා ඉවත්කොට වේදනාව සමග ස්කන්ධ තුනය. සංඛාරාදියෙහි සංඛාර ස්කන්ධය ඉවත්කොට රූප වේදනා සඤ්ඤා වශයෙන් ස්කන්ධ තුන දතයුතුය.

දෙවැන්නෙහි චතුහි බඳෙහි යනු විඤ්ඤාණය හැර. ඒවා නිරෝධයෙන් ස්කන්ධ සංග්‍රහයෙන් අසංඟහීතව ආයතන ධාතු සංග්‍රහයෙන් සංඟහීතය. තෙවැන්නෙහි දවිහි යනු වේදනා සංඥා ස්කන්ධවලින්. රූප අරූප ජීවිතේන්ද්‍රියෙන් වේදනා සංඥා විඥාන ස්කන්ධ ද ස්කන්ධ සංග්‍රහයෙන් අසංඟහීතය. ඒවායෙහි වේදනාව හා සංඥාව ද ආයතන ධාතු සංග්‍රහයෙන් සංඟහීතය. එහෙයින් කියන ලදී. 'වේදනා සංඥා ස්කන්ධවලින්.' මේ උපායෙන් සියළුතන්හි ස්කන්ධ භේදය දතයුතුය. මෙයින් පසු ස්කන්ධයන්ගේ නම පමණක් කියමු. සතරවැන්නෙහි තිහි බඳෙහි යනු ස්ත්‍රී පුරුෂ ඉන්ද්‍රියවල වේදනා සංඥා සංස්කාරවලින්. වේදනා පංචකයෙහි රූප සංඥා සංස්කාරවලින්. ශ්‍රද්ධා ඉන්ද්‍රියාදියෙහි ස්පර්ශ අවසානයෙහි රූප වේදනා සංඥා ස්කන්ධවලින්. වේදනාවෙන් වේදනා ස්කන්ධය සමානය. තෘෂ්ණා උපාදාන කර්ම භවවල විනිස සංස්කාරා

ස්කන්ධයට සමානය. පස්වැන්නෙහි ජාති ජරා මරණවල රූප ජීවිතේන්ද්‍රියට සමානය. ධ්‍යානයෙන් වනාහි නිවණ සුබුම රූපය සංඥාව ද ස්කන්ධ සංග්‍රහයෙන් අසංගෘහීතව ආයතන ධාතු සංග්‍රහයෙන් සංගෘහීතය. එනිසා එය සඳහා රූප ස්කන්ධ සංඥා ස්කන්ධයන්ගේ වශයෙන් ස්කන්ධ දෙකක් දතයුතුය. සවැන්නෙහි සෝකාදි තුනේ වේදනාව හා සමානය. උපායාසාදියෙහි සංඛාරය හා සමානය. නැවත වේදනාව වේදනා ස්කන්ධය හා සමානය. සංඥාව සංඥා ස්කන්ධය හා සමානය. චේතනාදියෙහි සංඛාර ස්කන්ධ හා සමානය විනිස වේ. මේ උපායෙන් හත්වන ප්‍රශ්නාදියෙහි සංග්‍රහ අසංග්‍රහ දතයුතුය.

අසංගෘහීතයෙන් සංගෘහීත පද නිමා විය.

දැන් සංගෘහීතයෙන් සංගෘහීත පද බෙදීමට **සමුදය** සවෙචන යනාදිය අරඹන ලදී. එහි යමක් ස්කන්ධාදි සංගෘහීතයෙන් ස්කන්ධාදි වශයෙන් සංගෘහීතය. නැවත ඒවායේම ස්කන්ධාදියෙන් සංග්‍රහ ප්‍රශ්නකර විසඳීම කරන ලදී. ස්කන්ධ ධාතු ආයතනවල සියළු කොටස් ගෙන සිටි පදවල එය එකකුදු නොයෙදේ. සියළු ස්කන්ධාදි පදයෙන් වෙනත් ස්කන්ධාදි වශයෙන් සංගෘහීත වූවක් නම් නැත. යම් පදයක් තමාගේ සංග්‍රාහකය සංග්‍රහකොට නැවත එයින්ම සංග්‍රහයට යන්නේය. එහෙයින් එබඳු පද මේ වාරයෙහි නොගන්නා ලදී. යම් පද සංඛාර ඒකදේශයක් හෝ අනිකකින් අසම්මිශ්‍රව දක්වයි. වේදනා ඒකදේශයක් හෝ සුබුම රූපයක් හෝ සත්‍ය ඒකදේශයක් හෝ අන්‍ය පදයකින් අසම්මිශ්‍රව දක්වයි. ඒ පද මෙහි ගන්නා ලදී. ඒවායේ උදානය මෙසේය.

දෙ සස් පසළොස ඉඳු - රන් එකොළොස පිළිසමුප
පුන එකොළොස පොකුරු - පද තිසයුරු මෙහි දිසේ

මෙහි ප්‍රශ්න වනාහි දෙකක්ම වේ. එහි ප්‍රශ්න කිරීමෙන් යම් පදයක් උදුරන ලදද එයම යම් ධර්මවලින් ස්කන්ධාදි වශයෙන් සංගෘහීතය. ඒ ධර්මයන් සඳහා සියළු තැන **එකෙන බඤ්ඣන** යනාදිය කියන ලදී. මේ එහි නය වේ. සමුදය සත්‍යයෙන් තෘෂ්ණාව හැර සෙසු සංස්කාර ස්කන්ධාදි සංග්‍රහයෙන් සංගෘහීතය. නැවත ඒවායින් තෘෂ්ණාව සංගෘහීතය. නැවත

ඒ තෘෂ්ණාව සංස්කාරවලින්ම ස්කන්ධාදි සංග්‍රහයෙන් සංගෘහීතය. සියළු තැන මෙම නයම වේ. මෙහි අරූප ධර්ම ප්‍රශ්නවල වනාහි සංස්කාර ස්කන්ධය හෝ වේදනා ස්කන්ධය හෝ එක ස්කන්ධයක් නම් වේ. රූප ධර්ම ප්‍රශ්නවල රූප ස්කන්ධය වේ. වැලපීම් ප්‍රශ්නයෙන් ශබ්දායතනය එක් ආයතනයක් නම්. ශබ්ද ධාතුව එක් ධාතුවක් නම්. සෙසු ස්ථානවල ධම්මායතන ධම්ම ධාතු වශයෙන් ම අර්ථය දතයුතුය.

සංගෘහීතයෙන් සංගෘහීත පද නිමා විය.

දැන් අසංගෘහීතයෙන් අසංගෘහීත පද බෙදීමට **රූපකඛන්ධන** යනාදිය අරඹන ලදී. එහි යම් පදයක් ස්කන්ධාදියෙන් අසංගෘහීත වූයේ ස්කන්ධාදී වශයෙන් අසංගෘහීතය. නැවත ඒවායේම ස්කන්ධාදියෙන් අසංග්‍රහය ප්‍රශ්න කර විසඳීම අරඹන ලදී. එය දුක්ඛ සත්‍යාදියෙහි පංචස්කන්ධ ගැනීම්වල, විඤ්ඤාණය සමග සුඛුම රූප ගැනීම්වල අනිදර්ශන අප්පටිඝාදි පදවල නො යෙදේ. නිවණ එබඳු පදයෙන් ස්කන්ධ සංග්‍රහයට පමණක් නොයන්නේය. සෙසු ස්කන්ධාදියෙන් අසංගෘහීත ධර්මයක් නම් නැත. එහෙයින් එබඳු පද මේ වාරයෙහි නොගන්නා ලදී. පංච ස්කන්ධයෙහි යම් පද සුඛුම රූපය සමග විඤ්ඤාණය ද එකට නො දැක්වේ. එබඳු පද ගන්නා ලදී. මේ උදානයකි.

සවි කඳු ආයතන - දාතුය තෙ සස් සස්නෙන්
සියළු ඉඳුරන් පිළි - සමුපා තෙ විස්සෙක් වේ

මතු සොළොස් පදයකි - නිකයෙහි තෙසාළිස් පද
පොකුරෙහි දෙසැත්තෑ - සත් පද සුළු අන්තරේ

මහ අන්තරේ පද - අටළොස් පසුද අටළොස්
දතයුතු දෙසූ බව - සෙසු පද නො දෙසූ මෙහි

මෙහි ප්‍රශ්නය සමානව විසඳීම් වශයෙන් එකතුකොට කරන ලද්ද සමග සියල්ල තිස්හතරක් වේ. එහි ප්‍රශ්න නැගීමෙන් උදුරන ලද පද එයම යම් ස්කන්ධාදියෙන් අසංගෘහීතය. ඒ ධර්මයන් සඳහා **එකෙන බන්ධන** යනාදිය කියන ලදී. තෙල නය මෙසේය. රූපස්කන්ධයෙන්

ස්කන්ධ සතර ද නිවණ ද ස්කන්ධ සංග්‍රහයෙන් අසංගෘහීතය. ආයතන ධාතු සංග්‍රහයෙන් හැර විඤ්ඤාණය සෙසු සංගෘහීත විඤ්ඤාණය ස්කන්ධ තුනෙන්ම අසංගෘහීත නම් වේ. නැවත එය සමග නිවණ ස්කන්ධ සංග්‍රහ සතරින් අසංගෘහීතය. ඒ සියල්ල ද නැවත විඤ්ඤාණයෙන් ම ස්කන්ධාදි සංග්‍රහයෙන් අසංගෘහීත යයි එක් ස්කන්ධයකින් එක් ආයතනයකින් ධාතු සතකින් අසංගෘහීත නම් වේ.

එසේ නැතහොත් යම් ඒමේ පද රූපස්කන්ධයෙන්. විඤ්ඤාණයම ස්කන්ධ තුනේ සංග්‍රහයෙන් අසංගෘහීතය. ඒ විඤ්ඤාණ ධර්මවලින් ඒ රූප ධර්මම සංග්‍රහ තුනෙන් අසංගෘහීතය. නැවත ඒ රූප ධර්ම විඤ්ඤාණයෙන් ම සංග්‍රහ තුනෙන් අසංගෘහීතය. විඤ්ඤාණය ද ස්කන්ධවලින් එක් විඤ්ඤාණ ස්කන්ධයකි. ආයතනවලින් එක් මනායතනයකි. ධාතුවලින් විඤ්ඤාණ ධාතු සතකි. එහෙයින් **එකෙන බන්ධන** යනාදිය කියන ලදී. මේ උපායෙන් ප්‍රශ්න නැගීමෙන් උදුරන ලද යම් පද, ඒවාම යම් ධර්මවලින් ස්කන්ධාදි වශයෙන් අසංගෘහීතය. ඒ ධර්මයන්ගේ වශයෙන් ස්කන්ධාදිය දතයුතුය. එහි දෙවන ප්‍රශ්නයෙහි පළමුව විඤ්ඤාණයන්ගේ වශයෙන් දතයුතුය. වේදනාදිය රූප විඤ්ඤාණවලින්ම ස්කන්ධාදි සංග්‍රහයෙන් අසංගෘහීතය. ඒවාද ස්කන්ධ දෙක, ආයතන එකොළහ, ධාතු සතළොස වේ. තුන්වන ප්‍රශ්නයෙහි විඤ්ඤාණය රූපාදි සතරින් අසංගෘහීත යයි ඒවායේ වශයෙන් ස්කන්ධාදීනු දතයුතුය. සතරවන ප්‍රශ්නයෙහි චකඛායතනය වේදනාදී සතරින් යි මෙ නයින් සියළු තන්හි ස්කන්ධාදිය දතයුතුය. අවසානයෙහි **රූපඤ්ච ධම්මායතනං** යයි උදාන ගාථාවෙන් දක්වන ලද ධර්මම වෙනත් ආකාරයකින් හකුළුවා දක්වන ලදී.

අසංගෘහීතයෙන් අසංගෘහීත පද නිමා විය.

දැන් සම්ප්‍රයෝග විප්‍රයෝග පද බෙදීමට **රූපකඛන්ධො** යනාදිය අරඹන ලදී. එහි යමක් ලැබේද යමක් නො ලැබේද ඒ සියල්ල ප්‍රශ්නයෙන් ගන්නා ලදී. විසඳීමෙහි දී යමක් නො ලැබේද එය ප්‍රතික්ෂෙප කරන ලදී. **චතූහි සම්පයොගෙ චතූහි විපපයොගෙ සභාගෙ විසභාගෙ** යන වචන හෙයින් සතර අරූප ස්කන්ධවලින් ම සභාගයන්ගේ එක් සන්තානයක

(සිතන) එක් මොහොතක උපන් අරූප ස්කන්ධවල ම ඔවුනොවුන් සම්ප්‍රයෝගය ලබයි. රූප ධර්මවල වනාහි රූපයෙන් නිර්වාණයෙන් හෝ නිර්වාණයේ ද රූපය සමග සම්ප්‍රයෝගයක් නම් නැත. රූප නිර්වාණවල අරූප ස්කන්ධවලින් ද එසේය. ඒවා ඔවුන්ගේ විසභාග වේ. රූප නිබබාණවලින් අරූප ස්කන්ධවල යම්සේද එසේම වෙන් වෙන් සන්තානවලින් නානා ක්ෂණවලින් අරූප ධර්ම සමගද නොමැත්තේමය. ඒ සන්තාන ක්ෂණ විසභාග බැවින් ඒවාද විසභාගම වේ. මෙය වනාහි විසභාග බැවින් සංග්‍රහ අර්ථයෙන් විරුද්ධවීමක් සංග්‍රහ නයෙහි නැත. සංග්‍රහාර්ථය ගණන් එළඹීමක් පමණය. (ගණනූපගමතතං) සම්ප්‍රයෝග නයෙහි ඇත. එකට උපන්බව ආදී ලක්ෂණ සම්ප්‍රයෝග අර්ථයයි. මෙසේ මෙහි යමකට එක් ධර්මයකින් ද සම්ප්‍රයෝග ලක්ෂණ නොයෙදේ. ප්‍රශ්නයෙන් සංග්‍රහ කොට ද නැතැයි ඒවා ප්‍රතික්ෂේප කරන ලදී. යමක විප්‍රයෝග ලක්ෂණ යෙදේද එහි විප්‍රයෝගම දක්වන ලදී. සප්ත විඥාන ධාතුවල යම් පද රූපයෙන් නිර්වාණයෙන් හෝ එකකුදු විප්‍රයුක්ත නොවූ කල්හි මිශ්‍ර ධර්ම දැක්වේ. ඒවා සියළු ආකාරයෙන් මෙහි නොයෙදේ යයි නොගන්නා ලදී. මෙය උදානයි.

දම් ආයතන දම් - දා දුක් සස් ද දිවියද
සය ආයතන නම් - රූ සතරද බවමහා

දෑ ජර මර නික - යෙහි එකුන්විසි පදද යන
පොකුරෙහි ද පණසය - සුළු අන්තරයෙහි අට පද

පසළොස ද මහ අත්-තර අටළොස එයින් පසු
එක්සිය තෙවිසි පද - නො ලැබෙයි සම්පයෝගයෙ

ධම්මායතනය රූප නිර්වාණ මිශ්‍ර බැවින් අපරියාපන්ත විඤ්ඤාණයෙන් සම්ප්‍රයුක්ත යයි කීමට නොහැකිය. මෙහි යම් වේදනාදිය විඤ්ඤාණයෙන් සම්ප්‍රයුක්තය. ඒ නිසා විප්‍රයුක්ත යයි කීමට නොහැකිය. සෙස්සෙහි ද තෙල නයම වේ. මෙසේ සියළු තන්හි ද මේවා නොයෙදේ යයි මෙහි නොගන්නා ලදී. සෙසු ස්කන්ධාදිය යෙදේ යයි ඒවායෙන් එක එකක් වශයෙන් ද සමෝධානව ද ප්‍රශ්න විසඳීම් කරන ලදී. සෙසු ප්‍රශ්නවල පළමුවැන්නෙහි **එකෙනායතනෙන** යනු මනායතනයෙන්. **කෙහිචි** යනු

ධම්මායතන ධම්මධාතු ඇතුළත් වේදනා සඤ්ඤා සංඛාරවලින්. දෙවැන්නෙහි **තීහි** යනු විචාරන ලද ඒවා හැර සෙසු ඒවායින්. **කෙහිචි සම්පයුත්ත** යනු වේදනා ස්කන්ධය සඤ්ඤා සංඛාරවලින්. ඉතිරියෙහි ද තමා හැර ඉතිරි ඒවායින්. **කෙහිචි විපපයුත්තෙනා** යනු රූප නිබ්බාණවලින්. මෙසේ සියළු තන්හි ධම්මායතන ධම්ම ධාතුවල රූපයේ විප්‍රයෝගයෙහි අරූපයද අරූපයේ විප්‍රයෝගයෙහි රූපය ද දැකිය යුතුය. තුන්වන ප්‍රශ්නය නොගැඹුරු අර්ථ ඇත. සතරවැන්නෙහි ස්කන්ධයන්ගෙන් කියක්දැයි නොකියා සම්ප්‍රයුක්තයක් නැතැයි කියන ලදී. එය වනාහි ස්කන්ධාදීන්ගේ වශයෙන්ම දතයුතුය. පසුව ද මෙබඳු වූ ප්‍රශ්නවල මෙම නයම වේ. මුල් ප්‍රශ්නයේ ස්වරූපය දක්වා පසුව එන ප්‍රශ්න පෙළෙහි සංක්ෂේප කරන ලදී. මෙ නයින් සියළුතැන අර්ථ යෝජනා දතයුතුය. යම්තැනක ප්‍රකට නොවන්නේ නම් එය ප්‍රකට කර යමි. **සොළසහි ධාතූහි** යනු තමාගේ පළමු විඤ්ඤාණ ධාතුව හැර විඤ්ඤාණ ධාතු හයෙන් සහ රූප ධාතු දසයෙන්. සෙස්සෙහි ද මෙම නයයි. **තීහි බන්ධෙහි** යනු සංස්කාර ස්කන්ධය හැර සෙසු ඒවායින්. **එකාය ධාතුයා** යනු මනෝවිඤ්ඤාණ ධාතුවෙන්. සමුදය මාර්ගවල වෙනත් ධාතුවකින් සම්ප්‍රයෝගයක් නැත. **එකෙන බන්ධන** යනු සංස්කාර ස්කන්ධයෙන්. **එකෙනායතනෙන** යනු ධම්මායතනයෙන්. **එකාය ධාතුයා** යනු ධම්ම ධාතුවෙන්. මේවායෙහි **කිසිවක්** ඒ සත්‍ය දෙක සම්ප්‍රයුක්ත වේ. සුඛින්ද්‍රියාදි ප්‍රශ්නයෙහි **තීහි** යනු සංඥා සංස්කාර විඤ්ඤානවලින්. **එකාය ධාතුයා** යනු එක් විඤ්ඤාණ ධාතුවකින්. **ඡහි ධාතූහි** යනු කාය විඤ්ඤාණ ධාතුව හැර සෙසු ඒවායින්. රූපභව ප්‍රශ්නයෙහි සියළු අරූප ස්කන්ධ සහ අරූප ආයතන ඇති බැවින් **න කෙහිචි** යයි කියන ලදී. අරූප භව ප්‍රශ්නයෙහි ඝාන ජිව්හා කාය විඤ්ඤාණ ධාතු නැති බැවින් **තීහිධාතූහි විපපයුත්තෙනා** යයි කියන ලදී.

අධිමොක්ඛ ප්‍රශ්නයෙහි **දවීහි ධාතූහි** යනු මනෝ ධාතු මනෝවිඤ්ඤාණ ධාතුවලින්. **පණ්ණරසහි** යනු සෙසු දස රූපධාතුවලින් සහ පංච චක්ඛු විඤ්ඤාණාදියෙන්. කුසල ප්‍රශ්නයෙහි කුසල්වලින් ස්කන්ධ සතරම ගන්නා ලද බැවින් සම්ප්‍රයෝගය ප්‍රතික්ෂිප්තය. වේදනා ත්‍රික ප්‍රශ්නයෙහි **එකෙන බන්ධන** යනු වේදනා ස්කන්ධයෙන්ම. **පණ්ණරසහි** යනු චක්ඛු සෝත ඝාන ජිව්හා විඤ්ඤාණ ධාතු සහ මනෝ ධාතුවලින් ද රූපධාතු දහයෙන්. **එකාදසහි** යනු කාය විඤ්ඤාණ ධාතුව සමග රූපධාතුවලින්. නෙවවිපාක න විපාක ධම්ම ධම්ම ප්‍රශ්නයෙහි **පඤ්චහි** යනු චක්ඛු විඤ්ඤාණාදියෙන්. අනුපාදින්න අනුපාදානිය ප්‍රශ්නයෙහි **ඡහි**

යනු මනෝ විඤ්ඤාණ ධාතු අත්හැරීමෙන්. සවිතක්ක සවිචාර ප්‍රශ්නයෙහි **පණ්ණරසහි** යනු පංච විඤ්ඤාණ සමග රූප ධාතුවලින්. අවිතක්ක විචාරමත්ත ප්‍රශ්නයෙහි **එකෙන ඔකෙන** යනු මුලින් කී සංස්කාර ස්කන්ධ වශයෙන් ම දතයුතුය.

දුතිය ධ්‍යාන විචාරය හැර සෙස්ස අවිතක්ක විචාරමත්ත නම් වේ. ප්‍රීතිය හැර සෙස්ස ප්‍රීති සහගත වේ. එහි විචාරය විචාරයෙන් ප්‍රීතිය ප්‍රීතියෙන් සම්ප්‍රයුක්ත නොවේ. සංඛාර බහිධ ධම්මායතන ධම්ම ධාතුවල කිසිවක සම්ප්‍රයුක්ත නම් වේ. **සොළසහී** යනු මනෝධාතු මනෝ විඤ්ඤාණ ධාතු හැරීමෙන්. අවිතක්ක අවිචාර ප්‍රශ්නයෙහි **එකාය ධාතුයා** යනු මනෝ ධාතුවෙන් සුබ සහගත උපෙකඛා සහගත වේදනා ත්‍රිකයෙහි කියන ලදමය. දර්ශනයෙන් අත්හළ යුතු ආදිය කුසල සමානය. පරිතතාරම්මණය (කුඩා අරමුණ) විපාක ධම්ම සමානය. **එකා ධාතුයා** යනු ධම්ම ධාතුවෙන්. කෙහීවි යනු එහි පරිතතාරම්මණ නොවේ නම් ඒවායින් ධම්ම ධාතු වනාහි චිත්තුපපාදවල සවැන්න වශයෙන් ස්කන්ධ සතරේ සංගෘහීත බැවින් පළමුවන ප්‍රතික්ඛෙපයම සේවනය කෙරේ. මහගත අරමුණු ආදිය කුසල සමානය. නූපන්නෙහි පඤ්චහි ධාතූහි යනු චකඛු විඤ්ඤාණාදියෙන් ඒවාද ඒකාන්තයෙන් උපපාදාදි ධර්ම වන බැවින්. උපන් කොටස ද භඡනය කෙරේ. වර්තමාන අරමුණු පරිත්ත අරමුණුවලට සමානය. හේතු ආදිය සමුදයට සමානය. අනුපාදින්න අනුපාදින්නවලට සමානය. සෙසු සියළු තැන නොගැඹුරු අරුත් වේ.

සම්ප්‍රයෝග විප්‍රයෝග පද නිමා විය.

දැන් සම්ප්‍රයුක්තයෙන් විප්‍රයුක්ත පද බෙදීමට **වෙදනකඛන්ධෙන** යනාදිය ආරම්භ කරන ලදී. එහි ලක්ෂණ මෙසේය. මේ වාරයෙහි ප්‍රශ්නයෙන් මතුකරන පදයෙන් යම් ධර්මයක් සම්ප්‍රයුක්ත වේ නම් ඒවායින් යම් ධර්මයක් විප්‍රයුක්තය. ඒවායේ ස්කන්ධාදියෙන් විප්‍රයෝගය අසා විසඳන ලදී. එය වනාහි රූප ස්කන්ධාදියෙහි නොයෙදේ. රූප ස්කන්ධයෙන් සම්ප්‍රයුක්තයක් නම් නැත. එහෙයින් එය ද මෙබඳු වූ අනිත් පද ද මේ වාරයෙහි නොගන්නා ලදී. යම් පද ධම්ම ධාතුවෙන් සම්ප්‍රයුක්ත ධර්මයෙහි විඤ්ඤාණය ද අනිකකින් අසම්මිශ්‍රව දක්වයි. ඒවා මෙහි ගන්නා ලදී. ඒවායේ උදානය මෙසේය.

සතර කඳු එක් ආ - යතන ඉඳුරන් දෙක වේ
දා පද සතක් වනු - පිළිසමුපා තුනෙක් වේ

පහස සත්වැනියට - තික තැන සත් මහතරේ
සවිතක් සවිචාර - මැදහත් එකෙක වන්නේ

අවසානයෙහි සතර කඳු ආදියෙන් ද මේ අර්ථයම සංගෘහීතය. එහි යම් පද සමාන විසඳුම් ඇත්තේ ද ඒවා උපිළිවෙළින් එකතුකොට එහි වේදනා ස්කන්ධ ආදි ප්‍රශ්න නගන ලදී. ඒවායෙහි ස්කන්ධාදි විභාග දතයුතුය. පළමුව වේදනා ස්කන්ධාදි ප්‍රශ්නයෙහි **එකෙන** යනු මනායතනයෙන්. **සතතහි** යනු විඤ්ඤාණ ධාතුවලින්. **කෙහිචි** යනු ධම්මායතනයෙහි වේදනාදියෙන්. විඤ්ඤාණ ධාතු ප්‍රශ්නයෙහි **තෙ ධම්මා න කෙහිචි** යනු ප්‍රශ්න නැගීමෙන් උපුටන ලද විඤ්ඤාණ ධාතු පදය හැර සෙසු විඤ්ඤාණ ධාතු ධම්ම සය, රූපය, නිවණද. ඒවායින් සියළු ස්කන්ධ ධාතු ආයතනවල සංග්‍රහ කරන ලද බැවින් කිසි ස්කන්ධවලින් ආයතනවලින් හෝ විප්‍රයුක්ත නොකරන ලදී. **එකාය ධාතුයා** යනු යම් යම් ප්‍රශ්නයකින් උපුටන ලද වේද ඒ ඒවායින්. උපේක්ෂා ඉන්ද්‍රිය ප්‍රශ්නයෙහි **පඤ්චහි** යනු උපේක්ඛා යුක්ත චකඛු විඤ්ඤාණ ධාතු ආදියෙන්. මෙම නයින් සියළු තැන ප්‍රශ්න නැගීමෙන් උදුරන ලද පදය සමග විප්‍රයුක්තයන්ගේ වශයෙන් අර්ථය දතයුතුය.

සම්ප්‍රයුක්තයෙන් විප්‍රයුක්ත පද නිමා විය.

දැන් විප්‍රයුක්තයෙන් සම්ප්‍රයුක්ත පද බෙදීමට **රූපකබඤඤන** යනාදිය අරඹන ලදී. එහි සියළු ප්‍රශ්න හිස් ප්‍රශ්න මෙනි. රූපස්කන්ධයෙන් විප්‍රයුක්ත නම් ස්කන්ධ සතරය. ඒවායේ අනිත් ඒවා සමග සම්ප්‍රයෝගයක් නැත. වේදනා ස්කන්ධයෙන් විප්‍රයුක්ත රූපය හා නිවණය. එහිද කිසිවකින් සම්ප්‍රයෝගයක් නැත. සියළු පදවල මෙසේය. විප්‍රයුක්තයන්ගේ වනාහි සම්ප්‍රයෝග අභාවය දතයුතුය. මෙසේ ප්‍රශ්න කිරීමෙන් හිස්බව සියළු විසඳුම්වල නැත නැත යයි මෙසේ කියන ලදී.

විප්‍රයුක්තයෙන් සම්ප්‍රයුක්ත පද නිමා විය.

දැන් සම්ප්‍රයුක්තයෙන් සම්ප්‍රයුක්ත පද බෙදීමට වෙදනකඛන්ධන යනාදිය අරඹන ලදී. එහි ස්කන්ධාදි වශයෙන් යම් පදයක් සම්ප්‍රයුක්තය. නැවත එහිම ස්කන්ධාදියෙන් සම්ප්‍රයෝගය අසා විසඳන ලදී. එය රූපයෙන් හෝ රූප මිශ්‍රකයෙන් හෝ සියළු රූපස්කන්ධ ග්‍රාහකපදවලින් හෝ නොයෙදේ. රූපයෙන් වනාහි රූප මිශ්‍රනයෙන් හෝ අනිකකගේ සම්ප්‍රයෝගයක් නැත. සියළු රූපස්කන්ධ සංග්‍රාහකවලින් සම්ප්‍රයෝගයට සුදුසු සියළු ස්කන්ධාදීන්ගේ ගැනීම වූ හෙයින් අනිකක් නැත. එය සමග සම්ප්‍රයෝගයට යම් පදයක් යන්නේ නම් එබඳු වූ පද මෙහි නොගන්නා ලදී. රූපයෙන් අසම්මිශ්‍ර පද අරූපයේ ඒකදෝසයක් පෙන්වයි. ඒවා මෙහි ගන්නා ලදී.
ඒවායේ උදානය මෙසේය.

අරූ කඳ සතරය - මන ආයතන එකමය
විනැණ දා සත වේ - දෙ සස් ඉඳුරන් තුදුසය

පිළිසුපා දොළොස - එයින් පසු වන සොළොසය
තිකයෙහි අටපදය - පොකුරෙහි තෙ සාළිස් පද

මහතර දුකෙහි සත් - පද පිටදුකෙහි සය පද
මෙම නිදසයෙහි පද - ගියේ නවයකි සඟරා

සියළු ප්‍රශ්නවල ප්‍රශ්නයෙන් යම් ධර්මයක් උපුටන ලද නම් ඒවාම සම්ප්‍රයුක්ත වේ. ඒවායේ හැටියට ස්කන්ධාදි භේදය දතයුතුය. ඉතිරි ස්කන්ධ තුන වේදනා ස්කන්ධයෙන් සම්ප්‍රයුක්තය. නැවත ඒවායින් වේදනා ස්කන්ධය සම්ප්‍රයුක්තය. එය ඒ සංඥාදියෙන් ස්කන්ධ තුනෙන් එක් මනායතනයෙන් විඤ්ඤාණ ධාතු සතෙන් එක් ධම්මායතනයෙහි ධම්ම ධාතුවෙන් ද කිසියම් සංඥා සංස්කාරවලින්ම සම්ප්‍රයුක්ත වේ. සියළු තැන්හි මෙම නයම වේ.

සම්ප්‍රයුක්තයෙන් සම්ප්‍රයුක්ත පද නිමා විය.

දැන් විප්‍රයුක්තයෙන් විප්‍රයුක්ත පද බෙදීමට **රූපකඛන්ධෙන** යනාදිය අරඹන ලදී. එහි සම්ප්‍රයෝග විප්‍රයෝග පද නිර්දේශයෙහි රූපස්කන්ධාදි ධර්ම උදුරන ලදද සියළු ප්‍රශ්නවල එයට උදුරන ලදී. සමාන විසඳීම්වල වනාහි එකක් වශයෙන් ගන්නා ලද පද වෙනත් පටිපාටියකින් පැමිණියේ වේ. එහි යම් පදයක් ප්‍රශ්නයෙන් උපුටන ලද නම් එය යම් ධර්මවලින් විප්‍රයුක්තය. ඒවායේ හැටියට ස්කන්ධ විභාගය දතයුතුය. රූපස්කන්ධයෙන් වේදනාදිය විප්‍රයුක්තය. ඒවායින් රූප ස්කන්ධය ද විප්‍රයුක්තය. නිවණ සුඛුම රූප ගතිය. ඒ රූපස්කන්ධය ස්කන්ධ සතරින් එක් මනායතනයෙන් විඤ්ඤාණ ධාතු සතෙන් ධම්මායතන ධම්ම ධාතුවල කිසි වේදනාදි ධර්මවලින් විප්‍රයුක්තය. සියළු තැන මෙම නයම වේ.

විප්‍රයුක්තයෙන් විප්‍රයුක්ත පද නිමා විය.

දැන් සංගෘහීතයෙන් සම්ප්‍රයුක්ත විප්‍රයුක්ත පද බෙදීමට **සමුදය සච්චෙන** යනාදිය අරඹන ලදී. එහි සංගෘහීත පද නිර්දේශයෙහි යම් සමුදය සත්‍යාදිය උදුරන ලද නම් සියළු ප්‍රශ්නවල ඒවායින්ම උදුරන ලදී. සමාන විසඳුම්වල වනාහි එකක් වශයෙන් ගන්නා ලද පද වෙනත් පටිපාටියකින් පැමිණි ඒවාය. එහි ධර්ම ප්‍රශ්නයෙන් උදුරන ලද පදයෙන් ස්කන්ධාදි සංග්‍රහයෙන් සංගෘහීතය. ඒවායේ යම් පදවලින් සම්ප්‍රයෝග හෝ විප්‍රයෝග වේ. ඔවුන්ගේ වශයෙන් ස්කන්ධාදි විභාගය දතයුතුය.

මේ එහි නය වේ. පළමුව සමුදය සත්‍යයෙන් සංස්කාර ස්කන්ධය ඇතුළත් ධර්ම ස්කන්ධාදි සංග්‍රහයෙන් සංගෘහීතය. ඒවා ද ස්කන්ධ තුනෙන්, මනායතන එකකින් විඤ්ඤාණ ධාතු සතෙන් සංස්කාර ස්කන්ධයෙහි ධම්මායතන ධම්ම ධාතුවල ද තෘෂ්ණාව හැර සෙස්සෙන් සම්ප්‍රයුක්තය. කිසිවකින් සම්ප්‍රයුක්ත නමී. රූපස්කන්ධ එකකින් රූපායතන දහයකින් රූප ධාතුවලින් ද විප්‍රයුක්තය. එක් ධර්මායතනයෙහි ධර්ම ධාතුවේද රූප නිබ්බාණවලින් විප්‍රයුක්තය. කිසිවකින් විප්‍රයුක්ත නමී. මේ උපායෙන් සියළු තැන අර්ථය දතයුතුය.

සංගෘහීතයෙන් සම්ප්‍රයුක්ත විප්‍රයුක්ත පද නිමා විය.

දැන් සම්ප්‍රයුක්තයෙන් සංගෘහීත අසංගෘහීත පද බෙදීමට වෙදනකඛන්ධෙන යනාදිය ආරම්භ කරන ලදී. එහි සම්ප්‍රයුක්තයෙන් සම්ප්‍රයුක්ත පද නිර්දේශයෙහි වේදනා ස්කන්ධාදි යම් ධර්ම උදුරන ලදද සියළු ප්‍රශ්නවල ඒවාම උදුරන ලදී. එහි ප්‍රශ්නයෙන් උදුරන පදයෙන් යම් ධර්ම සම්ප්‍රයුක්ත වේ. ඒවායේ ම සංග්‍රහය හෝ අසංග්‍රහය වේ. ඒවායෙහි වසයෙන්ම ස්කන්ධාදි භේදය දතයුතුය. එය නය මෙසේය. වේදනා ස්කන්ධය සංඥාදියෙන් සම්ප්‍රයුක්තය. ඒ සංඥාදිය, සංඥාදි ස්කන්ධ තුනෙන් ධම්මායතන දෙකෙන් මනායතනවලින් ධම්ම ධාතුවෙන් ද විඥාන ධාතු සතෙන්දෑයි ධාතු අටකින් සංගෘහීතය. සෙසු ස්කන්ධ ආයතන ධාතුවලින් අසංගෘහීතය. මේ උපායෙන් සියළු තැන අර්ථය දතයුතුය.

සම්ප්‍රයුක්තයෙන් සංගෘහීත අසංගෘහීත පද නිමා විය.

දැන් අසංගෘහීතයෙන් සම්ප්‍රයුක්ත විප්‍රයුක්ත පද බෙදීමට රූපකඛන්ධෙන යනාදිය අරඹන ලදී. එහි පස්වැන්නෙහි අසංගෘහීතයෙන් අසංගෘහීත පද නිර්දේශයෙහි රූපස්කන්ධයෙන් යම් සමාන ප්‍රශ්න ධර්මම අරූපභවයෙන් සමානය. ඒවාම උපුටන ලදී. සෙස්ස වනාහි නො නැගේ යයි නොඋදුරන ලදී. වේදනා ස්කන්ධයෙන් ස්කන්ධ වශයෙන් රූප අරූප ධම්ම අසංගෘහීත වේ. ඒවායේ ද සම්ප්‍රයෝගයක් නම් නැත. ඒ නිසා යම් පද නැගේ ද ඒවාම සමාන විසඳුම් සමග එක්කොට උදුරන ලදී. එහි ප්‍රශ්නයෙන් උදරන ලද ධර්මවලින් ස්කන්ධ වශයෙන් යම් පද අසංගෘහීත ද ඒවාම සම්ප්‍රයුක්ත විප්‍රයුක්ත වේ. ඒවායෙහි වශයෙන් ස්කන්ධ විභාගය දතයුතුය. එහි නය මෙසේය යන රූපස්කන්ධයෙන් පළමුව විඤ්ඤාණයම සංග්‍රහ තුනෙන් අසංගෘහීතය. වේදනාදි ස්කන්ධ තුනෙන් ධම්මායතන ධම්ම ධාතුවල ද වේදනාදියෙන් ම එය සම්ප්‍රයුක්තය. එක් රූපස්කන්ධයකින් දස රූපායතන රූපධාතුවලින් ධම්මායතන ධම්ම ධාතුවලද රූප නිර්වාණ ධර්මවලින් විප්‍රයුක්තය. ඒ සඳහා **තෙ ධම්මා තීහි ඛන්ධෙහි** යනාදිය කියන ලදී. මේ නයින් සියළු තැන අර්ථය දතයුතුය.

අසංගෘහීතයෙන් සම්ප්‍රයුක්ත විප්‍රයුක්ත පද නිමා විය.

දැන් විප්‍රයුක්තයෙන් සංගෘහීත අසංගෘහීත පද බෙදීමට රූපකබන්ධන යනාදිය අරඹන ලදී. එහි යම් පදවල විප්‍රයෝගය නො නැගේද ඒවා මේ වාරයෙහි නොගන්නා ලදී. ඒවා වනාහි කුමන ඒවා ද? ධම්මායතනාදියයි. ස්කන්ධාදියෙහි ධම්මායතනයේ එකකින්වත් විප්‍රයෝගය නො නැගේ. ධම්ම ධාතු ආදියෙහි ද මෙම නයම වේ. ඒවායෙහි උදානය.

දම් ආයතන දම් - දා ජීවිත ඉඳුරු යන
නම් රූ පද ඇතිව - සය ආයතන සමගින්

දෑ ජර මර නැනද - විසි තිකෙහි එක් පදයද
අවසන් තිකෙහි එක - සුළු අතුරු සත්පද යන

පොකුරෙහි දසය වේ - මහ අතුරු තුදුසය යන
එයින් මතු ස පදය - එකතුවෙන් පද සියළුම
සත් සාළිසක් දම් - නො ලැබෙයි (විනිස දන්නේ)

අවසානයෙහි ද ධම්මායතනං ධම්මධාතු යන ගාථාව ද මෙම අර්ථයම දැක්වීමට කියන ලදී. මේවා හැර සෙසු සියල්ලම ලැබේ. ඒවායෙහි ස්කන්ධ විභාගය කියන ලද අනුසාරයෙන් ම දතයුතුය.

විප්‍රයුක්තයෙන් සංගෘහීත අසංගෘහීත පද නිමා විය.

මෙපමණකින්

දා බෙදුමෙහි නිපුණ - මුනිසඳ කී දා කතා
එහි නයමුක බෙදුම් - පැවසුම් නිමාවිය දැන්

මේ නයමුක බෙදුම් - කීමෙන් හැක වියතුනට
සියළු නය දැනුමට - සැකවින් කියැවුණ කතා

එකෙක පදය ඉදින් - විතර විසින් පැවසුණොත්
බහුලව වචන මිස - අරුතෙහි වෙනසෙක් නොවේ

උනු බණවර දෙකින් - ම විසින් කළ හෙළබසින්
මෙනිසා ලැබූ පින් - ලොව සුව පිණිස වේවා

පරමත්ථදීපනී නම් පඤ්චප්පකරණට්ඨ කථාවේ ධාතුකථාප්පකරණ
අත්ථවණ්ණනාවට කළ සිංහල පරිවර්තනය
නිමි.

නිපුණ'රු'තැනි ධාතු - බේදය කියන පකරණා
'ධාතුකතා' නමින් - දෙසා සුරලොව බුදුරජ

ඉන් අනතුරුව මුනි - පැණවුම්බේද දක්වන
කී පුඟුල් පැණවුම - ලොවැ අගම පුඟුලාවන

එහි වැනුම් අවසර - දැන් පැමිණැති නිසා
වනමි එය එනිසා - එය'සනු සන්සුන් සිතින්

ඡ පඤ්ඤතතියො බන්ධපඤ්ඤතති -පෙ- පුගල පඤ්ඤතති යනු මෙය පුගල පඤ්ඤතතියේ උද්දේසයයි. එහි ඡ යනු ගණන වෙන්කිරීමය. මෙහි යම් ධර්ම පණවනු කැමතිව ඒවායේ ගණන් වශයෙන් සංක්ෂේපයෙන් එයින් පැණවුම් වෙන්කිරීම දක්වයි. පඤ්ඤතතියො යනු වෙන්කළ ධර්ම නිදර්ශනයයි. එහි 'ආචිකඛති, දෙසෙති පඤ්ඤපෙති, පට්ඨපෙති' යනු පැමිණි තැන්වල දැක්වීම, පැවසීම, පැණවුම නම් වේ. 'සුපඤ්ඤතතං මඤ්ච පීඨං' යයි පැමිණි තැන තැබීම බහා තැබීම මෙහි පඤ්ඤතති නම් දෙකම වටී. ඡ පඤ්ඤතතියො යනු පැණවීම් හයක් දැක්වීම් පැවසීම්ද හයක් තැබීම් බහාතැබීම් හයක් මෙහි අභිප්‍රේතය. නාම පඤ්ඤතති වනාහි ඒ ඒ ධර්ම දක්වන්නේ ද ඒ ඒ කොටසින් තබයි.

බන්ධ පඤ්ඤතති යනාදිය වනාහි සංක්ෂේපයෙන් ඒ ප්‍රඥප්තීන්ගේ ස්වරූපය දැක්වීමයි. එහි ස්කන්ධයන්ගේ ස්කන්ධ යයි පැණවීම, දැක්වීම, පැවසීම, තැබීම, බහාතැබීම ස්කන්ධ ප්‍රඥප්ති නම් වේ. ආයතනයන්ගේ ආයතනයයි. ධාතූන්ගේ ධාතු යයි, සත්‍යයන්ගේ සත්‍ය යයි, ඉන්ද්‍රියන්ගේ

ඉන්ද්‍රිය යයි පුද්ගලයන්ගේ පුද්ගල යයි පැණවීම, දැක්වීම, පැවසීම, තැබීම, බහා තැබීම පුද්ගල ප්‍රඥප්ති නම් වේ.

අටුඨකථා නයින් අන්‍ය වූ පාළි මුක්තකයෙන් අන්‍ය වූ ප්‍රඥප්ති භයක් දක්වයි. විද්‍යමාන ප්‍රඥප්තිය, අවිද්‍යමාන ප්‍රඥප්තිය, විද්‍යමානයෙන් අවිද්‍යමාන ප්‍රඥප්තිය, අවිද්‍යමානයෙන් විද්‍යමාන ප්‍රඥප්තිය, විද්‍යමානයෙන් විද්‍යමාන ප්‍රඥප්තිය, අවිද්‍යා මෝහයෙන් අවිද්‍යමාන ප්‍රඥප්තිය ඒ සයයි. එහි කුසල් අකුසල් වශයෙන් සත්‍යාර්ථ පරමාර්ථ වශයෙන් විද්‍යමාන පවතින ධර්මය පැණවීම විද්‍යමාන ප්‍රඥප්ති නම් වේ. එසේම අවිද්‍යමාන වූ ලෝකයාගේ ව්‍යවහාර මාත්‍රයෙන් ඇති ස්ත්‍රී පුරුෂභාවාදියේ පැණවීම අවිද්‍යමාන ප්‍රඥප්ති නම් වේ. සියළු ආකාරයෙන් නො ලැබෙන්නා වූ වචන වස්තු මාත්‍රයෙන්ම පංචම සත්‍යාදික වූ තීර්ථකයින්ගේ අණු ප්‍රකෘති පුරුෂාදිය පැණවීම ද හෝ අවිද්‍යමාන ප්‍රඥප්තිම වේ. එය වනාහි සාසනාවචර නොවේ යයි මෙහි නොගන්නා ලදී. මෙසේ මේවායේ විද්‍යමාන අවිද්‍යමානාදියේ විකල්පන වශයෙන් සෙස්ස දතයුතුය.

තෙ විජ්ජා ඡළභිඤ්ඤා යනාදියෙහි වනාහි ත්‍රිවිද්‍යා ෂට් අභිඥා විද්‍යමානය. පුද්ගලයා අවිද්‍යමානය. එහෙයින් ත්‍රිවිද්‍යා මොහුට ඇත්තේනුයි තෙවිජ්ජෝ වේ. ෂට්භිඥා මොහුට ඇත්තේනුයි ඡළභිඤ්ඤෝ වේ. මෙසේ විද්‍යමානයෙන් අවිද්‍යමානයේ පැණවීමෙන් මෙබඳු වූ විද්‍යමානයෙන් අවිද්‍යමාන වූ ප්‍රඥප්ති නම් වේ. ස්ත්‍රී රූප පුරුෂ රූප යනාදියෙහි වනාහි ස්ත්‍රී පුරුෂයෝ අවිද්‍යමාන වෙති. රූපය විද්‍යමාන වේ. ඒ නිසා ස්ත්‍රියගේ රූපය ඉත්ථිරූප වේ. පුරුෂයාගේ රූපය පුරිස රූප වේ. මෙසේ අවිද්‍යමානයෙන් විද්‍යමානයේ පැණවීමෙන් මෙබඳු වූ අවිද්‍යමානයෙන් විද්‍යමාන ප්‍රඥප්ති නම් වේ. චකඛු සමඵසෙසා සොත සමඵසෙසා යනාදියෙහි චකඛු සෝතාදිය ද ස්පර්ශය ද විද්‍යමානයට වේ. ඒ නිසා චක්ඛුවෙහි ස්පර්ශය, චක්ඛුවෙන් හටගත් ස්පර්ශයයි. චක්ඛුවෙහි ඵලයක් වූ විද්‍යමානයේ පැණවීමෙන් මෙබඳු වූ විද්‍යමානයෙන් විද්‍යමාන ප්‍රඥප්ති නම් වේ. බතතිය පුතෙතා බ්‍රාහ්මණ පුතෙතා සෙටඨී පුතෙතා යනාදියෙහි ක්ෂත්‍රියාදීහු අවිද්‍යමාන වෙති. පුත්‍රයෝ ද අවිද්‍යමාන වෙති. ඒ නිසා ක්ෂත්‍රියයාගේ පුතා බතති ය පුතෙතා යයි මෙසේ අවිද්‍යමානයෙන් අවිද්‍යමානයේ පැණවීමෙන් මෙබඳු වූ අවිද්‍යමානයෙන් අවිද්‍යමාන ප්‍රඥප්ති නම් වේ. ඒවා අතරෙන් මේ ප්‍රකරණයෙහි පළමු ප්‍රඥප්ති තුන ලැබේ.

බන්ධ පඤ්ඤත්ති -පෙ- **ඉන්ද්‍රිය පඤ්ඤත්ති** යන මෙතැන විද්‍යමානයම පණවන ලද බැවින් විද්‍යමාන ප්‍රඥප්ති ලැබේ. **පුග්ගල පඤ්ඤත්ති** යන පදයෙහි අවිද්‍යමාන ප්‍රඥප්ති වේ. **තෙවිජෙජා ඡළභිඤ්ඤා** යනාදියෙහි විද්‍යමානයෙන් අවිද්‍යමාන ප්‍රඥප්ති ලැබේ.

අටුවා මුක්තක ආචාර්යයා විසින් වනාහි අන්‍ය වූ ද ප්‍රඥප්ති, සයක් පනවන ලදී. උපාදා ප්‍රඥප්ති, උපනිධා ප්‍රඥප්ති, සමොධාන ප්‍රඥප්ති, උපනිකඛිත්ත ප්‍රඥප්ති, තජ්ජා ප්‍රඥප්ති, සනතති ප්‍රඥප්ති යනු ඒවාය. එහි යමෙක් රූප වේදනාදියෙහි එකකින් හෝ අනිකකින් රූප වේදනාදිය මෙන් සත්‍යාර්ථ පරමාර්ථයෙන් නොලැබෙන ස්වභාවයේ ද රූප වේදනාදි භේද වූ ස්කන්ධයන් ගැනීම නිසා, කාරණය කොට සම්මත වූ සංඝා, ඒ ඒ අංග ගෙන රථය, ගෙය, මිට, උදුන යයි ඒවා ඒ රූපම ගෙන කළය, වස්ත්‍රය සඳ හිරු ගමන ගෙන කාලය, දිසා, ඒ ඒ භූත නිමිති ද භාවනා ආනිසංස ද ගෙන කරුණු කොට සම්මත ඒ ඒ ආකාරයෙන් එළඹී උද්ග්‍රහ නිමිත්ත ප්‍රතිභාග නිමිත්ත යයි මෙබඳු රූප වූයේ උපාදා ප්‍රඥප්ති නම් වේ. පැණවිය යුතු අර්ථයෙන් ද මේවා ප්‍රඥප්ති නම් වේ. පැණවීම් අර්ථයෙන් නොවේ. ඒ අර්ථය යමක් පැණවීම, මෙය අවිද්‍යමාන ප්‍රඥප්ති නම් වේ. යම් පළමු දෙවන ආදිය සමාන කොට දෙවන තුන්වන ආදිය එකිනෙක සමානකොට දිග, කෙටි, දුර, ලඟ ආදිය පැණවීම යන මේවා උපනිධා ප්‍රඥප්ති නම් වේ. තවද මේ උපනිධා ප්‍රඥප්ති එය අනිත් බලාපොරොත්තු සමානකොට, අතට පත් දේ සමානකොට, සම්ප්‍රයුක්ත දේ සමානකොට, ආරෝපනය කළ දේ සමානකොට, ලඟ වූ දේ සමානකොට, එය බහුල වූ දේ සමානකොට, සමාන දේ සමානකොට, එයින් විශිෂ්ට වූ දේ සමානකර යනාදි වශයෙන් අනේකප්‍රකාර වේ.

එහි දෙවන තුන්වන යනාදිය ද එය අන්‍ය වූ බලාපොරොත්තු වී කියන ලද්ද තදඤ්ඤාපෙකඛ්‍යපනික නම් වේ. ඡතපාණී, සත්තපාණී යනාදිය අතටපත් දේ සමානකොට කියන ලද බැවින් හත්ථගතූපනියා නම් වේ. කොඩොල් ඇති, පර්වතය, ඔටුණු ඇති ආදිය සම්ප්‍රයුක්ත සමානකොට කියන ලද බැවින් සමපයුතතූපනිධා නම් වේ. ඉඳුසල් ගුහාව, පියගු ගුහාව, විමානය යනාදිය දුර නොවියයි සමානකොට කියන ලද බැවින් අවිදූරගතූපනිධා නම් වේ. රන්වන්, උසභගාමී යනාදිය ප්‍රතිභාගය සමානකොට කියන ලද බැවින් පටිභාගූපනිධා නම් වේ. පියුම් විළ,

බමුණුගම යනාදිය එය බහුල ලෙස සමානකොට කියන ලද බැවින් තබ්බහුලූපනිධා නම් වේ. මැණික් වලල්ල, දියමන්ති වලල්ල යනාදිය එය විශිෂ්ට කොට කියන ලද බැවින් තබ්බිසිට්ඨූපනිධා නම් වේ. යමක් වනාහි ඒ ඒ එකතුකිරීම් බලා ත්‍රිදණ්ඩ, අටපදය, ධාන්‍ය රාශිය, මල්රැස යනාදිය පැණවීම යන මෙය සමොධාන පඤ්ඤත්ති නම් වේ. යමක් පෙර වූ දේ බහා තබා දෙක, තුණ, හතර යනාදිය පැණවීම යන මෙය උපනිකඛිත ප්‍රඥප්ති නම් වේ. යමක ඒ ඒ ධර්ම ස්වභාවය බලා පෘථිවිය, උෂ්ණය, කර්කෂ බව, උණුසුම යනාදිය පැණවීම යන මෙය තජජාපඤ්ඤත්ති නම් වේ. යමක පරම්පරාව කැඩුණු බව අපේක්ෂාකොට අසූව, අනූව යනාදිය පැනවීම යන මෙය සනතති පඤ්ඤත්ති නම් වේ. මේවායින් තජජා පඤ්ඤත්ති විද්‍යමාන ප්‍රඥප්තිය වේ. සෙස්ස අවිද්‍යමාන පඤ්ඤය ද අවිද්‍යමානයෙන් අවිද්‍යමාන ප්‍රඥප්ති පඤ්ඤය ද සෙවිනේ වේ.

අටුවා මුක්තක ආචාර්යවරයා විසින්ම අන්‍ය වූ ද පැණවුම් හයක් දක්වන ලදී. කෘත්‍ය ප්‍රඥප්ති, සඤ්ඤාන ප්‍රඥප්ති, ලිංග ප්‍රඥප්ති, භූමි ප්‍රඥප්ති, පවත්තත ප්‍රඥප්ති, අසංඛත ප්‍රඥප්ති ඒවාය. එහි භාණක ධර්මකථික ආදි කෘත්‍ය වශයෙන් පැණවීම කෘත්‍ය ප්‍රඥප්ති නම් වේ. කෘෂ, ස්ථූල, රවුම්, හතරැස් ආදි සටහන් වශයෙන් පැණවීම සඤ්ඤාපන පඤ්ඤත්ති නම් වේ. ස්ත්‍රී, පුරුෂ ආදි ලිංග වශයෙන් පැණවීම ලිංග ප්‍රඥප්ති නම් වේ. කාමාවචර, රූපාවචර, අරූපාවචර, කෝසලක මාධුර යනාදි භූමි වශයෙන් පැණවීම භූමි ප්‍රඥප්ති නම් වේ. තිස්ස, නාග, සමන යනාදි වෙන් වෙන් නම් තැබීම් වශයෙන් පැණවීම පවත්තත ප්‍රඥප්ති නම් වේ. නිරෝධ නිබ්බාණං ආදි අසංඛත ධර්මයේ පැණවීම අසංඛත ප්‍රඥප්ති නම් වේ. එහි ඇතැම් භූමි ප්‍රඥප්ති සහ අසංඛත ප්‍රඥප්ති ද විද්‍යමාන ප්‍රඥප්ති වේ. කෘත්‍ය ප්‍රඥප්තිය විද්‍යමානයෙන් අවිද්‍යමාන පඤ්ඤය භාජනය කරයි. සෙස්ස අවිද්‍යමාන ප්‍රඥප්ති වේ.

දැන් යම් ඒ ප්‍රඥප්තීන්ගේ උද්දේස වාරයෙහි සංක්ෂේපයෙන් ස්වරූපය දැක්වීම කරන ලදී. සංක්ෂේපයෙන් ඒවායේ වස්තු බෙදා දර්ශන වශයෙන් ඒවා දැක්වීමට **කිත්තනාවතා** යනාදිය කීය. එහි පළමුවෙන් ප්‍රශ්නයෙන් මේ අර්ථය දතයුතුය. යම් ඒ මේ ස්කන්ධයන්ගේ ස්කන්ධ යයි පැණවීම, තැබීම, එය කොතෙකින් වේද? කියනු කැමැත්තෙන් **ඇසීමය. මෙයින් පසු කිත්තනාවතා ආයතනානං** ආදියෙහි ද මෙම නයම වේ. විසඳීමෙහි ද අර්ථය මෙසේ දතයුතුය. යම් පමණකින් සංක්ෂේපයෙන්

පැණවීමෙන් **පංචස්කන්ධයයි** හෝ ප්‍රභේද වශයෙන් **රූපකඛන්ධො** -පෙ- **විඤ්ඤාණකඛන්ධො** යයි හෝ එහිද රූපස්කන්ධය කාමාවචරය. සෙස්ස චතුභූමිකය හෝ මෙබඳු වූ පැණවීම් වේ. මෙපමණකින් ස්කන්ධයන්ගේ ස්කන්ධ යයි පැණවීම වේ. එසේම යම් පමණකින් සංක්ෂේපයෙන් පැණවීමෙන් **දවාදසායතනානි** යයි හෝ ප්‍රභේද වශයෙන් **චකඛායතනං** --පෙ- **ධම්මායතනං** යයි එහි ද දස ආයතන කාමාවචරය. ආයතන දෙකක් චතුභූමික හෝ මෙබඳු වූ පැණවීම් වේ. මෙපමණකින් ආයතනයන්ගේ **ආයතන** නය පැණවීම වේ.

යම් පමණකින් සංක්ෂේපයෙන් පැණවීමෙන් **අට්ඨාරස ධාතුයො** (දහඅටක් ධාතු) යයි හෝ ප්‍රභේද වශයෙන් **චකඛු ධාතු** -පෙ- **මනොවිඤ්ඤාණ ධාතු** යයි හෝ එහි ද සොළොස් ධාතු කාමාවචරය. ධාතු දෙකක් චතුභූමික හෝ මෙබඳු වූ පැණවීම් වේ. මෙපමණකින් ධාතූන්ගේ ධාතු යයි පැණවීම වේ. යම් පමණකින් සංක්ෂේපයෙන් පැණවීමෙන් **චතතාරි සචචානි** යයි හෝ ප්‍රභේද වශයෙන් **දුකඛ සචචං** -පෙ- **නිරොධ සචචං** යයි හෝ එහි ද සත්‍ය දෙකක් ලෞකිකය. සත්‍ය දෙකක් ලෝකෝත්තර යයි හෝ මෙබඳු රූප පැණවීම් වේ. මෙපමණකින් සත්‍යයන්ගේ **සචචානි** යයි පැණවීම් වේ. යම් පමණකින් සංක්ෂේපයෙන් පැණවීමෙන් **බාවීසතින්ද්‍රිය** යයි හෝ එහිද ඉන්ද්‍රිය දහයක් කාමාවචරය. ඉන්ද්‍රිය නවයක් මිශ්‍රකය. ඉන්ද්‍රිය තුනක් **ඉන්ද්‍රියානි** යයි පැණවීම් වේ. මෙපමණකින් සංක්ෂේපයෙන් වස්තූන් බෙදා දර්ශන වශයෙන් පැණවීම් පහක් දක්වන ලද්දේ වේ.

දැන් විස්තර වශයෙන් වස්තූන් බෙදා දර්ශන වශයෙන් පුද්ගල පැණවීම් දැක්වීමට **සමය විමුත්තෙනා අසමය විමුත්තෙනා** යනාදිය කීය. සම්මා සම්බුද්ධයන් වහන්සේ විසින් තලවල පැතිරෙමින් පවතින මෙත් සුඹුලෙහි තීරය මෙන් ද යට විහංගපකරණයෙහි මේ පස්ආකාර වූ පැණවීම්වලට වස්තු වූ ස්කන්ධාදිය නිප්පදේස වශයෙන් කියන ලදැයි එහෙයින් මෙහි ඒකදේස වශයෙන් කීවේය. පුද්ගල ප්‍රඥප්ති හය යට නොකියන ලදමය. මෙහිද උද්දේස වාරයෙහි ඒකදේසයකින්ම කියන ලදී. එහෙයින් එය විස්තර වශයෙන් කියනු කැමැත්තේ **සමය විමුත්තෙනා අසමය විමුත්තෙනා** යයි එකේ පටන් දහය දක්වා මාතෘකා තැබීය.

පුද්ගල ප්‍රඥප්ති මාතෘකා නිමියේය.

දැන් තබන ලද මාතෘකා මුල සිට බෙදා දැක්වීමට **කතමෝ ච පුග්ගලෝ සමයවිමුත්තෝ** යනාදිය කීය. එහි ඉධ යනු මේ සත්ත්ව ලෝකයෙහි **එකච්චෝ පුග්ගලෝ** යනු එක් පුද්ගලයෙක්. **කාලෙන කාලං** යනු මෙහි භූමි වශයෙන් අර්ථය දතයුතුය. එක එක කාලය යයි කියන ලදී. **සමයෙන සමයං** මෙය පෙරසේය. ඒ පැසෙන දහම්වලින් මිදීමෙන් විමොක්ඛ නම් වේ. **කායෙන** යනු විමෝක්ෂය සමග ඇතිවූ නාම කයින්. **ඵුසිත්වා විහරති** යනු ප්‍රතිලාභ ලැබ ඉරියව් පවත්වයි. කුමන කාලයක විමුක්තිය ලැබ වාසය කරයිද? සමාපත්තියට සමවැදීමට කැමැත්තාට කාලය නම් ඇත. අකාලයක් නම් නැත. එහි උදෑසනම සිරුර පිළිදැගුම් කරන කාලයයි. වත් කරන කාලය ද සමවදින්නාට අකාල නම් වේ. ශරීර කෘත්‍ය කර වත්කොට වසන තැනට පිවිස සිටින්නාට පිඬු පිණිස හැසිරෙන කාලය නො පැමිණියේ ද මේ අතරෙහි සමවදින්නාට කාලය වේ. පිඬු සිඟා යන කාලය සලකා නික්මෙන්නාට චේතිය වඳින කාලය, බික්ඛාගන ගමේ හැසිරෙන කාලය, ආසන සාලාවෙහි කැඳ වළඳන කාලය, වත් පිළිවෙත් කරන කාලය යයි මෙය ද සමවදින්නාට අකාල නම් වේ. ආසන සාලාවෙහි විවේක අවසරයක් ඇති කල්හි දාන වෙලාව නො පැමිණිවිට මේ අතරෙහි ද සමවදින්නාට කාලය වේ. දන් වළඳන කාලය විහාරයට යන කාලය පා සිවුරු තැන්පත් කරන කාලය දිවා වත් කරන කාලය විමසීම් දෙන කාලය යයි මෙය ද සමවදින්නාට අකාලද අසමය ද වේ. ඒ සියල්ල හැර අවසේස කාලයෙහි අවසේස සමයෙහි කියන ලද ආකාරයෙහි විමෝක්ෂ අට සමග නාම කයින් ඇතිවූ ප්‍රතිලාභ ලැබ වාසය කරන්නේ **ඉධෙකච්චෝ පුග්ගලෝ -පෙ- විහරති** යයි කියනු ලැබේ. තවද මෙය ස්පර්ශය සමග හටගත් ධර්මවලින් සමග හටගත් ධර්ම ස්පර්ශ කෙරේ නම් වේ. උපචාරයෙන් අර්පණාව ස්පර්ශ කෙරේනම් වේ. පෙර අර්පණාවෙන් පසු අර්පණාව ස්පර්ශ කෙරේ. යමක් සමග යම් ධර්ම හටගත්තේ නම් එයින් එසේ ප්‍රතිලාභ නම් වේ. ස්පර්ශයෙන් ද ස්පර්ශ කළා නම් වේ. උපචාරය ද අර්පණාවෙන් ප්‍රතිලාභ කරුණකි. පෙර අර්පණා පසු අර්පණා ද එසේය. එහි සහජාතවලින් සහජාතවල ස්පර්ශ කිරීම දතයුතුය. ප්‍රථම ධ්‍යානයෙහි විතකකාදි අංග පහ. එහි ඒ අංග හැර සෙසු අතිරේක පනස් දහම් සතර ස්කන්ධ වේ. ඒ නාම කයින් ප්‍රථම ධ්‍යාන සමාපත්ති විමුක්තිය ස්පර්ශ කොට වාසය කරයි. දුතිය ධ්‍යානය පීති සුඛ චිත්ත ඒකග්ගතාවලින් අංග තුනය. තෘතීය ධ්‍යානය සුඛ චිත්ත ඒකග්ගතාවලින් අංග දෙකය. සතරවැනි ධ්‍යානය උපෙකඛා

චිත්ත ඒකග්ගතාවලින් අංග දෙකය. ආකාසානඤ්චායතනය..... නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ද එසේය. එහි ඒ අංග හැර සෙසු අතිරේක පනස් දහම් ස්කන්ධ සතර නම් වේ. ඒ නාම කයින් නේවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්ති විමුක්තිය ස්පර්ශකොට පිළිලැබ වාසය කරයි.

පඤ්ඤාය චස්ස දිසවා යනු සංස්කාර විදර්ශනා ප්‍රඥාවෙන් ද චතුරාර්ය සත්‍ය මාර්ග ප්‍රඥාවෙන් ද දැක. **එකචෙව ආසවා පරිකබ්ණා හොනති** ප්‍රථම මාර්ග ආදියෙන් ආශ්‍රව ක්ෂණ වේ. **අයං වුචචති පුගගලො සමයවිමුතතො** යන මෙහි අෂ්ට සමාපත්තිලාභී පෘථග්ජනයා ඒ නාමකයින් ස්පර්ශකොට වාසය කෙරේ යයි කීමට වටී. පෙළෙහි වනාහි එකචෙව ආසවා පරිකබ්ණාති වුතතං (ඇතැම් ආශ්‍රව පරික්ෂීණා යයි කියන ලදී.) පුහුදුන් පුගුලාට ක්ෂීණ වූ ආශ්‍රවයන් නම් නැත. එනිසා ඔහු නොගන්නා ලදී. අෂ්ට සමාපත්තිලාභී ක්ෂීණාශ්‍රවයන් වහන්සේ ද ඒ නාමකයින් ස්පර්ශකොට වාසය කරති යයි කීමට වටී. උන්වහන්සේ වනාහී ක්ෂීණ නොවූ ආශ්‍රවයන් නැත. එනිසා උන්වහන්සේ ද නො ගන්නා ලදී. **සමය විමුතතො** යනු සෝවාන්, සකෘදාගාමී, අනාගාමී යන තුන්දෙනාම යයි දතයුතුය.

අසමය විමුත්ත නිද්දේසයෙහි පෙර හා සමාන යයි කියන ලද නයින්ම දතයුතුය. අසමය විමුතතො යන මෙහි ශුෂ්ක විදර්ශන ක්ෂීණාශ්‍රවයන් වහන්සේටම නමකි. ශුෂ්ක විදර්ශක වනාහි සෝවාන් සකදාගාමී අනාගාමී තිදෙනා ද අෂ්ට සමාපත්තිලාභී ක්ෂීණාශ්‍රවයන් වහන්සේද පෘථග්ජනයාද මේ දුකයෙහි නොලැබෙති. දුකයෙන් මිදුණු පුද්ගලයෝම වෙති. එනිසා ශාස්තෘන් වහන්සේ තමන් වහන්සේගේ සම්මා සම්බුද්ධ සුබුද්ධතාවෙන් යට ගන්නා ලද්ද ද නොගන්නා ලද්ද ද එකතුකොට පිට පෙරළිය සමග පාළියට නගන්නේ, **සබබෙපි අරිය** පුගගලා යනාදිය කීහ. එහි අරියෙ විමොකෙඛ යනු කෙලෙසුන්ගෙන් දුරුවූ බැවින් ආර්ය සංඛ්‍යාවට පැමිණි කල්හි ලෝකෝත්තර විමෝක්ෂයේ මෙය කියන ලද්දේ වේ. බාහිර වූ අෂ්ට සමාපත්ති සමවදින්නාට සමය ද අසමය ද ඇත. මාර්ග විමෝක්ෂයෙන් මිදෙන්නාට සමය හෝ අසමය හෝ නැත. යමෙකුට ශ්‍රද්ධාව බලවත් වේද, විදර්ශනාව ද අරඹන ලද්දේ ඔහු යනවිට සිටිනවිට හිඳගන්නා විට සයනය කරනවිට අනුභව කරනවිට පරිභෝජනය කරනවිට මාර්ගඵල ප්‍රතිවේධය නම් නොවේ යයි නැත.

මෙසේ මාර්ග විමෝක්ෂයෙන් මිදෙන්නාට සමය හෝ අසමය හෝ නැතැයි යට ගන්නා ලද්දෙහි ද නොගන්නා ලද්දෙහි ද එකතුකොට මේ පිටපෙරළිය බුද්ධි පාළියට නැගීය. සමාපත්තිලාභී පෘථග්ජනයා මේ පාළියෙන් ද නොගෙනම භජනය කරන්නේ සමාපත්තියෙන් විෂ්කම්භනය කරන ලද කෙලෙසුන්ගේ වශයෙන් සමය විමුක්තිභාවය භජනය කරන්නේය.

කුපප ධම්ම අකුපප ධම්ම නිද්දේසයෙහි යමෙකු ලබාගත් සමාපත්තිය වෙනස් වේ. නැසේ. එනිසා කුපප ධම්ම වේ. **රූප සහගතානං** යනු රූප නිමිති සංඛ්‍යාත වූ රූපයෙන් යුක්ත. එය සමග පවතින්නා වූ. රූපාරම්මණය හැර සතර රූපාවචර නොවේය යන අර්ථයයි. අරූප සහගතානං යනු රූපයෙන් අනිකක්. රූප නොවේය යනු අරූප වේ. අරූප සහගතව එය සමග පවත්නා. අරූප අරමුණු හැර සතර අරූපාවචර ධ්‍යාන නොවේය යන අර්ථය වේ. **න නිකාමලාභී** යනු පස් ආකාරයකින් ආවේර්ණ වසීභාවය තමා කැමති ආකාරයෙන් නොලද බැවින්. අල්ප ගුණ සමාපත්ති යන අර්ථයි. **න අකිච්ඡලාභී** යනු අපහසුවෙන් ලබන, දුකසේ ලබන යමෙක් පැමිණෙන කල්හි කෙලෙසුන් විෂ්කම්භනය කරන්නේ, උපචාරයට පැමිණෙන්නේ, අර්පණාවට පැමිණෙන්නේ සිත නැඹුරු කරන්නේ දුකසේ අපහසුවෙන් සංස්කාර සහිතව ප්‍රයෝගයෙන් ක්ලාන්ත වන්නේ ඒ සම්පත්තියට පැමිණීමට හැකිවේ. හෙතෙම අකිච්ඡලාභී නම් නොවේ. **න අකසිරලාභී** යනු මහත්ලාභී නොවේ. සමාපත්තියට නොපැමිණ මාර්ගය වැඩීමට නොහැකි වේ. වරක් හෝ දෙකක් චිත්තවාර වැටී වහා නැගී සිටී යන අර්ථයයි. **යට්ඨිච්ඡකං** යනු යම් අවසරයක සමාපත්තියට නොපැමිණ හිඳගැනීමට කැමති වේ. **යදිච්ඡකං** යන කසිණ ධ්‍යානං හෝ ආණපාණ ධ්‍යානය හෝ බ්‍රහ්මවිහාර ධ්‍යානය හෝ අසුභ ධ්‍යානය හෝ යයි යම් යම් සමාපත්තිවලට නොපැමිණ හිඳගැනීමට කැමති වෙයි. **යාවතිකිච්ඡකං** යනු මාර්ගය පිරිසිඳ යම් පමණ කාලයක් කැමති වේ. මෙය කියන ලද්දේ වේ. යම්තැනක යම් යම් සමාපත්ති යම්පමණ කාලයක් සමවැදීමට නැගී සිටීමට කැමති වේ. ඒ ඒ තැන ඒ ඒ සමාධි එපමණ කාලයක් සමවැදීමට ද නැගීසිටීමට ද නොහැකි වේ. සඳ හෝ තරු හෝ බලා මේ සඳ හෝ හිරු හෝ මෙපමණ තැන් ගියපසු නැගී සිටිමියි සීමාකොට ධ්‍යානයට සමවැදුනේ සීමා කළ ලෙස නැගී සිටීමට නොහැකි වේ. අනතුරුවම නැගිටී. සමාපත්තියට ප්‍රගුණ නොවීම

බැවිනි. **පමාදමාගමමා** යනු ප්‍රමාදය නිසා. **අයං වුච්චති** යනු මෙය මේ ආකාර පුද්ගලයා කුප්ප ධම්ම යයි කියනු ලැබේ. මේ අෂ්ට සමාපත්තිලාභී පෘථග්ජනයා සෝවාන් සකෘදාගාමී යයි පුද්ගලයෝ තුන්දෙනා නම් වෙති. මොවුන්ගේ වනාහි සමාධිය උවදුරු සහිතය. විදර්ශනාව උවදුරු සහිතය. කෙලෙස් ධර්මය මැඩ නොපැවැත්විය. පිරිසිදු නොකරන ලදී. එහෙයින් ඔවුන්ගේ සමාධි පඤ්ඤා විනාශ වේ. පිරිහේ. එද වනාහි සීල භේදයෙන් නොවේ. ආපත්ති ව්‍යතික්‍රමණයෙන් නොවේ. ගරුක ධර්ම මිදීමෙන් නොවේ. මෙය වනාහි අල්පමාත්‍රව කටයුතු කිරීමෙන් හෝ වත් බිඳීම් මාත්‍රයකින් හෝ නැසේ.

ඊට කතාවක් මේ. එක් ස්ථවිරයන් වහන්සේ නමක් සමවත්සුව විඳිති. පිඬු පිණිස ගමට පිවිසිකල්හි ගම්දරුවෝ කිළියෙහි සෙල්ලම් කර ගියහ. ස්ථවිරයන් වහන්සේ පැමිණ පිරිවෙණ (කිළිය) අමදිමියි සිතා විහාරයට පිවිස සමවත් සමවදිමියි හිඳගත්හ. හේ සමවැදීමට නොහැකිව ආවරණය කුමක්දැයි සිලය ආවර්ජනා කරන්නේ ස්වල්ප වූද කඩවීමක් නොදැක වත්බිඳීමක් ඇත්දැයි බලන්නේ කිළිය නොඇමදි බව දැන ඇමද පිවිස හිඳින්නේ සමවතට සමවැදී හුන්නේය.

අකුපප ධර්ම නිර්දේසයෙහි කියන ලද්දට ප්‍රතිපක්ෂ වශයෙන් දතයුතුය. **අකුපප** ධමෙමා යන මෙය වනාහි අෂ්ට සමාපත්තිලාභී අනාගාමියා ද ක්ෂීණාශ්‍රවයා ද යන දෙදෙනාට නමකි. ඔවුන්ගේ සමාධිය උවදුරු සහිත නොවේ. විදර්ශනා උවදුරු දහම් මනාව විෂ්කම්භිතය. මනාව පිරිසිදු කරන ලද ද වේ. එහෙයින් ඔවුන්ගේ දෙඩීම් ගණයා කෙරෙහි ඇලීම් ආදි කටයුතුවලින් හෝ යම්කිසි වෙනත් තමාට අනුරූප ප්‍රමාදයකින් ගතකරන්නේ ද සමාපත්තිය වෙනස් නොවේ. නොනැසේ. ශුෂ්ක විදර්ශකයෝ සෝවාන් සකෘදාගාමී අනාගාමී ක්ෂීණාශ්‍රවයෝ මේ දුකයෙහි නොලැබෙති. දුක මුත්ත පුද්ගලයෝ වෙති. එහෙයින් ශාස්තෘන් වහන්සේ තමන් වහන්සේගේ බුද්ධ සුබුද්ධතාවෙන් යට ගන්නා ලද්දට නොගන්නා ලද්දද ඇද මේ දුකය සමග පිට පෙරළියෙන් පාළියට නගන්නේ **සබ්බෙපි අරිය පුග්ගලො** යනාදිය දේශනා කළහ. අෂ්ට සමාපත්තීන්ගේ වෙනස්වීම නැසීම වන්නේය. ලෝකෝත්තර ධර්මය වනාහි වරක් ප්‍රතිවේධ කළවිට වෙනස්වීමක් නැසීමක් නම් නොවන්නේය. ඒ සඳහාම කියන ලදී.

පිරිහෙන දහම් නොපිරිහෙන දහම් නිද්දේසයෙහි ද කුපප ධම්ම අකපප ධම්ම නිද්දේසය වසයෙන්ම දතයුතුය. හුදෙක් මෙහි පුද්ගලයාගේ ප්‍රමාදය නිසා ධර්මයන්ගේ පිරිහීමද නොපිරිහීමද ගන්නා ලදැයි මේ ආකාර දේශනාව පමණක් විවිධය. සෙසු සියල්ල සමාන වේමය.

චෙතනා හබබ නිද්දේසයෙහි **චෙතනා හබෙබා** යනු චේතනාවෙන් නොපිරිහී සමවැදීමට සුදුසුය. **සචෙ අනුසඤ්චෙතෙති** යනු ඉදින් සමවත් සමවදින්නේ අනුසංඥේවතෙති නම් වේ. හේ නොපිරිහේ. අනිත් තැනැත්තා පිරිහේ.

අනුරකඛන හබබ නිද්දේසයෙහි අනුරකඛණා හබෙබා යනු අනුරක්ෂණයෙන් නොපිරිහී සමවැදීමට සුදුසුය. ඉදින් අනුරක්ෂණය කෙරේනම් උපකාර නොවන දහම් අත්හැර උපකාර දහම් සේවනය කරන්නේ සමවදියි. මෙසේ පිළිපදින්නේ අනුරකඛති නම් වේ. හේ නොපිරිහෙයි. අනිත් තැනැත්තා පිරිහෙයි. මේ කරුණු දෙක ද සමාපත්ති තැබීමට ස්ථාවර කිරීමට ප්‍රතිබල වේ. චේතනා සුදුසුකමට වඩා අනුරකඛන සුදුසුකම බලවත්ය. චේතනා සුදුසුකම උපකාර අනුපකාර දහම් නොදනියි. නොදන්නේ උපකාර දහම් දුරුකරයි. බැහැර කරයි. අනුපකාර දහම් සේවනය කරයි. හේ ඒවා සේවනය කරන්නේ සමවතින් පිරිහෙයි. අනුරකඛණ සුදුසුකම වනාහි උපකර අනුපකාර දහම් දනියි. දැනගන්නේ අනුපකාර දහම් දුරුකරයි. බැහැර කරයි. උපකාර දහම් සේවනය කරයි. හේ ඒවා සේවනය කරන්නේ සමවතින් නොපිරිහේ. ගොවියෝ දෙදෙනෙක් වෙති. එකෙක් රෝගීය. සීතාදිය නො ඉවසයි. අනිකා නිරෝගීය. සීතාදිය ඉවසයි. රෝගියා යට කුටියට නො බසයි. දිවා රෑ රැකුම් අත්හරියි. ගිරා මොනර ආදී පක්ෂීහු කුඹුරට බැස වී කති. රැට මුව හූරු ආදී සත්තු පැමිණ කමතක් තැලුවා සේ තලා යති. හෙතෙම තමාගේ ප්‍රමාදය නිසා බීජ ස්වල්පයක්වත් නොලබයි. අනිත් ගොවියා රෑ දවල් රැකුම් අත් නොහරියි. හෙතෙම තමාගේ අප්‍රමාදයෙන් එක් කිරියකින් ගැල් සතරක් ද අටක් ද ලබයි. එහි චේතනා සුදුසුකම රෝගී ගොවියා මෙනි. අනුරකඛණ සුදුසුකම නිරෝග ගොවියා මෙනි. රෝගියාට තමාගේ අප්‍රමාදයෙන් බීජ ස්වල්පයක්වත් නොලැබීම මෙන් චේතනා සුදුසුකම උපකාර අනුපකාර දහම් නොදැන උපකාරය හැර අනුපකාරය සේවනයෙන් සමාපත්තියෙන් පිරිහේ. අනිත් තැනැත්තා තමාගේ අප්‍රමාදයෙන් එක් කිරියකින් සතරක්

අටක් ගැල් පුරවන්නාක් මෙන් අනුරකඛණ සුදුස්සා උපකාර අනුපකාර දහම් දැන් උපකාර දහම් සේවනයෙන් සමාපත්තියේ අපරිහානිය දතයුතුයි. මෙසේ චේතනා භබ්බයෙන් අනුරකඛණ භබ්බය සමාපත්තිය ස්ථාවර කිරීමට බලවත් යයි දතයුතුයි.

පුථුජ්ජන නිද්දේසයෙහි **තීණි සංයොජනානි** යනු දිටඨි සීලබ්බත පරාමාස, විචිකිච්ඡා සංයෝජනයෝය. මේවා ඵල ක්‍ෂණයෙහි ප්‍රහීන වේ. මෙය වනාහි ඵලක්‍ෂණයෙහි ද නොවේ යයි දක්වයි. **තෙසඤ්ච ධම්මානං** යනු ඒ සංයෝජන ධර්මයන්ගේ මාර්ග ක්‍ෂණයෙහි ඒවායේ ප්‍රහානය පිණිස පිළිපන්නේ වේ. මෙය වනාහි මාර්ග ක්‍ෂණයෙහි ද නොවේ. මෙපමණකින් අත්හරින ලද කර්මස්ථාන ඇති ජල බාල පෘථග්ජනයාම මෙහි කියන ලදැයි දතයුතුය.

ගොත්‍රභු නිද්දේසයෙහි **යෙසං ධම්මානං** යනු ගෝත්‍රභු ඤාණය සමග උපන් යම් පනස් ධර්මයන්ගේ. **අරිය ධම්මස්ස** ලෝකෝත්තර මාර්ගයාගේ. අවකකනති හොති යනු පිහිටයි. උපදියි. පහළ වෙයි. **අයං වුච්චති** යනු මේ නිවණ අරමුණු කරන ඤාණයෙන් සියළු පෘථග්ජන ගැනීම, පෘථග්ජන ගෝත්‍රය පෘථග්ජන මණ්ඩලය, පෘථග්ජන පැණවීම ඉක්මවා ආර්ය ගැනීම, ආර්ය මණ්ඩලය, ආර්ය ගෝත්‍රය, ආර්ය පැණවීම පහළවීමෙන් ගෝත්‍රභු පුද්ගලයා යයි කියනු ලැබේ.

අභබ්බාගමන නිද්දේසයෙහි සම්මත පිළිවෙළට පැමිණීමට නුසුදුසු වේය යන අර්ථයෙන් **අභබ්බාගමන** වේ. **කම්මාවරණෙන** යනු පංචවිධ ආනන්තරිය කර්මයෙන්, **කිලෙසාවරණෙන** යනු නියත මිථ්‍යා දෘෂ්ටියෙන්, විපාකාවරණෙන යනු අහේතුක ද්විහේතුක ප්‍රතිසන්ධියෙන්. **අසද්ධා** යනු තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධා නැති. **අවජ්ඣඩිකා** යනු කුසල් කරන කැමැත්ත රහිත ඔහු නම් දඹදිව හැර සෙසු ද්වීප තුනේ වෙසෙන අය යයි දතයුතුය. ඒවායෙහි මිනිස්සු අවජ්ඣඩික භවයෙන් පවිටෝ නම් වෙති. දුප්පඤ්ඤ යනු භවාංග ප්‍රඥාව රහිත, **අභබ්බා** යනු නොලැබූ මගපල උපනිශ්‍රයන්. **නියාම** යනු මාර්ග නියාමය, සම්මත පිළිවෙළ ඔක්කමිතුං යනු මේ කුසල ධර්මවලට සම්මත පිළිවෙළින් බැසීමට පිවිසීමට, එහි පිහිටීමට නුසුදුසු භබ්බාගමන නිද්දේසයෙහි කියන ලද්දට ප්‍රතිපක්ෂ ආකාරයෙන් දතයුතුය. මෙසේ මේ දුකයෙහි යම් පුද්ගලයෝ

පංචානන්තරිකයෝද යමෙක් නියත මිථ්‍යාදෘෂ්ටික ද යම් අය විසින් අහේතුක ද්විහේතුක ප්‍රතිසන්ධි ගන්නා ලද ද යම් අය බුද්ධාදි තුණුරුවන් නො අදහත් ද යම් අයට කරනු කැමති කුසල ඡන්දය නැත් ද යමෙකුට අසම්පූර්ණ භවංග ප්‍රඥාව වේද යමෙකුට මාර්ගඵල උපනිශ්‍රය නොමැති වේද, ඒ සියල්ලෝම සම්මත පිළිවෙළට බැසගැනීමට, පිවිසීමට නුසුදුස්සෝ වෙති. ඊට වෙනස් වූයේ භබ්බ යයි කියන ලදී.

නියතානියත නිද්දේසයෙහි **ආනන්තරිකා** යනු ආනන්තරිය කර්මයෙන් යුක්ත වූවෝ. **මිච්ඡා දිට්ඨිකා** යනු නියත මිථ්‍යා දෘෂ්ටියෙන් යුක්ත වූවෝ. මේ සියළු දෙනා ද නිරයට නියත බැවින් නියත නම් වෙති. අෂ්ටාර්ය පුද්ගලයෝ මනා බැවින් ඉහළ ඉහළ මාර්ගඵල සඳහා ද අනුපාදාය පරිනිර්වාණයට නියත බැවින් නියත නම් වෙති. අවසේස පුද්ගලයෝ නියත නොවූ ගති ඇත්තෝ වෙති. යම්සේ අහසට දණ්ඩක් පොළොවට වැටෙන්නේ අගින් හෝ මැදින් හෝ මුලින් වැටෙන්නේ යයි නොදනී. එසේ ම අසවල් ගතියෙහි උපදින්නේ යයි නියමයක් නැති බැවින් අනියත යයි දතයුතුය. උතුරුකුරු වාසීන්ගේ යම් නියත ගති කියන ලදී. එය නියත ධර්ම වශයෙන් නොවේ. මිථ්‍යා සම්මත නියත ධර්මයම නියත නම් වේ. ඒවායේ වශයෙන් මේ පුද්ගල නියමය කියන ලදී.

පටිපන්නක නිද්දේසයෙහි **මග්ග සමංගිනෝ** යනු මාර්ගස්ථ පුද්ගලයෝය. ඔව්හු ඵලය පිණිස පිළිපන් හෙයින් පටිපන්නකා නම් වෙති. **ඵලසමංගිනෝ** යනු ඵල ප්‍රතිලාභය සඳහා ඵලසමංගිනෝ වෙති. ඵල ප්‍රතිලාභයේ සිට ඔව්හු ඵල සමාපත්තියට නො පැමිණියෝ ද ඵලයෙහි සිටියෝම වෙති.

සමසීසි නිද්දේසයෙහි **අපුබ්බං අචරිමං** යනු පෙර නොවී පසු නොවී එකවිටම යන අර්ථයයි. **පරියාදානං** යනු විනාශයයි. **අයං වුච්චති** යනු මේ පුද්ගලයා සමසීසි යයි කියනු ලැබේ. එම පුද්ගලයෝ තුන් ආකාර වෙති. ඉරියාපථ සමසීසි, රෝග සමසීසි සහ ජීවිත සමසීසි යනුවෙනි. එහි යමෙක් සක්මන් කරන්නේ විදර්ශනාව පිහිටුවා රහත්බවට පැමිණ සක්මන් කරන්නේම පිරිනිවන්පායි. පළුම තෙරුන් මෙනි. සිටියේම විදර්ශනාව පිහිටුවා රහත්බවට පැමිණ සිටියේම පිරිනිවන්පායි. තිස්ස

තෙරුන් හිඳගෙන සිටියේම විදර්ශනාව පිහිටුවා රහත්බවට පැමිණ හිඳ සිටියේම පිරිනිවන්පායි. වැදහොත්තේම විදර්ශනාව පිහිටුවා රහත්බවට පැමිණ වැදහොත්තේම පිරිනිවන්පායි. මේ ඉරියව් සමසීසි නම් වේ. යමෙක් වනාහි එක් රෝගයකට පැමිණ රෝගය තිබියදීම විදර්ශනාව පිහිටුවා රහත්ව එම රෝගයෙන්ම පිරිනිවන්පායි. මේ රෝග සමසීසි නම් වේ. ජීවිත සමසීසි නම් කවරෙක්ද? සීස දහතුනකි. පළිබෝධ සීසය ද තෘෂ්ණාව, බන්ධන සීසය ද මානය, පරාමාස සීසය ද දෘෂ්ටිය, විකෙඛප සීසය ද උද්ධච්චය, කිලෙස සීසය ද වීර්ය, උපටඨාන සීසය ද සිහිය, අවිකෙඛප සීසය ද සමාධිය, දසසන සීසය ද විමොක්ඛය, සංඛාර සීසය ද නිරෝධය යනුයි. එහි කිලෙස සීස අවිද්‍යාව රහත් මගින් මඩිනු ලැබේ. පවත්ත සීස ජීවිතේන්ද්‍රිය චුති චිත්තයෙන් මඩිනු ලැබේ. අවිද්‍යාවෙන් මඩිනු ලැබූ සිත ජීවිතේන්ද්‍රිය මැඩීමට නොහැකිය. අවිද්‍යාවෙන් මඩිනු ලැබූ සිත අනිකකි. ජීවිතේන්ද්‍රිය විනාශ කරන සිත අනිකකි. යමෙකුගේ මේ සීසද්වය සමානව විනාශවෙයි. හේ ජීවිත සමසීසි නම් වේ. මෙය කෙසේ සමවේද? වාර සමතාවෙන්, යම්කිසි වාරයක මාර්ගයෙන් නැගී සිටීම වේ. සෝවාන් මාර්ගයෙහි ප්‍රත්‍යවේක්ෂා පහකි. සකෘදාගාමී මාර්ගයේ පහකි. අනාගාමී මාර්ගයෙහි පහකි. රහත් මාර්ගයෙහි සතරකි. එකුන්විසි ප්‍රත්‍යවේක්ෂා ඤාණයෙහි පිහිටා භවංගයට බැස පිරිනිවෙයි. මේ වාර සමතාවෙන් මේ උභය සීස විනාශය සම වේ. එනිසා මේ පුද්ගලයා ජීවිත සමසීසි යයි කියනු ලැබේ. මෙයම මෙහි අභිප්‍රේත වේ.

ඨිතකපපි නිද්දේසයෙහි ස්ථිත කල්පය ඨිතකපප වේ. ඨිත කල්පය මොහුට ඇත්තේනුයි ඨිතකපපී වේ. කල්පයක් තැබීමට සමර්ථ යන අර්ථයයි. **උද්දයභන කාලෝ අසසාති** දැවෙන කාලය වන්නේය. **නෙව තාවා** යනු මේ මාර්ගයෙන් යුත් පුද්ගලයා සෝවාන් මාර්ගඵල සාක්ෂාත් කරනතුරු කල්පය නො දැවෙන්නේය. දැවෙන්නේ ද නොදැවීම සිටින්නේය. කල්ප විනාශය නම් මහා විකාර වූ මහා ප්‍රයෝගයකි. කෝටි ලක්ෂයක් සක්වල දැවෙනු ලබන වශයෙන් මහා ලෝක විනාශයයි. මෙය ද මෙසේ මහා විනාශය නවතින්නේ යයි කියයිද? සාසනය පවතින කාලයෙහි මේ කල්ප විනාශය නම් නැත. මෙසේ ඇති කල්හි ශාස්තෘන් වහන්සේ අනතුරු බව දැක්වීමට මේ කාරණය ගෙනහැර දැක්වූහ. මාර්ගස්ථ වූවහුගේ ඵලයට අනතුරක් කිරීමට නොහැකි යයි යන මෙය ද වන්නේය. මේ පුද්ගලයා කල්පයක් තබන්නේ කොපමණ කාලයක් තබන්නේද?

යම්කිසි වාරයක මාර්ගයෙන් නැගී සිටීම වේද ඉන්පසු භවංගයට වැටී මනෝද්වාරාවජ්ජය උපදී. ඉන්පසු අනුලෝම තුනක් ඇතිවේ. ගොත්‍රභූ සිත් එකකි. මාර්ග සිත් එකකි. ඵල සිත් දෙකකි. පච්චවෙකඛණ සිත් පහකි යයි මෙපමණ කාලයක් තිබෙන්නේය. මෙම අර්ථය අමුතු උපමාවකින් මෙසේ දැක්වූහ.

අරිය නිද්දේසයෙහි කෙලෙසුන්ගෙන් දුරු වූ බැවින් ආර්ය වේ. දෙවියන් සහිත ලෝකයාගෙන් වෙන්වූ බැවින් අරිය නම් වේ. අරිය අර්ථය නම් පිරිසිදු අර්ථය යයි පිරිසිදු බැවින් ද ආර්ය වේ. සෙස්සෝ අපිරිසිදු බැවින් අනාර්ය වෙති.

සෙකඛ නිද්දේසයෙහි මගඝසමංගිනෝ මාර්ග ක්‍ෂණයෙහි, ඵල සමංගිනෝ ඵල ක්‍ෂණයෙහි. අධිසීල සිකඛාදි තිවිධ ශික්‍ෂාවෙන් හික්මෙති යනු සෙකඛා වේ. රහතන් වහන්සේ වනාහි රහත්ඵල ක්‍ෂණයෙහි ත්‍රිවිධ ශික්‍ෂාවෙන් හික්මෙන ලදහ. නැවත උන්වහන්සේට හික්මෙන කෘත්‍යයක් නැතැයි අසෙකඛ වේ. මෙසේ සප්ත ආර්යෝ හික්මෙත් යයි සෙකඛා වේ. බිණාශ්‍රවයා අනිකකුගේ සමීපයේ සීලාදියෙහි ශික්‍ෂිත බැවින් ශික්‍ෂිත අසෙකඛා නම් වේ. බුදු පසේ බුදුහු තමන් විසින්ම අශෛක්‍ෂ බැවින් අසෙකඛා නම් වෙති. සෙසු පුද්ගලයෝ නොහික්මෙත්. ශික්‍ෂිත නොවෙති. ශෛක්‍ෂ ද අශෛක්‍ෂ ද නොවෙති.

තෙවිජ්ජ නිද්දේසයෙහි පළමුව පුබ්බෙනිවාස දිබ්බචකඛු ඤාණ උපදවා පසුව රහත්බවට පත්වන්නා ද පළමුව රහත්බව පැමිණ පසුව පුබ්බෙනිවාසානුසසති දිබ්බචකඛු ඤාණ උපදවන්නා ද තෙවිජ්ජ නම් වෙති. සූත්‍රාන්ත කථා වනාහි පරියාය දේසනාය. අභිධම්ම කථා නිප්පරියාය දේසනා යයි මේ ස්ථානයෙහි ආගම නියමයට ධුර වේ. එහෙයින් පළමුව විද්‍යා දෙකක් උපදවා පසුව රහත්බවට පැමිණෙන්නා ද මෙහි කැමති වේ. ඡට් අභිඥයන් කෙරෙහිද මෙම නයම වේ.

සම්මා සම්බුද්ධ නිද්දේසයෙහි පුබ්බ අනනුසසුනෙසු යනු අවසන් භවයෙහි සත්‍ය ප්‍රතිවේධයෙන් පෙර අන්‍ය කිසිවෙකුගේ සමීපයෙහි පෙර නොඇසූ විරූ. එයින් පෙර භවවල සර්වඥ බෝධිසත්ත්වයෝ බුදු සසුන්වල පැවිදිව තුන්පිටකය උගෙන ගතපච්චාගත වත සමාදන්ව කමටහන අනුව

ගෝත්‍රභූ සිතට හැපී තබති. එහෙයින් පශ්චිම භවයෙහිම නොහැසුරුණු බව සඳහා මෙය කියන ලදී. එකල්හි තථාගතයන් වහන්සේ පුරණ ලද පාරමී ඇති බැවින් අනිකකුගේ සමීපයෙහි තමා නොඇසූ සංඛත අසංඛත ධර්මවල 'ඉදං දුකඛං -පෙ- අයං දුකඛ නිරොධගාමිනී පටිපදා' යයි ආත්ම පච්චවෙකඛණ ඤාණයෙන් චතුරාර්ය සත්‍යය අවබෝධ කරති. **තඤ්ච** යනු ඒ චතුසසත්‍ය සංඛ්‍යාත අරහත් මාර්ගයෙහි සර්වඥභාවයට පැමිණෙති. **බලෙසුච වසීභාවං** යනු සර්වඥ ඤාණයේ මෙන්ම බලයෙහි ද පුරුදු කරන ලද වසීභාවයට පැමිණෙති. බුදුවරුන්ට සර්වඥතා ඤාණය ද දසබල ඤාණය ද අධිගමනයේ සිට අනිත් කළයුතු දෙයක් නැත. යම්සේ උභයකුල පරිසුද්ධ ක්ෂත්‍රිය කුමාරයෙකුට අභිසේකයේ සිට මෙය නම් අනාගත ඓශ්වර්ය යයි නොකිවයුතුය. සියල්ලම පැමිණියේ වේ. එසේම බුදුවරුන්ට රහත් මාර්ගයට පැමිණි තැන් පටන් මේ ගුණ නම් ආවෝ නැත. පිළිවිදි නැත. ප්‍රත්‍යක්ෂ වූයේ නැතැයි නොකිව යුතුය. සියළුම සර්වඥ ගුණ පැමිණියේය. පිළිවිද්දේය. ප්‍රත්‍යක්ෂ වූයේමය. **අයං වුචචති** යනු මෙය මෙසේ පාරමී පිරීමේ ආනුභාවයෙන් මාර්ගයෙන් පිළිවිදි සර්වඥ ගුණ පුද්ගලයා සම්මා සම්බුද්ධ යයි කියනු ලැබේ.

පළවෙක බුද්ධ නිද්දේශයෙහි ද **පුබෙබ අනනුසසුතෙසු** පදයෙහි පෙර කියන ලද නයින්ම අර්ථය දතයුතුය. පසේ බුදුවරයාද අවසාන භවයෙහි ආචාර්යවරයෙකු නැතිව තමාගේ ඤාණයෙන්ම සත්‍ය අවබෝධ කොට සර්වඥ ඤාණයෙහි සහ දස බලයෙහිද පුරුදු කරන ලද වසීභාවයට නො පැමිණේ.

උභතොභාග විමුත්ත නිද්දේසයෙහි **අථ විමොකෙඛ කායෙන ඵුසිත්වා විහරති** යනු අෂ්ට සමාපත්ති සහජාත නාමකයින් පිළිලැබ වාසය කරයි. පඤඤාය තසස දිසවා යනු විදර්ශනා ප්‍රඥාවෙන් සංස්කාරගතය ද මාර්ග ප්‍රඥාවෙන් චතුරාර්ය සත්‍ය දැක සතර ආසව **ක්ඛීණ** වේ. **අයං වුචචති** යනු මේ එබඳුරූප වූ පුද්ගලයා උභතොභාග විමුත්ත නම් යයි කියනු ලැබේ. මේතෙමේ භාග දෙකකින් වාර දෙකකදී මිදුනේ උභතොභාග විමුත්ත වේ. මේ එහි ථෙරවාදය - ත්‍රිපිටක චූලනාග තෙරහු කීහ. 'සමාපත්තියෙන් විෂ්කම්භන විමෝක්ෂයෙන් ද මාර්ගයෙන් සමුච්ඡේද විමෝක්ෂයෙන් ද මිදුනේ යයි උභතො භාගයෙන් හා වාර දෙකකදී මිදුනේය. ත්‍රිපිටක මහා ධම්මරක්ඛිත තෙරහු මෙතෙමේ නාම නිශ්‍රිත යයි කියා.

වා වෙයින් ගිනිසිළ - ගුණ යෙයි වහරට නොයා
මුනි මුත් නමකයින් - ගුණාසේ වහරෙහි නොයා

සූත්‍රය ගෙනහැර දක්වා නාම කයින් ද රූප කයින් ද මනාව මිදුනේ උභතොභාග විමුත්ත යයි කීහ. ත්‍රිපිටක චූලාභය තෙරහු මෙසේ කීහ. සමාපත්තියෙන් විෂ්කම්භන විමෝක්ෂයෙන් එක්වරක් මිදේ. මාර්ගයෙන් සමුච්ඡේද විමෝක්ෂයෙන් එක්වරක් මිදේ. මෙසේ මිදීම උභතොභාග විමුත්ත වේ.

මේ ස්ථවිරයන් වහන්සේලා තිදෙනාම පණ්ඩිතයහ. වාද තුනේම කරුණු පෙනෙන නිසා වාද තුනම පාළියට නගා තැබූහ. සංක්ෂෙපයෙන් වනාහි අරූප සමාපත්තියෙන් රූප කයින් මිදෙන ලදී. මාර්ගයෙන් නාම කයින් මිදෙන ලදැයි භාග දෙකින්ම මිදෙන ලද්දේ උභතොභාග විමුත්තෙතා වේ. හේ අරූප සමාපත්ති සතරේ එකිනෙකින් නැගිට සංස්කාරයන් සම්මර්ශනය කොට රහත්බවට පැමිණි සතර දෙනෙකි. නිරෝධයෙන් නැගිට රහත්බවට පැමිණි අනාගාමියා වශයෙන් පංචවිධ වේ. එහි පෙර සතරදෙනා සමාපත්තිසීස නිරෝධයට සම නොවදිනියි යන ආකාරයෙන් උභතොභාගවිමුත්ත වේ. අෂ්ට සමාපත්තිලාභී අනාගාමියා එයට සමවැද එයින් නැගී විදර්ශනාව වඩා රහත්බවට පැමිණියේ යයි නිෂ්පරියායෙන් උභතොභාග විමුත්ත ශ්‍රේෂ්ඨයා නම් වේ. අරූපාවචර ධ්‍යානය ද උපේක්ඛා ඒකග්ගතා යන අංග දෙකෙන් යුක්ත රූපාවචර ධ්‍යානය ද යන ධ්‍යාන පදනම්කොට රහත්භාවයට පත් පුද්ගලයා උභතොභාගවිමුත්ත නොවේද? නොවේ. කවරහෙයින්ද? රූප කයින් නොමිදෙන බැවිනි. ඔහු කෙලෙස් කයින්ම මිදේ. රූපකයින් නොමිදේ. ඒ නිසා එයින් නැගිට රහත් වූ පුද්ගලයා උභතොභාග විමුත්ත නම් නොවේ. අරූපාවචර වනාහි නාම කයින් ද මිදුණු රූපකයින්දැයි එයම පාදක කොට රහත්බවට පැමිණි පුද්ගලයා උභතොභාග විමුත්ත වේයයි දතයුතුය.

පඤ්ඤා විමුත්ත නිද්දේසයෙහි පඤ්ඤාවෙන් මිදීම **පඤ්ඤා විමුත්තෙතා** වේ. හෙතෙම, ශුෂ්ක විදර්ශකය, ධ්‍යාන සතරෙන් නැගිට රහත්බවට සතරදෙනා දැයි පංචවිධ වේ. මොවුන් අතුරෙන් එක්කෙනෙක්වත් අෂ්ට විමෝක්ෂලාභී නොවේ. එහෙයින්ම **න හෙව ඛො අටය විමොක්ඛති** යනාදිය කීහ. අරූපාවචර ධ්‍යානවල වනාහි එකක් ඇතිකල්හි උභතොභාග විමුත්ත නම් වේ.

කායසකඛි නිද්දේසයෙහි **එකච්චෙ ආසවා** යනු යට මාර්ග තුන හැර. අයං **වුච්චති** මේ එබඳු වූ පුද්ගලයා කායසකඛි යැයි කියනු ලැබේ. හේ වනාහි විචාරන ලද්ද සාක්ෂාත් කෙරේනුයි කායසකඛි වේ. ධ්‍යානය පළමුව ස්පර්ශ කෙරේ. පසුව නිරෝධ වූ නිවන ප්‍රත්‍යක්ෂ කෙරේනු ද කායසකඛි වේ. හේ සෝවාන්ඵලය ආදිකොට අරහත් මාර්ගස්ථයා දක්වා සයාකාර වේ.

දිට්ඨිප්පත්ත නිද්දේසයෙහි **ඉදං දුකඛං** යන මේ දුක. දුක මෙපමණය. මෙයින් මතු නැත. දුකඛ සමුදයාදියෙහි ද මෙම නයම වේ. **යථාභූතං පජානාති** යනු තෘෂ්ණාව හැර පංච උපාදාන ස්කන්ධයෙහි දුකඛ සත්‍ය යයි යථා පරිදි දනියි. තෘෂ්ණාව වනාහි දුක උපදවයි. නිපදවයි. ප්‍රභවය වෙයි. එයින් දුක උපදී. එහෙයින් ඒ මෙය දුකඛ සමුදය යයි තත් වූ පරිදි දැනගනියි. යමකින් මේ දුක ද සමුදය ද නිවණට පැමිණ නිරුද්ධ වේ. ව්‍යපසමනය වේ. නො පැවැත්මට පැමිණේ. එහෙයින් ඒ මෙය දුක්ඛ නිරෝධයයි. තත්වූ පරිදි දැනගනියි. ආර්ය අෂ්ටාංගික මාර්ගය ඒ දුක නිරෝධයට යවයි. එහෙයින් එය මේ දුක්ඛ නිරෝධගාමිනී ප්‍රතිපදාව යයි තත්වූ පරිදි දැනගනියි. මෙපමණකින් නා නා ක්ෂණයෙහි සත්‍ය ව්‍යවස්ථානය දක්වන ලද්දේ වේ. දැන් එකක්ෂණයෙහි දැක්වීමට **තථාගතපපවෙදිතා** යනාදිය කීහ. එහි තථාගතපපවෙදිතා යනු මහබෝමැඩ හිඳ තථාගතයන් විසින් පිළිවිද්ද අවබෝධ කරන ලද්ද ප්‍රකට කරන ලදී. ධම්මා යනු චතුසත්‍ය ධර්මය. **වොදිටයා හොනති** යනු මනාව දක්නා ලදී. **වොචරිතා** යනු සුචරිතයයි. ඒවායෙහි මේ ප්‍රඥාව මනාව හැසිරෙන ලද්දේ යන අර්ථය වේ. අයං **වුච්චති** යනු මෙබඳු වූ මේ පුද්ගලයා දිට්ඨිපත්ත යයි කියනු ලැබේ. මේ තෙමේ දෘෂ්ටියේ කෙළවරට පැමිණියේ යයි ද දිට්ඨිපත්ත වේ. සසර දුකය, නිරෝධය සැපය යන ඤාණය වේ. දක්නා ලද, අවබෝධ කරන ලද, ප්‍රත්‍යක්ෂ කරන ලද බලන ලද යන මේවායින් දිට්ඨිපත්තයා ප්‍රකට වේ. මෙතෙමේ ද කායසකඛි මෙන් හයාකාර වේ.

සද්ධාවිමුත්ත නිද්දේසයෙහි **නො ච බො යථා දිට්ඨිප්පත්තසස** යනු දෘෂ්ටියට පැමිණ ආශ්‍රව පරීක්ෂීණය. සද්ධාවිමුත්ත අර්ථය මෙසේ නොවේ. කෙලෙස් ප්‍රහාණයෙහි කිම විවිධතා ඇත්ද? නැත. එසේ නම් සද්ධා විමුත්ත යන දිට්ඨිපත්ත භාවයට නො පැමිණේද? පැමිණීමේ විවිධත්වයෙනි. දිට්ඨිපත්තයා වනාහි පැමිණෙන කාලයෙහි කෙලෙස්

විඤ්ඤාණය කරන්නේ දුක් අඩුවෙන් කරදර අඩුවෙන් ක්ලාන්ත නොවීම හැකිවෙයි. සද්ධාවිමුත්තයා වනාහි දුකෙන් කරදරයෙන් ක්ලාන්ත වී විඤ්ඤාණය කිරීමට හැකිවේ. එනිසා දිට්ඨිප්පත්ත බවට නො පැමිණේ. තව ද ඒවායේ පෙනීමේ ද නානත්වයක් ඇත. දිට්ඨිප්පත්තයාගේ ඉහළ මාර්ග තුනේ විදර්ශනා ඤාණය තියුණුය. සූර්ය, ප්‍රසන්නව උසුලයි. එනිසාද ඔහු දිට්ඨිප්පත්තයට නො පැමිණේ. ශිල්ප දක්වන තරුණයන් දෙදෙනාගෙන් එකෙකුගේ අතේ තියුණු කඩුවක් ඇත. එකෙකුගේ මොට්ට කඩුවකි. තියුණු කඩුවෙන් කෙසෙල් ගස් සිදුරු කරන්නේ ශබ්දයක් ඇති නොවේ. මොටවූ කඩුවෙන් කටකට යන සද්ද ඇතිවේ. එහි තියුණු අසිපතෙන් ශබ්ද නොකරන්නේම කෙසෙල් සිඳින්නාක් මෙන් දිට්ඨිප්පත්තයාගේ මාර්ග තුනේ විපසසනා ඤාණයේ තියුණු සූර විප්‍රසන්නභාවය, මොටවූ අසිපතින් සද්ද කරමින් කෙසෙල් සිඳින්නාක් මෙන් ශ්‍රද්ධා විමුත්තයාගේ මාර්ග තුනේ විපස්සනා ඤාණයේ නොතියුණු සූර නොවන අප්‍රසන්නභාවය දතයුතුය.

මේ නය වනාහි නො යන ප්‍රතික්ෂෙප කොට පැමිණිය යුතු නානත්වයෙන් ම සද්ධා විමුත්තයා දිට්ඨිප්පත්තභාවයට නොපැමිණේ යයි සනිටුහන් කරන ලදී. ආගමටඨ කථාවල මෙසේ කියන ලදී. මේ කථාවල සද්ධා විමුත්තයාගේ මාර්ග ක්ෂණයෙහි පූර්වභාගයේ අදහා ගන්නාගේ මෙන් සැලෙන්නාක් මෙන් මිදෙන්නාක් මෙන් කෙලෙස් ක්ෂය වේ. දිට්ඨිප්පත්තයාගේ මාර්ග ක්ෂණයේ පූර්වභාගයේ කෙලෙස් ඡේදන ඤාණය අදන්ධය. තියුණුය. සූර වී උසුලයි. එහෙයින් නොතියුණු කඩුවෙන් කෙසෙල් සිඳින්නා සේ කැපූ තැන මටසිලුටු නොවේ. කඩුව ඉක්මනින් නොයයි. ශබ්ද ඇසේ. බලවත් උත්සාහයක් කළයුතු වේ. සද්ධා විමුත්තයාගේ පූර්වභාග භාවනා මෙබඳු වේ. යම්සේ තියුණු කඩුවෙන් කෙසෙල් කඳ කපනවිට කැපූ තැන මට්ටම් වේ. කඩුව කඩිනමින් යයි. ශබ්ද නොඇසේ. බලවත් උත්සාහයක් අවශ්‍ය නොවේ. දිට්ඨිප්පත්තයාගේ පූර්වභාග භාවනා මෙබඳු වේ. **අයං වුච්චති** යනු සද්ධා විමුත්තයාය. මොහු කායසක්ඛි මෙන් සයාකාරය.

ධම්මානුසාරි නිද්දේසයෙහි **පටිපන්නස්ස** යනු මේ සෝවාන් මාර්ගස්ථයා දක්වන ලදී. **අධිමත්තං** යනු බලවත් ප්‍රඥාව ගෙනදෙයි යන අර්ථයෙන් **පඤ්ඤාවාහී** වේ. ප්‍රඥාව මේ පුද්ගලයා උසුලයි යනු ද

පඤ්ඤාවාහි යයි කියන ලදී. **පඤ්ඤා පුබබංගමං** යනු ප්‍රඥාව පෙරටුකොට. **අයං වුච්චති** යනු මෙබඳු වූ මේ පුද්ගලයා ධම්මානුසාරී යයි කියනු ලැබේ. සෝවාන් මාර්ගස්ථයාට මෙය නමකි. ඵලයට පැමිණිවිට දිට්ඨිප්පත්ත නම් වේ.

සද්ධානුසාරී නිද්දේසයෙහි ද ශ්‍රද්ධාව ගෙනදෙයි යනු **සද්ධාවාහී** වේ. ශ්‍රද්ධාව මේ පුද්ගලයා උසුලයි යනු ද සද්ධාවාහි යයි ද කියන ලදී. **සද්ධා පුබබංගමං** යනු ශ්‍රද්ධාව පෙරටුකොට. **අයං වුච්චති** යනු මෙබඳු වූ මේ පුද්ගලයා සද්ධානුසාරී යයි කියනු ලැබේ. හේ වනාහි ශ්‍රද්ධාවෙන් සිහිකරයි. අනුව සිහිකරයි යනුද සද්ධානුසාරී වේ. සද්ධාවිමුත්ත නම් වේ. ලෝකෝත්තර ධර්ම උපදවන්නන්ගේ ධුර දෙකකි. අභිනිවේස දෙකකි. සීස දෙකකි. එහි ශ්‍රද්ධා ධුර ප්‍රඥා ධුර යන ධුර දෙකය. එක් භික්ෂුවක් වනාහි සමථාභිනිවේසයෙන් පිවිසෙයි. එක්කෙනෙක් විපස්සනාභිනිවේසයෙන් පිවිසෙයි යන මෙය අභිනිවේස දෙකයි. එක්කෙනෙක් මුදුනට පැමිණෙන්නේ උභතොභාගවිමුත්ත නම් වේ. එක්කෙනෙක් ප්‍රඥා විමුත්ත යයි යන මේවා සීස දෙකය. යම් කෙනෙකුන් ලෝකෝත්තර ධර්ම උපදවන්නේ ඒ සියළුදෙනාම මේ ධර්ම දෙකෙන් මිදෙත්. ඔවුන් අතුරෙන් යම් භික්ෂුවක් අෂ්ට සමාපත්තිලාභී වූයේ ප්‍රඥාව ධුරකොට සමථ වශයෙන් අභිනිවේස වූයේ එක්තරා අරූප සමාපත්තියක් පදස්ථාන කොට විදර්ශනාව පිහිටුවා රහත්බවට පැමිණෙයි. හෙතෙම සෝවාන් මාර්ග ක්ෂණයෙහි ධම්මානුසාරී නම් වේ. සෙසු සෝවාන් ඵලයේ සිට රහත් මාර්ගය දක්වා සමාන සයේ කාය සක්ඛි නම් වේ. රහත්ඵලයට පැමිණි කල්හි උභතොභාග විමුත්ත නම් වේ. අනිත් තැනැත්තා ප්‍රඥාවම ධුරකොට විදර්ශනා වශයෙන් ප්‍රවේශ වූයේ ශුද්ධ සංස්කාරයෙහි හෝ රූපාවචර ධ්‍යානවල හෝ එක්තරා එකක් සම්මර්ශනය කොට රහත්බවට පැමිණේ. මේ තෙමේ ද සෝවාන් මාර්ගක්ෂණයේ ධම්මානුසාරී නම් වේ. සෙසු ස්ථාන සයේ දිට්ඨිප්පත්ත නම් වේ. රහත්බවට පැමිණි කල්හි පඤ්ඤා විමුත්ත නම් වේ. මේ නම් දෙක පෙර නො ආයේය. ඒවා පෙර ඒවා සමග පහක් වේ. අෂ්ට සමාපත්තිලාභී වෙන කෙනෙක් ශ්‍රද්ධාව මුරකොට සමාධි වශයෙන් ප්‍රවේශ වූයේ එක්තරා අරූප සමාපත්තියක් පාදකකොට විදර්ශනාව පිහිටුවා රහත්බවට පැමිණේ. මේ තෙමේ සෝවාන් මාර්ග ක්ෂණයෙහි සද්ධානුසාරී නම් වේ. සෙසු ස්ථාන සයේ කාය සක්ඛි වේ. රහත් බවට පැමිණි කල්හි උභතොභාග විමුත්ත නම් වේ. මෙහි එක

නමක් පෙර නොවීය. එය පෙර වූ පහ සමග සයක් වේ. තවකෙනෙක් ශ්‍රද්ධාවම ධුරකොට විදර්ශනා වශයෙන් ප්‍රවේශ වී සුද්ධ සංස්කාරයන් හෝ රූපාවචර ධ්‍යානවල එක්තරා එකක් සම්මර්ශනය කොට රහත්බවට පැමිණේ. මේ තෙමේ ද සෝවාන් මාර්ගක්ෂණයෙහි සද්ධානුසාරී වේ. සෙසු ස්ථාන හයෙහි සද්ධා විමුත්ත නම් වේ. රහත්බවට පැමිණිකල්හි පඤ්ඤා විමුත්ත නම් වේ. මෙහි ද එක් නමක් පෙර නොවීය. එය සමග පෙර සය සතක් වේ. මේ සප්ත පුද්ගලයෝ ලොවෙහි අග්‍ර දක්ෂිණෙය්‍ය නම් වෙති.

සත්තඛත්තුපරම නිද්දේසයෙහි **සත්තකඛත්තුං** යනු සත්වාරයෙහි. සත්වන භව උපත අවසන්කොට ඇති. අටවන භවයක් නොගනී යනු **සත්තකඛත්තුපරම** වේ. **සොතාපනෙනා හොති** යනු මෙහි සෝත නම් ආර්ය මාර්ගයයි. එයින් යුක්ත වූයේ සෝතාපන්න නම් වේ. යම්සේ කීය. 'ආයුෂ්මත් සාරිපුත්‍රයෙනි, සොතො සොතො යයි කියනු ලැබේ. සාරිපුත්‍රයෙනි, සොතො යනු කුමක්ද? ස්වාමීනි, මෙය වනාහි ආර්ය අෂ්ටාංගික මාර්ගය සොතො වේ. කෙසේද? සම්මා දිට්ඨි.... සම්මා සමාධි' යනුවෙනි. පින්වත් සාරිපුත්‍රයෙනි, සොතාපනෙනා, සොතාපනෙනා යයි කියනු ලැබේ. සාරිපුත්‍රයෙනි, සොතාපනන නම් කුමක්ද? ස්වාමීනි, යමෙක් මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයෙන් සමන්නාගත වූයේ ඒ මේ ආයුෂ්මතුන්ට මෙසේ නමක් වේ. මෙසේ ගෝත්‍රයක් හෝ වේ. මෙසේ මාර්ගක්ෂණයෙහි ද සෝතාපන්න නම් වේ. මෙහි වනාහි මාර්ගයෙන් ඵලයට නම දෙන ලදැයි ඵලක්ෂණයෙහි සෝතාපන්නයා අදහස් කරන ලදී. **අවිනිපාතධම්මො** යනු විනිපාත සංඛ්‍යාත අපායට උත්පත්ති වශයෙන් නොපැමිණෙන බව. **නියතො** යනු මාර්ග නියමයෙන් නියත වූ. **සම්බොධි පරායනො** යනු අවබෝධ කිරීම පිහිටකොට ඇති. හෙතෙම ලැබූ මාර්ගයෙන් අවබෝධ කෙරේනුයි සම්බෝධිපරායන වේ. ඉහළ මාර්ග තුනෙන් අවශ්‍යයෙන් ම අවබෝධ කෙරේනුයි සම්බෝධිපරායන වේ. **දෙවෙ ච මනුස්සෙ ච** යනු දෙව්ලොව ද මිනිස්ලොවද. **සන්ධාපත්වා සංසරිත්වා** යනු ප්‍රතිසන්ධි වශයෙන් භවයෙන් භවයට ගොස්. **දුක්ඛස්සන්තං කරොති** යනු සසර දුක කෙළවර කරයි. **අයං වුච්චති** යනු මෙබඳු වූ මේ පුද්ගලයා සත්තකඛත්තුපරම යයි කියනු ලැබේ. මේ තෙමේ වනාහි කලින් කල දෙව්ලොව හා මිනිස්ලොව වශයෙන් මිශ්‍ර වශයෙන් කියන ලදැයි දතයුතුය.

කොලංකොල නිද්දේසයෙහි කුලයෙන් කුලයට ගමන් කෙරේනුයි කොලංකොල වේ. සෝවාන්ඵලය අවබෝධ කිරීමේ සිට නීච කුලයෙහි උත්පත්තියක් නම් නැත. මහාභෝග කුලවලම උපදී යන අර්ථයයි. දෙව වා තීණි වා කුලානි යනු දෙව් මිනිස් වශයෙන් භව දෙකක හෝ තුනක. මෙසේ මෙය ද මිශ්‍ර බැවින් ම කියන ලදී. දෙවා වා තීණි වා යන මෙය දේශනා මාත්‍රයක් පමණි. සවන භවය තෙක් සැරිසරන්නේ ද කොලංකොලම වේ. උපදින්නේ යයි කීම ද වටී.

එකබීජී නිද්දේසයෙහි බන්ධබීජය කියන ලදී. යම් සෝතාපන්නයෙකුගේ එක් ස්කන්ධ බීජයක් ඇත. එක් ආත්ම භවයක් ගැනීම හෝ ඒකබීජී වේ. මානුසකං භවනති යන මෙය දේශනා මාත්‍රයකි. දිව්‍යාත්ම භාවයෙහි උපදී යයි කීමද වටී. භාග්‍යවතුන් වහන්සේ ගන්නා ලද ආකාරයෙන් මේවායේ මේ නාම වේ. මෙපමණ ස්ථානයකට ගියේ සත්තකඛත්තුපරම වේ. මෙපමණ කොලංකොලං වේ. මෙපමණ ඒකබීජී යයි භාග්‍යවතුන් වහන්සේ විසින් මේවායේ නාම ගන්නා ලදී. මේ තෙමේ සත්තකඛත්තුපරමය. මේ තෙමේ කොලංකොලංය. මේ තෙමේ ඒකබීජී යයි නියතයක් නැත. ඔවුන්ගේ මේ ප්‍රභේදය කවරෙක් නියම කරයිද? සමහර ස්ථවිරයන් වහන්සේලා පෙර හේතු නියමයෙන් යයි කියති. සමහරෙක් පළමු මාර්ගය, සමහරෙක් ඉහළ මාර්ග තුන, සමහරෙක් මාර්ග තුනේ විපස්සනාව යයි කියති. එහි පෙර හේතු නියමය යන වාදයෙහි පළමු මාර්ගයට උපනිශ්‍රය කළා නම් වේ. ඉහළ මාර්ග තුන උපනිශ්‍රය රහිතව ඉපදුනේය යන වචනය පැමිණේ. පළමු මාර්ගය නියමයයි යන වාදයෙහි ඉහළ මාර්ග තුනේ නිෂ්ඵලබව පැමිණේ. ඉහළ මාර්ග තුනේ නියමයයි යන වාදයෙහි පළමු මාර්ගය නූපන් කල්හිම ඉහළ මාර්ග තුන ඉපදීමට පැමිණේ. මාර්ග තුනේ විපස්සනා නියමයෙන් යයි යන වාදය වනාහි යෙදේ. ඉදින් ඉහළ මාර්ග තුනේ විදර්ශනාව බලවත් වේද එවිට ඒකබීජී නම් වේ. ඊට අඩුතරමින් වූයේ කෝලංකෝල වේ. ඊට අඩුතරමින් වූයේ සත්තකඛත්තුපරම වේ. එක් සෝතාපන්නයෙක් සසර කැමති වේ. සසරට ඇලුනේ නැවත නැවත සසරෙහිම හැසිරේ. දක්නා ලැබේ. අනේපිඬු සිටුතුමා, විසාඛා මහා උපාසිකාව, චූලරථ මහාරථ දෙවිපුත්වරු, අනේකවණ්ණ දේවපුත්‍රයා, සක්‍රදිව්‍ය රාජයා, නාගදත්ත දෙවිපුතා මේ මෙපමණ දෙනා සසර කැමැත්තේ සසර ඇළුණෝය. මුල සිට දෙව්ලෝ සය ශෝධනය කොට අකනිට්ඨයෙහි සිට පිරිනිවන්

පාන්නෝය. මොවුන් මෙහි නොගන්නා ලදී. යමෙක් මිනිස් ආත්මවලම සත්වරක් සැරිසරා රහත්බවට පැමිණේ. යමෙක් දෙව්ලෝ ඉපිද දෙවියන් අතරම නොසන්සිඳී සත්වරක් සැරිසරා රහත්බවට පැමිණේ. මොව්හු ද මෙහි නොගන්නා ලදී. මිශ්‍ර භව වසයෙන් ම සතතකඛතතුපරම හා කෝලංකෝලයෝ වෙති. මනුෂ්‍යභවයෙහි උපන්නා ම ඒකබීජී යයි ගන්නා ලද බව දතයුතුය. එහි එක් එක්කෙනා දුකඛාපටිපදාදි වශයෙන් සතරාකාරයට පැමිණේ. සද්ධා ධුරයේ සතතකඛතතුපරම සතරදෙනා, කොලංකොල සතරදෙනා, එකබීජී සතරදෙනා යයි දොළොස්දෙනෙක් වෙති. ප්‍රඥාවෙන් නිපදවීමට හැකි යයි මම ලොවුතුරා දහම් නිපදවන්නෙමියි මෙසේ ප්‍රඥාව ධුර කොට සතතකඛතතුපරමාදභාවයට පැමිණියෝ ද ප්‍රතිපදා වශයෙන් දොළහක්ම යයි. මේ සෝතාපන්නයෝ විසිහතර දෙනා ඉහටඨකතිඡඣානික (මෙහි අටක් ඇති වැටහීම්) වශයෙන්ම මේ ස්ථානයෙහි කියන ලදැයි දතයුතුය.

සකදාගාමී නිද්දේසයෙහි ප්‍රතිසන්ධි වශයෙන් එක්වරක් පැමිණේ යයි **සකදාගාමී** වේ. **සකිදෙව** යනු එක්වරක්ම වේ. **ඉමං ලොකං ආගතවො** යන මේ සකදාගාමී පස්දෙනාගෙන් සතරදෙනෙක් හැර එක්කෙනෙක්ම ගන්නා ලදී. එක්කෙනෙක් මෙහි සකදාගාමී ඵලයට පැමිණ මෙහිම පිරිනිවෙයි. එක්කෙනෙක් මෙහි පැමිණ දෙව්ලොව පිරිනිවෙයි. එක්කෙනෙක් දෙව්ලොවට පැමිණ මෙහි ඉපදී පිරිනිවෙයි. මේ සතරදෙනා මෙහි නොගන්නා ලදී. යමෙක් වනාහි මෙහි පැමිණ දෙව්ලොව ආයු තෙක් වැස නැවත මෙහි ඉපිද පිරිනිවෙයි. මේ එක්කෙනාම මෙහි ගන්නා ලදැයි දතයුතුය. මෙහි කිවයුතු සෙසු යමක් වේ නම් ඒ සියල්ල ඉහත ධම්මසංගහ අටුවා කථාවෙහි ලෝකෝත්තර කුසල නිද්දේසයෙහි කියන ලද්දේමය. මේ සකදාගාමියා ඒකබීජියා සමග කිම වෙනසක් වේද? ඒකබීජියා එකම ප්‍රතිසන්ධියකි. සකදාගාමියා ප්‍රතිසන්ධි දෙකකි. මෙය ඔවුන්ගේ වෙනස වේ.

අනාගාමී නිද්දේසයෙහි **ඔරම්භායොනං සංයෝජනානං** යන්නෙහි ඔරං යනු කාමලෝකයයි. මේ බැඳුම් පහ යමෙකුගේ හීන නොවී පවතී ද හේ භවාග්‍රයෙහි උපන්නේ ද බිලිය ගිලී මසු මෙන්, දිග තූලක් පයේ බැඳි කපුටෙකු මෙන් ඒ බැඳුම්වලින් අදිනු ලබන්නේ කාමධාතුවට ම වැටෙන නිසා පංච බන්ධනවලට ඔරම්භාගි යයි කියනු ලැබේ. යට භාග යයි යට

කොටස යයි යන අර්ථය වේ. **පරිකඛයා** යනු ඒ බන්ධනවල ක්ෂයවීමෙන් **ඔපපාතික** යනු ඉපදීමේ යෝනියයි. මෙයින් ඔහු ගැබක සයනය ප්‍රතික්ෂේප කරන ලදී. **අනාවත්තිත ධම්මා තස්මා ලොකා** යනු ප්‍රතිසන්ධි ග්‍රහණ වශයෙන් ඒ ලෝකයෙන් මෙහි නොපවතින ස්වභාවය, බුදුන් දැකීම, සඟුන් දැකීම, දහම් ඇසීම මොහුගේ පැමිණීම නොවලක්වන ලදී. අයං වුච්චති යනු මෙබඳු මේ පුද්ගලයා ප්‍රතිසන්ධි වශයෙන් නැවත කාම ලෝකයට නොඒමෙන් අනාගාමී නම් යයි කියනු ලැබේ.

අන්තරා පරිනිබ්බායි නිද්දේසයෙහි **උපපන්නං වා සමනන්තරා** යනු ඉපදීමෙන් සමනන්තරව **අපපන්නං වා වෙමජ්ඣං ආයුපපමාණං** යනු ආයුෂ ප්‍රමාණයෙහි මැදට නොපැමිණ. **අරියමග්ගං සංජනෙති** යන අර්ථයයි. වා ශබ්දයේ විකල්ප වශයෙන් මැදට පැමිණියහුද යන අර්ථය දතයුතුයි. මෙසේ අන්තරා පරිනිබ්බායි තුන්දෙනා සිද්ධ වෙති. උපරිට්ඨමානං සංයොජනානං යනු ඉහළ උද්ධංභාගිය සංයෝජන පහ, කෙලෙස් අට හෝ. **පහානාය** යනු මේවායේ ප්‍රහානය පිණිස මාර්ගය උපදවයි. **අයං වුච්චති** යනු මෙබඳුරූප වූ මේ පුද්ගලයා ආයු මැදට පැමිණි අනතුරුවම පිරිනිවන්පාන බැවින් අන්තරා පරිනිබ්බායි යයි කියනු ලැබේ.

උපහච්ච පරිනිබ්බායි නිද්දේසයෙහි **අනිකකමිත්වා වෙමජ්ඣං ආයුපපමාණං** ආයු ප්‍රමාණයේ මැද ඉක්මවා. **උපහච්ච වා කාලකිරියං** යනු එළඹි කාලක්‍රියාව ආයු කෙළවර ආසන්නයේ සිට යන අර්ථය වේ. **අයං වුච්චති** යනු මෙබඳුරූප වූ මේ පුද්ගලයා පළමුව අවිහයෙහි කල්ප දහස පමණ ආයුෂයෙන් කල්ප පන්සීයක සංඛ්‍යාවක මැද ඉක්මවා හයසිය වන කල්පයෙහි හෝ හත අට නවයෙහි හෝ එක්තරා කල්පයක දහවැන්නෙහි හෝ කල්ප සියයක් සිට රහත්බවට පැමිණ කෙලෙස් පිරිනිවුමෙන් පිරිනිවෙන්නේ උපහච්ච පරිනිබ්බායි යයි කියනු ලැබේ.

අසංඛාර සසංඛාර පරිනිබ්බායි නිද්දේසයෙහි අසංඛාරයෙන් අල්ප දුකෙන් අධිමාත්‍ර ප්‍රයෝග නොකොට කෙලෙස් පිරිනිවුමෙන් පරිනිර්වාණ ධර්මය යයි **අසංඛාර පරිනිබ්බායි** වේ. සසංඛාරයෙන් දුකෙන් කරදරයෙන් අධිමාත්‍ර ප්‍රයෝග කොට කෙලෙස් පිරිනිවුමෙන් පරිනිර්වාණ ධර්මය යයි **සසංඛාර පරිනිබ්බායි** වේ.

උදධංසොත නිද්දේසයෙහි ඉහළ බැවින් ඉහළ ඔහුගේ තෘෂ්ණා ස්‍රොතය (ජලපහර) සසර ස්‍රොත යයි හෝ **උදධසොතො** ඉහළට ගොස් හෝ ලැබිය යුතු බැවින් ඉහළ ඔහුගේ මාර්ග ස්‍රොත යයි උදධං සොත වේ. අකනිට්ඨයට ගමන් කෙරේ යනු **අකනිට්ඨගාමී** වේ. **අවිහා චුතො අතපපං ගචඡති** යනාදියෙහි අවිහයෙහි කල්ප දහසක් වසන්නේ රහත්බව පැමිණීමට නොහැකිව අතපපයට යයි. එහි ද කල්ප දෙදහසක් වසන්නේ රහත්බවට පැමිණීමට නොහැකිව සුදස්සයට යයි. එහි ද කල්ප හාරදහසක් වසන්නේ රහත්බවට පැමිණීමට නොහැකිව සුදස්සියට යයි. එහිද කල්ප අටදහසක් වසන්නේ රහත්බවට පැමිණීමට නොහැකිව අකනිට්ඨයට යයි. එහි වසන්නේ ආර්ය මාර්ගය උපදවයි යන අර්ථය වේ. මේ අනාගාමී ප්‍රභේදය දැනගැනීම පිණිස උදධංසොත අකනිට්ඨගාමී චතුෂ්කය දතයුතුය. එහි යමෙක් අවිහයෙහි පටන් සතර දෙව්ලොව පිරිසිදුකොට අකනිට්ඨයට ගොස් පිරිනිවන් පාන්නේය. මෙය උදධංසොත අකනිට්ඨගාමී නම් වේ. යමෙක් පහළ දේවලෝක තුන පිරිසිදු කොට සුදසසී දෙව්ලොව සිට පිරිනිවෙයි. මේ තෙමේ උදධංසොතය. අකනිට්ඨගාමී නොවේ. යමෙක් මෙයින් අකනිට්ඨයටම ගොස් පිරිනිවෙයි. මෙතෙම උදධංසොත නොවේ අකනිට්ඨගාමී වේ. යමෙක් පහළ සතර දෙව්ලොවෙහි එහි එයම පිරිනිවන්පායි. මේ තෙමේ උදධංසෝත නොවේ. අකනිට්ඨගාමී ද නොවේ. මෙසේ මේ අටසාළිස් අනාගාමීහු වෙති. කෙසේද? පළමුව අවිහයෙහි අන්තරා පරිනිබ්බායි තුන්දෙනෙකි. උපහච්ච පරිනිබ්බායි එක්කෙනෙකි. උදධංසොත එක්කෙනෙකි. අසංඛාර පරිනිබ්බායි පස්දෙනෙකි. සසංඛාර පරිනිබ්බායි පස්දෙනෙකැයි දසදෙනෙකි. එසේම අතපප, සුදසස, සුදසසීවල දහස් හතරකැයි සතළිසකි. අකනිට්ඨයෙහි උදධංසොත නැත. අන්තරා පරිනිබ්බායි තුන්දෙනෙකි. උපහච්ච පරිනිබ්බායි එක්කෙනෙකි. ඔව්හු අසංඛාර පරිනිබ්බායි සතරදෙනෙකි. සසංඛාර පරිනිබ්බායි සතර දෙනෙකි අටදෙනෙකි. මෙසේ හතළිස් අටදෙනෙක් වෙති. ඒ සියල්ලෝම ගැලවුණු පොත්තේ උපමාවෙන් දක්වන ලදහ. ඉදිකටු කතුරු මුවහතට රත්වූ ගිනිගලෙහි අල්ලනවිට ගිනිපුපුරු නැගී නිවේ. පළමු අන්තරා පරිනිබ්බායි මෙබඳු යයි දතයුතුය. කුමක්හෙයින්ද? ඉපදීමට සමාන්තරව කෙලෙස් පිරිනිවුමෙන් පිරිනිවෙන හෙයිනි. ඊට වඩා තදින් ගිනිගලෙහි අල්ලනවිට පුපුරු අහසට නැගී නිවේ. දෙවන අන්තරා පරිනිබ්බායි මෙවැනි යයි දතයුතුය. කුමක් හෙයින්ද? මැදට නොපැමිණ පිරිනිවෙන හෙයින්. ඊට වඩා තදින් ගිනිපුපුරු අහසට නැගී නැවතී පොළොවට වැටී නිවේ.

තුන්වන අන්තරා පරිනිබ්බායී මෙබඳුය. කුමක් හෙයින් ද මැදට පැමිණ හැපී පිරිනිවෙන හෙයින්. ඊට වඩා.....ගිනිපුපුරු අහසට නැගී පොළවට වැටී හැපී නිවේ. උපහච්ච පරිනිබ්බෙහි මෙබඳුය. කුමක් හෙයින්ද? කාලක්‍රියාවට එළඹ ආයුෂය ගෙවා පිරිනිවෙන හෙයින්. ඊට තදින්..... ගිනිපුපුරු කුඩා වියලි තණකොළ මත වැටී එය දවා නිවෙයි. අසංඛාර පරිනිබ්බායී මෙබඳුය. කුමක් හෙයින්ද? ප්‍රයෝග රහිතව ලුහු ගතියකින් පිරිනිවෙන හෙයින්. ඊට කලින්.....ගිනිපුපුරු මහත් වූ තෘණ කාෂ්ටවල වැටී ඒවා දවා නිවේ. සසංඛාර පරිනිබ්බායී මෙබඳුය. කුමක් හෙයින්ද? ප්‍රයෝග සහිතව ලුහු නොවන ගතියෙන් පිරිනිවන්පාන හෙයින්. ඉන්පසු මහත් වූ තෘණ කාෂ්ට මත වැටී ඒවා දැවෙන කල්හි පහවූ ගිනිදැල් ඇති අඟුරු හෝ ගිනිදැල් හෝ ඇතිවී කර්මාන්ත සාලාව දවා ගම්නියම්ගම් නගර රට දවා සමුද්‍රයට පැමිණ නිවේ. උද්ධංසොත අකනිට්ඨගාමියා මෙබඳු යයි දතයුතුය. කුමක් හෙයින්ද? අනේක භව බීජ ශක්ති ස්පර්ශය විනාශකොට පිරිනිවෙන හෙයින්. යම්හෙයකින් ආරකණ්කාදි භේදය කුඩා වූද මහත් වූද යකඩ කඩලමය. (හන ගලය) එනිසා සූත්‍රයෙහි සියළු වාරවල යකබලයම කියන ලදී. යම්සේ කීහ.

මහණෙනි, මෙහි භික්ෂුව මෙසේ පිළිපන්නේ වේ. මොහු නැත. නොවූයේය. නොවන්නේය. යමක් ඇත්නම් යමක් වූයේ නම් එය දුරුකරමි යයි උපේක්ෂා වෙයි. හේ භවයෙහි නොඇලේ. ඉපදීමෙහි නොඇලේ. ඉක්බිතිව උත්තර පද වූ ශාන්තිය මනා වූ ප්‍රඥාවෙන් බලයි. ඒ ශාන්ති පදය ද සියළු ආකාරයෙන් සියල්ල සාක්ෂාත් කෙළේ නොවේ. ඔහුට සියළු ආකාරයෙන් සියළු මානානුසය ප්‍රහීන වූයේ නොවේ. සියළු ආකාරයෙන් සියළු භවරාගානුසය ප්‍රහීන වූයේ නොවේ. සියළු ආකාරයෙන් සියළු අවිද්‍යානුසය ප්‍රහීන වූයේ නොවේ. හෙතෙම පංච ඕරම්භාගිය සංයෝජන ක්ෂය කර අන්තරා පරිනිබ්බායී වේ. යම්සේ මහණෙනි, දවස රත්වූ විට යකබලෙහි නැගී ගිනි පුපුරු ඇතිවී නිවේද එසේම මහණෙනි, මේ භික්ෂුව මෙසේ පිළිපන්නේ වේ. මෙය ඔහු නොවේ. අන්තරා පරිනිබ්බායී වේ. මහණෙනි, යම්සේ රත්වූ දවසෙහි යකබලෙහි හැනී ගිනිපුපුරු නැගී නිවෙන්නේය. මහණෙනි, එසේම භික්ෂුව මෙසේ පිළිපන්නේ වේ. මෙය ඔහු නොවේ. අන්තරා පරිනිබ්බායී වේ. මහණෙනි, මෙහි වනාහි භික්ෂුව මෙසේ පිළිපන්නේ වේ. මේ ඔහු නොවේ. අන්තරා පරිනිබ්බායී වේ. මහණෙනි, යම්සේ රත්වූ දිනයෙහි යකබලෙහි හැපී ගිනිපුපුරු ඇතිවී පොළොවෙහි හැනී නිවෙන්නේය. එසේම මහණෙනි, භික්ෂුව මෙසේ

පිළිපන්නේ වේ. මේ මොහු නොවේ. උපහච්ච පරිනිබ්බායි වේ. මහණෙනි, යම්සේ දවස රත්වූ විට යකබලෙහි නැගෙන කල්හි ගිනිපුපුරු ඉපදී නැගී ගොඩබිමින් හැනී නිවෙන්නේය. එසේම මහණෙනි, භික්ෂුව මෙසේ පිළිපන්නේ වේ. මෙය ඔහුගේ නොවේ. හැනී පිරිනිවෙන්නේය. මහණෙනි, මෙහි භික්ෂුව මෙසේ පිළිපන්නේ වේ. මෙය ඔහුගේ නොවේ. උපහච්ච පරිනිබ්බායි වේ. මහණෙනි, මේ භික්ෂුව මෙසේ පිළිපන්නේ වේ. මෙය ඔහුගේ නොවේ. අසංඛාර පරිනිබ්බායි වේ. මහණෙනි යම්සේ දවස රත්වූ විට යකබලේ හැනී ගිනිපුපුරු නැගෙන්නේය. නැගී කුඩා තෘණ සුඤ්ජයක හෝ දරගොඩක හෝ වැටී එය එහි ගිනි හෝ දල්වයි. දුම්ද දනවයි. ගිනිද දල්වා දුමද නගා එම කුඩා තෘණ පුංජය හෝ දරගොඩ හෝ දවා අනාහාරව නිවෙන්නේය. එසේම මහණෙනි, භික්ෂුව මෙසේ පිළිපන්නේ වේ. මෙය ඔහුගේ නොවේ. සසංඛාර පරිනිබ්බායි වේ. මහණෙනි, මෙහි භික්ෂුව මෙසේ පිළිපන්නේ වේ. මෙය ඔහුගේ නොවේ. උදධංසෝත අකනිට්ඨගාමී වේ. මහණෙනි, යම්සේ දවස රත්වූ විට යකබල නැගී ගිනි පුපුරු ඉපදී උඩ නැගී මහත් වූ තෘණ හෝ දරගොඩක වැටී එහි ගිනි හෝ උපදවා.....ඒ මහත් තෘණ පුංජය හෝ දර දවා යන්නේ ද දවන්නේය. වනයද දවන්නේය. යන්නේද දවා වනයද දවා හිස කෙළවර හෝ ගල් අන්තයට හෝ රමණීය වූ භූමි භාගයකට පැමිණ අනාහාරව නිවෙන්නේය. මහණෙනි, එසේම මේ භික්ෂුව පිළිපන්නේ වේ. මිශ්‍ර නොවේ. උදධංසෝත අකනිට්ඨගාමී වේ.

සෝතාපත්තිඵල සච්ඡිකිරියාය පටිපන්නායි නිද්දේසයෙහි අරුත් පැහැදිලිය. අයං වුච්චති යනු මෙබඳුරූප වූ මේ පුද්ගලයා රහත් යයි කියනු ලැබේ. මෙහි වනාහි දොළොස් රහතුන් දතයුතුය. කෙසේද? විමෝක්ඛ, සුඤ්ඤත, අනිමිත්ත, අපණිහිත යයි තුනකි. එහි සුඤ්ඤත විමෝක්ඛයෙන් මිදුණු බිණාශ්‍රවයා ප්‍රතිපදා වශයෙන් සිව්වැදෑරුම්ය. එසේම අනිමිත්ත අපණිහිත විමෝක්ඛාව ලද වේ. මෙසේ රහත් දොළොස් දෙනා දතයුතුය.

මෙසේ මේ දොළොස් රහතුන් මෙන් සකෘදාගාමී ද දොළොස් දෙනෙකි. අනාගාමී හතළිස් අටදෙනෙකි. මෙපමණ පුද්ගලයෝ මෙයින් මිදී බැහැර නූපදිති. මේ බුදු සසුන්හිම උපදිති.

ඒකක නිද්දේසය නිමි.

දුක නිද්දේසයෙහි **කොධනො** යනු කිපෙනසුළු මහා ක්‍රෝධයයි. මෙසේ පුද්ගලයා විචාරා ද ධර්මයෙන් පුද්ගලයා දැක්වීම සඳහා **තත්‍ථ කතමො කොධො** යනාදිය කීහ. උපනාහි නිද්දේසාදියෙහි ද මෙම නයම වේ. **කොධො කුජ්ඣනා** යනාදිය යට කියන ලදමය. එසේම උපනාහි නිද්දේසයෙහි **පුබ්බකාලං කොධො** යනාදිය. **අයං කොධො අපහීනො** යනු මෙපමණ ක්‍රෝධය විෂ්කම්භන ප්‍රහානයෙන් හෝ තදංග ප්‍රහානයෙන් හෝ සමුච්ඡේද ප්‍රහානයෙන් හෝ අප්‍රහීනය. උපනාහ ආදියෙහි ද මෙම නයයි.

අහිරික නිද්දේසාදියෙහි **ඉමිනා අහිරිකෙන** යනු මෙයින් මේ ආකාර අහිරික ධර්මයෙන් යුක්ත වූ. අනොත්තපෙපන යනාදියෙහි ද මෙම නයයි. **අජ්ඣත්ත සඤ්ඤොජනානි** යන ආධ්‍යාත්ම බන්ධනයයි. **බහිද්ධා සඤ්ඤොජනානි** යනු බාහිර බන්ධනයයි. ඒ දෙකම වඩු මඩු උපමාවෙන් දැක්විය යුතුය. මඩුවේ බඳින ලද ඇතුළේම සයනය කරන වස්සකු මෙන් මෙහි සිටි සෝවාන් සකදාගාමීහු ඔවුන්ගේ බැඳුම මෙහිමය. ඇතුළේ බඳින ලද පිටත සයනය කරන වස්සකු මෙන් රූප අරූප භවවල සෝවාන් සකදාගාමීහු ඔවුන්ගේ බැඳුම මෙහිය. සයනය බඹලොවය. පිටත බඳනා ලද පිටත සයනය කළ වස්සකු මෙනි. රූපාරූප භවවල අනාගාමී ඔහුගේ බැඳීමද නිදීමද පිටත වේ. පිටත බඳිනා ලද ඇතුළේ සයනය කළ වස්සකු මෙනි. මෙහි අනාගාමියා, ඔහුගේ බැඳුම රූපාරූප භවවලය. සිටීම මෙහිය.

අකෙකාධන නිද්දේසාදියෙහි **පහීනො** යනු විෂ්කම්භන ප්‍රහානයෙන් හෝ තදංග ප්‍රහානයෙන් හෝ සමුච්ඡේද ප්‍රහානයෙන් හෝ ප්‍රහීන වූ.

දුලලබ නිද්දේසයෙහි **දුලලභා** යනු සුලභ නොවේ. **පුබ්බකාරී** යනු පළමුවෙන්ම කරන්නා. **කතවෙදී** යනු කරන ලද්ද දනියි. දන්නා ලද්ද ප්‍රකට කරයි. ඔව්හූ ආහාර අනාගාරවල දැක්විය යුතුය. ගිහිගෙයි වනාහි මව්පියෝ පූර්වකාරීහු වෙති. දූ පුත්තු මව්පියන් පෝෂණය කරන්නේ ඔවුන්ට අභිවාදනාදිය කරන්නේ කෘතවේදීහු වෙති. පැවිද්දෙහි ආචාර්ය උපාධ්‍යායෝ පූර්වකාරීහු නම් වෙති. අනෙතවාසික සද්ධිවිහාරිකයෝ ඇදුරු උවදුරුවලින් පෝෂණය කරන්නේ අභිවාදනාදිය කරන්නේ කෘතවේදීහු නම් වෙති. ඒවා ප්‍රකට කිරීම සඳහා උපාධ්‍යාය පෝසක

සෝණ තෙරුන් ආදීන්ගේ කථාවස්තු කිවයුතුය. තවත් න්‍යායක්:- අන්‍යයන්ගේ උපකාර බලාපොරොත්තු නොවී ක්‍රියා කරන්නේ පුබ්බකාරී වේ. මව්පිය ඇදුරු උපාධ්‍යායවරුන් මෙනි. තෘෂ්ණා හරිත සතුන් අතුරෙහි හේ දුලබය. අන්‍යයන්ට කරන ලද උපකාර යට අනුරූප තමාට කරන උපකාර දන්නේ විඳින්නේ කතඤ්ඤූ කතවේදී වේ. මව්පිය ඇදුරු උවදුරුවලින් කෙරෙහි මෙනි. තෘෂ්ණාහරිත සත්ත්වයන් අතර මනාව පිළිපන් හේ දුලබය. තවද කරුණු රහිතව ආදරය කරන්නේ පුබ්බකාරීය. කරුණු සහිත ආදරය කරන්නේ කතඤ්ඤූකතවේදීය. කළත් නොකළත් උපකාර, උදව් කරන්නේ පුබ්බකාරී වේ. සාපේක්ෂකාරී වන්නේ කතවේදිය. අඳුරෙන් එළියට යන්නේ පුබ්බකාරීය. එළියෙන් එළියට යන්නේ කතඤ්ඤූ කතවේදීය. දෙවියන් සහිත ලෝකයෙහි අරහත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ පුබ්බකාරීයහ. ආර්ය ශ්‍රාවකයෝ කතඤ්ඤූකතවේදීයහ. පළමුවෙන් උපකාර කරන්නා පුබ්බකාරී නම් දුක නිපාත අටුවාවේ එය ඔහු කළ එය දැන පසුව උපකාර කරන්නේ කතඤ්ඤූකතවේදීය. ඔවුනතරෙහි පුබ්බකාරී ණය දෙමි යයි සන් කරයි. ණය දිරවූයෙමි යයි පසුව ක්‍රියා කරන්නා සන් කරයි. මෙපමණක්ම කියන ලදී.

අතතපපය නිද්දේසයෙහි දුතතපපයා යනු අතපපයා වේ. කිසිවෙකුට තෘප්තිමත් කළහැකි නොවේ. යමෙක් උපස්ථායක කුලය හෝ ඤාතිකුලය නිසා වෙසෙන්නේ සිවුරු දිරාගිය කල්හි ඔවුන් විසින් දෙන ලද සිවුරු බහා තබයි. පරිභෝග නො කරයි. නැවත නැවත දෙන ලද්ද ද ගෙන බහා තබයි. යමෙක් ඒ ක්‍රමයෙන්ම ලැබූ ලැබූ දේ අත්හරියි. අනුන්ට දෙයි. නැවත නැවත ලැබූ දේට ද එලෙසම කරයි. මේ පුද්ගලයෝ දෙදෙනා කරත්ත ගණන් පිරිනැමුවත් තෘප්තිමත් කිරීමට නොහැකි දුතතපපයෝ වෙති.

සුතපපය නිද්දේසයෙහි **න විසසජ්ජති** යනු තමාගේ නොකොට අනුන්ට නොදෙයි. අතිරේකයක් ඇති කල්හි බහා නොතබයි. අනුන්ට දෙයි. මෙය කියන ලද්දේ වේ. යම් භික්ෂුවක් උපස්ථාන කුලයෙන් හෝ ඤාති කුලයෙන් හෝ දිරුණු සිවුරට සාටකයක් ලැබ සිවුරක් කොට පරිභෝග කරයි. බහා නොතබයි. අගුළු දී පොරවන්නේ ද නැවත දෙන කල්හි වහා නොපිළිගනියි. යමෙක් ලද ලද දේ තමා පරිභෝග කරයි. අනුන්ට නොදෙයි. මේ දෙදෙනා පහසුවෙන් තෘප්තිමත් කළහැකි නිසා

සුතපපය නම් වෙති. **ආසවා** යනු කෙලෙස්ය. **න කුකකුවචායිතබ්බං කුකකුවචායනි** යනු කුකුස් කළයුත්තෙහි කුකුස් කරයි. හූරු මසක් ලැබ වලස් මස් යයි සැක කරයි. මුව මස් දිවි මස් යයි සැක කරයි. කාලය ඇතිකල්හි කාලය නැතැයි ද, නොපවරා පැවරුවෙමියි ද පාත්‍රයෙහි රජස් නැති කල්හි ඇතැයිද තම උදෙසා මස්මාළු නොකළ කල්හි මා උදෙසා කළැයි ද කුකුස් නොකරයි. අංගුත්තර අට්ඨාවෙහි වනාහි කුකුස් නොකළයුතු සංක්‍ෂෙප භාගයේ කුකුස් කළයුතුය. එහි තැබීම විචරණය එය කුකුස් නොකළ යුතුයයි මෙපමණක් කියන ලදී. **ඉමෙසං** යනු මේ පුද්ගලයන් දෙදෙනාගේ සරු භූමියෙහි තෘණලතාදිය මෙන් රාත්‍රියේ ද දවල් ද ආශ්‍රවයෝ වැඩෙත්මය. ශුක්ල පක්‍ෂයෙහි කැප මසක් ලැබ කැප මසකැයි ගන්නේ කුකුස් නොකළ යුතුය. කුකුස් නොකළ යන නාමයෙන් යන මේ නයින් අර්ථය දතයුතුය. **හීනාධිමුත්තිකො** යනු හීන අදහස් ඇත්තේ. **දුසසීලො** යනු සීල නැති. **පාපධමෙමා** යනු ලාමක දහම් ඇති. **පණීතාධිමුත්තෙතා** යනු ප්‍රණීත අදහස් ඇත්තේ. **කල්‍යාණධමෙමා** යනු සොඳුරු දහම්, පිරිසිදු දහම්. **තිත්තෙතා** යනු තෘප්තියට පත්. අවසන් කළ. **තපෙපතා** යනු අන් අයද තෘප්තිමත් කරන. **පවෙචක සම්බුදෙධා** යෙව තථාගත **සාවකා** මෙහි පසේ බුදුවරු නව ලෝකෝත්තර ධර්මයෙන් තමා තෘප්තිමත්හ. සම්පූර්ණයහ. අන් අය තෘප්තිමත් කිරීමට නොහැකි වෙති. උත්වහන්සේලාගේ ධර්ම කථාවෙන් අභිසමය (අවබෝධය) නොවේ. ශ්‍රාවකයන්ගේ වනාහි ධර්ම කථාවෙන් අප්‍රමාණ දෙවි මිනිසුන්ට අවබෝධ වේ. මෙසේ ඇතිකල්හි යම්හෙයකින් ඔව්හු ධර්මදේශනා කරන්නේ තමාගේ වචන කොට නො කියති. බුදුවරුන්ගේ වචනයයි කියා දහම් දෙසති. ඇසීමට සිටින පිරිස ද මේ භික්‍ෂුව තම අවබෝධ කළ ධර්මය නොකියයි. බුදුවරුන් විසින් අවබෝධ කළ ධර්මය දේශනා කරතියි ගෞරව කරති. මෙසේ ඒ ගෞරවය බුදුවරුන්ටම වේ. මෙසේ එහි සම්මා සම්බුදුන් වහන්සේම තෘප්තිමත් කරන්නා වෙති. යම්සේ අසවලාට මේ මේවා දෙනු යයි රජු අණකළ කල්හි කිසිවෙක් ගෙනවුත් දෙති. එහි රජතුමාම දායක වේ. යම් අය විසින් ලබන ලද්ද, රජතුමා විසින් දෙනලද තනතුරය ඓශ්වර්ය සම්පත් දෙන ලදැයි ඔව්හු ගනිති. රජ පිරිස විසින් දෙන ලදැයි නොවේ. මෙසේ මෙය පැමිණ ඇතැයි දතයුතුය. සෙසු සියළු තුන නොගැඹුරු අරුත් ඇත.

දෙවන නිද්දේසය නිමි.

තුන්වන නිද්දේසයෙහි දුස්සීලෝ යනු සිල් නැති. **පාපධම්මෝ** යනු ලාමක දහමය. සීල විපත්තියෙන් දුස්සීල හෝ දෘෂ්ටි විපත්තියෙන් පවිටු දහම්. කය වචන සංවරය බිඳීමෙන් හෝ දුස්සීල සෙසු සංවර භේදයෙන් පවිටු දහම්. අසුද්ධ ප්‍රයෝගයෙන් දුස්සීල. අසුද්ධ අදහසින් පවිටු දනම්. කුසල සීල නොමැතිකමින් දුස්සීල. අකුසල සීල යුත් හෙයින් පවිටු දනම්. **අසුචි** යනු අපිරිසිදු කායකර්මාදියෙන් යුක්ත. **සංකස්සර සමාචාරෝ** යනු සැකයෙන් අනුන් විසින් සිහි කළයුතු හැසිරීම. සැක සහිත හැසිරීම යන අර්ථයයි. දිවා ස්ථානවල රැස්වී කිසිවක් කථාකරන භික්ෂූන් දැක මොව්හු එකතුවී කතා කරති. මා විසින් කළ ක්‍රියාව දැන කතා කරත්දැයි මෙසේ සැක සහිත හැසිරීම වේ. **පටිඡන්න කම්මනෙතා** සැඟවිය යුතු පව්කම්කින් යුත්. **අස්සමණෝ සමණ පටිඤ්ඤා** අශ්‍රමණයෙක්ව. ශ්‍රමණ ප්‍රතිරූපතාවෙන් මම ශ්‍රමණයෙක්මියි මෙසේ ප්‍රතිඥාව. **අබ්‍රහ්මචාරි බ්‍රහ්මචාරි පටිඤ්ඤා** යනු අනිත් බ්‍රහ්මචාරීන් මනාව හැඳ පෙරවූ සකස් කළ පාත්‍ර ධර්ම ගම් නියම්ගම් ජනපද රාජධානිවල පිඬු පිණිස හැසිර දිවි ගෙවන්නන් දැක තෙමේ ද ඒ ආකාරයෙන් එසේ පිළිපදිනුයේ මම බ්‍රහ්මචාරීන්ට පිළිණ දෙන්නේ මෙන් වේ. මම භික්ෂු යයි කියා උපොසථාදියට පිවිසෙන්නේ බ්‍රහ්මචාරි පළිණ වේමය. එසේම සංඝික ලාභය ගැනීමේදී. **අනෙතා පූති** යනු අපිරිසිදු ක්‍රියාවෙන් ඇතුළට පිවිසි. ගුණ නැති බව හෝ ගුණසාර විරහිත බැවින් ඇතුළත අපිරිසිදු. **අවසසු තො** යනු රාගාදියෙන් තෙත් වූ. **කසම්බුජාතො** යනු හටගත් රාගාදි කසල. එසේ නැතහොත් කසම්බු යනු තෙත කුණප සහිත කසට ජලය යයි කියනු ලැබේ. මේ සසුනේ දුස්සීලයා නම් පිළිකුල් බැවින් තෙත කුනප කසට ජලය හා සමානය. එසේ හෙයින් කසල මෙන් ඇතිවී යයි කසම්බු ජාතො වේ. **තසස න එවං හොති** යන්න කුමක් හෙයින් නොවේද? යම්තැනක පිහිටීමෙන් රහත්බව ලැබීම හැකි වන්නේය. ඒ පිහිටීම බිඳුනු බැවින්. යම්සේ සැඩොල් ළමයෙකුට අසවල් ක්ෂත්‍රිය කුමාරයා රාජ්‍යයෙහි අභිෂේක කරන ලදැයි අසාද යම් කුලයක පසුව ඉපදී අභිෂේකයට පැමිණේ. ඒ කුලයෙහි පුතෙකුව නොඉපදුන බැවින් මෙසේ නොවේ. කවදා නම් මම ද ක්ෂත්‍රිය කුමාරයා මෙන් අභිෂේකයට පැමිණෙම්ද? එසේම දුස්සීලයෙකුට, අසවල් භික්ෂුව රහත් වූයේ යයි අසාද යම් සීලයක පිහිටියෙකු රහත්බවට පත්විය යුතුය. එය නොමැති වීමෙන් කවදා නම් මම ද ඒ සිල්වතා මෙන් රහත්බවට පැමිණෙන්නෙම් ද නම් මෙසේ නොවේ. අයං වුච්චති යනු මෙබඳු රූප වූ පුද්ගලයා රහත් බවට පැමිණීමේ ආසාව නැත්තේ නිරාස යයි කියනු

ලැබේ. **තසස එවං නොති** යනු කුමක් හෙයින්ද? යම්තැනක පිහිටීමෙන් රහත් බවට පැමිණීම හැකි වන්නේය. ඒ පිහිටීමෙන් ස්ථාවර වේ. යම්සේ සුජාත ක්ෂත්‍රිය කුමාරයෙකුට අසවල් ක්ෂත්‍රිය කුමාරයා රාජ්‍යයෙහි අභිෂේක කෙළේ යයි අසා පසුව යම්කිසි කුලයක ඉපිද අභිෂේකයට පැමිණේ. එහි පසු උපන් බැවින් මෙසේ වේ. කවදා නම් මම ද ඒ ක්ෂත්‍රිය කුමාරයා මෙන් අභිෂේකයට පැමිණෙන්නෙමි. එසේම සිල්වතෙක් අසවල් භික්ෂුව රහත්වූයේ යයි අසාම, යම් සීලයක පිහිටාම රහත්බවට පත්විය යුතුය. එහි පිහිටීමෙන් ස්ථාවර වී කවදා නම් මම ඒ භික්ෂුව මෙන් රහත්බවට පැමිණෙන්නෙමිද මෙසේ වේ. අයං වුචචති යනු එබඳු වූ මේ පුද්ගලයා අසංඝ බලාපොරොත්තු වන්නා වූ යයි කියනු ලැබේ. **යා හිසස පුබෙබ විමුතතසස** යනු ඒ ක්ෂීණාශ්‍රවයාගේ පෙර අරහත් විමුක්තියෙන් නොමිදුනා වූ විමුක්ති ආසා විය. එය සංසිඳී ඇති නිසා මෙසේ නොවේ. යම්සේ අභිෂේක කළ ක්ෂත්‍රියා හේ අසවල් රාජකුමාරයා රාජ්‍යයෙහි අභිෂේක කරන ලදැයි අසා එක් රජෙකුට අභිෂේක දෙකක් සේසත් දෙකක් නොවීමෙන් මෙසේ නොවේ. කවදා නම් මම ඒ රාජකුමාරයා මෙන් අභිෂේකයට පැමිණෙම්ද? එසේම ක්ෂීණාශ්‍රවයාට අසවල් නම් භික්ෂුව රහත්බවට පැමිණියේ යයි අසා රහත් දෙනමකගේ නොවීමෙන් කවදා නම් මම ඒ භික්ෂුව මෙන් රහත් වන්නෙම්ද? යන මෙය නොවේ. **අයං වුචචති** මෙබඳු වූ මේ පුද්ගලයා අරහත් බවට පැමිණීමේ ආසාවෙන් වෙන් වූ බැවින් විගතාසෝ (ආසා ඇති) යයි කියනු ලැබේ.

ගිලානූපම නිද්දේසයෙහි යම් උපමාවකින් ඔව්හු ගිලන් උපමා යයි කියනු ලබති. ඒ උපමාව දැක්වීමට **තයෝ ගිලානා** යනාදිය කියන ලදී. එහි **සපපාය** යන සුදුසු වුද්ධිකාරක. **පතිරූපං** සුදුසු. **නෙව වුටඨාති තමහා ආබාධා** යන පිළියම් කළ නොහැකි වාත අපස්මාරාදි රෝගයෙන් යුත් ගිලනා කියන ලදී. වුටඨාහි **තමහා ආබාධා** යන මෙයින් බහාලන ලද කුෂ්ට, තිලපුපඨක ආදි ජරා රෝග කියන ලදී. **ලභනෙතා සපපායානි භොජනානි නෙ අලභනෙතා** යන මෙයින් පිළියම් කිරීමට පහසු වූ සියළු රෝග කියන ලදී. මෙහි ද සුදුසු උපස්ථායකයා නම් ගිලාන උපස්ථායක අංගවලින් යුත් පණ්ඩිත දක්ෂ ක්‍රියාශීලී යයි දතයුතුය. **ගිලානුපටඨාකො අනුඤඤාතො භික්ෂු සංඝයා විසින් දෙන ලද අනුමැතියෙන්.** ඒ ගිලනාට තමාගේ ස්වභාවයෙන් යැපීමට නොහැකි වනවිට භික්ෂු සංඝයා විසින් භික්ෂූන්ගෙන් එක් භික්ෂුවක් ද සාමණේරයෙක් ද සොයා ලා මොහු

පෝෂණය කරන්නැයි ලබාදිය යුතුය. යම්තාක් ඔහු පෝෂණය කෙරේ නම් ඒ තාක් කල් ගිලනාට සහ ඒ දෙදෙනාට අවශ්‍ය දේ සැපයීම භික්ෂු සංඝයාට භාරය. **අඤ්ඤෑපි ගිලාන උපට්ඨාපෙතබ්බා** යනු අතිරේක ගිලනුන් දෙදෙනෙකුට උපස්ථාන කළයුතුය. කුමක් නිසාද? අවසානයට පැමිණි ගිලනෙකුට උපස්ථාන නොකරනු ලබනවිට 'මට උපස්ථාන කරනවා නම් මට පහසුවක් වෙයි' මට උපස්ථාන කරන්නේ නැතැයි සිත දූෂ්‍ය කරගෙන අපායේ උපදින්නේය. පෝෂණය කරනු ලබන්නාට මෙසේ වේ. භික්ෂු සංඝයා විසින් කළයුතු යමක් වීනම් ඒ සියල්ලම කරන ලදී. මගේ කර්ම විපාකය මෙබඳු යයි භික්ෂු සංඝයා කෙරෙහි මෙත්සිත පිහිටුවා ස්වර්ගයෙහි උපදී. යමෙක් අල්ප වූ අසනීපයකින් යුක්ත වූයේ උපස්ථාන ලැබුවත් නොලැබුවත් සුව වන්නේය. බෙහෙතක් නැතත් සුවවන අසනීපය බෙහෙත් කළ කල්හි ඉක්මණින්ම සුව වේ. එයින් හේ බුදුවදන් ඉගෙනීමට හෝ මහණදම් පිරීමට හෝ හැකිවන්නේය. මේ කාරණයෙන් අන්‍ය ගිලනුන්ටද උපස්ථාන කළයුතු යයි කියන ලදී. **නෙව ඔකකමනි** යනු නො පිවිසේමය. **නියාමං කුසලෙසු ධම්මෙසු සම්මතං** යනු කුසල ධර්මවල මාර්ග නියාම සංඛ්‍යාත සම්මතය. මෙයින් පදපරම පුද්ගලයා කියන ලදී. දෙවෙනි වාරයෙන් උගහටිතඤ්ඤක ගන්නා ලදී. සාසනයෙහි නාලක තෙරුන් සමාන. බුද්ධාන්තරයෙහි පසේ බුදුවරුන්ගේ සම්පයෙහි එක්වරක් අවවාද ලැබ පිළිවිදුනා ලද පසේ බුදු නුවණ ද තුන්වන වාරයෙන් විපචිතඤ්ඤූ පුද්ගලයා කියන ලදී. නෙය්‍ය පුද්ගලයා ඔහු නිශ්‍රිතවම වේ. **ධම්මදෙසනා අනුඤ්ඤාතා** යනු මාසයකට අටවරක් ධර්ම කථා අනුදන්නා ලදී. **අඤ්ඤෑසමපි ධම්මො දෙසෙතබ්බො** යනු සෙසු දහම් ද කිවයුතුය. කුමක් නිසාද? පදපරමයාට මෙම ආත්ම භාවයෙහි ධර්මය අවබෝධ කළ නොහැකි වුවත් අනාගතයට ප්‍රත්‍ය වන්නේය. යමෙක් තථාගතයන් වහන්සේගේ රූප දර්ශනය ලැබුවත් නොලැබුවත් ධර්ම විනයද ඇසීමට ලැබුනත් නැතත් ධර්මය අවබෝධ කරයි. හේ දහම් ඇසීම නොලබන්නේ එතෙක් අවබෝධ නොකරයි. ලබන්නේ වහා අවබෝධ කරයි. මේ කරුණින් ඔවුන්ට ධර්මය දේශනා කළයුතුය. තුන්වැන්නා වනාහි නැවත නැවත දේශනා කළයුතුය. කායසක්ඛි දිට්ඨප්පත්ත සද්ධාවිමුත්ත යට කියන ලදී.

ගුථභාණී ආදියෙහි **සභගගතො** යනු සභාවෙහි සිටින ලද. **පරිසගගතො** යනු ගමේ පිරිසෙහි සිටින ලද. **ඤාතිමජ්ඣගතො** යනු දායාද දෙන මැද සිටින ලද. **පූගමජ්ඣගතො** යනු සේනාව මැද සිටින

ලද **රාජකුල මජ්ඣගතෝ** යනු රාජකුලයේ මහා විනිශ්චය මැද සිටින ලද. **අභිනීතෝ** යනු ප්‍රශ්න ඇසීම සඳහා පමුණුවන ලද. **සකඛිපුටෙයා** යනු සාක්ෂි කොට අසන ලද. **එහි හෝ පුරිස** යන මෙය ඇමතීමකි. **අඤ්ඤහෙතු වා පරහෙතු වා** යනු තමාගේ හෝ අනුන්ගේ අත්පා ආදි හේතුවෙන් හෝ ධන හේතුවෙන් හෝ. **ආමිසකිඤ්චික්ඛහෙතු** යම් ඒ මේ අල්ප වූ. යටත්පිරිසෙයින් තිත්තිර වටු. ගිතෙල් පිඩ වෙඬරු පිඩ ආදි අල්ප වූයේ ද අල්ලසට හේතු යන අර්ථයි. **සම්පජාන මුසා භාසිතා** යනු දැනගෙනම බොරු කියන ලද්දේ වේ. **අයං වුච්චති** යනු එබඳු වූ මේ පුද්ගලයා අසූචි සමාන වචන ඇති බැවින් ගූථභාණි යයි කියනු ලැබේ. යම්සේ අසූචි නම් මහජනයාට අනිෂ්ට වේ. කාන්ත නොවේ. එසේම මේ පුද්ගලයාගේ වචන දෙව්මිනිසුන්ට අනිෂ්ට වේ. ප්‍රිය නොවේ. **අයං වුච්චති** යනු එබඳුරූප වූ මේ පුද්ගලයා මල් සමාන වචන ඇති බැවින් පුපඵභාණි යයි කියනු ලැබේ. යම්සේ පිපුණු ඉද්ද හෝ සමන් හෝ මල් මහජනයාට ඉෂ්ට වේ. ප්‍රිය වේ. එසේම මේ පුද්ගලයා හේ වචන දෙව් මිනිසුන්ට ඉෂ්ට වේ. ප්‍රිය වේ. **නෙලා** යන්නෙහි ඵල යනු දෝස යයි කියනු ලැබේ. ඵල නැති නිසා නෙල යයි කියනු ලැබේ. නිර්දෝෂ යන අර්ථයි. **නෙලගෙගා සෙතපඨාදොත** මෙහි කියන ලද නෙල මෙන්. **කණණසුඛා** යනු වචනවල මිහිරි බැවින් කනට සුවයකි. ඉඳිකටුවෙන් විදින්නාක් මෙන් කනට උල් නොදනවයි. අරුත් මිහිරි බැවින් මුළු සිරුරෙහි කෝපය ඇති නොවී ප්‍රේමය උපදවානුයි පෙමනියා වේ. හෘදයට පැමිණ වෙහෙසට පත් නොවන්නේ සුවසේ සිතට පිවිසේ යනු **හදයංගමා** වේ. ගුණ පිරීමෙන් පුරය වීර්යය වෙවී වේ. පුරයෙහි සංවර්ධන කාන්තාව මෙන් සුකුමාර බැවින් පොරී වේ. පුරයෙහි මෙය හෝ පොරී වේ. පුරයේ මෙය යනු නගරවාසීන්ගේ කථා නය අර්ථය වේ. නුවරවැසියන්ගේ කතා වේ. ප්‍රීතිමත්ය යන පිතා වේ. මානි මාත්‍රය මාතා වේ. භාතිමත්ත භතා වේ. මෙබඳු වූ කතා බොහෝදෙනාට ප්‍රිය වේය **බහුජන කනනා** වේ. බොහෝ දෙනාට ප්‍රියභාවයෙන් ම බොහෝදෙනාට මනාප වූ සිතේ වැඩීම කෙරේනුයි **බහුජන මනාපා** වේ. **අයං වුච්චති** මෙබඳු වූ මේ පුද්ගලයා මධුභාණි යයි කියනු ලැබේ. මුදුභාණි යනු ද පාඨයකි. දෙකේම මිහිරි වචන යන අර්ථයයි. යම්සේ චතු මධුර නම් ප්‍රණීත වේ. එසේම මේ පුද්ගලයාගේ වචන දෙව් මිනිසුන්ට මිහිරි වේ.

අරුකුපම චිතතාදියෙහි **අභිසජ්ජති** යනු ලගී. **කුපපති** යනු කෝප වශයෙන් කිපේ. **බ්‍යාපජ්ජති** යනු ප්‍රකෘතිභාවය අත්හරියි. කුණු වේ.

පතිට්ඨියති යනු ඊතභාවය තදබවට පැමිණේ. **කොපං** යනු දුර්වල ක්‍රෝධයයි. **දොසං** ද්වේෂ වශයෙන් ඊට වඩා බලවත් වේ. අපපච්චයං සතුට නැති, දොම්නසයි. **දුට්ඨාරුකෝ** යනු පැරණි තුවාලයකි. **කටෙඛන** යනු දණ්ඩක කෙළවරින්. **කළුලෙන** යනු කපාලයෙන්. **ආසවං දෙති** යනු නොසිඳී වැගිරේ. පැරණි තුවාලයේ එහි ස්වභාවය වශයෙන් සැරව ලේ ඉස්ම මේ තැන වැගිරේ. ගැටීමෙන් ඊට වඩා වැඩියෙන් වැගිරේ. **එවමෙව ඛො** යනු මෙහි මෙය උපමාව සැසඳීම වේ. පැරණි වණය මෙනි. ක්‍රෝධ පුද්ගලයා එහි ස්වභාවය වැගිරීම ක්‍රෝධ පුද්ගලයාගේ ස්වභාවය ද ඉදිමුණු අයකු මෙන් සැඬ හැසිරීමයි. දණ්ඩකින් හෝ කැටකැබලිත්තකින් හෝ ගැටීම මෙන් වචන ඇති වේ. ඇසීමට බොහෝ කැමැත්තෙන් මෙන් මා වැනි කෙනෙකුට මොහු මෙසේ කියා යයි අතිශයින් ඉදිමුණු බව දතයුතුය. අයං වුච්චති මෙබඳු මේ පුද්ගලයා අරුකූපමච්චිත්ත යයි කියනු ලැබේ. පැරණි තුවාල සමාන සිතය යන අර්ථය වේ.

රතනන්ධකාර තිමිසාය යනු රාත්‍රියෙහි චකුඛු විඤ්ඤාණයට පැමිණීම වැලැක්වීමෙන් නොපෙනීම කිරීමේ දැඩි අඳුර. විජජතතරිකාය යනු විදුලි කොටන ක්ෂණයෙහි. මෙයද මෙහි උපමා සංසන්දනයයි. ඇස් ඇති පුරුෂයකු මෙන් යෝගාවචරයා දතයුතුය. සෝවාන් මාර්ගය වළහන කෙලෙස් අඳුර මෙනි. සෝවාන් මාර්ග ඤාණය උපන් මොහොත විදුලිය කෙටීමක් මෙනි. සෝවාන් මාර්ග ඤාණයෙහි නිවන් දැකීම විදුලි කොටනවිට ඇස් ඇත්තෙකුට අවට රූප දර්ශනය වෙනවා මෙනි. සකදාගාමී මාර්ගය වලහන කෙලෙස් නැවත අඳුර පැතිරීම මෙනි. සකෘදාගාමී මාර්ග ඤාණය ඉපදීම නැවත විදුලි කෙටීමක් මෙනි. සකෘදාගාමී මාර්ග ක්ෂණයෙහි නිවන් දැකීම විදුලි කොටනවිට ඇස් ඇත්තෙකු රූප දැකීම මෙනි. අනාගාමී මාර්ගය වසන කෙලෙස් නැවත අඳුර පැතිරීමක් මෙනි. අනාගාමී මාර්ග ඤාණය ඉපදීම නැවත විදුලි කෙටීමක් මෙනි. විදුලිකොටන වෙලාවේ ඇස් ඇති මිනිසෙකුට අවට රූප පෙනෙන්නාක් මෙන් අනාගාමී මාර්ග ක්ෂණයෙහි නිවන්දැකීම දැනගත යුතුය. **අයං වුච්චති** මෙබඳු මේ පුද්ගලයා විජජූපම චිත්ත යයි කියනු ලැබේ. ස්වල්ප කාල එළියෙන් විදුලිය සමාන සිතය යන අර්ථය වේ.

වජිරූපම සිත්ේද මේ උපමා සංසන්දන යයි. රහත්මග ඤාණය වජ්‍රය (විදුර) මෙන් දතයුතුය. රහත්මග නුවණ අහුරන කෙලෙස් මිණිගැට

පහණ ගැට මෙනි. රහත්මග නුවණින් දැන කෙලෙසුන් හේ නැති බව විදුරෙන් මිණිගැට හෝ පහණ ගැට විනිවිද නො වැගිරෙන හැකිබව මෙනි. විදුරෙන් විනිවිද ගිය දෙයෙහි නැවත පරිසූරණක් නොමැති මෙන් රහත් මගින් නැසූ කෙලෙස් නැවත නූපදින බව දතයුතුය. **අයං වුච්චති** මෙබඳු මේ පුද්ගලයා වජිරූපමං චිත්ත යයි කියනු ලැබේ. කෙලෙසුන් මුලුමනින් නැසීමට සමත් විදුර හා සමාන සිතය යන අර්ථයයි.

අන්ධාදියෙහි **තථාරූපං චක්ඛු න හොති** යනු එබඳු ජාතික එබඳු ස්වභාව පැණ ඇසක් නොවේ. **එතං කරෙය්‍ය** යනු පිරුණු බවක් වැඩුණු බවක් කරන්නේය. **යාවජ්ජාන වජ්ජති** යනු සදොස් නිදොස්හි. **හීනපණීතෙ** යනු අධම උත්තමයෙනි, **කණහ සුකක සපපටිභාගෙ** යනු කළු සුදුවලම ඔවුනොවුන් පිළිබඳන නිසා ඊට ප්‍රතිපක්ෂ (පිළිවික්) වශයෙන් සප්පටිභාග යයි කියනු ලැබේ. මෙය මෙහි සංක්ෂේපයයි. කුසල ධර්මයෙහි කුසල් ධර්ම යයි පැණැසින් දන්නේය. අකුසලයෙහි අකුසල් යනු ද එසේය. සාවජ්ජාදියෙහි ද මෙම නයම වේ. කළු සුදු ප්‍රතිපක්ෂයෙහි අයහපත් ධර්මවල යහපත් ධර්ම ප්‍රතිපක්ෂ වශයෙන්, යහපත් ධර්මවල අයහපත් ධර්ම ප්‍රතිපක්ෂ වශයෙන් යයි යම් නුවණැසින් දන්නේය. එබඳු ඇසක් නොවේ යයි මෙම නයින් සෙසු තැන්වල ද අර්ථය දතයුතුය. **අයං වුච්චති** යනු මෙබඳු වූ මේ පුද්ගලයා මෙලොව භොග සංහරණ ප්‍රඥා චක්ෂුස ද පරලොව අර්ථ සොයන නුවණැසද නොවීමෙන් අන්ධ යයි කියනු ලැබේ. දෙවනුව මෙලොව භොග සංහරණ නුවණැස ඇතිව පරලොව අර්ථසාධක නැතිවීමෙන් එකචක්ඛු යයි කියනු ලැබේ. තුන්වෙනුව දෙකම ඇතිවීමෙන් ද්විචක්ඛු යයි කියනු ලැබේ.

අවකුජ්ජ පඤ්ඤාදියෙහි **ධම්මං දෙසෙනති** යන උපාසකය, බණ ඇසීමට පැමිණියේ යයි තමාගේ කටයුතු අත්හැර දම් දෙසති. **ආදි කල්‍යාණං** යනු මුල කලණය, සොඳුරුය, නිවැරදි නිදොස් කොට දේසනා කරති. සෙසු පදවල ද මෙම නයම වේ. මෙහි ආදි යනු මුල පිහිටුවීමය. **මජ්ඣං** යනු කථා මැදය. **පරියොසානං** යනු සනිටුහනය. (නිශ්චය) මෙසේ ධර්මය දේශනා කරන්නේ මුලින් පටන්ගැනීම කලණය, සොඳුරුය, නිවැරදි කොටම දේශනා කරයි. මැද ද අවසානය ද එසේය. එහිද ආදි මධ්‍ය අවසාන ඇත. සතරපද ගාථාවකද ආදි මධ්‍ය අවසාන ඇත. එහි පළමුවන පාදය ආදියයි දෙවන තුන්වන පාද මැදය. සතරවන පාදය අවසානයයි.

එක් අනුසන්ධියක් ඇති නිදානය ආදියයි. අනුසන්ධාන මැදය. ඉදමවොව යන අර්පනාව අවසානයයි. නොයෙක් අනුසන්ධි ඇත්තේ පළමු අනුසන්ධිය ආදියයි. ඉන්පසු එකක් හෝ නොයෙක් හෝ අනුසන්ධි මැදය. අවසන් අනුසන්ධිය අවසානයයි. මෙය දේශනා නයයි. අනුසාසනයේ වනාහි සීලය ආදියයි. සමාධිය මැදය. විපස්සනාව අවසානයයි. සමාධිය හෝ ආදියයි. විපස්සනාව මැදයි. මාර්ගය අවසානයයි. විපස්සනාව හෝ ආදියයි. මාර්ගය මැදයි. ඵලය අවසානයයි. මාර්ගය හෝ ආදියයි. ඵලය මැදයි. නිවන අවසානයයි. දෙක දෙක හෝ කරන්නේ සීල සමාධි ආදියයි. විපස්සනා මග්ග මැදයි. ඵල නිබ්බාන අවසානයයි. **සාත්‍ථං** යනු අර්ථ සහිත කොට දේශනා කරති. **සබ්‍යඤ්ජනං** යනු අක්‍ෂර සම්පූර්ණ කොට දේශනා කරති. **කෙවලපරිපුණ්ණං** යනු සියල්ල සම්පූර්ණ කොට අඩු නැතිව දේශනා කරති. පරිසුද්ධං යනු අවුල් නැතිව ගැට නැතිව දේශනා කරති. **බ්‍රහ්මචරියං පකාසෙනති** යනු මෙසේ දේශනා කරන්නේ ද ශ්‍රේෂ්ඨ හැසිරීම වූ ශික්‍ෂා පද තුන ඇතුළත් ආර්ය අෂ්ටාංගික මාර්ගය ප්‍රකාශ කරති. **නෙව ආදිං මනසිකරොති** යනු මුලින් පටන්ගැනීම මෙනෙහි නොකරයි. **කුමෙභා** යනු කලයයි. **නිකකුජෙජා** යනු කට යටට හරවා තබන ලද එවමෙවං මෙහි කළය මුනින් නැමුවාක් මෙන් අවකුජ්ජපඤ්ඤ පුද්ගලයා දතයුතුය. ජලය ඉසින කාලය මෙනි. දහම් දෙසීම ලබන කාලය ජලය පෙරලෙන කාලය මෙනි. ඒ ආසනයේ සිටියහුට ඉගෙනීමට අසමත් කාලය. ජලයේ සටහනක් නැති කාලය මෙනි. නැගිටිනවිට සලකුණක් නැති කාලය දතයුතුය. **අයං වුචචති** යනු මෙබඳු වූ මේ පුද්ගලයා අවකුජ්ජපඤ්ඤ යයි කියනු ලැබේ. අධොමුඛ පඤ්ඤසා යන අර්ථයයි.

ආකිණ්ණානි යනු බහන ලද. **සතිසෙම්මාසා පකිරෙය්‍ය** යනු අවසිහියෙන් විසුරුවන්නේය. එවමෙව යනු මෙහි උකුල මෙන් උච්ඡංග පුද්ගලයා දැකිය යුතුය. නොයෙක් නොයෙක් කැවිලි මෙන් නානා බුද්ධ වචනය. උකුලෙහි (ඔඩොක්කුවෙහි) නොයෙක් කැවිලි කමින් සිටින කාලය මෙනි. ආසනෙ හිඳගෙන දහම් ඉගෙනගන්නා කාලය. නැගිටිනවිට අසිහියෙන් කැවිලි විසුරුවන කාලය මෙනි. නැගිට යනවිට සලකුණක් නොමැති කාලය දතයුතුය. **අයං වුචචති** යනු මෙබඳු වූ මේ පුද්ගලයා උච්ඡංගපඤ්ඤ යයි කියනු ලැබේ. උච්ඡංගය සමාන පඤ්ඤා ඇත්තා යන අර්ථය වේ.

උකකුජ්ජා යනු කට උඩට හරවා තබන ලද. **සණ්ඨාති** යනු පිහිටුවයි. **එවමෙවඛෝ** මෙහි කට උඩට හරවා තබන ලද කළය මෙන් පුථුපඤ්ඤ පුද්ගලයා දැකිය යුතුය. ජලය වත්කළ කාලය මෙනි. දේශනාව ලැබූ කාලය. ජලය පිහිටි කාලය මෙනි හිඳගත්නා කාලය. නොවැටෙන කාලය මෙනි නැගිට යනවිට සලකුණු ඇති කාලය දතයුතුය. **අයං වුච්චති** යනු මෙබඳු වූ මේ පුද්ගලයා පුථුපඤ්ඤ යයි කියනු ලැබේ. පැවරුණු ප්‍රඥාව ඇත යන අර්ථයයි.

අවීත රාගාදියෙහි යම්සේ සෝවාන් සකෘදාගාමීහු එසේම පෘථග්ජනයෝද පස්කම් ගුණයෙහි හා තුන් භවයෙහි ද පහනොවූ රාග ඇත්තෝ වෙති. නුවණ නැති බැවින් නොගන්නා ලදී. යම්සේ දක්ෂ වඩුවෙක් සරු ගස් ඇති වනයකට පිවිස මුල පටන් හමුවෙන හැම ගසක්ම නොකපයි. කර්මාන්තයට සුදුසු ගසක්ම කපයි මෙසේ මෙහි භාග්‍යවතුන් වහන්සේ විසින් නුවණැති ආර්යයාට ගන්නා ලදී. පුහුදුන් පුගුලා නුවණ නැති බැවින් නොගන්නා ලදැයි දතයුතුය. කාමෙසු වීතරාගො යනු පස්කම් ගුණයෙහි පහවූ රාගය ඇති. **භවෙසු-අවීතරාගො** රූප අරූප භවවල පහනොවූ රාගය ඇති.

පාසාණ ලෙඛූපාදියෙහි **අනුසෙති** යනු ප්‍රහීන නොවූ හෙයින් අනුසේති වේ. **න බිපපං ලජ්ජති** යනු අතර නො නසියි. කල්පය ගෙවීමෙන් නසියි. **එවමෙව** යනු ඒ පුද්ගලයාගේ ක්‍රෝධය අනතුරුව දෙවන දිනයෙහි හෝ ඊළඟ දිනයෙහි හෝ නොනිවේ. කාලයක් පවතී. මරණයෙන්ම නිවෙය යන අර්ථය වේ. **අයං වුච්චති** යනු මෙබඳු වූ මේ පුද්ගලයා සෙල් ලිපියක් මෙන් ක්‍රෝධ භාවයෙන් කලක් සිටින හෙයින් පාසාණ ලෙඛූපමො යයි කියනු ලැබේ. **සො ච බවසස කොධො** යනු හේ ස්වල්ප වූ කරුණෙහි වහා කිපෙන ක්‍රෝධ ඇත්තේ වේ. **න චිරං** යනු චිරනොවන අප්‍රහීන බැවින් අනුව නිදයි. යම්සේ පොළොවෙහි ඇද කරන ලද ඉර සුළඟ ආදියෙන් වහා නැසේ. මෙසේම වහා උපන් ක්‍රෝධය ද වහා නිවේ යන අර්ථයයි. **අයං වුච්චති** යනු එබඳු වූ මේ පුද්ගලයා පොළොවෙහි ඉර මෙන් කිපෙන ස්වභාවයෙන් කලක් නොපවතිය යයි පඨවිලේඛූපමා යයි කියනු ලැබේ. **ආඝාළෙහන** යනු දැඩි සේ, කර්ම ඡේදනයෙන්, තද වචනයෙන්. **එරුසෙන** කණට සුවයක් නැති. **අමනාපෙන** සිතට සුවයක් නැති. **සංසඳති** යන එකක් වේ. **සඤ්ඤති** ගලපයි. **සමෙමාදති** යනු නිතරම වේ. නොහොත් **සංසන්ධති** යනු සිතේ සහ ක්‍රියාදියෙහි සිතින්

එකතු කිරීමට යයි. කිරි හා දියර මෙන් ඒකීභාවයට පැමිණේ යන අර්ථයයි. සම්මොදනී යනු උද්දේස ප්‍රශ්න ආදියෙහි වචන හා ක්‍රියාවල වචනයෙන් එක්කොට ගැනීමය. විදේශ රටකට ගිය තැනැත්තා ද ප්‍රිය සහායකයකු මෙන් ප්‍රියභාවයට පැමිණේය යන අර්ථයයි. තවද කටයුතු කාරණාවලදී ඔවුන් සමග මුලින්ම ඒක ක්‍රියාභාවයට එළඹෙන්නේ සසඳයි. මෑද තෙක් පවත්වන්නේ සන්ධි වේ. අවසානය දක්වා නොනවතින්නේ සම්මෙදති යයි දතයුතුය. **අයං වුච්චති** යනු එබඳු වූ මේ පුද්ගලයා දියේ ඉරක් මෙන් වහා සැසඳීමෙන් උදක ලේඛූපම යයි කියනු ලැබේ.

පොත්කුපමාවල යම් උපමාවකින් ඔව්හු පොත්කුපමා යයි කියනු ලබති. ඒ උපමාව දැක්වීමට තයෝ පොත්කා යනාදිය කියන ලදී. එහි **නවෝ** යනු අළුතෙන් වියන ලද. **පොත්කෝ** යනු හන වැහිරි සාටකයයි. **දුබ්බණ්ණා** යනු වර්ණ වෙනස් කිරීමය. **දුක්ඛ සම්ඵස්සා** යනු රළු ස්පර්ශයයි. **අපපගෙයා** යනු ඉතා බොහෝ වටිනා කහවණුවක් වටී. **මජ්ඣිමෝ** යනු පරිභෝගයෙන් මැද එය වනාහි අළුත්බව ඉක්මවා දිරුණු බවට නොපැමිණියේම වේ. මැද පිරිබෝ කල්හිද දුර්වර්ණ වූයේද රළු ස්පර්ශය වූයේද වටිනාකම අඩු වූයේද වේ. බොහෝ අගය ඇත්තේ අඩක් අගි. දිරුණු කාලයේ අඩ මසක් හෝ කාකයෙක් (තුට්ටුව) අගි. **උකබලි පරිමජ්ජං** යනු කළු හැලිය පිසදැමීම. නවෝ යනු උපසම්පදාවෙන් පස්වසට අඩු. උපතින් සැට වයස් වූවක නවකමය. දුබ්බණ්ණතාය යනු ශරීර වර්ණයෙන්ද ගුණ වර්ණයෙන් දුර්වර්ණ බැවින්. පිරිස් මැද හිඳින දුස්සීලයා හේ නිෂ්තේජස් බැවින් ශරීර වර්ණය ද දියුණු නොවේ. ගුණ වර්ණය ගැන කිවයුත්තක් නැත. **යෙ බො පනසස** යනු ඔහුගේ උපස්ථායකයෙක් හෝ ඤාති මිත්‍ර කෙනෙක් හෝ මේ පුද්ගලයා සේවනය කරති. **තෙසං** යනු ඒ පුද්ගලයන්ගේ ඇට ශාස්තෘන් සේවනය කරන මිථ්‍යාදෘෂ්ටිකයන්ගේ මෙන් දෙව්දතුන් සේවනය කරන කෝකාලිකාදීන්ගේ මෙන් ද ඒ සේවනය බොහෝ කලක් අහිත පිණිස දුක් පිණිස පවතී. මජ්ඣිමෝ යනු පස්වස් කාලයේ සිට නව වර්ෂ කාලය තෙක් මජ්ඣිම නම් වේ. **ථෙරෝ** යනු දස වර්ෂයේ පටන් ථෙරෝ නම් වේ. **එවමාහංසු** යනු මෙසේ කියති. **කිනනු බො තුයහං බාලයෙකුට කථා කිරීමේදී** යන අර්ථය කියන ලදී. තථාරූපං යනු එබඳු ජාති, එබඳු ස්වභාවය උකෙබපනීය කර්මයට හේතුවූ.

කාසිකවත්ථ උපමාවල **කාසී වස්ත්‍ර** නම් කපුඅංසු ගෙන කටින ලද නූලෙන් වියන ලද සියුම් වස්ත්‍රයයි. එය අළුතෙන් වියූ විට අගය අධිකය.

පරිභොග මධ්‍යමය විස්සක් තිහක් දහසක් අගී. දිරුණු කාලයෙහි ද අටක් දහයක් දහසක් වටී. **තෙසං නං හොති** යනු ඒ සම්මා සම්බුදුවරුන් සෙවිනා මෙන් එය සේවනය බොහෝ කල් දියුණුව පිණිස, සැප පිණිස පවතී. සම්මා සම්බුදු කෙනෙකුන් නිසා අද දක්වා මිදෙන සත්ත්වයින්ගේ ප්‍රමාණයක් නැත. එසේම සැරියුත් හිමි මහ මුගලන් හිමි අවසේස අසූමහ ශ්‍රාවකයන් නිසා ස්වර්ගයට ගිය සත්ත්වයන්ගේ ප්‍රමාණයක් නැත. අද දක්වා උන්වහන්සේලාගේ දර්ශනය අනුව පිළිපන් සත්ත්වයින්ගේ ද ප්‍රමාණයක් නැත. **ආධෙය්‍යං ගච්ඡති** යනු ඒ මහා ස්ථවිරයන්ගේ අර්ථ නිශ්‍රිත වූ වචන සුවඳ කරඬුවෙහි කාසික වස්ත්‍රය මෙන් තබා යයි. එසේ උත්තම අංගය වූ හිසෙහි හෘදයේද තැබිය යුතුයයි යයි. මෙහි සෙස්ස කියන ලද ආකාරයෙන්ම දතයුතුය.

සුපපමෙය්‍යාදියෙහි **සුඛෙන පමෙතබ්බා** යනු පහසුවෙන් මැණිය හැකි. ඉධ යනු මේ සත්ත්ව ලෝකයෙහි. **උදඛන** ආඩම්බරයෙන් යුත්. උනතළ උඩට විහිදුණු බට. හිස් මානය උඩට ඔසවා සිටී යන අර්ථයයි. චපලෝ පාතුය සැරසීම් ආදි චපලබවින් යුත්. **මුඛරෝ** දොඩමලු. **විකිණණ** වාචා අසංවර වචන. අසමාහිත සිතේ එකඟකමක් නැති. **විබහනත චිතත** භ්‍රාන්ත සිත. භ්‍රාන්ත දෙන භ්‍රාන්ත මුවදෙන සමාන. **පාකටින්ද්‍රියෝ** විවෘත ඉන්ද්‍රිය. අයං **වුච්චති** එබඳු වූ මේ පුද්ගලයා සුපපමෙය්‍ය යයි කියනු ලැබේ. යම්සේ දිය ස්වල්පයක ප්‍රමාණය පහසුවෙන් ගනී. එසේම මේ අඟුණ අංගවලින් යුත් පුද්ගලයාගේ ප්‍රමාණය පහසුවෙන් ගනී. එහෙයින් ඔහු සුපපවෙය්‍ය යයි කියන ලදී. එනිසා ඔහු සුපපමෙය්‍ය යයි කියනු ලැබේ. දුඛෙඛන ජමෙතබෙබා දුකින් මිනිස් යුතු. අනුදධතාදියට කියන ලද්ද ප්‍රතිපක්ෂ වශයෙන් දතයුතුය. අයං **වුච්චති** මෙබඳු රූප වූ මේ පුද්ගලයා දුපපමෙය්‍ය යයි කියනු ලැබේ. යම්සේ මහා සමුදුයෙහි ප්‍රමාණය දුකසේ ගනී. එසේම මේ ගුණාංගවලින් යුත් තැනැත්තාගේ ප්‍රමාණය දුකසේ ගනී. ඔහු අනාගාමී ද **ක්ෂීණාශ්‍රවයාද** කිවයුතු බවට පැමිණේ. එහෙයින් ඔහු දුපපමෙය්‍ය යයි කියනු ලදී. ප්‍රමාණ කළ නොහැකි නිසා **අපපමෙය්‍යෝ** වේ. යම්සේ අහසෙහි ප්‍රමාණය ගැනීමට නොහැකි සේ **ක්ෂීණාශ්‍රවයාද** අපපමෙය්‍ය යයි කියන ලදී.

න සෙවිතබබාදියෙහි **න සෙවිතබබ** යනු ලඟට නොඑළඹිය යුතුය. **න භජිතබෙබා** යනු නො ඇලිය යුතුය. **ත පයිරුපාසිතබෙබා**

සමීපයෙහි හිඳගැනීම් වශයෙන් නැවත නැවත සේවනය නොකළ යුතුය. **හීනෝ හොති සීලෙන** ආදියෙහි ගැනීමේ හීන බව දතයුතුය. යමෙක් පන්සිල් රකීද ඔහුව දස සීලය රකින්නා විසින් සේවනය නොකළ යුතුය. යමෙක් දස සිල් රකීද ඔහුට සිව් පිරිසිදු සිල් රකින්නා විසින් හා සේවනය නොකළ යුතුය. **අඤ්ඤතු අනුදදයා අඤ්ඤතු අනුකම්පා** යනු අනුදයාවද අනුකම්පාවද තබා තමාගේ අර්ථය සඳහා වූ මෙබඳු පුද්ගලයා නොසෙවිය යුතුය. දයාව අනුකම්පාව වශයෙන් ඔහු වෙත එළඹීමට වටී. **සදිසෝ හොති** මාන වේ. **සීලකථං ච නෝ භවිසසති** මෙසේ සමාන සීල වූ අපට සීලයම අරබයා කථා වන්නේය. **සා ච නෝ ඵාසු භවිසසති** ඒ අපගේ කථා දවසක් වුවත් පවතින්නේය. අරතමග කඩවීමක් නොවන්නේය. සීලවන්තයන් දෙදෙනෙක් අතුරෙන් එක්කෙනෙකුගේ සීල වර්ණනාව කියන කල්හි අනිත් තැනැත්තා සතුටු වෙයි. එහෙයින් ඔවුන්ගේ කථා පහසු ද පැවතීමද වේ. එක් දුස්සීලයෙක් ඇතිකල්හි දුස්සීලයාගේ සීලකථාව දුක්කථා මිස සීලකථා නොවේ. පහසුද පවතින්නේ ද නොවේ. සමාධි පඤ්ඤා කථාවලද මෙම නයම වේ. සමාධිලාභීන් දෙදෙනෙක් සමාධි කථාව පඤ්ඤාවන්තයෙක් පඤ්ඤා කථාව ද කියති. රැය හෝ දවාල ඉක්මෙනවා නො දනිති. සකකත්වා ගරුං කත්වා සත්කාර ද ගරුකාරද කොට. **අධිකෝ හොති** අතිරේකයක් වේ. **සීලකඛන්ධං** සීල රාශිය. **සීලං පරිපූරෙසසාමි** ඒ අතිරේක සීලය පුද්ගලයා නිසා තමාගේ සම්පූර්ණ නැති සීලරාශිය සම්පූර්ණ කරමි. **තසථ තසථ පඤ්ඤාය අනුගහෙසසාමි** මෙහි සීලයේ අසත්පාය අනුපකාර ධර්ම හැර සත්පාය උපකාර ධර්ම සේවනය කරන්නේ ඒ ඒ තැන සීලරාශිය ප්‍රඥාවෙන් අනුගෘහිතය. සමාධි පඤ්ඤා බන්ධවලද මෙම නයම වේ.

ජිගුචඡිතබබාදියෙහි **ජිගුචඡිතබෙබා** යනු අසූචි මෙන් පිළිකුල් කළයුතුය. **අථ බො නං** ඉක්බිතිව මොහුගේ. **කිනති සදෙදා** කථා ශබ්දය. **එවමෙවං** මෙහි අසූචිවළ මෙන් දුස්සීලයා දතයුතුය. අසූචි වළෙහි වැටී සිටි **නහර සර්පයා** මෙනි දුස්සීල පුද්ගලයා. වැසිකිලි වළෙන් ගොඩගත් **ඒ සර්පයා විසින්** පුරුෂයාගේ ශරීරය වෙළාගත් නමුත් දෂ්ට නොකළබව **මෙනි. දුස්සීලයා** ඇසුරුකරන ඔහුගේ කාර්යය නොකරන ස්වභාවය. **ශරීරය** අසූචියෙන් වැකී සර්පයා ගතකරන කාලය මෙනි. දුස්සීලයා ඇසුරු කරන්නාගේ නින්දාව ඇතිවන කාලය දතයුතුය. **නිඤකාලානං නිඹිරිගස් ගිනිපෙනෙල්ල. හීයේ‍යාසොමනතාය විචචිටායති** එය

ඇවිලෙන්නේ බොහෝසෙයින් සද්ද පවතී. ස්වභාවයෙන්ම පතුරු ගැලවෙනවිට ද සද්ද පවතී. විචිට්ඨායති යන ශබ්ද කරයි. ගැටුණුවිට වැඩියක් ශබ්ද කරයි යන අර්ථයයි. එවමෙවං මෙසේම ක්‍රෝධ පුද්ගලයා තමාගේ ස්වභාවයෙන් ම ආඩම්බරයෙන් චණ්ඩව හැසිරේ. අල්පමාත්‍ර වචනයක් කීවිට ද මා වැන්නෙකුට මෙසේ කියනියි වැඩියක් ආඩම්බර වන්නේ චණ්ඩව හැසිරේ. ගූථකූපෝ අසූචි පිරුණු වළ. අසූචි රාශියක් හෝ. මෙහි උපමා සංසන්දනය පෙර නයින්ම දතයුතුය. **තසමා එවරූපෝ පුග්ගලෝ අජ්ඣුපෙක්ඛිතබ්බෝ න සෙවිතබ්බෝ** යම්හෙයින් අධිකව ඇසුරු කිරීමෙන් අධිකව ඔහු වෙත එළඹීමෙන් ද කිපේමය. කිම, මෙයින් ඉවත් වන්නේ ද කිපේමය. එහෙයින් පිදුරු ගිනි මෙන් මධ්‍යස්ථ විය යුතුය. නො සෙවිය යුතුය. කිම කියන ලද්දේ වේ. යමෙක් පිදුරු ගින්නට ඉතා ළංවී තැවෙයි. ඔහුගේ සිරුර දැවේ. යමෙක් යමෙක් බොහෝ ඈත්වී තැවෙයි. ඔහුගේ සීතල නොසංසිඳේ. නොඑළඹ ඈත්නොවී මධ්‍යස්ථ භාවයෙන් තපින්නාට සීතල සංසිඳේ. ශරීරය ද නොදැවේ. එහෙයින් පිදුරු ගින්න මෙන් ක්‍රෝධ පුද්ගලයා මධ්‍ය ස්වභාවයෙන් මධ්‍යස්ථ විය යුතුය. නො සෙවිය යුතුය. භජනය නො කළ යුතුය. පයුරුපාසනය නොකළ යුතුය. **කල්‍යාණමිත්තෝ** යනු පිරිසිදු මිත්‍රයාය. **කල්‍යාණ සහායෝ** කලණ සහායකයාය. සහායෝ සමගාමීව එකට හැසිරෙන්නා. **කල්‍යාණ සම්පවංකෝ** යනු කලණයන් කෙරෙහි පිරිසිදු පුද්ගලයන් කෙරෙහි මහත් ඇදය. ඊට නැමුණු ඊට පහත් වූ ඊට නැමුණු මනස යන අර්ථයයි.

සීලෙසු පරිපූරකාරී ආදියෙහි **සීලෙසු පරිපූරකාරිනෝ** යනු මේ ආර්ය ශ්‍රාවකයෝ මාර්ග බ්‍රහ්මචර්යාවට ආදිභූත වූ යම් ඒ මේ ආදි බ්‍රහ්ම චරියක සතර පරිජී මහ සිකපද, ඒවා නො ඉක්මවීමෙන් යම් බුද්දානු බුද්දකවලට පැමිණෙත් ද, ඒවායින් නැගිටීමෙන් මානත් ආදි පිළියම් යෙදීමෙන්) සීලය කෙරෙහි කළයුතු සියළු දේ කරන්නේ යයි සීලෙසු පරිපූරකාරිනෝ යයි කියනු ලැබේ. සමාධි උවදුරු වනාහි කාමරාග ව්‍යාපාදයන්ගේ. ප්‍රඥාවට උපද්‍රව නම් සත්‍යය වඩන මෝහයේ මූළා නොවීම පිණිස සමාධි පඤ්ඤා වඩන්නේ ද සමාධි පඤ්ඤාවල කළයුතු දේ මාත්‍ර ප්‍රමාණයෙන් ප්‍රදේශ මාත්‍රයම කරත් යයි සමාධියෙහි ද ප්‍රඥාවෙහිද අවශ්‍ය ප්‍රමාණයෙන් කරන්නෝ යයි කියනු ලැබේ. මේ උපායෙන් ඉතිරි නය දෙකෙහි අර්ථය දතයුතුය. එහි තවද සූත්‍රාන්ත නයක් 'මහණෙනි, මෙහි භික්ෂුව සීලය සම්පූර්ණ කරන්නේ වේ. සමාධියෙහි ප්‍රමාණවත් සේ

කරන්නේ ප්‍රඥාවෙහි ප්‍රමාණවත් සේ කරන්නේ හේ යම් ඒ කුඩා අනුකුඩා සිකපදවලට පැමිණියේද නැගී සිටින්නේද වේ. ඊට හේතු කවරේද? මෙහි භික්ෂුව නුසුදුස්සෙක් නොවේ යයි කියන ලදී. යම් ඒ ආදි බ්‍රහ්මචරියක බ්‍රහ්මචර්යාවට සුදුසු ශික්ෂාපදවල තිරසීලී වේ. සිටිසුළු වූයේ සමාදන් වූ ශික්ෂාපදවල හික්මෙයි. හෙතෙම සංයෝජන තුන ක්ෂීණ කොට සෝවාන් වූයේ වේ. නොවැටෙන ස්වභාවය ඇත්තේ නියත වූ සම්බෝධිය (අවබෝධයට) පරායන වූයේ වේ. මහණෙනි, මෙහි භික්ෂුව සීලයෙහි සම්පූර්ණ වේ. සමාධියෙහි සම්පූර්ණ වූයේ වේ. ප්‍රඥාවේ ප්‍රමාණවත් වූයේ හෙතෙම යම් ඒ මේ ශික්ෂා පදවල හික්මෙයි. හෙතෙම ඕරම්භාගිය පහේ..... නො නවතින ස්වභාව ඇත්තේ ඒ ලෝකයෙන් මහණෙනි, මෙහි භික්ෂුව සීලයෙහි සම්පූර්ණ වූයේ සමාධියෙහි සම්පූර්ණ වූයේ ප්‍රඥාවේ සම්පූර්ණ වූයේ හෙතෙම යම් ඒමේ කුඩා අණුකුඩා....ශික්ෂාපද හික්මෙයි. හෙතෙම ආශ්‍රවයන්ගේ ක්ෂය..... පැමිණ වාසය කරයි.

සත්‍යාර නිර්දේශයෙහි **පරිඤ්ඤං පඤ්ඤපෙති** යනු ප්‍රහානය සමතික්‍රමණය පණවයි. **තත්‍ර** ඔවුනතර තිදෙනෙකු කෙරෙහි තෙන දථඨබෙබා ඒ පැණවීමෙන් ඒ ශාස්තෘවරයා රූපාවචර සමාපත්තිලාභී යයි දැකිය යුතුය යන අර්ථයයි. දෙවන වාරයෙහි ද මෙම නය වේ. **සම්මා සම්බුදෙධා සත්‍ථා තෙන දථඨබෙබා** ඒ තීර්ථකයන් විසින් අසා ධාරණ පැණවීමෙන් මේ තුන්වන ශාස්තෘවරයා සර්වඥ බුද්ධ යයි දතයුතුය. තීර්ථකයෝ කාමයන්ගේ පරිඥාව (දැනීම) පණවන්නේ රූපභවය කියයි. රූපයන්ගේ දැනීම පනවන්නේ අරූප භවය කියායි. වේදනාවන්ගේ දැනීම පණවන්නේ අසංඥභවයට කියති. මනාව පණවන්නේ මෙසේ පණවන්නේ නම් මනාව පැණවීමට හැකි නොවෙති. සම්මා සම්බුද්ධයන් වහන්සේ වනාහි කාමයන්ගේ ප්‍රහානය දැනීම අනාගාමී මාර්ගයෙන් පණවති. රූප වේදනාවන්ගේ ප්‍රහාන දැනීම රහත් මාර්ගයෙන් පණවති. **ඉමෙ තයො සත්‍ථාරා** මේ දෙදෙනා බාහිරකය. එක සම්මා සම්බුද්ධ යයි මේ ලෝකයෙහි ශාස්තෘවර තිදෙනා නම්. දෙවන සත්‍යාර නිර්දේශකයෙහි දිටෙය් චෙව ධම්මෙ යනු මේ ආත්ම භාවයෙහි. **අත්තානං සච්චකො ථෙතකො පඤ්ඤපෙති** යනු අත්තා නම් එකෙක් ඇත. නිත්‍යය, ධ්‍රුවය, සදාකාලිකය, විද්‍යමානය, ස්ථිරයයි පණවයි. **අභිසමපරායඤ්ච** යනු වෙනත් ආත්ම භාවයක මෙසේම පණවයි. මෙහි සෙස්ස කියන ලද නයින්ම දතයුතුය.

තික නිද්දේසය නිමි.

චතුක්කක නිද්දේශයෙහි **අසපපුරිසො** යනු ලාමක පුරුෂයාය. ප්‍රාණය හෙළීම (විනාශ කිරීම) **පාණාතිපාතී** වේ. නොදුන් දේ ගැනීම වන්නේ අදිනනාදානායි. කාමයන්හි වැරදි ලෙස හැසිරේනුයි **කාමෙසු මිච්ඡාචාරී.** බොරු කියානුයි මුසාවාදී. සුරාමේරය මද්‍ය ප්‍රමාදයෙහි සිටීනුයි **සුරාමෙරය මජ්ජපමාදට්ඨායි.** **පාණාතිපාතෙ සමාදිපෙති** යනු යම්සේ ප්‍රාණය නැති කෙරේද? එසේ ඔහු එහි ගැනීම ගන්වයි. සෙස්සෙහි ද මේ නයමය. **අයං වුච්චති** එබඳු වූ මේ පුද්ගලයා යම්හෙයකින් තමා කරන ලද්දෙහි ද දුසිල්බවින් යුක්ත වේ. යමෙකු එහි සමාදන් කරවා නම් ඒ පවේ භාගයක දායාදය හිමි වේ. එනිසා අසත්පුරුෂයා විසින් අසපුරිසතර යයි කියනු ලැබේ. **සපපුරිසො** යනු උතුම් පුරුෂයාය. **සපපුරිසතරො** යනු තමා විසින් කරන ලද්දෙහි සුසීලයෙන් යුක්තව යමෙකු සමාදන් කරවූයේ ද ඒ පිනේ අඩකඩ දායාද වන බැවින් උත්තමපුරිසෙන උත්තම පුරිසතර වේ. **පාපො** යනු අකුසල කර්මපථ සංඛ්‍යාත දසවිධ පවින් යුක්ත වූයේ. **කල්‍යාණො** යනු දසවිධ කල්‍යාණ ධර්මයෙන් යුක්ත වූයේ පිරිසිදුය. සොඳුරුය. මෙහි සෙස්ස යට කියන ලද නය අනුව නොගැඹුරු අරුත් ඇත්තේමය.

සාවජ්ජාදියෙහි **සාවජ්ජා** යනු දෝස සහිතය. **සාවජ්ජන කාය කම්මෙන** යනු දොස් සහිත වූ ප්‍රාණඝාතාදි කායකර්මයෙන්. සෙස්සෙසහිද මෙම නයයි. **අයං වුච්චති** එබඳු වූ මේ පුද්ගලයා තුන්දොරින් රැස්කරන කර්මයේ සදොස් බැවින් අසුචි කුණප ආදියෙන් යුත් ප්‍රදේශයක් මෙන් සාවද්‍ය යයි කියනු ලැබේ. **සාවජ්ජන බහුලං** යමෙකුගේ සාවද්‍ය කර්මම බොහෝ වේද? අනවද්‍ය කර්ම අඩුවේද? හෙතෙම සාවද්‍ය බහුල වූ කාය කර්මයෙන් යුක්ත අල්ප වූ අනවද්‍යයෙන් යුක්ත හයි කියනු ලැබේ. සෙස්සෙහි ද මෙම නයම වේ. කවරෙක් නම් මෙබඳු වේද? යමෙක් ගමෙහි හෝ නිගමයෙහි ධර්මතාව බැවින් කිසිවිට උපෝසථය සමාදන් වේ. සිල් පුරයි. **අයං වුච්චති** මෙබඳු රූප වූ මේ පුද්ගලයා තුන් දොරෙන් රැස්කරන කර්මයෙන් සාවද්‍යයේම බහුල බැවින් අනවද්‍යයේ අල්ප බැවින් වජ්ජබහුලො යයි කියනු ලැබේ. යම්සේ එක් ප්‍රදේශයක දුර්වර්ණ දුර්ගන්ධ පුෂ්ප රැස්කොට ඇත. ඒවා මත ඉද්ද පලොල් කෝඹු වැටී ඇත. මේ පුද්ගලයා එසේ යයි දතයුතුය. යම්සේ වනාහි එක් ප්‍රදේසයක කෝඩු ඉද්ද පලොල් මල් රැස් කොට තිබේ. ඒවා මත දුර්වර්ණ දුර්ගන්ධ ඩෙබර මල් වැටී ඇත. තුන්වන පුද්ගලයා මෙබඳු යයි දතයුතුය. **සතරවැන්නා** තුන්දොරින් රැස්කරන කර්මයේ නිදොස් බැවින් චතුමධුරයෙන් පිරුණු

රන් තලියක් මෙන් දතයුතුය. ඔවුන් අතරෙහි පළමුවැන්නා අඳබල් පුහුදුන් පුඟුලෙකි. දෙවැන්නා අතරින්පතර කුසල් කරන්නේ ලෞකික පෘථග්ජනයෙකි. තුන්වැන්නා සෝවාන් වූවෙකි. සකෘදාගාමී අනාගාමිහුද මොහු සමග සංග්‍රහ කරන ලදී. සතරවැන්නා ක්ෂීණාශ්‍රවයන් වහන්සේය. හෙතෙම වනාහි ඒකාන්තයෙන් අනවද්‍යම වේ. මෙය අංගුත්තර අටුවා කථා නය වේ.

උග්ඝටිතඤ්ඤු ආදියෙහි **උග්ඝටිතඤ්ඤු** යනු මෙහි ගලවාදැමීම නම් ඤාණ ගලවා දැමීමයි. ඤාණයෙන් ගලවා දමන ලද ඇසිල්ලෙහි දැනගනී යන අර්ථයයි. **සහඋදාහටවෙලාය** යනු කීමෙහි. කියන ලද ඇසිල්ලෙහිම. **ධම්මාභිසමයෝ** යනු සිව්සස් නුවණ සමග අවබෝධය. **අයං වුච්චති** මේ සතර සතිපට්ඨාන යනාදි නයින් සංක්ෂේපයෙන් මාතෘකාව තබන කල්හි දේශනා අනුසාරයෙන් ඤාණය යවා රහත්වීමට සමත් පුද්ගලයා උග්ඝටිතඤ්ඤු යයි කියනු ලැබේ. විස්තරය, විස්තරයෙන්ම අර්ථය දනී යයි **විපචිතඤ්ඤු** වේ. **අයං වුච්චති** සංක්ෂේපයෙන් මාතෘකා තබා විස්තර වශයෙන් අර්ථය බෙදනකල්හි රහත්බවට පැමිණීමට සමත් මේ පුද්ගලයා විපචිතඤ්ඤු යයි කියනු ලැබේ. උද්දේසාදියෙන් පැමිණවිය යුතු යනු **නෙයෙය්‍යා** වේ. **අනුපුබ්බෙන ධම්මාභිසමයෝ හොති** යනු අනුක්‍රමයෙන් රහත්බවට පැමිණීම. අක්ෂර පදම මොහුට පරම (අවසාන) යයි **පදපරම** වේ. ඒ ආත්මභාවයෙහි ධර්මය අවබෝධ නොවේ. **න තාය ජාතියා ධම්මාභිසමයෝ හොති** යනු ඒ ආත්මභාවයෙන් විදර්ශනාව හෝ මාර්ගය හෝ ඵලය හෝ නිපදවීමට නොහැකිය යන අර්ථය වේ.

යුත්තපටිභානාදියෙහි ඤාණයට ද ඤාණයට එළඹි වචන ද පටිභාන යයි කියනු ලැබේ. මෙහි එය අදහස් වේ. අර්ථයෙන් යුක්ත වූ ද ඤාණයෙන් යුක්ත වූ ද ප්‍රතිභානය මොහුට ඇත්තේය යනු **යුත්තපටිභානෝ** වේ. විචාරන ලද අනතුරුවම ප්‍රකාශ කරන්නට අසමත් බැවින් නො මුත්ත පටිභානය මොහුට ඇත්තේය යනු **නො මුත්තපටිභානෝ** වේ. මේ නයින් සෙස්ස දැනගත යුතුය. මෙහි වනාහි පළමුවැන්නා ඇසිල්ලක් විමසා යුතු දේම දකියි. තිපිටක චූලනාග ස්ථවිරයන් වහන්සේ මෙනි. උන්වහන්සේ වනාහි ප්‍රශ්නයක් විචාරන විට, විග්‍රහකොට යුක්ත ප්‍රයුක්ත කරුණුම කියති. දෙවැන්නා විචාරන ලද අනතුරුව යම් ඒ මේ වචනයකින් වසා තබයි. (පිළිබහයි) විමසා ද යුතු වූ දේ නොදකියි. වතුනිකායික පණ්ඩිත

තිස්ස ස්ථවිරයන් වහන්සේ මෙනි. උන්වහන්සේ වනාහි ප්‍රශ්නයක් විචාරන කල්හි ප්‍රශ්න විචාරීම අවසන් වනතුරු නොසිට යම් ඒ මේ දෙයක් කියති. උන්වහන්සේ වචනාර්ථය විමසනු ලබන්නේ කිසිතැනක නොනවතී. තුන්වැන්නා විචාරන සමකාලයෙහිම යුතු දේ දකියි. එකෙණෙහිම වචන ප්‍රකාශ කරයි. තිපිටක චූලාභය ස්ථවිරයන් වහන්සේ මෙනි. උන්වහන්සේ වනාහි ප්‍රශ්නයක් විචාරන ලද්දේ යුතු දේ හා ඒ සමග බැඳුණු දේ (යුකතපයුකත) ඉක්මනින් කියති. සතරවැන්නා විචාරන ලද්දේම යුතු දේ නොදකියි. යම් දෙයකින් වසන්නට ද නොහැකි වේ. නොබැඳුනාකාර ගිලුනෙක් වේ. ලාලුදායී තෙරුන් මෙනි.

ධම්මකථිකයන් අතරෙහි **අපඤ්ඤව භාසති** යනු පැමිණි පිරිසට ස්වල්පයක් කියයි. අසහිතඤ්ඤව යනු කියන්නේ ද අරුත් සහිතව කරුණු සහිතව නොකියයි. **පරිසාවසස න කුසලාහොති** යනු ඇසීමට හිඳගත් මොහුගේ පිරිස ද යුතු අයුතු, කරුණු කාරණා, සිලිටු නොසිලිටු නොදනී යන අර්ථය වේ. එවරූපො මේ තෙමේ එබඳු ජාතියේ බාල ධර්ම කථිකයෙකි. ඒ ජාතියේ බාල පිරිසෙහිම ධර්මකථික නාමය ලබයි. මෙම නයින් සියළුතන්හි අර්ථය දතයුතුය. මෙහි ද දෙදෙනෙක්ම ස්වභාව ධර්මකථිකයෝ වෙති. ඉතිරි අය ධර්මකථිකයන්ගේ අතරෙහි පිවිස සිටින නිසා මෙසේ කියන ලදී.

වලාහක උපමාවෙහි **වලාහක** යනු මේඝයයි. **ගජ්ජිතා** යනු අහස ගිගුරුමය. එහි ගොරවා නොවසින බව මෙනි. මිනිස්සු අහස ගොරවයි. සරු අස්වැන්නක් වන්නේ යයි බීජ වපුරති. ඉක්බිති නො වසින කල්හි කෙතේ බීජ කෙතෙහිම නැසේ. ගෙයි බීජ ගෙයිම නැසෙතැයි දුබික් වේ. ගොරවා නොවසින ස්වභාවය ද පවිටුය. මිනිස්සු මේ කාලයෙහි නොවසීය. වගල් කුඹුරුම වපුරති. ඉක්බිති වැසි වැස බීජ මහසමුදුරට පමුණුවයි. දුර්භික්ෂයක් ම වේ. ගොරවා වසින බව වනාහි යහපත්ය. එකල සුභික්ෂ වේ. නො ගොරවා නොවසින බව ඒකාන්තයෙන් ම පවිටුය. **භාසික හොති නො කතතා** දැන් ග්‍රන්ථධූරය පුරමියි විදර්ශනා ධුරය පුරමියි කියමන පමණකි. උද්දේසය නොගනියි. කමටහන් භාවනා නොකරයි. **කතතා හොති න භාසිතා** ග්‍රන්ථධූරය පුරමියි විදර්ශනා ධුරය පුරමියි නොකියයි. කාලය පැමිණි කල එය සම්පාදනය කරයි. මෙනයින් ඉතිරි ඒවාද දතයුතුය. මේ සියල්ල ප්‍රත්‍ය දායකයින්ටම කියන ලදී. එක්කෙනෙක්

අසවල් දිනයෙහි දානය දෙමියි සංඝයාට ආරාධනා කරයි. පැමිණි කල නොකරයි. මේ පුද්ගලයා පිනින් පිරිහෙයි. භික්ෂු සංඝයා ද ලාභයෙන් පිරිහෙයි. තවකෙනෙක් සංඝයාට ආරාධනා නොකොට සත්කාර කොට භික්ෂූන් පමුණුවන්නෙමි. ලබයි. අන් සියළුතන්හි ආරාධනා කරන ලද්දේ වේ. මේ තෙමේ ද පිනින් පිරිහෙයි. සංඝයා ද ඒ ලාභයෙන් පිරිහෙයි. තවකෙනෙක් පළමුව සංඝයාට ආරාධනා කොට පසුව සත්කාර කොට දන් දෙයි. මේ තෙමේ කෘත්‍යකාරී (කළමනාකාරී) වේ. තව කෙනෙක් සංඝයාට ආරාධනා නොකරයි. දන් නොදෙයි. මේ පවිටු පුද්ගලයා යයි දතයුතුය.

මූසික උපමාවල **ගාධං කත්තා නො වසිතා** තමාගේ ආශ්‍රයෙහි ගුලක් වළක් කනියි. එහි නොවසයි. වෙන කිසිතැනක වසයි. මෙසේ බළල් ආදි සතුරු වසයට යයි. බත්තා යනු ද පාර්‍යකි. **වසිතා නො ගාධං කත්තා** නො කනියි. අනුන් කැනූ ගුලේ වසයි. මෙසේ දිවි රකී. තුන්වැන්නා දෙකම කරයි. දිවි රකී. සතරවැන්නා දෙකම නොකරයි. සතුරු වසයට යයි. මෙම උපමාවෙන් උපමිත වූ පුද්ගලයන් අතරෙහි පළමුවැන්නා ඒ මීයා යම්සේ වළ කනීද එසේ නවංග සත්‍ථු සාසනය ඉගෙන ගනී. යම්සේ ඌ එහි නොවසයි ද කිසිතැනක වාසය කරමින් සතුරන් අතට යයි. එසේම මෙතෙමේද පරියත්ති වසයෙන් නුවණ මෙහෙයා චතුරාර්ය සත්‍යය අවබෝධ නොකරයි. ලෝක ආමිස ස්ථානවලම හැසිරෙන්නේ මරණය නැමති මාරයා, කෙලෙස් මාරයා, දේවපුත්ත මාරයා සංඛ්‍යාත සතුරන්ගේ වසඟයට යයි. දෙවැන්නා ඒ මීයා යම්සේ වළ නො කනීද එසේම නවංග සත්‍ථු සාසනය නොගනී. යම්සේ වනාහි අනුන් කනින ලද ගුහාවෙහි වාසය කරයි. දිවි රකියි. මෙසේ අනුන්ගේ කථා අසා චතුරාර්ය සත්‍ය ධර්මයන් අවබෝධ කොට තුන් මරුන්ගේ විෂය ඉක්මවයි. මේ නයින් තෙවන සතරවන උපමා සන්සන්දනය දතයුතුය.

අඹ උපමාවල **ආමං පක්කවණ්ණි** යනු ඇතුළත පැසී නැත. පිටත පැසුණා මෙනි. **පක්කං ආමවණ්ණං** ඇතුළත පැසී ඇත. පිටත නොපැසුණා මෙනි. සෙසු දෙකෙහි ද මෙම නයයි. එහි අඹේ නොපැසුණු බව යම්සේ ආමතා වේ. එසේම පුද්ගලයින්ගේ පුහුදුන් බව ආමතා වේ. ආර්යභාවය පක්කතා වේ. එහි යම්සේ එහි පැසුණු සමාන පැසුණු වර්ණ ඇති මෙබඳු පුද්ගලයා ද ආර්යයන්ගේ ඉදිරියට යෑම ආදිය සමාන බැවින් පැසුණු

වර්ණ ඇතැයි මේ නයින් උපමිත පුද්ගලයන් කෙරෙහි උපමා සැසඳීම දතයුතුය.

සට උපමාවල **කුමෙඛා** යනු කළයයි. **තුචෙඡා** ඇතුළත හිස්. **පිහිතො** වසා තබන ලද. ඇතුළත පිරුණු. **විවටො** විවෘත කර තබන ලද උපමිත පුද්ගලයන් අතර මෙහි ඇතුළත ගුණසාරයක් නැත්තා **තුචෙඡා** වේ. බාහිර සෝබන බැවින් **පිහිතො** වේ. පුද්ගලයා දතයුතුය. සෙස්සෙහිද මෙම නයම වේ.

විල උපමාවල - විලේ දණක් පමණ ජලය ඇති කල්හි වර්ණ පහළොවක් මිශ්‍රකළ බැවින් හෝ ඝන බැවින් හෝ දියේ මැනිම් තලය නොපෙනෙන බැවින් **උනතානො ගම්භීරාභාසො** නම් වේ. මිනිසුන් තුන්හතර දෙනෙකු පොව්වන ජලය ඇති කල්හි පිරිසිදු බැවින් දියේ මැනිම් සීමාව පෙනිමෙන් **ගම්භීරො උනතානාභාසො** නම් වේ. මේ කරුණු දෙකෙහි ස්වභාවයෙන් ඉතිරි දෙක දතයුතුය. පුද්ගලයා ද කෙලෙස් බහුල වූ බැවින් ගුණ ගැඹුරුබවක් නැති බැවින් ගුණ ගැඹුර ඇත්තන් හා සමානව ඉදිරියට යෑම් ආදියෙන් යුක්ත වූයේ **උනතානො ගම්භීරාභාසො** නම් වේ. මෙම නයින් සෙස්ස ද දතයුතුය.

ගව උපමාවල යම් ගවයෙක් තමාගේ ගව ගණයා සමග ගැටෙති. තැති ගන්වයි. පර ගව ගණයෙහි ඇලුණු යහපත් ස්වභාව ඇත්තේ වේ. මොහු සක ගව **චණෙඩා** නො පර ගව **චණෙඩා** නම් වේ. පුද්ගලයා ද තමාගේ පිරිස හා ගැටෙන්නේ ඵරුෂ වචන කියන්නේ හැසිරේ. අන්‍ය පිරිස් කෙරෙහි සුරස බව, නිහතමාන පැවැත්ම ඇත්තේ **සකගව චණෙඩා** වේ. නො **පරගව චණෙඩා** නම් වේ. මේ නයින් සෙස්ස ද දතයුතුය. මෙහි නිද්දේස වාරයෙහි **උඛෙඛජිතා හොති** යනු ගැටී බැණවැදී තැති ගැන්ම කෙරේ යන අර්ථයයි.

ආසීර්විෂ උපමාවල යම් සර්පයෙකුගේ විස වහා එයි. ඉක්මනින් පැතිරේ. දරුණු නොවේ. වැඩිකලක් නොපෙළයි. මෙය **ආගත විසො නො සොර විසො** වේ. සෙසු පදවලද මෙම නයයි. පුද්ගල බෙදීම වනාහි ප්‍රකට අර්ථ ඇත්තේමය.

අවිචාරව අනවබෝධව නින්දාවට සුදුස්සා වර්ණනා කරන ලද්දේ ආදියෙහි **අනනුපවජ්ජ** යනු සංසන්දනය නොකොට පරීක්ෂා නොකොට. **අපරියොගහෙත්වා** යනු ප්‍රඥා ගුණයන් නොගෙන. **භූතං තච්ඡං** යනු විද්‍යමාන බැවින් භූත වේ. විපරීත නොවීමෙන් තච්ඡං වේ. **කාලෙන** යුතු ඒ හා බැඳුණු කාලයෙන්. **තත්‍ර කාලඤ්ඤූ හොති** යනු යම් මෙය කාලයෙන් යයි කියන ලදී. එහි යම් පුද්ගලයෙක් කාලඤ්ඤූ හොති කාලය දනී. මේ ප්‍රශ්නය විස්තර කිරීම පිණිස මේ කාලයෙහි විමසන්නේ ද මා විසින් නොකිවයුතු වන්නේය. මේ කාලයෙහි කිවයුතු යයි කාලය කියයි නම් වේ. **උපෙක්ඛකො විහරති** මධ්‍යස්ථ උපේක්ෂාවෙන් වාසය කරයි. සෙසු සියල්ල නොගැඹුරුය.

උට්ඨාන ඵලූපජීවි යනාදියෙහි උට්ඨාන වීර්යයෙන්ම දවස ගෙවා එහි විපාක ඵලමාත්‍ර වශයෙන් කිසිවක් ලබා ජීවිතය ගෙවයි. එය වනාහි උත්සාහයට පැමිණ කිසි පින්පලයක් නොලබයි. ඒ සඳහා **යස්ස පුගලස්ස උට්ඨහතො** යනාදිය කියන ලදී. **තත්‍රපරිදෙව** යනු එයින් ඉහළ බ්‍රහ්මකායිකාදි දෙවියෝ. ඔවුන්ටද උට්ඨාන වීර්යයෙන් කටයුතු නැත. පින්පලයෙන් ජීවත්වෙති. පුඤ්ඤවතො ච යනු මේ පින් පින්වන්තයන් නම් ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදීනුද භූමාටු දෙවියන් ආදිකොට නිම්මානරතිය අවසන්කොට ඇති දෙවියන් සඳහා ද කියන ලදී. මේ සියළුදෙනාම උත්සාහ ඵලය ද පින්ඵලය ද අනුභව කරති. නිරය වාසිකයෝ වනාහි උත්සාහයෙන් දිවි රැකීමට නොහැකි වෙති. ඔවුන්ගේ පින්පලයෙන් ජීවත්වීමක් නැත.

අඳුරු ආදියෙහි පහත් කුලයක උපන්නේය යන ආදී අඳුරින් යුක්ත වූයේ **තමො** නම් වේ. කාය දුශ්චරිතාදියෙන් නැවත නිරයට පැමිණියේ **තම පරායන** වේ. **නෙසාද කුලෙ** යනු මුව වැද්දන් ආදීන්ගේ කුලයෙහි. **වෙන කුලෙ** යනු බටපොතු කාර්මික කුලයෙහි. **රථකාර කුලෙ** යුද අවි සාදන කුලයෙහි. **පුක්කුස කුලෙ** පවිත්‍ර කරන කුලයෙහි. **කසිර වුත්තිකෙන** දුකඛ වෘත්තියෙන්. දුබ්බණ්ණා දුර්වර්ණ, පාංසු පිසාචයකු මෙන්. දැවුණු කත්‍රවක වර්ණයෙන්. **දුද්දසිකො** - වැදූ මව ද අමනාපයෙන් දකින. **ඔකොටිමකො** මීටි. **කාණො** එක් ඇසක් හෝ දෙඇසම කන වූ. **කුණී** එක් අතක් හෝ දෑතම කොර වූ. **බඤ්ජො** එක් පයක් හෝ දෙපයම කොරවූ. **පකඛහතො** අත්පා කොරවූ. **පදීපෙය්‍ය** තෙල් කබල් ආදි පහන් උපකරණ.

එවං පුගගලෝ තමෝ හොති තමපරායනෝ මෙහි එක් පුද්ගලයෙක් පිටත එළියක් නොදැක මව්කුසම කඵරියකොට අපායවල උපදින ලද බැවින් කල්පයක් සැරිසරයි. හේ ද තමොතම පරායන වේ. හේ වනාහි කුහක පුද්ගලයෙක් වන්නේය. කුහකයාගේ මෙබඳු වූ උපත වේ යයි කියන ලදී. මෙහි ද **නීචෙ කුලෙ පචජාජාතෝ හොති චණ්ඩාල කුලෙ වා** ආදියෙන් පැමිණීමේ විපත මෙන්ම පෙර උපන් ප්‍රත්‍ය විපත්තිය ද දක්වන ලදී. දලිද්දෙ ආදියෙන් පවතින ප්‍රත්‍ය විපත්තිය. **කසිර ජුතනිකෙහි** ආදියෙන් ජීවත්වීමේ උපාය විපත්තිය. **දුබබණ්ණෙ** ආදියෙන් රූප විපත්තිය. **බහාබාධො** ආදියෙන් දුක් කරුණු එකතුවීමෙන්. **න ලාභී** ආදියෙන් සුව කරුණු විපත් ද උපභෝග විපත්තියද. කායෙන දුච්චරිතං ආදියෙන් අඳුරට යන කරුණු එකතුවීම. **කායසස භෙදා** ආදියෙන් ඊළඟ භවයෙහි අඳුර එළඹීම. හොඳ පැත්තෙහි කියන ලද්දට ප්‍රතිපක්ෂ වශයෙන් දතයුතුය. තවද මෙහි තිවිධ කුසල සම්පත්තියෙන් ඉපදීමෙන් ආලෝකයෙන් යුක්ත වූයේ **ජොති** වේ. ආලෝක ඇතැයි කියන ලද්දේ වේ. කාය සුචරිතාදියෙන් ස්වර්ග උත්පත්ති ආලෝකයට එළඹියේ. **ජොතිපරායනෝ** වේ. ක්ෂත්‍රිය මහාසාර කුල ආදියෙහි **ඛතතිය මහාසාලෝ** යනු ක්ෂත්‍රිය මහාසාරය. මහාසාර බවට පැමිණි ක්ෂත්‍රියා. යම් ක්ෂත්‍රියෙකු යටත්පිරිසෙයින් කෝටි සියයක් නිධානගත ධනය වේ. වියදම සඳහා කහවණු කළ තුනක් ගේ මැද ගොඩගසා ඇත. ඒ ක්ෂත්‍රිය මහසාර වේ. සෙසු බ්‍රාහ්මණයින්ට අසූ කෝටියක් නිධන්ගත වේ. වියදම සඳහා කහවණු කළ එකහමාරක් ගේ මැද ගොඩගසා ඇත. ඒ බ්‍රාහ්මණ මහාසාර නම් වේ. සෙසු ගෘහපතීන්ට සතළිස් කෝටියක් නිධන්ගත වේ. වියදම සඳහා කහවණු කළයක් ගේ මැද ගොඩගසා ඇත. ඒ ගෘහපති මහාසාර නම් වේ. ඔවුන්ගේ කුලයෙහි යන අර්ථයයි. අඩෙඩ ඉසුරුමත් නිධන්ගත ධනය මහත් බැවින් **මහදධනෙ** වේ. රන්රිදී භාජනා දී උපභෝග භාණ්ඩ මහත් බැවින් **මහාභොගෙ** වේ. නිධානගත රන්රිදී ධනයේ බොහෝ බැවින් **පහතජාතරූපරජතෙ** වේ. සම්පත් උපකරණවල සතුට වඩන කරුණු බොහෝ බැවින් **පහූත විතතූපකරණෙ** වේ. ගව ධනාදිය ද සප්තවිධ ධාන්‍යවල ද බොහෝ බැවින් **පහූත ධන ධඤඤ** වේ. **අභිරූපො** සුන්දර රූපය. **දසසනීයො** සෙසු වැඩ හැර දවසක්ම බැලිය යුතු. **පාසාදිකො** දැකීමෙන්ම සිත පැහැදීම ඇතිකරන. **පරමාය උතුම්. වණණපොකඛරතාය** ශරීර වර්ණයෙන් යුත්. පොකඛර යනු ශරීරය යයි කියනු ලැබේ. එහි වර්ණ සම්පත්තිය යන අර්ථය වේ. **සමනනාගතෙ** යුක්ත. ඔණතොණතාදියෙහි මෙලෝ පරලෝ

සම්පත් නැති ඔණතො වේ. පහත් ලාමක යන අර්ථයයි. ඊට විපක්ෂ වශයෙන් උණතො වේ. උසස් උසස්ව නැගුණු යන අර්ථය වේ. මෙහි සෙස්ස තමාදියෙහි කී නයින්ම දතයුතුය. තවද **ඔණතොණාතො** දැන් පහත්ය. පසුව උසස් වේ. **උණතාතොණත** දැන් උසස්ය. පසුව පහත් වේ. **උණතාතුණතො** දැන් උසස්ය. පසුවද උසස් වන්නේය.

රුක් උපමාවල පළමුව රුක් **එගගු සාරපරිවාරෝ** වන දෙටු රුක තමා ඵලය වේ. පිරිවර රුක් සාර වේ. මෙම නයින් සෙස්ස දතයුතුය. පුද්ගලයන් කෙරෙහි වනාහි සීලසාර නැත්තේ ඵලබව වේ. සීලසාර යුක්ත වූයේ සාරවත් බව දතයුතුය.

රූප ප්‍රමාණ ආදියෙහි සම්පත් යුතු රූප ප්‍රමාණ කෙරේනුයි **රූපපපමාණො** වේ. එහි පැහැදීම ඇතිකරයි යනු රූපපපසනෙනා වේ. **කිරිති** ශබ්ද සෝෂය ප්‍රමාණ කෙරේනුයි **සොසපපමාණො** වේ. ආරෝහ යනාදියෙහි **ආරොහං** වේ. උසස් බව වේ. පරිණාහං - කෘෂ ථූල භවයක් නැති වටමට සම්පත. සණ්ඨානං - අඟපසඟාදියේ දිගුකොට වට ආදි යුතු තැන්වල යථා ස්වභාවය. පාරිපූරිං කියන ලද ආකාරයෙන් නොඅඩු, **ලක්ඛණ** පිරිපුන් බව හෝ. **පරවණණානාය** අන්‍යයන් විසින් අනභිමුඛයෙහි පිටකරන ගුණවරුණෙන්. පරථොමතාය අන්‍යයන් විසින් ස්තුති වශයෙන් ගාථාදි නිබන්ධයෙන් කියන ලද ස්තුතියෙන්. පරපසංසනාය අන්‍යයන් විසින් ඉදිරියෙහි කරන ලද පැසසුමෙන්. පරවණණාහාරිකාය පරම්පරා ස්තුති වශයෙන් අන්‍යයන් විසින් පවත්වන ලද වරුණ ගෙනයෑමෙන්. **චීවරලූබං** සිවුරේ දුර්වර්ණ භාවයෙන් රූක්ෂ බව. **පතත ලූබං** භාජනයෙහි වර්ණ සටහන් වස්තුවලින් රූක්ෂ වූ. **සෙනාසන ලූබං** නාටකාදි සම්පත් නැති බැවින් සේනාසන රූක්ෂ බව. **විවිධං** අචෙලකාද භාවයෙන් නොයෙක් ආකාර වූ. **දුකකර කාරිකං** ශරීරය තැවීම, වෙනත් න්‍යායක් : මේ සිවු පුද්ගලයින් කෙරෙහි රූපය ප්‍රමාණකොට පැහැදුනේ. **රූපපපමාණො** නම් වේ. රූපපපමානො යනු එහිම අර්ථ වර්ණනයයි. ශබ්දයෙහි ප්‍රමාණය ගෙන පැහැදුනේ **ලූබපපමාණො** නම් වේ. ධර්මයෙහි ප්‍රමාණය ගෙන පැහැදුනේ **ධම්මපපණෙණා** නම් වේ. සෙස්සෙහි ඒවායේම අර්ථ වර්ණනා වේ. සියළු සත්ත්වයෝ ද කොටස් තුනක් කොට, කොටස් දෙකක් රූපපපමාණ වේ. එක කොටසක් රූපපපමාණ නොවේ. කොටස් පහක් කොට, සතර කොටසක් ශබ්ද ප්‍රමාණ වේ. එක් කොටසක් ශබ්ද ප්‍රමාණ

නොවේ. කොටස් දහයක් කොට, කොටසක් ලූඛපප්‍රමාණ වේ. එක කොටසක් රළු ප්‍රමාණ නොවේ. ලක්ෂයක් කොටස් කොට, ධර්ම ප්‍රමාණ ගනනින් එක් කොටසකි. සෙස්ස ධම්මපපමාණ නොවේ. ලොව වසන සතර ප්‍රමාණය මෙසේය. ලොව වසන මේ සතර ප්‍රමාණයෙහි බුදුවරුන් කෙරෙහි අප්‍රසන්න වූවෝ මද වෙති. ප්‍රසන්න වූවෝ බොහෝය. රූපපපමාණයෙහි බුද්ධරූපයෙන් ඉහළ පැහැදීම ගෙනදෙන රූපයක් නම් නැත. සොසපප්‍රමාණයේ බුදුවරුන්ගේ කීර්ති ඝෝෂයට වඩා ඉහළ පරිසාදාවන ශබ්දයක් නම් නැත. ලූඛපප්‍රමාණයෙහි මහත් වටිනා කසීසළු රන්භාජන සෘතු තුනට ගැලපෙන සියළු සම්පතින් යුත් උතුම් ප්‍රාසාද අත්හැර පසල් සිවුර සෙල්මුවා පාත්‍රය රුක්මුල් ආදී සෙනසුන් සෙවීනා භාග්‍යවත් බුදුන් වහන්සේට වඩා රූක්ෂභාවයෙන් ඉහළ ප්‍රසාදාවන රූක්ෂභාවයක් නැත. ධර්මප්‍රමාණයේ දෙවියන් සහිත ලෝකයෙහි අසාධාරණ වූ සීලාදි ගුණ යුත් තථාගතයන් වහන්සේගේ සීල ගුණයෙන් ඉහළ පැහැදීම ගෙනදෙන වෙනත් සීල ගුණයක් නම් නැත. මෙසේ භාග්‍යවතුන් වහන්සේ ලොව වසන මේ සතර ප්‍රමාණය මිටින් ගෙන මෙන් සිටියහ.

අත්ත හිත පිණිස පිළිපන්නාදියෙහි **සීලසම්පනෙනා** සීලයෙන් යුත්. **සමාධි සම්පනෙනා** ආදියෙහි ද මෙම නයමය. මෙහි සීලය ලෞකික ලෝකෝත්තර වශයෙන් කියන ලදී. සමාධි ප්‍රඥා ද එසේය. **විමුතති** රහත්ඵල විමුක්තියම වේ. **විමුතතිඤාණ දසසනං** දහනව ආකාර වූ ප්‍රත්‍යවේක්ෂා ඤාණය. නො පරං යනාදියෙහි පර පුද්ගලයා ඔහු විසින් ද සීලයෙන් යුක්ත වීම වටී යයි කියා යම්සේ සීලය සමාදන් වෙයි. මෙසේ සමාදන් නොකරවයි. නොගන්වයි. සියළු තැන මෙසේය. මේ සතුරෙහි වනාහි පළමුවැන්නා චකකලි තෙරුන් හා සමානය. දෙවැන්නා උපනද ශාක්‍යපුත්‍රයා හා සමානය. තෙවැන්නා සැරියුත් මුගලන් තෙරවරුන් හා සමානය. සිව්වැන්නා දෙවිදතුන් හා සමාන යයි දතයුතුය.

අත්තනත්තපාදියෙහි ආත්මය තවයි දුක් පමුණුවයි යනු, **අත්තනත්තපෝ** වේ. තමාගේ තැවීම් අනුයෝග අත්තපරිතාපනානුයොගං **අචෙලකෝ** වස්ත්‍ර නැති. නග්න. **මුත්තාචාරෝ** අත්හළ ආචාර. මලපහ කිරීම් ආදී ක්‍රියාවල ශිෂ්ටයන්ගේ ආචාරයෙන් විරහිතව හිටගෙන මලපහ කරයි. මූත්‍රා කරයි. කයි. බුද්ධි හත්‍ථාපලෙඛනෝ අතේ පිඬු අවසන් වූ පසු අත දිවෙන් ලෙවකයි. මලපහ කොට අතෙහිම දඬුවකැයි සිතා අතින් සූරා

මයි. ඔව්හු දඬුව සතෙකැයි පණවති. එහෙයින් ඔවුන්ගේ පිළිවෙත් පුරන්නේ මෙසේ කරයි. භික්ෂා ගැනීමෙහි ස්වාමීන් වහන්ස වඩින්නැයි කීකල, නොඑයි යනු **න එහි භදන්තිකො.** එසේනම් ස්වාමීන් වහන්ස, සිටින්නැයි කී විට ද නොසිටියි යනු **න තිට්ඨභදන්තිකො.** ඒ දෙකද මේ තීර්ථකයා මොහුගේ වචනය කළා වන්නේ යයි නොකරයි. **අභිනවං** කලින් ගෙන, ගෙනෙන ලද භික්ෂාව. **නිමන්තනං** අසවල් නම් කුලයට හෝ වීථියට හෝ ගමට හෝ පිවිසෙන්නැයි මෙසේ නිමන්ත්‍රණය කරන ලද භික්ෂාව නො ඉවසයි. නො ගනියි. **න කුමහිමුඛා** කළයෙන් ගෙන දෙන ලබන භික්ෂාව නොපිළිගනියි. **න කළොපිමුඛා** කළොපි යනු හැළියයි. පැස හෝ එයින් ද නොගනී. කුමක් හෙයින්ද? කළය කළොපිය හැන්දෙන් පහුර ලබයි. **න එළකමනතරං** එළිපත්ත අතර කොට දෙනු ලබන්නේ නොපිළිගනී. කුමක් හෙයින්ද? මෙය මා නිසා අතුරු කරණයක් ලබයි. දණ්ඩ මොහොල ආදියෙහි ද මෙම නයයි. **ඒවිනනං** දෙදෙනෙක් බුදින කල්හි එකෙක් නැගිට දෙන්නේ නොගනී. කුමක් හෙයින් ද? කබල අතරෙහි වේයයි. න ගබ්භිනිසා යනාදියෙහි ගැබිනිය කුසෙහි දරුව ක්ලාන්ත වේ. පොවන්නියගෙන් දරුවාට කිරෙන් අනතුරු වේ යයි පුරුෂාන්තරයට ගිය තැනැත්තියකින් රති අන්තරාය වේයයි නොගනියි. න සංකතනීසු - සළකුණු කොට බතෙහි දුබ්ක් සමයෙහි වනාහි අචේල ශ්‍රාවකයෝ අචේලහින්ගේ ප්‍රයෝජනය සඳහා එයින් එයින් සහල් ආදිය සම්මාදන් කොට බත් පිසති. උත්කෘෂ්ට අචේලකයෝ එයින් නොපිළිගනිති. **න යඤ්ඤ සා** යම් තැනක සුනඛයෙක් පිඬු ලබමියි එළඹ සිටියේ වේ. එහි ඌට නොදී ගෙනෙන ලද්ද නොගනී. කුමක් හෙයින්ද? මොහුට පිඬු අන්තරායක් වේ යයි. **සණ්ඩසණ්ඩචාරිනී** සමූහ සමූහ හැසිරෙන්නී. ඉදින් අචේලකයකු දැක මොහුට භික්ෂාව දෙමියි මිනිස්සු බත්ගෙට පිවිසෙති. ඔවුන් පිවිසෙන කල්හි කළොවිමුඛාදියෙහි සැඟවුණු මැස්සෝ නැගී සමූහ සමූහව හැසිරෙති. එයින් ගෙනෙන ලද භික්ෂාව නො පිළිගනී. කුමක් හෙයින්ද ? මා නිසා මැස්සන්ගේ ගෙදරට අනතුරක් වූයේ යයි. **ථුසොදකං** සියළු සසම් සම්භාරයෙන් කළ සෝවීරකය. මෙහිද සුරාපානයම සාවද්‍ය වේ. මෙය වනාහි මෙහිද සාවද්‍ය සංඥා වේ. **එකාගාරිකො** හේ එකම ගෙයි භික්ෂාව ලැබ නවතියි. **එකොලොපිකො** යමෙක් එකම පිඬකින් යැපෙයි. ද්වාගාරිකාදියෙහි ද මෙම නයම වේ. **එකිසසාපි දතනියා** එක දත්තියකින්. දතනි යනු කුඩා භාජනයක් වේ. (පිරිසිය මෙනි.) යමක අග්‍ර භික්ෂාව බහා තබයි. **එකාහිතං** එක් දවසක් ඇතුළත. **අදධමාසිකං** අඩමසක්

ඇතුළත. **පරියායභත්තභොජනං** වාර බත් බොජුන්. එක්දිනකින්, සත් දිනකින්, අඩමසකින් මෙසේ දින වාරයෙන් ගෙනෙන ලද බත් බොජුන්. **සාකභකෙබා** අමු සාක භක්‍ෂණය කරන්නා. **සාමාක භකෙබා** සාමාක සහල් භක්‍ෂණය කරන්නා. නීවරාදියෙහි නීවාර නම් වනයෙහි හටගන්නා (ස්වයංජාත) වී වර්ගයකි. දද්දුලලං - සොම්මරුවන් සම් සූරාදැමූ කසට. හටං ලාටු ද සෙවෙල් ද, කිණිහිරි ආදි ගස්වන කිරිද. **කණං** සහල් කුඩු, (හුනුසාල්). ආචාම බත්හැළියේ ඇලුණු දැවුණු බත් (දංකුඩ). ඒවා දැමූ තැනින් ගෙන කයි. බත් කැද යයි ද කියති. **පිඤ්ඤාකාදයො** පුන්නක්කු ආදිය පවතතඵලභොජී වැටුණු ගෙඩි බුදී. **සාණානි** හනවැහිරි රෙදි. මසාකානී මිශ්‍රව රෙදි. ඡවදුසසානි මළ සිරුරෙන් ඉවත දැමූ වස්තු. ඒරක තෘණවලින් මැසූ ඇඳුම්. පංසුකූලානි - පොළවෙහි දැමූ රෙදි කැබලි. තිරීටකානි ගස් පොතු වස්තු. **අජිනං** අඳුන් දිවිසම්. **අජිනක්ඛිපං** එහිම මැද පැලූ. කුසචීර කුසතණවලින් විසූ පටිය. වැහැරි පටි ලෑලි පටිවලඳ මෙම නයයි. **කෙසකම්බලං** මිනිස් කෙසින් කළ කම්බිලිය. ඒ සඳහා කියන ලදී. 'මහණෙනි, යම් ඒ මේ වියන ලද වස්තු, කෙස්කම්බිලිය ඒවා අතර නින්දිතයයි කියයි. 'වාළකම්බලං' අස් වලිගාදි ලොමින් කළ පොරෝනය. උලූක පංකං බකමූණා පියාපතින් කළ ඇඳුම. උබභටඨකො - උඩ සිටි. **උකකුටිකපපධානමනුයුතතො** උක්කුටික වීර්යයෙන් යුක්ත යන්නේ ද උක්කුටිකයෙන් සිට පැන පැන යයි. **කණටකාපසසයිකො** යකඩ කටු හෝ ප්‍රකෘති කටු හෝ බිම සිටුවා ඒ මත සම අතුරා සිටීම් සක්මන් ආදිය කරයි. සෙයෘං නිදන්නේ ද එහිම සයනය කරයි. සවස තුන්වනු කොට ඇත්තේ සායතනියං වේ. අළුයම, මධ්‍යාහ්නය, සවස යයි දවසට තුන්වරක් පවි සෝදන්නෙමි යයි ජලයට බැස අනුයෝගයෙන් යුක්තව වාසය කරයි. අනුන් තවන්නේ **පරංතපො** වේ. අනෘයන්ගේ තැවීම් ක්‍රම අනුගමනය කරන්නේ **පරපරිතාපානුයොගං** වේ. ඔරබභකාදියෙහි උරබභා යනු එලුවෝය. එලුවන් ම රන්නේ **ඔරබභිකො** වේ. සූකරිකා ඌරු ආදියෙහි ද මෙම නයයි. **ලුද්දා** දරුණු, කැකුළු (කර්කස) **මචඡ ඝාතකො** මසුන් මරන ධීවරයෝ. **බන්ධනාගාරිකා** බන්ධනාගාර පාලකයෝ. **කූරඋර කමමනතා** දරුණු කර්මාන්ත. මුදධාවසිතෙනා ක්‍ෂත්‍රිය අභිෂේකයෙන් හිස අභිෂේක කළ. **පුරතථිමෙන නගරසස** නගරයෙන් පෙර දිසාව. **සතථාගාරං** යඤ ශාලාව **ඛුරාජිනං නිවාසෙති** කුර සහිත අඳුම් දිවි සම පොරවා. **සපපි තෙලෙන** ගිතෙලින් ද තෙලෙන් ද ගිතෙල් හැර සෙසු යම්කිසිවක් තෙල් යයි කියනු ලැබේ. කණාඩුව මානො නිය සිදී ඇති නිසා කණිටු අවි විය

යුතු කාලයෙහි එයින් කණ්ඩුවමාන වේ. **අනන්තරහිතාය** අසන්තාවෙන්. **සදෘපවචඝාය** සමාන වස්සා හේ (පැටියාගේ). එලදෙන සුදු නම් පැටියාද සුදුය. පොහොර නම් හෝ රතුනම් හෝ පැටියා ද එබඳු වේ යයි මෙසේ සදෘපවචඝාය වේ. **සෝ එවමාහ** ඒ රජ මෙසේ කියයි. **වවඡතරා** තරුණ පැටිබව ඉක්මවා බලවත් පැටියා. වවඡතරියෙහිද මෙම නයයි. **පරිහිංසඝාය** වට කිරීම ද යඤ්ඤ භූමියේ ඇතිරීම සඳහා ද දිටෙයව ධම්මෙ මේ ආත්ම භාවයෙහි ම. **නිවඡාතෝ** ඡාත තණ්හාව යයි කියනු ලැබේ. එය මොහුට නැතැයි නිවඡා නොවේ. සියළු කෙලෙසුන්ගෙන් නිවුණු නිසා - **නිබ්බුතෝ.** ඇතුළ තවන කෙලෙස් නැති බැවින් සීතල වියයි - **සීතිභූතෝ.** ධ්‍යාන මාර්ගඵල නිර්වාණ සැප විඳියි යනු **සුඛ පටිසංවෙදී.** බ්‍රහ්මභූතෙන අත්තනා ශ්‍රේෂ්ඨ වූ ආත්මයෙන්. මේ පුද්ගලයා බුද්ධෝත්පාදයේ සිට දැක්වීමට **ඉධ තථාගතෝ** යනාදිය කීහ.

එහි **තථාගතෝ** යනු භාග්‍යවතුන් වහන්සේ කරුණු අටකින්, තථාගත නම් වන සේක. එසේ පැමිණියේ යයි තථාගත වේ. එසේ ගියේ යයි තථාගත වේ. තථ්‍ය ලක්ෂණය පැමිණියේ යයි තථාගත වේ. සත්‍ය ධර්මය යථා පරිද්දෙන් අවබෝධ කරන ලද්දේ තථාගත වේ. සත්‍ය දැක්වීමෙන් තථාගත වේ. සත්‍ය කීමෙන් තථාගත වේ. සත්‍ය කිරීමෙන් තථාගත වේ. අභිභවන අර්ථයෙන් තථාගත වේ. **අරහං සම්මා සම්බුද්ධෝ** ආදිය විසුද්ධි මාර්ගයෙහි විස්තර කෙළේමය. **තං ධම්මං** කියන ලද ආකාර ඒ සම්පත් ධර්මය අසයි. **ගහපති වා** කුමක් හෙයින් පළමුව ගෘහපති නිදෙසයිද? නිහතමාන බැවින් ද උත්සන්න බැවින් ද ක්ෂත්‍රිය කුලයෙන් පැවිදි වූවෝ ජාතිය නිසා බොහෝසෙයින් මානය කරති. හීන ජාති කුලවලින් පැවිදි වූවෝ තමාට ජාතියක් නැති බැවින් පිහිටීමට නොහැකි වෙති. ගෘහපති දරුවෝ වනාහි කිසිලිවලින් දාඩිය පෙරන්නේ පිටේ ලුනු පිපෙනතුරු පොළොව කොටා එබඳු මානයක් නොමැතිවීමෙන් නිහතමාන දර්ප වෙති. ඔව්හු පැවිදි වී මානය හෝ දර්පය හෝ නොකොට යථ ශක්තියෙන් බුද්ධ වචනය ඉගෙන විපස්සනාවට ක්‍රියා කරන්නේ රහත්බවේ පිහිටීමට හැකිවෙති. සෙසු කුලවලින් ද නික්මී පැවිදි වූවෝ බහුල නොවෙති. ගෘහපතියෝම බහුල වෙති. මෙසේ නිහතමාන බැවින් ද වැඩි බැවින් ද පළමු ගෘහපතියන් නිදෙසයි. **අඤ්ඤතරසාර වා** ඉතිරි කුලවල එක්තරා **එකක උපන්. තථාගතෙ සද්ධිං පටිලභති** පිරිසිදු දහම් අසා ධර්ම ස්වාමි වූ තථාගත සම්මා සම්බුදුන් වහන්සේ ඒකාන්තයෙන් ඒ භාග්‍යවතුන්

වහන්සේ යයි ශ්‍රද්ධා ඇතිවෙයි. **ඉති පටිසඤ්චික්ඛති** මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කරයි. **සම්බාධෝ ඝරාවාසෝ** ඉදින් හැටරියන් ගෙයි යොදුන් සියයක් අතර දම්පතිහු වෙසෙති. එසේ වුවද ඔවුන්ගේ කෙලෙස් පලිබෝධ අර්ථයෙන් ගිහිගෙයි වාසය සම්බාධ වේමය. **රජාපථෝ** රාග ඇලීම් ආදියෙන් නැගිටිය නොහැකියයි මහ අටුවාවෙහි කියන ලදී. ආගමන පථයයි කීමට ද වටී. නො ඇලීම් අර්ථයෙන් අභ්‍යවකාශය වැනි යයි **අබෙහාකාසෝ**. පැවිද්දා කුළුගෙවල් රුවන් පහයෙහි ද දේව විමානාදියෙහි ද මනාව වඩන ලද දොර ජනෙල්වලින් පිළිසන්ව වසන්නේ ද නො ඇලේ. නො සැරසේ. නො බැඳේ. එයින් කියන ලදී. **අබෙහාකාසෝ පබබජ්ජා** යයි. තවද **සම්බාධෝ ඝරාවාසෝ** කුශල ක්‍රියාවලම අවකාශ නැති බැවින්. රජාපථෝ වසන ලද කසල ගොඩක් මෙන් කෙලෙස් ඇලීම් එකතුවන ස්ථානය හෙයින්. අවෙචාකාසෝ පබබජ්ජා කුසල ක්‍රියාවල සුවසේ අවකාශ ඇති බැවින්. නයිදං සුකරං.....පබබජෙය්‍යං මෙහි මේ සංක්ෂෙප කථාවය. ඒ මේ ශික්ෂා තුනෙන් යුත් බ්‍රහ්ම චර්යාව නොකඩකොට එක දවසක් පසුව සිත පැමිණවීම සඳහා **එකනත පරිපුණ්ණං** වේ. කෙලෙස් මලවලින් පිරිසිදුකොට එකම දවසක් පසුව සිත පැමිණවීම සඳහා **එකනත** පරිසුදධං වේ. **සංඛ ලිඛිතං** ලියූ සක හා සමාන දෙවූ සක මෙන් හැසිරිය යුතුය. මෙය පහසු නොවේ. අගාරං අජ්ඣාවසතා ගිහිගෙයි වසන්නා විසින් ඒකාන්ත පරිපූර්ණව හැසිරීමට. යනූනානං කෙස් රැවුල් බා කහපාට බැවින් **කාසායා** බ්‍රහ්ම චර්යාවේ හැසිරෙන්නාට සුදුසු වූ **වත්ථානි** අවජාදෙත්වා වස්ත්‍ර ඇඳ නික්මී. අනගාරියං පබබජෙය්‍යං මෙහි ගිහිගෙට හිත වූ කෘෂි වණිජ් ආදි කර්ම අගාරිය යයි කියනු ලැබේ. ඒවා පැවිද්දෙහි නැත. එනිසා පැවිද්ද අනගාරියයි දැනගත යුතුය. ඒ **අනගාරියං පබබජෙය්‍යං** පිළිපදින්නේය. අපපං වා දහසකින් පහළ භෝග ස්කන්ධය අපප නම් වේ. දහසේ පටන් මහා වේ. බැඳීම් අර්ථයෙන්ම ඤාතීන්ම ඤාතිපරිමෙමා වේ. එය විස්සෙන් පහළ අපප වේ. විස්සේ සිට මහා වේ. **භික්ඛූනං සික්ඛාසාජීව සමාපන්නෙනා** භික්ෂූන්ගේ අධිශීල සංඛ්‍යාත යම් ශික්ෂා. එය ද මෙය සමග ජීවත් වෙයි. එක් ජීවිකාවක් සමග පැවැත්ම වේ. භාග්‍යවතුන් වහන්සේ විසින් පැනවූ ශික්ෂාපද සංඛ්‍යාත ඒ සහජීවය ද, එහි ශික්ෂණ භාවයෙන් සම්පන්න යයි භික්ෂූන්ගේ සිකඛා සාජීව සමාපන්න වේ. ශික්ෂාව සම්පූර්ණ කරන්නේ සාජීවය ද ව්‍යතික්‍රමණය නොවී ඒ දෙකම පැමිණියේ නම් අර්ථයයි. **පාණාතිපාතං පහාය** ආදියෙහි පාණඝාතාදි කථා යට විස්තර කරන ලදී. **පහාය** මේ ප්‍රාණඝාත දුසිල්බව දුරුකොට **පටිවිරතෝ**

හොති ප්‍රහීන කාලයේ සිට ඒ දුසිල්බවින් මෙපිටින් වෙන් වූයේ වේ. **නිහිත දණ්ඩා නිහිතසෙත්තා** අනුන් නැසීම සඳහා පොල්ලක් හෝ ආයුධයක් හෝ ගෙන විනාශ කිරීම පිණිස තබන ලද දණ්ඩ හෝ තබන ලද ආයුධය යන අර්ථයයි. මෙහි දණ්ඩ හැර සෙසු සියළු උපකරණ සතුන් විනාශ කිරීම් ස්වභාවයෙන් සස්ත්‍ර යයි දතයුතුය. භික්ෂුව යම් සැරයටි දණ්ඩක් හෝ දැහැටි දණ්ඩක් හෝ කතුරු දණ්ඩක් ගෙන හැසිරේ. එය අනුන් නැසීම පිණිස නොවේ. එහෙයින් තබන ලද දණ්ඩම තබන ලද ආයුධයම ඒ සංඛ්‍යාවට යයි. ලජ්ජී - පව පිළිකුල් කරන ලක්ෂණය වූ ලජ්ජාවෙන් යුක්ත. **දයාපන්නා** මෙත් සිත පැමිණි. **සබ්බපාණභූත හිතානුකම්පී** සියළු සතුන් කෙරෙහි දියුණුවෙන් අනුකම්පා කරන්නා. ඒ දයාවෙන් සියළු සතුන්ට යහපත උදාකරන සිතැත්තේ යන අර්ථයයි. **විහරති** ඉරියව් පවත්වයි. දෙන ලද දේම ගන්නා ලද්දේ දිනනදායී වේ. සිතින් දෙන දෙයම කැමති වෙයි. **දිනනපාටිකංඛී** වේ. සොරකම් කෙරේනුයි එන. සොරකම් නොකිරීමෙන් **අථේනෙන** වේ. සොරකම් නොකරන බැවින් **සුචිභූතෙන** වේ. **අත්තනා** ආත්ම භාවයෙන් ඉක්බිති ඔහු පිරිසිදු ආත්මභවක් ඇතිව වාසය කෙරේ යයි කියන ලද්දේ වේ. **අබ්‍රහ්මචරියං** ශ්‍රේෂ්ඨ නොවූ හැසිරීම. බ්‍රහ්මං ශ්‍රේෂ්ඨ ආචාරයෙහි හැසිරෙයි. **බ්‍රහ්මචාරී** වේ. ආරාචාරී අබ්‍රහ්මචරියාවෙන් දුරු වූ. මෙථුනා - රාගය නැගිටීම් වශයෙන් සමාන බැවින් මෙථුනක යයි ලද ව්‍යවහාරයෙන් සෙවිය යුතු බැවින් මෙථුන යයි සංඛ්‍යාවට කියන ලදී. අසද්ධර්මයයි. ගාමධම්මා ග්‍රාමවාසීන්ගේ ධර්මයයි. සත්‍ය කියා නය **සච්චවාදී** වේ. සත්‍යයෙන් සත්‍ය ගළපයි. ගටයි **සච්චසන්ධෝ** වේ. අතරින් පතරවත් බොරු නොකියයි යන අර්ථයයි. යම් පුරුෂයෙක් ඇතැම්විට බොරු කියයි. ඇතැම්විට ඇත්ත කියයි. ඔහු බොරුකීමෙන් අන්තරිත බැවින් සත්‍යයෙන් සත්‍ය නොගලපයි. එනිසා ඔහු සච්චසන්ධ නොවේ. මෙය වනාහි එබඳු ජීවිත හේතුවෙන්වත් බොරු නොකියා සත්‍යයෙන් සත්‍යය ගළපයි යනුම සච්ච සන්ධෝ වේ. **ථෙතෝ** ස්ථිරව සිටියේය යන අර්ථයයි. එක් පුද්ගලයෙක් කහ වර්ණය මෙන් (හලිද්දි රාගෝ විය.) දහයියා ගොඩේ සිටවූ කණුවක් මෙන්. අසුපිටේ තබන ලද පුහුල් ගෙඩියක් මෙන් ස්ථිර නොවේ. එකෙක් ගලේ කෙටූ අකුරන් මෙන් ඉන්ද්‍රඛීලයක් මෙන් ස්ථිරය. කඩුවෙන් හිස සිඳිද්දිත් කථා දෙකක් නොකියයි. මොහු **ථෙත** යයි කියනු ලැබේ. **පච්චයිකෝ** විශ්වාස කළයුතු, ශ්‍රද්ධාව ඇතිකර ගැනීම යන අර්ථයයි. එක් පුද්ගලයෙක් විශ්වාසය ඇති නොවේ. මෙය කවුරුන් කියන ලදද? අසවලා

විසින් යයි කී කල්හි එසේ නම් ඔහු විසින් කියන ලදී. මෙයම ප්‍රමාණය. දැන් පරීක්ෂා කිරීමට දෙයක් නැත. මෙය මෙසේ යයි කිවයුතු බවට පැමිණේ. මේ තෙමේ විචාරයිකයා යයි කියනු ලැබේ. **අවිසංවාදකො ලොකසස** ඒ සත්‍යවාදී භවයෙන් ලෝකය විරුද්ධ වාදයක් නැතැයි යන අර්ථයයි. **ඉමෙසං භෙදාය** යමක් මෙසේ නය කියන ලද්දවුන්ගේ සම්පයෙහි ඔවුන්ගේ භේදය සඳහා අසන ලදී. **ඛිනනං වා සන්ධාතා** මිතුරන් දෙදෙනෙකුගේ හෝ සමාන උපාධ්‍යායකාදීන්ගේ (එක උපාධ්‍යායකුගේ ශිෂ්‍යයන් අතර) හෝ කිසියම් කරුණකින් බිඳුනවුන්ගේ එක් එක්කෙනා වෙත එළඹ, ඔබ මෙබඳු කුලයක ඉපදී, බොහෝ ඇසූ පිරූ නැත් ඇතිව මෙය සුදුසු නොවේ යයි ආදිය කියා සමගි කරන ලදී. **අනුප්පදානා සමගිය තහවුරු කළ.** දෙදෙනෙකුගේ සමගිය දැක මෙබඳු කුලයක ඉපදුණු මෙබඳු ගුණවලින් යුත් මෙය ඔබට සුදුසු යයි ආදිය කියා ක්‍රියාව දැඩිකළා යන අර්ථයයි. සමගි වූ ආරාමය මොහුට වේයයි **සමගගාරාමො** වේ. යම්තැනක සමගිය නැත්නම් එහි විසීමද කැමති නොවේ යන අර්ථයයි. **සසමගගරතො** සමගි වූවන් කෙරෙහි ඇලීම. ඔවුන් හැර වෙන තැනකට යෑමට කැමති නොවේ යන අර්ථයයි. සමගි වූවන් දැක ද අසා ද සතුටුවේ යයි සමගග නන්දී වේ. **සමගගකරණිංවාචා භාසිකා** යම් වදනකින් සතුන් සමගි කෙරේද? ඒ සමගි ගුණය දැක්වීමට සඳහා වචන කථා කරයි. වෙන කථා නොකරයි. කාලය සුදුසු දේ කියයි යනු **කාලවාදී** වේ. කිවයුතු කාලය සලකා කියයි යන අර්ථයයි. තිබෙන සත්‍ය වූ ස්වභාවයම කියයි යනු භූතවාදී වේ. මෙලොව පරලොව ඇසුරුකොට කියයි යනු අත්ථවාදී වේ. නව ලොවුතුරා දහම් ඇසුරෙන් කියයි යනු **ධම්මවාදිති** සංවර විනය නය ඇසුරුකොට කියයි යනු **විනයවාදී** වේ. තබන අවකාශය නිධානයයි කියනු ලැබේ. නිධානය මොහුට ඇත්තේය යනු නිධානවතී වේ. සිත්ත තබාගත යුතු වචනයක් කියන ලදැයි යන අර්ථයයි. කාලෙන යනු මෙබඳු වචනයක් කියන්නේද? මම නිධානවතී වචනයක් කියන්නෙමියි අකාලයේ නො කියයි. සුදුසු තාල සලකාම කියයි යන අර්ථයයි. **සාපදෙසං** උපමා සහිත කරුණු සහිත යන අර්ථයයි. **පරියන්තවතීනං** දක්වන කොටස පැහැදිලි වනතුරු කියයි යන අර්ථයයි. **අත්ථ සංහිතං** නොයෙක් ආකාරයෙන් අර්ථ සහිතව කියයි. අනිකක් තබා අනිකක් නොකියතියි කියන ලද්දේ වේ. **බීජගාම භූතගාම සමාරම්භා** මූල බීජ, බඳ බීජ, එල බීජ, අගබීජ, බීජ බීජ යන පස්ආකාර වූ බීජගාමයේ ද යම්කිසි නිල් තණ රුක් ආදි භූත ගාමයේ ද සිදින තවන

ආදියෙන් විනාශ කිරීමෙන් වෙන්වෙයි යන අර්ථයයි. **එකභතතිකො** පාතරාස බත සායමාස බත යයි බත් දෙකක් ඇත. එයින් පාතරාස බත මධ්‍යාහ්නයෙන් අවසන් වේ. අනික මධ්‍යාහ්නයේ සිට අරුණ නැගෙනතුරු වේ. එහෙයින් මධ්‍යාහ්නය වනතුරු දසවරක් වළඳන්නේ ද එකභතතික වේ. එකභතතික යයි ඒ සඳහා කියන ලදී. රාත්‍රී භෝජනය රත්ති වේ. එයින් වෙන්වූයේ **රතතූපරතතො** වේ. මධ්‍යාහ්නය ඉක්මවා ඉර බසිනතුරු භෝජය විකාල භෝජනය නම් වේ. එයින් වෙන්වන ලද බැවින් විරතතො **විකාලභොජනා** වේ. සාසනයට අනුලොම් නොවූ විසුළු විරුද්ධ දැක්වීම් විසූක දසසන වේ. තමාම නටන, නැටවීම් වශයෙන් නැටීම (නෘත්‍ය)ද ගීද වැයුම් ද යටත්පිරිසෙන් මොනර නැටුම් ආදි වශයෙන් ද පවත්වන නැටීම් ආදියේ විසුළු වූ දැකීම් යයි **නච්චගීතවාදින විසූක දසසනා** වේ. නෘත්‍යාදිය තමා යෙදීමට හෝ අනුන් යෙදවීමට හෝ යුක්ත වූ ඒවා දැකීමට හෝ භික්ෂූන්ට මෙන්ම භික්ෂුණීන්ට ද නොවටී. මාලාදියෙහි **මාලා** යයි යම්කිසි මල්ය. **ගන්ධං** යම්කිසි සුවඳ වර්ගයකි. **විලෙපනං** සව් වර්ණ කරන. එහි පිලන්ධන යනු දැරීමකි. අඩුතැන් පුරවන්නේ **මණ්ඩකි** වේ. සුවඳ වශයෙන් සහ සම පාට කිරීම් වශයේ හෝ ඉවසන්නේ **විභූසෙති** වේ. **ඨාන** යනු කාරණ යයි කියනු ලැබේ. එනිසා යම් දුසිල් බවකින් ඒ මල් දැරීම් ආදිය මහජනයා කරයි, එයින් වැලකුනේ, වෙන්වූයේය යන අර්ථයයි. **උච්චාසයන** ප්‍රමාණය ඉක්මවූ ආසන, මහාසයන අකැප සන්ථත (ඇතිරි) එයින් වෙන්වූයේය යන අර්ථය වේ. **ජාතරූපං** ස්වර්ණ. **රජතං** කහවණු. ලොහවාසක, ඡතුමාසක, දාරුමාසක යයි ව්‍යවහාරයට යයි. එය තුම දෙකින්ම පිළිගැනීමෙන් වෙන්වූයේ, ගැනීමෙන් හෝ ගැනීමෙන් තොරවූයේ චෙත තබන ලදවිට ද නො ඉවසයි. **ආමක ධඤඤා පටිගහණ** හැල්, වී, යව, ගොයුම, තණහාල්, වරක (එනම් ධාන්‍ය) කුරහන් සංඛ්‍යාත සප්තවිධ ධාන්‍ය පිළිගැනීම, අතගෑම ද භික්ෂූන්ට නොවටී. **ආමක මංස පටිගහණ** මෙහි අන්තැනක් උදෙසා අනුදත් අමු මස් මාලු පිළිගැනීමම භික්ෂූන්ට නොවටී. ආමසනයද සුදුසු නැත. **ඉත්ථිකුමාරිකා පටිගහණා** මෙහි ස්ත්‍රිය පුරුෂාන්තරයට ගියා ය. (විවාහ වී) ඉතිරිවන කුමරියෝය. ඔවුන් පිළිගැනීම ද ස්පර්ශ කිරීම ද අකැපය. **දාසිදාස පටිගහණ** දැසි දසුන් වශයෙන් ඔවුන් පිළිගැනීම නොවටී. 'කැපකරුවෙකු දෙමි, ආරාමිකයකු දෙමි' කී කල්හි වනාහි වටී. අජඑළකයන් කෙරෙහි ද කෙත්වත් අවසන්හි කැප නොකැප විධි විනය විනය වශයෙන් පරීක්ෂා කළ යුතුය. එහි කෙත් නම් යම්තැනක පුබබණහ (වී ආදිය) වැඩෙද, වපුටු යන

අපරණ්ණ (කුරහන් ආදි) වැඩේද ඒ තැන්ය. කෙත්වතු ශීර්ෂයෙන් මෙහි වැව් කළා ආදිය ද සංග්‍රහ විය. **දූතෙය්‍යං** දූත කර්මය කියයි. ගිහියන්ගේ පණිවිඩ, හසුන් ගෙන ඒ ඒ තැන්වලට යෑම. **පහිණාගමන** අන්‍ය ගෙවල්වලට යවන කුඩා ගමන. **අනුයොගො** ඉහත කරුණු දෙකම. එහෙයින් දූත ක්‍රියා පහිණාගමන අනුයෝගය යයි මෙසේ මෙහි අර්ථය දතයුතුය. **කය විකකය** මිලට ගැනීම සහ විකිණීම. හොර තරාදි ආදියෙහි **කූටං** වංචාව. තුලාකූටය රූපකූට, අංගකූට, ගහණකූට, පටිචඡතතකූට යයි සතරාකාරය. එහි තුලාකූට නම් ගන්නකොට වැඩියෙන් ගනී. දෙනකොට අඩුවෙන් දෙයි. අංගකූට නම් ගන්නකොට පසසන් තරිදිය ඇඟිල්ලෙන් ඉක්මවයි. දෙනකොට ඉදිරියෙන් ඇඟිල්ලෙන් ඔබයි. ගහණකූට ගන්නවිට මුල ලණුවෙන් ගනියි. දෙනවිට අග ලණුවෙන් දෙයි. පටිචඡතත කූට නම් තරාදිය සිදුරුකර ඇතුළේ යකඩ කුඩු බහා ගන්නාවිට පසුභාගය කරයි. දෙනවිට අග භාගයෙනි. කපස නම් රත්භාජනය. එයින් වංචාව කංසකූට වේ. කෙසේද? එක් රන් භාජනයක් කොට තමන් ලෝහ භාජන දෙක තුනක් කරයි. ඒවායේ රන් ආලේප කරයි. ඉන්පසු ජනපදයට ගොස් කිසියම් මධ්‍යම කුලයකට පැමිණ රන්භාජන විකුණා ගන්නවාදැයි අසා වටිනාකම ඇසූවිට සමාන වටිනාකම දීමට කැමැත්තේ, රන්බව දැනගන්නේ කෙසේදැයි අසුවා විමසු ගනුවයි රන්භාජන ගලෙහි ගටා සියළු භාජන දී යයි. මානකූටය හදයභේදය, සිඛාභේදය, රජ්ජුභේද වශයෙන් තුන් ආකාරය. එහි හදය භේදය ගිතෙල්, තෙල් ආදිය මනින කාලයෙහි ලැබේ. ඒවා ගන්නේ යට සිදුරෙන් මැනීමෙන් වහා වත්කරන්නැයි කියා ඇතුළු භාජනයෙහි බොහෝ වගුරුවා ගනියි. දෙන්නේ සිදුර වසා වහා පුරවා දෙයි. සිඛො භේදයෙහි තල, සහල් මනිනවිට ලැබේ. ඒවා ගනු ලබන්නේ වහා සිඛාව ඔසවා ගනී. දෙන්නේ වේගයෙන් පුරවා සිඛාව බිඳ දෙයි. රජ්ජු භේදය කෙත් වතු මනිනවිට ලැබේ. අල්ලස් ලබන්නේ අතිමහත් කෙත මහත්කොට මනී. **උක්කෝටනාදියෙහි උකෙකාටනං** හිමියන් අහිමියන් කිරීමට අල්ලස් ගැනීම. **වඤ්චනං** ඒ ඒ උපායවලින් අනුන් වංචා කිරීම. එහිලා මේ කථා වස්තුවකි. එක් වැද්දෙක් වනාහි මුවකුද මුවපැටියෙකු ද ගෙන එයි. එක් ධූර්තයෙක් පින්වත, මුවා කියක් අගිද? මුවපැටියා කියක් අගිදැයි ඔහුගෙන් ඇසීය. මුවා කහවණු දෙකයි. පැටියා කහවණු එකයි. කහවණුවක් දී මුව පැටියා ගෙන ටිකදුරක් ගොස් නැවතී, මට මුව පැටියාගෙන් වැඩක් නැහැ. මට මුවා දෙන්න යයි ඉල්වීය. එහෙනම් කහවණු දෙකක් දෙන්නැයි කිය. මම කලින් කහවණු

එකක් දුන්නා නේද? ඔව් දුන්නා. මේ මුව පැටියා ගන්න. මෙසේ ඒ කහවණුව හා මේ කහවණුවත් වටින මුවපැටියා හා කහවණු දෙකක් වේ. හේ කරුණු සහිත යයි සලකා මුවපැටියා ගෙන මුවා දුන්නේය. **නිකති** යනු යෝග වශයෙන් හෝ මායා වශයෙන් හෝ හවඩි නොවන දෙයක් හවඩියක් කරයි. මුදල් නොවූවක් මුදල් කරයි. ස්වර්ණ නොවූවක් ස්වර්ණ කොට ප්‍රතිරූපකයකින් වංචා කිරීමය. **සාවියොගො** වංක යෝගයි. මේවා උකෙකාටනාදියටම නමකි. එහෙයින් උකෙකාටන සාවියොග යයි මෙසේ මෙහි අර්ථය දතයුතුය. අනිකක් දක්වා අනිකක පරිවර්තනය සාවි යෝගයයි. කිසිවෙක් කියති. එය වංචනයේම සංග්‍රහ කරන ලදී. ඡේදනාදියෙහි **ඡෙදනං** යනු අත කැපීම් ආදිය. **වධො** මරණය. බන්ධො ලනු ආදියනේ බැඳීම. **විපරාමොසො** හිම විපරාමොස, ගුම්බ විපරාමොස යයි දෙයාකාරය. යමක හිම වැටෙන කාලයෙහි හිමෙන් වැසී මාර්ගයට පිවිසි ජනයා මුළා කරයි. මෙය හිම විපරාමොසයයි. යමක් පඳුරු ආදියෙන් වැසී මුළා කෙරේනුයි මෙය ගුම්බ විපරාමොසයයි. **ආලොප** ගම් නියම්ගම් පැහැර ගැනීම යයි කියනු ලැබේ. **සහසාකාරො** සාහසික ක්‍රියා. මෙසේ මේ ඡේදන සහසාකරයෙන් වෙන්වූයේ වේ. **සො සනතුටෙඨා හොති** හේ සිව්පසයෙහි දොළොස් ආකාරයෙන් ඉතරිතර පච්චය සන්තෝෂ වශයෙන් යුක්ත වේ. **කායපරිහාරිකෙන** කාය පරිහරණ මාත්‍රයෙන්. **කුච්ඡිපරිහාරිකෙන** කුස පරිහරණ මාත්‍රයෙන්. **සමාදායෙව පකකමති** අෂ්ටවිධ වූ භික්ෂු පරිෂ්කාර ශරීරයටම සියල්ල සම්බන්ධ කරගෙන යයි. මගේ විහාරය, කාමරය, උපස්ථායකයා යයි ඇලීමක් බැඳීමක් නැත. හේ දුන්නෙන් මිදුණු ඊට මෙන් රැළෙන් නික්මුණු මදැතා මෙන් කැමති කැමති සෙනසුන, ලඳුකැලෑව ගසමුල අරණ්‍යය, පර්වතය පරිභෝග කරමින් කෙනෙක් සිටගෙන සිටිති. කෙනෙක් හිඳගෙන සිටිති. සියළු ඉරියව්වල කෙනෙක් නොදෙවෙනිය.

සිව්දෙසම මෙතවෙයි - ලද දෙයින් සිත තුටුවන
නැතිව බිය වෙරවඩන - කඟවෙනු සෙ තනිව සරයි

මෙසේ වර්ණනා කරන කඟවේණෙකු මෙන් පැමිණේ. දැන් එම අර්ථය උපමාවකින් දැක්වීමට **සෙය්‍යථාපි** යනාදිය කීහ. එහි **පකබිසකුණො** පියාපත් ඇති කුරුල්ලා. **ඩෙති** ඉගිලෙයි. මෙය මෙහි සංක්ෂෙප අර්ථයයි. **කුරුල්ලෝ** අසවල් ප්‍රදේශයේ ගසක පැසුණු ගෙඩි ඇතැයි දැන නොයෙක් දිසාවලින් පැමිණ නිය පා හොටවලින් ඒ ගෙඩි විද කති. මෙය අදථය,

මෙය හොටවලින් ඒ ගෙඩි විද කති. මෙය අදටය, මෙය හෙටටය යන්නක් ඔවුන්ට නැත. පල හීනවන විට ගසට ආරක්ෂා තැනේය. එහි පියාපත් හෝ නිය හෝ හොට හෝ නො තබති. ඒ ගස ගැන අපේක්ෂා නැතිව, කැමති දිසාවකට පියාපත් සහ ඉගිලී යයි. මේ භික්ෂුව ද එසේය. නොඇලී අපේක්ෂා රහිතවම යයි. **අරියෙන** නිර්දෝෂයෙන්. **සො චක්ඛුනා රූපං දිසවා** මේ ආර්ය සීලස්කන්ධයෙන් යුක්ත වූ භික්ෂුව චක්ඛු විඤ්ඤාණයෙන් රූප දැක යන අර්ථයයි. සෙස්සෙහි ද යමක් කිවයුතු නම් ඒ සියල්ල යට කියන ලදමය. **අබ්‍යාසෙක සුඛං** කෙලෙසුන්ගෙන් නොතෙත් වූ සුවය. අවිකිණණ සැප යයි ද කියන ලදී. ඉන්ද්‍රිය සංවර සැපයෙහි දක්නා ලද ආදියෙහි දුටු පමණින් ආදි වශයෙන් අවිකීර්ණ වේ. **සො අභික්කනෙත පටික්කනෙත** හේ මනස සවැනිකොට ඇති ඉඳුරන්ගේ සංවරයෙන් යුක්ත වූ භික්ෂුව අභික්කනත පටික්කනත ආදි ස්ථාන සතෙහි සිහියෙන් දැනීම් වශයෙන් දැනීම් ඇත්තේ වේ. එහි කිවයුතු දේ ධ්‍යාන විභංගයෙහි කියන ලද්දේමය. **සො ඉමිනා ච** යනාදියෙන් කුමක් දක්වයිද? අරණ්‍යවාසිකයාට ප්‍රත්‍ය සම්පත්තිය දක්වයි. යමෙකුට මේ ප්‍රත්‍ය සතර නැත්නම් ඔහුගේ අරණ්‍ය වාසය සමෘද්ධ නොවේ. තිරිසන්ගත සතුන් හෝ වනචාරීන් හෝ සමග කිවයුතු බවට පැමිණේ. අරණ්‍යයට අධිගෘහිත දෙවිවරු එබඳු ආරණ්‍ය වාසයේ සිටින පව්ටු භික්ෂුවට බියජනක ශබ්ද අස්සවති. අත්වලින් හිස පැහැර පලායන ආකාර කරති. අසවල් භික්ෂුව ආරණ්‍යයට පිවිස මේ මේ පව්කම් කෙළේ යයි නින්දා පතුරවයි. යමෙකුට මේ සිව්පසය ඇත්නම් ඔහුගේ ආරණ්‍යවාසය සමෘද්ධ වේ. හේ තමාගේ සිලය ප්‍රත්‍යවේක්ෂා කරන්නේ කිසි කලුවක් හෝ තිතක් හෝ නොදැක ශ්‍රීතිය උපදවා එය ක්ෂය ව්‍යය වශයෙන් සම්මර්ශනය කරන්නේ ආර්යභූමියට පැමිණෙයි. ආරණ්‍යයේ අධිගෘහිත දෙවියෝ සතුටු වී වර්ණනා කරති. මෙසේ දියෙහි වැටුණු තෙල්බින්දු මෙන් යසස-කීර්තිය පැතිරුණේ වේ. විචිතතං යනාදිය යට කියන ලද්දේය. **සො එවං සමාහිතෙ චිතෙත....** යථා කම්මූපගෙ සතෙත පජානාති යන මෙහි කිවයුතු සියල්ල විසුද්ධි මාර්ගයෙහි කියන ලද්දේය. තුන්වන විද්‍යාවෙන් **නොඑවං සමාහිතෙ චිතෙත** විදර්ශනා පාදක කොට ඇති සිව්වන දැහැන් සිත දතයුතුය. **ආසවානං ඛය ඤාණාය** රහත්මග ඤාණය සඳහා. අරහත්ත මාර්ගය ආශ්‍රවයන් විනාශ කිරීමෙන් ආශ්‍රවයන්ගේ ක්ෂය යයි කියනු ලැබේ. යමක් යම් තැනකට පැමිණ නිරුද්ධ වේද, එතැන මේ ඤාණය ඇතුළත් වේ. **චිත්තං අභිනිනනාමෙති** විදර්ශනා සිත පමුණුවයි. **සො ඉදං දුකඛං** මේ

ආදියෙහි දුක මෙපමණය. සියළු දුක් මෙයින් බොහෝ නොවේ. ස්වකීය කෘත්‍ය ලක්ෂණ ප්‍රතිවේදයෙන් ඇති සැටි දනියි. අවබෝධ කරයි. ඒ දුක ඇතිකරන තෘෂ්ණාව **අයං දුක්ඛ සමුදයො**. ඒ දෙකම යම්තැනකට පැමිණ නිරුද්ධ වේ. එය ඒවායේ නොපැවැත්මයි. නිවීමයි. **අයං දුක්ඛ නිරොධං** ඊට පමුණුවන ආර්ය මාර්ගය. **අයං දුක්ඛ නිරොධගාමිනී පටිපදා** ස්වකීය කෘත්‍ය ලක්ෂණ ප්‍රතිවේදයෙන් ඇතිසේ දැනගනී. අවබෝධ කරයි. මෙසේ අර්ථය දතයුතුය. මෙසේ ස්වරූප වශයෙන් සත්‍ය දක්වා දැන් කෙලෙස් වශයෙන් පරිසායකින් දක්වන්නේ **ඉමෙ ආසවා** යනාදිය කීහ. එහි **එවං ජාතතො එවං පසසතො** මෙසේ දැනගන්න බලන ඔහුට විපස්සනා සහිත මාර්ගය අවසානයට පැමිණෙන ලදැයි කියයි. කාමාසවා - කාම ආසවවලින් **විමුච්චතී** මෙසේ මෙයින් මාර්ග ක්ෂණය දක්වයි. **විමුත්තසමිං** මෙසේ මෙයින් ඵල ලක්ෂණය පෙන්වයි. මාර්ග ක්ෂණයෙහි සිත මිදේ. ඵලක්ෂණයෙහි විමුක්තිය වේ. **විමුත්තසමිං විමුත්තමිති ඤාණං** මෙසේ මෙයින් සත්‍යය ප්‍රත්‍යවෙක්ෂා ඤාණං දක්වයි. **ඛීණා ජාති** යනාදියෙන් ඒ භූමිය. ඒ ඤාණයෙන් හේ ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ ඛීණා ජාති ආදිය දැනගනී. **වුසිතං** විසූයේ. මොනවට විසූයේ, කරන ලද්දේ, හැසිරෙන ලද්දේ අවසන් වූයේය යන අර්ථයයි. **බ්‍රහමචරියං** මාර්ග බ්‍රහ්මචර්යාව. කල්‍යාණ පෘථග්ජනයා සමග ශෛක්ෂයන් සත්දෙනා බ්‍රහ්මචරිය වාසයෙහි වඩිති. ක්ෂීණාශ්‍රවයා වැස අවසන් වූයේ වේ. එහෙයින් ඔහු තමාගේ බ්‍රහ්මචර්යා වාසය ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ බ්‍රහ්මචර්ය විසුයේ යයි දැනගනී. **කතං කරණීයං** සිව්සස්වල සිව් මාර්ගයෙන් පරිඤ්ඤා-දැනගැනීම පහාන-ඉවත්කිරීම සච්ඡිකය-අවබෝධය වශයෙන් සොළොස් ආකාර කෘත්‍ය නිම කෙළේ යන අර්ථයයි. කල්‍යාණ පෘථග්ජනාදීහු ඒ කිස කරති. ඛීණාසවයන් වහන්සේ කළයුතු දේ කරන ලද්දේ වන්නාහ. එනිසා ඔහු තමාගේ කටයුතු ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ කළයුතු දේ කළැයි දැනගනී. **නාපරං ඉත්ථත්තාය** දැන් නැවත කළයුත්තක් නොමැති බැවින් සොළොස් කෘත්‍ය නැති බැවින් කෙළෙස් ක්ෂය කිරීමට හෝ මාර්ග භාවනා කෘත්‍ය නැතැයි දැනගනී.

සරාගාදියෙහි **අප්පහීනො** විෂ්කම්භන ප්‍රහානයෙන් හෝ තදංග ප්‍රහානයෙන් හෝ සමුච්ඡෙද ප්‍රහානයෙන් හෝ ප්‍රහීන නොවූ.

ලාභිහොති යනාදියෙහි **ලාභී** ලබන්නා. ලාභයක් ලැබ සිටී. **අජ්ඣත්තං චෙතො සමථස්ස** තමා අයත් අධ්‍යාත්ම සංඛ්‍යාත ස්කන්ධාදි

ධර්ම විෂ්කම්භ අනිත්‍යයි වශයෙන් පවතින විදර්ශනාවෙන්. **රූප සහතානං** රූපාවචර නිමිති අරමුණේ රූපාවචර සමාපත්තිවල. **අරූප සහගතානං** අරූප නිමිති අරමුණේ අරූප සමාපත්තිවල. මෙහි ද පළමුවැන්නා අෂ්ට සමාපත්තිලාභී පෘථග්ජනයා. දෙවැන්නා ශුෂ්ක විදර්ශක ආර්ය ශ්‍රාවකයා තුන්වැන්නා අෂ්ට සමාපත්තිලාභී ආර්ය ශ්‍රාවකයා. සතරවැන්නා ලෞකික මහජනයා දතයුතුය.

අනුසෝතගාමී ආදියෙහි **අනුසොතගාමී** සසර ශ්‍රොතම අනුගත වූයේ සසර සැඩපහරෙහි ගිලුනේ පෘථග්ජනයා දතයුතුය. **පටිසොතගාමී** උඩුගං දෙසට යෑම. අනුසෝතයට නොගොස් පටිසෝතයට යන්නාට අධිවචනයකි. **පාපඤ්ච කම්මං න කරොති** පණවන ලද්දක් ව්‍යතික්‍රමණය නොකරයි. සහාපි දුකෙබන සහාපි දොමනසෙසන - කෙලෙස් නැගිටින කල්හි උපන් දුක් දොම්නස් සමග ද. **පරිපුණ්ණං** තිවිධ ශික්ෂාවල එකකින්වත් අඩු නැති. **පරිසුද්ධං** කෙලෙස් නැති. **බ්‍රහ්මචරියං** ශ්‍රේෂ්ඨ චර්යාව. මේ චාරයෙන් සෝවාන් සකදාගාමී කියන ලදී. කිම ඔවුන් අඬමින් බ්‍රහ්ම චරියාවේ හැසිරෙත්ද? එසේය. කෙලෙස් ඇඬුමෙන් අඬමින් හැසිරෙත් නම් වේ. සිල්වත් පුහුදුන් භික්ෂුව ද මෙහිම ඇතුළත් කරන ලදී. **ඨිතතෙතා** සිටි බව. අනාගාමියා වනාහි කාමරාග ව්‍යාපාදවලින් **කම්පා** නොවන සිත් ඇති බව ද ඒ ලෝකයෙන් නොඑන ධර්මතාවද සිටි බව නම් වේ. **තිණ්ණෝ** තෘෂ්ණා ශ්‍රෝතසින් එගොඩ වූ. **පාරංගතෝ** නිවන් නැමති පරතෙරට ගිය. එතෙ තිට්ඨති අර්හත් ඵල නැමති ගොඩබිම සිටියි. **වෙහොවිමුත්තිං** ඵල සමාධිය. **පඤ්ඤා විමුත්තිං** ඵල ඤාණය. **අයං වුච්චති** මේ ක්ෂීණාශ්‍රවයා - රහතන් වහන්සේ. **තිණ්ණෝ පාරංගතෝ ථලෙ තිට්ඨති බ්‍රාහ්මණෝ** යයි කියනු ලැබේ. පව ඉවත්වීමෙන් මේ තෙමේ බ්‍රාහ්මණ නම් වේ.

අපපසුතාදියෙහි **අපපකං සුතං හොති** නවංග සත්ථු සාසනයෙහි කිසියම් ස්වල්පයක් ඇසුවේ වේ. **න අජ්ඣත්තඤ්ඤාය න ධම්ම මඤ්ඤාය** ධම්මානුධම්ම පටිපන්නො හොති යනු අටුවා ද පෙළ ද දැන ලෝකෝත්තර ධර්මයට අනුරූප ධර්මය වූ පූර්වභාග ප්‍රතිපදාවට පිළිපන්නේ නොවේ. මෙම නයින් සියළු තැන අර්ථය දතයුතුය.

සමණමවලාදියෙහි **සමණමවලො** ශ්‍රමණ අවලයා, 'ම' කාරය පද සන්ධි කරයි. සමණං + අවලො = සමණමවලො වේ. නිශ්වල ශ්‍රමණයා,

ස්ථිර ශ්‍රමණයා අර්ථය වේ. **අයං වුච්චති** මේ සෝවාන් පුද්ගලයා සාසනයෙහි මුල් උපත වූ ශ්‍රද්ධාවෙහි පිහිටි බැවින් **සමණමවලෝ** යයි කියනු ලැබේ. සකෘදාගාමියා වනාහි ඇලෙන කෙලෙස් ඇති බැවින් **සමණ පදුමෝ** යයි කියන ලදී. ඇලීම් අර්ථය මෙහි පදුම අර්ථයට නමකැයි කියන ලදී. කාමරාග සංඛ්‍යාත ඇලෙන කෙලෙස් නැති බැවින් අනාගාමියා **සමණ පුණ්ඩරීකෝ** කියන ලදී. සුදු අර්ථය මෙහි පුණ්ඩරීක අර්ථය නමැයි කියන ලදී. ක්ෂීණාශ්‍රවයාද තද බව ඇතිකරන කෙලෙස් නැති බැවින් ශ්‍රමණයන් අතර **සසමණ සුඛුමාලෝ** නමැයි කියන ලදී. අල්ප දුක්ඛාර්ථයෙන්ද (දුක් නැති බැවින්) මේ තෙවෝ සමණ සුඛුමාල ම වේ.

චතුක්ක නිපාත නිද්දේසය නිමි.

පංචකයෙහි **තත්‍රා** වීර්යය ද විපිළිසර බව ද මෙයයි. යනාදි නයින් යට කියන ලද ඒ පුද්ගලයන් අතරෙන් **යඨායං** යමෙක් ආරම්භති යයි, මෙහි ආරම්භ ශබ්දය කම්ම කිරිය හිංසන විරිය විකාරයට පත්කිරීම ආපත්ති චිත්තකම්ම යන මේවායෙහි වැටේ. එසේ මෙය 'යං කිංචි දුක්ඛං සම්භොති, සබ්බං ආරම්භ පච්චයා යයි කර්මයෙහි ආවේය. මහා යඤ්ඤා මහාරම්භා න තෙ හොන්ති මහප්ඵලා කිරියාවෙහිය. 'සමණං ගොතමං උද්දිසස පාණං ආරම්භන්ති හිංසනයෙහි, **ආරම්භථ** නික්කමථ යුඤ්ජථ බුද්ධසාසනෙ 'වීර්යෙහි, බිජගාම භූතගාම **සමාරම්භා** පටිවිරතෝ හොති විකොපනයෙහි වේ. **ආරම්භති ච විපපටිසාරී ච හොති** මෙය වනාහි ඇවැත් ඉක්මවීමෙහි ආවේය. එහෙයින් ඇවැත් ව්‍යතික්‍රමණ වශයෙන් ආරම්භ ද එය ප්‍රත්‍යවේමෙන් විපිළිසර බව ද වේ යයි මෙය මෙහි අර්ථයයි. **චෙතො විමුත්තිං** ඵල සමාධිය. **පඤ්ඤා විමුත්තිං** ඵල ඤාණය, **යථාභූතං නප්පජානාති** අවබෝධ නොකළ තැනැත්තා ස්වභාවය යථා වශයෙන් නොදනී. **යඤ්ඤස** යම්තැනක මොහුගේ. යම් තැනකට පැමිණ මේ පුද්ගලයාගේ - උපපනනා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣති - උපන් සියළු අකුසල ධර්ම නිරවශේෂයෙන් නිරුද්ධ වේ යන අර්ථයයි. කිම පැමිණ ඒවා නිරුද්ධ නොවේද? රහත්මග පලයට පැමිණියෙහුගේ නිරුද්ධ නම් වේ. මෙසේ ඇතිකල්හි මෙහි මාර්ග කෘත්‍ය වශයෙන් පලයම කියන ලදැයි දතයුතුය. **ආරම්භජාති** ආපත්ති ව්‍යතික්‍රමණං ස්වභාවකොට ඇත. **විපපටිසාරජා** විපිළිසරයෙන් හටගත්. **පවඩ්ඪනති** නැවත නැවත උත්තේජනයෙන් වැඩෙත්. **සාධු** ආයාචනයෙහි මෙය

කියන ලද්දේ වේ. ඒකාන්තයෙන් ආයු පමණ වැරදි කළ කල්හිද අපි ආයාචනා කරමු. දේසනා කළ යුතු සූත්‍ර දෙසීම සඳහා, නැගිට සිටිය යුත්ත නැගිටීම සඳහා ප්‍රකට කළයුත්ත ප්‍රකට කිරීම සඳහා. **ආරමභජෙ ආසවෙ** පිරිසිදු බවෙහි සිටි බව ප්‍රත්‍යවේක්ෂා කරමින් **විපපටිසාරෙ ආසවෙ පටිවිනොදෙත්වා** බැහැරකොට විපස්සනා සිත ද, **විපස්සනා පඤ්ඤඤ්ඤව භාවෙතු** විපස්සනා පඤ්ඤාව වඩනු. අමුනා **පඤ්චමෙන පුගගලෙන** මේ පස්වෙනි ක්ෂීණාශ්‍රව පුද්ගලයා විසින්. **සමසමො භවිස්සති** ලෝකෝත්තර ගුණවලින් ස්වභාවයෙන්ම සම වන්නේය. මෙසේ ක්ෂීණාශ්‍රවයා විසින් අවවාද දිය යුතුය යන අර්ථයයි. **ආරමභති න විපපටිසාරො හොති** ඇවැත්වලට නොපැමිණෙයි. විනය ප්‍රඥප්තියෙහි අදක්ෂ බැවින් අනාපත්තියෙහි ආපත්ති සංඥාවෙන් විපිළිසර වේ. අංගුත්තර අටුවාවෙහි වරක් ඇවතට පැමිණ එයින් නැගිට පසුව කිසිවකට නොපැමිණේ යන විපිළිසරය අත්හැරීමට නොහැකි යයි කියන ලදී. **න ආරමභති න විප්පටිසාරී හොති** ඇවතට නොපැමිණේ. විපිළිසර නොවේ. මේ පුද්ගලයා කවරෙක්ද? විරිය අත්හල පුද්ගලයාය. හේ වනාහි මේ බුද්ධ කාලයෙහි පිරිනිවන්පෑමෙන් කිම? අනාගතයෙහි මෛත්‍රීය සම්මා සම්බුදුන්ගේ කාලයේ පිරිනිවන් පාන්නෙමියි විසුද්ධ සීලය ද ප්‍රතිපත්ති නොපුරයි. හේ ආයුෂ්මතුන් කුමක් නිසා පමාව වාසය කෙරෙහිද? පුහුදුන් නම් ගති අනිබද්ධය. ආයුෂ්මතා මෛත්‍රී බුදුහාමුදුරුවන් දකින්නට ලැබුණත් රහත්බව නොලබන්නේය. විපස්සනාව වඩන්න යයි අවවාද කළ යුතුය. සෙසු සියළු තන්හි කියන ලද නයින්ම දතයුතුය.

දත්වා අවජානාති ආදියෙහි, එක් භික්ෂුවක් මහා පින්වන්තයෙකි. සිව්පස ලාභී වේ. හෙතෙම සිවුරු ආදිය ලැබ අනිත් මද පිනැත්තන්ගෙන් අසයි. හේද නැවත නැවත අසනු ලබන්නේ ගනීමය. ඉක්බිති දෙන්නා ටිකක් කිපී මකුබව උපදවනු කැමැත්තේ කියයි. මේ තෙමේ තමාගේ ස්වභාවයෙන් චීවරාදිය නොලබයි. අප නිසා ලබයි. මෙසේ පුද්ගලයා දී **අවජානාති** නම් වේ. එක් භික්ෂුවක් වනාහි තව භික්ෂු කෙනෙකුන් සමග දෙතුන් වසක් වසන්නේ, පෙර ඒ පුද්ගලයා ගරුකොට පසුව කල් යනකොට ගරු නොකරයි. අසුනෙන්ද නොනැගිටියි. නැගිට්ටේ ද නොයයි. මෙසේ පුද්ගලයා **සංවාසෙන අවජානාති** නම් වේ. **ආධෙය්‍යමුඛො** මුලින් දිය යුතු වචනය. පළමු වචනයෙහි තබන ලද මුව ඇති යන අර්ථයයි. **අධිමුච්චිතා හොති** සද්ධාතා වේ. එය නය මෙසේය. එක් පුද්ගලයෙක් භික්ෂුවට සරුප් වූ දෙය නොසරුප් යයි කියයි. එය අසා මෙතෙම

නිශ්චයට යයි. නැවත වෙනත් සභාගයකින් භික්ෂුව විසින් මෙය සරුප් යයි කීවිටද ඔහුගේ වචනය නොගනී. අසවල් දෙයින් මෙය නොසරුප් යයි අපට කියන ලදැයි පෙර භික්ෂුවගේ කථාවම ගනී. තව කෙනෙක් දුසිලා සිල්වත් යයි කියති. ඒ වචනය විශ්වාස කොට නැවත වෙනින් භික්ෂුවට මෙය නොසරුප් යයි මේ තෙමේ ඔබ ලඟට පැමිණීම නොසරුප් යයි කී කල්හිද ඔහුගේ වචනය නොගෙන පෙර කතාවම ගනී. තව කෙනෙක් ගුණ කියූ කථාද අගුණ කියූ කථාද ගනිති. මේ තෙමේද ආධෙය්‍ය මූඛොම වේ. තැබිය යුතු වචනය, යම් යම් දේ අසයි. ඒ ඒ තැන තැබිය යුතු වචනය යන අර්ථයයි. **ලොලෝ** අඩු කාලයක් සිටි බැවින් අශ්‍රද්ධාදියෙන් කැළඹුණු බැවින් ලොල් වූ. **ඉතතර සද්ධෝ** අඩු, අසම්පූර්ණ ශ්‍රද්ධාව. සෙස්සෙහි ද මෙම නයයි. මෙහි වනාහි නැවත නැවත භජන වශයෙන් ශ්‍රද්ධාවම **හතති** වේ. **පෙමං** ශ්‍රද්ධා ප්‍රේමය ද ගෙහසින ප්‍රේමය ද වටී. **පසාදෝ** ශ්‍රද්ධා ප්‍රසාදයම. **එවං පුගලලෝ ලොලෝ හොති.** මෙසේ ශ්‍රද්ධාව අඩු බැවින් පුද්ගලයා ලෝල නම් වේ. කහ වර්ණය මෙන් දහයියා ගොඩේ සිටවූ කනුවක් මෙන් අසුපිටේ තබන ලද පුහුලක් මෙන් නොබැඳි ස්ථානයෙහි මොහොතකින් පැහැදෙයි. මොහොතකින් කිපේ. **මන්දෝ මොමූහෝ** අඥාන බැවින් මඳ වේ. විසද නොවීමෙන් මොමූහය. මහා මෝඩයා යන අර්ථයයි.

යොධාජීව උපමාවල **යොධාජීව** යුද්ධයෙන් ජීවත්වන්නෝ. රජගගං ඇත් අස් ආදීන්ගේ පා පහරින් බිඳුණු පොළොවෙන් නැගෙන රජස්කන්ධය (දූවිලි). **සඤ්ඤාති** තදකොට. සිටීමට නොහැකි. **සහතිරජගගං** දූවිලි රාශිය දැක ද ඉවසයි. **ධජගගං** ඇතුන් අසුන් පිට හෝ රථවල හෝ ඔසවන ලද කොඩිවල අග. **උසසාදනං** ඇත් අස් රිය ආදියේ ද බලකායේ ද උස් ශබ්ද මහා ශබ්ද. **සමපහාර** පැමිණි අප්‍රමාණ වූ ප්‍රහාර. **භඤ්ඤති** විනාශ කරයි. විසාතයට පැමිණෙයි. **බ්‍යාපජ්ජති** විපතට පැමිණේ. ප්‍රකෘතිභාවය අත්හරියි. **සහති සමපහාරං** දෙතුන් පහරක් පැමිණ ද ඉවසයි. **තමෙව සංඝාමසීසං** එයම ජයකඳවුරු ස්ථානයයි. **අජ්ඣාවසති** දින හතක් අහිබවා වසයි. කරුණු කිම? ලද පහර හා පහරට පිළියම්ද කළ ක්‍රියාවට විශේසය දැන තනතුරු දීමද ඉසුරු සැප අනුභවය සඳහාද දැන් ශාස්තෘන්ට යුදසෙබලුන්ගෙන් වැඩක් නැත. මේ සාසනයෙහි එබඳු වූ පුද්ගලයන් පස්දෙනෙකු දැක්වීමට උපමාවක් ගෙනෙන ලදී. එහෙයින් ඒ පුද්ගලයන් දැක්වීමට එවමෙව යනාදිය කීහ. **එහි සංසීදති** - මිථ්‍යා විතර්කයෙහි යෙදෙයි. පිවිසෙයි. **න සක්කොති බ්‍රහමචරියං සතතානෙතුං** බ්‍රහ්මචරිය

චාසය නොකඩකරමින් ආරක්ෂා කිරීමට නොහැකි වෙයි. **සිකඛා දුබබල්‍යං ආවිකත්වා** ශික්ෂාවේ දුබල බව ප්‍රකාශ කොට. **කිමසස රජගගසමිං** කිම ඒ පුද්ගලයාට රජගහ නාමය මෙසේ කියයි. **අභිරූපා** රූපවති, **දසසනීයා** දැක්මට යෝග්‍ය, **පාසාදිකා** දැකීමෙන්ම සිතට ප්‍රසාදය ගෙන එන. **පරමාය** උතුම්. **වණණ පොකඛරතාය** ශරීර වර්ණයෙන් හා අඟ පසඟ සටහනින්. **උවහසති** අවමන්කොට සිනාසෙයි. **උලලපති** කියයි. **උජ්ඣගසති** අත පැහැර මහ හඬින් සිනාසෙයි. **උපපණ්ඩෙති** ලජ්ජා ඇති කරවයි. **අභිනිසීදති** අභිවචනය කොට සමීපයෙහි හෝ එක ආසනයේ හිඳියි. දෙවන පදයෙහිද මෙම නයයි. **අජෙඣාතතරති** යනු වසාගෙන සිටී. **විනිවෙයෙත්වා** - විනිමොචෙත්වා යන ගත් තැනින් අත බැඳුම් හැරදැමීම ද මිදීමද මෙහි සෙස්ස පැහැදිළිය.

පිණ්ඩපාතිකයන් අතරෙහි **මඤ්ඤතා මොමූහචචා** සමාදන් වූ දෙය නොදනී. ආනිසංස නොදනී. තමාගේ අඥාන බැවින් හා මුළා බැවින් අනුවණින්ම **පිණ්ඩපාතිකො හොති** පිණ්ඩපාතික වේ. **පාපිචෙඡා ඉචඡාපකතො** පිණ්ඩපාතිකයාට මේ පිණ්ඩපාතිකයෙකැයි සිව්පසයෙන් සත්කාර කරනු ලැබේ. ලජ්ජා ඇත්තෙකි. අපිස් කෙනෙකි ආදි ගුණයෙන් වර්ණනා කරන්නේ යයි මෙවැනි පවිටු අදහසින් යුක්ත වී **පිණ්ඩපාතිකො හොති** වේ. පිස්සුවෙන් පිඬු පිණිස හැසිරෙන්නේ **උම්මාද චිත්ත විකෙබාපා පිණ්ඩපාතිකො** නම් වේ. **වණණිතං** මේ පිණ්ඩපාතික අංගය බුදුවරුන් විසින් ද ශ්‍රාවකයන් විසින් ද වර්ණනා කරන ලදැයි ප්‍රශංසා කරන ලදැයි **පිණ්ඩපාතික** වේ. **අපපචඡතං යෙව නිසසාය** ආදියෙහි මෙසේ අපිස් වෙමි. මගේ මේ පිණ්ඩපාතික අංගය අපිස්බව සඳහා පවතින්නේ යයි මෙසේ සතුටු වන්නෙමි. මගේ මේ පිණ්ඩපාතිකාංගය සන්තෝෂය පිණිස පවතින්නේ යයි මෙසේ කෙලෙස් තුනී කරන්නෙමියි මගේ මේ පිණ්ඩපාතිකාංගය කෙලෙස් තුනිකිරීම පිණිස පවතින්නේ යයි **පිණ්ඩපාතිකො හොති ඉදමත්ථිතං** මේ කල්‍යාණ ප්‍රතිපත්තියේ ඇතිබව, මේ පිණ්ඩපාතය පමණකින් ඇති බව, යමක් ලදවිට එයින් ම යැපෙන බව සඳහාය යන අර්ථයයි. අගෙහා ජ්‍යෙෂ්ඨයා. සෙස්ස එහිම සමාන වචන වේ. ගවාඛිරං දෙනගෙන් කිරි වේ. දෙන හැර නොවේ. **ඛීරමහා දධි** යනාදියෙහි ද මෙම නයයි. එවමෙවං යම්සේ මේ පස්ගෝ රසයෙහි ගිතෙල්ම අග්‍ර වේ. එසේම මේ පිණ්ඩපාතිකයන් පස්දෙනා අතරෙන් යමෙක් අපිස් බව ආදිය නිසා පිණ්ඩපාතික වූයේ නම් හෙතෙමේ **අගෙහා ච සෙටෙඨා ච මොකෙඛා ච උත්තමෙ ච පවරෙ ච** මේ

පිණ්ඩපාතිකයන් පස්දෙනා අතරෙන් දෙදෙනෙක් ම පිණ්ඩපාතික වෙති. තුන්දෙනෙක් පිණ්ඩපාතිකයන් නොවෙති. නාම මාත්‍රයෙන් පිණ්ඩපාතික යයි දතයුතුය. බලුපචජ්ඣාභතතිකාදියෙහි ද මෙම නයම වේ.

පංචක නිද්දේසය නිමි.

සවැන්නෙහි **තත්‍රා** යනු ඒ පුද්ගලයන් සයදෙනා කෙරෙහි. **සම්මා සම්බුද්ධා තෙන දථයබ්බා** ඒ පුද්ගලයා ආචාර්යවරයකු නැතිව තමා විසින්ම උපදවන සියල්ල දන්නා නුවණින් සර්වඥ බුද්ධ යයි දතයුතුය. **පචෙචක සම්බුද්ධා තෙන** ආදියෙහි ද ඒ පසේබුදු නුවණින් ඒ පුද්ගලයා පචෙචක සම්බුද්ධ වේ. **තෙන** සාවක පාරමී නුවණින් ඒ පුද්ගලයෝ **සාරිපුතත මොගගලලානා** වෙති. **තෙන** දුක් කෙළවර කිරීමෙන් ඒ පුද්ගලයෝ **අවසෙස අරහනතා** අවසේස රහත්හු වෙති. **තෙන** කාමලෝවට නොපැමිණීමෙන් ඒ පුද්ගලයා **අනාගාමී** වේ. **තෙන** කාමලෝවට පැමිණීමෙන් ඒ පුද්ගලයෝ සොතාපන්න සකෘදාගාමිනෝ දථබ්බාති. සෝවාන් සකෘදාගාමින් දතයුතුය.

ඡක්ක නිද්දේසය නිමි.

සත්තකයෙහි **සකිං නිමුගෙගා** යනු එක්වරක් ගිලුණු. **එකනත කාළකෙහි** ඒකාන්තයෙන්ම කළුදහමින්, නාස්තිකවාද අහේතුකවාද අකිරියවාද සංඛ්‍යාත නියත මිථ්‍යාදෘෂ්ටික ධර්මවලින්. **එවං පුගගලෝ** මේ කාරණයෙන් පුද්ගලයා එක්වරක් **නිමුගෙගා** ගිලුනේ එසේ **නිමුගෙගාව** ගිලුනේම වේ. මේ භවතාට වනාහි ගොඩඒමක් නම් නැතැයි කියති. මකබලිගෝසාලාදීහු මෙන් යට යට නරක ගිනිම ආහාර වේ. **සාහු සද්ධා කුසලෙසු ධම්මෙසු** කුසල ධර්මයන්හි ශ්‍රද්ධාව නම් යහපත් ඇදහීමකි. **හිරී** ආදියෙහි ද මෙම නයම වේ. **උචචුජජති** එපමණකින් කුසලයෙන් මතුවූයේ වේ. **හායතිමෙව** කිරිගොටිටෙහි වත්කළ දිය මෙන් පිරිහේමය. **එවං පුගගලෝ** මෙසේ වහා ශ්‍රද්ධාව ඇති මේ ශ්‍රද්ධාදීන්ගේ වශයෙන් එක්වරක් ගොඩනැගී ඔවුන්ගේ පිරිහීමෙන් නැවත ගිලේමය. දේවදත්තාදීන් මෙන් දේවදත්තයා වනාහි අෂ්ට සමාපත්ති පංචාභිඥා උපදවාද බුදුවරුන්ට විරුද්ධ වූ බැවින් ඒ ගුණවලින් පිරිහුනේ ලේ සෙලවීමේ කර්මය ද

සංසඳේද කර්මය ද කොට මරණින් පසු දෙවන චිත්තවාරයෙන් නිරයේ උපන්නේය. කෝකාලිකයා අගසව් දෙනමට දොස් කියා පදුම නිරයෙහි උපන්නේය. **නෙව හායති නො වඩ්ඪති** පොහොනා නො කල්හිද නො පිරිහේ. පොහොනා කාලයෙහි ද නො වැඩේ. මෙහි අගාරික අනගාරික දෙදෙනාම දැක්විය යුතුය. ඇතැම් අගාරිකයෙක් (ගිහියෙක්) නො සෑහෙන කාලයෙහි පක්ෂ බත හෝ සලාක බත හෝ වසසාවාසික බත හෝ ආරාධනා කරයි. හේ පසුව සෑහෙන කාලයෙහි ද පක්ෂ බත ආදිය පමණක් පවත්වයි. අනගාරිකයා ද නො සෑහෙන කාලයෙහි උද්දේසය හෝ ධුතංගය හෝ ගනියි. ඤාණය විරිය සම්පත්තියෙන් සෑහෙන කාලයෙහි ද එයින් එහා යමක් නොකරයි. **එවං පුගලෝ** මෙසේ මේ ශ්‍රද්ධාදියෙන් සිටි පුද්ගලයා **උම්මුජ්ජිඤ්ඤා යීතෝ** නම් වේ. **උම්මුජ්ජිතා විපසසති විලොකෙති** සෝවාන් පුද්ගලයා නැගී සිට ගමන් මාර්ගයේ යා යුතු දිසාව හෝ බලන්නේ නම් වේ. **උම්මුජ්ජිඤ්ඤා පතරති** සකදාගාමී පුද්ගලයා කෙලෙස් තුනී බැවින් නැගී සිට යා යුතු දිසාවට හැරී එගොඩ වෙයි. **පතිගාධපපතෙතා හොති** අනාගාමී පුද්ගලයා නැගී සිට බලා එගොඩ වී ගොස් එක් ස්ථානයක සිටියේ වේ. සිටියි. නැවත නො එයි. තිණ්ණෝ පාරංගතෝ ථලෙ තිට්ඨති - සියළු ක්ලේශ ඕඝයන් තරණයකොට පරතෙරට ගොස් නිර්වාණ ථලයෙහි සිටියේ වේ. මේ පුද්ගලයෝ සත්දෙනා වනාහි ජල උපමාවෙන් දක්වන ලදී. සත වනාහි, ඇවිදින වෙළෙන්දෝ දීර්ඝ මාර්ගයට පිළිසන්පන්නේ අතරමග පිරුණු නදියක් වෙත පැමිණියහ. ඔවුනතුරෙන් පළමුවැන්නා ජලයට බිය පුද්ගලයෙකු නිසා බැස්ස තැනම ගිලී නැවත උඩ ඒමට නොහැකි විය. ඇතුළේම මස් කැසුබු ආදීන්ට ගොදුරු විය. දෙවැන්නා බැස්ස තැන ගිලී වරක් මතුවී නැවත ගිලී මතුවීමට නොහැකි විය. ඇතුළේම මස්කැසුබු ආදීන්ට ගොදුරු විය. තුන්වැන්නා ගිලී මතුවී ගඟේ මැද සිට මෙතෙරට ඒමට හෝ එතෙරට යෑමට නොහැකි විය. සතරවැන්නා නැගී සිටියේ එතෙර තොට බැලීය. පස්වැන්නා එතෙරවන තොට බලා පීනයි. සවැන්නා තරණයකොට පරතෙරට ගොස් ඉඟ පමණ ජලයෙහි සිටියේය. සත්වැන්නා පරතෙරට ගොස් සුවඳ සුණු ආදියෙන් ස්නානය කොට උතුම් ඇඳුම් ඇඳ සුරහි ආලේපනය කොට, නිල් උපුල් ආදිය පැළඳ නොයෙක් අලංකාරයෙන් සැරසුනේ මහා නගරයට පිවිස උතුම් ප්‍රාසාදය නැගී උතුම් භෝජන අනුභව කෙළේය. එහි පදික වෙළෙන්දෝ සත්දෙනා මෙනි. මේ පුද්ගලයන් සත්දෙනා සසර නදිය මෙනි. දියට බිය පළමු පුද්ගලයා බැස්ස තැනම ගිලුණා මෙන් මිසදිටුවා සසරෙහි ගැලීම. ගිලී

මතු වූ පුරිසයා මෙනි. ශ්‍රද්ධාදියේ ඉපදීම් මාත්‍රයෙන් නැගී ඒවායේ පරිහානියෙන් ගිලෙන පුද්ගලයා ගඟ මැද සිටියහු මෙන් ශ්‍රද්ධාදියේ ස්ථිතියෙන් සිටි පුද්ලගලයා. එතෙර කොට බලන්නා මෙන් යායුතු මග යායුතු දිසාව බලන සෝවාන් පුද්ගලයා. එගොඩ පිනන පුඟුලා මෙන් කෙලෙස් තුනී සකෘදාගාමී පුද්ගලයා. කරණය කොට ඉඟ පමණ ජලයේ සිටි පුද්ගලයා මෙනි. නොපවතින ධර්මතාවෙන් සිටි අනාගාමී පුද්ගලයා, ස්නානය කොට පරතෙරින් එතෙරව ගොඩබිම සිටි පුද්ගලයා මෙනි. ඕස සතර තරණයකොට නිවන් තලයෙහි සිටි ක්ෂිණාශ්‍රව බ්‍රාහ්මණයා ගොඩ සිටි පුද්ගලයා නගරයට පිවිස ප්‍රාසාදයට නැගී උතුම් භෝජනය මෙන් ක්ෂිණාශ්‍රවයා නිවන් අරමුණෙන් ඵලසමාපත්තියට පැමිණ ගතකිරීම දතයුතුය. උභතොභාග විමුක්තාදිය යට පවසන ලදමය.

සත්තක නිද්දේසය නිමි.

අධික නවක නිද්දේසාදිය ද යට කියන ලද නයින්ම දතයුතුය. දසක නිද්දේසයෙහි ඉධ කාමාවචර භූමියෙහි. කාමාවචර භූමියේ සත්තකඛත්තුපරමාදීන්ට කාමාවචර භූමියම නිෂ්ඨාව වේ. කාමාවචර බැවින්ම රහත්බවට පැමිණීම ද අනුපාදිසේස නිර්වාණයට පැමිණීම ද වේය යන අර්ථයයි. ඉධ විභාය මෙහි කාමාවචර ආත්මභාවය හැර සුද්ධාත්ම භවයෙහි සිටියවුනට නිෂ්ඨාව වේයයි යන අර්ථයයි. අන්තරා පරිනිබ්බායි ආදීහු මෙහි අනාගාමී ඵලයට පැමිණ මෙයින් චුතව සුද්ධාවාසවල ඉපිද ඒ ආත්මභාවයෙන් අරහත්භාවයට ද අනුපාදිසේස පරිනිර්වාණ ධාතුවට ද පැමිණෙති. එයින් කියන ලදී. ඉමෙසං පඤ්චනනං ඉධ විභාය නිට්ඨාති.

දසක නිද්දේසය නිමි.

මෙපමණකින්ම:-

ලොවැ අසම පුඟුල් පැණවුම
දෙසී නිදසාලයේ - හැකිළීමක් නොමැතිවම

අටුවාව ද එහී - සැකසූ හෙළදිව් බසින්
අටුවාවල ද ගම් - කිමිදී නිරවසේසෙන්

සුබෙදුණු නුමුසු වූ - ඒ ඒ තැනින් එමරුන්
එයින් ගෙන ඒවා - වැඩි විස්තර හැරදමා

සැකසූ විසුදු මගැ - නොගෙනම කියන ලද දේ
නැති කෙටි විතර වූ - නයින් අටුවාවකි මේ

සතක් ම පමණ වූ - බණවරකින් පෙළබසින්
මවිසින්ම සකසන - තිර පැවතුමට දහමේ

සියුම් සිව සඳහම් - එ පිණින් පැමිණ කුසලට
පිරිසිදු දහමැසින් - බලත්වා සැම සත්තුම

පරමත්ථදීපනී පඤ්චපපකරණට්ඨ කථාවේ
පුගල පඤ්ඤත්තිපපකරණ අත්ථවණ්ණනාවට
කළ සිංහල පරිවර්තනය නිමි.

දෙව්ගණ පෙරටුකොට - වැඩහිඳ පඬු ඇඹුලෙහි
අසම පුඟුලා වන - දෙවියන් සහිත ලොවෙහි

කුසල වූ සියළු පැණ - වුම් සහ විතර දෙසුමෙහි
දෙසා පුඟුල් පැණ - වුම ලොවැ උතුම් පුඟුලා

පුද්ගල කතාදී - කතාහි වන්බාවයෙන්
සැකවින් දෙසී මුනි - කතාවත් නම් පකරණ

මෑ පෙළ පමණක් ම - තබන ලද දෙව්ලොවෙහි
මොගලිපුත් සමිදු - බෙදූ එය මිහිතලෙහි

පැමිණැ'ත දැන් එහි - අරුත් වැනුම පිළිවෙලින්
එහෙයින් වනමි මම - එය'සනු සන්සුන් සිතින්

භාග්‍යවතුන් වහන්සේ යමක ප්‍රාතිහාර්ය අවසානයෙහි තිදස් පුරයෙහි පාරිජාත රුක්මුල්හි පණ්ඩුකම්බල සල'සුන්හි වස් එළඹ, මව කාය සාක්ෂිකොට දෙව්පිරිසට අභිධර්ම කථාව දේශනා කරන්නේ ධම්ම සංගණී, විභංග, ධාතුකථා, පුග්ගල පඤ්ඤත්ති, ප්‍රකරණ දේශනා කොට, කථාවත්‍ථු දේශනාවට වාරය පැමිණි කල්හි, 'අනාගතයෙහි මාගේ ශ්‍රාවක වූ මහා ප්‍රාඥ මොග්ගලීපුත්තතිස්ස ස්ථවිරයන් වහන්සේ, උපන් සසුන් කිලුට පිරිසිදුකොට, තුන්වන ධර්ම සංගීතිය පවත්වන්නේ බික්සඟන මැද වැඩහිඳ සකවාදයෙන් සූත්‍ර පන්සියක් සහ පරවාදයෙන් පන්සියයක්දැයි සූත්‍ර දහසක් කැටිකොට මේ ප්‍රකරණය බෙදන්නාහැ'යි උන්වහන්සේට ඉඩ තබා, පුද්ගල වාදයෙහි සතර ප්‍රශ්නවල දෙපස් වශයෙන් වාද මුඛ අට, ආදිකොට සියළු කථා මාර්ගයේ අසම්පූර්ණ බණවරකින් පාළි භාෂාවෙන් මාතෘකා තැබූහ.

ඉක්බිති අවසේස අභිධර්ම කථාව විස්තර නයින්ම දේශනා කොට වස් අවසානයෙහි රන් රිදී සෝපාන දෙකට මැද වූ මැණික්මය සෝපානයෙන් දෙව්ලොවින් සංකස්ස පුරයට බැස, සත්ත්ව දියුණුව සලසමින් ආයු තෙක් වැඩසිට අනුපාදිසේස පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවන්පා වදාළ සේක. ඉක්බිති මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ප්‍රමුඛ රහතන්වහන්සේලා අජාසත් රජතුමාගේ සහායෙන් ධර්ම විනය සංගායනා කළහ. එයින් වසර සියයකට පසු වජ්ජිපුත්තක භික්ෂූහු දස වස්තුව දැක්වූහ. එය අසා කාකණ්ඩ බමුණු පුත් යස ස්ථවිරයන් වහන්සේ සුසුනාග පුත් කාලාශෝක රජතුමාගේ සහාය ලබාගෙන දොලොස් දහසක් භික්ෂූන් අතරෙන් සත්සියයක් තෝරාගෙන ඒ දස වස්තුව මැඩ ධර්ම විනය සංගායනා කළහ. ඒ ධර්ම සංගීතිකාරක භික්ෂූන් වහන්සේලා නිග්‍රහ කරනු ලැබූ දස දහසක් වජ්ජික පුත්තක භික්ෂූහු මහා සංඝික ආචාර්ය කුලය ඇති කළහ. එයින් බිඳී ඇදුරු කුල දෙකක් විය. එනම් ගොකුලික හා එකබෙබාහාරිකය වේ. ගොකුලික නිකායෙන් බිඳී, පණ්ණත්ති වාද බාහුලික යයි ඇදුරු කුල දෙකක් ඇතිවිය. බාහුලිකයන් බහුසසුතිකා යනු ද නාමයක් වේ. ඔවුන් අතරෙහි ම චෙතියවාද නම් ආචාර්ය වාදයක් පහළවිය. මෙසේ මහා සංඝික ඇදුරු කුලයෙන් දෙවන සියවස ඇතුළත ආචරිය කුල පහක් උපණ. ඒවා මහා සංඝිකය සමග හයක් වේ. ඒ දෙවන වස් සියයෙහිම ස්ථවිර වාදයෙන් බිඳී මහිංසාසික වජ්ජිපුත්තක යයි ඇදුරුවාද දෙකක් ඇතිවිය. එහි වජ්ජිපුත්තක වාදයෙන් බිඳී ධම්මුත්තරිය, භද්‍රයානික, ඡනනාගාරික, සම්මිතිය යයි ආචාර්ය වාද

සතරෙක් ඇතිවිය. නැවත ඒ දෙවන වස් සියය ඇතුළතම මහා සංඝික වාදයෙන් බිඳී සබබත්‍ථිවාද ධම්මගුත්තික යයි ආචාර්ය වාද දෙකක් උපන්නේය. සබබත්‍ථිවාදයෙන් බිඳී කස්සපිකා යයි වාදයක් ඇතිවිය. කස්සපිකයෙන් බිඳී සංකන්තික නම් වාදයක් ඇතිවිය. එයින් බිඳී සුත්තවාද නම් වාදයක්දැයි ථේරවාදයෙන් බිඳී වාද එකොළහක් ඇතිවිය. ඒවා ථේරවාදය සමග දොළහක් විය. මෙසේ මෙම දොළහ ද මහා සංඝික වාද හයදැයි ආචරියවාද දහඅටක් දෙවන වස් සියය ඇතුළත දී ඇතිවිය. අටළොස් නිකාය යයි ද අටළොස් ආචරිය කුල යයි ද ඒවාටම නම් වේ. මේවායින් වාද දාහතක් හින්නක වන අතර ථේරවාදය අසම්භින්නක යයි දත යුතුය. දීපවංසයෙහි මෙය කියන ලදී.

තෙරුන්ගෙන් නෙරපුණු - වැදිරට පවිටු බිකුගණු
ලැබගෙන වෙන පසක් - අදහම් වූ බොහොදෙනා

කළන දම් සඟනා - දස දහසක් එකතු වී
එනිසා එයට මහ - 'සංගීති'යයි කියැවේ

මහ සඟිති බිකුගණ - කළහ විලොම් සසුනෙහී
මුල් සඟන බිඳලා - කළහ වෙතමම සඟ හක්

එක් තැන සඟහ සුත් - අන්තැන කළහ විලොමෙන්
දහමරුන් බින්දහ - විනයෙහි පස් නිකායේ

පරියා දෙසුම් සහ - නිප්පරියා දෙසුමෙහි ද
පත් සහ පමුණුවන - අරුත් නොදැනම බිකුවෝ

බිණු අන් සඳහා - අන්තැන තැබූ ඔවිහූ
සේයා පිණිස වන - වැනසූ නෙක අරුත්දම්

සුත් විනය ගැඹුරු - හැර එක්දෙසක් සඳහා
පිළිරු සුත්විනය - කළහ එහි ඔහු අනිකක්

අබිදම් සපකරණ - උදුරා අරුත් පිරිවර
නිදෙසය පිළිසුඹුහි - ජාතක එක් දෙසෙක්හි ද
මෙපමණ හැරදමා - වෙනකක් කළහ ඔවිහූ

නම් ලිඟු පිරිකර ද - කළයුතු දෙය ද පැවතුම්
මුල්සැටි හැරදමා - එහි ද අනිකක් කළහූ

මුලින් ම බෙදුනාහු - මහ 'සංගිති' කරුවෝ
ඔවුන් අනුකරණෙන් - බිඳුණු මත ම විය බොහෝ

ඉන්පසු කාලයෙහි - එහි බෙදය පහළවිය
ගෝකුලික එක්වහර - දෙකට බුන්හයැ බිකුවෝ

ගෝකුලිකයෙන් බෙද - පසුකාලයෙහි ඇතිවිය
බහුසසුති පඤ්ඤතති - දෙකට බුන්හයැ බිකුවෝ

චේතිය වාදය ද - විය මහා සංගිතියේ
මෙම වාද පහටම - මහ සංගිති මුල් විය

සඟහය එක්දෙසක - අරුත ද දහම ද බිඳි
ගත්වල එක්දෙසක් - හැර අනිකක් කළහ ඔහු

නම් ලිඟු පිරිකර ද - කළයුතු දෙය ද පැවතුම්
මුල්සැටි හැරදමා - එහි ද අනිකක් කළහූ

විසුදු තෙර මතයෙහි - නැවත ද බෙද ඇතිවිය
මහිංසාසක වජ්ජි - පුත්ත යයි බිකු බිඳුනහ

වැදිපුත් වාදයෙහි - බෙදය සිව් අයුරු වී
දමුතුරු සොඳුරයන් - ඡන්නාගාර සම්මිති

මහිංසාසකයෙන් - දෙබේ පසුකල ඇතිවී
දම්ගුත් සබ්බත්ථි - දෙකට බිඳුනහ බිකුවෝ

සබ්බත්ථි මතයෙන් - කසසපි ඉන් සංකනත
ඉන් සුත්ත වාද ද - පිළිවෙළින් බිඳුනේ විය

මේ එකොළොස් වාද - බිඳුනේ තෙර වාදයෙන්
සඟහා එක් දෙසක් - අරුත ද දහම ද නැසූ
ගත ද හැර එක් දෙසක් - එහි ද වෙනසක් කෙරුවෝ

නම් ලිඟු පිරිකර ද - කළයුතු දෙය ද පැවතුම්
මුල්සැටි හැරදමා - එහි ද අනකක් කළහූ

බුන් වාද සතළොස් - එක් වාදයක් නොබුනකි
මෙහැම අටළොස් විය - බුන් වාදයන් එය හා
මහ නුගරුකක් මෙන් - තෙර වාදය ම 'තුම් වේ

අඩු වැඩි නැතිව හුදු - බුදු සසුනෙහිම පරපුර
නුග ගසෙහි මෙන් විය - සෙසු වාද ඉන් ඇතිවිය

මුල් සියවසෙහි නැත - දෙවන සියවස ඇතුළත
බුන් සතළොස් වාද - උපන සම්බුදු සසුනේ

ඉන්පසු කලින් කල හේමවතික, රාජගිරික, සිද්ධතතික, පුබබසේලිය, අපරසේලිය, වාජිරිය යයි තවත් ආචරිය වාද හයක් ඇතිවිය. ඒවා මෙහි අදහස් නොවේ. මුලින් කී අටළොස් ආචරිය වාද පවතින කල්හි සාසනය කෙරෙහි සැදැහැවත් වූ අශෝක මහරජතුමා දිනපතා බුද්ධ පූජාව පිණිස ලක්ෂයක් ද ධර්ම පූජාව පිණිස ලක්ෂයක් ද සංඝ පූජාව පිණිස ලක්ෂයක් ද තමාගේ ඇදුරු වූ නිග්‍රෝධ තෙරුන්ට ලක්ෂයක් ද සතර වාසල්හි බෙහෙත් පිණිස ලක්ෂයක්දැයි පන්ලක්ෂයක් පරිත්‍යාග කරමින් සාසනයෙහි මහත් ලාභසත්කාර පැවැත්විය. තීර්ථකයෝ ලාභ සත්කාරවලින් පිරිහී යටත් පිරිසෙයින් කෑම ඇදීම් පමණකුත් නොලබා ලාබසත්කාර බලාපොරොත්තුවෙන් භික්ෂූන් කෙරෙහි පැවිදිව සිය දෘෂ්ටීන් මේ ධර්මය, මේ විනය මෙය ශාස්තෘ ශාසනයයි දක්වති. පැවිද්ද නොලබන්නෝ ද තමාම කෙස් කපා කසාවත් හැඳ විහාරවල හැසිරෙන්නේ පොහොය කර්ම කරන කාලයෙහි සඟ මැදට පිවිසෙති. භික්ෂූන් වහන්සේ විසින් ධර්මයෙන් විනයෙන් ශාස්තෘ ශාසනයෙන් නිග්‍රහ කරන ලබන ඔව්හු ධර්ම විනයානුලෝම ප්‍රතිපත්තියෙහි නොපිහිටන්නේ නොයෙක් ආකාර සාසන අර්බුද ද කිළිටි ද කටු ද උපදවති. සමහරෙක ගිනි පුදති. සමහරෙක් පංචතාපයෙන් තැවෙති. කෙනෙක් හිරු අනුව පරිවර්තනය වෙති.

සමහරෙක් ධර්මය ද විනය ද බිඳින්නෙමු යයි එසේ උත්සාහ කරති. එකල භික්ෂු සංඝයා ඔවුන් සමග උපෝසථය හෝ පවාරණය නොකළහ. අශෝකාරාමයෙහි සත්වසක් පොහෝ පවුරුණු නොවීය. රජුගේ අණින් කරවන්නෙමි යයි උත්සාහ කරන්නේ ද කිරීමට නොහැකි විය. වැරදියට ගත් මෝඩ ඇමතිවරයෙකු විසින් බොහෝ භික්ෂූන් ඝාතනය කළ කල්හි විපිළිසරයෙක් විය. ඒ රජතුමා, ඒ විපිළිසරයද ඝාසනයෙහි උපන් අර්බුදය ද සමනය කරනු කැමැත්තේ මේ කාරණයෙහි සමර්ථ කවරෙක්දැයි සංඝයාගෙන් විචාළේය. මොග්ගලීපුත්ත තිස්ස මහතෙරුන් යයි අසා සංඝයාගේ වචනයෙන් අහෝ ගංගාතෙර පර්වතයෙහි වැඩසිටි තෙරුන් වහන්සේ කැඳවාගෙන ඍද්ධි ප්‍රාතිහාර්ය දැකීමෙන් තෙරුන් වහන්සේගේ අනුභාවයෙහි සැක හැර තමගේ පසුතැවිල්ල අඝා විපිළිසරය සංසිඳවීය. තෙරුන්වහන්සේ ද රජ උයනෙහි වැඩවසන්නේ සත් දවසක් රජුට ආගම ඉගැන්වූහ. හෙතෙම උගත් සසමය ඇත්තේ සත්වන දවසෙහි භික්ෂු සංඝයා රැස්කරවා තිරයකින් වටකරවා තිරපවුර තුළ සිට ඒකලද්ධික භික්ෂූහු එක්තැන් කරවා එක් එක් භික්ෂුව කැඳවා විචාළේය. ස්වාමින් වහන්ස! බුදුන්වහන්සේ කුමන වාදියෙක්ද? එයින් සස්සතවාදිහු සාස්වතවාදියයි කීහ. එක් එක් සස්සතිකා, අනන්තානන්තිකා, අමරා විකෙඛපිකා අධිචසමුප්පන්නිකා, සඤ්ඤීවාදා, අසඤ්ඤීවාදා, නෙවසඤ්ඤී වාදා, උචෙඡදවාදා, දිට්ඨධම්ම නිබ්බාන වාදා, ආදීහු තම තමන් ගත් දෘෂ්ටිය යයි කීහ. රජ පළමුව සමය උගත් හෙයින් මේ භික්ෂූහුය. මේ තීර්ථකයින් යයි දැන ඔවුන්ට සුදු වස්ත්‍ර දී උපැවිදි කෙළේය. ඔව්හු සියල්ලෝ හැටදහසක් වූහ. ඉන්පසු භික්ෂූන් කැඳවා විචාළේය. ස්වාමින් වහන්ස, සම්මා සම්බුදුන් කුමන වාදීද? මහරජ, විභජ්ජවාදී යයි කීහ. මෙසේ කී කල්හි රජ තෙරුන් විචාළේය. ස්වාමින් වහන්ස, බුදුහිමි විභජ්ජවාදීද? එසේය මහරජ. ස්වාමීනි, දැන් ඝාසනය පිරිසිදුය. භික්ෂු සංඝයා උපෝසථ කරත්වා යයි ආරක්ෂාව ලබාදී නගරයට පිවිසියේය. සමගි සංඝයා එකතු වී පොහොය කළහ. ඒ සමාගමයෙහි භික්ෂූහු හැට ලක්ෂයක් වූහ. ඒ සමාගමයෙහි මොග්ගලීපුත්ත තිස්ස තෙරුන් වහන්සේ ඒ උපන් වස්තු නැවතත් උපදින්නේ යයි ඒවා මැඩපැවැත්වීම සඳහා ශාස්තෘන් වහන්සේ දෙනලද නය වශයෙන්ම කථාගතයන් වහන්සේ විසින් තබන ලද මාතෘකා බෙදන්නේ සක වාදයෙන් සූත්‍ර පන්සියයක් සහ පරවාදයෙන් පන්සියයක් දැයි සූත්‍ර දහයක් ගෙනහැර දක්වා මේ පරවාද මර්දන මතු කියන ලක්ෂණ ඇති කථාවත්ථුප්පකරණය දේශනා කළහ. ඒ සැට ලක්ෂයෙන් ත්‍රිපිටක පරියත්තධර පැමිණි සිව්පිළිසිඹියා

ඇති භික්ෂූන් දහසක් තෝරාගෙන, මහකසුප් හිමියන් සහ යස තෙරුන් ධර්මය ද විනය ද සංගායනා කළ සේ සංගායනා කරමින් සාසන කිලුට පිරිසිදු කොට තුන්වන ධර්ම සංගායනාව කළහ. එහි අභිධර්මය සංගායනා කරන්නේ මේ කියන ප්‍රකරණය සංග්‍රහ කළහ. එයින් කියන ලදී.

පුද්ගල කතාදී - කතාහි වත්බාවයෙන්
සැකවින් දෙසී මුනි - කතාවත් නම් පකරණ

මෑ පෙළ පමණක් ම - තබන ලද සුරලොවෙහි
සම්දු මොග්ගලි පුත් - බෙදූ එය මිහිතෙලෙහි

පැමිණෑත දැන් එහි - අරුත් වැනුම පිළිවෙළින්
එහෙයින් වනමි මම - එය'සනු සන්සුන් සිතින්

නිදාන කථා නිමි.

පුග්ගල කථා 1

එහි පුග්ගලෝ උපලබ්භති සච්චිකට්ඨ පරමත්ථෙන යන මෙය විචාරීමය. ආමන්තා යනු පිළිගැනීමය. මේ විචාරීම කාගේද? පිළිගැනීම කාගේද? අසවලාගේ යයි නොකිවයුතුය. භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ප්‍රකරණයෙහි නානාප්‍රකාර ලබ්ධීන් පිරිසිදු කිරීම පිණිස පෙළ වශයෙන් මාතෘකා තබන ලදී. ශාස්තෘන් වහන්සේ විසින් දෙන ලද නයෙහි සිට තෙරුන් විසින් එය පෙළ වශයෙන් ලදී. එහි යම් පමණ වාද මාර්ග දක්වන ලදද එපමණ වාදීන් සමග වාදයෙන් විග්‍රහ කථා කීමේ ස්ථවිරයන් වහන්සේ නොවේ. මෙසේ පවතින කල්හි ද ඒ ඒ කථාවල අර්ථය පහසුවෙන් දැරීම පිණිස සකවාදී විචාරීම්, පරවාදී විචාරීම්, සකවාදී පිළිගැනීම් යයි මෙසේ විභාග දක්වාම අර්ථ වර්ණනා කරන්නෙමි. **පුග්ගලෝ උපලබ්භති**

සච්චිකට්ඨ පරමත්ථෙන යන මෙය සකවාදී විචාරීමය. එයින් පුද්ගලයා ඇතැයි මෙසේ ලබ්ධි ඇත්තේ පුද්ගලවාදීහු වෙති. ඔව්හු මෙසේ විචාරිය යුතුයයි දක්වයි. පුද්ගලවාදීහු කවරහුද? සාසනයෙහි වජ්ජිපුත්තකයෝ ද සම්මිතියෝ ද සාසනෙන් බැහැර බොහෝ අන්‍ය තීර්ථකයෝ වෙති.

එහි **පුග්ගලෝ** යනු ආත්මය, සත්ත්වයා, ජීවය වේ. **උපලබ්භති** යනු ප්‍රඥාවෙන් පැමිණ ලබයි. දැනගනී යන අර්ථයයි. **සච්චිකට්ඨ පරමත්ථෙන** මෙහි සච්චිකට්ඨා යනු මායාව මිරිගුව ආදිය මෙන් අවිද්‍යමාන ආකාරයෙන් නොගතයුතු විද්‍යමාන අර්ථයයි. පරමත්ථා යනු පරම්පරාදි වශයෙන් නොගතයුතු උතුම් අර්ථය. දෙකින්ම යමෙක් අන්‍යයාගෙන්. **පුග්ගලෝ උපලබ්භති සච්චිකට්ඨ පරමත්ථෙන රූපඤ්ච උපලබ්භති** යනාදියෙන් ස්කන්ධ ආයතන, ඉන්ද්‍රිය වශයෙන් පනස් හත් ආකාර වූ ධර්ම ප්‍රභේදය දක්වන ලදී. යම්සේ එය භෞතික වශයෙන් ස්වභාව අර්ථයෙන් ලැබේ. කිම? මෙසේ ඔබගේ පුද්ගලයා ලැබුනේදැයි විචාරයි. පරවාදියා **ආමතතානි** එසේ යයි පිළිගනියි. පිළිගැනීමේ දී **කිසිවෙක් ආමහනෙත** යයි එති. **කිසිවෙක් ආමෝ** යයි පිළිගැනීමට එති. මෙහි වනාහි ආමතතා යයි එන ලදී. එහි අදහස මෙසේය. එය අනුන්ගෙන් **වුත්තං භගවතා අත්ථි පුග්ගලෝ අනතහිතාය පටිපනෙනා සූත්‍රයේ** එන ලදී. එය ගෙන යම්හෙයකින් වනාහි භාග්‍යවතුන් වහන්සේ සත්‍යවාදී, විසංවාදය පෙරටුව වචන නොකියති. අනුසසව වශයෙන් ධර්මදේශනා නො කරති. තමා අවබොධ කොට සදේවක ලෝකයන් ප්‍රකාශ කරති. එනිසා එයින් කියන ලදී. අත්ථි පුග්ගලෝ අතතහිතාය පටිපනෙනා, එය සත්‍ය වශයෙන් පරමාර්ථ වශයෙන් ඇතැයි යන ලබ්ධිය ගෙන ආමතතා යයි පිළිගනියි. ඉක්බිති එබඳු වූ ලෙස වචනයට ඡලවාදයට අවකාස නොදෙමින් සකවාදියා **යො සච්චිකට්ඨා** යනාදිය කීය. එහි අදහස මෙසේය. යම් අයෙකු විසින් අනුන්ගෙන් **සපපච්චයෝ අපපච්චයෝ සංඛතෝ අසංඛතෝ සසසතෝ අසසසතෝ සනිමිත්තෝ අනිමිත්තෝ** යයි මෙසේ දක්වන ලදී. රූපාදි පනස්හත් ආකාර ධර්ම ප්‍රභේදය එන ලදී. සම්මුති වශයෙන් නොවේ. පරම්පරා වශයෙන් නොගත යුතුය. තමාගේ විද්‍යමාන බැවින් මෙසේ සත්‍යාර්ථය ආත්ම ප්‍රත්‍යක්ෂතාවෙන් ද පරමාර්ථ වේ. ඒ සඳහා කීය. **යො සච්චිකට්ඨා පරමත්ථා තතෝ සෝ පුග්ගලෝ උපලබ්භති සච්චිකට්ඨ පරමත්ථෙන තතෝ** යන මෙය කරණ වචනයකි. එහෙයින් සත්‍යාර්ථ පරමාර්ථ වශයෙන් ඒ පුද්ගලයා ලැබේ. මෙහි අර්ථය මෙයයි. මෙය කියන ලද්දේ වේ. වෙනස්වීම් ප්‍රභේදයෙන් හෝ සප්‍රත්‍ය

භේදයෙන් හෝ ආකාරයෙන් යම්. සත්‍යාර්ථ පරමාර්ථය ලැබේ. කිම ඔබගේ පුද්ගලයා? ඒ ආකාරයෙන් ලැබේද? **නහෙවං වත්තබ්බො** යනු පරවාදියාගේ නොපිළිගැනීමය. මෙහි මේ පද ඡේදය, මෙසේ නොකිව යුතුය යන්නයි. නහ එවං යනු ද වටී. දෙකම මෙසේ නොකිව යුතුය යන අර්ථයයි. ආඥානාහි නිගඟහං යනු සකවාදි වචනයයි. ඔබගේ මුලින් කියයුතු පිළිගැනීම පසුව කිවයුතු පිළිගැනීම නොවේ. පසුව කී දෙයින් පෙර කී දේ නොගැලපෙයි. එනිසා නිග්‍රහයට පැමිණියේය. ඒ නිග්‍රහය, දෝසය, අපරාධය පිළිගතුවයි යන අර්ථයයි. මෙසේ නිග්‍රහය ඉක්මවා, දැන එය තැබීමට ද අනුලොම් පිළිලොම් වශයෙන් සාසනාරෝපයට ද වශයෙන් ප්‍රකට කරන්නේ හඤ්චි පුගලෝ යනාදිය කීහ.

එහි හඤ්චි පුගලෝ **උපලබ්භති** යන ඉදින් පුද්ගලයා ලැබේද ඒකාන්තයෙන් ඒ පුද්ගලයා සත්‍යාර්ථ පරමාර්ථ වශයෙන් ලැබේ යන අර්ථයයි. මෙය පළමුව පරවාදි පක්ෂයේ තැබීමෙන් නිග්‍රහ පැමිණිවීම ආරෝපනයේ ලක්ෂණය වූ අනුලෝම තැබීම නම් වේ. **තෙන වත රෙ** යනාදි අනුලෝම පක්ෂයෙහි නිග්‍රහයට පමුණුවන ලද අනුලෝම පැමිණවීම නම් වේ. එහි **තෙන** කාරණ වචනයයි. **වත** විශ්වාස වචනයයි. **රෙ** ආමන්ත්‍රණ වචනයයි. මෙය කියන ලද්දේ වේ. තෙන රෙ, කිව්යුතු කල්හි වත, රෙ හමේහා, හදුමුඛ තෙන කාරණෙන හදුමුඛය, ඒ කාරණයෙන් කිව යුතුමය. **යං තඤ්ච වදෙසි** ආදිය අනුලෝම පක්ෂයෙහි නිග්‍රහයට ආරෝපනය කරන ලද බැවින් අනුලෝම ආරෝපනා නම් වේ. යමක් ඒ අවසානයෙහි **මිච්ඡා** පදය එයට පෙරටුවෙන්, **ඉදනෙත** යයි ගෙන ආ යුතුය. මෙය ඔබගේ වැරැද්ද යයි මෙය මෙහි අර්ථයයි. පසුවද පෙළෙහි මෙය එන ලද්දේමය. **නො චෙ පත වත්තබ්බ** ආදිය එසේ නොකිව යුතු යයි ප්‍රතික්ෂේප කළ පක්ෂයට තබන ලද බැවින් ප්‍රතිලෝමයෙන් නිග්‍රහ පැමිණවීම ආරෝපණයන්ගේ ලක්ෂණ භූත පටිලෝම ඨපන නම් වේ. නො ච වත රෙ ආදි පටිලෝම පක්ෂයෙහි නිග්‍රහයට පමුණුවන ලද ප්‍රතිලෝම පැමිණවීම නම් වේ. නැවත **යං තඤ්ච වදෙසි** යනාදිය පටිලෝම පක්ෂයෙහි නිග්‍රහයට ආරෝපනය කරන ලද බැවින් පටිලෝම ආරෝපනය නම් වේ. මෙහි ද අවසානයෙහි මිච්ඡා පදයට ඉදිරියෙන් **ඉදනෙතති** යයි ගෙනහැර දැක්විය යුතුය. පසුවද මෙබඳු තැන්වල මෙම නයම වේ. එහි මුල පටන් සංක්ෂේපාර්ථය මෙසේය. ඉදින් පුද්ගලයෙක් සත්‍යාර්ථ පරමාර්ථ වශයෙන් ලැබේද. එහෙයින් ස්ථිරව ඔහු ලැබේ යයි කිවයුතුය. දෙවන ප්‍රශ්නයෙහි එයින් ඒ පුද්ගලයා ලැබෙතියි. මෙය ඔබගේ වැරැද්ද යයි

මෙසේ අනුලෝම වශයෙන් තැබීම පැමිණවීම ආරෝපනය වේ. ඉක්බිති නොකිව යුතුය. දෙවන ප්‍රශ්නයෙහි එයින් ඒ පුද්ගලයා ලැබෙයයි පළමු ප්‍රශ්නයෙහි ද නොකිව යුත්තේමය මෙහි යමක් කීවේද පළමු ප්‍රශ්නයෙහි සත්‍යාර්ථ පරමාර්ථයෙන් ලැබෙතියි කිවයුතුය. දෙවන ප්‍රශ්නයෙහි එයින් ඒ පුද්ගලයා ලැබෙයයි නොකිව යුතුය. මෙය ඔබගේ වැරැද්ද යයි මෙසේ ප්‍රතිලෝම වශයෙන් තැබීම, පැමිණවීම, ආරෝපනය වේ. මෙසේ මෙය නිග්‍රහයට ද අනුලෝම ප්‍රතිලෝම සතරේ පැමිණවීම ආරෝපනය කියන ලද බැවින් ලැබෙය යනාදිය අනුලෝම පංචක නම් වේ. මෙහි ද කිසිවක් අනුලෝමයෙන් පැමිණවීම් ආරෝපනයෙන් එකකි. ප්‍රතිලෝමයෙන් පැමිණවීම් ආරෝපනයෙන් එකකැයි නිග්‍රහ කතා දෙකකි. නිග්‍රහය දැනගන්නැයි මෙහි එයම පුද්ගලයා ලැබේ යයි පළමු වාදය නිසා පළමු නිග්‍රහයට දෙයාකාරයකින් ආරෝපනය කළ හෙයින් පළමු නිග්‍රහය එකම නිග්‍රහයකි.

දැන් විරුද්ධ නය වේ. එහි විචාරීම පරවාදියාගේය. හේ තමාට හිත පිණිස පිළිපන් පුද්ගලයා ඇතැයි ගත් බැවින් නො ලැබේ යයි නොපිළිගන්නේ මෙසේ විචාරයි. සකවාදයේ රූප ධර්ම ලැබේද මෙසේ නොලැබිය යුතු බැවින් **ආමනතා** යයි පිළිගනී. නැවත අනිකා තම අදහස් කළ සත්‍යාර්ථයම සඳහා **සො සච්චි කථො** යනාදිය කීහ. සම්මුති සත්‍ය පරමාර්ථ සත්‍ය එකතුකොට ද මෙසේ කියයි. සකවාදි පුද්ගලයා යයි උපාදාය ප්‍රඥප්ති ස්වභාවයෙන් ද සත්‍ය දෙකම එකතුකොට විචාරන ලද විටද **න හෙව** යයි ප්‍රතික්ෂේප කරයි. දැන් කිසිවක් ද එයින් පළමුවන පරමාර්ථ සත්‍ය වශයෙන් නොලබන ලද බැවින් පිළිගන්නා ලදී. පසුව සම්මුති සත්‍ය වශයෙන් මිශ්‍ර වශයෙන් හෝ ප්‍රතික්ෂේප කරන ලදී. පරවාදියා නොලැබේ යයි වචන සමාන බව පමණක් ඡලවාදය නිසා ඔබ විසින් පළමුව යමක් පිළිගන්නා ලද ද එය පසුව ප්‍රතික්ෂේප කරන ලදැයි කලහයට පෙරලා කලහයක් මෙන් කරන ලද තමාගේ නිග්‍රහ ක්‍රියාවට ප්‍රතිකර්ම කරන්නේ **ආඥානාහි පටිකම්මං** යයි කීය. දැන් මේ අනුලෝම පංචකයෙහි සකවාදියා විසින් වාද තැබීම කොට අනුලෝම පටිලෝම වශයෙන් පැමිණවීම් ආරෝපනයෙන් නිග්‍රහය ප්‍රකට කරන ලදී. මෙසේ ප්‍රතිකර්මය ප්‍රකට කරන්නේ **හඤ්චි පුග්ගලෝ** යනාදිය කීය. එය යට කියන ලද නයින්ම අර්ථ වශයෙන් දතයුතුය. මෙහි යම්හෙයකින් තැබීම නම් පරවාදී පක්‍ෂයේ තැබීමෙන් මෙය ඔබගේ දෝසයයි දැක්වීමට තැබීම් මාත්‍රයක්ම වේ. නිග්‍රහයේ හෝ ප්‍රතිකර්මයේ හෝ ප්‍රකට කිරීමක් නොවේ.

පැමිණවීම් ආරෝපනයෙන් ප්‍රකට කිරීමක් වේ. එහෙයින් මෙය අනුලෝම පටිලෝම වශයෙන් පැමිණවීම් ආරෝපනයේ වශයෙන් සතරාකාරයකින් ප්‍රතිකර්මය කළ බැවින් පටිකම්ම චතුකකය නම් යයි එක් චතුකකයක් දතයුතුය.

මෙසේ ප්‍රතිකර්ම කොට දැන් යමෙකුගේ අනුලෝම පංචකයෙහි සකවාදියා විසින් නිග්‍රහ කරන ලදී. ඔහුගේ ඒ ඡලවාදය සතර ආකාරවාද නිසා දුෂ්කර බව දක්වන්නේ **තඤ චෙ පන මඤ්ඤාසී** යනාදිය කීය. එහි **තඤ චෙපන මඤ්ඤාසි** යනු ඉතින් ඔබ සිතන්නෙහිද. **චතතබෙබ ඛො** යන මෙය ප්‍රත්‍යනීකයාගේ ඔවි යයි යන පිළිනය සඳහා කියන ලදී. **නො ච චතතබෙබ** යන මෙය නොවේය යන අවමානය සඳහා කියන ලදී. **තෙන තව තත්‍රථා** යනු ඒ කාරණයෙන් ඔබම එහි නොලැබේය යන පක්‍ෂයෙහි හෙවං පටිජානාති එසේ යයි මෙසේ පිළිගන්නේ. හෙවං නිගහෙතබෙබ නැවත නොවේ යයි අවමාන කරන්නා මෙසේ නිග්‍රහ කළයුතුය. **අථ තං නිගහණාමාති** ඉක්බිති මෙසේ නිග්‍රහයට සුදුසු ඔහු නිග්‍රහ කරමු. **සුනිගහිතො ච හොසි** යන ස්වකීය මතයෙන් නිග්‍රහ කරන ලද බැවින් මනාව නිග්‍රහ කරන ලද්දේ වෙහි. මෙසේ ඔහුට නිග්‍රහ කරන ලද බව දක්වා දැන් ඔහුට නිග්‍රහ කරන්නේ **හඤ්චි** යනාදිය කීය. එහි තැබීම පැමිණවීම ආරෝපනය යට කියන ලද ක්‍රමයෙන් දතයුතුය. අවසානයෙහි වනාහි **ඉදං තෙ මිච්ඡා** ඔබේ මේ වචනය වැරදි වේය යන අර්ථයයි. මේ ඡලවාදයෙන් (සය ආකාර වාදයෙන්) සතරාකාරයකින් නිග්‍රහය කළ බැවින් නිග්‍රහ චතුකක නම් වේ.

මෙසේ නිග්‍රහ කොට ද දැන් මවිසින් ඔබගේ මතයෙන් කරන ලද නිග්‍රහය මැඩපැවැත්විය නොහැකිය. ඔබ විසින් මගේ අනුලෝම පංචකයෙහි කරන ලද නිග්‍රහය ද මැඩපැවැත්විය නොහැකියයි දක්වන්නේ, **එසෙ වෙ දුනනිගහිතෙ** යනාදිය කීය. එහි එසෙ වෙ දුනනිගහිතෙ ඔබගේ මේ වාදය මා විසින් මැඩපැවැත්විය නොහැක. එසේ නැතහොත් ඔබගේ මේ නිග්‍රහය මා විසින් නොමැඩලිය හැක්කක් කරන ලදී. **හෙවමෙවං තත්‍ර දකබානි** එහි ද ඔබ විසින් මගේ යට කරන ලද නිග්‍රහයෙහි මෙසේ බලන්න. දැන් යං සකවාදියා විසින් මේ නිග්‍රහය කරන ලදී. **තං චතතබෙබ ඛො** යනාදි වචනයෙන් දක්වා නැවත ඒ නිග්‍රහය අනිග්‍රහභාවයට පමුණුවන්නේ **නො ච මයං තයා** යනාදිය කීය. එහි **නො ච මයං තයා තත්‍රථ හෙතාය පටික්ඛිත්තා** යනාදියේ අර්ථය මෙසේය. මගේ ඒ නිග්‍රහය

ඔබ විසින් නොමැඩලිය හැක්ක කරන ලදී. අප එහි අනුලෝම පංචකයෙහි ඔබ විසින් එසේයයි මේ ප්‍රතිඥාවෙන් මෙසේ දැනගන්නේ නැවත නොවේ යයි ප්‍රතික්ෂෙප කළ කල්හි ද නිග්‍රහය දැනගනුවයි මෙසේ නිග්‍රහ කළ යුතුමය. මෙසේ නිග්‍රහ නොකළ යුත්තෙහි ද මා නිග්‍රහ කෙළේය. මෙබඳු නිග්‍රහයෙන් වනාහි අපි නිග්‍රහ නොකරන ලද්දෝ වෙමු. දැන් යම් නිග්‍රහයක් නිසා නොමැඩලිය හැක්කෝ වෙමු යයි කීය. එය දැක්වීමට **හඤ්චි පුග්ගලො.....ඉදං නෙ මිච්ඡා** යයි කීය. මෙසේ මෙය අනුලෝම පටිලෝම වශයෙන් සතරාකාරයෙන් පැමිණවීම් ආරෝපනයෙන් නිග්‍රහයට පමුණුවන ලද උපනය චතුක්ක නම් වේ.

දැන් **න හෙවං නිග්ගහෙතබ්බෙ** යනාදිය නිගමන චතුක්ක නම් වේ. එය **න හෙවං නිග්ගහෙතබ්බෙ** මම ඔබ විසින් නිග්‍රහ කරන ලදිමි. මෙසේ නිග්‍රහ නොකළ යුතුය. මේ නිග්‍රහයේ දුන් නිග්‍රහභාවය මා විසින් සාදන ලදී. **තෙනහි** ඒ කාරණයෙන් මේ නිග්‍රහය නරක නිග්‍රහයකි. එහෙයින් මා නිග්‍රහවීද **හඤ්චි පුග්ගලො.....ඉදඤෙත **මිච්ඡා** මේ නිග්‍රහය ඔබගේ වැරැද්ද කියන අර්ථයයි. **තෙනහි යෙ කතෙ නිග්ගහෙ** යම් කරුණකින් මෙය වැරදිද ඒ කරුණින් යමෙක ඔබ විසින් නිග්‍රහ කරන ලදී. ඒ දුෂ්කෘතයකි. මා විසින් යමකට ප්‍රතිකර්ම කරන ලදී. එයම යහපත් ක්‍රියාවකි. මෙසේ මෙය **පුග්ගලො උපලබ්භති** යනාදියේ අනුලෝම පංචකයේ නො ලැබේ යනාදියේ ප්‍රතිකර්ම, නිග්‍රහ පැමිණවීම නිගමන චතුක්ක වශයෙන් අනුලෝම ප්‍රත්‍යනීක පංචක නම් දක්වන ලදැයි දතයුතුය. මෙපමණකින් සකවාදි පූර්ව පක්‍ෂය ඇතිකල්හි පරවාදින්ට වචන සමාන බව පමණකින් ඡල වාදයෙන් ජය වේ. දැන් පරවාද පූර්ව පක්‍ෂය ඇතිකල්හි සකවාදින්ට ධර්මයෙන්ම සත්‍යයෙන් ම යහපත් ජය වේ. එසේම වාද උපත දැක්වීමට **පුග්ගලො නූපලබ්භති** යන ප්‍රත්‍යනීක අනුලෝම පංචකය ආරම්භ විය. එහි ප්‍රත්‍යනීකයෙහි විචාරීම පරවාදියාටය. රූපාදි භේදය සත්‍යාර්ථ පරමාර්ථ සඳහා පිළිණය සකවාදියාටය. සුද්ධ **සම්මුති** සත්‍යය හෝ පරමාර්ථ මිශ්‍රකය හෝ **සම්මුති සත්‍ය සඳහා යො සවචිකථෙයා** නැවත අනුයෝගය පරවාදියාටය. සම්මුති වශයෙන් නොලැබේ යයි නොකියන ලද මිශ්‍ර වශයෙන් හෝ අනුයෝගයේ සංකීර්ණ බැවින් නහෙවං යයි ප්‍රතික්ෂෙපය සකවාදියාගේය. පිළිණය ප්‍රතික්ෂිපත යයි වචන සමාන **පමණකින් ආජානාහි නිග්ගහං** යනාදි වචන පරවාදියාගේය. මෙසේ මේ පුද්ගලයා නොලැබේ යයි දෙවන වාදය නිසා දෙවන නිග්‍රහය වේයයි දතයුතුය. මෙසේ ඒ ජලයෙන් නිග්‍රහය ආරෝපනය කරන ලදී. දැන් ඒ

පිළිණයෙන් දැහැමින් සෙමෙන් තමාගේ වාදයෙහි ජය දැක්වීමට අනුලෝම නයෙහි විචාරීම සකවාදියාටය. තමාගේ ලබ්ධිය නිසා පිළිණය පරවාදියාටය. ලබ්ධියට අවකාස නොදී පරමාර්ථ වශයෙන් නැවත අනුයෝගය සකවාදියාටය. පරමාර්ථ වශයෙන් පුද්ගලයාගේ අභාවයෙන් ප්‍රතික්ෂේපය පරවාදියාටය. ඉන්පසු දැහැමින් සෙමින් තමාගේ ජය දැක්වීම සඳහා ආජානාහි පටිකම්මං යනාදි සියල්ල සකවාදියාගේම වචන වේ. යට කියන ලද නයින්ම අර්ථ දතයුතුය. මෙසේ මෙය **පුගලෝ නූපලබභති** යනාදියේ ප්‍රත්‍යනීක පංචකයේ **උපලබභති** ආදියේ ප්‍රතිකර්ම, නිග්‍රහ, පැමිණවීම, නිගමන චතුක්කයෙහි ද වශයෙන් ප්‍රත්‍යනීක අනුලෝම පංචකය නම් දක්වන ලද්දේ වේ. මෙසේ මේ පළමු සත්‍යාර්ථයේ පංචක දෙක දක්වන ලදී. එහි පෙර පංචකයෙහි පරවාදියාට සකවාදියා විසින් කරන ලද නිග්‍රහය සුනිග්‍රහය වේ. සකවාදියාට වනාහි පරවාදියා විසින් ඡලවාදය නිසා ප්‍රතිකර්ම කොට තමා විසින් සාධිත ජය දුර්ජය වේ. දුතිය පංචකයෙහි සකවාදියාට පරවාදියා විසින් කරන ලද නිග්‍රහය දුර්නිග්‍රහ වේ. පරවාදියාට වනාහි සකවාදියා විසින් ධර්මවාදය නිසා ප්‍රතිකර්ම කොට තමා විසින් සාධිත ජය සුජය වේ.

පඨම සඞ්ඛිකට්ඨය

එහි මෙය කියනු ලැබේ.

නිගහය පරවාදි - පිරිසිදු පළමු විසෙහි
අපිරිසිදු ඔහුටය - එහි වන පිළිකම් ජයේ

නිගහය සකවාදි - අපිරිසිදු දෙවන පසැ
පිරිසිදු ඔහුටමය - එහි වන පිළිකම් ජයේ

එහෙයින් දෙතැනෙහිම - ජය වේ සකවාදි හට
දහමින්ම ජයවේ - කොයින් ජය අදහමින්

දෙපසින් ලකර වූ - මෙහි සත්අරුත් යම්සේ
දම් අදම් වසයෙන් - කියැවිණි ජය පැරදුමත්

මෙයින් පසු සියළුම - සත් අරුතෙහි පඬිදනා
මෙලෙසින්ම පහදනු - දෙතැනම ජය පරාජය

මෙසේ පිරිසිදු සත්අරුත් විස්තරකොට දැන් එයම වෙනත් ඕකසාදි නයින් විස්තර කිරීමට නැවත පුගලෝ උපලබහති යනාදිය ආරම්භ කරන ලදී. එහි විචාරීම සකවාදියාටය. පිළිණය පරවාදියාටය. නැවත **සබ්බත්ථ** යන ශරීරය සඳහා අනුයෝගය සකවාදියාටය. රූපයෙහි ආත්මයන්ගේ සමනුපසසනා දෝසයද ජීවය අනිකක් ශරීරය අනිකක් යයි පැමිණෙන දෝසය ද දැක ප්‍රතික්ෂේප පරවාදියාටය. මෙහි සෙස්ස අනුලෝම ප්‍රත්‍යනීක පංචකයෙහි යට කියන ලද නයින්ම දතයුතුය. පාඨය සංක්ෂේප කරන ලදී. එය ශරීරය සඳහා **සබ්බත්ථ න උපලබහති** යයි කී කල්හි ශරීරයෙන් බැහැර ලැබේ යයි පැමිණේ. එහෙයින් ප්‍රත්‍යනීකයෙහි ප්‍රතික්ෂේපය සකවාදියාටය. පළමුව පිළිගෙන පසුව අවමන් කෙරේ යයි ජලවාද වශයෙන් ප්‍රතිකර්මය පරවාදියාටය. සෙස්ස ප්‍රකටය.

දෙවන නයෙහි **සබ්බදා** යයි පෙර පසු ජාති කාලය ද ජීවමාන හා පිරිනිවන්පෑ කාලය ද සඳහා අනුයෝගය සකවාදියාටය. **සෙවච බතතියො සො බ්‍රාහ්මණො** යනාදියේ පැමිණි දෝසයද ධරමාන පිරිනිවන්පෑමේ විසේසභව දෝසයද දැක ප්‍රතික්ෂේපය පරවාදියාටය. සෙස්ස පළමු නයෙහි කියන ලද්ද හා සමාන වේ.

තෙවන නයෙහි **සබ්බසු** යයි ඝ්කන්ධ ආයතනාදිය සඳහා අනුයෝගය සකවාදියාටය. රූපයෙහි ආත්මයයි ඇසෙහි ආත්මයයි ආදි දෝස බියෙන් ප්‍රතික්ෂේපය පරවාදියාටය. සෙස්ස එබඳුමය. මෙසේ මේ අනුලෝම ප්‍රත්‍යනීක පංචක තුනෙහි අනුලෝම වශයෙන් ම පමණක් පිළිවෙළින් බෙදා නැවත ප්‍රත්‍යනීක අනුලෝම පංචකයෙහි ප්‍රත්‍යනීක වශයෙන් පමණක් ම බෙදීමට **පුගලෝ නූපලබහති** යනාදිය ආරම්භ කරන ලදී. එහි අනුලෝම පංචකයේ පෙළ හකුළුවා පැමිණි ප්‍රත්‍යනීකයෙහි කියන ලද නයින්ම ප්‍රත්‍යනීකයෙහි පෙළ හකුළුවා පැමිණි කල්හි අනුලෝමයෙහි කියන ලද නයින්ම අර්ථය දතයුතුය. මෙපමණකින් සුදධිතයේ මෙන්ම මේවායෙහිද තුණේ සහ සහ සතරේ සත්අරුත්වල එක එකෙහි සත් අරුතෙහි අනුලෝම ප්‍රත්‍යනීකයේ ප්‍රත්‍යනීක අනුලෝමයයි ප්‍රත්‍යනීක දෙකක් දෙකක් වශයෙන් මේ අෂ්ටමුඛ තමා වාද යුක්තිය දක්වන ලද්දේ වේයයි දතයුතුය. යම් එක එක මුඛයෙහි එක එක නිග්‍රහය වශයෙන් නිග්‍රහ අටකැයි පෙළෙහි ලියනු ලැබේ.

එහි මෙය කියනු ලැබේ.

මෙසේ සිව්වේ පැනෙහි - දෙපංචකයෙහි බේදයෙන්
මෙය අවමුවය නම් - කියැවිණි වාද යුත්තිය

එහි නිගහ අටමය - දැහැමි වූ එයින් සතරකි
අදහමද සතරෙකි - සියළු තැන සකවාදිය
පරාජය මෙන් ජය - සියළු තැන පරවාදිය

සචිකට්ඨ වර්ණනා නිමි.

දැන් රූපාදිය සමග සචිකට්ඨ සංසන්දනය වේ එහි **රූපඤ්ච** රූපය පරමාර්ථ වශයෙන් ලැබේ. කිම? ඔබේ පුද්ගලයා ද එසේ ලැබේද? යන්න සඳහා විචාරීම සකවාදියාගේය. පුද්ගලයෙක් ඇතැයි වචන මාත්‍රය පමණක් ගෙන ප්‍රතිඥාව පරවාදියාගේය. ඉදින් පරමාර්ථ වශයෙන් ඔබේ පුද්ගලික ඇත්නම්, රූපයෙන් චේදනාදිය මෙන් පුද්ගලයාගේ ද වෙනසකට පැමිණේ යයි අනුයෝගය සකවාදියාගේය. ආගම සූත්‍ර විරෝධය දැක ප්‍රතික්ෂේපය පරවාදියාගේය. සෙසු අර්ථ ප්‍රකටය. මෙහි ධර්ම වශයෙන් වනාහි සත්පනස් භේදයේ සත්‍යාර්ථ පරමාර්ථ වශයෙන් සකවාදී පක්ෂ මූලයේ අනුලෝම ප්‍රත්‍යනීකයේ සත්පනස් අනුලෝම පංචක දක්වන ලදී. ප්‍රතිකර්ම චතුක්කාදිය සංක්ෂෙප කරන ලදී. පරවාදී පක්ෂ මූලයේ ද ප්‍රත්‍යනීක අනුලෝමයේ සත් පනස් පටිලෝම පංචක දක්වන ලදී. ප්‍රතිකර්ම චතුකකාදිය සංක්ෂේප කරන ලදී. එය භගවත්හු කියන ලදැයි වචන මාත්‍රයෙන් පුද්ගලයාගේ ද රූපයේ ද ඇති බව සත්‍යාර්ථ පරමාර්ථ වශයෙන් ලැබෙන බව දක්වා වෙනස් බව දැනවීම සඳහා **චුතනං භගවතා** යන අනුයෝගය පරවාදියාගේය. සම්මුති පරමාර්ථවල ඒකත්ත නානත්ත ප්‍රශ්නයේ තබන බව ප්‍රතික්ෂෙපය සකවාදියාගේය. මෙහි ද සෙස්ස අර්ථ වශයෙන් ප්‍රකටය.

සුද්ධික සංසන්දනය
නිමි.

දැන් රූපාදියම සමග උපමා වශයෙන් සචිත්තකය සංසන්දනය වේ. එහි රූප වේදනාවල ලැබූ සමාන බවෙන් වෙනස් බව විචාරීම ද පුද්ගල රූපවල ලැබූ සමාන විචාරීමදැයි විචාරීම් දෙකම සකවාදියාගේය. ප්‍රතිඥා දෙකම පරවාදියාගේය. පරවාදියා විසින් අනුදත් හෙයින් ලැබූ සමානබවෙන් රූප වේදනාවල මෙන් රූප පුද්ගලයන්ගේ චෙනස්වන බව අනුයෝගය සකවාදියාගේය. ප්‍රතික්ෂෙප අනිකාගේය. මෙහි සෙස්ස ද අරුත් විසින් ප්‍රකටය. ධර්ම වශයෙන් වනාහි රූප මූලකාදියේ චක්‍රකවල ද වශයෙන් සකවාදි පක්‍ෂයේ නව නිග්‍රහ පන්සිය විස්සක් දක්වන ලදී. කෙසේද? ස්කන්ධයන්හි රූප මූලක චකකයෙහි සතරය, එසේ වේදනාදී මූලකවල විස්සකි. ආයතනවල චකඛායතන මූලක චකකයෙහි එකොළොසකි. එසේ සෙස්සෙහි එකසිය තිස්දෙකකි. ධාතුවල චකඛුධාතු මූලක චකකයෙහි දාහතකි. එසේ සෙස්සෙහි තුන්සිය හයකි. ඉන්ද්‍රියවල චකඛු ඉන්ද්‍රිය මූලක චකකයෙහි විසිඑකකි. එසේ සෙස්සෙහි හාරසිය හැටදෙකකි. මෙසේ නවනිග්‍රහ සියල්ල පන්සිය විස්සක් වේ. පරවාදී පක්‍ෂයෙහි ද **රූපං උපලබ්භති** යන අනුලෝම වශයෙන් ම රූප වේදනාවල චෙනස්වන බව පිළිණ කරවා නැවත **අත්ථි පුග්ගලෝ** යන සූත්‍රය නිසා ඡල වසයෙන් (සය ආකාර) පුද්ගලයාගේ රූපාදියෙන් ලැබූ සමානබව ආරෝපනය කොට වෙනස් වේ යන අනුයෝගය කරන ලදී. මෙහි සෙස්සේ අර්ථ පැහැදිලිය. ධර්ම වශයෙන් සකවාදි පක්‍ෂයෙහි කියන ලද නයින් නව ප්‍රතිකර්ම පන්සිය විස්සක් දක්වන ලදී.

දැන් යමක් සත්‍යාර්ථ පරමාර්ථයෙන් ලැබේ. එයින් රූපාදියෙහි පනස් හතක් වූ සත්‍යාර්ථ පරමාර්ථවලින් එක්තරා එකකින් විය යුතුය. රූපාදිය නිශ්‍රිතව හෝ රූපාදියෙන් වෙන්ව, රූපාදීන්ගේ නිශ්‍රයෙන්, එනිසා මේ චතුක්කයෙන් සත්‍යාර්ථ සංසන්දනය ආරම්භ විය.

එහි **රූපං පුග්ගලෝ** යන අනුයෝගය සකවාදියාගේය. උවෙජද දෘෂ්ටි බියෙන් නහෙවං යන ප්‍රතික්ෂෙපය පරවාදියාගේය. නිග්‍රහ ආරෝපනය සකවාදියාගේය. කිම මේ රූපය යුතු නොවේද? වේදනාව යයි කියන ලද ප්‍රතික්ෂෙප කළයුතුම වේද? එසේය ප්‍රතික්ෂේප කළයුතුය. එය වනාහි රූපයෙන් වේදනාවේ අන්‍ය ස්වභාව ස්වභාව හෙයින් අන්‍ය තත්ව අභාවයක් නොවේ. මෙය ද රූපාදියෙහි එක් ස්වභාවයකින් පුද්ගලයාගේ අන්‍ය තත්වයක් නොකැමති වේ. එනිසා මෙය ද අනුයෝගයයි. **රූපං පුග්ගලෝ.....අඤ්ඤත්‍රාවිඤ්ඤං පුග්ගලෝ** යයි සියළු පරමාර්ථ සත්‍ය සඳහා

අරඹන ලදී. සකලං වනාහි වෙන් වූ ලක්ෂණ වශයෙන් එකකින් කියන්නට නොහැකි යයි පෙළ වශයෙන් අනුයෝග ලක්ෂණ පමණක් තබන ලදී. පඬිවරු එයින් අර්ථය විස්තර කරති. වාද කැමැත්තෙන් මේ ලක්ෂණ ගෙන පරවාදියාට ඉඩ නොලැබෙන සේ කිවයුතුය. මෙසේ පාළි වශයෙන් අනුයෝග ලක්ෂණයේ තබන ලද්ද ද යුතුමය. මෙම නයින් සියළු අනුයෝගවල අර්ථය දතයුතුය. මෙය වනාහි විශේෂයකි. **රූපසමිං** පුග්ගලෝ යනාදියෙහි එක් මහභූත තත්වයක් නිසා මහභූත තුන වස්තුරූපය නිසා විඤ්ඤාණය රූපයෙහි යයි කීමට වටී. මෙසේ රූපයෙහි ඔබගේ පුද්ගලයා කිම? යම්සේ සහාග වෙන්වීමෙන් වේදනාදි සියළු ධර්ම අරූප හෝ ස්කන්ධ සතර නිවනම හෝ රූපයෙන් අන්තැනක යයි කීමට වටී. මෙසේ ඔබගේ පුද්ගලයා කිම? සියළු අනුයෝගිවල වනාහි උච්ඡේද දෘෂ්ටි බියෙන් ද ආගම විරෝධයෙන් ද ප්‍රතික්ෂේපය පරවාදියාගේය. මෙහි සෙස්සෙහි අර්ථය ප්‍රකටය. මෙහි ධර්ම වශයෙන් වනාහි සත්පනස් සත්‍යාර්ථවල එක එකේ හතර හතර කොට නිග්‍රහ වශයෙන් එක්දහස් විසිඅටක් දක්වන ලදී. ප්‍රතිකර්ම වශයෙන් එපමණකම් වේ. මෙහි **අත්ථි පුග්ගලෝ** යයි කීකල්හි සකවාදියාට ප්‍රතිඥාව වේ. එය සම්මුති වශයෙන් සූත්‍රයෙහි ආවේය. යමෙක් **රූපං පුග්ගලෝ** යනාදියෙහි ප්‍රතික්ෂේපය. හේ සකකාය දෘෂ්ටි ප්‍රශ්නයේ තබන ලද බැවිනි. ප්‍රතිකර්මය පරවාදියාට ඡල වශයෙන් හෝ වේ. චතුකක නය සංසන්දන යයි.

සංසන්දන කථා නිමි.

දැන් ලක්ෂණ යුක්ති නම් වේ. එහි නිවන හැර සෙස්ස සත්‍යාර්ථ පරමාර්ථය ප්‍රත්‍යය ප්‍රතිබද්ධ බැවින් ප්‍රත්‍ය සහිත වේ. ප්‍රත්‍යවලින් කළ බැවින් සංඛත වේ. ඉපදී නිරුද්ධ වන හෙයින් සදා අභාවයෙන් අශාස්වතය. උත්පත්ති කාරණ සංඛ්‍යාත නිමිත්ත ඇති බැවින් නිමිති සහිත වේ. නිවන කියන ලද ආකාර අභාව හෙයින් අප්‍රත්‍ය වේ. අසංඛත වේ. ශාස්වතය, අනිමිත්ත යන මෙය සවචිකථායේ ලක්ෂණය. එනිසා පුද්ගලයාද සවචකථාපරමත්ථ වේ. ඔහුගේ ද මේ ලක්ෂණ විය යුතු යයි සඳහා **පුග්ගලෝ සපපවචයෝ** යනාදි අනුයෝග අට ද සකවාදියාගේය. ප්‍රතික්ෂේපය පරවාදියාගේය. **ආඥානාහි නිගහං** යනාදිය වනාහි මෙහි සංක්ෂේප කරන ලදී. මෙසේ සකවාදී පක්ෂයෙහි අනුලෝම ප්‍රත්‍යනීකයෙහි අනුලෝමමාත්‍ර වශයෙන් මේ පංචක අට දතයුතුය. පරවාදී පක්ෂයෙහි ද

ප්‍රත්‍යනීක අනුලෝමයෙහි ප්‍රත්‍යනීක මාත්‍ර වශයෙන් අටමය. එහි පරවාදියා විසින් සූත්‍ර වශයෙන් සම්මුති සත්‍ය සාධන ලදී. සම්මුතියෙහි ද ප්‍රත්‍ය සහිත බවක් නැත. එහෙයින් යථාර්ථ වශයෙන් ප්‍රතික්ෂේපය සකවාදියාටය. ඡල වශයෙන් කිවයුතු ආඥානාහි පටිකම්ම ආදි සියල්ල මෙහි ද සංක්ෂේපමය.

ලක්ඛණ යුක්ති කථා නිමි.

දැන් වචන ශෝධනය වේ. එහි මෙය **පුග්ගලෝ උපලබ්භති** යන වචනය ශෝධනයට **පුග්ගලෝ උපලබ්භති උපලබ්භති පුග්ගලෝ** යනු විචාරීම සකවාදියාටය. එහි අර්ථය මේ 'පුග්ගලෝ' 'උපලබ්භති' යන පද දෙක ඒකාර්ථ වන්නේ ද? නානාර්ථ වන්නේද? ඉදින් නානාර්ථය රූපය අනිකක්, වේදනාව අනිකක් සේ මෙසේ පුද්ගලයා අනිකෙක් ලැබෙයි. අනිකක් බවට පැමිණේ. ඒකාර්ථ නම් යම්සේ සිත යමක් ද එය මනසයි. මෙසේ පුද්ගලයා ඔහුමය. හේ ලැබේ යයි පැමිණේ. එහෙයින් එය කියමි. ඉදින් ඔබගේ යම් පුද්ගලයෙක් හේ ලැබෙයි. මෙසේ ඇතිකල්හි යමෙක් යමක්නු ලබයි. ඒ හේ පුද්ගලයයි පැමිණේ. මෙය පිළිගන්නෙහි ද? එයින් පුද්ගලවාදියා යම්හෙයකින් පුද්ගලයාගේ ලැබීම කැමති වෙයි. රූපාදියේ පුද්ගලභාවය නොලබන්නේද, එහෙයින් **පුග්ගලෝ උපලබ්භති උපලබ්භති කෙහිචි පුග්ගලෝ කෙහිචි න පුග්ගලෝ** යනාදිය කීය. එහි අර්ථය මගේ පුද්ගලයා ඇත. ශාස්තෘ වචනයෙන් ලැබේ. යමෙක් ලැබේද, ඒ සියල්ල පුද්ගලයා නොවේ. කිසිවෙක් පුද්ගල වේ. කිසිවෙක් පුද්ගල නොවේ. 'කෙහි චි' යන්නේ, 'කෝ' කර අර්ථයෙහි 'කෙ' කාරය විය. 'හි' කාරය නිපාත මාත්‍රයකි. කිසිවෙක් පුද්ගල වේ. කිසිවෙක් පුද්ගල නොවේ යන මෙය මෙහි අර්ථය වේ. මෙය කියන ලදී. පුද්ගල යයි රූපාදියෙහි ද යම්කිසි ධර්මයක් ලැබෙමය. එහි පුද්ගලයාම පුද්ගල වේ. රූපාදියෙහි වනාහි කිසිවකුදු පුද්ගල නොවේ. ඉන්පසු සකවාදියා කීය. **පුග්ගලෝ කෙහිචි උපලබ්භති කෙහිචි න උපලබ්භති** එහි අර්ථය 'පුග්ගලෝ' 'උපලබ්භති' යන පද දෙකේ අර්ථයෙන් ඉදින් එකක් බව ලැබේ යයි පිළිගත් ධර්මය පුද්ගලයාගේ අනිකක් නොවූ ද කිසිවෙක් පුද්ගල වේ. කිසිවෙක් පුද්ගල නොවේ. කිසි පුද්ගලයෙක් ලැබේ. කිසි පුද්ගලයෙක් නොලැබේ යයි පැමිණේ. මෙය පිළිගන්නෙහිද? ඒ පුද්ගලයාගේ නොලැබීම අකමැති වන්නේ නහෙවං යයි ප්‍රතික්ෂේප කරයි. මෙයින් පසු ආඥානාහි

නිගගහං යනාදි සියල්ල සංක්ෂේප කරන ලදී. විස්තර වශයෙන් දතයුතුය. පුගගලෝ සච්චිකටෙයා යනාදියෙහි ද මෙම නයම වේ. මේ සියල්ල 'ලැබේ' සමාන වචනම වේ.

තවද පුගගලෝ **උපලබහති සච්චිකට්ඨ පරමත්ථෙන** යන්න පුද්ගල වාදීන්ගේ පිළිගැනීමය. එහෙයින් යථාර්ථ වශයෙන් පුද්ගලයා ලැබේය යන ලබ්ධියයි. මෙසේ පුද්ගලයා සත්‍යාර්ථ වශයෙන් ද පැමිණේ. පුද්ගලයා ඇත යන යම් විශ්වාසයක් වේද එය විද්‍යමාන වේ. සමාන වචන වේ. එනිසා මේ සියළු වචන සංශෝධිතය. එහි අවසානයෙහි **පුගගලෝ අත්ථි, න සබබා පුගගලෝ** යනාදිය කියන ලදී. එහි අදහස මෙසේය. මෙය පරවාදියා විසින්, **පුගගලෝ අත්ථි අත්ථි කෙහිචි පුගගලෝ කෙහිචි න** පුගගලෝ කියන ලදී. එහි අර්ථ වශයෙන් පුද්ගලයා ඇත. සියල්ල නැත. පුද්ගලයා යයි මෙපමණක් වේ. එහෙයින් එය සකවාදියා ලවා පිළිගන්වා ගෙන දැන් ඔහු මෙසේ අනුයෝගය යෙදේ. තමාට හිතවත් වූ ඔබගේ පුද්ගලයා ඇතැයි වචන මාත්‍රය නිසා පුද්ගලයා ඇතැයි ලබ්ධිය ගන්නා ලදී. බුදුන්වහන්සේ මෙසේ කියන ලදී. මෝඝරාජය, 'ලෝකය ශූන්‍ය වශයෙන් බලන්න', හැමදා සිහියෙන්, යනාදි නයින් නැතැයි ද කියන ලදී. එසේ පුද්ගලයා නැත. සියළු පුද්ගලයා නැතැයි පැමිණෙයි. කිම මෙය පිළිගන්නෙහිද? ඉක්බිති ඔහු නොපිළිගන්නේ **නහෙවං** යයි ප්‍රතික්ෂේප කරයි. මෙහි සෙස්ස නිග්‍රහාදි විධානය කියූ නයින් දතයුතුය.

වචන සොධනය නිමි.

දැන් පඤ්ඤත්තානුයෝග නම් වේ. පුද්ගලවාදියා රූපධාතුවෙන් රූපී පුද්ගලයා පණවයි. එසේම අරූප ධාතුවෙන් අරූපී පුද්ගලයා පණවයි. ඔහුගේ ඒ ලබ්ධිය බිඳීමට සියළු විචාරීම් සකවාදියාටය. ප්‍රතිඥාව සහ ප්‍රතික්ෂේපය අනිත් තැනැත්තාටය. හේ රූපී යයි කිකල්හි රූපකාය ස්වභාවයෙන් ද එසේම රූපයෙන් ද පැණවීමෙන් ඇති බව දනී. කාමී යයි කිකල්හි වීතරාග ස්වභාවයෙන් ද එසේම රූපයෙන් ද පැණවීමෙන් නැති බව ප්‍රතික්ෂේප කරයි. අරූපී යයි කී කල්හිද අරූප ස්කන්ධ ස්වභාවයෙන් ද අරූපයෙන් ද පැණවීමෙන් ඇති බව දැනගනී. නය දෙකෙහිම **සතෙතා** යයි පුද්ගලයාගේ පර්යාය වචන වශයෙන් කියන

ලදී. දැන් හේ 'කායෙ කායානුපසසී' යයි පැමිණි තැන කය අනිකකි. පුද්ගලයා අනිකෙකැයි කැමති වේ. ඒ නිසා ඒ ලබ්ධිය බිඳීමට **කායොති වා සරීරමාති වා** යනාදිය සකවාදී විචාරීමය. එහි **කායං අපපියං කරිත්වා** යයි කය පැමිණවිය යුතුය. ඇලිය යුතුය. ඒකීයභාවයට පැමිණවිය යුතුය. නොබෙදිය යුතු කොට විචාරම් යන අර්ථයයි. **එසෙ සෙ** මේ ඔහුමය. එසෙ එසෙතිපි යනු ද පාඨය. මේ ගේමය යන අර්ථයයි. **එකථෙය** යනු එක් අර්ථය. **සමෙ සමහාගෙ තජජාතෙ** යයි සම වූ සම භාගයෙහි, ඒ ජාතියේ. මෙහි භේදය වචන මාත්‍රයෙන් පමණි. අර්ථයෙන් වනාහි මෙතෙම කයම විචාරයි. පරවාදියා නානත්වයට අප්‍රසන්න වන්නේ **ආමනන්‍ති** යයි පිළිගනී. **පුගගලොති වා ජීවොති වා** යයි විචාරීමෙන් ද මෙම නයමයි. **අඤ්ඤෙසු කායෙ** විචාරන ලද්ද වනාහි කායානුපස්සනාවෙන් මෙසේ ලබ්ධිකයයි පිළිගනී. **අඤ්ඤං ජීවං** විචාරණ ලද්ද වනාහි ගැටි කියන ලද සූත්‍රය ප්‍රතික්ෂේප කිරීමට නොහැකිවන්නේ අවමන් කරයි. ඉන්පසු **ආජානාති නිගගහං** යනාදිය අර්ථය පැහැදිලිය. සකවාදියා තැබිය යුතු ප්‍රශ්න බැවින් ප්‍රතික්ෂෙප කරයි. පරවාදියා ඡල වශයෙන් ප්‍රතිකර්ම කරයි. එය ද අරුත් පැහැදිලිය.

පඤ්ඤත්තානු යෝගය නිමි.

දැන් ගති වෙනස්වීම් මුඛයෙන් චුතිපටිසන්ධි අනුයෝගය වේ. එහි **පුද්ගලවාදියා සන්තකඛන්ධෙ පරමං සඤ්ඤාවිත්‍වාන පුගගලො** යනාදිය සූත්‍ර නිසා පුද්ගලයා සැරිසරන්නේය යන ලබ්ධිය ගෙන ව්‍යවහාර කරයි. ඔහුගේ ඒ ලබ්ධිය බිඳීමට **සඤ්ඤාවති** යන විචාරීම සකවාදියාගේය. එහි **සඤ්ඤාවති** යනු සැරිසරයි. ගමනාගමනය කරයි. තමාගේ ලබ්ධි වශයෙන් ප්‍රතිඥාව පරවාදියාගේය. **සො පුගගලො** යනාදි අනුයෝගය සකවාදියාගේය. ප්‍රතික්ෂේපය අනිත් තැනැත්තාගේය. එහි **සො** යනු ඔහුමය. මෙසේ අනුයුක්ත වූයේ ශාස්වත දෘෂ්ටි බියෙන් ප්‍රතික්ෂේප කරයි. **අඤ්ඤෙසු** යයි විචාරණ ලද්දේ උචෙඡද දෘෂ්ටි බියෙනි. **සො ච අඤ්ඤෙසු ච** යයි විචාරණ ලද්දේ අමරා විකෙඛපවාදී දෘෂ්ටි බියෙනි. නැවත ප්‍රශ්න සතරම එකතුකර විචාරණ ලද්දේ දෘෂ්ටි සතරටම බියෙන් ප්‍රතික්ෂේප කොට නැවත යම් සූත්‍ර නිසා ලබ්ධිය ඇතිවිය. ඒවා දක්වන්නේ **තෙනහි පුගගලො සඤ්ඤාවති** යනාදිය කිය. නැවත සකවාදියා විසින්, ඔබේ ලබ්ධිය අනුව මෙලොව පරලොව දෙකේම සැරිසරන්නේ එක්කෙනෙක්ම යන

අදහසින් **සෙවව** යයි නියමකොට විචාරණ ලද්දේ ශාස්වත බියෙන් ප්‍රතික්ෂේප කොට නැවත දැඩිකොට එයම විචාරන ලද්දේ, යම්හෙයකින් ඒ පුද්ගලයාමය. අනිකෙක් නොවේ. හේ එයින් චුතව මෙහි උපන්නේය යයි ආදි සූත්‍රවල ඇත. එනිසා පිළිගන්න. **සෙවව මනුසෙසා** යයි විචාරණ ලද්දේ මනුෂ්‍යාත්මයයි. දෙවිබව අභාවයෙන් ප්‍රතික්ෂේප කරයි. නැවත විචාරණ ලද්දේ 'මම ඒ කාලයෙහි සුනේත්‍ර නම් ශාස්තෘ වීය'යි ආදි සූත්‍ර වශයෙන් පිළිගන්න. ඉක්බිති ඔහුට සකවාදියා දෙවිමිනිසුන්ගේ උත්පත්තිවල නානාභාවයෙන් ඔබේ වචනය මිථ්‍යාවකැයි පවසන්නේ මනුසෙසා හුත්වා යනාදිය කිය. එහි **හෙතං මරණං න හෙහීති** යයි මෙසේ ඇතිකල්හි මරණය නොවන්නේය යන අර්ථය වේ. මෙයින් පසු **යකෙඛා** පෙතෝ යයි ආත්මභාව නානා වශයෙන් අනුයෝග නානා බව දතයුතුය.

ඛත්තියෝ යනාදිය ජාති වශයෙන් මෙන්ම අංග විකලනාදි වශයෙන්ද කියන ලදී. නැවත **න චතතබබං** යයි පරවාදියා විසින් විචාරණ ලද්දේ මේ අර්ථයේ උත්පත්ති වශයෙන් පරලොව ගමන අභාවයෙන් ප්‍රතිඥාව සකවාදියාගේය. නැවත සෝතාපන්නයාගේ භවනතරයෙහි ද සෝවාන්බව අත්නොහැරීමෙන් දෙවන ප්‍රතිඥාව ද ඔහුගේය. **හඤ්ඤි** යනාදි වචනය පරවාදියාගේය. නැවත දෙව්ලොව උපන්නාගේ මනුෂ්‍යාත්ම භාවය දැක්වීමෙන් අනුයෝගය සකවාදියාගේය. ඉන්පසු **අනඤ්ඤා අවිගතො** යන මෙහි **අනඤ්ඤා** යනු සියළු ආකාරයෙන් එක සමානය. **අවිගතො** යනු එක් අයුරකින් ද නොගිය යන අර්ථය වේ. **නහෙවං** දෙව්ලොව උපන්නහුගේ මිනිස්බව අභාවයෙන් මෙසේ කීය. නැවත දැඩිකොට අනුයුක්ත වූයේ ඒ පුද්ගලයා සැරිසරතියි ලබ්ධියා පිළිගනී. **හත්ථවඤ්ඤෙනා** ආදි ආකාර වෙනස්වීම දැක්වීමෙන් නොගියහු සැරිසරතියි ලබ්ධිය බිඳීම සඳහා කියන ලදී. එහි **අලත්ථඤ්ඤෙනා** යනු යමෙකුගේ කකුලේ මාපට ඇඟිල්ල සිඳුනේය. **කණ්ඩරවඤ්ඤෙනා** යනු යමෙකුගේ මහ නහර සිඳුනේය. **සරූපෝ** යනාදියෙහි පළමුවන ප්‍රශ්නයෙහි මේ රූපකාය සමග පැමිණීම ප්‍රතික්ෂේප කරයි. දෙවන ප්‍රශ්නයෙහි මේ රූපකාය සමග පැමිණීම ප්‍රතික්ෂේප කරයි. දෙවන ප්‍රශ්නයෙහි අන්තරාභව පුද්ගලයා සඳහා පිළිගනී. හේ ඒ ලබ්ධියෙන් සමානව ගොස් මව්කුසට පිවිසෙයි. ඉක්බිති ඔහුගේ ඒ රූප බිඳෙයි. **තං ජීවං** යනු යම් රූප සංඛ්‍යාත ශරීරය සමග යයි. **කිම** ඔහුගේ ඒ ජීවයම ඒ ශරීරයම දැයි විචාරයි. මෙහි පරවාදියා ශරීරය බැහැර කොට සූත්‍ර විරෝධය ද ප්‍රතික්ෂේප කරයි. **සවෙදනා** යනාදියෙහි අසංඥ

උත්පත්තිය සඳහා ප්‍රතික්ෂෙප කරයි. ඊට වෙනස් උත්පත්ති සඳහා පිළිගනී. **තං ජීවං** යම් වේදනා සංඛ්‍යාත ශරීරය සමග යයි. කිම ඔහුගේ ඒ ජීවය ඒ ශරීරයමදැයි විචාරයි. **තං ජීවං තං සරීරං අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං** මෙය පෙළේ පංචස්කන්ධය ශරීරයයි අදහස් කරයි. පරවාදියා සූත්‍ර විරෝධය ප්‍රතික්ෂේප කරයි. **අරූපො** යනාදියෙහි පළමුවන ප්‍රශ්නයෙහි අන්තරාභවය සඳහා ප්‍රතික්ෂේප කරයි. දෙවැන්නෙහි ආරූප්පය ආරූප්පයේ ඉපදීම සඳහා පිළිගනී. **අඤ්ඤං ජීවං** යම් රූප සංඛ්‍යාත ශරීරය හැර අරූපයා සැරිසරයි. කිම ඔබගේ ඒ ශරීරය අනිකක් ද, ජීවය අනිකක් ද? විචාරයි. අනිකා සූත්‍ර විරෝධය ප්‍රතික්ෂේප කරයි. **අවෙදනා** යනාදියෙහි සංඥීභාවය සඳහා ප්‍රතික්ෂෙප කරයි. වෙනත් උත්පත්ති සඳහා පිළිගනී. **අඤ්ඤං ජීවං** යම් වේදනා සංඛ්‍යාත ශරීරය හැර වේදනා රහිත අවිඤ්ඤාණය සැරිසරයි. කිම ඔබගේ ඒ ශරීරය අනිකක්ද, ජීවය අනිකක්ද? විචාරයි. අනඤ්ඤා සූත්‍ර විරෝධය ප්‍රතික්ෂේප කරයි. **රූපං සඤ්ඤාවනි** යනාදියෙහි යම් රූපාදිය ස්කන්ධ අල්ලාගෙන රූපය පෙන්වයි. කිම ඔබගේ ඒ පුද්ගලයා සැරිසරන කල්හි ඒ රූපය ද සැරිසරයිද? විචාරයි. පරවාදියා 'සත්ත්වයින්ගේ අවිද්‍යා නීවරණයන්ගේ තෘෂ්ණා සංයෝජනයන්ගේ සැරිසැරීම' යයි සත්ත්වයාගේ සැරිසරන වචනයෙන් ප්‍රතික්ෂේප කරයි. නැවත විචාරණ ලද්දේ රූපාදි ධර්මය හැර පුද්ගලයා නැත. එහෙයින් ඒ සැරිසැරීමේ ඒ රූපයෙන් සැරිසැරියයුතු යයි සංඥාවෙන් දැනගනී. වේදනාදියෙහි ද මෙම නයම වේ.

රූපං න සඤ්ඤාවනි යනාදියෙහි ඔබගේ රූපය පුද්ගලයා නොවේ. ඔහුම සැරිසරයි කියයි. එහෙයින් එය විචාරමි. කිම ඔබගේ රූපය සැරිසරන්නේ නැද්ද? යන අර්ථයයි. අනඤ්ඤා සැරිසරන පුද්ගලයා විසින් ඔහුගේ උපාදාය වූ රූපයෙන් සැරිසැරීමට නොහැකි වේ යයි සංඥාවෙන් ප්‍රතික්ෂේප කරයි. නැවත විචාරණ ලද්දේ සත්ත්වයින්ගේ ම සැරිසරවන වචනයෙන් පිළිගන්න. මෙම සෙස්ස පැහැදිලිය. ගාථාවන්ගේ වනාහි මේ අර්ථයයි. ආයුෂ්මතුන්ගේ මතයෙන් වෘක්ෂය අල්ලාගත් ඡායාව මෙන් ඉන්ධ නය අල්ලාගත් ගින්න මෙන් ද ස්කන්ධ අල්ලාගත් පුද්ගලයා රූපාදියේ සැරිසැරීම් නැතිකල්හි ඒ **ඛන්ධෙසු සඡ්ජමානෙසු සො** ඔබගේ **පුග්ගලො භිජ්ජති** වෙ මෙසේ ඇතිකල්හි උවෙඡදා භවති දිට්ඨි ඔබ උවෙඡද දෘෂ්ටියට පැමිණේ. කෙසේද? **යා බුද්ධන විවජ්ජනා** යමක් වනාහි අකුසල දෘෂ්ටිය ද 'ශ්‍රමණ භවත් ගෞතමයා උවෙඡදවාදී' යයි පරියාය භාසිතය. එය නොකියමියි දක්වයි. **ඉක්බිති ඒ ඛන්ධෙසු භිජ්ජමානෙසු පුග්ගලො න භිජ්ජති** මෙසේ ඇතිකල්හි **සසසතො පුග්ගලො හොති**

ශාස්වත පුද්ගලයෙක් වේ. එයින් හේ නිවීමෙන් **නිබ්බානේන සමසමෝ** සමානව පැමිණේ. **සමසමෝ** යනු අතිශයින් සමානය. සමානවීමෙන් සමානය. සමභාවයෙන් සමානය. යම්සේම නිවන නූපදිනම් නොබිඳේ. මෙසේ ඔබගේ පුද්ගලයා ද එයින් සමාන වේ.

ගතිපරිවත්ත මුඛෙන චුතිපටිසන්ධානු යෝගය නිමි.

දැන් උපාදා පඤ්ඤත්තානුයෝගය වේ. එහි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥා ප්‍රතික්ෂේපය පරවාදියාටය. එය වනාහි ගස් අල්වාගෙන ඡායාව මෙන් ඉන්ධන අල්වාගෙන ගින්න මෙන් රූපාදිය අල්වාගෙන පුද්ගලයාගේ පැණවීම, පැණවීම අවබෝධය කැමති වේ. එහෙයින් රූපය අල්වාගෙන යයි විචාරන ලද්දේ පිළිගනී. නැවත යම්සේ ගස් අල්ලාගෙන ඡායාව ගස මෙන් ඉන්ධන අල්වාගෙන ගින්න ඉන්ධන මෙන් වෙනස්වන ධර්මය. මෙසේ ඔබගේ රූපය අල්වාගත් පුද්ගලයා රූපාදිය මෙන් වෙනස් වේ යයි මේ අර්ථය විචාරණ ලද්දේ තමාගේ ලබ්ධියෙහි සිට ප්‍රතික්ෂේප කරයි. **නීලං රූපං උපාදාය** නීලෝ යනාදියෙහි නීලරූපය සමග පුද්ගලයාගේ එකම ශරීරයෙහි නීලාදියේ බහුල වශයෙන් බහුභාවයද අකමැත්තේ ප්‍රතික්ෂේප කරයි. **කුසලං වෙදනං** යන මෙහි ද වේදනාව සමග එකට එකම සන්තානයෙහි බොහෝ කුසල වේදනා වශයෙන් බොහෝ බව අකැමැත්තේ ප්‍රතික්ෂේප කරයි. දෙවන නයෙහි 'මාර්ග කුසල' යයි ආදි වචන ස්වභාවයෙන් ඒක අර්ථය සඳහා පිළිගනී. **සඵලෝ** යනාදිය විචාරණ ලද්දේ එබඳු ව්‍යවහාරයක අභාවයෙන් ප්‍රතික්ෂේප කරයි. අකුසල පක්ෂයෙහි ඒකාර්ථ නොවීම සඳහා පිළිගනී. අව්‍යාකෘත පක්ෂයෙහි ශාස්වතාදි වශයෙන් අව්‍යාකෘතභාවය සඳහා පිළිගනී. මෙහි සෙස්ස යට කියන ලද නයින්ම දතයුතුය. **චක්ඛුං උපාදාය** යනාදියෙහි 'නුවණැත්තා' විසම වූ පව දුරුකරන්නේය යනාදි ව්‍යවහාර ස්වභාවයෙන් පිළිගනී. චක්ඛුමාත්‍ර නිරෝධයෙන් පුද්ගල නිරෝධය අකැමැත්තේ ප්‍රතික්ෂේප කරයි. **රූපං උපාදාය වෙදනං උපාදාය** මෙහි වෙනම රූප මූලකයක් දුක තික චතුක්ක දතයුතුය. යම් හෙයකින් ස්කන්ධයෙහි එල්බගත් පුද්ගලයාගේ පැණවීම වේද, එහෙයින් දෙකක් ද තුනක් ද සතරක් ද පහක් ද උපාදාය පැණවීම් පිළිගනියි. එක සිතෙහි දෙකක් පහක් හෝ අභාවයෙන් ප්‍රතික්ෂේප කරයි. ආයතනාදියෙහි ද මෙම නයයි.

දැන් යමෙකුට යමක් දැඩිසේ ගෙවන පණවන ලදද, එහි අනිත්‍යයෙන් එහි ද අනිත්‍යතාව එයින් වෙනස්ව සිද්ධය. මෙසේ ඔහුගේ පුද්ගලයාට ද පැමිණේ යයි දැක්වීමට **යථා රූකඛං** යනාදිය කීය. එහි **උපාදාය** යනු නිසා පැමිණ. පෙළ නැතිව අර්ථ නැත. පරවාදියා වනාහි එබඳු අනිත්‍ය ලබ්ධියේ සිට ප්‍රතික්ෂේප කරයි. **නිගළ්හො** හැකිලි බැඳුම්, **නෙගළිකො** ඒ බැඳුමෙන් බැඳුණ අය. **යසස රූපං සො රූපවා** යමකින් රූපවේ යන අර්ථයයි. **චිකෙන චිතෙතති** ආදියෙහි රාග සහිත සිත් වශයෙන් රාගාදිය සඳහා චිත්තානුපස්සනා වශයෙන් දැනගනී. **ඣායති** යනාදි නයෙන් විචාරණ ලද්දේ පුද්ගලයාගේ ක්ෂණිකභාවය අකමැත්තේ ප්‍රතික්ෂේප කරයි. **සො නි වා අක්ඛේඛාති වා** ශාස්වතවාදි බියෙන් ප්‍රතික්ෂේප කරයි. නැවත **න වත්තබ්බං කුමාරකොති වා කුමාරිකාති වා** විචාරණ ලද්දේ ලෝක ව්‍යවහාරය බිඳෙන බියෙන් වත්තබ්බං යයි දැනගනී. මෙහි සෙස්ස ප්‍රකටය.

දැන් පරවාදියා අන්‍ය ආකාරයකින් ලබ්ධිය පිහිටුවීමට කැමැත්තේ **න වත්තබ්බං පුග්ගලො උපලබ්භති** යනාදිය කීය. එහි **න වත්තබ්බං** ඔබගේ මෙයින් කිම? මෙසේ බොහෝ සෙයින් දැඩිසේ ගෙන පැණවීම් අනයෝගයෙන් මෙය පළමුව කියන්න. කිවයුතු පුද්ගලයා සත්‍යාර්ථ පරමාර්ථයෙන් නොලැබේද? එයින් සකවාදියා විසින් **ආමනතා** යයි කියන ලද කල්හි **නනු යො පසසති** යනාදිය කීය. එහි **යො** පුද්ගලයා. **යං රූපය.** **යෙන** ඇසින්. **සො** පුද්ගලයා. **තං රූපය.** **තෙන** ඇසින් මෙය කියන ලදී. යමෙක් යම් රූපයක් යම් ඇසකින් නොබලාද? හේ ඒ රූපය ඒ ඇසින් බලන්නේ පුද්ගලයාද? සකවාදියා වකබු විඤ්ඤාණයට කිසිවක් නිශ්‍රයභාවයට යන්නේ ඇසම රූප දකියි. එසේම කනම සද්ද අසයි.... විඤ්ඤාණය ම ධර්ම දනියි. 'රහතන් වහන්සේගේ ඇස ඇත. රහතන් වහන්සේ ඇසින් රූප බලති' ආදිය සම්මුති වශයෙන් **ආමනතා** යයි දැනගනී. එයින් ඡලවාදය නිසා පරවාදියා විසින් පුද්ගලයාගේ කිවයුතු බව සාධනය කිරීමට එම වාදයම පෙරළා **පුග්ගලො උපලබ්භති** යනාදිය කීය. එහි **යො න පසසති** අන්ධයාය. අසංඥ සත්ත්වයා, අරූප තලයෙහි උපන්නා, නිරෝධයට පත්වන්නා, අන්ධ නොවූයේ ද වෙනතැනක දැකීම් කාලයෙහි නොපෙනේ නම් වේ. සෙසු වාරවලද මෙම නයම වේ. සෙස්ස පෙළ වශයෙන් අරුත් දතයුතුය. මෙය සූත්‍ර සංසන්දනයයි. දිවැස් රූප ගෝචර බැවින් **රූපං පසසති** යයි කීය. දෙවන වාරයෙහි 'සතුන් දකිමි' වචනයෙන් **පුග්ගලං පසසති** යයි කීය. තුන්වන වාරයෙහි රූපය දැක

පුද්ගලයා විස්තර කරයි යන ලබ්ධියෙන් **උභො පසන්ති** යයි කීය. යමකින් දැකිය යුතු නම්, දකින ලද අසන ලද ස්පර්ශ කරන ලද දැනගන්නා ලද සතරාකාර රූප සංග්‍රහයෙහි රූපායතනයම සංග්‍රහ කරන ලදී. එහෙයින් සකවාදියා රූපය පුද්ගලයා, පුද්ගලයා රූපයයි දෙකම රූපයයි අනුයෝග කරයි. එහි අර්ථය ප්‍රකටය.

උපාදා පඤ්ඤත්තානු යෝගය නිමි.

දැන් පුරිසකාර අනුයෝගය වේ. ක්‍රියාව ඇතිකල්හි එහි කාරකයාද විය යුතුයයි යන ලබ්ධියෙන් විචාරීම පරවාදියාටය. එබඳු ක්‍රියා ඇති බැවින් ප්‍රතිඥාව සකවාදියාටය. නැවත **කතතා කාරෙතා** යයි විචාරීම පරවාදියාටය. එහි **කතතා** යනු ඒ කර්මවල කරන්නාය. **කාරෙතා** යනු ආණත්‍යාදි දේශනා ආදි උපායෙන් කරවන්නාය.

දැන් පරවාදියා පුද්ගලයා සඳහා කරන්නා යයි කතතා විචාරයි. කිරීම් මාත්‍රය නොවේ. එනිසා ප්‍රතික්ෂේපය සකවාදියාටය. **තසස කතතා කාරෙතා** යයි මෙහි ඉදින් යමක් ලබයි. එහි කරන්නා-පුද්ගලයා ඔහු ලබයි. කිම ඒ කරන්නා ද කරවන්නා ද අන්‍ය වූ පුද්ගලයා ලබයි යන අර්ථය වේ. පරවාදියා එසේ අකැමැත්තේ ඊශ්වර නිර්මාණවාද බියෙන් ප්‍රතික්ෂේප කරයි. නැවත විචාරණ ලද්දේ, මව්පියෝ පුද්ගලයා බිහිකරති. නමක් තබති. කළණමිත් ආචාර්යවරයා හෝ ඒ ඒ විද්‍යාස්ථාන ශිල්පායතන ශික්ෂා කරවයි. ඒ කරවන්නෝ නමැයි මේ අර්ථය සඳහා දැනගන්න. පෙර ක්‍රියාව මෙන්ම එහි කරන්නා ද කරවන්නා ද අදහස් වේ. **තසස තසෙසවා** යන මෙයින් මෙය විචාරයි. ඉදින් කර්මඵල කරන්නා කර්තෘ වේ. ඔහුගේද කර්තෘ, ඔහුගේ ද කර්තෘ ඇත්තේමය. මෙසේ ඇතිකල්හි මුලින් මුලින් දේ පසු පසුව පුද්ගලයා කළයුතු වේ. මෙයින් ද ඒ කර්මඵල කරන පුද්ගලයා විසින් ඉදිරියේදී වෙනත් පුද්ගලයෙක් කළයුතු වේ. එයින් ද අනිකෙක් දුක් කෙළවර කිරීමට නැත. සසර බිඳීමට නැත. අප්‍රත්‍ය පරිනිර්වාණයට නැත. ප්‍රත්‍යය අභාවයෙන් ප්‍රත්‍යය ප්‍රතිබද්ධ වූ දුකෙහි අභාවයෙන් යම් නිවනක් කියන ලදී. **තසස තසෙසව** ඉදින් ක්‍රියාව ක්‍රියාමාත්‍රයක් නොවේ. එහි කරන පුද්ගලයෙක්, ඔහු ද කරන්නෙක් යයි

මෙසේ පුද්ගල පරම්පරාවක් ඇත. මෙසේ ඇතිකල්හි යම් ඒමේ කර්ම වෘත්තයට නොපවතින කරණයෙන් දුකෙහි කෙළවර කිරීම කියන ලද්දේද එය නැතැයි යන අර්ථය වේ. පරවාදියා එය නොකැමැත්තේ ප්‍රතික්ෂේප කරයි. මෙයින් පසුවද කාරක ප්‍රශ්නවල සමානව ලැබෙන පුද්ගලයාම සඳහා කරන්නා කරවන්නා යයි කියන ලදී. ප්‍රත්‍ය නැත. මහාපොළොව ආදියේ ප්‍රත්‍ය නැත. **අඤ්ඤා කල්‍යාණ පාපකානං කම්මානං කත්තා** යන ප්‍රශ්නය සංස්කාරයයි හෝ ආත්මයයි හෝ ආදි දෘෂ්ටි බියෙන් ප්‍රතික්ෂේප කරන ලදී. **විපාකො උපලබ්භති** යනාදි විපාක පටිසංවේදී වශයෙන් පුද්ගලයා දක්වන්නාට ලබ්ධිය බිඳීම සඳහා කියන ලදී. එහි **විපාක පටිසංවේදී** යයි අනුයෝගය පරවාදියාටය. විපාක පැවැත්මෙන් අන්‍ය වූ විඳින්නෙකු හෝ අභාවයෙන් ප්‍රතික්ෂේපය සකවාදියාටය. නැවත විචාරය සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. **තසස විපාක පටිසංවෙදී** යයි ඒ විපාක විඳින්නාගේ විඳීම. යම් විපාකයක් විඳිය යුතු නම් පුද්ගලයෙක් නැත. එනිසා විපාකය ප්‍රතික්ෂේප කිරීම පරවාදියාගේය. නැවත විචාරණ ලද්දේ යම්සේ පින් විපාකයෙහි සිව් තැනැත්තා විපාකය විඳී. පුත්‍රයා හෝ ස්වාමියා හෝ මව හෝ බිරිඳ හෝ සිඹියි. අලංකාර කරයි. එහෙයින් එබඳු වූ විඳීම සඳහා පිළිගැනීම පරවාදියාගේය. **තසස තසෙසව** යනාදි විපාකය විපාක මාත්‍රයක් නොවේ. එහි විඳින පුද්ගලයා එහි විඳින එහි විඳින යයි මෙසේ පුද්ගල පරම්පරාව ඇත. මෙසේ ඇතිකල්හි ඒ විපාක චිත්තතයාගේ (පැවැත්මේ) නොපැවැත්ම කරණයෙන් දුකෙහි කෙළවර කිරීම කියන ලදී. එය නැතැයි යන අර්ථය වේ. **අඤ්ඤා කල්‍යාණ පාපකානං කම්මානං විපාක පටිසංවෙදී** යන ප්‍රශ්නය වෙදනාවනත යයි හෝ ආත්මයයි හෝ ආදි දෘෂ්ටි බියෙන් ප්‍රතික්ෂේප කරන ලදී. දිබ්බං සුඛං යනාදි කල්‍යාණයට පමුණුවන කර්මඵල විපාක බෙදා දැක්වීම් වශයෙන් අරඹන ලදී. ඒ සියල්ල යට කියන ලද නයින් දතයුතුය. මෙහි සකවාදීහු ද පුද්ගල වශයෙන් ම විඳීම ප්‍රතික්ෂේප කළහයි දතයුතුය. වේදයිත වශයෙන් නොවේ. මහාපොළොව ආදිය අරමුණු කොට වේදයිතයේ පහළවීම නොසිදුවේ. **කත්තා කාරෙතා විපාක පටිසංවෙදි** යනාදිය මිශ්‍ර නය වශයෙන් අරඹන ලදී.

එහි සො කරොති යන යමක් ඔබ කර්තෘ ද විඳින්නා ද යයි කියයි. කිම හේම කරයිද හේම විඳියිද යන අනුයෝගය සකවාදියාගේය. සූත්‍ර විරෝධ භයෙන් ප්‍රතික්ෂේපය පරවාදියාගේය. නැවත විචාරණ ලද්දේ, 'ඉධ නන්දති පෙච්ච නන්දති' සූත්‍ර වශයෙන්. ප්‍රතිඥාව ඔහුගේමය. ඉක්බිති

ඔහුගේ වචනයට ඉඩ වලක්වන්නේ සකවාදියා **සයං කතං සුඛං දුක්ඛං** යයි කීය. එහි **අඤ්ඤා කරොති** යන කරන විඳින අයගේ අන්‍ය වූ යයි විචාරීම් වශයෙන් කියන ලදී. එයින් පරවාදියා සූත්‍ර විරෝධ භයෙන් ප්‍රතික්ෂේප කොට නැවත විචාරණ ලද්දේ මිනිසෙක් කොට දෙවියෙක් විඳියයි සිතන්නේ දැනගනී. මෙබඳු වාදිහු වනාහි අනුන් කළ සැපදුක් පැමිණේ යයි යන ආකාරයෙන් විචාරණ ලද්දේ නැවත ප්‍රතික්ෂේප කරයි. **සො වඤ්ඤා ච** යයි කරන විඳින අය එකෙකැයි අන්‍ය ප්‍රශ්න වශයෙන් කියන ලදී. එයින් පරවාදියා සූත්‍ර විරෝධ භයෙන් ම ප්‍රතික්ෂේප කොට නැවත විචාරණ ලද්දේ පෙර නය දෙකම එකතුකොට දැනගනී. මෙසේ වාදිහු වනාහි තමා විසින් කරන ලදද අනුන් විසින් කරන ලදද සැපදුක් වලට පැමිණෙති යයි යන විසින් විචාරන ලද්දේ නැවත ප්‍රතික්ෂේප කරයි. **නෙව සො කරොති කරන්නා විඳින්නා** එකෙක් අනිකෙක් ප්‍රතික්ෂේප වශයෙන් කියන ලදී. එයින් පරවාදියා සූත්‍ර විරෝධ වශයෙන්ම ප්‍රතික්ෂේප කොට නැවත විචාරණ ලද්දේ මිනිසෙක් දෙව්ලොව උපතට හේතුවූ කර්ම කොට මිනිසෙක්ව නො විඳියි. ඒ කරන ලද කර්මයෙන් අනිකෙක්ද නොවිඳී. එහෙයින් කරන්නාගෙන් විඳින්නා ඔහු නොවේ. අනිකෙක් ද නොවේ යයි සිතන්නේ දැනගනී. මෙය ලබ්ධිමාත්‍රයකි. මෙබඳු වාදිහු වනාහි තමා නොකරන අනුන් නොකරන අහේතුකව සැපදුක් පැමිණේ යයි යන විසින් විචාරණ ලද්දේ නැවත ප්‍රතික්ෂේප කරයි. තව ද මේ මිශ්‍ර නයෙහි මුල පටන් මේ නයෙන් අර්ථය දතයුතුය. මේ පුද්ගලවාදී කර්මවල කරන්නාද විඳින්නාද කැමති වේ. එහෙයින් යමෙක් කරන්නේ ඔහුම හෝ අන්‍යයකු හෝ දෙදෙනාම හෝ විඳින්නකු විය යුතුය. දෙදෙනාම නොවිය යුතුය යන මෙය පැමිණියේය. මෙසේ පැමිණි අනුයෝගය යොදන සකවාදියා නෙව සො කරොති යනාදි විකල්ප සතර කීය. සෙස්ස කියන ලද ආකාරයෙන්මය. අවසානයෙහි වනාහි ප්‍රශ්න හතරම එකතුකොට විචාරණ ලද්දේය. එහි ප්‍රතික්ෂේපය ද පිළිගැනීම ද තමා විසින් කරන ලද දෝස පැමිණීම ද පෙර නයෙන්ම දතයුතුය. මෙයින් පසු කල්‍යාණ පැමිණීම යයි නොකියා යට කියන ලද නයින් ම **කම්මං අත්ථි** යනාදි විකල්පයෙන් දක්වන ලදී. ඒවායේ ද යට කියන ලද නයින් ම අර්ථය දතයුතුය.

පුරිසකාර අනුයෝගය
නිමි.
කල්‍යාණ වර්ග යයි මීටම නමකි.

මෙයින් පසු අභිඥා යෝගාදි වශයෙන් අරහත් සාධනය වේ. එහි **ආමනතා** යයි සකවාදියා විසින් ප්‍රතිඥා දුන් කල්හි පරවාදියා බාහිර අතීන්ද්‍රිය බද්ධ රූපයෙහි ඉද්ධිවිධාදි විශේෂ අධිගම නැත. අධ්‍යාත්මය ඇත. එහෙයින් ඉද්ධි ආදිය නිපදවූ පුද්ගලයා විසින් විය යුතු යයි සිතන්නේ **නනු කොවි ඉදධි විකුබබති** යනාදිය කීය. ඒ සියල්ල නොගැඹුරු අරුත් ඇත්තේය.

අභිඥානුයෝගය
නිමි.

දැන් **මාතා** යනාදි ඤාති අනුයෝගයයි. **ඛතතියො** යනාදිය ජාති අනුයෝගය වේ. **ගහටෙඨා පබබජිතො** යනු ප්‍රතිපත්ති අනුයෝග වේ. **දෙවො මනුසෙසා** යනු උත්පත්ති අනුයෝග වේ. සොතාපනෙනා යනාදිය ප්‍රතිවේද අනුයෝග වේ. අරිය අනුයෝග යයි ද කියනු ලැබේ. ඒ සියල්ලම නොගැඹුරු අරුත් වේ. **අරහා භුතවා න අරහා** මෙහි මෝඩ ප්‍රශ්නය නිසා නොකියන ලදී. **චතතාරො පුරිස යුගානි** යනාදිය සංඝානුයෝග වේ. එය ද නොගැඹුරු අරුත් වේ. **සංඛතො** යනාදිය සත්‍යාර්ථ ස්වභාවානුයෝග වේ.

එහි **තතියා කොටි** විචාරීම සකවාදියාගේය. එබඳු සත්‍යාර්ථයේ අභාවයෙන් ප්‍රතික්ෂේපය පරවාදියාගේය. නැවත විචාරණ ලද්දේ පුද්ගලයා සඳහා ප්‍රතිඥාව ඔහුගේමය. **අඤඤා පුගගලො** යන ප්‍රශ්නයෙහි ද සංඛත වූ ස්කන්ධයන්ගේ අන්‍ය තත්වයක් අකැමැත්තේ ප්‍රතික්ෂේපය ඔහුගේය. **බන්ධා සංඛතා** යනාදි සංඛත අසංඛත ස්වරූපයෙන් දක්වා අන්‍ය වූ විචාරණ බවක් කියන ලදී. **රූපං සංඛතං** යනාදි ස්කන්ධ විභාගයෙන් දක්වා අන්‍ය වූ විචාරණ ලද බවක් කියන ලදී. **පුගගලසස උපපාලො** යන විචාරීම සකවාදියාගේය. 'ජාති ධම්මා ජරා ධම්මා අථො මරණ ධම්මිනො' යනාදි සූත්‍ර වශයෙන් ප්‍රතිඥාව පරවාදියාගේය. සංඛතභාවය වනාහි හේ නොකැමති වේ. එහෙයින් ප්‍රතික්ෂේප කරයි. නැවත 'න උපපාදො පඤඤායති' ආදි නයින් විචාරණ ලද්දේ 'දුකඛමෙවහි සමෙහාති දුකඛං තිටයති වෙති වා' යනාදි වචනයෙන් පුද්ගලයාගේ උත්පාද ආදිය නම් අයුතු වේයයි පිළිගනී. **අත්ථමහි** අත්ථ යනු නිවනයි.

එහි ඇතැයි විචාරයයි. එය ඇති බව ශාස්වතයි. නැති බවින් උච්ඡේදයට පැමිණේ. ඒ දෙකම නොකැමැත්තේ පසුව ප්‍රතික්ෂේප කරයි.

ඤාතකානුයෝගය
නිමි.

භවය නිසා ප්‍රශ්නයෙහි **භවං** යනු උත්පත්ති භවයයි. වේදනාව විඳිමින් යන ප්‍රශ්නයෙහි වේදනාව විඳින්නේ වේදනාව විමසන යෝගාවචරයාම දැනගනී. බාල පෘථග්ජනයා නො දනී. කායානුපස්සනා ප්‍රශ්න පැහැදිලිය. පාරායන ගාථාවෙහි **සුඤ්ඤතෝ ලොකං අවෙකඛසසු** යන සත්ත්ව ශූන්‍යතා වශයෙන් ස්කන්ධ ලෝකය බලන්න යන අර්ථය වේ. පුගගලෝ අවෙකඛති යනු සකවාදී ප්‍රශ්න වේ. පරවාදියාහට වනාහි සුඤ්ඤතෝ ලොකං අවෙකඛසසු යන ගාථාවෙහි යමෙක් බලා ද හේ පුද්ගලයාය යන ලබ්ධිය වේ. එහෙයින් ඔහුගෙන් මෙසේ විචාරයි. **සහ** රූපෙන රූපකාය සමග එයින් ඉවත් නොකළ යන අර්ථය වේ. මෙය පංච ස්කන්ධ වශයෙන් අනුදැන නැවත **තං ජීවං** යයි විචාරණ ලද්දේ සූත්‍ර විරෝධ බියෙන් ප්‍රතික්ෂේප කරයි. **විනාරූපෙන** යන මෙය සතර ස්කන්ධ වශයෙන් අනුදැන නැවත අඤ්ඤං ජීවං යයි විචාරණ ලද්දේ සූත්‍රවිරෝධ බියෙන් ප්‍රතික්ෂේප කරයි. අඛනතර ගතොති ච බහිද්ධා **නිකඛමිත්වානිච** මෙය **සහ රූපෙන විනාරූපෙන** යයි යට කියන ලද්දේ වචන ලක්ෂණ වේ.

එහි **අඛනතර ගතො** යනු රූපයේ ඇතුළට ගිය. මෙයින් හෝ එයින් නො නික්මී රූප වෙන් කිරීම් වශයෙන් සිටියේ යන අර්ථය වේ. **නිකඛමිත්වා** යනු රූප වෙන්කිරීම ඉක්මවා රූපය අනිශ්‍රිතව යන අර්ථයයි. අනතතා තමා ජීවයෙන් පුද්ගලයාගෙන් විරහිතය එක් ධර්මයක ද පුද්ගලයෙක් නැත යන අර්ථයයි. සියළු සූත්‍රවල ආගම අර්ථ කතාවල කියන ලද නයින්ම අර්ථය දතයුතුය. මෙහි වනාහි කියන්නන් සඳහා කියමු. **චුතනං භගවතා සපපිකුමෙහා** යනාදි සියළු දේශනා යථාර්ථ වශයෙන් ම අර්ථ වශයෙන් නොගතයුතු යයි දැක්වීම සඳහා ගෙනෙන ලදී. යම්සේ රත්තරං ගෙන කරන ලද ස්වර්ණ විකාර කලය රන් කලය යයි කියනු ලැබේ. මෙසේ ගිතෙල් ගෙන කළ ගිතෙල් විකාරය **සපපිකුමහ** ගිතෙල් කළය යන නම නොවේ. යම් කළයක ගිතෙල් බහාලන ලද්දේ එය ගිතෙල් කළය යන අර්ථයයි. තෙල් කළ යනාදියෙහි ද මෙම නයම වේ.

යම්සේ ද නිවණ නිත්‍යය, ස්ථිරය, මෙසේ බත් හෝ කැඳ නැත. කාලය වෙන් නොකොට දවස් දකිමු යයි පැණවීම වශයෙන් නිත්‍ය බත් ස්ථිර කැඳ යයි කියනු ලැබේ යන අර්ථයයි. **අත්ථි පුග්ගලෝ අනනුභිනාය පටිපනෙනා** යනාදියෙහි ද රූපාදි ධර්ම තමාට ආවේණික (ලක්ඛණ / පච්චත්ත ලකබණ) සහ සමාන ලක්ඛණ වශයෙන් පවතී. මෙසේ පුද්ගලයා නොවේ. රූපාදිය ඇතිකල්හි මෙසේ නාමය, මෙසේ ගෝත්‍රය (කුලය) යයි ව්‍යවහාර වේ. මෙසේ මෙයින් ලෝක ව්‍යවහාරයෙන් ලෝක සම්මුතියෙන් ලෝක නිරුක්තියෙන් පුද්ගලයා ඇත යන මෙය මෙහි අර්ථය වේ. භාග්‍යවතුන් වහන්සේ විසින්ද මෙය කියන ලදි. චිත්ත, මෙය ලෝක ව්‍යවහාරය, ලෝක නිරුක්තිය, ලෝක පැණවීමයි. රූපාදි ධර්ම නැතිවද ලෝක සම්මුතිය වෙන් වෙන් හා සමාන ලක්ඛණ වශයෙන් පැණවීමක් ඇත. මෙය මෙහි අර්ථයයි. බුදුවරුන්ගේ වනාහි සම්මුති පරමාර්ථ වශයෙන් කථා දෙකකි. එහි සත්ත්වයා, දෙවියා, පුද්ගලයා, බ්‍රහ්මයා යනු සම්මුති කථා නම් වේ. අනිත්‍ය, දුක්ඛ, අනත්ත, ස්කන්ධ, ධාතු, ආයතන, සතිපට්ඨාන, සම්මප්පධාන යනාදිය පරමාර්ථ කථා නම් වේ. එහි යමෙක් සම්මුති දේශනාවෙන් සත්ත්වයා යයි..... බ්‍රහ්මයා යයි කී කල්හි දැනගැනීමට අවබෝධ කිරීමට පැමිණවීමට රහත් ඵල ගැනීමට හැකි වේ. එනිසා භාග්‍යවතුන් වහන්සේ මුලින් සත්ත්වයා යයි හෝ පුද්ගලයා යයි හෝ දෙවියා යයි හෝ බ්‍රහ්මයා යයි හෝ කියති. යමෙක් පරමාර්ථ දේශනාවෙන් අනිත්‍ය යයි හෝ දුකයයි හෝ ආදියෙහි එක්තරා දෙයක් අසාම දැනගැනීමට, අවබෝධයට පැමිණවීමට, රහත්ඵල ලැබීමට හැකිවේද ඔහුට අනිත්‍ය ආදියෙහි එක්තරා කොටසක් දේශනා කරති. එසේ සම්මුති කථාවෙන් අවබෝධය ලබන සත්ත්වයන්ට පළමුව පරමාර්ථ කථා දේශනා නොකරති. සම්මුති කථාවෙන් අවබෝධකොට පසුව පරමාර්ථ කථා දේශනා කරති. පරමාර්ථ කථාවෙන් අවබෝධ කරන සත්ත්වයින්ට පළමුව සම්මුති කථා දේශනා නොකරති. පරමාර්ථ කථාවෙන් අවබෝධ කරවා පසුව සම්මුති කථා දේශනා කරති. ප්‍රකෘතියෙන් පළමුවම පරමාර්ථ කථා කියන්නහුට දේශනාව රළු ආකාර වේ. එහෙයින් බුදුවරු පළමුව සම්මුති කථා දේශනා කර පසුව පරමාර්ථ කථා දේශනා කරති. උන්වහන්සේලා සම්මුති කථා දේශනා කරන්නේ ද ස්වභාවයම, සත්‍යයම දේශනා කරති. පරමාර්ථ කථා දේශනා කරන්නේ ද සත්‍යයම දේශනා කරති. පරමාර්ථ කථා දේශනා කරන්නේ ද සත්‍යයම ස්වභාවයම දේශනා කරති. මෙය වනාහි:

දෙසීය සස් දෙකම - දෙසුවන් උතුම් බුදුහිමි
සම්මුති පරමරුත් - නොලැබේ තෙවැන්නක් මෙහි

එහි ලොවැ සම්මත කෙරුණු - වදන් ලකුණු ද සස්වත
පරමරුත් වදනය - සස් වේ ලකුණු තත දම්

තවද අන්‍ය වූ නයකි. භාග්‍යවතුන් වහන්සේගේ දේශනා දෙකකි. ස්කන්ධාදි වශයෙන් පරමාර්ථ දේශනාය. ගිතෙල් කළය වශයෙන් සම්මුති දේශනාය. භාග්‍යවතුන් වහන්සේ ව්‍යවහාරය නො ඉක්මවයි. එහෙයින් පුද්ගලයා ඇත යන වචන මාත්‍රයෙන් ප්‍රවේශවීම නොකළ යුතුය. බුදුවරුන් විසින්:

නොකර වහර බැහැර - දෙසන ලද පරමරුත ද
සම්මුතිය නොහැරම - එහෙයින්ම සෙසු පඬිවරු
දෙසනවිට පරමත් - වහරද බැහැර නොකරනු

සෙසු සියල්ල පැහැදිලි අරුත් වේ.

පරිහානි කථා 2

දැන් පරිහානි කථා වේ. පරිහානි ධර්මය අපරිහානි ධර්මය යන මේ ධර්ම දෙක ශෛක්ෂ භික්ෂූන්ට පරිහානිය සඳහා පවතී. මහණෙනි, මේ ධර්ම පහ සමය විමුක්ත භික්ෂූන්ට පරිහානිය පිණිස පවතී. මේ ආදි සූත්‍ර නිසා සම්මිතිය, වජ්ජිපුත්තක, සබ්බත්ථිවාදි, මහා සංඝික ඇතැමෙක් රහතන් වහන්සේගේ ද පිරිහීම දකිති. එහෙයින් ඔවුන්ගේ හෝ වෙනත් අයගේ හෝ මෙබඳු ලබ්ධිය බිඳීම සඳහා **පරිහායති අරහා අරහතා** යන විචාරීම සකවාදියාගේය. එහි **පරිහායති** යන එහි පැමිණි පරිහානිය නොපැමිණි පරිහානිය යයි පරිහානි දෙකකි. එහි 'දෙවනුවද ආයුෂ්මත්

ගෝධිකය. සාමයිකයා ඒ චේතෝ විමුක්තියෙන් පිරිහෙයි' යන මෙය පැමිණි පරිහානි නම් වේ. ශ්‍රමණඵල කැමැත්තවුන්ගේ යහපත් වූ ශ්‍රමණ ඵලය නොපිරිහේවා යනු අපපතන පරිහානි වේ. ඒවායින් මෙහි පැමිණි පරිහානිය අදහස් කරයි. ඒ සඳහා **ආමනතා** යයි ප්‍රතිඥාව පරවාදියාගේය. සව සමයෙහි වනාහි මේ පැමිණි පරිහානිය නම් ලෞකික සමාපත්තියම කැමති වෙත්. රහත් ආදි ශ්‍රමණ ඵලවලින් නොවේ. පරසමයෙහිද ඔහු සියළු ශ්‍රමණ පලවල, සියළු භවවල, සියළු කාලවල, සියළු පුද්ගලයින්ගේ කැමති නොවෙති. එය වනාහි ඔවුන්ගේ ලබ්ධි මාත්‍රයම යයි සියළු ලබ්ධිජාල බිඳීමට නැවත **සබබඤ්ඤූ** යනාදි නයින් දේශනය වර්ධනය කළහ. එහි පරවාදියා ක්‍රමයෙන් පිරිහී සෝවාන් ඵලයෙහි සිටියහුගේ රහත් පරිහානිය අකැමති වේ. ඉහළ තලවල සිටියහුගේම කැමති වේ. රූපාරූප භවවල සිටියහුගේ නොකැමති වේ. ක්‍රියාවේ යෙදීමට කැමැත්තවුන්ගේ වනාහි පිරිහෙන ධර්ම ස්වභාවයෙන් කාම භවයෙහි සිටියහුගේම කැමති වේ. එහෙයින් **සබබඤ්ඤූ** නය විචාරණ ලද්දේ ප්‍රතික්ෂේප කරයි. නැවත දැඩිකොට විචාරණ ලද්දේ කාමභවය සඳහා පිළිගනී. සියළු තන්හි වනාහි කාමභවයෙහි. පරිහානිකර කාම ගුණ ඇත. එහෙයින් එහි පිරිහේ යයි ඔහුගේ ලබ්ධිය තුන්වන විචාරයෙන් **පරිහානි** යයි පරිහානිකර ධර්ම විචාරයි. එහි පරිහානි නම් කමම රාමතාදි ධර්මය. විශේෂයෙන් කාමරාග ව්‍යාපාදම වේ. ඒවා රූපාරූප භවවල නැත. එහෙයින් **නහෙවං** යයි ප්‍රතික්ෂේපය පරවාදියාගේය. සබබදා යයි කාලය විචාරිම. එහි පළමුවන ප්‍රශ්නයෙහි නුවණින් සිහිකරන කාලයෙහි නොපිරිහෙන බැවින් ප්‍රතික්ෂේප කරයි. දෙවන ප්‍රශ්නයෙහි නුනුවණින් මෙනෙහි කිරීමෙන් රාත්‍රියෙහි හෝ දිවා කාලයෙහි හෝ හැම කාලයේ ම පිරිහෙන බැවින් පිළිගනී. තෙවැන්නෙහි පරිහානිකර ධර්ම සමග යෙදීමෙහි මොහොතම පරිහානි නම් වේ. එයින් පෙර අපරිහීන වූ පසුව පිරිහුනහුගේ පිරිහීමක් නැතැයි ප්‍රතික්ෂේප කරයි. **සබෙබ අරහනෙතා** ප්‍රශ්නවල පළමුවැන්නෙහි තීක්ෂණ ඉන්ද්‍රිය ඇත්තවුන් සඳහා ප්‍රතික්ෂේප කරයි. දෙවැන්නෙහි මෘදු ඉන්ද්‍රියයන් සඳහා පිළිගනී. තෙවැන්නෙහි ද තීක්ෂණ ඉන්ද්‍රියාම අදහස් කරයි. ඔවුන්ගේ වනාහි සියළු දෙනාගේම පිරිහීම නොවේ යයි ඔහුගේ විශ්වාසයයි. සෙටඨි උදාහරණයෙහි පළමු විචාරීම පරවාදියාටය. දෙවැන්න සකවාදියාටය. එහි අදහස මෙසේය. ඔබලා මගෙන් යමක් විචාරව්ද? **අරහා අරහනෙතා පරිහායනෙතා වතුහි ඵලෙහි පරිහායති?** එහි තොප විචාරමි. **චතුහි සත සහසෙසහි සෙටඨි සෙටඨිතතං කරොනෙතා සත සහසෙසහි පරිහීනො, සිටුවරයා සෙටඨිතතා පරිහීනො**

හොති? එයින් සකවාදියා සක් ලෙසකින් පරිහානිය සඳහා **ආමනනා** යයි කී කල්හි **සබබ සාපතෙයෙසා පරිහීනො හොති?** විචාරයි. එසේ නොපිරිහෙන බැවින් සකවාදියා **නහෙවං** යයි කියා ඉක්බිති එසේම රහතන් වහන්සේ ද පිරිහෙත් ද? නොවේය. සතර පලයෙන් උපන් ලබ්ධිය දෙවන සියළු ප්‍රශ්න විචාරයි. පරවාදියා සිටුවරයාගේ අභව්‍යතාව නියම වශයෙන් නොදක්නේ පිළිගෙන රහත්හුගේ සතර ඵලයෙන් පරිහානි භව්‍යතා විචාරණ ලද්දේ 'නියතො **සමෙබාධි පරායනො** යන වචනයේ අර්ථය නුනුවණින් ගෙන ලබ්ධියෙහි සිටියේ සෝවාන් ඵලයෙන් පිරිහීම අභව්‍ය නිසා ප්‍රතික්ෂේප කරයි. එය වනාහි ලබ්ධි මාත්‍රයකි. මෙපමණකින් වාද යුක්තිය නම් නිම වේ.

දැන් ආර්ය පුද්ගල සංසන්දනය අරඹන ලදී. එහි ඇතමෙක් රහතන් වහන්සේගේ පරිහානිය දකිති. ඇතමෙක් අනාගාමියාගේ ද ඇතමෙක් සකදාගාමියාගේ ද දකිති. සෝවාන් වූවහුගේ පරිහානිය සියල්ලෝම නොදකිති. යම් රහත් කෙනෙක් පිරිහී අනාගාමී සකදාගාමී භවයෙහි සිටියේ, ඔවුන්ගේ පිරිහීම දකිති. අනිත් අනාගාමී සකදාගාමීන්ගේ නොවේ. ඔව්හු සෝවාන් වූවහුගේ පිරිහීම සියළු කාලයෙහිම කැමති නොවෙති. එහෙයින් සංක්ෂේපයෙන් විචාරණ කරා. එහි ඔවුන්ගේ ලබ්ධි වශයෙන් පිළිගැනීම ද ප්‍රතික්ෂේපය ද දතයුතුය. **පරිහායති අනාගාමී අනාගාමී ඵලා** යන ප්‍රශ්නයෙහි යමෙක් අනාගාමියාගේ පිරිහීම කැමති නොවෙති. ඔවුන්ගේ වශයෙන් ප්‍රතික්ෂේපය වේ. ඇතමෙක් ප්‍රකෘති අනාගාමී හෝ රහත්හු පිරිහී සිටි අනාගාමී හෝ පිරිහීම දකිති. ඔවුන්ගේ වශයෙන් පිළිගැනීම වේ යනු මෙය මෙහි නය මුඛයයි. ඒ අනුසාරයෙන් සියළු සංක්ෂේප අර්ථයෙන් දතයුතුය. මෙහි සෝවාන්පලයේ අතර රහත්බව අවබෝධ කෙරේයයි කියන ලදී. එය පරිහීනයාගේ නැවත උත්සාහයෙන් රහත්බවට පැමිණීම සඳහා කියන ලදී. අනිත් නැනැත්තා සෝවාන් පලයෙන් අනතුරුව රහත්බවක් නැති නිසා ප්‍රතික්ෂේප කරයි. ඉන්පසු පරිහානි නම් මෙතෙමේ කෙලෙස් ප්‍රහානයට හෝ උත්සාහ අඩු වන්නේය. මාර්ග භාවනාදියේ හෝ අඩු බැවින්, සත්‍යයන් හෝ නො දැකීමෙන් මේ ආදි වශයෙන් යෙදීමට **කසස බහුතුරා කිලෙසා පහීනා** යනාදිය කියන ලදී. ඒ සියල්ල පැහැදිලි අදහස් ඇත්තේ වේ. සූත්‍රවල අර්ථය ආගමාර්ථ කථාවල (නිකාය අටුවා) කියන ලද නයින්ම දතයුතුය. **සමය විමුත්තො අරහතතා පරිහායති** යන මෙහි මෘදු ඉන්ද්‍රිය ඇත්තා සමය විමුත්තය. තීක්ෂණ ඉන්ද්‍රිය ඇත්තා අසමය විමුත්ත වේ යනු ඔවුන්ගේ ලබ්ධියයි. ස්ව

සමය වනාහි වසීප්‍රාප්ත නොවූ ධ්‍යානලාභියා සමය විමුත්ත වේ. වසීප්‍රාප්ත ධ්‍යානලාභියා ද සියළු ආර්ය පුද්ගලයෝ ආර්ය විමෝක්ෂයෙහි අසමය විමුත්ත යයි නිශ්චය වේ. හේ වනාහි තමාගේ ලබ්ධිය ගෙන **සමය විමුත්තෙතා පරිහායති ඉතරෝ න පරිහායති** යයි කිය. මෙහි සෙසු අර්ථ නොගැඹුරුය.

අරිය පුද්ගල සංසන්දනය
නිමි.

දැන් සූත්‍ර ශෝධනය වේ. එහි **උච්චාවචා** යන උතුම් හීන භේදයෙන් (උච්චා ච අවචා ච) උසස් වූ ද පහත් වූ ද, **පටිපදා** ප්‍රතිපදාව. **සමණෙන පකාසිතා** බුද්ධ ශ්‍රමණයා විසින් එළිය කරන ලදී. සැප ප්‍රතිපදාවේ වහා අවබෝධ කරන්නා උසස්ය. දුක් ප්‍රතිපදාවේ පසුබටව අවබෝධ කරන්නා පහත්ය. සෙස්සෝ දෙකේ එක් අංගයකින් උසස්ය. එකකින් පහත්ය. පළමුව කියන ලද්දාම උච්චය. ඉතිරි තිදෙනාම අවචය. **න පාරං දිගුණං යනති** එක් මගින් එක් මගකින් නිවණට දෙවරක් නොයයි යන අර්ථයයි. කුමක් හෙයින්ද? යම් මගකින් සියළු කෙලෙස් ප්‍රහීන නොවේද, මෙයින් එක මගකින්ම රහත්බව දක්වයි. **අත්ථි ජිනසස ඡෙදියනති** යනු සිදිනු ලැබූ කෙලෙස් නැවත සිදිය යුතු කිසිවක් ඇතිදැයි අසයි. අනිත් තැනැත්තා තීක්ෂණ ඉන්ද්‍රිය සඳහා ප්‍රතික්ෂේප කොට නැවත විචාරණ ලද්දේ මෘදු ඉන්ද්‍රිය සඳහා ප්‍රතික්ෂේප කොට නැවත විචාරණ ලද්දේ මෘදු ඉන්ද්‍රිය සඳහා පිළිගනී. සකවාදියා සූත්‍රය දක්වා නැති බව පෙන්වයි. එහි **ඔඝපාසො** යනු කෙලෙස් සැඩපහර මෙන්ම කෙලෙස් තොණ්ඩුව ද වේ. **කතසස පටිවයො** භාවිත මාර්ගයේ නැවත භාවනා මෙහි ද ප්‍රතික්ෂේප පිළිගැනීම් පෙර නයින්ම දැනගත යුතුය. **පරිහානාය සංවත්තනති** පරවාදියා විසින් ගෙනෙන ලද සූත්‍රයෙහි පංචධර්ම නොපැමිණි පිරිහීම සඳහා මෙන්ම ලෞකික සමාපත්ති පිරිහීම පිණිස ද පවතී. හේ වනාහි පැමිණි රහත්පල පිරිහීම සලකයි. එයින්ම **අත්ථි අරහතො කමමා රාමතා** යයි කිය. අනිකාද අසමය විමුත්තිය සඳහා ප්‍රතික්ෂේප කොට අනිකා සඳහා පිළිගනී. කාමරාග වශයෙන් හෝ පවතින එය ප්‍රතික්ෂේප කොට අන්‍ය ආකාරයකින් පැවැත්ම පිළිගනී. රාගාදිය වනාහි ඇද්දැයි අසන ලද්දේ පිළිගැනීමට නොහැකි වේ. **කිං පරියුටඨිතො** යනු කුමකින් නැගිටියේද? අනුබන්ධය මැඩගත්තේ හෝ වී යයි අර්ථයයි. අනුසය විචාරීමද තීක්ෂණ ඉන්ද්‍රිය මෘදු ඉන්ද්‍රිය

වශයෙන්ම ප්‍රතික්ෂේප පිළිගැනීම් දතයුතුය. 'කල්‍යාණුසයෝ' යන වචන මාත්‍ර සමාන වීමෙන් හෝ පිළිගනී. **රාගෝ උපචයං ගචඡති** භාවනාවෙන් ප්‍රහීනය සඳහා කීය. පසුව දෝස මෝහවලද මෙම නයම වේ. සක්කාය දෘෂ්ටි ආදීන්ගේ වනාහි දර්ශනයෙන් ප්‍රහීන බැවින් රැස්කිරීම අකැමති වේ. සෙසු සියළු තැන නොගැඹුරු අරුත් වේ.

සූත්‍ර සොධනය
නිමි.

බ්‍රහ්මචරිය කථා 3

දැන් බ්‍රහ්මචරිය කථා වේ. එහි බ්‍රහ්මචරිය වාස දෙකකි. මාර්ග භාවනාව ද පැවිද්ද ද යනුවෙනි. පැවිද්ද සියළු දෙවියන් කෙරෙහි නැත. මාර්ග භාවනා අසංඥ සත්ත්වයෙහි හැර නොවලක්වන ලදී. එහි යමෙක් පරනිම්මිත වසවත්ති දෙවියන් කෙරෙහි දැඩිසේ ගෙන ඉන් ඉහළ දෙවියන් කෙරෙහි මාර්ග භාවනා නොකැමති වෙති. සම්මිතියන් මෙනි. ඔවුන් සඳහා නත්ථි දෙසෙ නය විචාරීම එකවාදියාගේය. 'මහණෙනි, ස්ථාන තුනක බ්‍රහ්මචරිය වාසිය ඇත. දඹදිව මිනිස්සු, උතුරුකුරු දිවයිනේ මිනිස්සු, තව්තිසා දෙවියන් යන මොවුන් වසන තැන්. මේ සූත්‍රයේ කොටස් දෙකක දෙවියන්ට බ්‍රහ්මචරිය වාසය නැතැයි උපත් ලබ්ධි වශයෙන් පිළිගැනීම පරවාදියාටය. නැවත දෙදෙනාම බ්‍රහ්මචර්යාවට අන්තරායික ධර්ම වශයෙන් **සබෙබ දෙවා ඡළා** යයි විචාරීම සකවාදියාටය. එහි **හත්‍ථසංවාචිකා** යනු ගොළුවකු මෙන් හස්ත මුද්‍රාවෙන් කියන්නා. පසුව **අත්ථි දෙවෙසු** යයි විචාරීම පරවාදියාටය. මග්ග භාවනා සඳහා ප්‍රතිඥාව සකවාදියාටය. ප්‍රතිඥාවේ අදහස නො සලකා පැවිද්ද වශයෙන් අනුයෝගය පරවාදියාටය. **යත්‍ථ නත්ථි පබබජ්ජා** ප්‍රශ්නයෙහි ගිහීන්ට ද

ඇතැම් දෙවියන්ට ද මාර්ග ප්‍රතිලාභය සඳහා ප්‍රතික්ෂේපය ඔහුටමය. නැවත විචාරණ ලද්දේ ප්‍රත්‍යන්තවාසීන් මෙන්ම අසංඥ සත්ත්වයා ද සඳහා ප්‍රතිඥාව ඔහුටමය. **යො පබ්බජ්ජති** යනාදියෙන් විචාරීමද මෙම නයම වේ. නැවත **අත්ථි දෙමෙසු** යයි ප්‍රශ්නයෙහි ද මාර්ග භාවනාව සඳහාම ප්‍රතිඥාව සකවාදියාටය. **සබ්බ දෙවෙසු** යයි කී කල්හි අසංඥ සත්ත්වයා සඳහා ප්‍රතික්ෂේපය ඔහුටමය. **මනුසෙසසු** යන ප්‍රශ්න දෙකෙහි ජම්බදීපකයින් සඳහා ප්‍රතිඥාව ප්‍රත්‍යන්තවාසීන් සඳහා ප්‍රතික්ෂේපය දතයුතුය. **අත්ථි යත්ථ අත්ථි** යන ඔබගේ දෙවියෝ ඇත්ද, හෝ ඒ ප්‍රදේශ යම් තැනක ඇත්දැයි මෙසේ සත්ත්ව ප්‍රදේශ විභාග මුඛයෙන් විසඳීම සකවාදියාටය. මෙම නයින් සියළු ඒකන්තරික ප්‍රශ්න දතයුතුය. සූත්‍ර අනුයෝගයෙහි **කුහිං එලුපපත්ති** ඒ අනාගාමියාට රහත්පල ලැබීම කොතේදැයි විචාරීම සකවාදියාටය. **තත්‍රෙව** යනු සුද්ධාවාසවලය. **හඤ්චි** කාරණ අරුතෙහි නිපාතයකි. මෙය කියන ලදී. අනාගාමී පුද්ගලයා මෙම ලෝකයෙහි වඩන ලද මගින් එහි සුද්ධාවාසවල පල අවබෝධ කරයි. එහි වෙනත් මාර්ගයක් නොවඩයි. එහෙයින් දෙවියන් කෙරෙහි බ්‍රහ්මචරිය වාසයක් නැත.

දැන් ඉදින් අන්තැනක වඩන ලද මාර්ගයෙන් අන්තැනක පල අවබෝධ **කිරීම** වේ. එහෙයින් සෝවාන් ආදීන්ටද වන්නේ යයි මේ අර්ථය දැක්වීමට නැවත **අනාගාමී** යනාදීන්ගේ සංසන්දන විචාරීම සකවාදියාටය. එහි අනාගාමියාගේ පල අවසේසය පිළිගැනීම සෙස්සන්ගේ පල අවබෝධය ප්‍රතික්ෂේප කිරීම පරවාදියාටය. මෙහි වඩන ලද මාර්ග **ඇති** අනාගාමියා මෙහි හැර නිටයි නම් වේ. හෙතෙම 'මෙහි අනාගාමී මාර්ගය වඩා එහි ඕපපාතිකව ඉපදී පිරිනිවේ' යන වචනයෙන් නැවත මාර්ග භාවනා හැර උත්පත්ති වශයෙන් ම රහත්පලය අවබෝධ කෙරේ යයි ඔහුගේ ලබ්ධියයි. සෝවාන් සකදාගාමීහු වනාහි එහි මාර්ගය වඩා එහි උපදිත්. ඔවුන්ගේ මෙහි පැමිණීමක් නැත. මෙසේ හේ අනාගාමියාගේ පල අවබෝධය විචාරණ ලද්දේ පිළිගනී. සෙස්සන්ගේ ප්‍රතික්ෂේප කරයි. අනාගාමී පුග්ගලො තත්‍ථ භාවිතෙන මගෙන ප්‍රශ්නයෙහි අනාගාමියාව එහි මාර්ග භාවනා නැතැයි යන ලබ්ධියෙන් ප්‍රතික්ෂේප කරයි. **මගෙණා ච භාවියති න ච කිලෙසා පහීයන්ති** යන විචාරීම සකවාදියාගේය. රූපාවචර මාර්ගය සඳහා ප්‍රතිඥාව අනිකාගේය. රූපාවචර මගින් වනාහි හෙතෙම මෙහි හැර උපන්නේය. **අනාගාමී පුග්ගලො කතකරණීයො** යන ප්‍රශ්නයෙහි 'ඕපපාතිකව එහි පිරිනිවේ' යන වචනයෙන් උත්පත්තිය ද ඔහුගේ

කතාකරණයේ අභාවය සඳහා පිළිගනී. **අරහා** යන ප්‍රශ්නයෙහි මෙහි පිරිනිවන්පාන්නෝ රහතුන් වේ වශයෙන් ප්‍රතික්ෂෙප කරයි. නැවත විචාරණ ලද්දේ එහි පිරිනිවන්පාන්නවුන් වශයෙන් පිළිගනී. **අත්ථි අරහතො පුනබ්භවො** යනාදියෙහි එහි පිරිනිවන්පාන්නා මෙහි පිරිනිවන්පාන්නා වශයෙන්ම අර්ථය දතයුතුය. **අපපටිවිද්ධා කුපෙපා ච නත්ථි පරිනිබ්බායි** යයි විචාරණ ලද්දේ මෙහිම වඩන ලද මගින් රහතන් වහන්සේගේ අකුප්ප අවබෝධය කැමති වන්නේ ප්‍රතික්ෂෙප කරයි. **යථා මිගො** පළමු උදාහරණය පරවාදියාගේය. දෙවැන්න සකවාදියාගේය. සෙසු සියළු තැන පැහැදිලි අරුත් වේ.

ඔදිසො කථා 4

දැන් ප්‍රමාණ වශයෙන් කථා වේ. එහි යම් සෝතාපත්තාදීන්ගේ විවිධ අවබෝධ වශයෙන් එක එක ප්‍රමාණයේ කෙලෙස් ප්‍රහානය කැමති වෙති. දැන් මෙහි සම්මිතියන් මෙනි. ඔවුන්ගේ ඒ ලබ්ධිය බිඳීමට **ඔධිසො** යයි ඇසීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. නැවත අනුයෝගය සකවාදියාටය. ඒකදේශයකින් සෝවාන්බවේ නොවීමෙන් ප්‍රතික්ෂේපය පරවාදියාටය. මේ උපායෙන් සියළු වාරවල අර්ථය දතයුතුය.

ඔධිසො කථා වර්ණනා නිමි.

ජහති කථා 5

දැන් ජහති කථා නම් වේ. එය යම් වචනලාභි පෘථග්ජනයා සත්‍යාවබෝධ අනාගාමී නම් වේ. ඔහුගේ පෘථග්ජන කාලයේම කාමරාග ව්‍යාපාද ප්‍රහීන වූයේ යයි ලබ්ධිය දැන් මේ සම්මිතියාගේ ලබ්ධිය මෙනි. ඔවුන්ගේ ඒ ලබ්ධිය බිඳීමට **ජහති පුථුජ්ජනො** යයි විචාරීම සකවාදියාගේය. ධ්‍යානයෙන් විෂ්කම්භනය ඒවායේ නැගිටීම නොදක්නවුන්ගේ ප්‍රතිඥාව පරවාදියාටය. ධ්‍යානයෙන් විෂ්කම්භනය වූද අනාගාමී මාර්ගයෙන්ම අත්‍යන්ත ප්‍රශ්නය වේ. එහෙයින් නැවත **අචචනතං** යනාදි අනුයෝගය සකවාදියාටය. එබඳු වූ ප්‍රහානයක අභාවයෙන් ප්‍රතික්ෂේපය අනිකාටය. **විකබමෙහනි** යනු අත්‍යන්ත විෂ්කම්භනය සඳහා විචාරීම සකවාදියාටය. ඉන්පසු අනාගාමී මාර්ගස්ථයා සමග පෘථග්ජනයා සැසඳීම වේ. එය පැහැදිලිය. ඉන්පසු **අනාගාමිඵලෙ සණයාති** යයි විචාරණ ලද්දේ ධ්‍යාන අනුගාමියා සඳහා පිළිගනී. **අරහතෙත සණයාති** විචාරණ ලද්දේ දර්ශන මාර්ගයෙන් උද්ධංභාගියන් හේ ප්‍රහාන අභාවයෙන් ප්‍රතික්ෂෙප කරයි. **අපුබබං අචරිමං තයො මගෙග** යයි විචාරණ ලද්දේ එබඳු වූ භාවනාවක අභාවයෙන් ප්‍රතික්ෂේප කරයි. නැවත විචාරණ ලද්දේ මාර්ග තුනේ කෘත්‍ය ස්වභාවය සඳහා පිළිගනී. ශ්‍රමණඵල විචාරීම්වලද මෙම නයම වේ. **කතමෙන මගෙගන** යයි විචාරණ ලද්දේ අනාගාමී මගෙගන යයි ධ්‍යාන අනාගාමින් සඳහා කියයි. නැවත සංයෝජන ප්‍රහානය විචාරණ ලද්දේ අනාගාමී ආදි මාර්ග තුනෙන් ඒ කෙලෙස් ප්‍රහීන නොකළ හෙයින් ප්‍රතික්ෂේප කරයි. දෙවනුව අසන ලද්දේ පළමුවන මාර්ගයම ධ්‍යාන අනාගාමී මාර්ග භවය සඳහා පිළිගනී. මෙහි සෙස්ස පැහැදිලිය.

ජහති කථා වර්ණනා
නිමි.

සබ්බමත්ථීති කථා 6

දැන් සියල්ල ඇත යන වාදකථා නම් වේ. එහි 'යමෙකුගේ යම්කිසි රූපයක් අතීත අනාගත වර්තමාන.....මෙය රූපස්කන්ධයයි කියනු ලැබේ' ආදි වචනයෙන් අනිත්‍යාදී සියළු භේද ස්කන්ධ ස්වභාවය අත්නොහරියි. එනිසා සියල්ල ඇත යන ලබ්ධිය වේ. ඔවුන්ගේ ඒ ලබ්ධි ශෝධනය සඳහා **සබ්බමත්ථි** යන විචාරීම සකවාදියාගේය. කියන ලද ආකාරයේ ලබ්ධියේ සිට පිළිගැනීම පරවාදියාගේය.

සබ්බත්ථ යනු සියළු ශරීරයෙහි සියල්ල ඇත්දැයි විචාරයි. **සබ්බදා** යනු සියළු කාලයෙහි සියල්ල ඇත්දැයි විචාරයි. **සබ්බෙන සබ්බං** යනු සියළු ආකාරයෙන් සියල්ල ඇත්දැයි විචාරයි. **සබ්බෙසු** යනු සියළු ධර්මවල සියල්ල ඇත්දැයි විචාරයි. **අයොගං** අයුත්ත. නොයෙක් ස්වභාවවල යෝග වේ. එක ස්වභාවයක් නොවේ. මෙසේ මේ ප්‍රශ්නයෙහි රූපය වේදනාවෙන්, වේදනාව හෝ රූපයෙන් අනන්‍ය වූ ඒක ලක්‍ෂණය කොට **සබ්බමත්ථි** යයි විචාරයි. **යමපි තත්ථි කම්මපත** යම් සවැනි ස්කන්ධාදියක් සා අඟක් මෙන් කිසිවක් නැතැයි සිද්ධ වේ. එය ද ඔවුන්ට ඇත්දැයි විචාරයි. **සබ්බමත්ථීති යා දිට්ඨි සා දිට්ඨි මිච්ඡාදිට්ඨීති යා දිට්ඨි සා දිට්ඨි** මෙයින් මෙය අසයි. ඔබගේ යම් මේ සියල්ල ඇත යන දෘෂ්ටිය, ඒ දෘෂ්ටිය යථාවත් නොකළ හැකි බැවින් මිථ්‍යා දෘෂ්ටියයි මෙසේ ඔබගේ සමයේ ඇත්දැයි විචාරයි. අනිත් නැනැත්තා මේ සියළු නයෙහි කියන ලද ආකාරයෙන් ඇති බව නැති හෙයින් ප්‍රතික්‍ෂේප කරයි. මේ සියළු නයෙහි වනාහි ආඥානාහි නිගහං යනාදිය කොට මාර්ගභේද සියළු කථා විස්තර වශයෙන් දතයුතුය.

දැන් **අතීතං අත්ථීති** කාල සංසන්දනය වේ. එහි **අතීතං අත්ථි** යනාදිය සුද්ධික සංසන්දනය. **අතීතං රූපං අත්ථි** ආදිය ස්කන්ධාදි වශයෙන් කාල සංසන්දනයයි. **පච්චුපපන්නං රූපං අපපියං කරිත්වා** අතීත අනාගත හැර වර්තමාන රූපයම අප්‍රිය වූ භජනය නොකළ යුත්තේ කොට. **රූපභාවං ජහති** යන ප්‍රශ්නයෙහි නිරුද්ධ වූ රූපයේ ද රූපස්කන්ධයෙහි ඇතුළත් බැවින් ප්‍රතික්‍ෂේප කරයි. රූපභාවං න ජහති යන ප්‍රතිලෝම ප්‍රශ්නයෙහි ද රූපස්කන්ධහේ සංගෘහීත හෙයින්ම පිළිගනී. **ඔදාතං වත්ථං**

අපපියං කරිත්‍වා යන මෙහි කිසිවක් නොව සියළු වස්තුය සුදුය. මෙයින් වස්තු යයි නොකියා සුදු වස්තුය අප්‍රිය කොට යයි **කී** කල්හි සකවාදියා විසින් ඒකත්ත බැවින් අනුදනී. **ඔදාතභාවං ජහති** ප්‍රශ්නයෙහි වර්ණය ඉවත්වීම සඳහා ප්‍රතිඥාව සකවාදියාගේය. **වත්‍ථභාවං ජහති** මෙහි වනාහි පැණවීම පහ නොවූ හෙයින් ප්‍රතික්ෂේපය ඔහුටමය. ප්‍රතිලෝමයෙහි ද මෙම නයයි. **අතීතං අතීතභාවං න ජහති** යයි අසන ලද්දේ ඉදින් හරින්නේ නම් අනාගතය හෝ වර්තමානය වන්නේ යයි සිතන්නේ පිළිගනී. **අනාගතං අනාගතභාවං න ජහති** යයි අසන ලද්දේ ඉදින් නොහරින්නේ නම් අනාගතය මෙසේ මොහුව නොපැමිණෙන්නේ යයි වර්තමානභාවය නොපැමිණෙන්නේ යයි සිතන්නේ ප්‍රතික්ෂේප කරයි. වර්තමාන ප්‍රශ්නයෙහි ද මේ නයින්ම අර්ථය දතයුතුය. මෙසේ සුද්ධික නය කියා නැවත ස්කන්ධ වශයෙන් දැක්වීමට **අතීත රූපං** යනාදිය කියන ලදී. ඒ සියල්ල පෙළ ඇසුරෙන්ම දැනගැනීමට හැකිය.

කාල සංසන්දනය
නිමි.

දැන් **අතීතං නත්‍ථි** යනාදි වචන සංශෝධන වේ. එහි හෙතුවේ **අතීතං නත්‍ථි** ඉදින් අතීතය නැතැයි යන අර්ථය වේ. **අතීතං අත්‍ථි** මිචඡා අතීතය ද එය ඇතැයි ද යනු මිථ්‍යාවකි. **තඤ්ඤේව අනාගතං තං පච්චුපපන්නං** යයි අසන ලද්දේ අනාගතය ක්ෂීණය, වර්තමාන බව අභාවය සඳහා කාල නාගත්වයෙන් ප්‍රතික්ෂෙප කරයි. දෙවනුව අසන ලද්දේ යමක් ඇතිවීමට පෙර අනාගතය විය. එය ඇතිවන කාලයෙහි වර්තමාන බව දැනගනී. **හුත්වා හොති හුත්වා හොති** ඉදින් මෙය අනාගතය වී වර්තමානය වේ යයි කියන එයම අනාගතයයි එයි. වර්තමානයයි ලබ්ධි වශයෙන් අනාගතය හෝ වර්තමානය හෝ වී යයි කියන ලදී. කිම එයම වී වේද? ඇතිවී නැවත ඇති නොවීමෙන් **නහෙවං** යයි ප්‍රතික්ෂේප කරයි. දෙවනුව අසන ලද්දේ එය අනාගතය වී වර්තමානය වීම වේයයි ගණන් ගනී. එනිසා පිළිගනී. ඉක්බිති සකවාදියා ඉදින් ඔබ ඒ අනාගතය වී වර්තමානය වීම වේ යයි කියන ලදී. කිම එයම වී වේද? ඉතරයා ඇතිවී වූ දෙයේ නැවත ඇතිවී අභාවයෙන් **නහෙවං** යයි ප්‍රතික්ෂේප කරයි. දෙවනුව අසන ලද්දේ ඒ අනාගතය වී වර්තමානය වෙමින් වී වේදයි ගණනයට ගියේය. එනිසා පිළිගත්හ. ඉක්බිති ඔහුට සකවාදියා ඉදින් ඔබගේ ඒ අනාගතය වී

වර්තමානය වෙමින් වී වර්තමානය නොවීම නොවී නොවේ යයි ගණනයට යන ලදී. හා අඟක් මෙනි. කිම එයද නැවත නොවී නොවේද? යන අදහසින් **න හුත්වා න හොති නහුත්වා නහොති** යන ප්‍රශ්නය අසයි. ඉතරයා යමක් නැත්ද එය නැති බවම අනාගතය නොවී වර්තමානය නොවේ යයි න හුත්වා න හොති නම් වේ. ඊට හේතු නැවත නොවී නොවේ යන භවය මීට කොයින්දැයි සිතන්නේ ප්‍රතික්ෂේප කරයි. **තඤ්ඤේව පවත්තුපපත්තනං නං අතීතං** යන ප්‍රශ්නයෙහි ද වර්තමාන ක්ෂණයෙහිම අතීත බව අභාවය සඳහා කාල විවිධත්වය ප්‍රතික්ෂේප කරයි.

දෙවන ප්‍රශ්නය අසන ලද්දේ යම් අතීත බවෙන් පෙර වර්තමානය විය. එයම අතීතය පිළිගත්හ. **හුත්වා හොති හුත්වා හොති** යයි ඉදින් ඔබ විසින් වර්තමානය වී අතීතය වී යයි කියන ලදී. එයම වර්තමාන යයි එය අතීත යයි ලබ්ධි වශයෙන් වර්තමානය හෝ අතීතය හෝ ඇතිවී වේ යයි කියන ලදී. කිම ඔබගේ එයම වී වේද? ඉතරයා ඇතිවී වූයේ නැවත වී අභාවයෙන් න හෙවං යයි ප්‍රතික්ෂේප කරයි. දෙවන ප්‍රශ්නයෙහි යම්හෙයකින් එය වර්තමානය වී අතීතය වෙමින් වී වේයයි සංඛ්‍යාවට යන ලදී. එහෙයින් පිළිගත්හ. ඉක්බිති ඔහුට සක්වාලයා ඉදින් එයම වර්තමානය වී අතීතය වෙමින් වී මේ යයි නොවෙමින් නොවී නොවේ යයි සංඛ්‍යාවට යන ලද හා අගති කිම? ඔබගේ එයම නැවත නොවී නොවේ යයි අදහසින් **න හුත්වා න හොති න හුත්වා න හොති** යන ප්‍රශ්නය අසයි. අනිකා යමක් නැත් ද එය නැතිබවම වර්තමානය නොවී අතීතය නොවේ යයි නහුත්වා න හොති නම් වේ. ඊට හේතුඃ- නැවත නොවී නොවේ යන බව කොයින්දැයි සිතන්නේ ප්‍රතික්ෂේප කරයි. දෙකම එක්කොට පැමිණි තුන්වන ප්‍රශ්නයෙහි ද මේ උපායෙන් යෝජනා කළ යුතුය.

වෙනත් න්‍යායක් ඉදින් එයම අනාගතය එය වර්තමානය අනාගතයේ වර්තමානය කියන ලද ඇති බව වර්තමානයේ අනාගතය කියන ලද ඇති බවට පැමිණේ. (අනාගතයෙන් වර්තමානය වේ නම් වර්තමානයෙන් අනාගතය වේ යයි කී සේය.) මෙසේ ඇතිකල අනාගතය ද වී වේ නම්. වර්තමානයද වී වේමය නම්. එයින් එය අසම්. කිම? ඔබගේ මේවායින් එක එක වී වේද? වී වේදැයි? අනිකා **තඤ්ඤේව අනාගතං නං පවත්තපත්තනං** ප්‍රශ්නයෙහි ප්‍රතික්ෂේප නයින්ම ප්‍රතික්ෂේප කොට නැවත අසන ලද්දේ දෙවන ප්‍රශ්නයෙහි පිළිගත් නයින් ම පිළිගනී.

ඉක්බිති ඔහු සකවාදියා තඤ්ඤේවඅනාගතං තං පච්චුප්පන්නං යන්න ප්‍රශ්න වශයෙන් ඒවායින් එක එක වී වේ වී වේ යයි පිළිගන්නා වූ පෙර ප්‍රතික්ෂිප්ත ප්‍රශ්නය පෙරළා අසන්නේ **න හුත්වා න හොති න හුත්වා න හොති** යයි අසයි.

එහි අර්ථය : ඔබ විසින් එයම අනාගතය එය වර්තමානයයි කීකල්හි පළමු ප්‍රශ්නය ප්‍රතික්ෂේප කරන අනාගතයේ වේය යන භවය වර්තමානයටද වේ යන බව ප්‍රතික්ෂේප කරන ලද්දේය. එයින් අනාගතය නොවේ. වර්තමානය නොවී යයි දෙවන ප්‍රශ්නයෙහි ඔබේ අනාගතය එයම එය වර්තමානයයි පිළිගන්නා ලදී. මෙසේ ඇති කල්හි අනාගතයද නොවී නොවේ නම් වේ. වර්තමානයද නොවී නොවේමය. එහෙයින් එය අසමි. කිම? ඔබගේ මේවායින් එක එක නොවී නොවේද? පරවාදියා හැම අයුරින්ම අඳුරේ ගිලුනෙකු මෙන් ඒවායේ නොවී නොවේ යන බව නොදක්නේ **න හෙවං** යයි ප්‍රතික්ෂෙප කරයි. දෙවන වාරයෙහි ද ඉදින් එයම වර්තමානය එය අතීතය. වර්තමානයේ අතීතය කියන ලදී. අතීතයේද වර්තමානය කියන ලද්දේ වේ යයි පැමිණ මෙසේ ඇතිකල්හි වර්තමානයද වී වේ නම් වේ. අතීතය ද වී වේමය. එහෙයින් එය අසමි. කිම ඔබේ මේවායින් එක එක හුත්වා හොති හුත්වා හොති? අනිකා **තඤ්ඤේවඅතීතං** ප්‍රශ්නයන් ප්‍රතික්ෂෙප නයින්ම ප්‍රතික්ෂෙප කොට නැවත අසන ලද්දේ දෙවන ප්‍රශ්නයෙහි පිළිගන්නා ලද නයින්ම පිළිගනී. ඉක්බිති සකවාදියා ඔහු **තඤ්ඤේවඅතීතං** යයි ප්‍රශ්න වශයෙන් ඒවායින් එක එක හුත්වා හොති හුත්වා හොති යයි පිළිගන්න පළමු ප්‍රතික්ෂිප්ත ප්‍රශ්නය පෙරළා අසන්නේ **න හුත්වා න හොති න හුත්වා න හොති** යයි අසයි.

එහි අර්ථය: **තඤ්ඤේවඅතීතං** යයි කියන ලද කල්හි පළමු ප්‍රශ්නය ප්‍රතික්ෂේප කරන ඔබ විසින් වර්තමානයේ වන බව අතීතයද වී වෙන බව ප්‍රතික්ෂේප කරන ලද්දේ ද? එයින් වර්තමානය නොවේනම් අතීතය නොවී නම්, දෙවන ප්‍රශ්නයෙහි ද ඔබගේ **තඤ්ඤේවඅතීතං** යයි පිළිගන්නා ලදී. මෙසේ ඇතිකල්හි වර්තමානයද නොවී නොවේ. අතීතයද නොවී නොවේමය. එහෙයින් එය අසමි. කිම? ඔබගේ මේවායින් එක එක **න හුත්වා න හොති න හුත්වා න හොති**? පරවාදියා හැම අතින් අඳුරේ ගිලීමෙන් ඒ නිසා නොවී නොවේ යන බව නොදක්නේ **න හෙවං** යයි ප්‍රතික්ෂේප කරයි. තුන්වන

වාරයෙහි ද ඉදින් එයම අනාගතය එය වර්තමානය එය අතීතය අනාගත වර්තමානයන්ගේ වර්තමාන අතීතවල කියන ලද වෙන බව වර්තමාන අතීතයද අනාගත වර්තමානවල කියන ලද වෙන බව පැමිණේ. මෙසේ ඇතිකල්හි අනාගතයද තැවී වේ නම් වර්තමානයද අතීතය ද වී වේමය නම්. එයින් එය විචාරමි. කිම? ඔබගේ මේ තුනෙන් එක එක හුත්වා හොති හුත්වා හොති? අනිකා **තඤ්ඤඤ්ච අනාගතං තං පච්චුප්පන්නං තං අතීතං** යන ප්‍රශ්නවල ප්‍රතික්ෂිප්ත නයින්ම ප්‍රතික්ෂෙප කොට නැවත අසන ලද්දේ දෙවන ප්‍රශ්නයෙහි පිළිගන්නා ලද නයින්ම පිළිගනී. ඉක්බිති සකවාදියා **තඤ්ඤඤ්ච අනාගතං කං පච්චුප්පන්නං තං අතීතං** යන ප්‍රශ්න වශයෙන් ඒවායින් එක එක හුත්වා හොති **හුත්වා හොති** පිළිගන්නේ පෙර ප්‍රතික්ෂෙප කළ ප්‍රශ්නය පෙරළා අසන්නේ න හුත්වා න හොති න හුත්වා න හොති යයි අසයි.

එහි අර්ථය :- තඤ්ඤඤ්ච අනාගතං තං පච්චුප්පන්නං තං අතීතං කි කල්හි පළමුවන ප්‍රශ්නය ප්‍රතික්ෂෙප කරන ඔබ විසින් අනාගත වර්තමාන වෙන බව වර්තමාන අතීතවලද වූ බව ප්‍රතික්ෂෙප කරන ලදද? එයින් අනාගතය වර්තමානය ද නොවේ නම්. වර්තමානය ද අතීතය ද නොවී නම්. දෙවන ප්‍රශ්නයෙහිද **තඤ්ඤඤ්ච අනාගතං කං පච්චුප්පන්නං තං අතීතං** යයි පිළිගන්නා ලදී. මෙසේ ඇතිකල්හි අනාගතය ද නොවේ නම් වර්තමානයද අතීතයද නොවී නොවේමයම වේනමි. එයින් එය අසමි. කිම ඔබගේ මේවායින් එක එක න හුත්වා න හොති, න හුත්වා න හොති? පරවාදියා හැම අයුරින් අඳුරෙහි ගිලිනෙකු මෙන් ඒවායේ නොවී නොවේ යන බව නොදක්නේ **න** හෙවං යයි ප්‍රතික්ෂෙප කරති.

වචන ශෝධනය නිමි.

මෙහි නිගහාදිය වනාහි යට කියන ලද නයින් ම යෙදිය යුතුය. **අතීතං චකඛු අහූ** ආදියෙහි ද චකඛු ආදි භාව අත්හැරීමෙන් ම ඇති බව (දැනගනී) පිළිගනී. **පසසති** යනාදිය අසන ලද්දේ ඒ විඤ්ඤාණයන්ගේ කෘත්‍ය ස්වභාව වශයෙන් ප්‍රතික්ෂේප කරයි. **තෙන ඤාණෙන ඤාණ කරණීයං කරොති** යන ප්‍රශ්නයෙහි ඒ ඤාණයේ නිරුද්ධවීම නිසා එහි කෘත්‍යභාවය නොදක්නේ ප්‍රතික්ෂේප කරයි. නැවත අසන ලද්දේ

අතීතාරම්මණඤාණය වර්තමාන ඤාණය අතීත ධර්මයන්ගේ දැනගන්නා ලද බැවින් අතීත ඤාණය ලේඝයකින් වර්තමාන ඤාණයම අතීත කොට ඒ ඤාණයෙන් කළයුත්තේ ඇති බව පිළිගනී. ඉක්බිති සකවාදියා ඔහුට ලේඝ අවකාශය නොදී ඒ ඤාණයෙන් **තෙන ඤාණෙන දුක්ඛං පරිජානාති** යනාදිය කීය. පරවාදියා අතීතාරම්මණඤාණයෙන් මේ සතර කිස නොමැත්තේ ප්‍රතික්ෂේප කරයි. අනාගත ප්‍රශ්නයෙහි ද මෙම නයම වේ. වර්තමාන ප්‍රශ්නය මෙන්ම සංසන්දන ප්‍රශ්නය ද නොගැඹුරු අරුත් වේ.

අරහතෝ අතීත රාගෝ අත්ථි යනාදියෙහි ද රාගාදි භාවය අත් නොහැරීමෙන් මෙසේ පිළිගනී. **සරාගෝ** යනාදියෙහි සූත්‍ර විරෝධ බියෙන් මෙන්ම යුක්ති විරෝධයෙන් ද ප්‍රතික්ෂේප කරයි. මෙසේ සියල්ල ද පෙළ ඇසුරෙන්ම දැන පසුව **අත්ථි සිසා අතීතං සියාඤාතීනං** යන මෙහි අර්ථය මෙසේ දතයුතුය. යම් අතීතයක්ම ඇත්ද ඒ අතීතය, යම් වර්තමාන අනාගතයක් ඇත්ද එය නොමැත. ඒ අතීතය නොමැත. **නෙනාතීතං ඤාතීතං ඤාතීතං අතීතං** යන ඒ කරුණෙන් අතීතය නැති අතීතය, නැති අතීය අතීතයයි අනාගත වර්තමාන ප්‍රශ්නවල ද මෙම නයයි. **න වත්තබ්බං අතීතං අත්ථි අනාගතං අත්ථි** යන සූත්‍ර සාධනය පිණිස විචාරීම පරවාදියාටය. ප්‍රතිඥාව සකවාදියාටය. නැවත තමාගේ ලබ්ධිය නිසා **යං කිඤ්චි හික්ඛවෙ රූපං** යන අනුයෝගය පරවාදියාටද දෙවන නයෙහි විචාරීම සකවාදියාටද වේ. ප්‍රතිඥාව පරවාදියාටය. මෙසේ සියළු තැන විචාරීමද ප්‍රතිඥාවද දතයුතුය. පරවාදියා විසින් අනාගතයේ ඇති බව සාධනය පිණිස **නනු වුත්තං භගවතා කබලීකාරෙ වෙ හික්ඛවෙ** යන සූත්‍රය අවසානයෙහි **අත්ථි තඤ්ච ආයතිං පුනබ්භවාභි නිබ්බත්ති** යනාදිය දක්වන ලදී. එය අනාගතයේ ඇති බව සාධනයක් නොවේ. එය හේතුන්ගේ අවසානය වන බැවින් අවශ්‍ය භාවිතය සඳහා එහි කියන ලදී. මෙම සූත්‍ර අදහසය. සෙසු සියළු තැන අරුත් පැහැදිලිය.

දැන් අතීත ස්කන්ධ යනාදි කථා වේ. එහි ස්කන්ධභාවය අත් නොහැරීමෙන් අතීත අනාගතවල ඇති බව කැමති වන්නාට **අතීතං බන්ධා** යයි ඇසීම පරවාදියාටය. අතීතයේ ස්කන්ධ සංග්‍රහවී බැවින් **ආමනන්තා** යයි ප්‍රතිඥාව සකවාදියාටය. නැවත **අතීතං අත්ථි** යන ඇසීම

පරවාදියාටය. එහි නිරුක්ති මාර්ගය සූත්‍රයෙන් ඇති බව වළකන ලද හෙයින් ප්‍රතික්ෂේපය සකවාදියාටය. ආයතන ධාතු විචාරවලද අනාගත ප්‍රශ්නවලද වර්තමානය සමග සසඳ, අනුලෝම ප්‍රතිලෝම වශයෙන් පැමිණි ප්‍රශ්නවලද **අතීතං රූපං** යන ප්‍රශ්නවලද මේ උපායෙන් අර්ථ දතයුතුය. සූත්‍ර සාධනයෙහි වනාහි **න වත්තබ්බං** යන විචාරීම සකවාදියාටය. එහි **නත්ථි වෙතෙති** මේ ධර්ම නැතැයි යන අර්ථයයි. ස්කන්ධාදිභාවය ඇතිකල්හි අකැමැත්තාගේ නැති බව **ආමන්තා** යයි ප්‍රතිඥාව පරවාදියාටය. ඒවායේ නැති බව සාධනය පිණිස සූත්‍රය දැක්වීම සකවාදියාටය. දෙවන විචාරීමද පරවාදියාටය. ප්‍රතිඥාව සකවාදියාටය. සූත්‍රය දැක්වීම පරවාදියාටය. එය වනාහි ඒවායේ ස්කන්ධාදිභාවයම සාධය. ඇති බව නොවේ. ගෙනෙන ලද්ද ද නොගෙනෙන ලද්ද හා සමාන වේමය.

එකච්චං අත්ථීති කථා 8

දැන් **එකච්චං අත්ථීති** කථා නම් වේ. එහි යමෙක් අතීතය පමණක් ඇතැයි සිතයි. කසසපිකයන් මෙනි. ඔවුන්ගේ ලබ්ධිය බිඳිනු පිණිස **අතීතං අත්ථී** යන විචාරීම සකවාදියාගේය. **එකච්චං අත්ථී** යන විසඳීම පරවාදියාගේය. එහි අදහස මෙසේය. විපාක නොදුන් විපාක ඇත. විපාක දුන් විපාක නැත. **එකච්චං නිරුද්ධං** යන අනුයෝගය සකවාදියාගේය. එහි අර්ථයඃ ඉදින් ඔබේ අතීතය එක ලෙසකින් ඇත. එක ලෙසකින් නැත. මෙසේ ඇතිකල්හි එක්ලෙසකින් අතීතය නිරුද්ධය. එක් ලෙසකින් අතීතය නිරුද්ධ නොවේ. එසේම සිටි බවට පැමිණේ. **විගතං** යනාදියෙහිද මෙම නයයි. **අවිපකක විපාකා ධම්මා එකච්චෙ** යන මෙය යම්හෙයකින් ඔහු යම් විපාක නොදුන් විපාකවල ඇති බව කැමති වෙති. එයද අතීතයේමය. එහෙයින් ඔබගේ අතීතය එක් ලෙසකින් ඇත. එසේම විපාක නොදුන් ධර්ම ද එක් ලෙසකින් ඇත. එක් ලෙසකින් නැතැයි චෝදනා කිරීම කියන ලදී. **විපකක විපාකා** යයි මෙය යමක නැති බව හේ කැමති වේ. ඒවායේ වශයෙන් චෝදනා කිරීමට කියන ලදී. **අවිපාකා** මෙසේ අව්‍යාකත වසයෙන් චෝදනා කිරීමට කියන ලදී. මෙසේ මේවායේ තුනේ සමූහ වශයෙන් සියළු අනුලෝම ප්‍රතිලෝමවල ප්‍රතිඥා ද ප්‍රතික්ෂේප ද

දතයුතුය. **අතීතා එකදෙසං විපකත විපාකා එකදෙසං අවිපකක විපාකා** යයි අඩාල කළ විපාක කියනු ලැබේ. යම් කර්මයකින් ප්‍රතිසන්ධිය උපදවන ලදී. භවාංගය ද චුතියද එහිම විපාක වේ. එහෙයින් ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වා එය අඩාල කළ විපාක නම් වේ. එබඳු වූ ධර්මය සඳහා මෙය කියන ලදී. **විපචවිසසනතීති කත්වා තෙ අත්ථි** යයි විචාරීම සකවාදියාගේය. යම්සේ ධර්මධර පුද්ගලයෙකුගේ නිදනවිට ද බහුලව පවතින ධර්මය ඇතැයි කියනු ලැබේ. මෙසේ ලෝක ව්‍යවහාර වශයෙන් ඇති බව සඳහා ප්‍රතිඥාව පරවාදියාගේය. **විපචවිසසනතීති කත්වා පචචුපපනන** යයි දෙවන ප්‍රශ්නයේ කර්මයන්ගේ අවිනාශ සංඛ්‍යාවෙන් කර්මයෙන් රැස්කළ දෙයක් ඇතැයි ලබ්ධියේ සිට ප්‍රතිඥාව පරවාදියාගේය. **අනාගතං අත්ථි** යනාදියෙහි ද **එකචචං අත්ථි** යනු උපදින ධර්ම සඳහා කියයි. සෙසු සියළු තැන යට කියන ලද නය අනුව දතයුතුය.

සතිපට්ඨාන කථා 9

දැන් සතිපට්ඨාන කථා නම් වේ. එහි 'මහණෙනි, සතර සතිපට්ඨානවල ඇතිවීම ද නැතිවීම ද දේශනා කරන්නෙමි'යයි සතිපට්ඨාන සංයුත්තයෙහි කියන ලද නයින් ම කායාදිය සිහියෙන් අරමුණු දහම් ගෙන සියළු ධර්ම සතිපට්ඨාන යයි ලබ්ධිය, යම් සේ දැන අන්ධකයන්ගේ මෙනි. අන්ධකයෝ නම් පූර්ව ශෛලිය, අපර ශෛලිය, රාජගිරික, සිද්ධත්ථික යයි පසුව පහළ වූ මේ නිකය වෙති. ඔවුන්ගේ ලබ්ධි සමාන බව විමසීම සකවාදියාගේය. ප්‍රතිඥාව පරවාදියාගේය. එහි යම්තැනක පිහිටියේ ද ඒවායෙහි යයි පට්ඨාන නම් වේ. කවරක් පිහිටියේ ද? සති සිහියෙන් පිහිටීම සතිපට්ඨාන යයි මේ අර්ථයෙන් සිහිය ගෝචර වූයේද සතිපට්ඨාන වේ. පිහිටතියි පට්ඨාන වේ. කුමක් පිහිටයිද? සිහිය. සිහිය පිහිටියේ සතිපට්ඨාන යයි මේ අර්ථයෙන් සිහියම සතිපට්ඨාන වේ. එහෙයින් වාද දෙකම පරියායෙන් යෙදේ. යමෙක් ඒ පරියාය හැර සියළු ධර්ම ඒකාන්තයෙන් **සතිපට්ඨාන** යයි කියති. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. අරමුණු වශයෙන් ප්‍රතිඥාව පරවාදියාටය. සියළු දහම් සිහිය යයි අනුයුක්තයේ වනාහි සියළු සිහි ස්වභාවය අභාවයෙන් ප්‍රතික්ෂේපය

ඔහුටමය. එහි **බයගාමී** ආදිය මාර්ග විශේෂණයෝය. ඒකායන මාර්ගය කෙලෙසුන් ගේ ක්‍ෂය භූත වූ නිවණට යේනුයි **බයගාමී** වේ. සතර සත්‍යයන් අවබෝධයට යේනුයි බොධගාමී වේ. සසර රැස් නොකරමින් යේනුයි **අපචයගාමී** වේ. මෙසේ මේ පදවලින් ඔබේ සියළු දහම් මෙබඳු රූපය. ඒවා ඒකායන මාර්ගය වේදැයි විචාරයි. **අනාසවා අසංයොජනියා** යනාදියද ලොවුතුරු බව විචාරීම සඳහා කියන ලදී. බුද්ධානුස්සති යනාදිය ප්‍රභේද විචාරීම් වශයෙන් කියන ලදී. **චකඛායතනං සතිපට්ඨානං** යනාදිය සියළු ධර්මවල ප්‍රභේද විචාරීම් වශයෙන් කියන ලදී. එහිද සිහිය වශයෙන් ප්‍රතික්‍ෂේපය. අරමුණු වශයෙන් ප්‍රතිඥාතය. මෙසේ සියළු ප්‍රශ්නවල අර්ථය දතයුතුය. සූත්‍ර සාධනය නොගැඹුරුය.

හෙවත්තී කථා 10

දැන් හෙවත්තී කථා වේ. එහි අතීතාදි භේද සියළු දහම් රූපාදි වශයෙන් ඇත. අතීත අනාගත වර්තමාන වශයෙන්, අනාගත වර්තමාන හෝ අතීතාදී වශයෙන් නැත. මේ සියල්ල මෙසේ ඇත. මෙසේ නැතැයි ලබ්ධිය, යම්සේ දැන කියන ලද අන්ධකයින්ගේ ප්‍රභේද මෙනි. ඔවුන් සඳහා **අතීතං අත්ථි** යයි විචාරීම සකවාදියාටය. **හෙවත්ථි හෙවනත්ථි** යන විසඳීම පරවාදියාටය. එහි හෙවා යනු මෙසේ යන්නය. ඉක්බිති සකවාදියා ඉදින් අතීතයම මෙසේ ඇත. මෙසේ නැතැයි ලබ්ධිය, මෙසේ ඇතිකල්හි එයම ඇත එයම නැතැයි විචාරන්නේ **සෙවත්ථි සෙව නත්ථි** යයි ඔහුට කිය. අනිත් තැනැත්තා ඒ ස්වභාවයෙන් ඇති බව එයින්ම නැතිබව සඳහා ප්‍රතික්‍ෂේප කරයි. දෙවනුව අසන ලද්දේ ස්වකීය ස්වභාවයෙන් ඇති බව පරභාවයෙන් නැතිබව සඳහා පිළිගනී. ඉන්පසු **අත්ථිටෝ නත්ථිටෝ** යයි ඇති ස්වභාවය නැති ස්වභාවය නම් වේ යයි විචාරයි. මේ උපායෙන් සියළු වාරවල අර්ථය දතයුතුය. අවසානයෙහි වනාහි **නෙනහි අතීතං හෙවත්ථි හෙවනත්ථි** යයි ද **නෙනහි රූපං හෙවනත්ථි හෙනත්ථි** යයි නූතුවණින් පිහිටුවන ලදැයි ද යන ආදිය කියා පරවාදිය විසින් පිහිටුවන ලද ලබ්ධිය කිසිසේත් පිහිටියේ නැත්තේමය.

මහා වර්ගය නිමියේය.

පරූපහාර කථා 11

දැන් පරූපහාර කථා නම් වේ. එහි යමෙක් රහත්බව දැනගත්තේ, නොපැමිණ පැමිණි සංඥා ඇත්තේ, අධිමානය ඇත්තේ කොහොන් වූයේ හෝ සැබෑ රහතුන්ගේ ශුක්‍ර විසටයි දැක, මාරකායික දෙවියෝ රහතුන්ගේ අසූචි එක්තැන් කරතියි සිතයි. යම්සේ දැන් පූර්ව ශෛලීහු සහ අපර ශෛලීහු මෙනි. **අත්ථි අරහතො** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව ඉතිරි අයටය. දැන් යම්හෙයකින් සුක්‍රක විසඨයි නම් රාගය හටගැන්ම වේ. එහෙයින් **අත්ථි අරහතො රාගො** යයි අනුයෝගය ඇරඹීය. ඒ සියල්ල පැහැදිලිය. **මාරකායිකා දෙවතා අනතනො** යනාදි ප්‍රශ්නයෙහි යම්සේ ඒ දේවතාවන්ගේ සුක්‍රක විසඨයි නම් නැත. අන්‍යයන්ගේ ශුක්‍ර ගෙන එකතු නොකරති. රහතුන්ගේ වනාහි ශුක්‍රම නැත එහෙයින් නභවං යයි ප්‍රතික්ෂෙප කරති. **නෙව අතනනො** යන ප්‍රශ්නයෙහි මවා රැස්කරති යන ලබ්ධියෙන් පිළිගනී. **ලොමකූපෙහි** යන ප්‍රශ්නයෙහි හිතෙල් තෙල් මෙන් ලෝමකූපවලින් එක්කරන බව දැක ප්‍රතික්ෂෙප කරයි. හඳහි යනු උද්‍යොගාර්ථයෙහි නිපාතයකි. මම රහත් වීම් දැයි විමති ගනිමියි මෙසේ උත්සාහ කොට රැස්කරතියි යන අර්ථය වේ. **අත්ථි අරහතො විමති** යයි අසන ලද්දේ වස්තු අටෙහි සැකය සඳහා ප්‍රතික්ෂේප කරයි. දෙවනුව අසන ලද්දේ ස්ත්‍රීපුරුෂ ආදීන්ගේ නම්ගොත්වල නිශ්චයබව සඳහා පිළිගනී. **අත්ථි තසස ආසයො** යයි ඒ ශුක්‍රගේ මලමූවල මෙන් පිහිටි ස්වභාවයක් ඇත්දැයි අසයි. **සධම්ම කුසලසස** තමාගේ ද රහත් ධර්මයෙහි පමණක් දක්ෂ වූ ප්‍රඥා විමුක්තිය සඳහාම කියයි. **පරමධම්ම කුසලසස** ස්වධර්මයෙන් අන්‍ය වූ අෂ්ට සමාපත්ති ධර්මයෙහි ද දක්ෂ වූ උභතොභාග විමුක්තිය සඳහාම කියයි. සෙස්ස පෙළ ඇසුරෙන්ම දතයුතුය.

අඤ්ඤාණ කංඛා කථා 12

දැන් අඤ්ඤාණ, කංඛා, පරවිතරණ, යයි කථා තුන වේ. එහි රහත් වූ ස්ත්‍රීපුරුෂාදීන්ගේ නම්ගොත් ආදියෙහි ඤාණය පැවැත්මේ අභාවයෙන් අඤ්ඤාණයක් ඇත. (නුවණක් නැත.) එහිම නිශ්චයක් නොමැතිවීමෙන්

සැක (කංඛා) ඇත. යම්හෙයකින් ඔවුන්ගේ ඒ වස්තු (අඤ්ඤාණ, කංඛා) අන්‍යයන්ට දෙති. ප්‍රකාශ කරති. කියති. එහෙයින් පරවිතරණ ඇත. මේ ලබ්ධි යම් භේද දැන පුබ්බසේලීයාදීන්ගේ මෙනි. ඔවුන්ගේ ඒ ලබ්ධි බිඳීමට කථා තුනෙහිම විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව ද ප්‍රතික්ෂේපය ද පරවාදියාටය. එහි සියළු ප්‍රශ්නවල මෙන්ම විසඳුම්වලද පෙළ අනුගමනය කොටම අර්ථ දතයුතුය.

වචීභෙද කථා 13

දැන් වචීභේද කථාවේ, එහි යමෙකුගේ සෝවාන් මාර්ග ක්ෂණයෙහි ප්‍රථම ධ්‍යානයට සමවැදුනහුගේ දුක් යයි කියයි යන ලබ්ධිය, පුබ්බසේලියාදීන්ගේ මෙනි. ඔවුන් සඳහා **සමාපතතස්ස අත්ථි වචීභෙදො** යයි විචාරීම සකවාදියාටය. ලබ්ධියෙහි සිට ප්‍රතිඥාව පරවාදියාටය. නැවත **සබ්බත්ථ** යයි භව තුන සඳහා විචාරණ ලද්දේ අරූපය සඳහා ප්‍රතික්ෂේප කරයි. **සබ්බදා** යයි කාලය වශයෙන් විචාරණ ලද්දේ ප්‍රථම මාර්ග ක්ෂණයෙහි ප්‍රථම ධ්‍යාන සමාපත්තියෙන් අන්‍ය වූ සියළු සමාපත්ති කාල සඳහා ප්‍රතික්ෂේප කරයි. **සබ්බෙසං සමාපනනානං** යයි විචාරණ ලද්දේ ලෞකික සමාපත්තියට සමවැදුනවුන් සඳහා ප්‍රතික්ෂෙප කරයි. **සංඛ සමාපතතීසු** යයි අසන ලද්දේ දෙවන ධ්‍යාන ආදි සියළු ලෞකික ලෝකෝත්තර සමාපත්ති සඳහා ප්‍රතික්ෂේප කරයි. **කාය භෙදො** යයි ඉදිරියට යෑම් වශයෙන් පවත්වන කාය විඤ්ඤත්තිය. මෙය යම් සිත් වචී විඤ්ඤත්තිය උපදවයි. ඒවාම කාය විඤ්ඤත්තියවේ. මෙසේ ඇතිකල්හි කුමක් හෙයින් කාය භේදය නොවේදැයි චෝදනා පිණිස විචාරයි. පරවාදියා ලබ්ධි වශයෙන් ප්‍රතික්ෂේප කරයි. මෙන්ම පිළිගනියි ද වේ. දැන් ඉදින් ඔහු මාර්ග ක්ෂණයෙහි දුක්යයි වචන කියයි. සමුදය ආදියෙහි ද කියන්නේය. ඉදින් එය නොකියයිද ඉතිරිය ද නොකියන්නේ යයි චෝදනාව පිණිස **දුක්ඛනති ජානනෙතාති ආදයො** ප්‍රශ්න කියන ලදී. අනිත් අය තමාගේ ලබ්ධි වශයෙන්ම පිළිගනී මෙන්ම ප්‍රතික්ෂේප ද කරයි. ලෝකෝත්තර ප්‍රථම ධ්‍යානයට සමාපත්තියා දුක් දුක් යයි විපස්සනා කෙරේ යයි ඔහුගේ ලබ්ධියයි. **ඤාණං** යනු ලෝකෝත්තර චතුස්සත්‍ය ඤාණයයි. **සොතං** සෝත විඤ්ඤාණය අදහස් කරයි. යමකින් ශබ්ද අසාද, **දවිනනං එසසානං** යනු සෝත ස්පර්ශය, මනෝ ස්පර්ශය යන දෙක. **නො වත රෙ වතතබ්බෙති**

ඉදින් අවිශේෂයෙන් යම්කිසිවකට සමවැදුනහුගේ නැත යන වචන භේදය සමවැදුනහුගේ වචන භේදයක් ඇතැයි අවිශේෂයෙන් නොකිව යුතුය. සූත්‍ර සාධනය සමග මෙහි සෙස්ස නොගැඹුරු අරුත් වේ. මෙයින් යමක් 'ආනන්ද සිබී භාග්‍යවතුන් වහන්සේගේ' යයි අවසානයෙහි සූත්‍රය ගෙනෙන ලදී. එහි යම් සමාපත්ති සිතකින්. ඒ වචන භේදය ඇතිවූයේද කාය භේදය ද එයින් ඇතිවන්නේමය. එය ලෝකෝත්තර ප්‍රථමධ්‍යාන සිත නොවේ. එහෙයින් සාධක නොවේ.

දුකඛහාර කථා 14

දැන් දුකඛහාර කථා නම් වේ. එහි දුක් දුක්යයි වචන කියන්නේ දුක්වල ඤාණය ගෙන එයි. එය දුකඛාහාර යයි කියනු ලැබේ. එය ද වනාහි ඒ මාර්ග අංගය මාර්ග පරියාපත්ත (ඇතුළත්) යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ දැන පුබබසෙලිය මෙනි. ඔවුන් සඳහා **දුකඛාහාරෝ** යයි ඇසීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. යෙ කෙචි යයි පළමුවන ප්‍රශ්නයෙහි නොදක්නහු සඳහා ප්‍රතික්ෂේප කරයි. දෙවන ප්‍රශ්නයෙහි දක්නහු සඳහා පිළිගනී. එය වනාහි ලබ්ධි මාත්‍රයකි. එහෙයින් **සබෙබ තෙ** යයි වාදයේ බිඳීමට **බාල පුථුජ්ජනා** යනාදිය කීය.

චිත්තඨිති කථා 15

දැන් චිත්තඨිති කථා වේ. එහි යමෙකුගේ සමාපත්ති සිත මෙන්ම භවාංග සිත ද නොසිඳීමෙන් පවත්නා බව දැක එකම සිත කලක් සිටී යයි ලබ්ධිය, දැන් යට කියන ලද භේද ඇති අන්ධකයින්ගේ ඒ ලබ්ධි විශෝධනය **පිණ්ඩ එක චිත්තං දිවසං තිටයති** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. උපඩඪදිවසෝ උපපාදබණෝ යයි මෙහි ඨිති ක්ෂණය නොගෙන 'අනිච්චා වත සංඛාරා උපපාද වයධම්මිනෝ' යන

දේශනා නයින් උපපාද ව්‍යය වශයෙන් විචාරණ ලදී. **තෙ ධම්ම චිතෙතන ලහුපරිවතෙතා** යයි විචාරණ ලද්දේ සිත් වශයෙන් වහා පෙරලෙන දහම් නොදක්නේ ප්‍රතික්ෂේප කරයි. දෙවනුව විචාරණ ලද්දේ යමෙකුගේ සිතේ දිගුපැවැත්මක් කැමති වෙයි. ඒ සඳහා පිළිගනී. **යාවතායුකං තිට්ඨති** යන ප්‍රශ්නයෙහි 'කල්ප අසූ ලක්ෂයක් සිටිති යම් දෙවියෝ' ආදී වචන වශයෙන් ආරුප්පයෙන් අන්තැනක ප්‍රතික්ෂේප කරයි. ආරුප්පයෙහි (අරූපාවචර ලෝකවල) පිළිගනී. **මුහුතනං මුහුතනං උපපජ්ජති** ප්‍රශ්නයෙහි පරවාදියාට 'උපපාද වය ධම්මිනෝ' යයි ආදි සූත්‍ර විරොධ හයෙන් පිළිගනී. ඊතිය වනාහි ඔහුගේ ලබ්ධි වශයෙන් කැමති වේ. මෙහි සෙස්ස නොගැඹුරු අරුත් වේ.

කුකකුළ කථා 16

දැන් කුකකුළ කථා නම් වේ. එහි 'මහණෙනි, සියල්ල ඇවිල ගන්නා ලදී, සියළු සංස්කාර දුක් වේ' ආදි සූත්‍ර කල්පනා නොකර ගෙන වෙනසක් නැතිව සියළු සංස්කාර කුකකුළ නරකයෙහි මෙන් පහවූ ගිනිඅඟුරු ඇැති මිශ්‍ර වූ උනු අළු සමාන යයි ලබ්ධිය, යම්සේ දැන් ගොකුලිකයන් මෙනි. ඔවුන්ගේ නොයෙක් ආකාර සැප සංසන්දනයෙන් ඒ ලබ්ධිය විවේචනය සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. එහි අනොධිං කත්‍වා යනු සීමාවක් නොකොට අවිශේෂයෙන් සියල්ලම යන අර්ථය වේ. සෙසු සියල්ල පෙළ වශයෙන්ම සූත්‍ර සාධනය ද සමග දතයුතුය.

අනුපුබ්බාභිසමය කථා 17

දැන් අනුපූර්ව අභිසමය කථා නම් වේ. එහි යමෙකුගේ:

ටික ටික සැණ විසින් - නුවණැත්නා පිළිවෙළින්
රිදියෙහි සිපි ලෙසින් - තම මල බැහැර ලන්නේ

ආදි දේශනා නුනුවණින් ගෙන සෝවාන්පලය අවබෝධ කිරීම සඳහා පිළිපන්නේ ඇතැම් කෙලෙස් දුක් දැකීමෙන් අත්හරියි. ඇතැම් කෙලෙස් සමුදය නිරෝධ මාර්ග දැකීමෙන් අත්හරියි. සෙස්ස ද මෙසේ සොළොස් කොටසකින් පිළිවෙළින් කෙලෙස් ප්‍රහානය කොට රහත්වීම වෙයි. මෙබඳු වූ නොයෙක් අවබෝධ ලබ්ධිය ඇතිවිය. දැන් අන්ධක, සර්වාස්තිවාදි, සම්මිතිය, භද්‍රයානිකයන්ගේ මෙනි. ඔවුන්ගේ ලබ්ධි විවේචනයට **අනුපුබබාති සමයො** යයි විචාරීම සකවාදියාය. ප්‍රතිඥාව පරවාදියාටය. **අනුපුබෙබන සොතාපත්ති මග්ගං** යයි විචාරණ ලද්දේ එක මගකට බොහෝ ආකාර පැමිණීම බියෙන් ප්‍රතික්ෂේප කරයි. දෙවනුව විචාරණ ලද්දේ දුකඛ දර්ශන වශයෙන් පිළිගනී. ඒවා හෝ සතර ඤාණය ද එකම සෝවාන් මාර්ගයයි පිළිගනී. පලය වනාහි එකක්ම කැමති වේ. එනිසා ප්‍රතික්ෂේප කරයි. සකදාගාමී මාර්ග ආදියේ ද මෙම නයම වේ. **මග්ගෙ දිට්ඨේ එලෙ ඨිතො** යන ප්‍රශ්නයෙහි දුක්ඛ දර්ශනාදියෙන් දැකීම අවසන් නොවේ. මාර්ග දර්ශනයෙන් අවසාන නම් වේ. එකල හේ පලයේ සිටියේය යන සංඛ්‍යාවට යයි. එනිසා පිළිගනී. **දුකෙඛ දිට්ඨේ චත්තාරි සච්චානි** විචාරීම පරවාදියාටය. එක් අභිසමය වශයෙන් ප්‍රතිඥාව සකවාදියාටය. පුන දුකඛ සච්චං චත්තාරි සච්චානි යයි අනුයෝගය වේ. සතරද නානා ස්වභාව බැවින් ප්‍රතික්ෂේපය ඔහුටමය. **රූපකඛන්ධෙ අනිච්චතො දිට්ඨේ** යයි විචාරීම සකවාදියාය. මුහුදෙහි එක ජලබිඳුවක රස බැලූවිට සෙසු ජලයේ රස බැලුවා සේ එක් දහමක් අනිත්‍යාදියෙන් අවබෝධ කිරීමෙන් සියල්ලම අවබෝධ කෙළේය යන ලබ්ධියෙන් ප්‍රතිඥාව පරවාදියාටය. **චතූහි ඤාණෙහි** යනු දුක් ඤාණාදියෙන්. **අථඛහි ඤාණෙහි** ශ්‍රාවකයන්ට සාධාරණ වූ සත්‍ය ඤාණයෙන් මෙන්ම පටිසම්භිදා ඤාණයෙන් ද. **දවාදසහි ඤාණෙහි** අංග දොළහක් ඇති පටිච්ච සමුප්පාද ඤාණයෙන්. **චතුවතතාරීසාය ඤාණෙහි** ජරාමරණ ඤාණය, ජරාමරණ සමුදය ඤාණය යයි මෙසේ නිදාන වර්ගයෙහි කියන ලද ඤාණයෙන් සත්ත සතතිතියා ඤාණෙහි මහණෙනි, ජරාමරණ අනිත්‍යය, සංඛතය, පටිච්ච සමුප්පන්නය, ක්ෂය ධර්මය, ව්‍යය ධර්මය, විරාග ධර්මය, නිරෝධ ධර්මය යයි මෙසේ එහිම කියන ලද ඤාණයෙන් මෙහි සෙස්ස සූත්‍ර සාධනය සමග පෙළේ එන ලෙස දැනගත යුතුය.

වොහාර කථා 18

දැන් ව්‍යවහාර කථා නම් වේ. එහි භාග්‍යවත් බුදුන්වහන්සේ ලෝකෝත්තර ව්‍යවහාරයෙන් ව්‍යවහාර කරන්නේ යයි යමෙකුගේ ලබ්ධිය, යම්සේ දැන් අන්ධකයින්ගේ මෙන්. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ලබ්ධි වශයෙන් ප්‍රතිඥාව පරවාදියාටය. **ලොකුත්තර සො තෙ** ආදිය එහි අයුතුබව දැක්වීම සඳහා කියන ලදී. එහි අදහස මෙය වේ. ශබ්දායතනයම ඔවුන්ගේ ලෝකෝත්තරය ද නැතහොත් සෝතාදිය වේද? **හඤ්චි බුද්ධසස භගවතො වොහාරො ලොකියෙ සොකෙ පටිහඤ්ඤති** යන මෙහි ඉදින් එය ලෝකෝත්තරය. ස්පර්ශ වේ නම් ලෝකෝත්තර වන්නේ යයි මෙසේ අර්ථය නොගත යුතුය. ලෞකිකයෙහි ස්පර්ශ වන්න වනාහි ලෝකොත්තරත්වයක් නම් නැත යයි මෙහි අදහස් මේ වේ. ලොකියෙන විඤ්ඤාණෙන යන මෙහිද ලෞකිකයෙන්ම යන අර්ථය වේ. ඉතිරිවායේ ආකාර විවිධ වේ. ලෝකෝත්තරයෙහි ලෞකික ඤාණයෙන් ද දැනගනී. මෙසේ සියල්ල යථානුරූපයෙන් දැනගතයුතුය. **සබෙබ තෙ මගගං භාවෙනති** යන ප්‍රශ්නවල ඇතමෙක් මාර්ගය නොලබති. ඔවුන් සඳහා ප්‍රතික්ෂෙප කරයි. ඇතමෙක් ලබති. ඔවුන් සඳහා පිළිගනී. **සොවණ්ණමයාය** රුවන් මුවාවෙන්. මෙය පරවාදියාටය. උදාහරණ: එලණ්ඩියාය, එරණ්ඩුවලින්, මෙය සකවාදියාටය. උදාහරණ: **ලොකියං වොහාරනතසස ලොකියො** මෙය ද එක් ලබ්ධියකි. එය දැන් ඇතැම් අන්ධකයින්ගේ ලබ්ධිය වේ. මෙහි සෙස්ස නොගැඹුරු අරුත්ම වේ.

නිරොධ කථා 19

දැන් නිරෝධ කථා නම් වේ. එහි යමෙකුගේ නුවණින් නොබැලූ නිරෝධය ද නුවණින් බැලූ නිරෝධය ද යන දෙකම එකක් කොට නිරෝධ සත්‍යයයි ලබ්ධිය වේ. යම්සේ දැන් මහිංසාසකයන්ගේ මෙන්ම අන්ධකයන්ගේ මෙනි. ඔවුන් සඳහා **දෙව නිරොධා** විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. **දෙව දුක්ඛ නිරොධා** ප්‍රශ්නවල යම්හෙයකින් දුක්ඛ සත්‍ය දෙකක් කැමති නොවේ. එනිසා ප්‍රතික්ෂේප කරයි. යම්හෙයකින් දෙයාකාරයකින් දුක් නිරුද්ධ වේයයි කැමති වේ. එනිසා පිළිගනී. **දෙව**

නිරොධ සච්චානි යන ප්‍රශ්නවල දුකඛ සත්‍ය දෙකක් නිරෝධ වශයෙන් අකැමති වන්නේ ප්‍රතික්ෂේප කරයි. දෙයාකාරයකින් දුක්වල නිරෝධවීමෙන් පිළිගනී. **දෙව නාණානි** ආදියෙහි ද මෙම නයම වේ. **අත්‍ථි දවිනනං නිබබානං** යනාදියෙහි ප්‍රශ්නවල උස් පහත් බව නො දක්නේ ප්‍රතික්ෂේප කරයි. **අපපටිසංඛා නිරුදෙධ** යන යමෙක් ලෝකෝත්තර ඤාණයෙන් නිරුද්ධ නොවූයේ සුද්ධ ප්‍රකෘතිකත්වය හෝ ඉදිරිපත් කිරීම විචාරය හෝ ලෙසින් පැවතීමෙන් නිරුද්ධ කියනු ලැබේ. ඒ සංස්කාරයෝ, **පටිසංඛා නිරොධං** යයි ලෝකෝත්තර ඤාණයෙන් නිරුද්ධ වේ. නො ඉපදීම්බවට පැමිණෙයි. **තනු අපපටිසංඛා නිරුදධා සංඛාරා** විචාරීම සක්‍යාදියටය. එහි බිඳුනවුන්ගේ නැවත නො බිඳීමෙන් නුනුවණින් මෙනෙහි කිරීමෙන් නිරුද්ධ වූවන්ගේ හෝ ආර්ය මාර්ගයෙහි උපන්කල්හි එසේ නිරුද්ධ වීමෙන්ම ද සකවාදියා අත්‍යන්ත බිඳුනුබව පිළිගනී. මෙහි සෙස්ස පැහැදිලිය.

දෙවෙනි වර්ගය සමාප්තයි.

බල කථා 20

දැන් බලකථා නම් වේ. එහි යමෙකුගේ අනුරුද්ධ සංයුත්තයේ 'ඇවැත්නි, මම මේ සතර සීවටන් භාවිත කොට, බහුලකොට, හේතුව හේතුව වශයෙන් ද අනේතුව අහේතුව යථාපරිදි දනිමි' යනාදි සූත්‍ර දහය නුනුවණින් ගෙන තථාගතයන් වහන්සේගේ බලය ශ්‍රාවකයින්ට සාධාරණ යයි ලබ්ධිය. යම්සේ දැන් අන්ධකයින්ගේ මෙන්, ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ලබ්ධියෙහි සිට ප්‍රතිඥාව පරවාදියාටය. තථාගත බලයද නම් මෙය ශ්‍රාවකයින්ට සාධාරණ ද අසාධාරණ ද සාධාරණ අසාධාරණ ද ඇත. එහි ආශ්‍රවයන්ගේ ක්ෂය ඤාණය සාධාරණය. ඉන්‍ද්‍රියපරොපරියත්ති ඤාණය අසාධාරණය. සෙසු ඒවා සාධාරණ ද අසාධාරණ ද වේ යානායානාදිය ශ්‍රාවකයෝ කොටසක් දනිති. තථාගතයන් වහන්සේ නිපපදේසයෙන් (සම්පූර්ණයෙන්) දනිති. මෙසේ ඒවායේ උද්දේසය (මාතෘකා) වශයෙන් සාධාරණ වේ. නිද්දේස (විස්තර) වශයෙන් නොවේ. මෙය වනාහි අවිශේෂයෙන් සියල්ලම සාධාරණ යයි කීය. එය විවේචනයට **තථාගත බලං සාවක බලං** යයි නැවත අනුයෝගය ආරම්භ කරන ලදී.

එහි පළමු ප්‍රශ්නයෙහි නිද්දේස වශයෙන් සියළු ආකාර විෂය සඳහා ප්‍රතික්ෂේප කරයි. දෙවන ප්‍රශ්නයෙහි උද්දේස වශයෙන් යානායාන මාත්‍රාදිය දැනීම් වශයෙන් පිළිගනී. **තඤ්ඤඤ්ඤවා** යනාදි ප්‍රශ්නවල සියළු ආකාරයෙන් නිනනාන (නිර්නය හෝ ස්වරභේදය) කරණය අභාවයෙන් ප්‍රතික්ෂේප කරයි. පුබ්බයොගෝ ච පුබ්බචරියා ච අර්ථ වශයෙන් එකය. එසේම ධම්මකඛානඤ්ච ධම්ම දෙසනාච. ඉන්ද්‍රිය පරොපරියත්ති ප්‍රශ්නයෙහි එක් දෙසකින් සාධාරණභාවය සඳහා ශ්‍රාවක විෂයෙහි පිළිගනී. දැන් යම්හෙයකින් උද්දේස වශයෙන් සමාන ස්ථානාදිය ශ්‍රාවකයා දනියි. එහෙයින් ශ්‍රාවකයාගේ එබඳු දැනීම ප්‍රකාශකොට දැනීම් මාත්‍ර සමාන බවෙන් එය ශ්‍රාවක සාධාරණ යයි පිහිටුවීමට **සාවකෝ යානං යානං ජානාති** යනාදිය පරවාදි ප්‍රශ්නය වේ.

එහි ඉන්ද්‍රිය පරොපරියත්ති ඤාණය, ෂට් අසාධාරණ ඤාණවලින් වෙනත් එකක් යයි ගත්තා ලදී. **ආසවකෙඛන වා ආසවකඛයං** තථාගතයන් වහන්සේ ආසවකඛය ඤාණය සමග ශ්‍රාවකයින්ගේ ආසවකඛය ඤාණය සැසඳීමේදී වෙනස්කම් ඇති බව කිවයුතු වන්නේ ය. එය නැත. විමුත්තියා වා විමුතති පදවල ද මෙම නයම වේ. මෙහි සෙස්ස පැහැදිලිය. දැන් සකවාදිය විසින් අශ්‍රවයන්ගේ යම් ක්ෂය ඤාණයක් සාධාරණ යයි අනුමත කරන ලදී. එය සමග සසඳ සෙස්සෙහි ද සාධාරණ බව විචාරීමට නැවත **ආසවානං** ඛයෙ යනාදිය පරවාදි ප්‍රශ්න වේ. ඒවා විසඳීමෙහි සකවාදියා විසින් ආශ්‍රවක්ෂයෙහි විශේෂ භාවයෙන් සාධාරණ බව ප්‍රතික්ෂේප කරන ලදී. නැවත ස්ථාන ස්ථානාදියේ ආසවකඛය සමගම සසඳ අසාධාරණ ප්‍රශ්න පරවාදියාටය. එහි ආසවකඛය ඤාණයෙහි ප්‍රතික්ෂේප සෙසු තන්හි ප්‍රතිඥා සකවාදියාටය. ඉන්පසු ඉන්ද්‍රිය පරෝපරියත්තිය සමග සසඳ අසාධාරණ ප්‍රශ්න පරවාදියාටය. එය සංක්ෂේපකොට දක්වන ලදී. එහි ඉන්ද්‍රිය පරොපරියත්තයෙහි ප්‍රතික්ෂේපය හා සෙසු තැන්වල ප්‍රතිඥාව සකවාදියාටය.

අරියනන්ති කථා 21

දැන් අරියනන්ති කථා නම් වේ. එහි යමෙකුගේ කේවල වූ ආසවකඛය ඤාණයම අරිය වේ. ඉක්බිතිව පෙර නව බලය ද අරියා යයි ලබධිය, යම්සේ දැන් අන්ධකයින්ගේ මෙනි. ඔවුන් සඳහා **අරියං** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. නැවත ඉදින් ආර්ය මාර්ගයෙහි එයින් වෙනත් දෙයක් විය යුතුයයි මාර්ගාදි වශයෙන් විචාරීම සකවාදියාටය. ප්‍රතික්ෂේපය පරවාදියාටය. නැවත ශූන්‍යතා අරමුණු වශයෙන් විචාරීම සකවාදියාටය. එහි ශූන්‍යතා දෙකකි. සත්ත්ව ශූන්‍යතා සහ සංස්කාර ශූන්‍යතා වශයෙනි. සියළු සංස්කාරවලින් ශූන්‍ය වූ වෙන්වූ ඉවත්වූ නිවණ. එහි පරවාදියා නිවන් අරමුණ සඳහා ප්‍රතික්ෂේපව කරයි. සංස්කාර අරමුණ සඳහා පිළිගනී. **මනසි කරොති** යයි විචාරණ ලද්දේ ද නිවනම සඳහා ප්‍රතික්ෂේප කරයි. සංස්කාරයන් සඳහා පිළිගනී. එයින් සකවාදියා විසින් සමාන අසමාන මෙනෙහි කිරීම සංස්කාර අරමුණය. ශූන්‍යතා මෙනෙහි කිරීම නිවන් අරමුණ යයි මෙම නය ගෙන **දවිනනං එසසානං දවිනනං චිනතානං සමොධානං හොති** යයි විචාරණ ලද්දේ මද අවසරයක්වත් නොලබන්නේ ප්‍රතික්ෂේප කරයි. අනිමිත්ත අපපණිහිතවලද මෙම නයම වේ. සත්ත්ව නිමිති අභාවයෙන් ස්කන්ධ අනිමිත්ත වේ. සංස්කාර නිමිති අභාවයෙන් නිවන එක් ධර්මයකට ආරෝපනය කර තැබිය යුතු සංඛ්‍යාවෙන් ද ප්‍රණිහිත අර්ථයෙන් ද ප්‍රණිහිත සංඛ්‍යාවට ගිය සත්ත්ව ප්‍රණිධානයද අප්‍රණිහිත වූ ස්කන්ධ වේ. තෘෂ්ණා ප්‍රාර්ථනාවෙන් තෘෂ්ණාවෙන් හෝ අරමුණු වීමෙන් සියළු සංස්කාර ප්‍රණිධියෙන් අප්‍රණිහිත වූ නිවන. එහෙයින් මෙහි ද ප්‍රතික්ෂේපය ද පිළිගැනීම ද පෙර නයින්ම දතයුතුය. එයින් යම්සේ සතිපට්ඨානාදි ලෝකෝත්තර ධර්ම අරියා මෙන්ද ශූන්‍යතාදි අරමුණු ද කිම? ඔබගේ මෙසේ ස්ථාන අස්ථාන ඤාණයද? යයි අනුලෝම ප්‍රතිලෝම විචාරය වේ. එහි සියළු ප්‍රතිඥා සියළු ප්‍රතික්ෂේප පරවාදියාටමය. මේ උපායෙන් සෙසු ඤාණවලද ප්‍රශ්න හා විසඳීම් දතයුතුය. පෙළෙහි වනාහි සෙස්ස හකුළුවා අවසානයෙහි චුතූපපාත ඤාණයම බෙදන ලදී. එයින් පසු ස්ව සමයෙහි ද අරිය යයි සිද්ධ වූ ආශ්‍රවයන්ගේ ක්ෂය ඤාණය සමග සසඳ සෙසු ඤාණවල අනුලෝම වශයෙන්ද ප්‍රතිලෝම වශයෙන්ද අරියභාව විචාරය වේ. ඒ සියල්ල පරවාදියාටය. ප්‍රතිඥාව ද ප්‍රතික්ෂේපය ද සකවාදියාටය. ඒවා පැහැදිලිය. මෙහි පෙළෙහි වනාහි පළමු නව මානයම දක්වා සත්ත ඤාණ කෙටිකරන ලදී.

අරියන්ති කථා වර්ණනා නිමි.

විමුත්ති කථා 22

දැන් විමුත්ති කථා නම් වේ. එහි යමෙකුගේ විතරාග සිත්වල විමුක්ති ප්‍රයෝජනයක් නම් නැත. යම්සේ වනාහි කිලිටි වස්ත්‍රයක් සෝදන ලබන්නේ කිලුටු මිදේ ද එසේ රාග සහිත සිත රාගයෙන් මිදේ යයි යන ලබ්ධිය, යම්සේ දැන් අන්ධකයන්ගේ මෙනි. ඔවුන් සඳහා **සරාගා** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනිකාටය. එයින් **රාගං සහගතං** ආදි නයින් විචාරණ ලද්දේ මාර්ග ක්ෂණයෙහි සිත මිදේ නම් වේ. එකල එබඳු වූ සිතක් නැතැයි ප්‍රතික්ෂේප කරයි. **සඵසසං** යනාදි නයින් විචාරණ ලද්දේ ද යම්සේ ස්පර්ශය ද සිත ද යන දෙක රාගයෙන් මිදේ. මෙසේ රාගියාගේ මිදීම නොදක්නේ ප්‍රතික්ෂේප කරයි. සදොසාදියෙහි ද මෙම උපායෙන් අර්ථය දතයුතුය.

විමුච්චමාන කථා 23

දැන් විමුච්චමාන කථා නම් වේ. එහි යමෙකුගේ ධ්‍යානයෙන් විෂ්කම්භනය වන විමුක්තියෙන් මිදුණු සිත මාර්ග ක්ෂණයෙහි සමුච්ඡේද විමුක්තියෙන් මිදෙන්නේ යයි ලබ්ධිය, ඔවුන් සඳහා **විමුත්තං විමුච්චමානං** යන විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. නැවත **එකදෙසං** යයි විචාරීම සකවාදියාටය. එහි **එකදෙසං** යන භාව නපුංසක යයි. යම්සේ විමුක්තිය ඒක දේශයකින් හෝ ඒක දේසයකින් අවිමුක්තිය හෝ වේ කිම මෙසේ ඒකදේස විමුක්තිය, ඒකදේස අවිමුක්තිය යයි විචාරයි. මෙසේ විචාරීමට කරුණු කිම? **විමුත්තං විමුච්චමානං** අඩාල කළ බැවින් කියන ලදී. යම්සේ කරනු ලබන පැදුරු ආදිය අඩාල කරන ලද බැවින් ඒක දේශයකින් කළ, ඒක දේශයකින් නොකළා වේ. එසේම මෙයද ඒක දේශයකින් විමුක්තියට ඒක දේශයකින් අවිමුක්තියට පැමිණේ. එයින් පරවාදියා පැදුරු ආදිය මෙන් සිතේ ඒකදේශයක භාවයක් පළමු ප්‍රශ්න ප්‍රතික්ෂේප කොට දෙවන මිදෙන්නහුගේ අසම්පූර්ණ වූ විමුක්තිය පිළිගනී. එහි එකල සමුච්ඡේද විමුත්තියෙන් ඒකදේස විමුක්තියෙන් මිදේය යන

ලබ්ධියයි. එයින් සකවාදියා ඉදින් ඔබගේ එකම සිත ඒකදේස විමුත්ත ඒකදේස අවිමුත්ත වේනම් ඔබගේ ඒ සෝතාපන්නයා ද ඒකදේසයකින් සෝවාන් ද ඒක දේසයකින් සෝවාන් නොවේද වන්නේය. චෝදනාව පිණිස **එකදෙසං සොතාපනෙනා** යනාදිය කීය. පරවාදියා ඒ විධානය නොදක්නේ ප්‍රතික්ෂේප කරයි. සෙසු වාරවලද මෙම නයයි.

උත්පාද ක්ෂණ ප්‍රශ්නයෙහි ඉදින් එකම හිත මිදීමද මිදෙමින් පැවතීම ද එක් ක්ෂණයකදී මිදීම මිදෙමින් පැවතීමට ද පැමිණේ. ඔබේ එබඳු වූ සිතේ තේරුම කුමක්ද? සූත්‍ර සාධනයෙහි ප්‍රථම සූත්‍රය පරවාදියාටය. එහි ඔහුගේ අදහස මෙසේය. **විමුචචති** යන අඩාල නිර්දේශයයි. එනිසා ඒ යෝගියා මෙසේ දැනීමෙන් මෙසේ බැලීමෙන් ඒ ආශ්‍රවයන්ගෙන් සිත මිදුනේ යයි, මිදෙමින් පවතින්නේය. දෙවන සූත්‍රය සකවාදියාටය. එහි අදහස මෙසේය. ඉදින් බොහෝ මිදුනේය යන වචනයෙන් මිදෙන ලදී. මිදෙමින් සිටියේ යන්නෙහි මිදුණා යන අදහස නොමැති හෙයින් මිදුනේ වන්නේය. මිදෙමින් සිටියේ නොවේ. දැන් යම්සේ ඔබගේ අඩාලව පවතින විමුක්තිය විමුචචමාන වේද? මෙසේ අඩාලව පවතින රාගාදියෙන් ඇලීම් ආදිය ද ඇතැයි චෝදනාව පිණිස නැවත **අතීි චිනතං** යනාදිය අරඹන ලදී. පරවාදියා විසින්ද එබඳු සිතක් නොදක්නේ සියල්ල ප්‍රතික්ෂෙප කරන ලදී. ඉක්බිති ඔහුට සකවාදියා කෙළවරවල් දෙකක තුනක් නැතැයි අවබෝධ කරවන්නේ **තනු රතතඤඤවව අරහතතඤඤව** යනාදිය කීය. එහි අර්ථය සොඳුරු නැනැත්ත, රාග සම්ප්‍රයුක්ත සිත රත් වූයේ නොවේද? රාග විප්‍රයුක්ත සිත රත් නොවූයේ නොවේද යන කෙළවර දෙක නොවේද? රජස්මාන යයි තුන්වන කෙළවරක් නැත. දුට්ඨාදියෙහි ද මෙම නයයි. ඉක්බිති ඔහු **ආමනතා** යයි පිළිගෙන සිටී. විමුක්ති පක්ෂයෙහි ද කෙළවර දෙකක් ම දැක්වීමට **හඤඤි රතතඤඤවව** යනාදිය කීය. එහි අර්ථය ඉදින් මේ කෙළවර දෙක පිළිගන්නෙහිද? අධිමුක්තිය මෙන්ම විමුක්තියද මෙයින්ම පිළිගන්න. විමුචචමාන නම් පරමාර්ථ වශයෙන් තුන්වන කෙළවරක් නැත.

අට්ඨමක කථා 24

දැන් අට්ඨමක කථා නම් වේ. එහි යමෙකුගේ අනුලෝම ගෝත්‍රභූ මාර්ග ක්ෂණයෙහි කෙලෙසුන්ගේ හැසිරීම් නැති හෙයින් අෂ්ටමක සෝතාපත්ති මාර්ගස්ථ පුද්ගලයාගේ පරියුට්ඨාන (කෙලෙස් නැගිටීම්) දෙකක් ප්‍රහීන වූයේ යයි ලබ්ධිය යම්සේ දැන අන්ධකයන්ගේ සහ සම්මිතියන්ගේ මෙනි. ඔවුන්ගේ එක්තරා එකක්හු සඳහා විචාරය සකවාදියාටය. මාර්ගක්ෂණයේ සිට දෘෂ්ටිය නොඉපදීම සඳහා ප්‍රතිඥාව පරවාදියාටය. එයින් යම්හෙයකින් දෘෂ්ටි නම් මෙය සෝතාපන්නයාගේ ප්‍රහීනය. මාර්ගස්ථයාගේ නොවේ. එහෙයින් **අට්ඨමකො පුග්ගලො සොතාපන්නො** යන අනුයෝගය සකවාදියාගේය. විචිකිච්ඡා ප්‍රශ්නයෙහිද මෙම නයම වේ. අනුසය ප්‍රශ්නයෙහි පරියුට්ඨානයෙන් අන්‍ය වූවක් අනුසය යයි ඔවුන්ගේ ලබ්ධිය වේ. එහෙයින් **න හෙවං** යයි ප්‍රතික්ෂේප කරන ලදී. සීලබ්බත පරාමාස ප්‍රශ්නයෙහිද සීලබ්බත පරාමාස පරියුට්ඨානං යයි ව්‍යවහාරයක් නොපෙනේ. එහෙයින් ප්‍රතික්ෂේප කරයි. ඔහුගේ පරියුට්ඨානයම ප්‍රහීන වීයයි ලබ්ධිය වේ. **මගෙහා භාවිතො** යන ප්‍රශ්නයෙහි ඒ ක්ෂණයෙහි වඩයි. භාවිත නොකරන ලදී. එනිසා ප්‍රතික්ෂේප කරයි. අමග්ගෙන යනාදි අනුයෝගය පළමු මාර්ගයෙන්ම ප්‍රහානභාවය සඳහා ප්‍රතික්ෂේප කරයි. ඉදින් අමාර්ගයෙන් ප්‍රහීන කරවිද, ගෝත්‍රභූ පුද්ගලාදීන්ගේ ද ප්‍රහීන බවට පැමිණි හෙයින් **උපපජ්ජසසති** යයි විචාරය සකවාදියාගේය. විසඳීම සකවාදියාටය. සෙසු සියළු ප්‍රකටය.

අට්ඨමකයේ ඉන්ද්‍රිය කථා 25

දැන් අෂ්ටමකයේ ඉන්ද්‍රිය කථා නම් වේ. එහි යමෙකුගේ අෂ්ටමක පුද්ගලයා මාර්ග ක්ෂණයෙහි ඉන්ද්‍රිය ලබයි. ඔහුට ලැබුණා නොවේ යන ලබ්ධිය, යම්සේ දැන් අන්ධකයින්ගේ මෙනි. ඔවුන් සඳහා **නත්ථි සද්ධින්ද්‍රියං** යයි ඇසීම සකවාදියාගේය. ප්‍රතිඥාව පරවාදියාගේය. **නත්ථි සද්ධා** යයි අසන ලද්දේ සද්ධා ඉන්ද්‍රියෙන් ශ්‍රද්ධාවේ නානත්වය සලකා ප්‍රතික්ෂේප කරයි. සෙස්සෙහි ද මෙම නයයි. යම්සේ වනාහි යමෙකුට මනස ඇත.

ඔහුට මනින්ද්‍රිය ද ඇත. මෙසේ යමෙකුට ශ්‍රද්ධාදිය ඇත්ද ඔහුට ශ්‍රද්ධා ඉන්ද්‍රියාදිය ද ඇතැයි දැක්වීම සඳහා **අත්ථි මනො අත්ථි මනින්ද්‍රියං** යනාදිය අරඹන ලදී. සූත්‍ර සාධනයද සමග ඒ සියල්ල නොගැඹුරු අරුත් ඇති වේ.

දිබ්බචක්ඛු කථා 26

දැන් දිබ්බචක්ඛු කථා නම් වේ. එහි යමෙකුගේ සතරවැනි ධ්‍යාන දහම උපස්ථම්භය ලැබූ මාංශ චක්ෂුසයම දිව්‍ය චක්ෂුස වේ යයි ලබ්ධිය යම්සේ දැන අන්ධකයින්ගේ මෙන්ම සම්මිතියන්ගේ වැනි වේ. ඔවුන් සඳහා **මංස චක්ඛුං** යයි ඇසීම සකවාදියාටය. ප්‍රතිඥාව අනිකාමය. නැවත **මංස චක්ඛු දිබ්බ චක්ඛු දිබ්බ චක්ඛු මංසචක්ඛු** යයි අසන ලද්දේ එපමණකින්ම එය නොවේ යයි ප්‍රතික්ෂේප කරයි. **යා දිසං** යනාදි විචාරවල ද දෙකම ඒක ස්වභාවය අභාවයෙන් ප්‍රතික්ෂේප කරයි. **විසයො** යනාදියෙහි රූපායතන දෙකම විසය වේ. මාංස චක්ෂුව වනාහි ආපාතගත වූයේම දකියි. දිව්‍ය චක්ෂුව ආපාතගත නොවූ පර්වතාදියෙන් හරස් වූද අති සූක්ෂම රූපද ගෝචර වේ. මාංස චක්ෂුවට මෙබඳු ශක්තියක් නැත. **උපාදිනනං හුත්වා අනුපාදිනනං හොති** යයි විචාරණ ලද්දේ යම්හෙයකින් මාංස චක්ෂුව උපාදින්න වේද? දිව්‍ය චක්ෂුව අනුපාදින්න වේ. මාංස චක්ෂුව මෙන් දිව්‍ය චක්ෂුව කැමති නොවේ. එනිසා ප්‍රතික්ෂේප කරයි. දෙවනුව අසන ලද්දේ 'යම්හෙයකින් මාංස චක්ෂුවේ ඉපදීමේ මාර්ගය දිව්‍ය චක්ෂුවගේය' යන වචන නිසා මාංස චක්ෂුවේ ඉපදීමේ මාර්ගය දිව්‍ය චක්ෂුවගේය.' යන වචන නිසා මාංස චකඛු නිසා දිබ්බචක්ඛු උපදී. එයද රූපාවචරයන් හේ සතර මහා භූතයේ ප්‍රසාදය කැමති වේ. එනිසා පිළිගනී. **කාමාවචරං හුත්වා** යයි අසන ලද්දේ ද යම්සේ මාංස චක්ෂුවම දිවැස සේ කැමති නොවේ. එනිසා ප්‍රතික්ෂේප කරයි. දෙවනුව විචාරණ ලද්දේ රූපාවචර ධ්‍යාන ප්‍රත්‍යයෙන් උපන් බැවින් රූපාවචර නම් හටගත්තේ යයි පිළිගනී. **රූපාවචරං හුත්වා අරූපාවචරං** යයි අසන ලද්දේ ඉන්පසුව භාවනාවෙන් අරූපාවචර ක්ෂණයෙහි රූපාවචර සිතේ අභාවයෙන් ප්‍රතික්ෂේප කරයි දෙවනුව අසන ලද්දේ අරූපාවචරයන්ගේ සතර මහාභූත ප්‍රසාද වී උපදී යයි ලබ්ධියෙන් පිළිගනී. ඇතුළත් නොවන බව වනාහි

නොකැමති වේ. එනිසා ප්‍රතික්ෂේප කෙරේමය. දිබ්බචක්ඛුං ධම්මූපත්ථදධං යන කාමාවචර ධර්මයෙන් උපස්ථම්භ වී නැවත ධම්මූපත්ථදධං ලෝකෝත්තර ධර්මයෙන් උපස්ථම්භ වී. දෙව ච ච චක්ඛූති යයි අසන ලද්දේ කිසියම් දිව්‍ය චක්ෂුසකට ලෝකෝත්තර ධර්මයෙන් උපස්ථම්භ වූයේ ප්‍රඥා චක්ෂුභාවය අකැමති වේ. ප්‍රඥා චක්ෂුවේ ඇති බැවින් ප්‍රතික්ෂේප කරයි. නැවත අසන ලද්දේ මාංස චක්ෂුව ලෝකෝත්තර ධර්මයෙන් උපස්ථම්භ වූයේ දිවැස වේ යයි ලබ්ධියෙන් පිළිගනී. මෙහි සෙසු අර්ථ පැහැදිලිය.

දිබ්බසොත කථා 27

දැන දිබ්බසොත කථා නම් වේ. එහි එකංයෙව සොතං යයි අසන ලද්දේ දෙකක් ඇති බැවින් ප්‍රතික්ෂේප කරයි. නැවත අසන ලද්දේ යම්හෙයකින් එයම ලෝකෝත්තර ධර්මයෙන් උපස්ථම්භ වූයේ දිවැස වේ යයි ලබ්ධි වශයෙන් පිළිගනී. සෙස්ස යට කියන ලද නයෙන්ම වේ.

යථාකම්මූපන ඤාණකථා 28

දැන් යථාකම්මූපග ඤාණකථා නම් වේ. එහි යමෙකුගේ 'ඉති දිබ්බෙන චක්ඛුනා විසුදෙධන.....යථාකම්මූපනෙ සත්තෙ පජානාති' මෙසේ පිරිසිදු දිවැසින්.....කර්මානුරූපය පැමිණි සතුන් දනයි. සූත්‍රය වැරදියට ගෙන කර්මානුරූපව පැමිණි ඤාණයම දිවැස යයි ලබ්ධිය, ඔවුන් සඳහා ඇසීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. නැවත **යථාකම්මූපගතඤ්ච මනසිකරොති** යයි අසන ලද්දේ එක් සිතක අරමුණු දෙකක් නැති බැවින් ප්‍රතික්ෂේප කරයි. දෙවනුව අසන ලද්දේ නා නා සිත් වශයෙන් පිළිගනී. නැවත ලේසයකට හෝ අවසර නොදී **දවිනනං එසසානං** යයි අසන ලද්දේ ප්‍රතික්ෂේප කරයි. මෙසේ මේ කම්වූ පරිදි පදයෙන් එසේම **ඉමෙ වත භොනෙතා සතතා** යනාදි පදය සමග යෝජනාවල අර්ථය දතයුතුය. **ආයසමා සාරිපුතෙතා යථාකම්මූපගතං ඤාණං ජානාති** යන මෙය සකවාදියා යම්හෙයකින් ස්ථවිරයන් වහන්සේ අපිස්බැවින් අභිඥාවන්

භාවිත නොකරත් යයි ඇතමෙක් නොදනිති. ඒවා වනාහි නැතැයි සිතති. එහෙයින් ඒ දිවැස නොලැබූ ස්ථවිරයෝ යයි සිතමින් විචාරති. ඒ කාරණයෙන්ම **අත්‍ථායසමතෝ සාරිපුත්තෙනසස දිබ්බචක්ඛු** යයි අන්‍යයෙක් අසන ලද්දෙ ප්‍රතික්ෂේප කරයි. දෙවනුව අසන ලද්දේ යම්කිසි ශ්‍රාවකයකු විසින් පැමිණිය යුතු සියළු තැනම ස්ථවිරයන් විසින් නො පැමිණ ඇතැයි පිළිගනී. දැන් එය අවුල් කරන්නේ සකවාදියා **නනු ආයසමා සාරිපුත්තෙනා** යනාදිය කීය. මේ ගාථාව ස්ථවිරයන් වහන්සේ භාවිත කිරීමේ අදහසක් නැති හෙයින් කීහ. අභිඥානයේ අභාවයෙන් නොවේ. පරවාදියා වනාහි අභාවයෙන්ම යයි අර්ථය සලකයි. දිවැස ගැන නොවේ. එහෙයින් කියන ලදී. **තෙනහි න වත්තබ්බං යථා කම්මූපගඤාණං දිබ්බචක්ඛූති.**

සංවර කථා 29

දැන් සංවර කථා නම් වේ. එහි යමෙකුගේ තව්තිසා දෙවියන් ගෙන ඉන් උපරි දෙවිවරු පස්පවෙහි නො හැසිරෙති. එහෙයින් සංවරය ඇතැයි ලබ්ධිය වේ. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. වෛර හැසිරීම නොදක්නා නිසා ප්‍රතිඥාව අනෙකාටය. එයින් සංවරය නම් අසංවරයක් ඇතිකල්හි හැසිරිය යුත්තෙහි හැසිරීමය. එහෙයින් අසංවරය විචාරීම සකවාදියාටය. දෙවියන් කෙරෙහි පාණාතිපාතාදියේ අභාවයෙන් ප්‍රතික්ෂේපය අනෙකාටය. **අත්‍ථි මනුස්සෙසු** යනාදි සංවරය ඇතිකල්හි අසංවරයේ අසංවරය ද ඇතිකල්හි සංවරයේ ස්වභාවය දැක්වීමට කියන ලදී. **පාණාතිපාතා වෙරමණී** යනාදි ප්‍රශ්නවල ප්‍රාණඝාතාදියේ නොහැසිරීම් වශයෙන් ප්‍රතිඥාව වේ. ප්‍රාණඝාතාදිය නැති බැවින් ප්‍රතික්ෂේපය දතයුතුය. ප්‍රතිලෝම ප්‍රශ්න ප්‍රකටය. **නත්‍ථි දෙවෙසු සංවරෙ** යන ප්‍රශ්නයෙහි ප්‍රාණඝාතාදිය කොට නැවත එයින් සංවරභාවය සඳහා ප්‍රතිඥාව සකවාදියාටය. එයින් ඡල වශයෙන් **යදි සංවරො නත්‍ථි සබ්බ දෙවා පාණාතිපාතො** යයි විචාරීම පරවාදියාගේය. දෙවියන්ගේ වෛර හැසිරීමක් නැති බැවින් ප්‍රතික්ෂේපය සකවාදියාගේය. **න** හෙවං යයි වචන මාත්‍රය ගෙන ලබ්ධිය පිහිටුවීම පරවාදියාගේය. මෙසේ පිහිටුවන ලද ලබ්ධිය නොපිහිටවූවා වේ.

අසඤ්ඤ කථා 30

දැන් අසඤ්ඤ කථා නම් වේ. එහි යමෙකුගේ 'සංඛාර පච්චයා විඤ්ඤාණං' යන වචනය හැර විඤ්ඤාණයෙන් ප්‍රතිසන්ධියක් නම් නැත. 'සඤ්ඤුප්පාදාව පන තෙ දෙවා කමහා කායා චවන්ති' යන වචනයෙන් අසංඥ සත්ත්වයින්ට ද චුති පටිසන්ධි ඤණයෙහි සංඥාව ඇතැයි ලබ්ධිය වේ. දැන් යම්සේ අන්ධකයින්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට සකවාදියා කිම ඔබේ ඒ ස්ථානය සඤ්ඤභාවය දැයි ආදියෙන් චෝදනා කිරීමට සඤ්ඤා භවො සඤ්ඤාගති යනාදිය කිය. ඒ සියල්ල ඉන්පසුවද පෙළ ඇසුරෙන්ම දතයුතුය.

නෙවසඤ්ඤා නාසඤ්ඤායතන කථා 31

දැන් නෙවසඤ්ඤානාසඤ්ඤා කථා නම් වේ. එහි යමෙකුගේ 'නෙවසඤ්ඤානාසඤ්ඤායතනං' වචනයෙන් නොකිවයුතුය. ඒ භවයෙහි සංඥාව ඇතැයි ලබ්ධිය වේ. අන්ධකයින්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. මෙහි සෙසු සියල්ල පෙළ නයින්ම දතයුතුය.

තුන්වැනි වර්ගය නිමියේය.

ගිහිසස අරහාති කථා 32

දැන් ගිහියාගේ රහත් යන කථා නම් වේ. එහි යමෙකුගේ යසකුල පුත් ආදි ගිහි ස්වරූපයෙන් සිටි අයගේ රහත්බවට පැමිණීම දැක ගිහියා රහත් වෙතියි ලබ්ධි වේ. යම්සේ උත්තරපථකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. එනි **ගිහිසස** යයි යමෙක් ගිහි සංයෝජනාවලින් සමන්විතවම රහත්වේය යන අර්ථය වේ. පරවාදියා අදහස නොසලකා ගිහි ස්වරූප මාත්‍රයම දකින්නේ පිළිගනී. මෙහි ගිහි නම් ගිහි සංයෝජනයෙන් වේ. ස්වරූප මාත්‍රයෙන් නොවේ. එයින්

භාග්‍යවතුන් වහන්සේ කීහ.

නියත බඹවිහරණ - සන්සුන් දැමුණු ලකරින්
වචන මෙත හැමටම - බමුණු සමණ ද බිකු වෙන්

මේ නය දැක්වීමට **අත්ථි අරහතො** යනාදිය ඇරඹිය. ඒ සියල්ල පැහැදිලිය.

උප්පත්ති කථා 33

දැන් උප්පත්ති කථා නම් වේ. යමෙකුගේ 'ඔපපාතිකො හොති තත්‍ථ පරිනිබ්බායි' යනාදි වචන අනුවණින් ගෙන සුද්ධාවාසවල උපත රහත් යයි ලබ්ධි වේ. යමෙකුගේ 'උපහච්ච පරිනිබ්බායි' පදය පෙරළා 'උපපජ්ජ පරිනිබ්බායි' ගණන් ගැනීමත් සමග උපතින් රහත්වෙතියි ලබ්ධිය වේ. යම්සේ උතතරාපථකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. එහි යම්සේ උත්පත්ති සිත ලෞකිකය. එහෙයින් සෝවාන් ආදිහුද නොවෙති. රහතුන් කොහෙත්ම නැත. එහෙයින් මේ නය දැක්වීමට සහ **උපපතනියා සොතාපනෙනා** යනාදිය ඇරඹිය. **සාරිපුත්තෙනා** යනාදි මහ තෙරවරුන්ගෙන් එක්කෙනෙකුන්වත් උපතින් රහත් වූයේ දැයි චෝදනා පිණිස කියන ලදී. **උපපතෙතසියෙන** යනු ප්‍රතිසන්ධි සිතින්. ඒ උපත සොයයි. ගවේෂණය කරයි යයි එහෙයින් උපපතෙතසියං යයි කියනු ලැබේ. මෙහි සෙස්ස පැහැදිලිය.

අනාසව කථා 34

දැන් අනාසව කථා නම් වේ. එහි අනාශ්‍රව රහතුන්ගේ සියළු දහම් අනාශ්‍රව යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ උත්තරාපථකයින්ගේ මෙන් වේ. ඔවුන් සඳහා **අරහතො** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට අනාශ්‍රව නම් මාර්ගාදියයි. කිම ඔබගේ ඒවාම උපදීදැයි චෝදනා පිණිස මගෙගා එලං යයි අරඹන ලදී. චකඛුං අනාසවං

ඇස අනුශ්‍රවදැයි විචාරණ ලද්දේ එය ආශ්‍රව සහිත බැවින් ප්‍රතික්ෂේප කරයි. දෙවනුව විචාළේ එය අනාශ්‍රව යයි පිළිගනී. සිවුරු ප්‍රශ්නයෙහි එකම දහමක් අනාශ්‍රව යයිද ආශ්‍රව යයිද වේ යයි ලක්ෂණ විරෝධ බියෙන් ප්‍රතික්ෂෙප කරයි. දෙවනුව විචාළේ අනාශ්‍රව වී ආශ්‍රව වේ යයි පිළිගනී. **තඤ්ඤේව අනාසවං** යන ප්‍රශ්න දෙකෙහි මෙම නයම වේ. සකවාදියා වනාහි **තඤ්ඤේව** යයි අනුමත බැවින් **මගෙඟා අනාසවෙ** ඉත්‍යා යනාදියෙන් චෝදනා කරයි. මේ උපායෙන් සියළු අර්ථ දතයුතුය.

සමනනාගත කථා 35

දැන් සමනනාගත කථා නම් වේ. එහි වර්තමාන ක්ෂණයෙහි සමංගීභාව සමත්වාගමය රූපාවචරාදියෙහි කිසියම් උපතකින් ප්‍රතිලාභ සමන්වාගමයයි සමත්වාගම දෙකකි. හේ අවබෝධය ලබනතුරු නො පිරිහේ. මේ සමත්වාගම දෙක හැර අන්‍ය වූ උත්පත්ති ධර්ම වශයෙන් එන සමත්වාගමයක් ඇතැයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ උත්තරාපථකයන්ගේ මෙනි. ඔවුන්ගේ පැමිණි දහම් යයි කිසිවක් නැතැයි අනුබෝධය සඳහා **අරහා චතුහි එලෙහි සමනනාගතො** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට ඔබගේ රහතුන් ස්කන්ධ සතරෙහි මෙන් සතරපලයෙන් යුක්තය. මෙසේ ඇතිකල්හි සතර පලයෙහි යම් ස්පර්ශාදිය ඒ රහතුන් එයින් යුක්තබවට පැමිණෙතැයි චෝදනා පිණිස **අරහා චතුහි එසෙසහි** යනාදිය අරඹන ලදී. ඒක ක්ෂණයෙහි සතර ඵසාදීන්ගේ අභාවයෙන් ඒ සියල්ල පරවාදියා විසින් ප්‍රතික්ෂේප කරන ලදී. අනාගාමී ප්‍රශ්නවලද මෙම නයම වේ. **සොතාපනි එලං** විතිවතෙතා ප්‍රථම ධ්‍යානය මෙන් නොව දවිතීය ධ්‍යානලාභියා නැවත ඉකුත් වේදැයි අසයි. **සොතාපනි මගගං** යනාදිය යමක් ඉක්මවන්නේ එයින් නැවත යුක්තදැයි දැක්වීමට අරඹන ලදී. **තෙහිව අපරිහීනො** යන ප්‍රශ්නයෙහි යම්හෙයකින් විරුද්ධ හැසිරීමකින් ලෞකික ධ්‍යාන පිරිහේ. ලෝකෝත්තරය එසේ නොවේ. මාර්ගයෙන් කෙලෙස් ප්‍රහීන වේ. ඵලයෙන් සන්සිඳේ. ඒවා එසේ ප්‍රහීන ද සන්සිඳීම ද වේ. එහෙයින් සකවාදිසා එසේ යයි ප්‍රතිඥාතය. **අරහතා චතනාරො මගගා පටිලද්ධා** ආදියෙහි ප්‍රකාශ විය. සෙස්ස පැහැදිළිය.

උපෙක්ඛා සමන්නාගත කථා 36

අරහා ඡහි උපෙක්ඛාහි යන කථාවද මේ නයින්ම දතයුතු. රහතන් වහන්සේ දොරවල සයෙහි උපේක්ෂාවල උපතින් සුදුසු නිසා ඒවායින් යුක්තයයි කියනු ලැබේ. උත්පත්ති භාවයෙන් සියල්ල එකක්ෂණයෙහි නොවේ. සෙස්ස පැහැදිලිය.

බොධියා බුද්ධොති කථා 37

දැන් බෝධිය බුද්ධ යයි කථා නම් වේ. එහි බෝධි යනු සතර මාර්ග ඤාණයට ද සර්වඥතා ඤාණයට ද පර්යාය නමකි. යම්සේ සුදු වර්ණයෙන් සුදුය. කළු වර්ණයෙන් කළුය. එහෙයින් මෙසේ බෝධිය බුද්ධ යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ උත්තරාපථකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීමද අනුයෝගය ද සකවාදියාගේය. ප්‍රතිඥාවද ප්‍රතික්ෂේපයද අනෙකාගේය. **අනීතායා** ප්‍රශ්නයෙහි ඒ ක්ෂණයෙහි අභාවයෙන් ප්‍රතික්ෂේප කරයි. දෙවනුව විචාළේ ප්‍රතිලාභය සඳහා පිළිගනී. නැවත කෘත්‍ය වශයෙන් විචාළේ කෘත්‍යභාවයෙන් ප්‍රතික්ෂේප කරයි. දෙවනුව විචාළේ එහෙයින් එයින් යම් කළයුතු දෙයක් කරන ලදී. එහි මුළාබව පිළිගනී. සුළු ඉඩක්වත් නොදී **දුක්ඛං පටිජානාති** ආදි නයින් විචාළේ ඒ කෘත්‍යයේ අභාවයෙන් ප්‍රතික්ෂේප කරයි. දෙවනුව විචාළේ 'ගියෝ රාජ්ගහ බුදුහු' යයි අනාගතයෙහි බෝධියේ බුදුබව සිතන්නේ පිළිගනී. **බොධි කරණියං කරොති** යයි විචාළේ ඒ ක්ෂණයෙහි කෘත්‍යතාවයෙන් ප්‍රතික්ෂේප කරයි. දෙවනුව විචාළේ ඉදින් නො කරන්නේ නම් බුද්ධ යයි නො කියනු ලබන්නේය. යම්සේ අවශ්‍ය දේ කරන්නේය. එහෙයින් කෙරේ යයි පිළිගනී. නැවත සුළු ඉඩක්වත් නොදී විචාරණ ලද්දේ ප්‍රතික්ෂේප කරයි. වර්තමාන ප්‍රශ්නය සැසඳීම සමග පැහැදිලි අර්ථ වේ. තුන්බෝධිය එකක් කොට විචාරණ ලද්දේ සර්වඥතා ඤාණය සඳහා තුනම බුද්ධ යයි කිවයුතු බැවින් පිළිගනී. නැවත තුනෙන්ම විචාරණ ලද්දේ සියල්ලම ඒක ක්ෂණයෙහි නොවීමෙන් ප්‍රතික්ෂේප කරයි. දෙවනුව විචාළේ අතීත අනාගත වර්තමාන සර්වඥතා ඤාණය වශයෙන් පිළිගනී. නැවත සුළු අවකාශයක්වත් නොදී **සතතං සමිතං** යයි විචාරන ලද්දේ ප්‍රතික්ෂේප කරයි. **න චතතබබං බොධියා** යයි විචාරීම පරවාදියාටය. දැන්

ඔහුගේ නොසැලකීම ප්‍රකට කිරීමට **තත්‍ර බොධිපටිලාභා** යන ප්‍රශ්නයෙහි යමෙකුගේ සිතෙහි බෝධි සංඛ්‍යාත මාර්ග ඤාණය ඉපදෙනවිට බුද්ධ යන සම්මති ස්වභාවයෙන් පිළිගැනීම වේ. ඔහුගේ අදහස නොදැන හෑදූ යයි ලබ්ධිය තැබීම පරවාදියාගේය. දැන් ඔහුගේ නොසැලකීම ප්‍රකට කිරීමට **බොධිපටිලාභා බුදෙධානි බොධියා බුදෙධානි** විචාරීම සකවාදියාටය. එහි අර්ථය : කිම ඔබගේ යම්හෙයකින් බෝධි ප්‍රතිලාභය බුද්ධ වේ. එහෙයින් බෝධිය බුද්ධ වේද? පරවාදියා බෝධි ප්‍රතිලාභය (සත්‍යාවබෝධය) නම් බෝධියෙන් ඉපිද නිරුද්ධ වේ. සන්තානයෙහි (සිතෙහි) උපන්බවට වේ. බෝධි නම් මාර්ග ක්ෂණයෙහි ඤාණයයි. මේ විභාගය නොසලකන්නේ නැවත පිළිගනී. එයින් සකවාදියා විසින් බොධිපටිලාභා බොධි යයි විචාළේ වචනයට අවකාශයක් නොලබන්නේ ප්‍රතික්ෂේප කරයි.

මෙසේ මේ කථා තුනම උත්තරාපථකයන්ගේය.

ලකඛණ කථා 38

දැන් ලක්ඛණ කථා නම් වේ. එහි යමකින් සමන්නාගත වූ මහා පුරුෂයකුගේ ගති දෙකක් වේ. මේ සූත්‍රය වැරදියට ගෙන ලක්ඛණවලින් යුක්ත වූයේ බෝධිසත්ත්වයන් වහන්සේම යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ දැන් උත්තරාපථකයන්ගේ මෙනි. ඔවුන් සඳහා ඇසීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. **චකකවතති සත්තො** යයි ප්‍රශ්නවල යම්හෙයකින් චක්‍රවර්ති සත්ත්වයා බෝධි සත්ත්වයාද ඇත. අබෝධි සත්ත්වයාද ඇත. එනිසා අබෝධි සත්ත්වයා සඳහා ප්‍රතික්ෂේප කරයි. බෝධිසත්ත්වයා සඳහා පිළිගනී. ද්වතතිංසිමානි යන සූත්‍රය බෝධිසත්ත්වයා සඳහාම කියන ලදී. හෙතෙමේ ද පශ්චිම භවයෙහි බුදු වේ. ඉතිරි අය කෙරෙහි සක්විති වේ. එහෙයින් ගෙනෙන ලද්ද ද නොගෙනෙන ලද්දද සමාන වේමය.

නියාමොකකනති කථා 39

දැන් නියාමොකකනති කථා නම් වේ. එහි යමෙකුගේ සථිකාර සූත්‍රයෙහි ජෝතිපාලගේ පැවිද්ද සඳහා බෝධිසත්ත්වයා කාශ්‍යප භගවත්හුගේ ධර්මයෙහි බැසගත් නියමය හැසුරුණු බඹසර යයි ලබ්ධිය, යම්සේ දැන් අන්ධකයන්ගේ මෙනි. ඔවුන් සඳහා **බොධිසතෙනා** යයි ඇසීම සකවාදියාගේය. ලබ්ධියෙහි සිට ප්‍රතිඥාව පරවාදියාගේය. එයින් යමකින් නියමය හෝ බ්‍රහ්මචර්‍යාව හෝ ආර්ය මාර්ගයට නමකි. බෝධිසත්ත්වයන්ට පාරමී ඤාණය හැර බැසගැනීමට වෙනත් නියමයක් නම් නැත. ඉදින් වන්නේ නම්, බෝසතාණෝ සෝවාන් ශ්‍රාවකයෙක් වන්නේය. එසේ නොවේ නම් හුදෙක් බුදුවරු ඔහුට තමාගේ ඤාණ බලයෙහි සිට මේ තෙමේ බුදුවන්නේ යයි ප්‍රකාශ කරති. එහෙයින් නැවත **බොධිසතෙනා** යයි අනුයෝගය සකවාදියාටය. පශ්චිම භවය සඳහා ප්‍රතික්ෂෙපය පරවාදියාටය. දෙවන ප්‍රශ්නයෙහි ජෝතිපාල කාලය සඳහා ප්‍රතිඥාව ඔහුටමය. **සාවකො හුත්වා** යනාදියෙහිද මෙම නයම වේ. **අනුසසවිකො** යනු අනුසසායෙන් (පරම්පරාවේ ඇසීමෙන්) ප්‍රතිවේධ කළ ධර්මය. පශ්චිම භවය සඳහා ප්‍රතික්ෂෙප ජෝතිපාල කාලයෙහි අනුස්සය සඳහා පිළිගනී. **අඤ්ඤං සත්ථාරං** යනු ආළාර ද රාමසුත්තද සඳහා කියන ලදී. **ආයසමා ආනන්දො** යනාදි බැසගැනීමේ නියමයෙන් ශ්‍රාවකයෝ වෙති. සෙසු අය බැසගැනීමේ නියමයෙන් මෙබඳු රූප නොවේ යයි දැක්වීමට කියන ලදී. **සාවකො ජාතිං විතිවතෙතා** යන යම් ජාතියකින් ශ්‍රාවකයා එය ඉකුත් කළ වෙනත් භවයක අන්‍ය භවයක ශ්‍රාවකයෙක් නොවේදැයි විචාරයි. පරවාදියා සෝවාන් ආදීන්ගේ සෝවාන් ආදි ශ්‍රාවක භවයෙන් ප්‍රතික්ෂෙප කරයි. මෙහි සෙස්ස පැහැදිලිය.

අපරාපි සමනනාගත කථා 40

දැන් තවද සමනනාගත කථා නම් වේ. එහි යමෙකුගේ සතරවැනි මාර්ගස්ථ පුද්ගලයා පැමිණි දහම් වශයෙන් ඵල තුනෙන් යුක්ත යයි ලබ්ධිය වේ. යම්සේ දැන් අන්ධකයින්ගේ මෙහි ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. මෙහි සෙස්ස යට සතර පලයෙන් යුක්ත කථාවෙන් කියන ලද නයින්ම දතයුතුය.

සංයෝජන පහාන කථා 41

දැන් සංයෝජන පහාන කථා වේ. එහි යමෙකුගේ නිෂ්පරියායෙන් සියළු සංයෝජන ප්‍රහානය රහත් යයි ලබ්ධි වේ. යම්සේ දැන් අන්ධකයින්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනිකාටය. නැවත **සබ්බෙ සංයොජනා** යයි විචාරණ ලද්ද යට කියන ලද නයින් ප්‍රහීනය සඳහා ප්‍රතික්ෂේප කරයි. සිව්වන මගින් අනවශේෂ ප්‍රහානය සඳහා පිළිගනී. සියළු තැන මෙම නය වේ.

සතරවන වර්ගය නිමි.

විමුතති කථා 42

දැන් විමුක්ති කථා නම් වේ. එහි විදර්ශනා, මාර්ගය, ඵලය ප්‍රත්‍යවේක්ෂා යයි සතර ඤාණය විමුක්ති ඤාණ නම් වේ. ඒවායින් විපස්සනා ඤාණය නිත්‍ය මිත්‍රාදීන් විසින් මුදන ලද හෙයින් තදංග විමුක්තිභාවයෙන් හෝ මුදන ලද බැවින් විමුත්ති ඤාණ වේ. මාර්ගය සමුච්ඡේද විමුක්ති වේ. ඵලය පටිපස්සද්ධි විමුක්ති වේ. ප්‍රත්‍යවේක්ෂා ඤාණය වනාහි විමුක්තිය දන්නේ යයි විමුක්ති ඤාණය වේ. මෙසේ සතරාකාර වූ විමුක්ති ඤාණයෙහි නිෂ්පරියායෙන් ඵල ඤාණයම විමුක්ති වේ. සෙසු විමුත්ත හෝ අවිමුත්ත හෝ නොකිව යුතුය. එහෙයින් මෙය නම් වූ විමුක්ති ඤාණය විමුත්ත යයි නොකියා අවිශේෂයෙන්ම විමුක්ති ඤාණය විමුක්තියයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ අන්ධකයින්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. නැවත යං කිඤ්චි යයි විචාරන ලද්දේ මාර්ග ඤාණයේ අනාශ්‍රව බව සඳහා පිළිගනී. යම් හෙයකින් වනාහි සෝතාපන්නයාගේ ඵලයෙහි සිටි ඒ ඤාණය නොවේ. එහෙයින් විමුක්තිය නොවේ යයි චෝදනාව පිණිස නැවත සකවාදියා **සොතාපනනසසා** යනාදිය කීය. මේ උපායෙන් සියළු තැන අර්ථය දතයුතුය.

අසෙකඛ කථා 43

දැන් අසෙකඛ කථා නම් වේ. එහි යම්හෙයකින් ආනන්ද ස්ථවිරාදීහු සේකයහ. 'භාග්‍යවතුන් වහන්සේ උදාරය' ආදි නයින් අසේක යයි දැනගනිති. නිසා සේකයන්ට අසේක ඤාණය ඇතැයි යම් අයගේ ලබ්ධිය, යම්සේ උත්තරාපථකයන් ගේ වැනි වේ. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. **ජානාති පසසති** යන මෙය තමා විසින් හදාළ දැනීම් වශයෙන් කියන ලදී. ගොතුභූතො යනාදිය යටම භූමියේ සිටියහුට ඉහළ ඉහළ ඤාණයේ අභාවය දැක්වීම සඳහා කියන ලදී. **නනු ආයසමා ආනන්දො සෙකඛා උළාරෝ භගවාති ජානාති** යයි පරවාදියා අශෛක්ෂයන් භාග්‍යවතුන් කෙරෙහි පැවතෙන බව යන එය අසේක ඤාණ යයි කැමති වේ. මෙය අසේක නොවේ. එසේ හෙයින් මෙසේ පිහිටි ලබ්ධිය නොපිහිටියා මෙනි.

විපරීත කථා 44

දැන් විපරීත කථා වේ. එහි යමෙක් මේ පඨවි කසිනයෙහි පඨවි යන සංඥාවට පැමිණේ. ඔහුගේ ඒ ඤාණය විපරීත ඤාණයකියි යමෙකුගේ ලබ්ධියයි. යම්සේ අන්ධකයින්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. පඨවිය නිසා උපන් නිමිත්තෙහි පඨවි නොමැත්තේමය. එහි ද මේ පඨවි සංඥාව ඇතැයි යන විපරීත ඤාණය මෙය යනු ඔහුගේ අදහසයි. එයින් සකවාදියා ලක්ඛණ පඨවි, සසම්භාර පඨවි, නිමිත්ත පඨවි, පඨවි දෙවියෝ ද යන සියල්ල පඨවිමය. ඒවා කෙරෙහි පඨවි යන ඤාණය විපරීත ඤාණය නොවේ. අනිත්‍යයෙහි නිත්‍යයයි ආදි විපර්යාස වනාහි විපරීත ඤාණ නම් වේ. කිම ඔහුට මේවායින් එක්තරා එකකින් චෝදනා කිරීමට අනිචෙව නිචවං යනාදිය කිය. පරවාදියා විපර්යාස ලක්ඛණ අභාවය සඳහා ප්‍රතික්ෂේප කරයි. පඨවි නිමිත්ත පිණිස පිළිගනී. **කුසලං** යනු ශෛක්ෂ පෘථග්ජනයින්ගේ ඤාණය සඳහා කියන ලදී. **අත්ථි අරහතො** යන ප්‍රශ්නයෙහි විපර්යාස ලක්ඛණ අභාවයෙන් ප්‍රතික්ෂේප කරයි. පඨවි නිමිත්ත සඳහා පිළිගනී. **සබෙබව පඨවි හොති** ඒ සියළු පඨවි කසිණය ලක්ඛණ පඨවියම වේදැයි විචාරයි.

සකවාදියා එසේ නොවීමෙන් ප්‍රතික්ෂේප කරයි. **නනු පඨවි අත්ථි අත්ථි ච කොචි පඨවිං පඨවිතො සමාපජ්ජති** යන විචාරීම සකවාදියාටය. එහි අර්ථය: නිමිත්ත පඨවිය ඇත නේද? පඨවියෙන්ම කිසියම් පඨවියක් ඇත්තේද? සමවදී. වැගිරීමෙන් හෝ උෂ්ණයෙන් හෝ නොවේ. පඨවි අත්ථි යනාදිය ඉදින් යම්සේ යමක් ඇත්ද, එයද සමවදින්නාට සියළු විපර්යාස සමූලඝාතනය කරන මාර්ග ඤාණයද ඔබට විපරීතදැයි දැක්වීමට කියන ලදී.

නියාමක කථා 45

දැන් නියාමක කථා නම් වේ. එහි යම් පුද්ගලයෙක් නිවැරදි නියම පිළිවෙළින් බැසගන්නේය. එය සුදුසුය. මේ ධර්මය අවබෝධ කරගැනීමට නියම පිළිවෙළින් නොවූ පෘථග්ජනයාවම යම්හෙයකින් භාග්‍යවතුන් වහන්සේ දනිද එහෙයින් සිහි පුද්ගලයාව නියම පිළිවෙළින් ඤාණය ඇතැයි ඇතමෙකු මේ ලබ්ධිය දරයි. යම්සේ දැන් උත්තරාපථකයින්ගේ මෙනි. ඔවුන් සඳහා **අනියතිසසා** යැයි විචාරීම සකවාදියාටය. එහි නියාමගමනාය යනු පිළිවෙළ මාර්ගය කියනු ලැබේ. මාර්ග ගමනය සඳහා මාර්ගයට බැසගැනීම සඳහා යන අර්ථය වේ.

ඔහුගේ යම් ඤාණයක් දැක බුදුහිමි මේතෙමෙ සුදුසු යයි දැනගනී. ඒ සඳහා ප්‍රතිඥාව පරවාදියාටය. ඉක්බිති සකවාදියා අයුක්තිවාදයයි ඔහුට දැක්වීමට **නියතසසා** යයි විපරීත අනුයෝගය කීය. එහි පළමු ප්‍රශ්නයෙහි නියත වූ පුද්ගලයාට අනියාගමනය පිණිස ඤාණයක් නම් නැතැයි ප්‍රතික්ෂෙප කරයි. දෙවැන්නෙහි නැති බැවින් පිළිගනියි. තුන්වැන්නෙහි අනියතයාගේ නැත්දැයි විචාරන ලද්දේ ලබ්ධි විරෝධයෙන් ප්‍රතික්ෂේප කරයි. නැවත පළමු ප්‍රශ්නයට සතරවැන්න කොට නියතයේ නියාම ගමනාදි වශයෙන් ප්‍රශ්න තුනක් කරන ලදී. ඒවායින් පළමුවැන්නෙහි යම්හෙයකින් ආදී මඟින් නියතයේ නැවත එම අරුත සඳහා ඤාණය නැත. එනිසා ප්‍රතික්ෂේප කරයි. දෙවැන්නෙහි නැති බැවින්ම පිළිගනී. තෙවැන්නෙහි ලබ්ධි විරෝධයෙන්ම ප්‍රතික්ෂේප කරයි. නැවත පළමු ප්‍රශ්නය අටවැනිකොට අනියතයේ අනියාගමන වශයෙන් ප්‍රශ්න තුනක් කරන ලදී. ඒවායේ අරුත් කියන ලද නයින්ම දතයුතුය. නැවත පළමු ප්‍රශ්නයම

දොළොස්වැන්න කොට එය මූලිකව **අත්‍ථි නියාමො** යනාදි ප්‍රශ්න කරන ලදී. එහි යම්හෙයකින් නියාමගමන පිණිස ඤාණය නම් මාර්ග ඤාණයම වේ. එහෙයින් ඒ සඳහා **අත්‍ථි නියාමො** යයි කියන ලදී. අනිත් තැනැත්තා වනාහි **නියතෙ** යයි කී කල්හි ප්‍රතික්ෂේප කරයි. ඤාණ යයි කී කල්හි පිළිගනී. සතිපට්ඨානාදියෙහි ද මෙම නයම වේ. ගොතුභූනො යනාදිය යමකින් යමකට නො පැමිණියේද එහි එය නැතැයි දැක්වීම සඳහා කියන ලදී. **භගවා ජානාති** යයි තමාගේ ඤාණ බලයෙන් දනියි. උත්වහන්සේගේ නියාම ගමන ඤාණ ස්වභාවයෙන් නොවේ. එහෙයින් මෙම කාරණයෙන් පිහිටන ලද ඔහුගේ ලබ්ධිය නොපිහිටියේ වේමය.

පටිසම්භිදා කථා 46

දැන් පටිසම්භිදා කථා නම් වේ. එහි යමෙකුගේ ආර්යයන්ගේ සියළු ඤාණම ලෝකෝත්තර යයි ගෙන සියළු ඤාණය ප්‍රතිසම්භිදාව යයි ලබ්ධි වේ. යම්සේ අන්ධකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. සම්මුති ඤාණ ප්‍රශ්නවල පඨවි කසිණ සම්මුතිය සමාපත්ති ඤාණය සඳහා ප්‍රතික්ෂේප කරයි. නිරුක්ති ඤාණය සඳහා පිළිගනී. **යෙ කෙචි සම්මුතිං** යන ප්‍රශ්නයේ පෘථග්ජනයන් සඳහා ප්‍රතික්ෂේප කරයි. චෙතොපරිය (අනුන් සිත් දන්න නුවණ) සඳහා ප්‍රතික්ෂේප කරයි. ආර්යයාගේ ඤාණය සඳහා පිළිගනී. **සබබා පඤ්ඤා** යන ප්‍රශ්නවල කසිණ සමාපත්ති ප්‍රඥාව සඳහා ප්‍රතික්ෂේප කරයි. ලෝකෝත්තරය සඳහා පිළිගනී. **පඨවි කසිණ සමාපතිං** යනාදි මේවායේ මෙපමණක යම් ප්‍රඥාවක්, කිම ඒ සියල්ල පටිසම්භිදා දැයි විචාරීම සඳහා කියන ලදී. **තෙන හි සබබං ඤාණං** යම්හෙයකින් සියළු ලෝකෝත්තර ප්‍රඥාව ප්‍රතිසම්භිදා වේ. එහෙයින් සියල්ල යන වචනය ශ්‍රමණ ඵල සමග පිහිටුවයි.

සම්මුති ඤාණ කථා 47

දැන් සම්මුති ඤාණ කථා නම් වේ. එහි සම්මුති පරමාර්ථ වශයෙන් සත්‍ය දෙකකි. යමෙක් වනාහි මෙසේ විභාග නොකොට සත්‍යය යන වචන සමානකමින් සම්මුති ඤාණය ද සත්‍ය අරමුණමයි කියති. යම්සේ අන්ධකයින්ගේ මෙනි. ඔව්හු අයුක්ති වාදීහු යයි ඔවුන්ගේ වාද විශෝධනය සඳහා මේ කථා ආරම්භ කරන ලදී. එහි **න වත්තබ්බං** යන විචාරීම සකවාදියාටය. පරමාර්ථ සත්‍ය සඳහා ප්‍රතිඥාව සකවාදියාටය. **සම්මුති සච්චමහි** යයි සත්‍යයෙහි සම්මුතිය ඇතුළු වූ. ප්‍රථමාවෙහි ආධාර විභක්තිය. සම්මුති සත්‍යය යන අර්ථයයි. **සම්මුති ඤාණං සච්චාරම්මණඤ්ඤව** යන විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. ඉන්පසු ඉදින් ඔහු එය අවශේෂයෙන් සත්‍ය අරමුණම යයි ද ඒ ඤාණයෙන් දුක් අවබෝධ ආදිය කරන්නේ දැයි චෝදනා කිරීමට තෙන ඤාණෙන යනාදිය කීය.

චිත්තාරම්මණ කථා

දැන් චිත්තාරම්මණ කථා නම් වේ. එහි චේතොපරියායෙහි ඤාණය යයි වචනය පමණක් ගෙන ඒ ඤාණය චිත්තාරම්මණම යයි යම් අයගේ ලබ්ධිය වේ. යම්සේ දැන් අන්ධකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. ඉක්බිති සරාගාදි වශයෙන් වූ ඔහුගේ සිත යමෙක් දැනගනී. ඔහුට රාගාදිය ද අරමුණු වේ. එනිසා නොකිව යුතුය. චිත්තාරම්මණ යයි එය චෝදනා කිරීමට **නනු අත්ථි** කොවි යනාදිය ඇරඹීය. **එසසාරම්මණෙ** යනු ස්පර්ශ සංඛ්‍යාත අරමුණෙහි වෙදනා රම්මණෙ ආදියෙහි ද මේ නයම වේ. නැවත **එසසාරම්මණෙ** ඤාණං න වත්තබ්බං යයි විචාරණ ලද්දේ ස්පර්ශයේ ස්පර්ශ ලක්ෂණය මෙනෙහි කරන්නාට ස්පර්ශ අරමුණ වේ යයි දැනගනී. මෙය කිම **එසස** පරියායෙ ඤාණං යයි විචාරණ ලද්දේ එබඳු වූ සූත්‍ර පදවල අභාවයෙන් ප්‍රතික්ෂේප කරයි. වේදනාදියෙහි ද මෙම නයයි. දැන් යමක් නිසා ලබ්ධිය වේද එයම දක්වා ලබ්ධිය පිහිටුවීමට **නනු චෙතො පරියාය ඤාණං** යයි කීය. එය වනාහි වචන මාත්‍රයෙන් පමණක් පිහිටියේ ද නො පිහිටියේ ම වේ.

අනාගත ඤාණ කථා 48

දැන් අනාගත ඤාණ කථා නම් වේ. එහි අනාගත නම් අතර ද අතරක් නැතිවද ඇත. ඒවායින් අතරක් නැති තැන ඒකාන්තයෙන් අතරෙහි මෙන් ඤාණයක් නැත. එක් චිත්ත වීථියක ජවන අතරද එසේය. එහි ඇතමෙක් සියළු තන්හි අනාගත ඤාණයක් කැමති වෙති. යම්සේ අන්ධකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. ඉක්බිති ඔහුට ඔබගේ අනාගතයෙහි යම් ඤාණයක්, කිම එයින් අතරක් නැති අනාගතය මූලාදි වශයෙන් දන්නේදැයි චෝදනා කිරීමට **අනාගතං මූලතො** යනාදිය කිය. එහි මූලතො ආදි සියල්ල කරුණු යන්නට සමාන වචන වේ. කරුණුවලින් තමාගේ යම් ඵලයක් කරයිද එය එහි මුල්වෙයි. පිහිටයි යනු මූලයයි. එයින් ද එය හිනයයි පවත්වයි යනු හේතු වේ. එයින් එය තබයි. ඒයි එය ගන්න යයි ගෙන යනු ලබයි යනු නිදාන වේ. එයින් එය ආරම්භ වෙයි යනු සම්භව වේ. එයින් ම එය ගනියි යනු ආහාර වේ. එයින් එය උදාවෙයි යනු සමුදය වේ යයි කියනු ලැබේ. යම්හෙයින් අනන්තර සිත මේ ආකාරයෙන් දැනගැනීමට නොහැකිය. එහෙයින් **න හෙවං** යයි ප්‍රතික්ෂේප කරයි. **අනාගතං හෙතුප්පවවයං** යයි අනනතර අනාගත සිතෙහි යම් හේතු ප්‍රත්‍යතාවක් වේ නම් එය දනීද? එහි යම් ධර්මයක් හේතු ප්‍රත්‍යයෙන් වේ නම් එය දනීද යන අර්ථයයි. සෙසු පදවලද මෙම නයයි. ගොතුභූනො යනාදිය යම්තැනක අනාගත ඤාණය ඇතිවේද එය ස්වරූප වශයෙන් දැක්වීමට කියන ලදී. පාටලී ප්‍රතතසස යන සූත්‍රය යම්තැනක අනාගත ඤාණය පහළවේද එය දැක්වීමට ගෙනෙන ලදී. යම්හෙයකින් වනාහි මේ සියල්ල අනාගත ඤාණයට සාධක නොවේ. එනිසා නොගෙනෙන ලද්දේමය.

පච්චුපපන්න ඤාණකථා 49

දැන් පච්චුපපන්න ඤාණ කථා නම් වේ. එහි ඇතැම් අයගේ සියළු සංස්කාරවල අනිත්‍ය වශයෙන්, දෘෂ්ටිවල ඤාණය ද අනිත්‍ය වශයෙන් දක්නා ලදැයි වචනය නිසා අවිශේෂයෙන් වර්තමාන ඤාණය ඇතැයි ලබ්ධිය වේ. යම්සේ අන්ධකයන්ගේ වැනි වේ. ඔවුන් සඳහා **පච්චුපපන්නෙන**

යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. ඉක්බිති ඔහු ඉදින් අවිශේෂයෙන් වර්තමාන ඤාණය ඇත. ක්ෂණ වර්තමානයෙහි ද එය විය යුතුය. මෙසේ ඇතිකල්හි ඤාණ දෙකක් එකවිට නොවීමෙන් ඒ ඤාණයෙන්ම එය දතයුතු වේ යයි චෝදනා පිණිස **තෙන** යන අනුයෝගය සකවාදියාටය. පිළිවෙළින් විනාශය දකින්නේ භංගානුපසසනාවෙන්ම භංගානුපසසනා ඤාණය බලයි යන අදහස වේ. **තෙන ඤාණෙන තං ඤාණං ජානාති** යනාදියෙහි ද මෙම නයම වේ. **තෙන එසෙන තං එසසං** යනාදිය ඔහුට පොඩි ඉඩක්වත් නොදීමට කියන ලදී. මෙයින් වනාහි යම් ලබ්ධි පිහිටුවීමක් සඳහා **නනු සබ්බ සංඛාරෙ** ආදිය කියන ලදී. එහි නය වශයෙන් ඒ ඤාණය දකින ලද්දේ වේ. අරමුණු අදහසින් යයි ප්‍රතිඥාව සකවාදියාට නොවේ. එහෙයින් මෙසේ ඔහුගේ පිහිටි ලබ්ධිය ද නොපිහිටන ලද්දේම වේ.

ඵලෙ ඤාණ කථා 50

දැන් ඵල ඤාණ කථා නම් වේ. එහි බුදුවරයෝ ද සත්ත්වයින්ගේ ආර්යඵල ප්‍රාප්තිය සඳහා දහම් දෙසති. ශ්‍රාවකයෝ ද එසේ දේශනා කරති. මෙසේ මේ සමානකමින් බුදුවරුන්ගේ මෙන් ශ්‍රාවකයන්ගේ ද ඒ ඒ සතුන් පැමිණවිය යුතු ඵලයෙහි ඤාණය ඇතැයි ඇතමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ අන්ධකයන්ගේ මෙනි. ඔවුන් සඳහා **සාවකසස** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. ඉක්බිති ඔහුට ඉදින් ශ්‍රාවකයාගේ ඵලයෙහි ඤාණය ඇතැයි, බුදුවරුන් මෙන් සමාන වේ නම්, සෝවාන් පලයෙහි, තමාගේ ඤාණ බලයෙන් මේ ඒකබීජය, මේ කෝලංකෝලය, මේ සත්තකඛත්තුපරම යයි ඔහුගේ පලාවබෝධය පනවන්නාහ. කිම ඔබගේ ශ්‍රාවකාය ද යයි චෝදනා පිණිස සාවකො ඵලසසකතං පඤ්ඤාපෙති යයි කීය. පරවාදියා ප්‍රතික්ෂෙප කරයි. **අත්ථි සාවකසස ඵලපරොපරියතති** යනාදි ඵලයෙහි ඤාණය ඇති බව ප්‍රත්‍ය විචාරීම සඳහා කියන ලදී. මෙහි අදහස මෙසේය. බුදුවරුන්ගේ මේ ඵලය හීනය. මේ ඵලය පළමුවය. මෙසේ ඵලයන්ගේ උසස් පහත්භාවය දැනීම් සංඛ්‍යාත ඵලයෙහි පරොපරියත්ති නම් නුවණක් ඇත. එසේම ඉන්‍ද්‍රිය, පුගල පරොපරියතති උන්වහන්සේලාට ඇති බැවින් ඒ ඒ පුද්ගලයන්ගේ ඒ ඒ ඉන්‍ද්‍රිය වශයෙන් ඒ ඒ ඵල දනිති. කිම ඔබගේ ශ්‍රාවකයාට ද මේ පරොපරියතති තිබේද? **අත්ථි සාවකසස බන්ධ පඤ්ඤතති** යනාදිය ද ඉදින් ඔබේ ශ්‍රාවකයාට

බුදුවරුන්ට මෙන් ඵලයෙහි ඤාණය ඇත්ද? මෙය ඔහුගේ පැමිණීම විය යුතුය. කිම උන්වහන්සේට මෙය නිබේද? මෙම පැණවීම් තමාගේ ඵලයෙන් දැනගැනීමට හෝ පැණවීමට ඔහුට/ශ්‍රාවකයාට හැකිවේ යයි චෝදනා පිණිස කියන ලදී. සාවකො ජිනොති ආදිය ඉදින් ශ්‍රාවකයාට බුදුවරුන්ට මෙන් ඵලයෙහි ඤාණය ඇත. මෙසේ ඇතිකල්හි හෙතෙමේ ම ජින වේයයි චෝදනා පිණිස කියන ලදී. සාවකො අනුපපනනසස යන ප්‍රශ්නයෙහි ද මෙම නයයි. අඤඤාණී යන ප්‍රශ්නයෙහි අවිද්‍ය සංඛ්‍යාත අඤඤාණයේ විනාශය නිසා ප්‍රතික්ෂේප කරයි. උන්වහන්සේට (ශ්‍රාවකයාට) බුදුවරුන්ට මෙන් ඵලයෙහි ඤාණය නැත. එහෙයින් පරවාදියාගේ වාදය නොපිහිටියේමය.

පස්වෙනි වර්ගය නිමි.
මහා පණ්ණාසකය නිමියෙය.

නියාම කථා 51

දැන් නියාම කථා නම් වේ. එහි **නියාම** යනු 'සුදුසු' කුසල ධර්මයන්හි සුදුසු බවට පැමිණීමට සමත් යන වචනයෙන් ආර්ය මාර්ගය කියයි. යම්හෙයකින් ඉපදී නිරුද්ධ වූ කල්හි ද පුද්ගලයෙක් අනියත නම් නොවේ. එහෙයින් හෙතෙමේ නියම වේ. නිති අරුතින් අසංඛත යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ අන්ධකයින්ගේ වැනි වේ. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. එයින් ඉදින් හෝ අසංඛත වේ නම් මෙබඳු ස්වරූපයෙන් ඔහු විය යුතු යයි දක්වන්නේ **නිබ්බානං** යනාදිය කීය. සංසන්දන විමසීම නොගැඹුරුය. **අත්ථි කොචි** යනාදිය නියාමයේ සංඛතභාවය දැක්වීමට කියන ලදී. මගෙහා අසංඛතො යන ප්‍රශ්නයෙහි ඔහුගේ ඉපදීම් නිරුද්ධවීම් භාවයෙන් ප්‍රතික්ෂේප කරයි. **නියාමො සංඛතො** යන ප්‍රශ්නයෙහි මාර්ගය නිරුද්ධ වූයේද නියාමයේ නිතිව සඳහා ප්‍රතික්ෂේප කරයි. **සොතාපත්ති නියාමො** යනාදි ප්‍රශ්නවලද අනුලෝම වශයෙන් ද ප්‍රතිලෝම වශයෙන් ද මෙම නයින්ම අර්ථය දතයුතුය. **පඤ්ච අසංඛතානි** යයි විචාරණ ලද්දේ පංච අසංඛතයන්ගේ පැමිණි ස්ථානයක් නොදක්නේ ප්‍රතික්ෂේප කරයි. දෙවනුව විචාරණ ලද්දේ සතර සම්මත නියමයන්ගේ නියාම වචනයෙන් නිවණේ ද අසංඛත භාවයෙන් පිළිගනී. **මිච්ඡත්ත නියාම** ප්‍රශ්නය නියාම වචන මාත්‍රයෙන් අසංඛත බවේ අයුතු බව දැක්වීම සඳහා කියන ලදී.

පටිච්ච සමුප්පාද කථා 52

දැන් පටිච්ච සමුප්පාද කථා නම් වේ. එහි යමෙකුගේ නිදාන වර්ගයෙහි 'තථාගතයන්ගේ ඉපදීම හෝ තථාගතයන්ගේ නො ඉපදීම හෝ ඒ ධාතු සිටියේ ම ධර්මය ස්ථිත යයි ආදි වචනයෙන් පටිච්ච සමුප්පාදය අසංඛත යයි ලබ්ධිය වේ. යම්සේ පුබ්බ සේලියන්ගේ සහ මහිංසාසකයන්ගේ වැනි වේ. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. **අවිජ්ජා සංඛතා** යනාදි ප්‍රශ්න අවිජ්ජා ආදියේ ම පටිච්ච සමුප්පාද බව දැක්වීම සඳහා කියන ලදී. යම්කෙනෙකුන් විසින් වනාහි මෙයින් එහි එක එක අංගය පටිච්ච සමුප්පාද යයි කියනු ලැබේ. එය පටිච්ච සමුප්පාද විභංගයෙහි කියන ලද්දේමය. **අවිජ්ජා පච්චයා සංඛාරාති** යා තස්ථ ධම්මට්ඨිතතා යනාදි යම් සූත්‍රයකින් ලබ්ධිය පිහිටියේය. එහිම අර්ථය දැක්වීමෙන් ලබ්ධිය බිඳීම සඳහා කියන ලදී. එහි අර්ථය මෙසේය. මෙය යට ඨිතාව සා ධාතු ධම්මට්ඨිතතා ධම්ම **නියාමතා** යයි කියන ලදී. අවිජ්ජාදියෙන් වෙන්ව එකක් නැත. අවිජ්ජාදිය වනාහි ප්‍රත්‍යවලටම නමකි. තථාගතයන් වහන්සේ උපන්නත් නූපන්නත් අවිද්‍යාවෙන් සංස්කාර ඇතිවේ. සංස්කාරාදියෙන් විඤ්ඤාණාදිය සම්භව වේ. එහෙයින් අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාර යයි මේ පදයෙහි සංස්කාර ධර්මවල හේතුවෙන් ස්ථිත වූයේ යයි ධම්මට්ඨිතතා වේ. ඒ ධර්මවලම හේතුවෙන් නියාම බව යයි ධම්ම නියාම බව අවිජ්ජා යයි කියනු ලැබේ. එය ද අසංඛතය. නිවණ ද අසංඛත යයි විචාරයි. පරවාදියා ලබ්ධි වශයෙන් පිළිගෙන නැවත දෙව අසංඛතානි යයි විචාරණ ලද්දේ සූත්‍ර අභාවයෙන් ප්‍රතික්ෂේප කොට ලබ්ධි වශයෙන්ම පිළිගනී. සෙසු පදවල ද මෙම නයමය. යට කියන ලද්දට සමානව මෙහි කියන ලද නයින්ම දැනගත යුතුය.

සච්ච කථා 53

දැන් සත්‍ය කථා නම් වේ. එහි යමෙකුගේ 'මහණෙනි, මේ සතර තථය, අවිතථය'යි සූත්‍රය නිසා සතර සත්‍ය අසංඛත යයි ලබ්ධියක් වේ. යම්සේ පුබ්බේසේලියන්ගේ වැනි වේ. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. එහි අදහස මෙසේය. දුක්ඛ සමුදය මාර්ගවල වස්තු සත්‍යය සංඛතය. ලක්ෂණ සත්‍යය අසංඛතය. නිරෝධයෙහි වස්තු

සත්‍යයක් නැත. එය අසංඛතමය. එහෙයින් **ආමන්තා** යයි කීය. එය වනාහි ලබ්ධි මාත්‍රයකි. හේ දුක් වස්තු සත්‍යය කැමති වේ. සමුදය මාර්ග දෙකද එසේය. මේවායේ යම් බාධා, ප්‍රභව, නෛර්යානික ලක්ෂණ ලක්ෂණ සත්‍යය නම් වේ. බාධන ලක්ෂණාදියෙන් වෙනත් දුකඛාදි නාම නැත. **නාණානි** යනාදියෙහි අදහස කියන ලද නයින්ම දතයුතුය. **දුකඛ සචචං** යන ප්‍රශ්නයෙහි ලබ්ධි වශයෙන් ලක්ෂණ සඳහා පිළිගනී. **දුකඛං** යන ප්‍රශ්නයෙහි වස්තු සඳහා ප්‍රතික්ෂෙප කරයි. මෙයින් පසු ශද්ධික ප්‍රශ්න ද සංසන්දන ප්‍රශ්නද සියල්ල පෙළ අනුසාරයෙන් ම දතයුතුය. ලබ්ධිය පිහිටුවීමට ගෙනෙන ලද සූත්‍රය අවසානයේ අර්ථයේ වැරදි ගැනීම නිසා නොගෙනෙන ලද්දක් මෙනි.

සචච කථා වර්ණනාව නිමි.

ආරුප්ප කථා 54

දැන් ආරුප්ප කථා නම් වේ. එහි යමෙකුගේ 'සතර ආරුප්ප ආනෙඤ්ජ' යයි වචනය නිසා ඒ සියළු ධර්ම අසංඛත යයි ලබ්ධි වේ. ඔවුන් සඳහා **ආකාසානඤ්චායතනං** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනිකාටය. මෙහි සෙස්ස නොගැඹුරු අරුත් ඇත්තේය. සාධක සූත්‍රය ද අරුත් නො දැන ගෙනෙන ලද බැවින් නොගෙනෙන ලද්දට සමාන වේමය.

ආරුප්ප කථා වර්ණනාව නිමි.

නිරෝධ සමාපත්ති කථා 55

දැන් නිරෝධ සමාපත්ති කථා නම් වේ. එහි නිරෝධ සමාපත්ති යනු ස්කන්ධ සතරේ නො පැවැත්මය. යම්හෙයකින් වනාහි එය කරනු ලබන්නේ කරයි. සමවදිනු ලබන්නේ සමවදියි. එහෙයින් නිෂ්පන්න යයි කියනු ලැබේ. සංඛත අසංඛත ලක්ෂණවල අභාවයෙන් සංඛත යයි හෝ අසංඛත යයි හෝ නොකිව යුතුය. එහි යමෙකුගේ යම් සංඛතයක් නොවේ. එහෙයින් අසංඛත යයි ලබ්ධිය වේ. අන්ධකයන්ගේ සහ උත්තරාපථයන්ගේ වැනි වේ. ඔවුන් සඳහා **නිරොධ සමාපනති** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව ඉතිරි අයටය. **උපපාදෙනති** යනාදි සමවදින ප්‍රතිලාභ වශයෙන්ම

කියන ලදී. යම්සේ වනාහි රූපාදිය සංඛත ධර්ම උපදවයි. එසේ එය වෙන කිසිවෙක් නූපදවයි. **නිරොධා වොදානං වුටඨානං** යයි ඵල සමාපත්ති දතයුතුය. අසංඛතවල එය නැත්තේමය. එනිසා ප්‍රතික්ෂෙප කරයි. **තෙනහී** යයි යම්හෙයකින් සංඛත නොවේ. එහෙයින් අසංඛත යයි ලබ්ධි වේ. මෙය වනාහි අසංඛත භාවයෙහි හේතු නොවේ යයි කියන ලද නමුත් නොකියන ලද්දට සමාන වේමය.

ආකාස කථා 56

දැන් ආකාස කථා නම් වේ. එහි පරිච්ඡේද, වසයෙන් ආකාස තුනක් දක්වයි. පරිච්ඡේදාකාස, කසිණුග්ඝාටි ආකාස, අජටාකාශ, යනුවෙන් හිස් අවකාස යනු ඊටම නමකි. ඒවායින් පරිච්ඡේද ආකාසය සංඛතය. ඉතිරි දෙක පැණවුම් මාත්‍රයකි. ඒ දෙකේ ම සංඛත නැති නිසා අසංඛත යයි ලබ්ධි වේ. උත්තරාපථයන්ගේ සහ මහිංසාසකයන්ගේ මෙනි. ඔවුන් සඳහා **ආකාසො** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. මෙහි සෙස්ස පැහැදිලිය.

ආකාස සනිදස්සන කථා 57

දැන් ආකාස සනිදස්සන කථා නම් වේ. එහි යමෙකුගේ කෙසි සිදුරුවල ඤාණය පැවතීම නිසා සියළු අජටාකාසය සනිදස්සන යයි ලබ්ධි වේ. අන්ධකයන්ගේ මෙනි. ඔවුන් සඳහා **ආකාසො සනිදස්සනො** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. ඉක්බිති ඔහු ඉදින් සනිදර්ශන වේද? මේ ආකාරයට වන්නේ යයි චෝදනාව පිණිස **රූපං** යනාදිය කියන ලදී. **චක්ඛුඤව පටිච්ච** යන ප්‍රශ්නවල මෙබඳු වූ සූත්‍රයක අභාවයෙන් ප්‍රතික්ෂේප කොට සමාන කිරීම් ආදිත් අවබෝධය නිසා පිළිගනී. **දිවනනං රුකඛානං අනතරං** යයි මෙහි ගසේ රූපය ඇසින් දැක අතරෙහි රූප අභාවයෙන් ආකාසයයි මනෝද්වාර විඤ්ඤාණය උපදී. චක්ඛු විඤ්ඤාණය නොවේ. සෙස්සෙහි ද මෙම නයයි. එනිසා මෙය සාධක නොවේ.

පඨවි ධාතු කථා 58

දැන් පඨවි ධාතු සනිදසසන යනාදි කථා නම් වේ. එහි යමෙකුගේ පහණ, දියරැලි, ගස් චලනය ද පසිඳුරන් පිහිටි ආකාසය ද වර්ණ ආයතනයද කාය විඤ්ඤත්ති කාලයෙහි අත් පා ආදි රූප දැක පඨවි ධාතු ආදිය සනිදර්ශන යයි ලබ්ධි වේ. අන්ධකයන්ගේ වැනි වේ. ඔවුන් සඳහා සියළු කථාවල මුලින් විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. සෙසු සියළු තැන පෙළ අනුසාරයෙන් ද යට කියන ලද නයින් ද දතයුතුය. පඨවි ධාතු සනිදර්ශනය ආදිකොට කාය කර්මය සන්දර්ශනය අවසාන කථා වේ.

සංගහිත කථා 59

දැන් සංගහිත කථා නම් වේ. එහි දාමාදියෙන් (දම්වැල් කඹ ආදිය) බලිවර්දයන් (ගොනුන්) මෙන් කිසියම් ධර්මවලින් කිසියම් ධර්මයක් සංගෘහීත නොවේ. එහෙයින් කිසියම් ධර්මවලින් සංගෘහිත කිසියම් ධර්මයක් නැත. මෙසේ ඇතිකල්හි 'එක් විධියකින් රූප සංග්‍රහය' යනු නිරර්ථකයයි යමෙකුගේ ලබ්ධිය වේ. රාජගිරිකයන්ගේ සහ සිද්ධාර්ථිකයන්ගේ මෙනි. ඔවුන් සඳහා වෙනත් අර්ථයකින් සංග්‍රහභාවය දැක්වීමට විචාරීම සකවාදියාටය. තමාගේ ලබ්ධි වශයෙන් ප්‍රතිඥාව පරවාදියාටය. දැන් සංග්‍රහ ලබන අර්ථය දැක්වීමට **නනු අත්ථි කෙචි ධම්මා** යනාදිය අරඹන ලදී. ඒ සියල්ල යට කියන ලද නයින් නොගැඹුරු වේ. පරවාදියා විසින් ලබ්ධිය පිහිටුවීම සඳහා යථා **දමෙන** වා යනාදි උපමා ගෙනෙන ලදී. සකවාදියා විසින් ඊට අසතුටුව ප්‍රතික්ෂේප නොකොට **හඤ්චි දාමෙන** වා යයි ඔහුගේ ලබ්ධිය බිඳින ලදැයි දතයුතුය. මෙහි අර්ථය මෙසේය. ඉදින් ඔබගේ දාමාදියෙන් බලිවර්දයන් සංගෘහීත (දම්වැල් ආදියෙන් ගොනුන් බඳිනම්) වේ නම් **කිසියම්** ධර්මවලින් කිසියම් ධර්මයක් සංගෘහිත වේමය.

සම්පයුත්ත කථා 60

දැන් සම්පයුත්ත කථා නම් වේ. එහි යම්හෙයකින් කලෙහි තෙල් මෙන් වේදනාදිය සංඥාදියෙහි ඇතුළත් වී නැත. එහෙයින් කිසි ධර්මයක් කිසියම් ධර්මවලින් යුක්ත වී නැත. මෙසේ පවතින විට, ඤාණ සම්පයුක්ත යනාදිය අරුත් සුන් වේ යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ රාජගිරික සිද්ධත්ථිකයන්ගේ මෙනි. ඔවුන් සඳහා අනිත් අර්ථයකින් ම සම්ප්‍රයුක්තය දැක්වීමට විචාරීම සකවාදියාටය. තමාගේ ලබ්ධි වශයෙන් ප්‍රතිඥාව පරවාදියාටය. මෙහි සෙස්ස යට කියන ලද නයින් දතයුතුය. පරවාදියා විසින් තලෙහි තෙල් උපමා ප්‍රශ්නය ගෙනෙන ලදී. එය වේදනා සඤ්ඤා මෙන් තල තෙල් ලක්ෂණයෙන් වෙනස්ය. සමාන නැත. තෙල් වෙන්කළ පසු තල යයි දෙයක් නැත. එනිසා උපමාව නොගෙනෙන ලද මෙනි.

චෛතසික කථා 61

දැන් චෛතසික කථා නම් වේ. එහි යම්හෙයකින් එසසිකාදිය නැත. එහෙයින් චෛතසිකයන් නොවිය හැකිය. මෙසේ චෛතසික ධර්ම නැතැයි යමෙකුගේ ලබ්ධියයි. යම්සේ රාජගිරික සිද්ධත්ථ ආදීන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. **සහජාතෝ** යනු සම්ප්‍රයුක්ත සහජාත සඳහා කියන ලදී. **එසසිකා** යනු එබඳු ව්‍යවහාරයක් නොදක්නාහුගෙන් විචාරීම සකවාදියාටය. කුමන ව්‍යවහාරයකින්ද? යම්සේ සිත ඇසුරු කරන චෛතසිකය. එය ද ස්පර්ශය නිශ්‍රිත වූ බැවින් එසසික යයි කී කල්හි දොසක් නැතැයි ප්‍රතිඥාව පරවාදියාගේය. සෙස්ස පැහැදිලිය.

දාන කථා 62

දැන් දාන කථා නම් වේ. දාන නම් ත්‍යාග චේතනාව. විරතිය හා දෙය ධර්මය යයි ත්‍රිවිධය. 'සද්ධා හිරියං කුසලඤ්ච දානං' යයි ආ තැන

ත්‍යාග චේතනාව දාන යයි. 'අභයං දෙති' පැමිණි තැන විරතිය ද 'දානං දෙති අන්නං පානං' ආ තැන දේය ධර්මය ද දාන වේ. එහි ත්‍යාග චේතනාවෙන් දෙයි හෝ දේය ධර්ම වේ. මෙයින් දේ නුයි හෝ දේය ධර්මය දාන වේ. අවඛණ්ඩනාර්ථයෙන්, කැපීම් අර්ථයෙන් දාන වේ. එය උපදින්නේ භය භෙරව සංඛ්‍යාත දුස්සීල චේතනා කපයි සිඳියි යනු ද දාන වේ. දෙන ලද දේ දේනුයි ද දාන වේ. මෙසේ මෙය ත්‍රිවිධ අර්ථයෙන්ද, චෛතසික ධර්ම සහ දෙය ධර්ම යයි ත්‍රිවිධ අර්ථයෙන් ද, චෛතසික ධර්ම සහ දෙය ධර්ම යයි ද්විධ අර්ථයෙන් ද දාන වේ. එහි යමෙකුගේ චෛතසික ධර්මයම දානයයි දේය ධර්ම දාන නොවේ යයි ලබ්ධිය වේ. යම්සේ රාජගිරික සිද්ධත්ථිකයන්ගේ මෙනි. ඔවුන් සඳහා **චෙතසිකො** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. ඉක්බිති එහුට දේය ධර්ම වශයෙන් චෝදනා කිරීමට **ලබ්භා** යයි විචාරීම සකවාදියාටය. ආහාරාදිය මෙන් එය දිය නොහැකි යයි ප්‍රතික්ෂේපය පරවාදියාටය. නැවත දැඩිකොට විචාරණ ලද්දේ **අභයං දෙති** යන සූත්‍රය වශයෙන් ප්‍රතිඥාව ඔහුටමය. එසඳ ප්‍රශ්නාදියෙහි වනාහි එසඬං දෙති යන ව්‍යවහාරය නොදක්නේ ප්‍රතික්ෂිප්තය. **අනිට්ඨඵලං** ආදිය අචේසික ධර්මයන්ට දාන භාවය දැක්වීමට කියන ලදී. අචේසික වූ ආහාරාදි දානය අනාගතයේ විපාක නොදේ. ඉෂ්ටඵල භව නියමය මෙයින් කියන ලදී. මෙහි අදහස මෙසේය. ඉදින් අචේතසික වූ ආහාර දානයක් වන්නේ ද හීන සිතින් අනිෂ්ට වූ කාන්ත නොවූ බෙත දෙන්නහුට කොසඹ බීජාදියෙන් මෙන් අනිෂ්ට වූ ම පල උපදවන්නේය. යම්හෙයකින් වනාහි මෙහි දියුණුව පැතිරවූ චාග චේතනාවෙන් දුන් දානය දේය ධර්ම අනිෂ්ඨ වුව ද ඉෂ්ට පලම වේ. මෙසේ පරවාදියා විසින් චෛතසික ධර්ම වූ දාන භාවයෙහි පිහිටවූ කල්හි සකවාදියා අනිත් පරියායකින් දේය ධර්මයේ දානභාවය සාධනය කිරීමට **දානං ඉට්ඨඵලං චුත්තං භගවතා** යනාදිය කීය. පරවාදියා වනාහි චීවරාදියෙය ඉෂ්ට විපාක නොදක්නේ ප්‍රතික්ෂේප කරයි. සූත්‍ර සාධනය පරවාදී වාදයේ ද සකවාදී වාදයේ ද යෙදේ. එක අර්ථයකින් නොවේ. **දෙය්‍ය ධම්මො ඉට්ඨඵලෝ** යයි ඉෂ්ටඵල භාවය පමණක් ප්‍රතික්ෂේප කරන ලදී. එහෙයින් තෙනහි න චත්තබ්බං යයි මෙහි ඉෂ්ටඵල භාවයෙන් ම නොකිව යුතු බව සුදුසුය. දිය යුතු අර්ථයෙන් දේය ධර්මය ද දානයම වේ. දාන දෙකේ ම සංකර බව මිදවීම් අර්ථයෙන් ම මේ කථා වේ.

පරිභොගමය පුඤ්ඤ කථා 63

දැන් පරිභෝගමය පුඤ්ඤකථා නම් වේ. එහි 'තෙසං දිවා ච රත්තො ච සදා පුඤ්ඤං පවඩ්ඪති' (ඔවුන් දිවා රෑ දෙකේම පින් වැඩේ) ද 'යසස හිකඛවෙ භිකඛු චීවරං පරිභුඤ්ජමානො' (මහණෙනි, යම් භික්ෂුවක් සිවුර පරිභෝග කරන්නේ) මේ ආදි සූත්‍ර නුනුවණින් ගෙන යමෙකුගේ පරිභෝගමය පින ඇතැයි ලබ්ධිය වේ. යම්සේ රාජගිරික සිද්ධත්ථික සම්මිතිකයන්ගේ මෙනි. ඔවුන් සඳහා **පරිභොගමයං** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. ඉක්බිති ඔහු පින් නම් එසසාදි කුසල දහමිය. එයින් පසුව නැත. එහෙයින් එසසාදිය ඔබ වැඩිය යුතුයයි චෝදනා කිරීමට **පරිභොගමයො එසෙසා** යනාදිය අරඹන ලදී. ඒ සියල්ල ප්‍රතික්ෂේප කරන ලද්දේ පරවාදියා විසින් නොවඩන ලද බැවිනි. **ලනා විය** මේ ආදි ක්‍රියාවෙන් හෝ භාවනාවෙන් හෝ වෙන්ව වැල් ආදිය තමාම වැඩේ. කිම ඔබගේ මෙසේ වැඩේදැ'යි චෝදනා පිණිස කියන ලදී. එසේ නොවැඩෙන බැවින් න හෙවං යයි ප්‍රතික්ෂෙප කරන ලදී. **න සමනනාහරති** යන ප්‍රශ්නයෙහි ප්‍රතිග්‍රාහකයන් ගේ පරිභෝගයෙන් පළමු චේතනාව වැඩේ. මෙසේ එය පින වේ යයි ලබ්ධි වශයෙන් පිළිගනී. ඉන්පසු **අනොවට්ඨනතසස** ආදියෙන් විචාරණ ලද්දේ දායකයාගේ ත්‍යාග චේතනාව සඳහා ප්‍රතික්ෂේප කරයි. එහි අනාවට්ඨනතසස යනු දාන චේතනාවෙන් පෙර හැසිරෙන ආවර්ජනයෙන් භවාංගය නොවැටුණ. **අනාභොගසස** නිරාභෝගියාගේ. අසමනනාහරනතසස සමනනාහර නොවූ (සිත එක අරමුණක නැති). ආවර්ජනයෙහි භවංගය සිඳ තමාගේ මාර්ගයෙහි උපදින දාන චේතනාව සිත එකඟ කරයි. සිතේ මේ කෘත්‍යයෙන් සිත එකඟ නොවූවහුට පින් වේදැයි විචාරයි. **අමනසිකරොනතසස** මෙනෙහි නොකරන්නහුගේ. ආවර්ජනයෙන් අනතුරුව උපදින්නේ මෙනෙහි කිරීම නම් වේ. මෙසේ කරන්නහුගේ යන අර්ථයයි. කරණ වචනයෙහි මෙය ආධාරයි. අචෙතනසස චේතනා නූපදවන්නහුගේ. **අපතෙථනතසස** ප්‍රාර්ථනා සංඛ්‍යාත ක-සල කැමැත්ත නොකරන්නහුගේ. **අපපණිදහනතසස** දාන චේතනා වශයෙන් සිත නො පිහිටුවන්නාගේ යන අර්ථය වේ. **නනු ආවටෙටනතසස** වාරයෙහි. **ආභොගසස** සිතා බලන්නාගේ. එසේ නැතහොත් ආභොගය මොහුටය. ආභෝගය හෝ අනතුරුව එය පින් වේය යනු අර්ථය වේ. **දවිනනං එසසානං** යනාදියෙහි ද එකවිට දායකයාගේ එසස දෙකක අභාවයෙන් ප්‍රතික්ෂේප කරයි. දායකයාගේ ද පරිභෝග

කරන්නාගේ දැයි දෙදෙනාගේ එසසාදිය සඳහා පිළිගනී. තව ද ඔහුගේ පංච විඤ්ඤාණයන්ගේ එකතුවීම ඇතැයි ලබ්ධිය වේ. ඒ අනුව ද පිළිගනී. ඉන් ඔහුගෙන සකවාදියා ප්‍රශ්නයක් අසයි. එහි ද කුසල අකුසලයන්ගේ එකවිට එක්කාසුවීමක් නොමැති හෙයින් ප්‍රතික්ෂේප කරයි. පරිභෝගමය සිත විප්‍රයුක්තව උපදීය යන ලබ්ධියෙන් පිළිගනී. ඉක්බිති ඔහුට සකවාදියා සූත්‍රයෙන් නිග්‍රහ කරයි. සූත්‍ර සාධනයෙහි ආරාම රෝපකාදීන්ගේ අනුස්සරණ ප්‍රතිසංස්කරණාදියෙන් අතරතුර උපදින පින සඳහා **යදා පුඤ්ඤං පවඩ්ඪති** කියන ලදී. **අපපමාණෙ තසස පුඤ්ඤානිසංසො** යන මෙය අප්‍රමාදව වාසය කරන්නහුට දෙන ලද ප්‍රත්‍යය බැවින් මෙබඳු වූ මාගේ සිවුර පරිභෝග කෙරේනුයි අනුමෝදනා වශයෙන් ද කියන ලදී. හේ එය පරිභෝගමය යයි සලකයි. යම්හෙයකින් ප්‍රතිග්‍රාහකයකු විසින් පිළිගෙන පරිභෝග නොකරන ලද දේය ධර්මයෙහි ද පින වේමය. එහෙයින් සකවාදි වාදයම බලවත් වේ. එහි **පටිගගාහකෙ පටිගගහිතෙ** යන පදයේ ප්‍රතිග්‍රාහකයකු විසින් පිළිගන්නා ලදැයි අර්ථය දතයුතුය. සෙස්ස පැහැදිලිය.

ඉතොදින්න කථා 64

දැන් ඉතෝදින්න කථා නම් වේ. එහි යමෙකුගේ 'ඉතො දිනෙනන යාපෙනති පෙතා කාලකතා තහිං' වචන නිසා මෙයින් යම් චීවරාදියක් දෙන ලද ද එයින්ම යැපෙති යන ලබ්ධිය යම්සේ රාජගිරික සිද්ධත්ථිකයන්ගේ මෙනි. ඔවුන් සඳහා **ඉතො දිනෙනන** යන විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. නැවත චීවරාදි වශයෙන් අනුයුක්ත වූයේ ප්‍රතික්ෂේප කරයි. **අඤ්ඤො අඤ්ඤසස කාරකො** අන්‍යයන්ට විපාක දෙන කර්මවල කාරකයා අනිකෙකි. තමාම තමාගේ කර්මය නොකරයි යනු කියන ලද්දේ වේ. මෙසේ විචාරණ ලද්දේ පරවාදියා සූත්‍ර විරෝධ භයෙන් ප්‍රතික්ෂේප කරයි. **දානං දෙනතනති** දානය දෙන්නේ දැක යන අර්ථය වේ. එහි යම්සේ තමාගේ අනුමෝදන්වීම නිසා එහි භෝග උපදී. එහෙයින් මේ කාරණයෙන් ඔහුගේ ලබ්ධිය පිනිටවූයේ ද නොපිහිටියේම වේ. ඔව්හු මෙයින් දෙන වස්තුවෙන් නො යැපෙති. සෙසු සූත්‍ර සාධනවල ද මෙම නයම වේ.

පඨවි කම්මවිපාක කථා 65

දැන් පඨවි කම්ම විපාක කථා නම් වේ. එහි යම්සේ 'අත්ථි ඉසසරිය සංවත්තනියං කම්මං ආධිපච්ච සංවත්තනියං කම්මං' යයි මෙහි ඉසුරුමතුන්ගේ සම්පත්, අධිපතීන්ගේ අධිපති බව නම්. පෘථිවි ඓශ්වර්ය, ආධිපත්‍ය පමුණුවන කර්මය ඇතැයි කියන ලදී. එහෙයින් ඇතමෙකුගේ පඨවිය කර්ම විපාකයකැයි ලබ්ධි වේ. යම්සේ අන්ධකයන්ගේ මෙනි. ඔවුන් සඳහා **පඨවි** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව ඉතිරි අයටය. **සසුඛවෙදනීයා** යනාදි කර්මවිපාක ස්වභාව දර්ශන වශයෙන් කියන ලදී. **එසෙසා හොති** යනාදී නයින් නිර්දිෂ්ට විපාකවල ස්පර්ශය සැප වේදනාදි ප්‍රභේද වේ. එය ද සංඥාදිය ද සැප වේදනාවලින් යුක්ත වූ වේදනාදිය සංඥාදියෙන් සියළු අරමුණු සහිත වේ. ඒවායේ පෙර හැසිරුණු ආවර්ජනාදි සංඛ්‍යාත ආවර්ජනා ද ඇත. චේතනා කර්ම ප්‍රත්‍ය වේ. යමක් එහි ඉෂ්ට විපාක වේ. ඔහුගේ ප්‍රාර්ථනා ප්‍රණිධාන වශයෙන් පවතින මූල තෘෂ්ණාවය. ඔබගේ මෙබඳු වූ පඨවියදැයි අසයි. පරවාදියා ප්‍රතික්ෂේප කරයි. ප්‍රතිලෝම විචාරීම් පැහැදිලිය. **කම්ම විපාකො පරෙසං සාධාරණො** යන ප්‍රශ්නයෙහි ස්පර්ශාදිය සඳහා ප්‍රතික්ෂේප කරයි. කර්මයෙන් හටගත් රූපයද පෘථිවි ආදීන්ගේ ද සාධාරණභාවය නිසා පිළිගනී. **අසාධාරණ මඤ්ඤසං** යන සූත්‍රය පරසමයෙන් ගෙන දක්වන ලදී. **සබෙබ සත්තා පඨවිං පරිභුඤ්ජති** යන ප්‍රශ්නයෙහි පෘථිවිය ආශ්‍රිත නිසා ප්‍රතික්ෂේප කරයි. නිශ්‍රිතය සඳහා පිළිගනී. **පඨවිං පරිභුඤ්ජිත්වා පරිනිබ්බායති** යන ප්‍රශ්නයෙහි ආරුප්පයෙහි පිරිනිවෙන්නවුන්ගේ වශයෙන් පිළිගනී. **කම්ම විපාකං අබෙපෙච්චා** මෙය පරසමය වශයෙන් කියන ලදී. කර්ම විපාක ගෙවා දමාම පිරිනිවන් පාන්නේය යනු ඔවුන්ගේ ලබ්ධියයි. ස්ව සමයෙන් වනාහි කරන ලද කර්මයෙන් උපන් විපාක නොගෙවා පිරිනිවුමක් නැත. ඔවුන්ගේ ලබ්ධියෙන් පඨවි සාධාරණ විපාක බැවින් උපන් විපාකයක්ම වේ. ඒ විපාකබවෙන් සිට එය නොගෙවා පිරිනිවීම අයුතු යයි චෝදනා කිරීමට වටී. පරවාදියා ලබ්ධි වශයෙන් ප්‍රතික්ෂේප කරයි. **චකකවතති සත්තසස කම්ම විපාකං** යන ප්‍රශ්නයෙහි අසාධාරණ ඵසසාදිය සඳහා ප්‍රතික්ෂෙප කරයි. සාධාරණය සඳහා පිළිගනී. පඨවි සමුද්‍ර සුරිය චන්ද්‍රිමා (පොළව, මුහුද, හිරු, සඳ) ආදිය සාධාරණ කර්ම විපාකයයි ඔවුන්ගේ ලබ්ධියයි. **ඉසසරිය සංවත්තනියං** මෙහි ඉසසරිය නම් බොහෝ ධනය ඇති බවයි. ආධිපච්ච යනු සෙසු ජනයින් තමාගේ වසයෙහි තබා ඔවුන් විසින් ගරු කළයුතු

ස්ථානයෙහි අධිපතිබව වේ. එහි කර්ම ප්‍රතිලාභ වශයෙන් එය පැමිණවීම නම් වේ. ඉපදවීම් වශයෙන් නොවේ. එහෙයින් විපාක අභාවයෙහි මෙය අසාධක වේ.

ජරාමරණ විපාක කථා 66

දැන් ජරාමරණ විපාක කථා වේ. එහි යමෙකුගේ '**අත්ථි දුබ්බණ්ණ සංවත්තනියං කම්මං අප්පායුක සංවත්තනියං කම්මං**' යි මෙහි දුබ්බණ්ණතා නම් ජරාය. අප්පායුකතා නම් මරණයයි. එය පමුණුවන කර්මද වේ. එහෙයින් ජරාමරණ යනු විපාකයකැයි ලබ්ධි වේ. යම්සේ අන්ධකයින්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. ප්‍රතිලෝම ප්‍රශ්නයෙහි **අනාරම්මණං** යනු රූප ධර්මයන්ගේ අනාරම්මණ ම වේ. අරූපයන්ගේ වනාහි ජරා මරණ සම්ප්‍රයෝග ලක්ෂණ අභාවය අනාරම්මණ ම වේ. **අකුසලානං ධම්මානං ජරාමරණං අකුසලානං ධම්මානං විපාකෝ** යන ප්‍රශ්නයෙහි ජරා මරණයෙන් නම් අනිෂ්ට විපාකයෙන් විය යුතුයයි ලබ්ධියෙන් පිළිගනී. එම කරුණින් ම කුසල ධර්මයන්ගේ ජරාමරණයේ කුසල විපාක බව ප්‍රතික්ෂේප කරයි. ඔහුගේ අකුසල විපාක බවම පිළිගනී. **කුසලානඤ්ච අකුසලානඤ්ච** මෙසේ විචාරීම් වශයෙන් එකතු කරන ලදී. ඒ ක්ෂණයෙහි එය නැත. අව්‍යාකෘත අවිපාකවල ජරාමරණ විපාකයයි කිවයුතු පරියායක් නැත. එහෙයින් අව්‍යාකතත වශයෙන් ප්‍රශ්න නො අසන ලදී. **දුබ්බණ්ණා සංවත්තනියං** යන මෙහි දුබ්බණ්ණ නම් අපිරිසිදු වර්ණතාවය. අප්පායුකතා නම් ආයුෂය කලක් පැවතීමට අසමර්ථ බවයි. එහි අකුසල කර්මය කර්මයෙන් නිපන් දුර්වර්ණ රූපයට කර්ම ප්‍රත්‍යය වේ. අසමාන බැවින් එය විපාක නොවේ. ඍතුවෙන් හටගත් ආදි භේදයෙන් එය ප්‍රතිලාභ වශයෙන් ආයුෂය ද උපචෙය්ද වශයෙන් ප්‍රත්‍ය වේ. මෙසේ මෙය පරියාය වශයෙන් එය පැමිණවීම නම් වේ. එසසාදීන්ගේ මෙන් ජනක වශයෙන් විපාක නැත. එහෙයින් විපාක භවයෙහි සාධක නැත. මෙහි සෙස්ස යට කියන ලද්ද හා සමානය.

අරිය ධම්ම විපාක කථා 67

දැන් අරියධම්ම විපාක කථා නම් වේ. එහි යමෙකුගේ ශ්‍රමණඵලය කෙළෙස් නැතිකිරීම සඳහා පමණය. චිත්ත චෛතසික ධර්ම සඳහා නොවේ යයි ලබ්ධි වේ. යම්සේ අන්ධකයන්ගේ මෙනි. ඔවුන් සඳහා **අරියධම්ම විපාකො** යයි විචාරීම සකවාදියාටය. එහි **අරියධම්ම විපාකො** යයි විචාරීම සකවාදියාටය. එහි **අරියධම්ම විපාකො** යනු මාර්ග සංඛ්‍යාත ආර්ය ධර්මයේ විපාකය කෙලෙස් ක්ෂය කිරීමම පමණක් වූ ආර්ය ඵලය යයි ලබ්ධියෙන් ප්‍රතිඥාව පරවාදියාටය. **සාමඤ්ඤං** ශ්‍රමණභාවයයි. මෙය මාර්ගයට නමකි. 'මහණෙනි, ඔබට සාමඤ්ඤය ද, සාමඤ්ඤ ඵලය ද දෙසමි.' යයි කියන ලදී. බ්‍රහ්මඤ්ඤයෙහි ද මෙම නයයි. **සොතාපත්තිඵලං න විපාකො** යනාදියෙහි සෝවාන් මාර්ගාදියේ අපචයගාමී බව සඳහා ආර්ය ඵලවල අවිපාක බව පිළිගනී. දානපලාදිය ප්‍රතික්ෂේප කරයි. එය ආචයගාමීන්ගේ අර්ථය මෙසේ දරයි :- විපාක සංඛ්‍යාත ආචය යයි, රැස්කළ බැවින් එය හෝ යයි යනු ආචයගාමිනො වේ. විපාකය විනාශ කරමින් යයි යනු අපචය ගාමිනො වේ. එහෙයින් මෙසේ පිළිගැනීම ද ප්‍රතික්ෂේප ද වේ. **කාමාවචරං කුසලං සවිපාකං ආචයගාමී** යනාදිය විචාරීම පරවාදියාගේය. ප්‍රතිඥාව ද ප්‍රතික්ෂේපය ද සකවාදියාගේ ය. ලෞකික කුසලවිපාක චුති පටිසන්ධිය ද සසර ද රැස්කරමින් යන්නේනුයි ආචයගාමී වේ. ලෝකෝත්තර කුසලය චුති පටිසන්ධිය ද සසරද විනාශ කරමින් යන්නේය යනු අපචයගාමී වේ. මෙසේ මෙය විපාක සහිත වේ. අපචයගාමී වචනයෙන් පමණක් අවිපාක නොවේ. මෙහි මේ අර්ථය සකදාගාමී ප්‍රතිඥාව ද ප්‍රතික්ෂේපය ද දතයුතුය.

විපාක ස්වභාව ධර්ම කථා 68

දැන් විපාක විපාක කථා නම් වේ. එහි යමෙකුගේ විපාකය අඤ්ඤමඤ්ඤාදි ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ. එහෙයින් විපාකය ද විපාකධම්ම ධම්ම යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ අන්ධකයින්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. **තස්ස විපාකො** යනු ඔහුගේ විපාක ස්වභාව ධර්මයාගේ විපාකයේ යම් විපාකයක්. එය ද ඒ විපාක ස්වභාව ධර්මය වේ යයි විචාරයි. පරවාදියා අනාගත

විපාක දෙන බව සඳහා ප්‍රතික්ෂේප කරයි. දෙවනුව විචාරණ ලද්දේ ඒ ප්‍රත්‍යය ද අනිත් විපාකයක නිපැත්ම සඳහා පිළිගනී. මෙසේ පවතිනවිට, කුසල අකුසලයන් ගේ මෙන් ඒ විපාකයේ ද විපාක වේ. ඒ විපාකයේ ද සසර සිඳ නො දැමීමට පැමිණේදැයි විචාරණ ලද්දේ සමය විරෝධ බියෙන් ප්‍රතික්ෂේප කරයි. **විපාකො වා** යනාදියෙහි වචනවල ඉදින් විපාකයේ විපාක ස්වභාව ධර්මයෙන් එක් අරුතක් බව වන්නේය. කුසල අකුසල අව්‍යාකෘත එක් අරුත් බවට පැමිණෙන්නේය යන්න ප්‍රතික්ෂේප කරයි. **විපාකොව විපාක ධම්මධම්මොව** යන මෙහි අදහස මෙසේය. එය සිවු විපාක ස්කන්ධවල එක එකක් අඤ්ඤ මඤ්ඤ ප්‍රත්‍යවල ප්‍රත්‍යය අර්ථයෙන් විපාක ස්වභාව ධර්මය වර්තමාන අර්ථයෙන් ද විපාකය සිතන්නේ විපාකය විපාක ස්වභාව ධර්ම යයි විචාරණ ලද්දේ ආමනතා යයි පිළිගනී. ඉක්බිති ඔහු සකවාදියා යම්හෙයකින් ඔබ විසින් ඒකඤ්ඤයෙහි ස්කන්ධ සතරෙහි විපාකය ද විපාක ස්වභාව ධර්මය ද අනුදන්නා ලදී. එහෙයින් ඒවායේ සහගත ආදි බවට පැමිණේ යයි චෝදනා කිරීමට මෙසේ කීය. පරවාදියා කුසලාකුසල සංඛ්‍යාත විපාක ස්වභාව ධර්මය සඳහා ප්‍රතික්ෂේප කරයි. **නඤ්ඤත්ථව අකුසලං** යයි ඉදින් ඒ විපාක ස්වභාව ධර්මය යම් අකුසල් විපාකයක් නම් එය අකුසල් වේ. කුමක් හෙයින්ද? විපාක ස්වභාව ධර්මයන් එක්කළ බැවිනි. **නඤ්ඤත්ථව කුසලං** යනාදියෙහි ද මෙම නයම වේ. **අඤ්ඤමඤ්ඤ පච්චයා** යන මෙය සහජාතයන්ගේ ප්‍රත්‍යය මාත්‍ර වශයෙන් කියන ලදී. ඒවායේ විපාක නැත. විපාක ස්වභාව ධර්ම ද නැත.

ගති කථා 69

දැන් ගතිකථා නම් වේ. එහි අසුරකාය සමග ගති භයකැයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ අන්ධකයන්ගේ ද උත්තරපථකයන්ගේ වැනි වේ. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව පරවාදියාටය. ඉක්බිති ඔහුට සකවාදියා 'සාරිපුත්‍රයෙනි, ගති වනාහි පහකි' යයි ලෝමහංසන පරියායෙහි (ධර්මය විස්තර කරන පිළිවෙළ) පිරිසිඳ දැක්වූ ගතීන්ගේ වශයෙන් චෝදනා කිරීමට **නනු පංචගතියො** යනාදිය කීය. පරවාදියා සූත්‍රවිරෝධ බියෙන් පිළිගනී. එහෙයින් සකවාදියා ගති සය

නොපිළිගත්තේ කුමක් හෙයින්ද? 'චතූහපායෙහි ච විප්පමුත්තො' (සිව් අපායෙන් මිදුණු) මෙහි අසුරකාය ද ගන්නා ලද්දේ නොවේද? නැත. වෙනම නැති හෙයිනි. අසුරකායෙහි කාකඤ්ඡික අසුරයෝ ප්‍රේත ගතියෙහි සංග්‍රහ කරනු ලැබූහ. වෙපචිත්ති පිරිස දේව ගතියෙහි සංග්‍රහ කරනු ලැබූහ. අසුරකාය යයි එක් ගතියක් නම් වෙනම නැත. දැන් එකම අර්ථය දැක්වීමට **නනු කාලකඤ්ඡිකා** යයි ආරම්භ කරන ලදී. එහි **සමාන වණ්ණා** සමාන රූප සටහණ. **බිභච්ඡ** විරූප, බලන්න බැරි. **සමනාහාර** - කෙල සොටු ලේ ආදි සමාන ආහාර. **සමාන භොග** - සමාන මිතුනු දම් හැසිරීම්. **සමානායුකා** සමාන ආයුෂ කාල ඇති. **ආවාහ විවාහං** කන්‍යාවන් පාවා ගැනීම සහ කන්‍යාවන් පාවා දීම. යහපත් පැත්තේ:- **සමාන වණ්ණා** සමාන රූප සටහණ, අභිරූප පැහැපත දර්ශනීය ප්‍රභා සම්පන්න වේ. **සමාන භොග** සමාන පස්කම් සුව. **සමානාහාර** සුභෝජනාදි ආහාර. සෙස්ස කියන ලද නය අනුව. නනු අපි අසුරකායෝ? මෙය අසුරකායමම සාධකයකි. එහි වෙනම ගති වෙන්කිරීමක් වෙනම නැති නිසා ගති සාධක නැත.

අනතරාභව කථා 70

දැන් අන්තරාභව කථා වේ. එහි යමෙකුගේ 'අනතරා පරිනිබ්බායි' සූත්‍ර පදය නුනුවණින් ගෙන අන්තරා භවයක් ඇත. දිවැසක් නැතිව දිවැසක් ඇත්තා මෙන් ඍද්ධියක් නැතිව ඍද්ධියක් ඇත්තා මෙන් මාපිය සමාගමය ද ඍතු කාලය ද බලමින් සත් දිනක් හෝ අතිරේක සත්දිනක් හෝ සිටිනු ලැබේ යන ලබ්ධි වේ. යම්සේ පුබබසේලියෝ ද සම්මිතියෝ ද මෙනි. ඔවුන් සඳහා **අත්ථි** යන විචාරීම සකවාදියාටය. ලබ්ධියෙහි පිහිටා ප්‍රතිඥාව පරවාදියාටය. ඉක්බිතිව ඔහුට භාග්‍යවතුන් වහන්සේ තුන් භාවයක් දේශනා කරන ලදහ. ඒ දේශනාව අනුව චෝදනා කිරීමට **කාම භවො** යනාදිය කීය.

එහි අදහස මෙසේය. ඉදින් ඔබේ අන්තරා භව නම් භවයක් ඇත්නම් එය කාමාදි භවවලින් අනිකක් විය යුතුය. පංචවෝකාර (ස්කන්ධ පහක් ඇති) භව මෙනි. එහෙයින් ඔබ අසමි. කුමක් ද ඔබේ මේ අන්තරා භවය? එය කාමභවයද? නැතහොත් රූප අරූප භවද? පරවාදියා ඒවා

කැමති නොවන්නේ ප්‍රතික්ෂේප කරයි. කාමභවය ද ආදි අන්තරා භවයක් ඉදින් ඇත්නම් සීමා දෙකක් අතර වන්නේ යයි චෝදනා කිරීමට ඇරඹන ලදී. පරවාදියා වනාහි එසේ කැමති නොවන්නේ සියළු ප්‍රශ්න ප්‍රතික්ෂේප කරයි. සහධර්මයෙන් නොව ලබ්ධියෙනි. එනිසාම සකවාදියා **නො වත රෙ** යයි වළක්වයි. **පඤ්චමී සා යොනී** යනාදිය ද යම්සේ පර සිදුණු යෝනි ආදියෙහි ද හෝ එකතු කිරීමට නොයයි. ඉක්බිති එයින් ඉන් ඉන් අතිරේකයෙන් විය යුතු යයි චෝදනා කිරීමට කියන ලදී. **අනතරාභවූපගං කමමං** යයි ඉදින් එය ද එක් භවයෙකි. කාම භවයේ උපදින කර්මාදිය ඇතැයි ශාස්තෘන් වහන්සේ විසින් දක්වන ලදී. මෙසේ එහි ඉපදීම කර්මයෙන් විය යුතුයයි චෝදනා පිණිස කියන ලදී. යම් හෙයකින් අන්‍ය සමයෙහි අන්තරාභවයට යන වෙන්වූ කර්මයක් නැත. යම් යම් භාවවල උපදින්නේ ඒ භවවලට අයත් කර්මයෙන් අන්තරා භවයෙහි උපදින්නේය යනු ඔවුන්ගේ ලබ්ධියකි. එනිසා **න හෙවං** යයි ප්‍රතික්ෂේප කරන ලදී. **අත්ථි අනතරා භවූපගා සත්තා** යයි විචාරණ ලද්දේ ද ඔවුන් කාමභවයට ම පැමිණෙය යන ලබ්ධියෙන් ප්‍රතික්ෂේප කරයි. **ජායතිති** යනාදිය අසන ලද්දේ ද එහි ඉපදීම ජරාවට යෑම මරණය මෙන්ම චුති ප්‍රතිසන්ධි කැමති නොවන්නේ ප්‍රතික්ෂේප කරයි. රූපාදි වශයෙන් විචාරණ ලද්දේ ද අන්තරා භව සත්ත්වයා නොපෙනේ. අනිත් සතුන්ගේ මෙන් රූප වේදනාදිය ඕලාරික නොවේයයි ඔහුගේ ලබ්ධියයි. එනිසා ප්‍රතික්ෂේප කරයි. මේ කාරණයෙන් ම පංචවෝකාර භව භවයෙහි ද ප්‍රතික්ෂේප දතයුතුය.

දැන් **කාමභවො ගති** යනාදි භව සංසන්දනය වේ. එහි අදහස මෙසේය. ඉදින් ඔබේ අන්තරා භවය කිසියම් ගති භාවයක වන්නේය. කාම භවාදියෙහි භවගති ආදි භේද ලැබේ. එසේ එහිද ලැබේද? යම්සේ එහි නොලැබේ නම් මෙහි ද නොලැබේ. සමාන භව භවයෙහි ඒවායේ විශේෂ විභාග ඇත. ඉතිරියෙහි (අන්තරා භවයෙහි) නැත. එහි විශේෂය කුමක්ද? පරවාදියා ලබ්ධි වශයෙන් ඒ ඒ දේවල් පිළිගන්නේ ද? ප්‍රතික්ෂේප කරන්නේ ද වේ. **සබ්බ සඤ්ඤාසඤ්ඤව සත්තානං අත්ථි අනතරා භවො** විචාරණ ලද්දේ යම්සේ නිරයට පැමිණි අසඤ්ඤ සත්තයට පත් අරූපයට පත් සතුන්ගේ අන්තරා භවය කැමති නොවේ. එහෙයින් ප්‍රතික්ෂේප කරයි. **ඒ කරුණින්ම ප්‍රතිලෝමයෙහි පිළිගනී. අනනතරිකසස** යනාදි යමෙකුගේ **ඒ අන්තරාභවය කැමති නොවේ. ඒවා** බෙදා දැක්වීමට කියන ලදී. **සූත්‍ර සාධනය** සමග ඒ සියල්ල පෙළ අනුසාරයෙන් දතයුතුය.

කාම ගුණ කථා 71

දැන් කාමගුණ කතා නම් වේ. එහි ස්ව සමයෙහි කාමධාතු යයි වස්තු කාමය ද ක්ලේශ කාමය හා කාමභවය ද කියනු ලැබේ. මේවායෙහි වස්තුකාමය ප්‍රිය වූ අර්ථයෙන් කාම නම් වේ. ස්වභාවයෙන් ආත්මයක් නැති ශූන්‍ය අර්ථයෙන් ධාතු යයි කාමධාතු වේ. ක්ලේශ කාම ප්‍රිය වූ අර්ථයෙන් මෙන්ම ගමන් කිරීම් අර්ථයෙන් ද කාම වේ. කාම භවය ප්‍රිය වූ අර්ථයෙන් ගමනාර්ථයෙන් වස්තු කාම පවත්නා දේශ අර්ථයෙන් යන තුන් ආකාරයකින් කාම වේ. කියන ලද අර්ථයෙන්ම ධාතු කාමධාතු වේ. පරසමයෙහි වනාහි 'මහණෙනි, මේ කාම ගුණ පහකි.' යන වචන මාත්‍රයෙන් පංචවිධ කාම ගුණ කාම ධාතු යයි ගන්නා ලදී. එහෙයින් යමෙකුගේ මේ ලබ්ධිය වේ. යම්සේ දැන් පුබ්බසේලියන්ගේ මෙනි. ඔවුන් සඳහා කාමධාතු නානත්වය අවබෝධ කරවීමට **පඤ්චව වා** යයි විචාරීම සකවාදියාටය. ලබ්ධි වශයෙන් ප්‍රතිඥාව අනෙකාටය. **නනු අත්ථි** යනාදිය ක්ලේශ කාමය දැක්වීමට කියන ලදී. එහි **තපපටිසංයුත්තෙනා** කාම ගුණයෙන් යුක්ත කාම ගුණ අරමුණුය යන අර්ථය වේ. **නො චත රෙ චතතබෙබ පඤ්චව වා** යන මේවායෙහි ඒ හා සම්බන්ධ කැමති වනවිට පස්කම් ගුණම කාමධාතු යයි නොකිව යුතුය. ඡන්දාදිය ප්‍රිය වූ අර්ථයෙන් කාම ද ධාතු ද කාමධාතු වේ. ගමනාර්ථයේ ද කාම සංඛ්‍යාත ධාතු ද කාමධාතු යන අර්ථය වේ. **මනුසසානං චකබු** යනාදිය වස්තුකාම දැක්වීමට කියන ලදී. පරවාදීහු ආයතන සයම වස්තුකාම භවයෙන් ප්‍රතික්ෂේප නොකොට නැවත මනෝ යයි විචාරණ ලද්දේ මහගත ලෝකෝත්තර සඳහා කාමධාතු භාවය පිළිනොගනී. යම්හෙයකින් තෙභූමික සියළු මනස කාමධාතුමය. එහෙයින් ඔහු සකවාදියා සූත්‍රයෙන් නිග්‍රහ කරයි. **කාමගුණා භවො** යනාදි භවයේ කාමධාතු භාවය දැක්වීමට කියන ලදී. යම්සේ වනාහි කාමගුණය පමණක් භවයයි ව්‍යවහාර නොවේ. එහෙයින් පරවාදියා න හෙවං යයි ප්‍රතික්ෂේප කරයි. **කාම ගුණූපගං කම්මං** යනාදි සියල්ල කාම ගුණයට පමණය. කාමධාතු භවය දැක්වීම සඳහා නොවේ. කාමධාතු සංඛ්‍යාත කාමභවයට පැමිණීමේ කර්ම ඇත. කාමභවයට පැමිණෙන සත්ත්වයෝ වෙති. එහි උපදිති දිරති මැරෙති සැවති උපදිති වන්නේ කාම ගුණයෙහි නොවේ. මේ උපායෙන් සියළු අර්ථය දතයුතුය.

කාම කථා 72

දැන් කාමකථා නම් වේ. එහි යමෙකුගේ 'මහණෙනි, මේ පංච කාමගුණයෝ' යන වචනය පමණක් නිසා රූපාදි පංච ආයතන කාම යයි ලබ්ධිය වේ. යම්සේ පුබ්බසේලියන්ගේ මෙනි. ඔවුන්ගේ ක්ලේශ කාමයාගේම නිෂ්පරියායෙන් කාමභවය දැක්වීමට **පඤ්ච** වා යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. මෙහි සෙස්ස නොගැඹුරු අරුත් වේ.

රූපධාතු කථා 73

දැන් රූපධාතු කථා නම් වේ. එහි රූපී ධර්ම රූපධාතු නම් යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ අන්ධකයින්ගේ මෙනි. ඔවුන් සඳහා **රූපිනො** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහු සකවාදියා යම්සේ රූප ධාතු රූප නම් රූප භවය වේ. රූප මාත්‍රය පමණක් නොවේ. එහෙයින් මෙයින් චෝදනා කිරීමට **රූප භවො** යනාදිය කීය. ඒ සියල්ල කාමගුණ කථාවෙහි කියන ලද නයින්ම දත යුතුය. යාව **කාම ධාතු** යයි විචාරණ ලද්දේ භූමි පිරිසිදීමෙන් විරෝධය දකින්නේ ප්‍රතික්ෂෙප කරයි. නැවත දැඩිකොට විචාරණ ලද්දේ තමාගේ ලබ්ධි වශයෙන් පිළිගනී. මෙසේ ඇතිකල්හි භව දෙකකින් යුක්ත බවට පැමිණේ. එයින් සකවාදිසා ඔහුට **කාම භවෙන** යනාදිය කීය. අනෙකා එකකුගේ භව දෙකකින් යුක්තභාවයෙන් ප්‍රතික්ෂෙප කරයි.

අරූප ධාතු කථා 74

අරූප කථාවේද මේ උපායෙන් අර්ථය දතයුතුය. අරූප ධර්මවල වනාහි වේදනා ස්කන්ධයට ගෙන **වෙදනා භවො** යයි මෙහි යනාදි නයින් දේශනා කරන ලදී. එහි ඔබගේ අරූපී ධර්ම සංඛ්‍යාවට ගියේ වේදනාවලින් එක්තරා එකක් වේ යයි මෙසේ අර්ථය දතයුතුය. සෙස්ස යට කියන ලද නයින්ම දැනගත යුතුය.

රූප ධාතුවේ ආයතන කථා 75

දැන් රූපධාතුවේ ආයතන කථා නම් වේ. එහි යමෙකුගේ 'සියළු අඟපසඟ අභිනන්දිය මනෝමය රූපී වේ' යන සූත්‍රය නිසා බ්‍රහ්මයින්ගේ ඝාන ආදි නිමිති ද ආයතනම වේ යයි කල්පනය කොට ඔවුන්ගේ ආත්මභාවය සළායතනිකයයි ලබ්ධි වේ. යම්සේ අන්ධකයන්ගේ ද සම්මිතිකයන්ගේ ද වැනි වේ. ඔවුන් සඳහා **සළායතනිකො** යයි විචාරීම සකවාදියාටය. ලබ්ධි වශයෙන් ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට එහි ආයතන නැත යනුවෙන් චෝදනා කිරීමට **අත්ථි තත්‍ර ඝානායතනං** යනාදිය ආරම්භ කරන ලදී. එයින් පරවාදියා එහි අධ්‍යාත්මික ඝානාදි ආයතන තුනේ සටහන් නිමිති, ඒවාම ආයතනයයි ලබ්ධියෙන් පිළිගනී. බාහිර වූ ගන්ධාදි ආයතන වශයෙන් විචාරණ ලද්දේ ඝාන ප්‍රසාද ආදිය එහි කැමති නොවේ. එහෙයින් ඒ ගෝචරය ඉවත් කරන්නේ ප්‍රතික්ෂෙප කරයි. ප්‍රතිලෝම ප්‍රශ්න සංසන්දන ප්‍රශ්නයෙහි දී මේ උපායෙන් අර්ථය දතයුතුය. **අත්ථි ඝානායතනං අත්ථි ගන්ධායතනං තෙන ඝානෙන ගන්ධං ඝායති** යයි ඒ පරසමයෙහි ඇතැම් ආචාර්යයන් සඳහා කියන ලදී. ඔව්හු වනාහි එහි අධ්‍යාත්මික ආයතන සම්පූර්ණ යයි කැමති වෙති. ආයතන කෘත්‍ය සහිත විය යුතු යයි ඒ ඝානාදියෙන් ඒ ගන්ධාදිය ඝානය කරති සාධනය කරති ස්පර්ශ කරති යයිද කැමති වෙති. ඒ ලබ්ධිය සඳහා පරවාදියා **ආමනනා** යයි පිළිගනී. **අත්ථි තත්‍ර මූලගන්ධො** යනාදිය විචාරණ ලද්දේ ඇති බව සාධනය කිරීමට නොහැකි වන්නේ ප්‍රතික්ෂේප කරයි. **නනු අත්ථි තත්‍ර ඝාන නිමිත්තනං** ආදි සටහන් මාත්‍රයටම සාධකය. ආයතනයට නොවේ. එනිසා සාධක වශයෙන් ගෙනෙන ලද්ද නොගෙනෙන ලද්දට සමාන වේ.

ආරුප්පෙ රූපකථා 76

දැන් ආරුප්පයෙහි රූපකථා නම් වේ. එහි යමෙකුගේ 'විඤ්ඤාණ පච්චයා නාමරූපං' යන වචනයෙන් අරූප භවයෙහි ද ඕලාරික රූප හැර සියුම් රූප ඇතැයි ලබ්ධි වේ. යම්සේ අන්ධකයින්ගේ මෙනි. ඔවුන් සඳහා **අත්ථිරූපං** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. මෙහි සෙස්ස පැහැදිලි අරුත් වේ.

රූපං කම්මනති කථා 77

දැන් රූපය කර්මය යයි කථා වේ. එහි යමෙකු ගේ කාය වචී විඤ්ඤත්ති සංඛ්‍යාත රූපයම කාය කම්ම වචී කම්ම නම් වේ. එය ද කුසල හටගැනීම කුසල ද අකුසල හටගැනීම අකුසලද යයි ලබ්ධි වේ. යම්සේ මහිංසාසක, සම්මිතියන්ගේ මෙනි. ඔවුන් සඳහා **කුසලෙන චිතෙතන සමුටඨිතං** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහු ඉදින් ඒ කුසලය. මේ අරමුණු සහිත භේදය කුසලයේ ලැබේ. එය එහිද ඇද්දැයි චෝදනා කිරීමට **සාරම්මණං** යනාදිය අරඹන ලදී. එහි **පත්ථනා පණිධි** යයි චේතනාවට ම සමාන වචනයකි. කුසල චේතනාම කල්පනා කිරීම පත්ථනා යයි ද කල්පනා කරමින් සිටි නිසා පණිධි යයි ද කියනු ලැබේ. පර සමයෙන් වනාහි කුසල් සිතින් හටගත් වෙදනා සඤ්ඤා චේතනා සද්ධා යනාදියෙහි වේදනාදියම එහි පත්ථනා පණිධියයි ලබයි. චේතනාවෙන් නොවේ. කුමක් හෙයින්ද? චේතනා දෙකක් එකවිට නොමැති නිසාය. කනට වැටුණු බව වනාහි පෙළ අනුවදැයි දතයුතුය. රූපායතනං ආදිය පෙර වාරයෙහි **සබබං තං කුසලං** යන සඤ්ඤේපයේ ප්‍රභේද දැක්වීම සඳහා කියන ලදී. සෙස්ස සැසඳීමෙන් **වචී කම්මනති** කථා දතයුතුය. **අකුසලෙන චිතෙතන සමුටඨිතං** යනාදි විධාන ද පෙළ ඇසුරෙන් දතයුතුය. අසූචි යයි මෙහි ශුක්‍ර අදහස් කෙරේ. සූත්‍ර සාධනය පැහැදිලිය.

ජීවිතින්ද්‍රිය කථා 78

දැන් ජීවිතේන්ද්‍රිය කථා නම් වේ. එහි යමෙකුගේ ජීවිතේන්ද්‍රිය නම් සිතෙන් වෙන් වූ අරූප ධර්මයකි. එහෙයින් රූප ජීවිතේන්ද්‍රියක් නැතැයි ලබ්ධිය වේ. යම්සේ පුබ්බසේලියන්ගේ මෙන්ම සම්මිතියන්ගේ වැනි වේ. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. **නත්ථි රූපීනං ධම්මානං ආයු** යන ප්‍රශ්නයෙහි උපාදින්න රූපයන්ගේ ද තෘණ කාෂ්ඨාදියේ ද සන්තාන වශයෙන් පැවතීම ආයු, ඨිතිය, යැපීම, ක්‍රියා පැවැත්වීම, පැවැත්ම, පාලනය කැමති වේ. එහෙයින් ප්‍රතික්ෂේප කරයි. **අත්ථි** යන ප්‍රශ්නයෙහි මේ කාරණයෙන් පිළිගනී. **අත්ථි අරූප ජීවිතින්ද්‍රියං** යන ප්‍රශ්නයෙහි සත්ත්ව සන්තානයෙහි රූපී හෝ අරූපී හෝ සියල්ල

සිතෙන් වෙන්ව අරූප ජීවිතේන්ද්‍රියම කැමති වේ. එහෙයින් පිළිගනී. නිරෝධ සමාපත්ති ප්‍රශ්නයෙහි ද සිතෙන් වෙන්වූ අරූප ජීවිතයම සඳහා ප්‍රතික්ෂේප ද කරයි. පිළිගනියි ද වේ. සකවාදියා එය පිළිනොගන්නේ යමක් අරූප පැවැත්මක් නැති කරහි රූප පැවැත්මක් ඇතැයි චෝදනා කිරීමට හඤ්චි යනාදිය කීය. සංස්කාර ස්කන්ධ ප්‍රශ්නයෙහි එසස ආදි සංස්කාර ස්කන්ධයන් සඳහා ප්‍රතික්ෂේප කරයි. කාය කර්ම ආදි සංස්කාර ස්කන්ධයන් සඳහා පිළිගනී. **කාය විඤ්ඤත්ති වචී විඤ්ඤත්ති සම්මා** වාචා **සම්මා කම්මන්තෙනා ජීවිතින්ද්‍රියං** යන මේ ආදි ධර්ම ද සංස්කාර ස්කන්ධයෙහි ඇතුළත් වේය යනු ඔහුගේ ලබ්ධියයි. සකවාදියා වනාහි එය නො පිළිගන්නේ ඉදින් නිරුද්ධ වූයේද අරූප පවතින කල්හි සංස්කාර ස්කන්ධ ඇත්ද සතර ස්කන්ධයන්ගේ ඇති බව වේයයි චෝදනා කිරීමට අසඤ්ඤී වෙදනාඛන්ධෝ යනාදිය කීය. අනෙකා සමාපත්ති ඇතුළත සඳහා ප්‍රතික්ෂේප කරයි. සම්මදිත්තාට ද නැගී සිටින්නාට ද පෙර අපර භාගයක් සඳහා පිළිගනී. අසංඥසත්ත්ව වාරයෙහි ද මෙම නයයි. අසංඥ සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධි කාලයෙහි සිත ඉපදී නිරුද්ධ වේ යනු ඔහුගේ ලබ්ධියයි. එය සමග සිතෙන් වෙන් වූ අරූප ජීවිතේන්ද්‍රිය ඉපදී දිවිතෙක් පවතී. එහෙයින් ඔවුන්ට ජීවිතේන්ද්‍රියක් නැද්දැයි විචාරණ ලද්දේ ප්‍රතික්ෂේප කරයි. ඇත්දැයි විචාරණ ලද්දේ පිළිගනී. වේදනා ස්කන්ධ ආදිය ඒවායේ පැවැත්ම වශයෙන් ප්‍රතික්ෂේප කරයි. චුති ප්‍රතිසන්ධි වශයෙන් පිළිගනී. සකවාදියා වනාහි එය කැමති නො වන්නේ ඉදින් එහි එක් සැණයෙහි වේදනාදිය ඇති පංච වෝකාර පැවතීමට පැමිණේ යයි චෝදනා කිරීමට **පංච වොකාර භවො** යයි කීය. අනෙකා සූත්‍ර විරෝධී බියෙන් ප්‍රතික්ෂේප කරයි. **එකදෙසං හිජ්ජති** ප්‍රශ්නයෙහි සම්ප්‍රයුක්ත වූයේ බිඳේ. විප්‍රයුක්ත වූයේ නොබිඳේ යයි ඔහුගේ ලබ්ධියයි. එනිසා පිළිගනී. **දෙව ජීවිතින්ද්‍රියානි** යයි විචාරීම පරවාදියාගේය. ප්‍රතිඥාව සකවාදියාගේය. රූප අරූප වශයෙන් ජීවිතේන්ද්‍රිය දෙකකි. ඒවායින් සත්ත්වයෝ ජීවත් වෙති. ඒවායේ බිඳී යෑමෙන් මැරේ යයි කියනු ලැබේ. චුති ක්ෂණයෙහි ජීවිතේන්ද්‍රිය දෙකම එකවිට බිඳේ.

කම්මහේතු කථා 79

දැන් කර්ම හේතු කථා නම් වේ. එහි යම් රහත් කෙනකුන් පෙර භවයෙහි රහතන් වහන්සේ නමකට අසත්‍ය දෝෂාරෝපන කළ වීරිය හේ එම කර්ම හේතුවෙන් රහත්බවින් පිරිහේය යන යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ පුබ්බසේලියන් ගෙනා සම්මිතියන්ගේ මෙනි. ඔවුන් සඳහා **කම්මහෙතු** යන විචාරීම සකවාදියාගේය. ප්‍රතිඥාව අනෙකාගේය. සෙස්ස පරිහානි කථාවේ කී නයින්ම වේ. හඳ හි අරහනතානං අබභාචික්ඛති යන මෙය යමෙකුගේ කර්මයේ හේතු පිරිහෙළයි. එය පිළිගැනීමට කියයි. ඉක්බිති සකවාදියා ඔහුට ඒ පක්ෂය පිළිගන්වා ඉදින් මෙසේ යම් රහතන් වහන්සේ නමක් අසත්‍ය දෝෂාරෝපන නොකළ විරිනම් ඒ සියල්ල රහත්බවට පැමිණෙන්නේ දැයි චෝදනා කිරීමම යෙ කෙචි යනාදිය කිය. අනිකා ඒ කර්මයේ අරහත් බවට පැමිණෙන නියාම නොදක්නේ ප්‍රතික්ෂෙප කරයි.

අටවෙනි වර්ගය නිමියේය.

ආනිසංස කථා 80

දැන් ආනිසංස කථා නම් වේ. එහි ස්ව සමයෙහි සංස්කාර ආදීනවයෙන් නිවන ද ආනිසංස වශයෙන් බලන්නහුට සංයෝජන ප්‍රහාන වේය යනු නිගමය වේ. යමෙකුගේ වනාහි ඒ දෙකෙහිම එක් වාදයක් කොටගෙන ආනිසංස දැකීමෙන්ම සංයෝජන ප්‍රහාන වේයයි ලබ්ධි වේ. යම්සේ අන්ධකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට ඔබ විසින් එකංසිවාදය ගන්නා ලදී. ආදීනවය ද දැකිය යුතු වයස් එහි විභාග දැක්වීම සඳහා සකවාදියා **සංඛාරෙ** යනාදිය කීය. **සංඛාරෙ ච අනිච්චතො මනසිකරොති නිබ්බානෙව ආනිසංස දසසාවි හොති** යන ප්‍රශ්නයෙහි අදහස මෙසේය. ආනිසංස දකින්නහුට සංයෝජන ප්‍රහාන වේ යනු ඔවුන්ගේ ලබ්ධිය වේ. නනු **සංඛාරො අනිච්චතො මනසිකරො සංයොජනා පහීයනති** යයි විචාරණ ලද්දේ **ආමනතා** යයි පිළිගනී. එයින් ඒ සංස්කාරයන් අනිත්‍ය වශයෙන් මෙනෙහි කරයි. නිවනෙහි ද ආනිසංස දකින්නේ වේයයි මෙයට පැමිණේ. කිම එය පිළිගන්නෙහි ද? ඉන් පරවාදියා ඒක චිත්තක්ෂණය සඳහා ප්‍රතික්ෂේප

කරයි. දෙවනුව විචාරණ ලද්දේ නොයෙක් සිත් වශයෙන් පිළිගනියි. සකවාදියා ඔහුගේ අදහස් මැඩ අනිත්‍ය වශයෙන් පිළිගනියි. සකවාදියා ඔහුගේ අදහස මැඩ අනිත්‍ය මෙනෙහි කරන්නාට ආනිසංස දැකීමද එකට ප්‍රතිඥාන නිසා ස්පර්ශ දෙකේ සිත් දෙක එක් වේදැයි අසයි. අනෙකා දෙකේ එකතුව නොදක්නේ ප්‍රතික්ෂේප කරයි. **දුකඛතො** යනාදි ප්‍රශ්නයෙහිද මෙම නයම වේ. මෙහි නිශ්චය පිළිබඳ කිම? කිම අනිත්‍යාදි වශයෙන් මෙනෙහි කරන්නාට සංයෝජන ප්‍රහීන වේද? නැතහොත් නිවණෙහි ආනිසංස දක්නහුටද, නැතහොත් දෙකම එකට කරන්නහුටද? ඉදින් අනිත්‍යාදියෙන් මෙනෙහි කරන්නාට ප්‍රහීන වන්නේ නම් විදර්ශනා සිතින් ම වන්නේය. ඉක්බිති ආනිසංස දක්නහුට අනුසස් වශයෙන් නිවනෙහි ආනිසංස දකින්නාට විදර්ශනා සිතින්ම වන්නේය. ඉක්බිති දෙකම එකට කරන්නහුට වන්නේ නම් එසසාදි දෙකේ එක්කිරීමෙන් වන්නේය. නිෂ්පත්තියට පැමිණේද නැවත නිත්‍යයෙන් යයි ආදි ග්‍රහණයේ අනුත්පත්ති ධර්ම භාවයෙන් නිවනෙහි ද ප්‍රත්‍යක්ෂ වශයෙන් ආනිසංස දැකීම කැමති වේ. එහෙයින් පැවතීම් වශයෙන් ද නිවනෙහි ආනිසංස දකින්නාට සංයෝජනයන්ගේ ප්‍රහීනවීම සුවදැකීමට සාධනය කරයි. ආනිසංස දැකීම් මාත්‍රයෙන්ම සංයෝජන ප්‍රහාන නොවේ. එහෙයින් නොගෙනෙන ලද සමාන වේමය.

අමතාරමමණ කථා 81

දැන් අමතාරමමණ කථා නම් වේ. එහි යමෙකුගේ **නිබ්බානං** මඤ්ඤති ආදියේ නුනුවණින් අරුත් ගෙන අමතාරමමණය (නිවන් අරමුණ) සංයෝජන වේයයි ලබ්ධි වේ. යම්සේ පුබ්බසේලියන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට ඉදින් අමතාරම්මණය සංයෝජනයක් නම්, අමෘතයට සංයෝජනාදිභාවය පැමිණේ යයි චෝදනා කිරීමට **අමතං සංයොජනියං** යනාදිය කීය. අනෙකා සූත්‍ර විරෝධ බියෙන් සියල්ල ප්‍රතික්ෂේප කරයි. මේ උපායෙන් සියළු වාරවල අර්ථය දතයුතුය. **නිබ්බානං නිබ්බානො** යයි ගෙනෙන ලද සූත්‍රය වනාහි දිට්ඨධම්ම නිබ්බානය සඳහා කියන ලද්දකි. එහෙයින් එය සාධකයක් නොවේ.

රූපං සාරම්මණන්ති කථා 82

දැන් රූපය සාරම්මණයයි කථා වේ. එහි රූපය ප්‍රත්‍ය සහිත අර්ථයෙන් සාරම්මණ නම් වේ. ආරම්මණ ප්‍රත්‍ය වශයෙන් වෙනත් අරමුණක් නොකෙරේ. යමෙකුගේ වනාහි අවිශේෂයෙන් රූපය සාරම්මණ යයි ලබ්ධි වේ. යම්සේ උත්තරාපථකයන්ගේ මෙනි. ඔවුන් සඳහා අරමුණු දෙකේ විභාග දැක්වීම සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. මෙහි සෙස්ස පෙළ ඇසුරෙන්ම දතයුතුය. **න වත්තබ්බං** යන ප්‍රශ්නයෙහි ආධාරක අරමුණ සඳහා ප්‍රතිඥාව සකවාදියාටය. දෙවන ප්‍රශ්නයෙහි ද ප්‍රත්‍ය අරමුණ සඳහා ප්‍රතිඥාව ඔහුටම වේ. මෙසේ මෙහි සප්‍රත්‍යාර්ථයෙන්ම සාරම්මණ බව සිද්ධ වේ.

අනුසයා අනාරම්මණාති කථා 83

දැන් අනුසයා අනාරම්මණාති කථා වේ. එහි යමෙකුගේ අනුසය නම් චිත්ත විප්‍රයුක්ත අහේතුක අව්‍යාකෘත වේ. එයින්ම අනාරම්මණ භේයයි ලබ්ධි වේ. යම්සේ අන්ධකයන්ගේ ද ඇතැම් උත්තරාපථකයන්ගේ ද මෙනි. ඔවුන් සඳහා **අනුසයා** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට අනාරම්මණයෙන් නම් මෙසේ විය යුතු යයි චෝදනා කිරීමට **රූපං** යනාදිය කීය. **කාමරාගෝ** යනාදිය කාමරාග අනුසයෙන් අනන්‍යතාව දක්වන ලදී. **සංඛාරක්ඛන්ධෝ අනාරම්මණෝ** යන ප්‍රශ්නයෙහි චිත්ත සම්ප්‍රයුක්ත සංස්කාර ස්කන්ධය සඳහා ප්‍රතික්ෂේප කරයි. අනුසය, ජීවිතේන්ද්‍රිය, කායකර්මාදි ශූන්‍ය ද සංස්කාර ස්කන්ධයට ඇතුළත්ය. ඒ සඳහා පිළිගනී. මේ උපායෙන් සංස්කාරවල අර්ථය දතයුතුය. **සානුසයෝ** යන ප්‍රශ්නයෙහි අප්‍රහීන අනුසය බැවින් සානුසය බව අනුදනී. අනුසයන්ගේ පැවතීම් ස්වභාවයෙන් නොවේ. යමක් අප්‍රහීන වේ නම් එය අතීත නොවේ. අනාගත නොවේ. වර්තමාන නොවේ. මාර්ග වද්‍ය කෙලෙස් අප්‍රහීනවම ඇතැයි කියනු ලැබේ. එබඳු වූ ද මේ නම අරමුණු යයි නොකිව යුතුය. එහෙයින් එය ප්‍රතික්ෂේප කරන ලදී. එය වනාහි මෙය හුදකලා අනුසය නොවේ. රාගාදියද එබඳුම වේ. එහෙයින් අනුසය වල අනාරම්මණ බවට සාධක නැත.

ඤාණ අනාරම්මණ කථා 84

දැන් ඤාණය අනාරම්මණ යයි කථා වේ. එහි යම්සේ රහතන් වහන්සේ චකඛු විඤ්ඤාණයෙන් යුත් ඤාණ ඇත්තේ යයි කියනු ලැබේ. ඒ ඤාණයේ ඒ ඤාණයෙහි අරමුණ නැත. එහෙයින් ඤාණය අනාරම්මණය යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ අන්ධකයින්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. මෙහි සෙස්ස අනුසය කථාවෙහි කියන ලද නයින්ම දතයුතුය.

අතීතාරම්මණ කථා 85

දැන් අතීත ආරම්මණ කථා වේ. එහි යම්හෙයකින් අතීත අනාගත අරමුණු නම් නැත. එහෙයින් අරමුණු නැති බැවින් තදාරම්මණ සිත අරමුණෙන් බැහැර විය යුතු යයි ද අතීතයේ අරමුණු නමැයිද යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ උත්තරපථකයන්ගේ මෙනි. ඔවුන් සඳහා **අතීතා** රම්මණං යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. මෙහි සෙස්ස පෙළ අනුවම පැමිණවිය යුතුය.

විතඤ්ඤානුපතති කථා 86

දැන් විතකක අනුපතිත කථා නම් වේ. එහි අරමුණින් සහ සම්ප්‍රයෝගයෙන් දැයි විතකකානුපතිත කථා දෙයාකාරය. එහි අසවල් සිතේ විතකකයේ අනුපතිත වන්නේය. විතර් විප්‍රයුක්ත චිත්ත ස්වභාවයෙන් සියළු සිත් විතකකානුපතත නොවේ. මෙසේ මේ විභාගය නොකොට අවිශේෂයෙන් සියළු සිත් විතකකානුපතත යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ උත්තරපථකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. මෙහි සෙස්ස පෙළ වශයෙන් පැමිණවිය යුතු.

විතකක විපඵාර සඳ්ද කථා 87

දැන් විතකක විපඵාර සඳ්ද කථා නම් වේ. එහි යම්හෙයකින් විතකක විචාර වචී සංඛාර යයි කියන ලදී. එහෙයින් සියළු විතර්කයෙන් විචාරයෙන් අඩු තරමින් මනෝධාතු පවතින කාලයේ ද විතර්ක විපඵාර ශබ්දය යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ පුබ්බසේලියන්ගේ මෙනි. ඔවුන් සඳහා **සබ්බසො** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙනකාටය. ඉක්බිති ඔහුට ඉදින් විතකක විපඵාරය පමණක් ශබ්දය වේ නම් එසසාදි විපඵාරය ද ශබ්දය වියයුතු වන්නේ යයි චෝදනා කිරීමට **සබ්බසො ඵුසතො** යනාදිය කීය. අනිකා එබඳු සූත්‍ර ලේඛයක් නො දක්නේ ප්‍රතික්ෂේප කරයි. **විතකක විපඵාරො සඳ්දා සොත විඤ්ඤඤ්ඤය්‍යා** යයි විතර්කයේ විපඵාරය (රාවය) පමණක් ශබ්දය කොට විචාරයි. විතර්ක විපඵාරයෙන් හටගත් සූත්‍ර ප්‍රමාණය ශබ්දය වේ. ඉතිරිවා ප්‍රතික්ෂේප කරයි. **තනු විතකක විපඵාර සඳ්දා න සොත විඤ්ඤඤ්ඤය්‍යා** යයි මෙය ඔහුගේම ලබ්ධිය දක්වයි. හේ විතකක විපඵාරය පමණක් ශබ්දයයි කියයි. හෙ සොතවිඤ්ඤඤ්ඤය්‍ය නො කියයි. අනෙකා වනාහි 'විතකක විපඵාර ශබ්දය අසා' යන වචනයෙන් සොත විඤ්ඤඤ්ඤය්‍ය ද ශබ්ද යයි කියයි.

න යථා චිත්තසස වාචාති කථා 88

දැන් යථා චිත්තසස වාචාති කථා නම් වේ. එහි යම්හෙයකින් **කිසිවෙක් අනිකක් කියන්නෙමියි අනිකක් කියයි.** එහෙයින් සිත අනුව වචනය නැත. චිත්තානුරූපව චිත්තානුගතික නැත. සිත නැතිවද වචන පවතී යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ පුබ්බසේලියන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට ඉදින් එය උපදවන සිත නොවන්නේය. එසසාදිය ද ඒ ක්ෂණයෙහි නොවන්නේ යයි චෝදනා කිරීමට **අඵසසකසස** යනාදිය කීය. **න හණහිතු කාමො** යනාදියෙහි යම්හෙයකින් අනිකක් කියන්නෙමියි අනිකක් කියන්නේ කියනු කැමතිවීමම නම් වේ. එහෙයින් න හෙවං යයි ප්‍රතික්ෂේප කරයි. **නනු අහඊ කොචි අඤ්ඤං හණිසසාමි** යනාදියෙහි සිව්රු යයි කියනු කැමැත්තේ චිර යයි කියන්නේය. එහි අනිකක් කියනු කැමති සිත අනිකක් කියන සිත, මෙසේ පූර්වභාගයෙන් සිතේ අසමාන බව අපථා චිත්ත නම්

වේ. එයින් ඔහුගේ හුදෙක් අනාපත්ති නම් වේ. චිර යන වචනය උපදවන සිතක් නැත. මෙසේ ඒ වචනය අචිත්තකයයි අර්ථය සඳහා මේ උදාහරණයෙන් යථා චිත්තයේ වචන නොවේ යයි පිහිටුවන ලද්දේ ද නොපිහිටන ලද්දේම වේ.

න යථා චිත්තසස කායකමමනති කථා 89

දැන් න යථා චිත්තසස කාය කමමනති කථා නම් වේ. එහි යම්හෙයකින් කිසිවෙක් අන්තැනක යන්නෙමියි අන්තැනක යයි. එහෙයින් සිත අනුව කාය කර්මය චිත්තානුරූපය චිත්තානුගතිකව නොවේ. සිතෙන් බැහැරව ක්‍රියාව පවතී යනු යමෙකුගේ ලබ්ධිය වේ. පුබ්බසේලියන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. මෙහි සෙස්ස යට කියන ලද නයින් ම දතයුතුය.

අතීතානාගතෙහි සමනනාගත කථා 90

දැන් අතීත අනාගතවලින් යුක්ත කථා නම් වේ. එහි සමනනාගත පඤ්ඤතති පටිලාභ පඤ්ඤතති යයි පඤ්ඤතති දෙකක් දතයුතුය. ඒවායින් වර්තමාන ධර්ම යුක්ත වූයේ සමනනාගත යයි කියනු ලැබේ. අෂ්ට සමාපත්ති ලාභියාට වනාහි කිසි සමාපත්තියක් ඒකක්ෂණයෙහි නොපවතී. අනිකක් අතීත වේ. අනිකක් අනාගත වේ. අනිකක් වර්තමාන වේ. පිළිවිද අපරිහීබවින් ලාභී යයි කියනු ලැබේ. එහි මේ විභාගය නොගෙන යම්හෙයකින් ධ්‍යානලාභීන්ගේ අතීත අනාගත ධ්‍යාන ද ඇත. එහෙයින් ඔව්හු අතීතයේ ද අනාගතයෙන් ද යුක්තයයි ලබ්ධි වේ. යම්සේ අන්ධකයින්ගේ මෙනි. මෙහි සෙස්ස පැහැදිලිය. **අටඨවිමොකඛඣායී** යනාදිය වනාහි ලාභී බවට සාධක වේ. සමන්නාගත බවට (යුක්ත බවම) නොවේ.

නවවෙනි වර්ගය සමාප්තයි.

නිරොධ කථා 91

දැන් නිරෝධ කථා නම් වේ. එහි යමෙකුගේ උපපත්තෙත්‍යය සංඛ්‍යාත භවංග සිතේ භංග ක්‍ෂණය සමග ක්‍රියා සංඛ්‍යාවට ගිය කුසල හෝ අකුසල හෝ ස්කන්ධ සතර චිත්ත සමුට්ඨාන (හටගත්) රූපය යයි පංචස්කන්ධය උපදී. ඒ නූපන් කල්හි භවංගය නිරුද්ධ වූ විට සතතතිය කැඩෙන්නේය යනු ලබධි වේ. යම්සේ අන්ධකයන්ගේ මෙනි. ඔවුන් සඳහා **උපපත්තෙතසියෙ උපපත්තෙතසියෙ** යන සතරපදයෙහි බහුවචනය ආධාර අර්ථයෙහි ඒකවචන වූ ආධාර විභක්තියයි. උපන් ස්කන්ධ පහ නිරුද්ධ නොවූ කල්හි යනු මෙහි අර්ථය වේ. **දසනනං** යනු උපපත්තෙත්‍යය බන්ධ වශයෙන් සහ කිරිය බන්ධ වශයෙන් ද කියන ලදී. එහි පළමු ප්‍රශ්නයෙහි ස්කන්ධ ලක්‍ෂණ වශයෙන් ක්‍රියා ලක්‍ෂණ වශයෙන් ද ඒ ස්කන්ධ පහක්ම යයි ප්‍රතික්‍ෂෙප කරයි. දෙවන ප්‍රශ්නයෙහි පෙර පසු වශයෙන් උපපත්තෙත්‍යය කිරිය වශයෙන් ද නානත්තය සඳහා පිළිගනී. ස්පර්ශ සිත් දෙකේ එක්කිරීම විචාරණ ලද්දේ සූත්‍ර ලේශ භාවයෙන් ප්‍රතික්‍ෂෙප කරයි. **කිරියා** චනතාරෝ යයි රූපය හැර කුසල හෝ අකුසල හෝ ගන්නා ලදී. **කිරියා** ඤාණං යනු පරවාදියා විසින් චකඛු විඤ්ඤාණයෙන් යුක්ත වූ ක්‍ෂණයෙහි රහතන් වහන්සේ ගේ අනුඥාත වූ අනාරම්මණ ඤාණය යයි කියන ලදී. **නිරුදෙධ මගෙහා උපපජ්ජති** යයි විචාරීම පරවාදියාටය. නිරුද්ධ නොවූ කල්හි නො ඉපදීමෙන් ප්‍රතිඥාව සකවාදියාටය. මනො මගගං භාවෙති යන ඡලයෙන් විචාරීම පරවාදියාගේය. යම්හෙයකින් ප්‍රතිසන්ධියේ සිට චුති සිත දක්වා ඍත්ත්වයා ජීවත් වේ නම්. එහෙයින් සකවාදියා න හෙවං යයි ප්‍රතික්‍ෂෙප කරයි.

රූප මගෙහාති කථා 92

දැන් රූපං මගෙහාති කථා නම් වේ. එහි යමෙකුගේ සම්මා වාචා කම්මනත ආජීව රූපයයි ලබධිය වේ. යම්සේ මහිංසාසක, සම්මිතිය මහා සංඝික යන මොවුන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. **ඉක්ඛිති** ඔහුට ඉදින් ඔබගේ සම්මා වාචාදිය රූප වේ. විරති නොවේ. සම්මා දිට්ඨි ආදි මාර්ගයේ සාරම්මණාදි ස්වභාවය

වේ. මෙසේ ඒවාද රූප වන්නේ යයි චෝදනා කිරීමට **සාරම්මණං** යනාදිය කීය. එහි ප්‍රතික්ෂේපය ද ප්‍රතිඥාව ද පරවාදියාගේ ලබ්ධි අනුරූපයෙන් දතයුතුය. මෙහි සෙස්ස අරුත් පැහැදිලිය.

පංච විඤ්ඤාණ සමංගිසස මගග කථා 93

දැන් පංච විඤ්ඤාණ සමංගි වූ මගග කථා නම් වේ. එහි යමෙකුගේ 'භික්ඛුනා රූපං දිසවා න නිමිත්තගගාහී හොති' යන සූත්‍රය නිසා පංච විඤ්ඤාණ යුක්ත වූ පුද්ගලයාගේ මාර්ග භාවනා ඇතැයි ලබ්ධිය වේ. යම්සේ මහා සංඝිකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට ඉදින් ඔහුට මාර්ග භාවනා ඇත්නම් පංචවිඤ්ඤාණ ගතිකයෙන් මාර්ගය හෝ මාර්ග ගතිකයෙන් පංච විඤ්ඤාණයන් හෝ විය යුතුය. ඒවා මාර්ග ගතික නොවේ. නිවන අරමුණු නොවන බවද ලෝකෝත්තරය නොවන බව ද පංච විඤ්ඤාණ ගතික මාර්ගය නොවේ. ඒවායේ ලක්ෂණයෙන් සංගිත නොවේ යයි චෝදනා කිරීමට **නනු පඤ්චවිඤ්ඤාණා උපපනනවත්ථුකා** යනාදිය කීය. එහි අදහස මෙසේය. ඉදින් පංච විඤ්ඤාණ සමංගියාව මාර්ග භාවනා වන්නේ නම් යම් මනෝවිඤ්ඤාණයකින් මාර්ගය සම්ප්‍රයුක්ත වේ නම් එයද පංච විඤ්ඤාණ යුක්ත වූවහුට වන්නේය. මෙසේ ඇතිකල්හි යම් මේ පංච විඤ්ඤාණ උපන් වස්තු යයි ආදි ලක්ෂණය කියන ලදී. මෙසේ නොකියා විඤ්ඤාණ හයකැයි කිවයුතු වන්නේය. එසේ නොකියා පඤ්ච විඤ්ඤාණයම කියන ලදී. එනිසා පංච විඤ්ඤාණ සමංගියාට මාර්ග භාවනා ඇතැයි නොකිව යුතුය. යම්සේ මෙහි අදහස මෙසේය. එහෙයින් සකවාදියා ඒ ලක්ෂණය පරවාදියාට පිළිගන්නවා **නො වත රෙ වතතබෙබ පඤ්ච විඤ්ඤාණ සමංගිසස අත්ථි මගගභාවනා** යයි කීය. (පංච විඤ්ඤාණ සමංගියාව මාර්ග භාවනා ඇතැයි නොකිවයුතුය යන අදහස වේ.)

වෙනත් න්‍යායක්:- පංච විඤ්ඤාණ උපන් වස්තු මාර්ග අවස්තු ද වේ. ඒවා ද උපන් අරමුණු වේ. මාර්ගය කිවයුතු අරමුණක් නොවේ. එය පෙර හටගත් වස්තුවකි. මාර්ගය අවස්තුක ද වේ. ඒවා පෙර හටගත් අරමුණුය. මාර්ගය පෙර හටගත් අරමුණක් නොවේ. ඒවා ආධ්‍යාත්මික වස්තු වේ. මාර්ගය අවස්තුක ද වේ. ඒවාද රූපාදි වශයෙන් බාහිර අරමුණුය. මාර්ගය

නිවන් අරමුණුය. ඒවා නානා වස්තුක වේ. මාර්ගය අවසකු හෝ ඒක වස්තුක හෝ වේ. ඒවා නා නා අරමුණු වේ. මාර්ගය එක් අරමුණ වේ. ඒවා තම තමාගේම රූපාදි ගෝචරයෙහි පැවැත්වීමෙන් අනෙන්‍යාන්‍ය ගෝචර විසයෙහි නොහැසිරෙයි. මාර්ගය රූපාදියෙහි එකම හැසිරීමෙන් නොකරයි. කිරියමනෝධාතුව පෙර හැසිර එක්තැන් කිරීමෙන් මෙනෙහි කිරීමෙන් උපදියි. මාර්ගය ආවර්ජනා රහිත වේ. ඒවා පිළිගැනීම් ආදියෙන් ගැවසීගෙන උපදී. මාර්ගයට ඒවා සමග පෙරපසු බව නැත. ඒවා නූපන් කාලයෙහි තීක්ෂණ විදර්ශනා සමයෙහි ඒවායේ අනුපපතිදේස වූ ආරුප්පයෙහි ද ඉපදීමෙන් ඒවා පිළිගැනීම් ආදියෙන් අතර බැවින් අනෙන්‍යාන්‍ය සමනන්තරව නූපදී. මාර්ගයට පිළිගැනීම් ආදියෙන් අන්තරිත භවයක් ද නැත. ඔවුන්ගේ අන්තැන්හි අභිමුඛව වැටෙන අභෝග මාත්‍ර කිසකුදු නැත. මාර්ගයේ කෙසේ උදුරා දමන කෘත්‍ය ඇත. යම්හෙයකින් මෙහි ද අභිප්‍රාය මෙසේය. සකවාදියා මේ ආකාරයෙන් මාර්ගයේ අපංචවිඤ්ඤාණ ගතිකභාවය පරවාදියාට පිළිගන්වා "නො වත රෙ වත්තබෙ පඤ්ච විඤ්ඤාණ සමංගිසස අත්ථි මග්ග භාවනා" යයි කිය. **සුඤ්ඤතං ආරබ්භ** යයි යම්සේ ලෝකෝත්තර මාර්ගය ශූන්‍ය වූ නිර්වානය අරබයා ද ලෞකිකය. සුද්ධ සංස්කාර පුංජය අරබයා ද උපදී. කිම ඔබ මෙසේ චකඛු විඤ්ඤාණය විචාරන්නෙහිද? අනිකා 'චක්ඛඤ්ච පටිච්ච රූපෙ ච' වචනයෙන් ප්‍රතික්ෂේප කරයි. දෙවනුව විචාරණ ලද්දේ 'න නිමිත්තග්ගාහි' යන වචනයෙන් එහි යම් අනිමිත්තක් වේ යයි එයම ශූන්‍ය යයි පිළිගනී. **චකඛුඤ්ච පටිච්චාති** ප්‍රශ්න දෙකෙහිම මෙම නය වේ. **චකඛු විඤ්ඤාණං අතීතානාගතං ආරබ්භ** යයි මෙහි අදහස මෙසේය.

මනෝ විඤ්ඤාණයෙන් යුක්ත වූ තැනැත්තාට මාර්ග භාවනා ඇත. මනෝ විඤ්ඤාණය ද අතීත අනාගත ද අරබයා උපදී. කිම ඔබගේ චකඛු විඤ්ඤාණය මෙසේද? **එසසං ආරබ්භ** යනාදියෙහි ද මෙම නය වේ. **චකඛුනා රූපං දිසවා න නිමිත්තග්ගාහී** යන මෙහි ජවන ක්ෂණයෙන් නිමිති ගන්නා ලද්ද කියන ලදී. චකඛු විඤ්ඤාණං ක්ෂණයෙහි නොවේ. එහෙයින් ලෞකික මාර්ගය සඳහා ද මෙය සාධක නොවේ.

පඤ්ච විඤ්ඤාණ කුසලාපීති කථා 94

දැන් පංච විඤ්ඤාණ කුසලා පීතිකථා නම් වේ. එය යට කියන ලද නයින්ම අර්ථ වශයෙන් දතයුතුය.

පංච විඤ්ඤාණ සාභොගාති කථා 95

දැන් පංච විඤ්ඤාණ සාභොගති කථා නම් වේ. එහි ආභොග නම් කුසල අකුසල වශයෙන් වේ. ශාස්තෘන් වහන්සේලා විසින්ද 'චක්ඛුනා රූපං දිසවා න නිමිත්තගගාහි හොති න නිමිත්තගගාහි හොති' යනාදිය කියන ලදී. එය අනුවණින් ගෙන පංච විඤ්ඤාණ විඳීම් සහිත යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ මහා සංඝිකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. මෙහි සෙස්ස පෙර කථා හා සමාන වේ.

දවීහි සීලෙහීති කථා 96

දැන් දවීහි සීලෙහි කථා නම් වේ. එහි 'සීලෙ පතිට්ඨාය නරෝ සපඤ්ඤා' යනාදි වචනයෙන් යම්සේ ලෞකික ශීලයෙන් සිල්වත් වූයේ ලෝකෝත්තර මාර්ගය වඩයි. එහෙයින් පළමුව ලෞකික වූද මාර්ග ක්ෂණයෙහි ලෝකෝත්තර වූ ද සීල දෙකකින් යුක්ත වූයේ යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ මහා සංඝිකයන්ගේ මෙනි. ඔවුන් සඳහා **මගග සමංගී විචාරීම** සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට ඉදින් හේ එකවිට ලෞකික ලෝකෝත්තර සීල දෙකින් යුක්ත වූයේ, ස්පර්ශ දෙකින් ද යුක්ත විය යුතුයයි චෝදනා කිරීමට **දවීහි එසෙසහි** යනාදිය කීය. අනිකා එබඳු වූ නයක් නොදක්නේ ප්‍රතික්ෂේප කරයි. **ලොකියෙන වා ලොකුත්තරෙන ච** යන ප්‍රශ්නයෙහි පෙර සමාදන්වීම ද මාර්ග ක්ෂණයෙහි උපන් සම්මා වාචාදිය ද සඳහා පිළිගනී. **ලොකියෙ සීලෙ නිරුද්ධෙ** යයි විචාරීම පරවාදියාටය. ක්ෂණභංග නිරෝධය සඳහා ප්‍රතිඥාව සකවාදියාටය. අනිකා වනාහි එය ව්‍යතික්‍රමණය මෙන් සලකන්නේ **දුසසීලො** යනාදිය කීය. ඔහුගේ ලබ්ධිය පිහිටුවීම වනාහි පෙර අභින්න වූ සීලභාවයෙහිම දක්වයි. දෙකකින් යුක්ත නොවේ. එහෙයින් ලබ්ධිය නොපිහිටියේමය.

සීලං අචෙතසිකනති කථා 97

දැන් සීලය අචේතසික යයි කථා නම් වේ. එහි යම්හෙයකින් සීලය ඉපිද නිරුද්ධ වුවද සමාදාන හේතුක වූ සීල උපචය නම් ඇත. යමකින් එය සිල්වත් නම් වේද එහෙයින් සීලය අචේතසික යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ මහා සංඝිකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. මෙහි සෙස්ස දානය අචේතසික කථාවෙහි කියන ලද නයින්ම දතයුතුය. ලබ්ධිය පිහිටුවීමද අනුවණින් ගන්නා ලද බැවින් නොපිහිටියේමය.

සීලං න චිත්තානු පරිවත්තී කථා 98

දැන් සීලය චිත්තානුපරිවත්තති නොවේය යන කථා නම් වේ. එහි **න චිත්තානුපරිවත්තතිති** යයි භාෂානතුරයෙහිම නා නා විධය. සෙස්ස පෙර කථා සමාන වේමය.

හේතු සමාදාන හෙතු කථා 99

දැන් සමාදාන හෙතු කථා නම් වේ. එහි 'ආරාමරොපා' යන ගාථාවේ අර්ථය අනුවණින් ගෙන 'සදා පුඤ්ඤං පවඩ්ඪති' යයි ලබ්ධිය වේ. යම්සේ මහා සංඝිකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. චිත්ත විප්‍රයුක්ත සීලොපචය සඳහා ප්‍රතිඥාව පරවාදියාටය. සෙස්ස පෙර කථා හා සමාන වේ.

විඤ්ඤත්තති සීලත්ති කථා 100

දැන් විඤ්ඤත්තිය සීලය යයි කථා නම් වේ. එහි කාය විඤ්ඤත්තිකාය කර්ම වේ. වචී විඤ්ඤත්තිවාක් කර්ම වේයයි ගන්නා ලද බැවින් විඤ්ඤත්තිය සීලය යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ මහා සංඝිකයන්ගේ ද සම්මිතියන්ගේ ද මෙනි. ඔවුන් සඳහා **විඤ්ඤත්තිනි** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට යම්සේ

සීලය නම් විරතියකි. රූප ධර්මයක් නොවේ. එහෙයින් මෙයින් චෝදනා කිරීමට **පාණාතිපාතා වෙරමණී** යනාදිය කීය. **අභිවාදනං සීලං** යනාදි යථාරූප වූ විඤ්ඤත්ති සීලය යයි හඟී. එය උපුටා දැක්වීමට කියන ලදී. යම්හෙයකින් එය විරති නොවේ නම් එහෙයින් නැවත **පාණාතිපාතා** යනාදිය කීය. ලබ්ධිය වනාහි ජලයෙන් පිහිටුවන ලද බැවින් නො පිහිටියේමය.

අවිඤ්ඤත්ති දුසසීල්‍යනති කථා 101

දැන් අවිඤ්ඤත්ති දුස්සීල කථා නම් වේ. එහි චිත්ත විප්‍රයුක්ත අකුසල් රැස්කිරීම ද පාණාතිපාතාදියෙහි අංග සම්පූර්ණවීම සඳහා ඇණවීමද අවිඤ්ඤත්ති දුස්සීලබව යනු යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ මහාසංඝිකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට ඉදින් ඒ දුසිල්බව පාණාතිපාතාදියෙහි එක්තරා එකක වන්නේ යයි චෝදනා කිරීමට **පාණාතිපාතෝ** යනාදිය කීය. **පාපකම්මං සමාදියිත්‍වා** මෙසේ පාප සමාදානය වී **උභෝ වඩ්ඪනති** යයි විචාරණ ලද්දේ දෙන ක්ෂණයෙහි පාපයේ නො ඉපදීම සඳහා ප්‍රතික්ෂෙප කරයි. දෙවනුව විචාරණ ලද්දේ චිත්ත විප්‍රයුක්ත පව් රැස්කිරීම සඳහා පිළිගනී. මෙහි සෙස්ස පරිහොගමය කථාවෙහි කියන ලද නයින්ම දතයුතුය. ඔහුගේ ලබ්ධි පිහිටුවීම පාප සමාදාන පූර්ව භාගයෙහි සාධනය වේ. අවිඤ්ඤත්ති දුසිල්බවේ නොවේ.

දසවෙනි වර්ගයයි.
දෙවැනි පණ්ණාසකය සමාප්තයි.

තිසෙසා අනුසය කථා 102

දැන් අනුසය අබ්‍යාකතා, අහෙතුකා, චිත්ත විපයුත්තා යයි අනුසය කථා තුනෙක් වේ. එහි යම්සේ පෘථග්ජනයා කුසල අබ්‍යාකත සිත පවත්නා කල අනුසය සහිත යයි කිවයුතුය. ඒ ක්ෂණයෙහි යම් හේතුවක් ඔහුගේ ඒ හේතුවෙන් අනුසය සහේතුක නොවේ. එය සිත සමග සම්ප්‍රයුක්ත නොවේ. එහෙයින් එය අබ්‍යාකත, අහේතුක, චිත්ත විප්‍රයුක්ත යයි

යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ මහා සංඝිකයන්ගේ ද සම්මිතියන්ගේ ද මෙනි. ඔවුන් සඳහා කථා තුනේ ම විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. සෙස්ස යට කියන ලද නය අනුව පෙළ මඟින්ම දැනගැනීමට හැකි නිසා විස්තර නොකරන ලදී.

ඤාණ කථා 103

දැන් ඤාණ කථා නම් වේ. එහි මාර්ග ඤාණයෙන් අඥානය ඉවත්වූ කල්හි ද නැවත චකඛු විඤ්ඤාණාදි වශයෙන් ඤාණ විප්‍රයුක්ත සිත පවතිනවිට ඒ මාර්ග සිත නොපවතී. එහෙයින් ඤාණය ඇතැයි නොකිවයුතු යනු යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ මහා සංඝිකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට අඥානය ඉවත්වූ කල්හි ඤාණ යයි පැණවීමක් නොවන්නේය. රාගාදිය ඉවත්වූ කල්හි විතරාගාදි පැණවීමක් ද නොවන්නේ යයි පුද්ගල පැණවීමෙහි අදක්ෂයයි චෝදනා කිරීමට **රාගෙ විගතෙ** යනාදිය කිය. පරවාදියා ඒවා ඉවත්වූ කල්හි සරාගාදි භාවයෙහි යුක්තිය නොදක්නේ ප්‍රතික්ෂේප කරයි. අවසානයෙහි යම්සේ ඤාණලාභයෙන් එය ඤාණය යයි කිවයුතු බව සුදුසු වේ. එහෙයින් **න හෙවං** ප්‍රතික්ෂේපය සකවාදියාටය.

ඤාණ චිත්තවිප්පයුත්ත යයි කථා 104

දැන් ඤාණය චිත්ත විප්‍රයුක්ත යයි කථා නම් වේ. යම්සේ රහතන් වහන්සේ චකඛු විඤ්ඤාණාදියෙන් යුත් ලැබූ මාර්ග ඤාණය නිසා ඤාණී යයි කියනු ලැබේ. උන්වහන්සේ ඒ සිතෙන් සම්ප්‍රයුක්ත නැත. එහෙයින් ඤාණය චිත්ත විප්‍රයුක්ත යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ පුබ්බසේලියන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට ඉදින් ඔබේ ඤාණය චිත්ත විප්‍රයුක්ත වේනම් චිත්ත විප්‍රයුක්ත රූපාදියෙහි එකක් වන්නේ යයි චෝදනා කිරීමට **රූපං** යනාදිය කීය. අනෙකා ප්‍රතික්ෂේප කරයි. සෙස්ස යට කියන ලද නය අනුවමය. අවසානයෙහි වනාහි **පඤ්ඤවා** යයි විචාරණ ලද්දේ ප්‍රතිලාභ වශයෙන් ඒ පැවැත්ම කැමති වේ. එනිසා පිළිගනී.

ඉදං දුකඛනති කථා 105

දැන් මේ දුක් සහ කථා නම් වේ. එහි යමෙකුගේ ලෝකෝත්තර මාර්ග ක්ෂණයෙහි යෝගාවචරයා මෙසේ දුක් යයි කියයි. මෙසේ ඔහුගේ මේ දුකයයි වචන කීමද මේ දුකයයි ඤාණය පවතී යයි ලබ්ධිය වේ. යම්සේ අන්ධකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. මාර්ග ක්ෂණයෙහි එසේ වචන කීම ඤාණය පැවතීම ද සඳහා ප්‍රතිඥාව අනෙකාටය. යම්සේ හේ සෙසු සත්‍ය පටිසංයුක්ත වචන පෘථග්ජනව කියයි ද, ඔහුගේ එබඳු ඤාණ පැවතුම් කැමති නොවේ. එනිසා සමුදයාදි ප්‍රශ්නවල ප්‍රතික්ෂෙප කරයි. රූපං අනිච්චං ආදි දුකට ඇතුළත් දැකීම් වශයෙන් කියන ලදී. අනිකා වනාහි ස්ව සමයෙහි එබඳු ව්‍යවහාර නොදක්නේ ප්‍රතික්ෂෙප කරයි. **ඉති වදනති** යනාදිය ඉදින් ඔහුගේ දුකෙහි ඤාණය පවතී. ඉදං දුකඛං යන පිළිවෙළින් සතර ඤාණයෙහි පැවතිය යුතුයයි දැක්වීමට කියන ලදී. අනෙකා එසේ කැමති නොවේ. එහෙයින් ප්‍රතික්ෂෙප කරයි.

ඉද්ධි බල කථා 106

දැන් ඉද්ධිබල කථා නම් වේ. එහි ඉද්ධිපාද භාවනා ආනිසංස අනුවණින් ගෙන ඉද්ධි බලයෙන් යුක්ත කල්පයක් ඇතැයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ මහිංසාසකයන්ගේ මෙනි. ඔවුන් සඳහා **ඉදධිබලෙන සමනනාගතො කපපං තිටෙඨය්‍ය** යයි විචාරීම සකවාදියාටය. එහි කල්ප නම් මහා කල්ප, කල්ප ඒක දේස, ආයුෂ කල්ප යයි ත්‍රිවිධය. 'මහණෙනි, මේ කල්පයේ අසංඛ්‍ය සතරකි' යන තැන මහා කල්පය කල්පයයි කියන ලදී. 'බ්‍රහ්ම කායික දෙවියන්ගේ ආයු ප්‍රමාණය කල්පය'යි මෙතැන කල්‍යෙක දෝෂයයි. 'නිරයෙහි කල්පයක් පැසේ' මෙතැන ආයු කල්පයයි. ආයු කල්පය, ආයු විධානයයි. කර්ම විපාක වශයෙන් හෝ වර්ෂ ගණනින් හෝ ආයු පිරිසිඳීම යන අර්ථය වේ. ඒවායින් මහා කල්පය සඳහා විචාරයි. අනෙකා පිළිගනී. ඉක්බිති ඔහුට සකවාදියා ඉදින් ඔබගේ ඉද්ධි බලයෙන් යුක්ත වූයේ 'යමෙක් අවුරුදු සීයක් හෝ ඊට අඩුවෙන් හෝ වැඩියෙන් හෝ' මෙසේ සීමාවන ආයු කල්පය, වැඩියෙන් මහා කල්පයක් හෝ මහා කල්‍යෙක දේශයක් හෝ ජීවත් වන්නේ ද ඉද්ධියෙන් ඔහුගේ

ආයුෂය වේදැයි චෝදනා කිරීමට **ඉදධිමයි කො සො ආයු** යනාදිය කීය. අනෙකා ඍද්ධිමය ජීවිතේන්ද්‍රියක් නැත. කර්මයෙන්ම හටගන්නා ලදැයි කියන ලද හෙයින් ප්‍රතික්ෂේප කරයි. මෙහි ඍද්ධිමතාගේ විශේෂය කුමක්ද? ඍද්ධිය නැතිවද ආයු කල්පය සිටින්නේ නොවේද? විශේෂය මෙයයි. ඍද්ධිමතාට ආයු ඇති තෙක් ජීවිතය පවත්වන්නේ අන්තරායකර කරුණු ඍද්ධි බලයෙන් බැහැර කර අනතුරු අකාල මරණ වැලැක්වීමට හැකි වේ. ඍද්ධි නැත්තාට මෙබඳු බලයක් නැත. **අතීතං අනාගතං** යයි මෙය අවිශේෂයෙන් කල්පය සිටී යයි ප්‍රතිඥාත හෙයින් චෝදනා කරයි. දෙව **කපෙප** ආදිය ඉදින් ඍද්ධිවන්තයා ජීවිත කාලය ඉක්මවීමට සමත් වේ. එකක් නොව අනෙක් කල්ප සිටී යයි චෝදනාව පිණිස කියන ලදී. **උපපනෙනා එසෙසා** ආදි සියල්ල ඍද්ධියෙන් නොලබයි. ඍද්ධියට අවිෂයද ඇතැයි දැක්වීමට කියන ලදී. මෙහි සෙස්ස පැහැදිලිය.

සමාධි කථා 106

දැන් සමාධි කථා නම් වේ. එහි යමෙකුගේ ඒක චිත්තක්ෂණයෙහි ඉපදුනද ඒකග්ගතාව සමාධාන අර්ථයෙන් සමාධියයි නොගෙන 'සත්ත රත්තින්දිවානි එකත්ත සුඛ පටිසංවෙදි විහරිතුං' ආදි වචන නිසා චිත්ත සන්තතිය සමාධියයි ලබිධි වේ. යම්සේ සර්වාස්තිවාදීන්ගේද උත්තරා පථකයන්ගේද මෙනි. ඔවුන් සඳහා **චිත්ත සන්තති** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට ඉදින් චිත්ත සන්තතිය සමාධි චිත්ත සන්තති නම්. අතීතය ද ඇත. අනාගතය ද ඇත. වර්තමාන සිත පමණක් චිත්ත සන්තති නොවේ. කිම ඔබගේ ඒ සියළු සමාධියයි චෝදනා කිරීමට **අතීත** යනාදිය කීය. අනෙකා එසේ අකැමැත්තේ **ප්‍රතික්ෂේප කරයි. නනු අතීතං නිරුද්ධං** යනාදි චිත්ත සන්තතියේ වර්තමාන සිතම කෘත්‍ය කරයි. අතීත අනාගත නිරුද්ධ බැවින් නූපන්නේ ද නැත. කෙසේ නම් එය සමාධි නම් වේදැයි දැක්වීමට කියන ලදී. **එක චිත්තක්ඛණිකො** යයි විචාරීම පරවාදියාටය. එයින් ස්ව සමයෙහි 'සමාධිං භික්ඛවෙ භාවෙථ' යනාදියෙහි වර්තමාන කුසල සිතින් යුත් ඒකග්ගතාව සමාධිය යයි කියන ලදී. ඒ සඳහා ප්‍රතිඥාව සකවාදියාටය. **චක්ඛු විඤ්ඤාණ සමංගී** යනාදි 'ඒක චිත්ත ක්ෂණික' යයි වචනය පමණක් ගෙන ජලයෙන් කියන ලදී. එයින් සකවාදියා විසින් ප්‍රතික්ෂේප කරන ලදී. **නනු වුත්තං**

භගවතා යන සූත්‍රය පෙරපසු වශයෙන් පවතින සමාධිය අමිශ්‍රව සිදුකරයි. සන්තතියෙන් සමාධිභාවය නැත. එහෙයින් සාධක නොවේ.

ධම්මට්ඨිතතා කථා 108

දැන් ධම්මට්ඨිතතා කථා නම් වේ. එහි 'ඨිතාව සා ධාතු' යන වචනය නිසා පටිච්ච සමුප්පාද සංඛ්‍යාත ධම්මට්ඨිතතා නම් එකක් ඇත. එය ද පරිනිෂ්පත්තය යනු යමෙකුගේ ලබ්ධියයි. යම්සේ අන්ධකයින්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට ඉදින් පරිනිෂ්පන්න වූ අවිජ්ජාදීන්ගේ අන්‍ය වූ ධම්මට්ඨිතතා නම් පරිනිෂ්පන්නයක් ඇත් ද? ඔබගේ ඒ ධම්මට්ඨිතායෙන් අන්‍ය වූ ස්ථිතියක් පරිනිෂ්පන්න වේදැයි චෝදනා කිරීමට **තාය ඨිතාය** යනාදිය කීය. පරවාදියා මෙබඳු වූ ලබ්ධියක් නැති බැවින් ප්‍රතික්ෂෙප කරයි. දෙවනුව විචාරණ ලද්දේ අනන්තර ප්‍රත්‍යය ද අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය ද සඳහා පිළිගනී. සෙස්ස යට කියන ලද නය අනුව පැහැදිලිය.

අනිච්චතා කථා 109

දැන් අනිච්චතා කථා නම් වේ. එහි අනිත්‍ය වූ රූපාදීන්ගේ අනිත්‍යය ද රූපාදිය මෙන් පරිනිෂ්පන්න යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ අන්ධකයින්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට ඉදින් ඔබගේ රූපාදිය මෙනම් අනිත්‍ය පරිනිෂ්පන්නය. එයින් අන්‍ය වූ පරිනිෂ්පන්න අනිත්‍යතාවක් විය යුතුයයි චෝදනා කිරීමට **තාය අනිච්චතාය** යයි කීය. අනෙකා අනිත්‍යතා දෙකක් එකවිට නොවීමෙන් ප්‍රතික්ෂෙප කොට, නැවත යම්සේ ඒ අනිත්‍යතාව නිත්‍ය නොවේ. එහෙයින්ම අනිත්‍ය සමග අතුරුදහන් වේ. එහෙයින් පිළිගනී. ඉක්බිති ඔහුට සකවාදියා සුළු අවසරයක්වත් නොදී යම් දෙවන අනිත්‍යතාවක් ප්‍රතිඥාතය. එයට ද එයින් පසුව වූ දෙයටද පරම්පරා වශයෙන් නොකැඩුණු දෝෂය ආරෝපනය කරන්නේ **තාය තායෙව** යනාදිය කීය. **ජරා පරිනිපනනා** යනාදිය යම්හෙයකින් උපන් ජරාමරණයෙන් අන්‍ය වූ අනිත්‍යතාවක් නම් නැත. එහෙයින් අනිත්‍යතාව

විභාගයට යෙදීම් වශයෙන් කියන ලදී. එහිද පරවාදියාගේ ප්‍රතිඥාව ද ප්‍රතික්ෂේපය ද දතයුතුය. **රූපං පරිනිපපනනං** යනාදිය යමෙකුගේ ඒ අනිත්‍යතාවය. ඒවා සමග සැසඳීම සඳහා කියන ලදී. එහි පරිනිෂ්පන්න රූපාදීන්ගේ අනිත්‍යතා ජරාමරණ ඇත. මෙසේ පරිනිෂ්පන්න අනිත්‍යාදියේ ඒවා නැතැයි සිතන්නේ ඒකාන්තයෙන් ප්‍රතික්ෂේප කෙරේමය.

එකොළොස්වෙනි වර්ගයයි.

සංවරෝ කම්මනති කථා 110

දැන් සංවර කම්මං කථා නම් වේ. එහි 'ඇසින් රූප දැක නිමිති ගන්නේ වේ. නිමිති නොගන්නේ වේ' යන සූත්‍රය නසා සංවරය ද අසංවරය ද කර්මය යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ මහා සංඝිකයන්ගේ මෙන් ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට ස්ව සමයෙහි යම් චේතනාවක් කර්මයයි කියන ලදී. යම්සේ එය කාය වචී මනෝ ද්වාරවල පවතින කාය කර්ම ආදි නම් ලබයි. ඔබේ සංවර කර්මය එසේද එය ද චක්ඛු ඉන්ද්‍රියාදියෙහි පවතින්නේ චක්ඛු කම්ම ආදි නම ලබන්නේ යයි චෝදනා කිරීමට **චක්ඛුන්ද්‍රියං සංවරෝ චක්ඛු කම්මං** යනාදිය කීය. අනෙකා එබඳු සූත්‍ර පද නොදක්නේ සතර දොරවල ප්‍රතික්ෂේප කොට පස්වන කායද්වාරයෙහි ප්‍රසාද කය සඳහා ප්‍රතික්ෂේප කරයි. විඤ්ඤතති කය සඳහා පිළිගනියි. හේ වනාහි ප්‍රසාද කය ද විඤ්ඤතති කයද කාය ඉන්ද්‍රියෙහිම කැමති වේ. මනෝ ද්වාරයේ ද විපාක දොර සඳහා ප්‍රතික්ෂේප කරයි. කර්ම ද්වාරය සඳහා පිළිගනී. අසංවරය ද මේ නයම වේ. **චක්ඛුනා රූපං දිසවා** යන සූත්‍රය ඒ දොරවල සංවරයම දක්වයි. එහි කර්මභාවය එහෙයින් අසාධක වේ.

කම්ම කථා 111

දැන් කම්ම කථා නම් වේ. එහි 'නාහං භික්ඛවෙ සඤ්චෙතනිකානං කම්මං' යන සූත්‍ර පදය නිසා සියළු කර්ම විපාක සහිතය යනු යමෙකුගේ

ලබ්ධිය වේ. යම්සේ මහා සංඝිකයන්ගේ මෙනි. 'චෙතනාහං භික්ඛවෙ කම්මං වදාමි' යයි ශාස්තෘන් වහන්සේ විසින් අවිශේෂයෙන් චේතනාව කර්මය යයි කියන ලදී. එය කුසල අකුසලම විපාක සහිතය. අව්‍යාකෘත අවිපාකය. මේ විභාගය ඔවුන්ට දැක්වීමට **සබ්බං කම්මං** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. නැවත **සබ්බා චෙතනා** යයි ප්‍රශ්නවල අව්‍යාකෘත සඳහා ප්‍රතික්ෂේපය. කුසල අකුසල සඳහා ප්‍රතිඥාව දතයුතුය. **විපාකාබ්‍යාකතා** යනාදි සවිපාක අවිපාක චේතනා ස්වරූපයෙන් දැක්වීමට කියන ලදී. මෙහි සෙස්ස පැහැදිලිය. **නාහං භික්ඛවෙ** සූත්‍රය ඇතිකල්හි දිට්ඨ ධම්මාදියෙහි විපාක විඳීම සඳහා කියන ලදී. එහෙයින් එය සාධක නොවේ.

සඳ්දා විපාකොති කථා 112

දැන් ශබ්දය විපාක යයි කථා නම් වේ. එහි 'හේ ඒ කර්මය කරන ලද හෙයින් රැස්කරන ලද හෙයින් උස්සන්න හෙයින් මහත් හෙයින් බ්‍රහ්මස්වර වේ යයි ආදිය අනුවණින් ගෙන සද්දය විපාක යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ මහා සංඝිකයන්ගේ මෙනි. ඔවුන්ගේ කර්මය හටගැනීම අරූප ධර්මයට විපාකයයි නම් ලබයි. රූප ධර්මවල වනාහි මේ ව්‍යවහාරය නැතැයි දැක්වීමට විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. **සුඛවෙදනීයො** යනාදි විපාකය නම් මෙබඳු වේ යයි දැක්වීමට කියන ලදී. **සො තසස කම්මසස** යන සූත්‍රය ලක්ෂණ ප්‍රතිලාභ දැක්වීමට කියන ලදී. මහා පුරුෂයා කර්ම කළ බැවින් පිරිසිදු පිරිවරද වේ. පිරිවර විපාක නොවේ. එහෙයින් මෙය සාධක නොවේ.

සළායතන කථා 113

දැන් සළායතන කථා නම් වේ. එහි යම්සේ කර්ම කළ හෙයින් සළායතන ඇතිවිය. එහෙයින් සළායතන විපාකයයි. යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ මහා සාංඝිකයන්ගේ මෙනි. ඔවුන් සඳහා **චක්ඛායතනං විපාකො** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. සෙස්ස යට කියන ලද නය අනුවම වේ. **සළායතනං විපාකො** යන මෙහි මනායතනය විපාක වන්නේය. සෙසු ඒ හුදෙක් කර්මයෙන් හටගත්තේය. විපාක නොවේ. එහෙයින් මෙය සාධක නොවේ.

සත්තකඛත්තු පරම කථා 114

දැන් **සත්තකඛත්තු පරම** කථා නම් වේ. එහි යම්හෙයකින් 'සත්තකඛත්තු පරම' යයි කියන ලදී. එහෙයින් සත්තකඛත්තු පරම පුද්ගලයා සත්තකඛත්තු පරමතාවෙන් නියත යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ උත්තරාපථකයන්ගේ මෙනි. ආර්ය මාර්ගය ඔවුන් හැර අන්‍ය කෙනෙකුට නියම නැත. යමකින් හේ සත්තකඛත්තු පරමාතවෙන් නියත වන්නේ යයි මේ විභාගය දැක්වීමට විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. **මාතා ජීවිතා** යනාදියෙහි අදහස මෙසේය. සම්මත හා මිථ්‍යත්ත යයි නියත දෙයකි. ආර්ය මාර්ගය සම්මත නියතයයි. එය යහපත් ධර්මයකි. එහි පල උපතද විපාක නියම වේ. ආනන්තරිය කර්මය මිථ්‍යත්ත නියාමය වේ. එය අනතුරුව නිරයේ උපත වේ. එහි සත්තකඛත්තු පරම සෝවාන් මාර්ගයෙන් අවිනිපාත ධර්මතාවෙන් ද විපාකය ද නියමිතය. සෙසු මාර්ගවල නියමයක් නැත. අධිගත නොවන හෙයිනි. හේ ආනන්තරිය කර්ම කිරීමට නුසුදුසු වේ. ඔබ නියාමයක් කැමති වෙහි. එයින් ඔබට කියමි. ඔබගේ මේ මිථ්‍යත්ත නියාමයෙන් ඒ නියමය කුමක්ද? **අභබ්බෝ අනන්තරා** යන ප්‍රශ්නවල ආනන්තරියභාවය සඳහා ප්‍රතික්ෂේප කරයි. සත්තකඛත්තු පරමය සඳහා පිළිගනී. **අත්ථි සෝ නියාමෝ** යන ප්‍රශ්නයෙනි. සත්තකඛත්ත පරමතාවෙන් නියමයක් නො දක්නේ ප්‍රතික්ෂේප කරයි. **අත්ථි තෙ සතිපට්ඨානා** ආදි නියාම සංඛ්‍යාත මාර්ග ධර්මය දැක්වීමට කියන ලදී. ඔහුගේ වනාහි නැවත පළමු මාර්ගයට පැමිණීමෙන් ඒවාද නැත. එනිසා ප්‍රතික්ෂේප කරයි. මෙහි සෙස්ස පැහැදිලිය. **නනු සෝ සත්තකඛත්තු පරමෝ** යයි මෙහි භාග්‍යවතුන් වහන්සේ මේ පුද්ගලයා මෙපමණ භවවල ඇවිද පිරිනිවන්පාන්නේය. මේ තෙම මෙපමණයයි තමන් වහන්සේගේ ඥාණ බලයෙන් ප්‍රකාශ කරති. කිසි භව නියමයක් නම් නැත. එහෙයින් සත්තකඛත්තුපරම කොලංකොල එකබීජී යයි කියන ලදී. එහෙයින් මෙය සාධක නොවේ.

කොලංකොල එකබීජී කථාද මේ උපායෙන්ම දතයුතුය.

ජීවිතා වොරොපන කථා 115

දැන් ජීවිත තොරකරන කථා නම් වේ. එහි යම්හෙයකින් ද්වේෂ සම්ප්‍රයුක්ත සිතින් ප්‍රාණය අනිපාත වේ. ද්වේශය ද දෘෂ්ටි සම්පන්න වූයේ ප්‍රහීන නොවූයේ, එහෙයින් දෘෂ්ටියෙන් යුක්තව දැන දිවි ඇති ප්‍රාණියෙකුගේ ජීවිතය තොර කරන්නේ යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ පුබ්බසේලිය අපරසේලීයන්ගේ මෙනි. ඔවුන් සඳහා දිටඨී සම්පනෙනා යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. **සඤ්චිච්ච** මාතරං ආදි ප්‍රශ්නවල 'අටඨානමෙතං අනවකාසො' යයි සූත්‍රයෙන් ප්‍රතික්ෂේප කරයි. **සඤරි අගාරවො** යනාදි ශාස්තෘන් කෙරෙහි හෙරව ශික්ෂා පදවල ව්‍යතික්‍රමණ භාවය දැක්වීමට කියන ලදී. අනෙකා වනාහි අකුසල වශයෙන් ඔහුගේ අගෞරවයක් නැතැයි ප්‍රතික්ෂේප කොට ගෞරව සහිත බව ද පිළිගෙන නැවත අගාරවො යයි විචාරණ ලද්දේ ඒ ඒ කෘත්‍යවල යෙදුණු වික්ෂිප්ත නැති මෙනෙහි නොකිරීමෙන් සෑය වදින පැදකුණු කරන බව සඳහා පිළිගනී. නැවත **ඔදහෙය්‍ය** යනාදි නයින් විචාරණ ලද්දේ එබඳු කිරියාවන් දැන දැන නොකිරීමෙන් ප්‍රතික්ෂේප කරයි. මෙහි සෙස්ස පැහැදිලිය.

දුගගති කථා 116

දැන් දුගගති කථා නම් වේ. එහි යමෙක් දුග්ගතිය ද දුර්ගති සත්ත්වයන්ගේ රූපාදි අරමුණු තෘෂ්ණාවදැයි දෙකම දුගගති යයි ගෙන නැවත එසේ නොබෙදා විශේෂයක් නැතිව දෘෂ්ටි සම්පන්නයාට දුර්ගති ප්‍රහීන යයි කියති. යම්සේ උත්තරාපථකයන් මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. **ආපායිකෙ රූපෙ රජෙජය්‍ය** යනාදි පරවාදියාගේ ලබ්ධියෙන් දෘෂ්ටි සම්පන්නයාට දුර්ගතිය අප්‍රහීනයයි චෝදනා කිරීමට කියන ලදී. මෙහි සෙස්ස පැහැදිලිය. **නිරයං උපපජෙජය්‍ය** යනාදිය දුගගති ප්‍රහානයම දුගතිගාමී තෘෂ්ණා ප්‍රහානය හෝ දක්වයි. දුගති සත්ත්වයන්ගේ රූපාදි අරමුණෙන් තෘෂ්ණා ප්‍රහානය නොවේ. එනිසා සාධක නොවේ.

සප්තම භවිකයා පිළිබඳවද මෙම ක්‍රමයමයි.

දොළොස්වෙනි වර්ගය යි.

කප්පට්ඨ කථා 117

දැන් කල්පස්ථ කථා නම් වේ. එහි යමෙකුගේ 'සංඝං සමගගං භෙත්වාන කපපං නිරමහි පචචති' (සමග සංඝයා භේද කොට කල්පයක් නිරයෙහි පැසේ) යයි සංඝ භේදකයා කල්පයම නිරයේ සිටී යයි ලබ්ධි වේ. යම්සේ රාජගිරිකයන්ගේ මෙනි. ඔවුන් සඳහා **කප්පට්ඨෝ** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. **බුද්ධෝ ච ලොකෙ** යන මෙය හැර බුද්ධෝත්පාදයෙන් සංඝභේදයේ අභාවය දැක්වීමට කියන ලදී. **කප්පෙ ච සණ්ඨාති සංඝො ච භිජ්ජති** යනාදිය ඉදින් හේ මුළු කල්පයම සිටීද, නැවත හටගැනීමේ සිට ඒ කර්මය කොට එහි ඉපදී සිටින්නේ යයි දැක්වීමට කියන ලදී. **අතීතං** යනාදිය යට කියන ලද අදහසය. **කප්පට්ඨෝ ඉදධිමා** යන ප්‍රශ්නයෙහි භාවනාමය සඳහා ප්‍රතික්ෂේප කරයි. පරසමයෙහි ජාතිමය ඍද්ධිය කැමති වේ. ඒ සඳහා පිළිගනී. **ඡන්දිද්ධිපාදෝ** යනාදිය ජාතිය හැර ඉද්ධියෙන් ඉද්ධි ඇතැයි මෙය ලබ්ධිය පමණකි. කිම එයින් ඍද්ධිය ඇත්ද? මෙම නයින් ඉද්ධිපාද භාවිතය වන්නේ යයි චෝදනා පිණිස කියන ලදී. **අපායිකෙ නෙරයිකෙ** යන සූත්‍රය හේ එක කපක් අසූවට බෙදා එයින් එක් කොටසක කාලයක් පමණක් සිටින්නේය. ඒ ආයු කල්පය සඳහා කියන ලදී. එහෙයින් දුසාධක වේ.

කුසල චිත්ත පටිලාභ කථා 118

දැන් කුසල සිත් ප්‍රතිලාභ කථා නම් වේ. එහි කල්පසමය ස්ව සමයෙහි කාමාවචර කුසලයම ලබයි. එහි උපත යමකින් වලක්වන්නේ නම් එය මහගත හෝ ලෝකෝත්තර හෝ නොලබයි. මෙම විභාගය නොකොට අවිශේෂයෙන් ඒ කුසල සිත නොලැබේ යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ උත්තරාපථකයන්ගේ මෙනි. විභාග දැක්වීමෙන් ඔවුන්ගේ ඒ ලබ්ධිය බිඳීමට විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. මෙහි සෙස්ස නොගැඹුරු අරුත් වේ.

අනන්තරාපයුත්ත කථා 119

දැන් අනන්තරා පයුත්ත කථා නම් වේ. එහි අනන්තරා පයුත්ත නම් යමකින් ස්කන්ධ භේදයෙන් අනතුරුව විපාක දෙන මාතෘ ඝාතක ආදි ආනන්තරික කර්ම අණ කරන ලදී. එහි යමෙකුගේ නියත අණ කිරීමෙන් අණකරන ලද ඒ කර්මය කරන්නේය. හේ අර්ථසාධක චේතනාවෙන් උපදින ලද බැවින් මවඡතතනියත වේ. සම්මත්ත නියාමයට බැසගැනීමට නො සුදුසු වේ. යමෙකුගේ අනියත ආණත්තියෙන් අණ කරන ලද ඒ කර්මය කරන්නේය. හේ අර්ථසාධක චේතනාවෙන් නූපදන ලද බැවින් මිචඡතෙ නියත නොවේ. සම්මත්ත නියාමයට බැසගැනීමට සුදුසු වේ. මෙය ස්ව සමයෙහි නිශ්චයයි.

අනියත ආණත්තියෙන් ද සම්මත්ත නියාමයට බැසගැනීමට නුසුදුසු වේ යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ උත්තරාපථකයන්ගේ මෙනි. ඔවුන්ගේ ලබ්ධිය බිඳීමට සකවාදියා පූර්ව පක්ෂය දී අනන්තරා පයුත්තෙතා යයි පරවාදියා විසින් තමාගෙන් විචාරවයි. එයින් මෙහි පළමු විචාරීම පරවාදියාටය. අර්ථසාධක චේතනාවේ අභාවය සඳහා ප්‍රතිඥාව සකවාදියාටය. ඉන්පසු පරවාදියා මාතුඝාත ආදි කර්මයේ අණ ලද බැවින් හේ මිචඡතත නියත යයි සිතයි. එහෙයින් **මිචඡතත නියාමං** යන ප්‍රශ්නය විචාරයි. සකවාදියා එක් පුද්ගලයෙකුගේ නියාම දෙකක් බැස නො ගැනීම සඳහා **න හෙවං** යයි ප්‍රතික්ෂෙප කරයි. **නනු තං කම්මං** යනු මාතුඝාතාදි කර්මය. එහි අනියත ඇණවීම සඳහා **ආමනතා** යයි ප්‍රතිඥාව සකවාදියාගේය. අනියත වූද ඇණවීම යොදවා සිටියහුට මා විසින් නුසුදුසු දෙයක් කරන ලදැයි කුකුස් ඉපදී විපිළිසර බවට පත්වේ. **හඤ්චි** යනාදිය කුකුස් ඉපදීම පමණක් ගෙන පරවාදියා විසින් ලබ්ධිය පිහිටුවීමට කියන ලදී.

දැන් යමෙකුගේ අනියත ආණත්තිකයකුගේ අනන්තර පුථුක්ත පරාදීනව සම්මත්ත නියමයට බැසගැනීම වන්නේය. ඒ පුද්ගලයා ගෙන **අනන්තර, පයුත්තෙතා පුගගලො අහබෙබා** යයි විචාරීම සකවාදියාටය. තමාගේ ලබ්ධි වශයෙන් ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට සකවාදියා මාතුඝාතාදි කර්ම කරන්නා නුසුදුසු වේ. කිම ඔබගේ එයින් ඒ කර්ම කළවුන් යයි චෝදනා කිරීමට **මාතා ජීවිතා වොරොපිතා** යනාදිය කීය.

අනෙකා ඒ වස්තූන්ගේ අරෝගය **පිණිස** එබඳු ක්‍රියාවක් නොදක්නේ **න හෙවං** යයි ප්‍රතික්ෂෙප කරයි. **තං කම්මං පටිසංහරිත්වා** යයි අනියත ආණත්‍ති කර්මය සඳහා කියන ලදී. එය මා විසින් කළ අණ නිවාරණයෝ හැකිළීම වේ. හකුලන ලද හෙයින්ම මෙහි කුකුස දුරුවිය. එනිසා විපිළිසර බව දුරුවීම වේ. මෙසේ ඇතිකල්හිද පෙර ඇණවීමෙන්ම නියතභාවය සිතන්නේ පරවාදියා **ආමනන්‍ති** යයි පිළිගනී. ඉක්බිති ඔහුට සකවාදියා ඒ කර්මයේ හකුලන ලද බව පිළිගන්වා තමාගේ ලබ්ධිය පිහිටුවා **හඤ්ච්** යනාදිය කීය. නැවත **අනන්තරා පයුත්තෙනා** යයි අවසාන ප්‍රශ්නයෙහි පළමු ප්‍රශ්නයෙහි මෙන් විචාරීම පරවාදියාටය. ප්‍රතිඥාව සකවාදියාටය. ප්‍රයුක්ත පූර්වතා පමණක් ගෙන අනියත ආණත්‍ති වශයෙන් **හඤ්ච්** යයි ලබ්ධිය පිහිටුවීම පරවාදියාගේය. මේ ලබ්ධිය වනාහි නුනුවණින් පිහිටුවන ලද හෙයින් නොපිහිටුවන ලද්දේම වේ.

නියාම කථා 120

දැන් නිපාතයේ නියාම කථා නම් වේ. එහි **මිච්ඡත්ත නියාම** ආනන්තරිය කර්මය සහ සම්මත්ත නියාම ආර්ය මාර්ගය යයි නියාම දෙකකි. මේ නියාම දෙක හැර අනිත් නියාමයක් නැත. සෙසු සියළු තෙහුමික ධර්ම අනියත නම් වේ. ඒවායින් යුක්ත වූ ඒවාද අනියත වේමය. බුදුවරුන් විසින් වනාහි ස්වකීය ඤාණ බලයෙන් මේ සත්ත්වයා අනාගතයෙහි බෝධියට පැමිණෙන්නේ යයි ප්‍රකාශ කරන බෝධිසත්ත්වයා පින් පිරුණ බැවින් නියත යයි කියනු ලැබේ. මෙසේ මේ ව්‍යවහාර මාත්‍රය ගෙන බෝධිසත්ත්වයා පශ්චිම භවිකය. ඒ සමයේ ධර්මය අවබෝධ කිරීමට සුදුසුය යන අදහසින් නියත වූ නියාමයට බැසගන්නේ යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ පුබබසේලී අපරසේලීයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. **මිච්ඡත්ත නියතො** යනාදි අනිත් නියාමයෙන් නියත වූ අන්‍ය නියාමභාව දැක්වීම සඳහා කියන ලදී. **පුබ්බෙ මගගං භාවෙත්වා** යනාදිය නියාම ප්‍රභේද දැක්වීමට කියන ලදී. **භබ්බො බොධිසතෙතා** යන වචනය නුදෙක් බෝසතුන්ගේ සුදුසු බව දක්වයි. නියතයාගේ නියාමයට බැසගැනීම ඒ නිසා අසාධ වේ. හේ වනාහි පෙර එක් නියත ධර්මයකින් අනියතය. බෝමැඩදී සත්‍ය දර්ශනයෙන් නියාමයට බැස ගන්නේය.

නිවුත කථා 121

දැන් නිවුත කතා නම් වේ. එහි පිරිසිදු පුද්ගලයාට පිරිසිදු කෘත්‍ය නැති බැවින් නිවරණයන්ගේ යටකරන ලද පැතිර ඇති ගැවසීගත් පුද්ගලයාට නීවරණ දුරුකිරීම වේ යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ උත්තරාපථකයන්ගේ මෙනි. ඔවුන් සඳහා **නිවුතො** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. **රතෙතා රාගං** යනාදිය නිවුතයාගේ (වටකළහුගේ) නීවරණ දුරුකිරීමෙහි දොස් දැක්වීමට කියන ලදී. **පරිසුද්ධ පරියොදාතෙ** යනාදිය විෂ්කම්භන විසුද්ධියෙන් පිරිසිදු වූවහුගේ සමුච්ඡේද විසුද්ධිය දැක්වීමට කියන ලදී. **තසස එවං ඥානතො** යනාදිය දැනීමෙන් දැකීමෙන් නිවන දක්වයි. නිවුත්තයාගේ නීවරණ දුරකිරීම නොවේ. එහෙයින් අසාධක වේ.

සම්මුඛීභූත කථා 122

දැන් සම්මුඛී භූත කථා නම් වේ. එහි **සම්මුඛීභූතො** සංයෝජනවල සම්මුඛභාවයයි. ඒවායින් යුක්ත බවට පැමිණියේය. මෙහි සෙස්ස නිවුත කථා හා සමාන වේමය.

ආශ්වාදන කථා 123

දැන් සමාපන්න වූයේ ආශ්වාදනය කෙරේ යයි කථා නම් වේ. එහි පළමු ධ්‍යානයට සමවැදී වාසය කරයි. හේ එය ආශ්වාදනය කෙරේ යයි ආදි වචන නිසා සමාපන්න ආශ්වාදනය කරයි. එය ඔහුගේ ධ්‍යාන ආශාව යයි ධ්‍යාන අරමුණ වේයයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ අන්ධකයින්ගේ මෙනි. ඔවුන් සඳහා **සමාපනෙනා** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. **තං ඣඩහං තසස ඣඩානසස ආරම්මණං** යන ප්‍රශ්නවල එයම ඒ අරමුණ නොදක්නේ සූත්‍ර විරෝධ බියෙන් ප්‍රතික්ෂේප කරයි. 'තදසසාදෙති' වචන මාත්‍රයෙන් පිළිගනී. **සො**

තං අසසාදෙති යන සූත්‍රය ධ්‍යානලාභියා ධ්‍යානයෙන් නැගිට ධ්‍යාන ආශ්වාදය සාධයි. සමාපත්තිය තුළදීම ධ්‍යාන ආශාව ධ්‍යාන අරමුණු බව නොවේ. එහෙයින් සාධක නොවේ.

අසාත රාග කථා 124

දැන් අසාත රාග කථා නම් වේ. එහි 'යං කිංචි වෙදනං වෙදෙති සුඛං වා දුකඛං වා අදුකඛමසුකං වා සො තං වෙදනං අභිනඳති අභිවදති' (යම්කිසි සැප හෝ දුක් හෝ අදුකඛමසුඛ හෝ වේදනාවක් විඳිද හෙතෙම ඒ වේදනාවට සතුටු වේ. ප්‍රකාශ කරයි.) යන සූත්‍රයෙහි මෙලොව වශයෙන් සතුටුවීම කියන ලදී. අභිනඳති යන වචනය නිසා දුක්වේදනාවේ ද රාග ආශ්වාද වශයෙන් සතුටු වේ. එනිසා ආසාත රාගය ඇතැයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ උත්තරාපථකයන්ගේ මෙනි ඔවුන් සඳහා අහේ **අසාත රාගො** විචාරීම සකවාදියාටය. එහි **අසා රාග** යනු දුක්වේදනා විඳින කල්හි අහෝ මට මෙය වන්නේ යයි ඇලීම. **ආමනතා** යයි ලබ්ධි වශයෙන් ප්‍රතිඥාව පරවාදියාටය. සො තං වෙදනං අභිනඳති යන සූත්‍රයෙහි වෙනස්වී දුක්වේදනාව අරබයා රාගය ඉපදීමක් නම් නැත. සමූහ වශයෙන් ගැනීමෙන් වනාහි විඳීම් ලක්ෂණ වූ ධර්මය දුක්වේදනාවම හෝ ආත්ම වශයෙන් බලන්නේ දිටු හැඟීම් වූ දිටු අභිනන්දනයෙන් සතුටු වේ. දුකින් වෙනස්වන වේදනාවෙන් සතුටු නොවේ. දුක් වේදනාවෙන් යුක්ත වූ ඊට ප්‍රතිපක්ෂ වූ කාම සුව පතන්නේ දුක් වේදනාව සතුටු වේ. මෙසේ දුක් වේදනාවෙන් සතුටුවේ යන අදහසයි. එනිසා මේ අසාත රාගය අසාධක වේ.

ධම්ම තණහා අබ්‍යාකතා කථා 125

දැන් ධම්ම තණහා අබ්‍යාකතා කථා නම් වේ. එහි රූප තෘෂ්ණාව -පෙ- ධර්ම තෘෂ්ණා යයි මේ තෘෂ්ණා සයේ යම්සේ සියල්ලටම පසු තෘෂ්ණාව ධර්ම තෘෂ්ණා යයි කියන ලදී. එහෙයින් එය අව්‍යාකෘත යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම් පුබ්බසේලියන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. සෙසු ප්‍රශ්නවල පෙළෙන්

අර්ථය පමුණුවයි. කාම තෘෂ්ණාදි කොටස් තුනෙන් තෘෂ්ණා සය හකුළුවා දක්වන ලදී. රූපාදි අරමුණු සයෙහි කාමාශ්වාද වශයෙන් පවතිනා තෘෂ්ණාව කාම තෘෂ්ණා වේ. ආත්මය ද ලෝකය ද යයි ශාස්වත දෘෂ්ටි සහගත තෘෂ්ණාව භව තෘෂ්ණා වේ. නොවන්නේ යයි උච්ඡේද දෘෂ්ටි සහගත තෘෂ්ණාව විභව තෘෂ්ණා වේ. **නනු සා ධම්ම තණ්හා** යන පද තෘෂ්ණාවෙන් ධර්ම අරමුණු අරබයා පැවතීම දක්වයි. අව්‍යාකෘතභාවය නොවේ. එහෙයින් සාධක නොවේ.

ධම්ම තණ්හා න දුක්ඛ සමුදයොති කථා 126

දැන් ධර්ම තෘෂ්ණාව දුක්ඛ සමුදය නොවේය කථා නම් වේ. එහිද යම්හෙයකින් එය ධර්ම තෘෂ්ණාව යයි කියන ලදී. එහෙයින් දුක්ඛ සමුදය නොවේ යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ පුබ්බසේලියන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. සෙස්ස පෙරකථාව හා සමාන වේ.

තෙළෙස්වැනි වර්ගය නිමයි.

කුසලාකුසල පටිසන්ධාන කථා 127

දැන් කුසල අකුසල ප්‍රතිසන්ධි කථා නම් වේ. එහි අකුසලයේ කුසල හෝ කුසලයේ අකුසල හෝ අනතුරුව ඉපදීමක් නම් නැතැයි ඒවායේ අන්‍යොන්‍ය ප්‍රතිසන්ධානය නො යෙදේ. යම්හෙයකින් යමෙක් වනාහි එක් වස්තුවකම ඇලීම ද නො ඇලීම ද වේ. එහෙයින් එය අන්‍යොන්‍යව නැවත ගලපයි යන ලබ්ධිය ගෙන සිටී. මහා සංඝිකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. **අවාටටනා පණිධි** යයි ආවජ්ජන දෙකටම නමකි. ඒ භවංගය පෙරලේය ආවටටනා වේ. භවංග අරමුණකින් වෙනත් අරමුණක සිත පිහිටයි තබයි යනු පණිධි වේ. **කුසලං ආවටටනතසස** යයි යම් ඒ අකුසලයට අනතුරුව නැවත ගලපන කුසලය උපදී. එය නොපෙරලී උපදිදැයි අසයි. අනිකා ආවර්ජනය හැර කුසලයේ ඉපදීම නො දක්නේ ප්‍රතික්ෂෙප කරයි. **කුසලං අයොනිසො මනසිකරොති** යන මෙය අකුසලයට අනතුරුව කුසලය උපදින්නේ නම් අකුසලයම ආවර්ජනයෙන් නුනුවණින් මෙනෙහි

කරන්නාට උපදින්නේ යයි චෝදනා කිරීමට කියන ලදී. සෙස්ස පෙළ අනුව පමුණුවා ගන්න. **නනු යසම්ඤ්ඤඤ්ඤව වත්ථුසම්ං** යන වචනය එක අරමුණෙහි සරාගය සහ විරාගය දක්වයි. කුසල අකුසල අන්තරභවය ඒ නිසා අසාධක වේ.

සළායතන උත්පත්ති කථා 128

දැන් සළායතන උත්පත්ති කථා නම් වේ. උපපත්තේයි ප්‍රතිසන්ධි සිත සමග ඕපපාතිකයන්ගේ සළායතන පහළ වේ. ගබ්භසෙය්‍යකයන්ට අජ්ඣත්තික ආයතනවල මනායතන කායායතන ප්‍රතිසන්ධි ක්ෂණයෙහි උපදී. ඉතිරි ආයතන සතර සත් සැත්තෑ රෑයෙහි උපදී. ඒවාද ප්‍රතිසන්ධි කර්මය හෝ වෙනත් කර්මයක් කළ හෙයින්දැයි ස්ව සමයෙහි වාදය වේ. එසේ වුවද එක් කර්මයක් හටගැනීමෙන් අතු වෙලෙප් යුත් ගස්වල අංකුර මෙන් බීජමාත්‍ර සළායතන මච්කුස පිළිසිඳ ගැනීමේදීම උපදී යනු යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ පුබ්බසේලියන්ගේ මෙනි. ඔවුන් සඳහා **සළායතනං** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. **සබ්බංග පච්චංගං** යනාදි සළායතන ඇතිකල්හි මෙබඳු වී බැසගනී යයි චෝදනා කිරීමට කියන ලදී. **මාතුකුච්ඡි ගතසස** යයි විචාරීම පරවාදියාටය. පසුව **මාතුකුච්ඡිගතසස පච්ඡා කෙසා** යයි විචාරීම සකවාදියාටය. මෙහි සෙස්ස පැහැදිලිය.

අනන්තර පච්චය කථා 129

දැන් අනන්තර පච්චය කථා නම් වේ. එහි නෘත්‍ය ගීතාදියේ රූප දැකීම ශබ්ද ඇසීම ආදියේ වහා සිදුවන පෙරලීම් දැක මේ විඤ්ඤාණ ඔවුනොවුනට අනතුරුව උපදී යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ උත්තරාපථකයන්ගේ මෙනි. ඔවුන් සඳහා **චකඛු විඤ්ඤාණසස** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. **සොත විඤ්ඤාණං රූපාරම්මණඤ්ඤව** යනාදිය චකඛු විඤ්ඤාණයට අනතුරුව උපදී. විපාක මනෝධාතු මෙන් රූපාරම්මණය වන්නේ යයි චෝදනා කිරීමට කියන ලදී. **චකඛුඤ්ඤව පටිච්ච රූපෙ ච උපජ්ජති සොත විඤ්ඤාණං** යන ප්‍රශ්නවල සූත්‍ර අභාවය නිසා

ප්‍රතික්ෂේප කොට අනතුරුව පවත්නා බව සලකන්නේ ලබ්ධි වශයෙන් පිළිගනී. **තඤ්ඤව චකඛු විඤ්ඤාණං තං සොත විඤ්ඤාණං** යයි යම්සේ පළමු ජවනයට අනතුරුව දෙවන ජවනය මනෝ විඤ්ඤාණභාවයෙන් එයම වේ. කිම ඔබගේ මේ දෙකම එකදැයි විචාරයි. මෙම නයින් සියළු වාරවල අර්ථය දතයුතුය. **නවචනි ගාථනි** යනාදි වචන අරමුණු එක්කිරීමෙහි වහා පරිවර්තනය වීමෙන් සංකීර්ණබවක් දක්වයි. අතන්තර ප්‍රත්‍ය නිසා නොවේ. එනිසා සාධක නොවේ.

අරියරූප කථා 130

දැන් අරියරූප කථා නම් වේ. සම්මා වාචා, සම්මා කම්මනත රූපය 'තඤ්ච බො සබබං රූපං චතතාරි ච මහා භූතානි චතුනනඤ්ච මහා භූතානං උපාදාය රූප' යන වචනයෙන් උපාදාය රූප වේ යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ උත්තරාපථකයන්ගේ මෙනි. ඔවුන් සඳහා **අරිය** රූපං මහාභූතානං **උපාදාය** යයි විචාරීම සකවාදියාටය. එහි ආර්යයන් හෝ රූපය, ආර්ය වූ හෝ රූපය අරිය රූප වේ. **ආමනනා** යයි ලබ්ධියේ සිට ප්‍රතිඥාව පරවාදියාටය. **කුසලං** යයි විචාරණ ලද්දේ ලබ්ධි වශයෙන් ම පිළිගනී. අනාසව විචාරීම්වල ද මෙම නයම වේ. **යං කිඤ්චි රූපං** යන සූත්‍රය හැර සෙසු රූප භූත උපාදාය බව දක්වයි. සම්මා වාචා කම්මනතවල ඒවායේ රූප මාත්‍රයම සිදු නොවේ. උපාදාය රූප කොහේද? එනිසා අසාධක වේ.

අඤ්ඤා අනුසයෝ කථා 131

දැන් අඤ්ඤා අතිසංයොනි කථා නම් වේ. මෙහි පෘථග්ජනයා කුසල අව්‍යාකෘත සිත පවතින කල අනුසය සහිත යයි කිවයුතුය. නැගිටින අවස්ථාවේ නොවේ. එනිසා අනුසය අනිකකි, නැගිටීම අනිකක් යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ අන්ධකයින්ගේ මෙනි. ඔවුන් සඳහා **අඤ්ඤා කාමරාගානුසයෝ** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. සෙස්ස යට අනුසය කථාවෙහි කියන ලද නයින්ම දතයුතුය.

සානුසයෝ යනාදි ඒ අවස්ථාවේ අනුසයේ අප්‍රහීන බව අනුසය සහිත යයි කිවයුතු හා නූපන්නා වූ ද පරියුට්ඨීත ද නොකිව යුතු යයි දක්වයි. අනුසය පරියුට්ඨානයෙන් අන්‍ය තත්ත්වයක් නොවේ. එහෙයින් සාධක නොවේ.

පරියුට්ඨානං චිත්තවිප්පයුත්තනති කථා 132

දැන් පරියුට්ඨානය චිත්ත විප්‍රයුක්ත යයි කථා නම් වේ. එහි අනිත්‍යාදි වශයෙන් මෙනෙහි කරන්නාට ද රාගාදිය උපදී. මෙය කියන ලදී. 'හාරද්වාජය, එක් දිනක අසුභ වශයෙන් මෙනෙහි කරන්නෙමියි සුභ වශයෙන්ම මෙනෙහි කරයි.' එහෙයින් පරියුට්ඨානය චිත්ත විප්‍රයුක්ත යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ අන්ධකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. මෙහි සෙස්ස නොගැඹුරු අරුත් වේමය.

පරියාපන්න කථා 133

දැන් පරියාපන්න කථා නම් වේ. එහි යම්හෙයකින් කාමරාගය කාමධාතුවේ නිද්‍රා අවස්ථා වේ. කාමධාතුවේ ඇතුළත් යයි ද කියනු ලැබේ. එහෙයින් රූප අරූප රාගය ද රූප ධාතු අරූප ධාතුවල නිද්‍රාවේ සිටී. රූප ධාතු අරූප ධාතු පරියාපන්න වේ යයි ද යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ අන්ධකයින්ගේ ද සම්මිතියන්ගේ ද මෙනි. ඔවුන් සඳහා **රූප රාගො** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. එහි **අනුසෙති** යයි යම්සේ කාමරාගය කාම විතර්ක සංඛ්‍යාත කාමධාතුව සහජාත වශයෙන් නිදයි. කිම ඔබගේ රූප රාගය රූප ධාතුදැයි විචාරයි. **පරියාපනන** යයි යම්සේ ඒ ත්‍රිවිධ වූ කාමධාතුවේ ක්ලේශකාම වශයෙන් ඇතුළත් වූ බැවින් කාමධාතු පරියාපන්න වේ. කිම ඔබගේ මෙසේ රූප රාගය ද

රූපධාතු පරියාපන්නදැයි විචාරයි. අනිකා වනාහි අදහස නො සලකන්නේ හුදෙක් ලබ්ධි වශයෙන් **ආමන්තා** යයි පිළිගනී. ඉක්බිති ඔහුට එම අර්ථය සලවාලන්නට කුසල විපාක කිරිය සංඛ්‍යාත සමාපත්ති ආදියෙන් සසඳ විචාරීමට **සමාපත්තෙසියො** යනාදිය කීය. මෙහි සෙස්ස පෙළ අනුව පැමිණෙයි. **නනු කාමරාගො** යනාදි වචනය ද කාමරාගයේම කාමධාතුවේ අනුසය බවද ඇතුළත් බවද දක්වයි. ඉතිරිවා ඉතිරි ධාතුවල නොවේ.

අබ්‍යාකත කථා 134

දැන් අව්‍යාකෘත කථා නම් වේ. විපාක කිරිය රූප නිබ්බාන සංඛ්‍යාත චතුර්විධ අව්‍යාකෘතය අවිපාක බැවින් අව්‍යාකෘත යයි කියන ලදී. දෘෂ්ටිගත වූ 'වචඡය, ලෝකය ශාස්වතය. මෙය අව්‍යාකෘතය' යයි ශාස්වතාදි භාවයෙන් නොකියන ලද බැවින් යමෙකුගේ වනාහි මේ විභාගය නොගෙන පෙර අව්‍යාකෘතය මෙන් දෘෂ්ටිගතයා ද අව්‍යාකෘත යයි ලබ්ධි වේ. යම්සේ අන්ධකයින්ගේ ද උත්තරාපථකයන්ගේ ද මෙනි. ඔවුන්ගේ ඒ විභාගය දැක්වීමට **දිට්ඨිගතං අබ්‍යාකතං** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. මෙහි සෙස්ස පෙළ අනුවම පමුණුවා ගනී.

අපරියාපන්න කථා 135

දැන් අපරියාපන්න කථා නම් වේ. එහි යම්හෙයකින් ධ්‍යානලාභී පෘථග්ජනයා කාමවල පහවූ රාග ඇත්තේ යයි කිවයුතු වේ. එසේ වුවත් පහ වූ දෘෂ්ටි නොවේ. එහෙයින් දෘෂ්ටිය අපරියාපන්න යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ පුබ්බසේලීන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. මෙහි සෙස්ස පෙළ අනුව පැමිණවිය යුතුය.

තුදුස්වන වර්ගය නිමි.

පච්චය කථා 136

දැන් පච්චය කථා නම් වේ. එහි යම් ධර්මයක් හේතු ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වේ. යමක් හේතු ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේද, එයම යම්හෙයකින් ආරම්මණ අනන්තර සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය නොවේ. යමක් ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වේද, එයම යම්හෙයකින් අනන්තර සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය නොවේ. එහෙයින් ප්‍රත්‍යභාවය විකල්පයයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ මහා සංඝිකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. මෙහි සෙස්ස පෙළ අනුවම පැමිණවිය යුතුය.

අඤ්ඤමඤ්ඤ පච්චය කථා 137

දැන් අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය කථා නම් වේ. එහි යමෙකුගේ සමයෙහි 'අවිජ්ජා පච්චයා සංඛාරා' අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙත්යයි නමුත් සංස්කාර ප්‍රත්‍යයෙන් අවිද්‍යා නැත. එහෙයින් අවිද්‍යාවම සංස්කාරයන්ට ප්‍රත්‍ය වේ. අවිද්‍යාවට සංස්කාර ප්‍රත්‍ය නොවේ යයි ලබ්ධි වේ. යම්සේ මහා සංඝිකයන්ගේ මෙනි. ඔවුන් සඳහා අවිද්‍යා සංස්කාරාදීන්ගේ අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යබව ද ඇතැයි දැක්වීමට විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. **අවිජ්ජා සංඛාරෙන** යයි මෙහි අපුඤ්ඤාභිසංඛාරම ගන්නා ලදී. එහෙයින් **සංඛාර පච්චයා අවිජ්ජා** යන මෙහි සහජාත අඤ්ඤමඤ්ඤ අත්ථි අවගත සම්ප්‍රයුක්ත වශයෙන් ප්‍රත්‍යභාවය දතයුතුය. **උපාදාන පච්චාපි තණ්හා** යන මෙහි කාම උපාදානය හැර සෙසු උපාදාන තුන අවිද්‍යාවට සංස්කාර මෙන් තණ්හාවට ප්‍රත්‍ය වේයයි දතයුතුය. සෙස්ස පෙළ අනුව පැමිණවිය යුතු. **ජරාමරණ පච්චයා** විචාරීම පරවාදියාටය. **නාමරූපං විඤ්ඤාණ පච්චයා** යයි විචාරීම සකවාදියාටය.

අද්ධා කථා 138

දැන් අද්ධා කථා නම් වේ. එහි 'තීණිමානි භික්ඛවෙ කථාවත්ථූනි' යන සූත්‍රය නිසා කාල සංඛ්‍යාත පරිනිෂ්පන්න (හේතුවෙන් හටගත්) අද්ධා නම් ඇතැයි යමෙකුගේ ලබ්ධිය වේ. කාලය යයි පැණවීම් මාත්‍රය හැර අද්ධ යයි පරිනිෂ්පන්න කිසිවක් ඒවායේ නැත. රූපාදිය වනාහි ස්කන්ධම පරිනිෂ්පන්න යයි විභාග දැක්වීමට අද්ධා පරිනිපඵනෙනා යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට ඉදින් එය පරිනිෂ්පන්න රූපාදියෙන් එක්තරා එකක් විය යුතු යයි චෝදනාවට රූපං යනාදිය කීය. අනෙකා ප්‍රතික්ෂෙප කරයි. සෙස්ස පෙළ අනුව පැමිණවිය යුතුය.

ඛණ - ලය - මුහුත්ත කථා 139

ඛණ - ලය - මුහුත්ත කථාවල ද මෙම නයම වේ. මේ ඛණ ආදි සියල්ලම අද්ධ පරියාය වේ.

ආසව කථා 140

දැන් ආසව කථා නම් වේ. එහි යම්හෙයකින් ආශ්‍රවවලින් මත්තෙහි අනිත් ආශ්‍රවයක් නම් නැත. යමකින් ආශ්‍රව සතර සාසව වන්නේය. එහෙයින් සතර ආසව අනාසව වේයයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ හේතුවාදීන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට ඉදින් ඔබගේ ආසව අනාසව වේ. මෙසේ ඇතිකල්හි ඒවා මාර්ගාදි ලක්ෂණයට පැමිණියා සෙයින් විය යුතුයයි චෝදනා කිරීමට මගෙහා යනාදිය කීය. මෙහි සෙස්ස පැහැදිලිය.

ජරාමරණ කථා 141

දැන් ජරාමරණ කථා නම් නම් වේ. එහි ජරාමරණ අපරිනිෂ්පන්න බැවින් ලෞකික යයි හෝ ලෝකෝත්තර යයි හෝ නොකිව යුතුය. 'ලොකියා ධම්මා ලොකුත්තරා ධම්මා' යන දුකයෙහි ජරාමරණ ලෞකික පදයෙහිවත් ලෝකෝත්තර පදයෙහිවත් දක්වා නැත. එහි යමෙකුගේ මේ ලක්ෂණය නොගෙන ලෝකෝත්තර ධර්මයන්ගේ ජරාමරණ ලෝකෝත්තර යයි ලබ්ධි වේ. යම්සේ මහා සංඝිකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. මෙහි සෙස්ස පෙළ අනුවම පමුණුවයි.

සඤ්ඤා වෙදයිත කථා 142

දැන් සඤ්ඤාවෙදයිත කථා නම් වේ. එහි සඤ්ඤාවෙදයිත නිරෝධ සමාපත්ති නම් කිසියම් ධර්මයක් නැත. සතර ස්කන්ධයන්ගේ නිරෝධයයි. මෙසේ එය ලෞකික නොවේ. ලෝකෝත්තර නොවේ. යම්හෙයකින් වනාහි ලෞකික නොවේ නම් එහෙයින් ලෝකෝත්තර වේ යනු යමෙකුගේ ලබ්ධිය වේ. යම් හේතුවාදීන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. සෙස්ස පෙර කථා හා සමාන වේ.

දුතිය සඤ්ඤාවෙදයිත කථා 143

දැන් යම්හෙයකින් එය ලෝකෝත්තර නොවේ නම් එහෙයින් ලෞකික වේ යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ හේතුවාදීන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. සෙස්ස පෙර හා සමාන වේ.

තතිය සඤ්ඤාවෙදයිත කථා 144

දැන් යම්හෙයකින් අසවල් දෙය මරණ ධර්මය, අසවල් දෙය මරණ ධර්ම නොවේ යයි සත්ත්වයින්ගේ මරණ ධර්මතාවයේ නියමයක් නැතැයි සඤ්ඤාවේදයිත නිරෝධයට සමවැදුනේ ද කලුරිය කරන්නේය යනු යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ රාජගිරිකයන්ගේ මෙනි. මරණ ධර්මතාවේ මරණ සමයද නොමැරෙණ සමය ද දැක්වීමට විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට යම්සේ කළුරිය කරන්නාට නම් මරණාසන්නයේ එසසාදියෙන් විය යුතුය. එහෙයින් ඒ ආකාරයෙන් චෝදනා කිරීමට **අත්‍ථි** යනාදිය කීය. **අථසසකසස කාලකිරියා** යනාදිය විචාරණ ලද්දේ සෙසු සතුන් සඳහා ප්‍රතික්ෂෙප කරයි. **විසං කමෙයය** යනාදිය විචාරණ ලද්දේ සමාපත්ති ආනුභාවය සඳහා ප්‍රතික්ෂේප කරයි. දෙවන වාරයෙහි ශරීර ප්‍රකෘතිය සඳහා පිළිගනී. මෙසේ ඇතිකල්හි සමාපත්ති ආනුභාවයක් නැත. එයින්ම ඔහු **න නිරොධ සමාපනෙනා** යයි යෙදේ. **න කාලංකරෙය්‍ය** යයි විචාරීම පරවාදියාටය. **අත්‍ථි සො නියාමො** යයි පරවාදියාගේ ප්‍රශ්නයෙහි මෙබඳු වූ නියාමයක් නම් නැත. එනිසා ප්‍රතික්ෂේප කරයි. **චකඛු විඤ්ඤාණ සමංගී** යනාදි සකවාදියා විසින් නියාමය නැති කල්හිද මැරෙන කාලයෙහිම මැරෙයි. අකාලයෙහි නොවේ යයි දැක්වීමට කියන ලදී. එහි අදහස මෙසේය. ඉදින් නියමයක් නොවීමෙන් මරණය වන්නේ නම් චකඛු විඤ්ඤාණය සමග වන්නේය. එයින් 'පංච විඤ්ඤාණවලින් චුත නොවෙයි, නො උපදියි' යන සූත්‍ර විරෝධය වන්නේය. යම්සේ චකඛු විඤ්ඤාණය සමග කාලකිරියා නොවේ නම් එසේ නිරෝධ සමාපන්නයාගේ ද වේ.

අසඤ්ඤ සතතුපිකා කථා 145

දැන් අසඤ්ඤසතතුපිකා කථා නම් වේ. එහි සංඥා විරාග වශයෙන් පවත්වන භාවනාව අසංඥ සමාපත්තිය ද නිරෝධ සමාපත්තිය ද සඤ්ඤාවේදයිත නිරෝධ සමාපත්ති නම් වේ. මෙසේ ලෞකික ලෝකෝත්තර වශයෙන් සඤ්ඤාවේදයිත නිරෝධ සමාපත්ති දෙකකි. එහි ලෞකිකය පෘථග්ජනයා පිළිබඳ අසඤ්ඤසතතුපිකා නම් වේ. ලෝකෝත්තරය ආර්යයනට වේ. එය නාසඤ්ඤ සතතුපිකා වේ. මේ විභාගය නොකොට අවිශේෂයෙන් ම සඤ්ඤාවේදයිත නිරෝධ සමාපත්ති

අසඤ්ඤසත්තුපිකා යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ හේතුවාදිකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට යම්හෙයකින් අසඤ්ඤ සමාපත්තියට සමවැදුනහුට අලෝභාදිය ඇත. නිරෝධ සමාපත්තිය නැත. එහෙයින් ඒවායින් චෝදනා කිරීමට **අත්ථි** යනාදිය කීය. මෙහි ද **අසඤ්ඤිහි** යන ප්‍රශ්නයෙහි මෙහි සඤ්ඤ විරාග වශයෙන් සමවදිනා ලද බැවින් අසඤ්ඤි බව අනුගතය. එහි ද මෙයින් චුත වූ අනාගාමියාට නිරෝධ සමාපත්තියම වේ. එහෙයින් ද මේ ප්‍රතිඥාවෙන් පිහිටුවන ලද ලබ්ධිය නොපිහිටියේම වේ.

කම්මූපචය කථා 146

දැන් කම්ම උපචය කථා නම් වේ. එහි යමෙකුගේ කර්මය උපචය නම් කර්මයෙන් අනිකක් වූ චිත්ත විප්‍රයුක්ත වූ අව්‍යාකෘත අනාරම්මණයකැයි ලබ්ධි වේ. යම්සේ අන්ධකයන්ගේද සම්මිතියන්ගේද මෙනි. ඔවුන් සඳහා **අඤ්ඤං කම්මං** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට ඉදින් කර්මූපචය කර්මයෙන් අනිකක් නම්, එසස උපචය ද එසසාදියෙන් අනිකක් විය යුතුයයි චෝදනා කිරීමට **අඤ්ඤෝ එසෙසා** යනාදිය කීය. අනිකා ලබ්ධියෙන් නැති බැවින් ප්‍රතික්ෂේප කරයි. **කමෙමන සහජාතෝ** යයි ප්‍රශ්නවල චිත්ත විප්‍රයුක්තය සඳහා ප්‍රතික්ෂේප කරයි. චිත්ත සම්ප්‍රයුක්තය සඳහා පිළිගනී. **කුසලෝ** යයි ප්‍රශ්නවලද විප්‍රයුක්තය සඳහා ප්‍රතික්ෂේප කරයි. සම්ප්‍රයුක්තය සඳහා පිළිගනී. **අකුසලෝ** යන ප්‍රශ්නවල ද මෙම නයම වේ. **සාරම්මණෝ** යයි විචාරණ ලද්දේ ඒකාන්ත අනාරම්මණම කැමති වේ. එහෙයින් ප්‍රතික්ෂේප කරයි. **චිත්තං හිස්ස්මානං** සිත බිඳුණුවිට කර්මය බිඳේ යන අර්ථය වේ. මෙය ම හෝ පාඨයයි. එහි යම්හෙයකින් සම්ප්‍රයුක්තය බිඳේ. විප්‍රයුක්තය නොබිඳේ. එහෙයින් පිළිගැනීම ද ප්‍රතික්ෂේපය ද වේ. **කම්ම මහි කම්මූපචයෝ** කර්මය ඇතිකල්හි කර්මූපචය වේ. කර්මය පිහිටි කල්හි හෝ කර්මූපචය වේ. කර්ම රැස්කිරීමෙන්ම විපාකය ඇතිවේ. ඒ කර්මය නිරුද්ධ වූ විට, අංකුරය ඇතිවීමෙන් බීජය මෙන් විපාකය ඇතිවීමෙන් කර්ම රැස්කිරීම පවතී යයි ලබ්ධි වේ. එහෙයින් පිළිගනී. **තඤ්ඤේව කම්මං සෝ කම්මූපචයෝ සෝ කම්මවිපාකෝ** යයි යම්හෙයකින් කර්මය කර්ම උපචය වේ. එයද විපාක දෙනතුරු පවතීයයි ලබ්ධි වේ. එහෙයින් ඒ තුනම

එකක්දැයි ඔහුගෙන් විචාරයි. **විපාකෝ සාරම්මණෝ** යන මෙය විපාකය මෙන් විපාක ධර්ම ස්වභාවය ද අරමුණ හා බැඳී ඇතැයි චෝදනා කිරීම පිණිස විචාරයි. අනිකා වනාහි ලබ්ධි වශයෙන් එකක් පිළිගනී. එකක් ප්‍රතික්ෂෙප කරයි. ප්‍රතිලෝමයෙහිද මෙම නයයි.

පසළොස් වන වර්ගය නිමයි.
තුන්වැනි පණ්ණාසකය නිමියේය.

නිගණ්ඨ කථා 147

දැන් නිගණ්ඨ කථා නම් වේ. එහි ලෝකයේ බලවත් වූ වශීභූත වූ යමෙක් ඇත. ඔහුට අනුන්ගේ සිත් නිග්‍රහ කිරීමට නොහැකි වන්නේ නම් ඔහුගේ බලවත්වීමෙන් වශීභූත වීමෙන් ප්‍රයෝජනය කුමක්ද? බලවත් වූ වශීභාවයෙන් අනුන්ගේ සිත් නිගැස්ම කරන්නා වූ බලවතෙක් ඇත්තේය යනු යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ මහා සංඝිකයන්ගේ මෙනි. ඔවුන් සඳහා **පරොපරස්ස** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. එහි **නිගණ්ඨානි** යනු සංක්ලේශයෙන් වලකාලීමය. මෙහි සෙස්ස පෙළ අනුව පමුණුවන්න.

නිගණ්ඨ කථාව ද මෙම නයම වේ.

සුඛානුප්පදාන කථා 148

දැන් සැප ප්‍රදාන කථා නම් වේ. එහි 'බහූනං වත නො භගවා සුඛ ධම්මානං උපහතත්තා' යන සූත්‍රය නිසා අන්‍යයෙක් අන්‍යයාට සැප ප්‍රදානය කරයි යනු යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ හේතුවාදී නිකායිකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. **දුකඛං අනුපපදෙති** යයි විචාරණ ලද්දේ එබඳු සූත්‍ර පද නොදක්නේ ප්‍රතික්ෂේප කරයි. **අත්තනෝ සුඛං** යනාදි ප්‍රශ්නයෙහි තමාගේ හෝ අනුන්ගේ හෝ යමක් ඇත්නම් එය ප්‍රදානය කිරීමට නොහැකිය. යමක් ඔහුටමය. එහි ප්‍රදානය නම් කුමක්දැයි ප්‍රතික්ෂේප කරයි. **නෙවත්තනෝ** යනාදි ප්‍රශ්නයෙහි වනාහි එබඳු වූ යමක් නොවේ නම් එය

නොදීමට සුදුසු වේ යයි ලබ්ධියෙන් පිළිගනී. **නො වත රෙ** යයි එබඳු වූ සැපයක් නැතැයි කියන ලදී. **සුබ ධම්මානං උපහතත්තී** යන වචනය භාග්‍යවතුන් වහන්සේ විසින් අනුන්ගේ සැපයට ප්‍රත්‍යවන බව දක්වන ලදී. ආහාරාදිය මෙන් සැපය ප්‍රදානය නොවේ. එහෙයින් සාධක නොවේ.

අධිගයහ මනසිකාර කථා 149

දැන් අධිගය්හ මනසිකාර කථා නම් වේ. එහි නයතො ආරම්මණතො යයි මනසිකාර දෙකකි. එහි එක සංස්කාරයක් ද අනිත්‍ය වශයෙන් දැකීමෙන් සියළු සංස්කාර අනිත්‍ය යයි අවසේස සංස්කාර පැමිණවීම නයතො මනසිකාර වේ. අතීත සංස්කාර මෙනෙහි කරන්නේ අනාගතයේ සංස්කාර මෙනෙහි කිරීමට හැකි නොවේ. අතීතාදියෙහි කිසිවක් මෙනෙහි කරන්නාට ආරම්මණාතො මනසිකාර වේ. එහි වර්තමානයෙහි මෙනෙහි කරන්නේ යම් සිතකින් ඒවා මෙනෙහි කෙරේද එය වර්තමාන ක්ෂණයෙහි මෙනෙහි කිරීමට නොහැකි වේ. එහි යමෙකුගේ 'සබ්බ සංඛාරා අනිච්චා' යනු වචනය නිසා ආරම්මණ මනසිකාරය පමණක් ගෙන මෙනෙහි කරන්නේ හැම සංස්කාර එකවිට මෙනෙහි කෙරේයයි ලබ්ධි වේ. පුබ්බසේලිය අපරසේලියන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට යම්හෙයකින් සියල්ල එකවිට මෙනෙහි කරන්නා විසින් යම් සිතකින් ඒවා මෙනෙහි කෙරේද එයද මෙනෙහි කළයුතු වේ. එහෙයින් ඒ සිත බැවින් චෝදනා කිරීමට **තෙන චිත්තෙන** යනාදිය කීය. අනිත් තැනැත්තා අරමුණුකොට දැනගැනීමට නොහැකියි ප්‍රතික්ෂේප කරයි. මෙබඳු ලක්ෂණ සිතයයි දැනගන්නා ලද බැවින් ඒ සිතද දන්නේ වේයයි පිළිගනී. නොහොත් එයම එහි අරමුණු නොවේයයි ප්‍රතික්ෂේප කරයි. 'සබ්බ සංඛාරා අනිච්චාති යදා පඤ්ඤාය පසසති' යනාදිය නිසා උපන් ලබ්ධි වශයෙන් පිළිගනී. සෙසු ප්‍රශ්න දෙකෙහිද මෙම නයම වේ. **නෙන එසෙසන** යනාදියෙහි සූත්‍රයෙහි යථා ස්වරූපය නොදක්නේ ප්‍රතික්ෂේපය. අතීතාදි ප්‍රශ්නවල යට කියන ලද නයින්ම ප්‍රතික්ෂේප ප්‍රතිඥා දතයුතුය. සෙස්ස පෙළ අනුව පැමිණවිය යුතුය. **සබ්බෙ සංඛාරා** යනාදි වචනය නයෙන් දැකීම සඳහා කියන ලදී. ආරම්මණ වශයෙන් ඒකක්ෂණයෙහි නොවේ. එහෙයින් සාධක නොවේ.

රූපං හෙතූති කථා 150

දැන් රූපය හේතුයයි කථා නම් වේ. එහි හේතු යනු කුසල මූලාදි හේතුවටත් කිසියම් ප්‍රත්‍යයටත් නමකි. මේ විභාගය නොකොට 'චතතාරෝ මහාභූතා හෙතූ' යන වචන මාත්‍රය නිසා අවිශේෂයෙන් රූපය හෙතු යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ උත්තරාපථයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. **අලොභො හෙතූ** යයි කිම ඔබගේ රූපය අලෝභ සංඛ්‍යාතයෙන් හේතුදැයි විචාරයි. අනෙකා ප්‍රතික්ෂෙප කරයි. සෙස්සෙහි ද මෙම නයයි. **මහාභූතා උපාදාය රූපානං උපාදාය හෙතූ** යන මෙහි ප්‍රත්‍යාර්ථයෙන් හේතුභාවය කියන ලදී. මූලාර්ථයෙන් නොවේ. එහෙයින් අසාධක වේ.

151 රූපං සහෙතකනති කථාවේ ද මෙම නයින්ම අර්ථය දතයුතුය.

රූපං කුසලාකුසලනති කථා 152

දැන් රූපය කුසල අකුසල යයි කථා නම් වේ. එහි **'කායකමමං වචී කමමං කුසලමපි අකුසලමපි'** යන වචනය නිසා කාය වචී සංඛ්‍යාත කාය විඤ්ඤත්ති වචී විඤ්ඤත්ති රූපය කුසල ද අකුසලදැයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ මහිංසාසකයන්ගේ ද සම්මිතියන්ගේ ද මෙනි. ඔවුන් සඳහා **රූපං කුසලං** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට ඉදින් ඔබේ රූපය කුසල වේද, මෙයාකාරයෙන් එය ද විය යුතුයයි සාරම්මණං යනාදිය කීය. පසුව අකුසල ප්‍රශ්නයෙහි ද මෙම නයම වේ. මෙහි සෙස්ස පැහැදිලිය.

රූපං විපාකොති කථා 153

දැන් රූපය විපාකයයි කථා නම් වේ. එහි කර්මය කළ බැවින් උපන් චිත්ත චෛතසිකයන් මෙන් කර්මය කළ බැවින් උපන් රූපයද විපාකයයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ අන්ධකයන්ගේ ද සම්මිතියන්ගේ ද මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට ඉදින් ඔබගේ රූපය විපාක වේ නම්

මෙයාකාරයෙන් එයද විය යුතුයයි චෝදනා කිරීමට සුබවෙදනීයං යනාදිය කීය. සෙස්ස පෙළ අනුව පැමිණවිය යුතුය.

රූපං රූපාවචරං අරූපාවචරනන්ති කථා 154

දැන් රූපය රූපාවචර යයි කථා නම් වේ. එහි කාමාවචර කර්මය කළ බැවින් යම් රූපයක් කාමාවචර වේ ද එහෙයින් රූපාවචර අරූපාවචර කර්ම කළ බැවින් රූපය රූපාවචර අරූපාවචර වේයයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ අන්ධකයන්ගේ මෙනි. ඔවුන් සඳහා අත්ථිරූපං රූපාවචරං යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. මෙහි සෙස්ස යට කියන ලද නයින් දතයුතුය.

රූපරාගො රූපධාතු පරියාපන්නො අරූපරාගො අරූපධාතු පරියාපන්නන්ති කථා 155

දැන් රූප රාගය රූප ධාතුවම ඇතුළත්ය. අරූප රාගය අරූප ධාතුවට ඇතුළත් යයි කථා නම් වේ. එහි යම්හෙයකින් කාමරාගය කාම ධාතුවට ඇතුළත් වේද, එහෙයින් රූපාරූප රාගද රූපාරූපධාතුවලට ඇතුළත් විය යුතු යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ අන්ධකයින්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. සෙස්ස යට කියන ලද නයින්ම දතයුතුය. එහි හුදකලාව රූප ධාතු අත්නොහැර පවතී. අරූප ධාතු අත්නොහැර පවතී යන පද විශේෂයයි. ඒ ලබ්ධි වේ. අන්ධකයන්ගේ ද සම්මිතියන්ගේද වේ. මෙය අන්ධකයින්ගේමය.

සොළොස්වැනි වර්ගය නිමයි.

අත්ථි අරහතො පුඤ්ඤූපචයොති කථා 156

දැන් රහතන් වහන්සේ පින් රැස්කිරීම යයි කථා නම් වේ. එහි යමෙකුගේ රහතන් වහන්සේගේ දාන සංවිභාග චේතිය වන්දනාදි කර්ම දැක රහතන් වහන්සේට පින් රැස්කිරීම ඇතැයි ලබ්ධි වේ. යම්සේ අන්ධකයින්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට රහතන් වහන්සේ නම් ප්‍රහීන කළ පින්පව්

ඇත්තේ වේ. ඉදින් උන්වහන්සේ පින් කරන්නේ නම් පව්ද කරන්නේ යයි චෝදනා කිරීමට **අපඤ්ඤපචයෝ** යයි කීය. අනෙකා ප්‍රාණඝාතාදි කර්ම නොදක්නේ ප්‍රතික්ෂේප කරයි. **පුඤ්ඤාභි සංඛාරං** යනාදියෙහි භවගාමී කර්ම රහතන් වහන්සේට නැතැයි ප්‍රතික්ෂේප කරයි. **දානං දදෙය්‍ය** යනාදියෙහි කිරිය සිතින් දානාදිය පවත් ස්වභාවයෙන් සකවාදියා පිළිගනී. අනෙකා සිත නොගෙන ක්‍රියා පවත් මාත්‍රය දැකීමෙන්ම ලබ්ධිය පිහිටුවයි. එය වනාහි අනුවණින් පිහිටුවන ලද බැවින් නොපිහිටුවන ලද්දේ වේමය.

නත්ථි අරහතො අකාල මච්චූති කථා 157

දැන් රහතන් වහන්සේට අකාල මරණ නැතැයි කථා නම් වේ. එහි **නාහං භික්ඛවෙ සඤ්චෙතනිකානං කම්මානං කතානං උපචිතානං විපාකං අපපටිසංවෙදිත්වා බ්‍යන්තිභාවං වදාමි** යන සූත්‍රයේ අර්ථය අනුවණින් ගෙන රහතන් වහන්සේ නම් සියළු කර්ම විපාක විඳ පිරිනිවන් පෑ යුතුය. එහෙයින් රහතන් වහන්සේට අකාල මරණ නැතැයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ රාජගිරිකයන්ගේද සිද්ධත්ථිකයන්ගේද මෙනි. ඔවුන් සඳහා විචාරිම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට ඉදින් උන්වහන්සේට අකාල මරණ නැත්නම්, අරහන්ත ඝාතක නම් නොවිය යුතුයයි චෝදනා කිරීමට **නත්ථි අරහන්ත ඝාතකො** යයි කීය. අනෙකා ආනන්තරිය කර්මයේද එබඳු පුද්ගලයන්ගේ ද ඇතිවීම ප්‍රතික්ෂේප කරයි. විසං න කමෙය්‍ය යන ප්‍රශ්නයෙහි පෙර කළ කර්මය යම්තාක් අවසන් නොවේද ඒතාක් නොයයි යන ලබ්ධියෙන් ප්‍රතික්ෂේප කරයි. මෙහි සෙස්ස පෙළ අනුව පමුණුවන්නා 'නාහං භික්ඛවෙ' යන සූත්‍රය මේ සඳහා කියන ලදී. චේතනා සහිත කළ කර්මවල විපාක නොවිඳ ඒ කර්මයන්ගේ කෙළවර බව මාර්ගය සිදුණු බව නොකියමි. එහිද දිට්ඨධම්ම වේදනීය මෙම ආත්මයෙහිම මිස ඉන්පසුව නොවේ. උපපජ්ජවේදනීය අනතුරු ආත්මයෙහිම මිස ඉන්පසුව නොවේ. අපරාපරිය කර්ම විපාකයට අවසර ලැබෙන අවස්ථාවේ විපාක දෙයි. මෙසේ සියළු ආකාරයෙන් සසර පවතිනතුරු ලැබූ විපාක වාරයෙහි විපාක දේ. 'න විජ්ජති සො ඡගතිපපදෙසො යත්ථඨිතො මුඤ්චෙය්‍ය පාපකම්මා' මෙසේ ඇතිකල්හි මෙය නොලැබූ විපාක ඇති යම් කර්මයක් රහතන් වහන්සේ විසින් අවශ්‍යයෙන් විපාක විඳිය යුතුයයි කල්පනා වශයෙන් නැත. රහතන්

වහන්සේට අකාල මරණ නැතැයි ලබ්ධි ප්‍රතිඥාපනය කරන ලදී. එය දුෂ්කර වේමය.

සබ්බමිදං කම්මතොති කථා 158

දැන් මේ සියල්ල කර්මයෙන් යයි කථා නම් වේ. එහි 'කම්මුනා වත්තති ලොකො' යන සූත්‍රය නිසා මේ සියළු කර්ම ක්ලේශ විපාක වෘත්තය කර්මයෙන්ම වේයයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ රාජගිරිකයන්ගේ ද සිද්ධත්ථිකයන් ද මෙනි. ඔවුන් සඳහා **සබ්බමිදං** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට මෙසේ ඇතිකල්හි කර්මය ද කර්මයෙන් පැමිණේ යයි චෝදනා කිරීමට කම්මුමපි කම්මතො යයි කීය. අනෙකා ඉදින් කර්මය ද කර්මයෙන්ම නම් ඒ කර්මය විපාකයම වන්නේ යයි ප්‍රතික්ෂේප කරයි. පුබෙබ කත හෙතු යයි මේ සියල්ල කර්මයෙන් නම් පෙර කළ හේතුවෙන් එය විය යුතුයයි චෝදනා කිරීමට විචාරයි. අනෙකා පුබෙබකත හේතුවාදයට බියෙන් ප්‍රතික්ෂේප කරයි. **කම්ම විපාකතො** ඉදින් මේ සියල්ල කර්මයෙන් වේ නම් අතීතභවය පැවතීමට හේතුභූත වූ යම් කර්මයක් වේද, එයද පෙර භවයෙහි කර්මයෙන් වූ විපාකයකින් පැමිණේ. එයින් මේ සියල්ල ඒ කර්ම විපාකයෙන් පැමිණේදැයි චෝදනා කිරීමට විචාරයි. අනෙකා බීජයෙන් අංකුර මෙන් වර්තමානයේ පවත්නා කර්මයෙන් හටගැනීම සඳහා ප්‍රතික්ෂේප කරයි. දෙවනුව විචාරණ ලද්දේ ඒ කර්මයේද බීජ පෙර බීජයෙන් මෙන් පෙර කර්මයෙන් පවතින බව පිළිගනී. **පාණං හනෙය්‍ය** යනාදිය ඉදින් සියල්ල කර්ම විපාකයෙන් පැමිණේ නම් ප්‍රාණඝාතාදිය කර්ම විපාකයෙන්ම කරන්නේ යයි චෝදනා කිරීමට කියන ලදී. අනෙකා දුසිල් චේතනාවෙන්ම කරන්නේ යයි චෝදනා කිරීමට කියන ලදී. අනෙකා දුසිල් චේතනාවෙන්ද එක් ආකාරයකින් පෙර කර්මයෙන් නිපන් විපාකයෙන්ම යන ලබ්ධියෙන් පිළිගනී. ඉක්බිති ඔහුට ඉදින් ප්‍රාණඝාතය කර්ම විපාකයකින් ඇතිවේ නම් ප්‍රාණඝාතය මෙන් විපාකයද සඵල වේ යයි චෝදනා කිරීමට **සඵලො** යයි කීය. අනෙකා ප්‍රාණඝාතයේ තිරය සංවත්තනික භාවයෙන් සඵලබව දකින්නේ පිළිගනී. කර්ම විපාකයේ වනාහි මේ පලය යයි කියන ස්ථානය නොදක්නේ ප්‍රතික්ෂේප කරයි. අදින්නාදානාදියෙහි ද මෙම නයම වේ. **ගිලානපච්චය භෙසජ්ජ පරිකඛණෙ**

සඑලෝ යයි දේය ධර්ම වශයෙන් දානපල විචාරයි. 'කම්මුනා වත්තති' යයි සූත්‍රයක් නැත. කර්මයයි අකර්මවාදි බව ප්‍රතික්ෂේප කොට කර්මය ඇතැයි කර්මවාදි බව කර්මය කළ බව දක්වයි. සියල්ලම කර්මයෙන් හටගත්තේ නොවේ. එහෙයින් සාධක නොවේ.

ඉන්ද්‍රියබද්ධ කථා 159

දැන් ඉන්ද්‍රියබද්ධ කථා නම් වේ. එහි දුක ඉන්ද්‍රියබද්ධ අනින්ද්‍රිය බද්ධ යයි දෙයාකාරය. ඉන්ද්‍රිය බද්ධය දුක් වස්තු බැවින් දුක්ය. අනින්ද්‍රිය බද්ධය. උදයව්‍යය පෙළීම් අර්ථයෙන් යමක් අනිත්‍ය නම් එය දුක් යයි සංගෘහීත බැවින් දුක් වේ. මේ විභාගය නොගෙන යම් අවබෝධයක් සඳහා භගවත්හු බඹසර වුසූද එය ඉන්ද්‍රියබද්ධ දුකය. සෙසු ඒවා නොවේ යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ හේතුවාදින්ගේ මෙනි. ඔවුන්ට සෙසු ඒවාද දුක් බව දැක්වීමට **ඉන්ද්‍රියබද්ධඤ්ඤේව** යයි විචාරීම සකවාදියාට ය. ප්‍රතිඥාව අනෙකාංශය. ඉක්බිති ඔහුට, යම්හෙයකින් භගවත්හු විසින් යමක් අනිත්‍ය නම් එය දුකයයි කියන ලදද, එහෙයින් ඉන්ද්‍රිය බද්ධයෙන්ම එය අනිත්‍ය විය යුතුයයි චෝදනා කිරීමට **ඉන්ද්‍රිය බද්ධඤ්ඤේව අනිච්චං** යනාදිය කිය. **නනු අනින්ද්‍රිය බද්ධං අනිච්චං** යනු පෘථිව්‍ය, පර්වත, ගල් ආදිය අනින්ද්‍රිය බද්ධ වූ දේ අනිත්‍ය නොවේද යන අර්ථය වේ. **න චත්තබබං ඉන්ද්‍රිය බද්ධඤ්ඤේව දුකබං** යන ප්‍රශ්නයෙහි **ආමනතා** යයි ප්‍රතිඥාව සකවාදියාගේය. ඉන්ද්‍රියබද්ධ වූ දුක්දොම්නස්වල අරමුණු වේ. භෝග විනාශාදිය නිතරම දොම්නසට අරමුණු වේ. එහෙයින් අනිත්‍ය අර්ථය නැතිවද අනින්ද්‍රිය බද්ධය දුක් යයි කිවයුතුය. කර්ම ක්ලේශ නූපදවන ලද වුවත් දුක ආර්ය සත්‍යයයි නොකිව යුතුය. එසේ මාර්ගයෙන් අවබෝධ නොකරන ලද බැවිනි. යම්හෙයකින් තෘණ කාෂ්ඨාදි නිරෝධය හෝ ඍතු බීජාදි නිරෝධය හෝ දුක්ඛ නිරෝධ ආර්ය සත්‍ය නම් නොවේ. එහෙයින් ඉන්ද්‍රිය බද්ධය දුක් ද ආර්ය සත්‍යය ද වේ. අනික වනාහි දුක්මයයි මේ නානත්වය දැක්වීමට පිළිගනී. යථා **ඉන්ද්‍රියබද්ධස්ස** ආදි වචන ඉන්ද්‍රිය බද්ධ අවබෝධයෙන් බ්‍රහ්මචරිය වාසය අවබෝධ කළ තැනැත්තාට නැවත නොපැමිණීම දක්වයි. එහෙයින්ම මෙහි සකවාදියා විසින් ප්‍රතික්ෂේප කරන ලදී. 'යදනිච්චං තං දුකබං' වචනයෙන් යුක්ත වූ අනින්ද්‍රිය බද්ධයට දුක් බව පිරිසිදු කිරීමට නොහැකි වේ. එනිසා සාධක නොවේ.

යථෙච්ඡා අරිය මග්ගනති කථා 160

දැන් යථෙච්ඡා අරිය මග්ගනති කථා නම් වේ. එහි යම්හෙයකින් ආර්යමාර්ග දුක්ඛ නිරෝධගාමිනී ප්‍රතිපදාව යයි කියන ලදී. එහෙයින් ආර්ය මාර්ගය හැර අවශේෂ සංස්කාර දුක් යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ හේතුවාදීන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිපදාව අනෙකාටය. ඉක්බිති ඔහුට ඉදින් මෙසේ සමුදයේ ද දුක්ඛභාවය පැමිණේ යයි චෝදනා කිරීමට **දුක්ඛ සමුදයොපි** යයි කීය. අනෙකා හේතු ලක්ෂණය නිසා ප්‍රතික්ෂෙප කරයි. නැවත විචාරණ ලද්දේ පවත්නා පරියාපන්න භවය සඳහා පිළිගනී. තිණෙ වා යන ප්‍රශ්නවල සූත්‍ර විරෝධ බියෙන් ප්‍රතික්ෂෙප කරයි. ලබ්ධි වශයෙන් පිළිගනී. මහි සෙස්ස නොගැඹුරු අරුත් වේ.

න වතනබබං සංඝො දක්ඛිණං පතිගණ්හති කථා 161

දැන් සංඝයා දක්ෂිණාව පිළිගන්නේ යයි නොකිවයුතු කථා නම් වේ. එහි පරමාර්ථ වශයෙන් මාර්ගවලට සංඝයා වේ. මාර්ගඵලයෙන් තොර අනිකෙක් සංඝ නම් නැත. මාර්ගඵලද කිසිවක් නොපිළිගනී. එහෙයින් සංඝයා දක්ෂිණාව පිළිගන්නේ යයි නොකිව යුතුයයි යමෙකුගේ ලබ්ධිය වේ. කෙසේද දැන් මහා පුණ්‍යවාදී සංඛ්‍යාත වෛතුල්‍යවාදීන්ගේ මෙනි. ඔවුන් සඳහා **නි වතනබබං** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට ඉදින් සංඝයා පිළි නොගන්නේ නම් ශාස්තෘන් වහන්සේ ආහුණෙය්‍ය ආදියෙන් ප්‍රශංසා නොකරන්නේ යයි චෝදනා කිරීමට **නනු සංඝො ආහුණෙය්‍ය** යනාදිය කීය. **සංඝස්ස දානං දෙනති** යමෙක් සංඝයාට දන් දෙයි. ඔවුන් ප්‍රතිග්‍රාහකයන් නොවනකල්හි කාට දෙන්නේදැයි චෝදනා පිණිස කියන ලදී. **ආහුතිං ජාතවෙදොව** යන සූත්‍රය පරසමයෙන් ගෙනෙන ලදී. එහි **මහාමෙඝං** යයි වර්ෂාව සඳහා කියන ලදී. පොළොව වර්ෂාව පිළිගනී. මේඝය (වලාකුල) ම නොවේ. **මග්ගා පටිගණ්හාති** යන මාර්ගවල සංඝයා යයි ලබ්ධියෙන් කියයි. මාර්ගවලම සංඝයා නොවේ. මාර්ගවල පහළවීමෙන් පිරිසිදුවූ ස්කන්ධ ගැනීමෙන් පණවන ලද අෂ්ට පුද්ගලයෝ සංඝයා වෙති. එහෙයින් සාධක නොවේ.

න වත්තබ්බං සංඝෝ දක්ඛිණං විසොධෙති කථා 162

දැන් සංඝයා දක්ෂිණාව පිරිසිදු කෙරේයයි නො කිවයුතු කථා නම් වේ. එහි මාර්ගවලට සංඝයා වේ. ඒවාට දක්ෂිණාව පිරිසිදු කිරීමට හැකි නොවේ. එහෙයින් සංඝයා දක්ෂිණාව පිරිසිදු කෙරේ යයි නොකිව යුතුයයි යමෙකුගේ ලබ්ධිය වේ. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ආහුණෙය්‍යෝ යනාදි ඉදින් සංඝයාට දක්ෂිණාව පිරිසිදු කිරීමට නොහැකි වේ නම් ශාස්තෘන් හන්සේ මෙසේ ප්‍රශංසා නො කරන්නේ යයි දැක්වීමට කියන ලදී. විසොධෙති යනු මහපල කරයි. සංඝයාට ස්වල්පයක් දෙන ලද්දේ බොහෝ වේ. බොහෝ දෙන ලද්දේ බහුතර වේ. දක්ඛිණෙය්‍යෝ යනු දක්ෂිණාවට සුදුසුය. දක්ෂිණාව පිරිසිදු කෙරේය යන අර්ථය වේ. දක්ඛිණං ආරාදෙනති යනු සම්පාදනය කරයි. අල්ප වූ දක්ෂිණාව මහත්ඵලයට පමුණුවයි යන අර්ථයයි. සෙස්ස යට කියන ලද නය අනුව වේ.

න වත්තබ්බං සංඝෝ භුඤ්ජති කථා 163

දැන් සංඝයා වළඳයි යනු නො කිවයුතු කථා නම් වේ. එහිද මාර්ගවලම සංඝයා වේ. ඒවා කිසිවක් අනුභව නොකරයි. එහෙයින් සංඝයා වළඳයි. බොයි. කයි. රසවිඳියි යනු නො කිවයුතු යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ වෛතුල්‍යවාදීන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට ඉදින් සංඝයා නො වළඳන්නේ නම් සංඝ හත්තාදිය නිරර්ථක වන්නේ යයි චෝදනා කිරීමට නනු අඪී කෙචි සංඝභත්තාදීනි කරත්දැයි යනාදිය කීය. ගණ භොජනං යනාදි ඉදින් සංඝයා නො වළඳන්නේ නම් ඔවුන්ට භෝජනාදිය නොවන්නේ යයි චෝදනාව සඳහා කියන ලදී. අට්ඨපානානි මෙය ද ඉදින් සංඝයා පානය නොකරන්නේ නම් මේ පානයන්, අනුදැන වදාළේ කාටදැයි චෝදනාව පිණිස කියන ලදී. මෙහිද සෙස්ස යට කියන ලද නයින්ම දතයුතුය.

සංඝයාට දෙන ලද්ද මහත්ඵලයයි නොකිවයුතු කථා 164

දැන් සංඝයාට දෙන ලද්ද මහත්ඵල නොවේය යන කථා වේ. එහිද මාර්ගඵල සංඝ නම් වේ. ඒවාට කිසිවක් දීමට හැකි නොවේ. ඒවාට පිළිගැනීමට හැකි නොවේ. දීමෙන් ඒවා කිසි උපකාරයක් බලාපොරොත්තු නොවේ. එහෙයින් සංඝයාට දෙන දේ මහත්ඵලයයි නො කිවයුතුයයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ වෛතුල්‍යයන් මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ආනුණෙය්‍යා යනාදි ඉදින් සංඝයාට දෙන ලද්ද මහත්ඵල නොවන්නේ නම් බුදුහු මෙසේ ප්‍රශංසා නොකරන්නාහයි දැක්වීමට කියන ලදී. සෙස්ස පෙළ අනුව යොදාගන්න.

බුදුරදුන්ට දුන් දේ මහත්ඵලයයි නොකිවයුතු කථා 165

දැන් බුදුරදුන්ට දෙන ලද්ද මහත්ඵල යයි නොකිවයුතු කථා නම් වේ. එහි භාග්‍යවත් බුදුන් වහන්සේ කිසිවක් නොවළඳති. ලෝකයට අනුවර්තනය වීම සඳහා වළඳන්නාක් මෙන් තමන්වහන්සේ දක්වති. එහෙයින් නිරූපනාකාරය බැවින් උන්වහන්සේට දෙන ලද්ද මහත්ඵල යයි නොකිවයුතු යනු යමෙකුගේ ලබ්ධිය වේ. මෙසේ වෛතුල්‍යයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. දිපදානං අගෙහා ආදි මනුසස දුස්සීලයන්ට ද දෙන දානය දහස් ගුණයක් විපාක වේ. මෙබඳු වූ අග්‍ර පුද්ගලයකු යයි දැක්වීම සඳහා කියන ලදී. මෙහි සෙස්ස පෙළ අනුව පැමිණවිය යුතුය.

දකඛිණා විසුදධි කථා 166

දැන් දක්ඛිණා විසුද්ධි කථා නම් වේ. එහි ඉදින් ප්‍රතිග්‍රහණයෙන් දක්ඛිණාව පිරිසිදු වේනම් මහත්ඵල වන්නේය. දායකයා විසින් දානය දෙන ලදී. ප්‍රතිග්‍රාහකයා විසින් විපාකය නිපදවන ලදී යයි අන්‍යයෙක් අන්‍යයෙකුගේ කරන්නා වන්නේය. අනුන් කළ සුවදුක් පැමිණෙන්නේය. අනෙකෙක් කරන්නේය. අනෙකෙක් විඳින්නේය. එහෙයින් දීමෙන්ම දානය

පිරිසිදු වේ. ප්‍රතිග්‍රහණයෙන් නොවේ. මෙහි දායකයාගේම, විසුද්ධියෙන් විපාක දීම වේයයි ඇතමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ උත්තරපථකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. **ආහුණෙය්‍යා** යනාදි ඉදින් ප්‍රතිග්‍රහණයෙන් දානය පිරිසිදු නොවේ නම් ආහුණෙය්‍යාදි භාවය කුමක් කරන්නේදැයි දැක්වීමට කියන ලදී. **අක්ඛේඤා අක්ඛේඤස්ස කාරකෝ** ඉදින් දායකයාට දාන චේතනා ප්‍රතිග්‍රාහකයා විසින් කළා වන්නේය. ප්‍රතිග්‍රාහක සංඛ්‍යාත වස්තුව නිසා ඔහුගේ දාන චේතනාව පිරිසිදු වී මහා විපාක අර්ථයෙන් පිරිසිදු කරයි. එහෙයින් ප්‍රතිග්‍රහණයෙන් දානය පිරිසිදු නොවේයයි චෝදනාව අචෝදනම වේ.

සතළොස්වන වර්ගය නිමියේය.

මනුසස්ස ලොක කථා 167

දැන් මනුසස්ස ලෝක කථා නම් වේ. එහි 'භාග්‍යවතුන් වහන්සේ ලෝකයෙහි උපන්හ. ලෝකයෙහි වැඩුණාහ. ලෝකයෙන් නො ඇලී ලෝකය මැඩ වාසය කරති' යන සූත්‍රය අනුවණින් ගෙන භාග්‍යවතුන් වහන්සේ තුසිත භවනයෙහි උපන්හ. එහිම වාසය කරති. මනුෂ්‍ය ලෝකයට නොපැමිණෙති. නිර්මිත රූපය පමණක් මෙහි දක්වති යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ දැන් වෛතුල්‍යයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට විචාරීමෙන් ද සූත්‍ර සාධනයෙන් ද දැක්වීමට **නනු අත්ථි** යනාදිය කීය. **ලොකෙ ජාතෝ** පරවාදියා තුසිත පුරය සඳහා කියයි. ශාස්තෘන් වහන්සේ විසින් මනුෂ්‍ය ලෝකයම සඳහා ලෝකං යයි කියන ලදී. **ලොකං අභිභුය්‍ය** යයි පරවාදියා මනුෂ්‍ය ලෝකය අභිභවනය කොට දෘෂ්ටියෙන් කියයි. ශාස්තෘන් වහන්සේ වනාහි අරමුණු ලෝකය මැඩ වාසය කළහ. **අනුපලිත්තෝ ලොකෙන** පරවාදියා මනුෂ්‍ය ලෝකයෙහි නො ඇලීම සඳහා කියයි. ශාස්තෘන් වහන්සේ ලෝක ධර්මයෙහි කෙළෙසුන්ගෙන් නො ඇලී වාසය කළහ. එහෙයින් මෙය අසාධකය.

ධම්ම දෙසනා කථා 168

දැන් ධර්මදේශනා කථා නම් වේ. එහි තුසිත පුරයෙහි සිටියේ ධර්ම දේශනාව පිණිස භාග්‍යවතුන් වහන්සේ නිර්මිත බුදුවරයෙකු එවූහ. එයින් ද උන්වහන්සේගේ ද දේශනා පිළිගෙන ආයුෂ්මත් ආනන්ද හිමියන් විසින් ධර්මය දේශනා කරන ලදී. භාග්‍යවත් බුදුන් වහන්සේ නොවේ යයි යමෙකුගේ ලබ්ධිය වේ. වෛතුල්‍යවාදීන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට ඉදින් එයින් ධර්මය දේශනා කරන ලද්දේ නම් එයම ශාස්තෘන් වහන්සේ යයි චෝදනා කිරීමට **අභිනිමම්මතතා ජිනෝ** යනාදිය කීය. අනිකා එසේ නොපිළිගන්නේ ප්‍රතික්ෂෙප කරයි. සෙස්ස පැහැදිලිය.

කරුණා කථා 169

දැන් කරුණා කථා නම් වේ. එහි ප්‍රියකරන වස්තූන්ගේ විපත්තියෙන් රාග සහිත වූ රාග වශයෙන් කරුණා ප්‍රතිරූපක පැවැත්ම ඇත. රාගයම කරුණා නම් වේ. එය ද භාග්‍යවතුන් වහන්සේට නැත. එහෙයින් භාග්‍යවත් බුදුන්වහන්සේට කරුණාව නැතැයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ උත්තරාපථකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට කරුණා නම් නික්ලේශයෙන් ද සතුන් අරමුණු කිරීමෙන් ද චිත්ත විමුක්තියෙන් ද ආනිසංස එකොළොසකින් ද මෛත්‍රී ආදියෙන් සමාන ජාතික වේ. එහෙයින් ඉදින් භාග්‍යවතුන් වහන්සේට කරුණාව නැත්නම් මෛත්‍රී ආදියට නොවන්නේ යයි චෝදනා කිරීමට **නත්ථි බුද්ධසස භගවතො මෙතතා** යනාදිය කීය. **අකාරුණීකෝ** යන ප්‍රශ්නයෙහි එබඳු වූ ව්‍යවහාරයක් නොදක්නේ ප්‍රතික්ෂෙප කරයි. මෙහි සෙස්ස නොගැඹුරු අරුත් වේමය.

ගන්ධජාත කථා 170

දැන් ගන්ධජාත කථා නම් වේ. එහි යමෙකුගේ භාග්‍යවත් බුදුන් වහන්සේ කෙරෙහි අනුවණින් ප්‍රේම වශයෙන් භාග්‍යවතුන් වහන්සේගේ

මල මූ සෙසු සුවඳ ජාතීන්ට වඩා අධිකව ගනී. ඊට වඩා සුවඳ ජාතියක් නැතැයි ලබ්ධි වේ. යම්සේ ඇතැම් අන්ධකයන්ගේ ද උත්තරාපථකයන්ගේ ද මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. මෙහි සෙස්ස පෙළ අනුව පමුණුවයි.

එකමගග කථා 171

දැන් ඒක මාර්ග කථා නම් වේ. එහි යමෙකුගේ භාග්‍යවතුන් කෙරෙහි අනුවණින් ප්‍රේම වශයෙන් භාග්‍යවතුන් වහන්සේ සෝවාන් වී සකදාගාමී වී අනාගාමී වී රහත්බව අවබෝධ කළහ. එකම ආර්ය මාර්ගයෙන් සතර පලයන් අවබෝධ කළහයි ලබ්ධිය වේ. යම්සේ ඔවුන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට සතරපල සමග උපන් සතර එසසාදීන්ගේ එකක් සේ සමොධාන වශයෙන් චෝදනා කිරීමට **භගවා සොතාපනෙනා කී** කල්හි එයින් සක්කාය දිට්ඨි ආදීන්ගේ ප්‍රහාණ අභාව වශයෙන් චෝදනා කරයි. **භගවා සොතාපනෙනා** යයි බුදු කෙනෙකුට සෝවාන් බව නැතැයි ප්‍රතික්ෂේප කරයි. පසුව එන ප්‍රශ්න දෙකෙහි ද මෙම නයයි. මෙහි සෙස්ස පෙළ අනුව පමුණුවන්න.

ඣාන සංකනති කථා 172

දැන් ධ්‍යාන සංක්‍රාන්ති කථා නම් වේ. එහි යමෙකුගේ 'ඉධ භික්ඛවෙ භික්ඛු විවිචෙචව කාමෙහි පඨමං ඣානං උපසම්පජ්ජ විහරති', විතකක විචාරානං වූපසමා දුතියං ඣානං තතියං ඣානං චතුත්ථ ඣානං උපසම්පජ්ජ විහරති' යන මේ පිළිවෙළ දේශනාව නිසා ඒ ඒ ධ්‍යානයේ උපචාර සමාධියට නොපැමිණ ධ්‍යානයෙන් ධ්‍යානයට සංක්‍රමණය වේ යයි ලබ්ධි වේ. යම්සේ මහිංසාසකයන්ගේ ද ඇතැම් අන්ධකයන්ගේ ද මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට ඉදින් ඔබගේ දුතිය ධ්‍යාන උපචාරයට නොපැමිණ උපිළිවෙළින් ප්‍රථම ධ්‍යානයෙන් ද්විතීය ධ්‍යානයම සංක්‍රමණය වෙයි. පළමුවැන්නෙන්

තුන්වැන්නද දෙවැන්නෙන් සතරවැන්නද සංක්‍රමණය වන්නේ යයි චෝදනා කිරීමට **පඨම ඣානා** යනාදිය කීය. **යා පඨමස්ස** යනාදි ඉදින් පළමුවැන්නෙන් අනතුරුව දෙවැන්න, දුතියාදියෙන් හෝ තතියාදිය සමවදී. එකක් වර්ජනය කිරීමෙන් සමවදින්නේ යයි චෝදනා කිරීමට කියන ලදී. **කාමෙ ආදීනවකො** යයි පළමුව කාමයන්ගේ ආදීනව මෙනෙහි කරන්නාට පසුව උපදී. ධ්‍යාන කළණයෙහි නිමිත්තම මෙනෙහි කරයි. **තස්සෙඤ්ඤව පඨමං** යනාදි පෙර ජවනයෙන් පැසුළු ජවන මෙන් අනතුරුව උපදින්නේය. පෙර පැසුළු බව හැර ලක්ෂණ වශයෙන් එයම එය වන්නේ යයි චෝදනා කිරීමම විචාරයි. මේ උපායෙන් සියළු තැන අර්ථය දතයුතුය. **විවිචෙවෙව කාමෙහි** යනාදියෙන් පිළිවෙළින් ධ්‍යාන දෙසූ බව දක්වයි. අනතුරුව උත්පත්ති නොවේ. එහෙයින් අසාධක වේ.

ඣානානන්තරික කථා 173

දැන් ඣානානන්තරික කථා නම් වේ. එහි යමෙකුගේ සමයෙහි පඤ්චක නයේ ධ්‍යාන පහක් බෙදන ලදී. හුදෙක් සමාධි තුනක් දක්වන ලදැයි අවිතක්ක විචාරමත්ත සමාධියට ඕකාස නොදන්නන්ගේ පළමුවන දෙවන ධ්‍යාන අතරෙහි ඣානානන්තරික යයි මේ ලබ්ධිය වේ. යම්සේ සම්මිතියන්ගේ ද ඇතැම් අන්ධකයන්ගේ ද මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට ධ්‍යානයද එසසාදි චෛතසික ධර්ම වේ. එහෙයින් ඉදින් ඣානානන්තරිකා වන්නේ නම් එසසනන්තරිකාදියද විය යුතුයයි චෝදනා කිරීමට **අත්ථි එසසනන්තරිකා** යනාදිය කීය. දුතියස්ස ච **ඣානස්ස** යනාදි ධ්‍යානානන්තරිකා නම් වන්නේ නම් දෙවන තුන්වන ආදියද ධ්‍යානමය. ඒවායේ ද අන්තරිකා විය යුතුයයි චෝදනාව පිණිස කියන ලදී. හෙතෙම හුදෙක් ලබ්ධියේ අභාවයෙන් ප්‍රතික්ෂේප ද කරයි. පිළිගැනීම ද කරයි. **පඨමස්ස ච** යයි විචාළේ ලබ්ධි වශයෙන් පිළිගනී. **සවිතක්කෙකා සවිචාරෙ** යනාදි සමාධි තුනේම සමාධිභාවය සමානය. අවිතක්ක විචාරමත්ත සමාධියම ඣානානන්තරික වේ. ඉතිරි ඒවායේ නොවේ. මෙහි විශේෂ හේතු කුමක්දැයි චෝදනා පිණිස කියන ලදී. **දවිනනං ඣානානං පටුපපන්නානං** පළමු දෙවන ධ්‍යාන සඳහා විචාරයි. අනිත් තැනැත්තා ඒවායේ ප්‍රත්‍යුත්පන්න අන්තරයෙහි අවිහත්ත වූ විචාර මාත්‍ර වූ සමාධිය ධ්‍යානාන්තරික නම් වේ යයි ලබ්ධියෙන් පිළිගනී. අවිතක්කෙකා

විචාරමත්තෙනා සමාධි පඨමං ඣානං යයි චතුක්ක නය වශයෙන් විචාරයි. සකවාදියා ඒ නයෙහි ඔහුගේ අභාවයෙන් ප්‍රතික්ෂේප කරයි. **නනු තයෝ සමාධි** යන මෙහි අදහස මෙසේය. යම්සේ ඒ සමාධි තුනෙහි සමාධි ධ්‍යාන දෙකකි. ධ්‍යාන අන්තරිකය නොවේ. මෙසේ ඉතිරි ධ්‍යානයද විය යුතුය. ඣානන්තරික නොවේ.

සමාපන්නෙනා සද්දං සුණාතීති කථා 174

දැන් සමාපන්න වූයේ ශබ්ද අසා යයි කථා නම් වේ. එහි යම්හෙයකින් පළමු ධ්‍යානයට සමවත් වූවහුට ශබ්දවලින් බාධා ඇතැයි භාග්‍යවතුන් වහන්සේ කියන ලදී. ඉදින් සමවත් සමවැදි පුද්ගලයා ශබ්ද නො අසන්නේ නම් බාධාවන්නේ කෙසේද? එහෙයින් සමවත් සමවන්නේ ශබ්ද අසායයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ පුබ්බසේලියන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව **අනෙකාටය. චක්ඛුනා රූපං පසසති** යනාදි සමවත් සමවන්නාට පංචද්වාරයේ පැවතීමක් නැත. එය නොමැති කල්හි ඉදින් හේ ශබ්ද අසන්නේ නම් රූප ද බලන්නේ යයි චෝදනා කිරීමට කියන ලදී. 'සද්දෝ කණ්ඨකෝ' යනු වික්ඛෙප කරන බව කියන ලදී. ඕලාරික ශබ්ද කනේ ගැටුණුවිට පළමු දැහැනින් නැගිටීම වේ. එහෙයින් මෙය කියන ලදී. එහෙයින් අසාධක වේ. **දුතියසස ඣානසස** යනාදි යම්සේ වෙනත් බාධක සමාපත්තිය තුළ නැත. මෙසේ ශබ්ද ශ්‍රවණය අවබෝධය සඳහා කියන ලදී. ඒ සියල්ල නොගැඹුරු අරුත් වේ.

චක්ඛුනා රූපං පසසතීති කථා 175

දැන් ඇසින් රූප බලයි යන කථා නම් වේ. එහි 'චක්ඛුනා රූපං දිසවා' යන වචනය නිසා ප්‍රසාද චක්ෂුවම රූප බලා යයි. යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ මහා සංඝිකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට ඉදින් ඇසින් රූප බලන්නේ නම් රූපයෙන් රූප දකින්නේ යයි චෝදනා **කිරීමට රූපෙන රූපං පසසති** යයි කීය. අනිකා රූපායතනය සඳහා **ප්‍රතික්ෂේප** කොට නැවත විචාළවිට ඇස සඳහාම පිළිගනී. **පටිවිඤානාති** යයි මෙහි අදහස

මෙසේය. දකීයයි අපි දැනගැනීම සඳහා විචාරමු. ඇස ලඟට පැමිණීම පමණක් නොවේ. එහෙයින් කියන්න. කිම ඔබගේ ඇස රූපයෙන් රූප දැනගනීද? අනිකා පෙර නයින් ම ප්‍රතික්ෂේප කොට ද පිළිගැනීම ද වේ. ඉක්බිති ඔහුට මෙසේ ඇතිකල්හි රූපය මනෝවිඤ්ඤාණයට පැමිණේ. එය ද දැනගැනී යයි චෝදනා කිරීමට රූපං මනොවිඤ්ඤාණං යයි කිය. අනිකා ලෙශයකුදු නො ලබන්නේ ප්‍රතික්ෂේප කරයි. **අත්ති චක්ඛුස්ස** ආවටටනා යනාදි ඉදින් ඇස දැනගැනීම් අරුතින් බලයි නම් චක්ඛු විඤ්ඤාණය මෙන් එයද ආවර්ජනාවෙන් විය යුතු යයි චෝදනා කිරීමට විචාරයි. අනිකා යම්සේ ආවර්ජන ප්‍රතිබද්ධ ඇසක් නොවේ. ආවර්ජනාවට අනතුරුව එය නූපදී. එහෙයින් **නහෙවං** යයි ප්‍රතික්ෂේප කරයි. **සොතෙන සද්දං** යනාදියෙහි ද මෙම නයයි. 'ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුනා රූපං පස්සති' යයි සඝංහාර කථා න්‍යායෙන් කියන ලදී. යම්සේ ඊයෙන් විදින්නේද දුන්නෙන් විදී යයි කියනු ලැබේ. මෙසේ චක්ඛු විඤ්ඤාණයෙන් බලන්නේ ද ඇසින් බලයි කියන ලදී. එනිසා මෙය අසාධක වේ. සෙස්සෙහිද මෙම නයයි.

අටළොස්වැනි වර්ගය නිමයි.

කිලෙස ජහන කථා 176

දැන් කෙලෙස් අත්හරින කථා නම් වේ. එහි යම්හෙයකින් කෙලෙස් ප්‍රහානයක් ඇත. ප්‍රහීන කෙලෙස් ද අතීත කෙලෙස් ප්‍රහීන වී ඇත. එසේම අනාගත වර්තමානද වේ. එහෙයින් අතීත කෙලෙස් ප්‍රහානයෙන් අනාගත වර්තමාන කෙලෙස් ද ප්‍රහාන වූයේ යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ ඇතැම් උත්තරාපථකයන්ගේ මෙනි. ඔවුන් සඳහා **අත්තිතෙපි** යනාදි විචාරීම සකවාදියාගේය. ප්‍රතිඥාව අනෙකාගේය. සෙස්ස පෙල අනුව පමුණුවයි. **නත්ථි කිලෙසෙ ජහති** යන පරවාදියාගේ මේ ප්‍රශ්නයෙහි යම්සේ කසල බැහැර කරන්නාට කසල බැහැර කරන උත්සාහය මෙන් කෙලෙස් දුරුකරන්නාට අතීතාදි කෙලෙස්වල උත්සාහයක් නැත. නිවන් අරමුණෙහි වනාහි ආර්ය මාර්ගය පවතිනවිට කෙලෙස් නූපන්නේමය. නූපදී යයි ප්‍රහීන වූයේ වේ. එහෙයින් **න හෙවං** යයි ප්‍රතික්ෂේප කරයි. **තෙනහි අතීතෙ කිලෙසෙ ජහති** යනාදිය වනාහි යම්හෙයකින් නොමැති නම් කෙලෙස් ප්‍රජනන යයි නො කිවයුතුය. එහෙයින් අතීතාදි භේදයෙහි දුරුකරයි යන ජලයෙන් කියන ලදී.

සුඤ්ඤතා කථා 177

දැන් ශූන්‍යතා කථා නම් වේ. එහි **සුඤ්ඤතා** යයි අනාත්ම ලක්ෂණ ස්කන්ධ ද නිවනදැයි ශූන්‍යතා දෙකකි. ඒවායින් අනාත්ම ලක්ෂණය එක් ආකාරයකින් සංස්කාර ස්කන්ධයට ඇතුළත් වේ. නිවන අපරියාපන්න වේ. මේ විභාගය නොගෙන ශූන්‍යතාව සංස්කාර ස්කන්ධයට ඇතුළත් වේයයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ අන්ධකයින්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. **අනිමිත්ත** යනු සියළු නිමිති රහිත නිවනයි. අප්‍රණිහිත යනු ඊටම නමකි. කුමක්හෙයින් ගෙනෙන ලදද? අවිභජ්ජ වාදයෙහි දෝෂාරෝපනය සඳහා. යමෙකුගේ නොබෙදා ශූන්‍යතාව ඒකදේශයකින් සංස්කාර ස්කන්ධයට ඇතුළත් යයි ලබ්ධිය වේ. ඔහුගේ නිවන ද සංස්කාර ස්කන්ධයට ඇතුළත් බවට පැමිණේ. මේ දෝෂාරෝපනය සඳහා අනිමිත්ත අප්පණිහිතං ගෙනෙන ලදී. අනෙකා ඒ ඇතුළත් බව නොකැමැත්තේ ප්‍රතික්ෂේප කරයි. **සංඛාරකබන්ධෝ න අනිච්චෝ** යනාදි නිවන් සංඛ්‍යාත ශූන්‍යතාවේ අනිත්‍යභාවයට පැමිණි දෝෂ දර්ශනය සඳහා කියන ලදී. **සංඛාරකබන්ධස්ස සුඤ්ඤතා** යනාදි අන්‍ය ස්කන්ධයේ ශූන්‍යතාව අන්‍ය ස්කන්ධයට ඇතුළත් වේ. සංස්කාර ස්කන්ධ ශූන්‍යතාව ද සෙසු ස්කන්ධවලට ඇතුළත් විය යුතුයයි චෝදනාව පිණිස කියන ලදී. **සංඛාරකබන්ධ සුඤ්ඤතා න වත්තබ්බ** යනාදි ඉදින් සංස්කාර ස්කන්ධ ශූන්‍යතාව සෙසු ස්කන්ධවලට ඇතුළත් නොවේ යයි ප්‍රතිලෝම දර්ශනය සඳහා කියන ලදී. **සුඤ්ඤමිදං භික්ඛවෙ සංඛාරා** යන සූත්‍රය පරසමයෙන් ගෙනෙන ලදී. එහි **සංඛාරා** යනු සබ්බ සංඛාරා අනිච්චා යි පැමිණි තැන මෙන් පංචස්කන්ධයයි. එය ද ආත්මයට අයත් ශූන්‍යතා බව ශූන්‍යතා යයි සාසනාවචර වේ. විරුද්ධ නොවේ. එහෙයින් අනුඥාතය. යම්හෙයකින් මේ ශූන්‍යතාවෙන් සංස්කාර ස්කන්ධ පරියාපන්නභාවය දක්වයි. එහෙයින් අසාධක වේ.

සාමඤ්ඤඵල කථා 178

දැන් ශ්‍රමණ ඵල කථා නම් වේ. එහි මාර්ග විථියද ඵලසමාපත්ති විථිය ද ආර්ය මාර්ගයේ විපාක සිත ශ්‍රමණ ඵලයයි ස්ව සමයෙහි නිශ්චය වේ. එසේ නොගෙන යමෙකුගේ ක්ලේශ ප්‍රහානය ද ඵලයට පැමිණීම ද

ශ්‍රමණඵලය වේ. එහෙයින් අසංඛත ලබ්ධි වේ. යම්සේ පුබ්බසේලියන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. මෙහි සෙස්ස යට කියන ලද නය අනුව පෙළ පැමිණවිය යුතුය.

පත්ති කථා 179

දැන් පත්ති කථා නම් වේ. එහි යමක් ලබයිද, ඒ ඒ ලාභ පත්ති නම් වේ. එය ද අසංඛතයයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ පුබ්බසේලියන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. මෙහිද සෙස්ස යට කියන ලද නය අනුව පෙළ අනුවම පැමිණවිය යුතුය. න වත්තබ්බං යනාදි යම් ලබ්ධියකින් පත්ති අසංඛත යයි හඟිද, එය ප්‍රකාශ කිරීමට කියන ලදී. එහි සකවාදියා න හෙවං වත්තබ්බෙ යයි ප්‍රතික්ෂේප කරන්නේ හුදෙක් පත්තියේ රූපාදිභාවය නොපිළිගනී. පත්ති කිසි ධර්මයක් නැත. අසංඛතභාවය නො අනුදනී. අනෙකා වනාහි ප්‍රතික්ෂෙප මාත්‍රයෙන්ම අසංඛතයයි ලබ්ධිය පිහිටුවයි. එය අනුවණින් පිහිටුවන ලද බැවින් නොපිහිටියේමය.

තථතා කථා 180

දැන් තථතා කථා නම් වේ. එහි යමෙකුගේ රූපාදි සියළු ධර්මයන්ගේ රූපාදිභාව සංඛ්‍යාත තථතා නම් ඇත. එය ද සංඛත රූපාදියෙහි ඇතුළත් නොවන බැවින් අසංඛත යයි ලබ්ධි වේ. යම්සේ ඇතැම් උත්තරාපථකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. මෙහි ද සෙස්ස යට කියන ලද නය අනුව ප්‍රකටය.

කුසල කථා 181

දැන් කුසල කථා නම් වේ. එහි අනවද්‍ය කුසලය ඉෂ්ට විපාක වේ. අනවජ්ජ යනු කෙළෙස් විප්‍රයුක්ත වේ. මේ නය හැර අකුසලය සියළු ධර්ම භජනය කරයි. ඉෂ්ට විපාකය නම් මතු උපත්වල ඉෂ්ටපල නිපදවන

පින වේ. මේ නය කුසල ත්‍රිකයෙහි මුල් පදම භජනය කරයි. යමෙකුගේ වනාහි මේ විභාගය නොගෙන අනවජ්ජභාව මාත්‍රයෙන්ම නිවන කුසල යයි ලබ්ධි වේ. යම්සේ අන්ධකයන්ගේ මෙනි. ඔවුන්ගේ ඉෂ්ට විපාක අර්ථයෙන් නිවනෙහි කුසල් අභාවය දැක්වීමට විචාරීම සකවාදියාටය. තමාගේ ලබ්ධි වශයෙන් ප්‍රතිඥාව අනෙකාටය. මෙහි ද සෙස්ස යට කී නය අනුව පැහැදිලිය.

අවචනත නියාම කථා 182

දැන් අවචනත නියාම කථා නම් වේ. එහි 'යමෙකුගේ වරක් ගිලුනේ ගිලුනේම වේ. සූත්‍රය නිසා පෘථග්ජනයාට අත්‍යන්ත නියාමයක් ඇතැයි ලබ්ධි වේ. යම්සේ ඇතැම් උත්තරාපථකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. **මාතුඝාතකෝ** යනාදි නියත මිථ්‍යාදෘෂ්ටිකයාට ද මාතුඝාතකාදීන්ට සමානව මිච්ඡත්ත නියාමයෙහි මාතුඝාතකාදීන් අත්‍යන්ත නියතයෙන් යයි චෝදනා කිරීමට කියන ලදී. අනෙකා නියත මිථ්‍යාදෘෂ්ටිකයා සසර කනුවක්ව භවාන්තරයෙහි ද නියතමය. මෙහි වනාහි එක ආත්මභාවයකැයි ලබ්ධියෙන් **න හෙවං** ප්‍රතික්ෂෙප කරයි. **විචිකිච්ඡා උපපජ්ජෙය්‍ය** යන මෙය නියත හෝ නොවේ හෝ මෙසේ උපදින්නේ යයි විචාරයි. අනෙකා නොඉපදීමට කරුණු නොදක්නේ පිළිගනී. නූපජ්ජෙය්‍ය යයි විචාරණ ලද්දේ යම් දෘෂ්ටියක් සේවනය කරන්නේ නියාමයට බැසගත්තේ එහි නොඉපදීම සඳහා පිළිගනී. එයින් **පහිනා** යයි විචාළේ මාර්ගයෙන් අප්‍රහීන බැවින් ප්‍රතික්ෂේප කරයි. ඒ දෘෂ්ටිය අරබයා නොපැවැත්ම වශයෙන් පිළිගනී. **ඉක්බිති** ඔහුට යම්හෙයකින් ප්‍රහානය නම් ආර්ය මාර්ගයෙන් හැර නැත. එහෙයින් එයින් චෝදනා කිරීමට **සෝතාපතති මගෙගන** යනාදිය කීය. හේ එක මගකින්වත් අප්‍රහීන බැවින් ප්‍රතික්ෂේප කරයි. නැවත **කතමෙන** යයි විචාළේ මිථ්‍යා මාර්ගය සඳහා **අකුසලෙන** යනාදිය කීය. **උච්ඡෙද දිට්ඨි උපපජ්ජෙය්‍ය** යයි දෙවන නියාම උපත විචාරයි. අනෙකා යම්හෙයකින් 'යෙපි තෙ උකකණණවසස අඤ්ඤා නත්ථික වාදා අකිරිය වාදා අහෙතුක වාදා' යන වචනයෙන් තිදෙනාම නියත මිථ්‍යාදෘෂ්ටික බැවින් එකට උපදී. එහෙයින් පිළිගනී.

ඉක්බිති ඔහුට හේ නව නාම වේ. අත්‍යන්ත නියමයයි චෝදනා කිරීමට **භඤ්ඤි** යනාදිය කීය. අත්‍යන්ත නියතයාට දෙවන නියාමය

නිරර්ථකය. **නුපපජ්ජය්‍ය** යන ප්‍රශ්නයෙහි ශාස්වත දෘෂ්ටියෙන් ශාස්වත යයි යමක් ගන්නා ලදද එයම උපදින්නේ යයි ගෙන අනුප්‍රාප්තිය සඳහා පිළිගනී. **පහීනා** යයි විචාළේ මාර්ගයෙන් අප්‍රහීන බැවින් ප්‍රතික්ෂේප කරයි. කියන ලද නයින් නොඉපදීමෙන් පිළිගනී. **සස්සත දිට්ඨි උපපජ්ජය්‍ය** යනාදියෙහි ද මෙම නයම වේ. සෙස්ස විචිකිච්ඡා චාරයෙහි කියන ලද නයමය. **න චනතබබං** යයි විචාරය පරවාදියාගේය. සූත්‍රයේ ඇති බැවින් ප්‍රතිඥාව සකවාදියාගේය. හේ භවාන්තරයේ ද ගිලුනේ නොවේ. මේ භවයේම නුසුදුස්සෙකි. හේ එම දෘෂ්ටිය අත්හරින්නට යයි මෙහි අදහස වේ. එහෙයින් මෙය සාධක නොවේ. සියළු කාලයේ මතුවී ගිලේ යයි වචන මාත්‍රයෙන් තීරණයකට නොඑළඹ අර්ථය සෙවිය යුතුයයි දැක්වීමට කියන ලදී.

ඉන්ද්‍රිය කථා 183

දැන් ඉන්ද්‍රිය කථා නම් වේ. එහි ලෞකික ශ්‍රද්ධාව ශ්‍රද්ධා නමි. ශ්‍රද්ධා ඉන්ද්‍රිය නොවේ. ලෞකික විරිය සති සමාධි පඤ්ඤා ද එසේ යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ හේතුවාදීන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරය සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. **නත්ථි ලොකියා සද්ධා** යනාදිය යම්හෙයකින් ලෞකික ශ්‍රද්ධාදිය අධිපති අර්ථයෙන් ඉන්ද්‍රිය වේ. ශ්‍රද්ධාදියෙන් අන්‍ය වූ ශ්‍රද්ධා ඉන්ද්‍රියාදිය නැත. එහෙයින් ලෞකික වූ ද ශ්‍රද්ධාදියම ශ්‍රද්ධා ඉන්ද්‍රියාදි භාවය දැක්වීමට කියන ලදී. **අත්ථි ලොකියො මනො** යනාදිය ඔබගේ ලෞකික වූ මනස ආදි ධර්ම යම්සේ මන්ද්‍රියාදිය වේද එසේ ලෞකික ශ්‍රද්ධාදිය ද ශ්‍රද්ධින්ද්‍රියාදිය වේ. උපමාව ඒ අර්ථය පැහැදිලි කිරීමට කියන ලදී. මෙහි සෙස්ස පෙළ අනුව පැමිණේ.

එකුන්විසි වැනි (19) වර්ගය නිමයි.

අසඤ්චිච්ච කථා 184

දැන් අසඤ්චිච්ච කථා නම් වේ. එහි ආනන්තරිය වස්තු නම් ගරු වේ. බර වේ. එහෙයින් නොදැන ද ඒ වස්තු විරෝපනය (මව මැරීම ආදිය කළවිට) කළ කල්හි ආනන්තරික කර්මය වේ යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ ඇතැම් උත්තරාපථකයන්ගේ මෙනි. ඔවුන් සඳහා

අසඤ්චිච්ච යයි විචාරය සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට යම්හෙයකින් ආනන්තරිය කර්මය නම් කර්මපථ බැවින්, ඉදින් නොදැන කර්මපථ භෙද වන්නේය. අවසේස ප්‍රාණඝාතාදිය ද නොදැන කර්මපථ වන්නේ යයි චෝදනාව **පිණිස අසඤ්චිච්ච පාණං සන්තඤා** යනාදිය කීය. අනෙකා එබඳු ලබ්ධියක් නැති බැවින් ප්‍රතික්ෂේප කරයි. සෙස්ස පෙළ අනුව පමුණුවා ගන්න. **න වතනබබං මාතුඝාතකෝ** යයි විචාරීම පරවාදියාටය. රෝග ප්‍රතිකාර කාලයෙහි නොදැන මරණ සඳහා ප්‍රතිඥාව සකවාදියාටය. **නනු මාතා ජීවිතා වොරොපිතා** යන ප්‍රශ්නයෙහි ද නොදැන දිවි ගැලවීම සඳහා ප්‍රතිඥාව පරවාදියාටය. මෙසේ අදහස නොගෙන ඝඤ්ඤි යයි ලබ්ධිය පිහිටුවීම අනෙකාගේය. එය අනුවණින් පිහිටුවන ලද හෙයින් නොපිහිටවූවා මෙනි. පිතුඝාතකාදියෙහි ද මෙම නයම වේ. සංඝ භේදයෙහි වනාහි ධර්ම සංඥාව සඳහා **සංඝභෙදතො ආනන්තරිකෝ** යයි විචාරීම සකවාදියාගේය. 'සංඝං සමගඝං භෙත්වාන කපපං නිරයම්හි පච්චති' යන වචනය අනුවණින් ගෙන ප්‍රතිඥාව පරවාදියාගේය. නැවත **සඛ්බති** යයි විචාළේ නම් පක්ෂයෙහි ධර්ම සංඥාව සඳහා ප්‍රතික්ෂෙප කරයි. පර පක්ෂයෙහි ධර්ම සංඥාව සඳහා පිළිගනී. **ධම්ම සඤ්ඤී** යන ප්‍රශ්න දෙකේම මෙම නයම වේ. **නනු වුත්තං භගවතා** සූත්‍රය ඒකාන්තයෙන් ධර්මවාදියාගේ ආනන්තරිකභාවය දැක්වීම සඳහා කියන ලදී. **ආපායිකෝ නෙරයිකෝ** යන ගාථාවෙන් ද අධර්මවාදීන්ම අභිප්‍රේතය. අනෙකා වනාහි අදහස නොගෙන ලබ්ධිය පිහිටුවයි. එය අනුවණින් පිහිටුවන ලද බැවින් නොපිහිටියේමය.

ඤාණ කථා 185

දැන් ඤාණ කථා නම් වේ. එහි ලෞකික ලෝකෝත්තර වශයෙන් ඤාණය දෙයාකාරය. ලෞකික සමාපත්ති ඤාණය ද දානාදි වශයෙන් පවතින කම්මසකත ඤාණ ද වේ. සත්‍ය අවසන්කොට ඇති මාර්ග ඤාණය ද ඵල ඤාණය ද ලෝකෝත්තර වේ. මෙම විභාගය නොකොට ඤාණය සත්‍ය අවසන්කොට පමණක් ඇත. අනිත්වා ඤාණ නොවේ. එහෙයින් පෘථග්ජනයාට ඤාණය නැතැයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ හේතුවාදීන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. **පඤ්ඤා** යනාදිය ඤාණ පරියාය වචන දැක්වීම සඳහා

කියන ලදී. එයින් මෙය දක්වයි. ඉදින් ඔහුගේ ඤාණය නැතිද පඤ්ඤාදියද නැත. එහෙත් පඤ්ඤාදිය ඇති ද ඤාණය ද ඇත. කුමක් හෙයින්ද? පඤ්ඤාදිය ඤාණයෙන් අනිකක් නොවේ. **පඨමං ඤාණං** යනාදි සමාපත්ති ඤාණය දැක්වීම සඳහා කියන ලදී. **දානං දදෙය්‍ය** යනාදි කම්මසකත ඤාණයද **දුකඛං පරිජානාති** ලෝකොත්තර මාර්ග ඤාණයම දක්වයි. ලෝකෝත්තර ඤාණයම නොවේ.

නිරයපාල කථා 186

දැන් නිරයපාල කථා නම් වේ. එහි නිරයේ නේරයික කර්මයෙන්ම නිරයාපල රූප වශයෙන් වධ දේ. නිරයපාල සත්ත්වයන් නැත්තාහයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ අන්ධකයින්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට ඉදින් එහි නිරයාපාලයෝ නොවන්නාහු නම් කර්ම කරණයද නොවන්නේය. කරන අය සිටින කල්හිම කිරීම ඇතැයි චෝදනා කිරීමට **නත්ථි නිරයෙසු** යනාදිය කිය. **අත්ථි මනුසෙසසු** ප්‍රත්‍යක්ෂයෙන් දැන්වීමට කියන ලදී. යම්සේ මිනිසුන් සිටින කල්හි කිරීම වේ. මෙසේ එහිද වේ. මෙහි අදහස මෙසේය. **අත්ථි නිරයෙසු** විචාරීම පරවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. **න වෙසසභූනො පිච පෙතනිරාජා** යයි පරවාදියා විසින් ස්ව සමයේ සූත්‍රය ගෙනෙන ලදී. එය වනාහි සාසනාවචර යයි සකවාදියා විසින් අනුදනී. එහි වෙසසභූ යනු එක් දෙවියෙකි. **පෙතනිරාජා** ප්‍රේත විෂයෙහි මහත් ඍද්ධිවන්තයෙකි. **සෝම** ආදිය ප්‍රකටමය. මෙය කියන ලදී. තමාගේ කර්මයෙන් **ඉතො පනුණණං පරලොකං පතනං** පුරුෂයෙක් නැත. මේ වෙස්සභූ ආදීනු විනාශ කරති. යම් කර්මවලින් එහි උපන් හේ ඒ **සකානි කම්මා** සිය කර්මවලින්ම ඔහු **තජ්ජ හනනති** එහි නසති යයි කම්මසසකතය දක්වයි. නිරයපාලයින්ගේ අභාවයක් නොවේ. සකවාදියා වනාහි තමෙනං හිකඛවෙ ගෙනෙන ලද සූත්‍රපද පැමිණවිය යුතු වේ.

තිරච්ඡානගත කථා 187

දැන් තිරච්ඡානගත කථා නම් වේ. එහි දෙවියන් කෙරෙහි ඒරාවණ ආදි දෙවිවරු ඇත් රූප අශ්ව රූප බවට පත්වෙති. තිරිසන්නු එහි

නැත්තාහ. යමෙකුගේ වනාහි තිරිසන් වෙස් ගත් දිව්‍ය පුත්‍රයින් දැක දෙව්ලොව තිරිසනුන් ඇතැයි ලබධි වේ. යම්සේ අන්ධකයින්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. **ඉක්බිති** ඔහුට ඉදින් දේව යෝනියෙහි තිරිසන්නු වෙත් නම් තිරිසන් යෝනියෙහි ද දෙවියන් විය යුතුයයි චෝදනා **කිරීමට අසති තිරච්ඡානගතෙසු** යනාදිය කීය. **එරාවණෝ** යන ප්‍රශ්නයෙහි ඔහුගේ ඇති බවට ප්‍රතිඥාව සකවාදියාගේය. තිරිසන්ගත නොවේ. ඇතුන් බලන්නේ වෙත්යයි චෝදනා කිරීමට කියන ලදී. එහි **යාවසිකා** යනු යව දායකයෝය. **කාරණිකා** යනු ඇත් ඇදුරු ආදිහු. ඔව්හු නා නා විධ කටයුතු කරන්නාහුය. **සන්තකරකා** ඇතුන් ආදීන්ට ආහාර සපයන්නෝ. **න හෙවං** එසේ අකමැත්තේ ප්‍රතික්ෂේප කරයි.

මගඟ කථා 188

දැන් මාර්ග කථා නම් වේ. එහි යමෙකුගේ 'පුබ්බෙව ඛො පනස්ස කාය කම්මං වචීකම්මං සුපරිසුද්ධා හොති' මේ සූත්‍රයම සම්මා වාචා, කම්මන්ත ආජීවයේද චිත්ත විප්‍රයුක්ත බව නිසා නිප්පරියාය වශයෙන් අංග පහම මාර්ගයයි ලබධිය වේ. යම්සේ මහිංසාසකයන්ගේ මෙනි. ඔවුන් සඳහා **පඤ්චංගිකො** යෙනාදිය පරසමය වශයෙන් **කියන** ලදී. පර සමයෙහි සම්මා වාචාදිය මාර්ග අංගයයි ආවේය. රූපබව මාර්ගාංගයක් නොවේ යයි වර්ණනා කරන ලදී. **සම්මා දිට්ඨි මගඟං** යනාදිය මාර්ගාංගයට අමාර්ග නම් නැතැයි දැක්වීමට කියන ලදී. **පුබ්බෙව ඛො පනස්ස** යන සූත්‍රයෙහි පරිසුද්ධ සීල මාර්ග භාවනා වේ. ඉතිරියෙහි නොවේ යයි පැමිණිය යුතු ප්‍රතිවිද්‍යාවේ විසුද්ධ බව දැක්වීමට **කාය කම්මං වචීකම්මං ආජීවො සුපරිසුද්ධා හොති** යන කියන ලදී. මේවා හැර පංචංගිතභාව දැක්වීමක් නොවේ. එයින් කීය. **එවමස්සායං අරියෙ අට්ඨංගිකො මගෙහා භාවනා පරිපූරිං ගච්ඡති** සකවාදියා විසින් ගෙනෙන ලද සූත්‍රය පමුණුවන ලදී.

ඤාණ කථා 189

දැන් ඤාණ කථා නම් වේ. එහි දම්සක් පැවතුමෙහි දොළොස් ආකාර ඤාණය සඳහා දොළොස් වස්තු ඤාණය ලෝකෝත්තරයයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ පුබ්බසේලියන්ගෙ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට ඉදින් ඒ දොළොස් වියෙකු දොළොස්මග නුවණින් විය යුතුයයි චෝදනා කිරීමට දවාදසා යනාදිය කීය. අනෙකා මාර්ගයේ ඒකත්වය සඳහා ප්‍රතික්ෂේප කරයි. එක් එක් සංඝයෙහි සච්ච ඤාණ කිච්ච ඤාණ කත ඤාණ වශයෙන් ඤාණ නානත්වය සඳහා පිළිගනී. දවාදස සොතාපත්ති මග්ග යනාදියෙහි ද මෙම නයයි. **නනු වුත්තං භගවතා** යන සූත්‍රය සමග පෙර අපර ඤාණ නානත්වය දක්වයි. ආර්ය මාර්ගයේ දොළොස් ඤාණ බව නොවේ. එහෙයින් සාධක නොවේ.

විසිවෙනි වර්ගය නිමයි.
සිව්වෙනි පණ්ණාසකය සමාප්තයි.

සාසන කථා 190

දැන් සාසන කථා නම් වේ. එහි සංගීති තුන සඳහා සාසනය අළුත් කරන ලදැයි ද තථාගත සාසනය අළුත් කරන කිසිවෙක් ඇතැයි ද තථාගත සාසනය අළුත් කිරීමට ලැබේ යයි ද යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ ඇතැම් උත්තරාපථකයන්ගේ මෙනි. ඔවුන් සඳහා කථා තුනේම විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. **සතිපට්ඨාන** යනාදි සාසනය නම් සතිපට්ඨානාදි ආර්ය ධර්ම ද කුසලාදී දේශනා ද වේ. එහි යමෙකුගේ භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද සතිපට්ඨානාදිය හැර ඔව්හු අන්‍ය සතිපට්ඨානාදිය කිරීමෙන් අකුසලාදිය හෝ කුසලාදි බව කිරීමෙන් කසිනය නවීකතත නම් වන්නේය. කිම? එය මෙසේ කළේ කවුරුන්ද? මෙසේ කරන කිසිවෙක් ඇත්ද? මෙසේ කිරීමට ලැබේද? ප්‍රශ්න තුනටම චෝදනා පිණිස කියන ලදී. සෙසු සැමතැන පෙළ අනුව යෙදිය යුතුය.

අවිච්චත්ත කථා 191

දැන් අවිච්චත්ත කථා නම් වේ. එහි යම් පුද්ගලයෙකුගේ යම් ධර්මයක් වර්තමාන වේද, හේ එයින් යුක්ත වේ යනු ස්ව සමයෙහි නිශ්චයයි. යම්හෙයකින් පෘථග්ජනයා විසින් තෙභූමික ධර්ම අවබෝධ නොකරන ලදී. එහෙයින් හේ ඒකක්ෂණයෙහිම සියළු තෙධාතු ධර්මවලින් යුක්ත යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ ඔවුන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාගේය. ප්‍රතිඥාව අනෙකාගේය. එසෙසහි යනාදි සියළු ස්පර්ශාදීන්ගේ ඒකක්ෂණයේ පැවැත්මේ දෝස දැක්වීම සඳහා කියන ලදී. සෙසු සියළු තැන ප්‍රකටය.

සඤ්ඤාජන කථා 192

දැන් සංයෝජන කථා නම් වේ. එහි යම්හෙයකින් රහතන් වහන්සේ හැම බුද්ධ විෂයම නොදනිති. එහෙයින් උන්වහන්සේට එහි අවිජ්ජා විචිකිච්ඡා අප්‍රහීන විය යුතුය යන සංඥාවෙන් කිසි සංයෝජනයක් ප්‍රහානය නොකොට රහත්බවට පැමිණියේ යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ මහා සංඝිකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. **අත්ථි කිඤ්චි සකකාය දිට්ඨි** යනාදිය රහතුන්ගේ සියළු සංයෝජන ප්‍රහානය දැක්වීම සඳහා කියන ලදී. **සච්චං බුද්ධ විසයං** යන ප්‍රශ්න දෙකේ රහතුන් සර්වඥ ඥාණ භාවයෙන් ප්‍රතිසේධනය කරන ලදී. අවිජ්ජා විචිකිච්ඡාවල අප්‍රහානයෙන් නොවේ. අනෙකා ඒවායේ අප්‍රහීනතා සඳහා **තෙනහී** යයි ලබ්ධිය පිහිටුවයි. එය අනුවණින් පිහිටුවන ලද බැවින් නොපිහිටියේම වේ.

ඉද්ධි කථා 193

දැන් ඉද්ධි කථා නම් වේ. ඉද්ධි නම් මෙය කිසිතැන සමෘද්ධ වේ. කිසිතැන සමෘද්ධ නොවේ. අනිත්‍යාදියේ නිත්‍යාදි කරණය ඒකාන්තයෙන් සමෘද්ධ නොවේ. සභාග සන්තතිය විසභාග සන්තති කිරීම හෝ සභාග සන්තති වශයෙන් ම චිර කලක් පැවැත්වීම හෝ යමෙකුගේ ප්‍රයෝජනය සඳහා කරනු ලැබේද, ඔවුන්ගේ ප්‍රත්‍යාදි කරුණු නිසා කිසිවක් සමෘද්ධ

වේ. භික්ෂූන්ගේ ප්‍රයෝජනය සඳහා පැන් ගිතෙල් කිරි ආදිය කිරීම මෙන් මහාධාතු නිදහසේ පහන් ආදියේ බොහෝ කලක් පැවැත්වීම මෙන් ද මෙය ස්ව සමයෙහි සනිටුහනය. ආයුෂ්මත් පිළිඳවච්ඡ තෙර රජුගේ මාළිගය රන් වේවයි අදිටන් කෙළේය. ඒ නිසා අධිපපාය ඉද්ධි ඇතැයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ අන්වකයන්ගේ මෙනි. ඔවුන් සඳහා **අත්ථි අධිපපාය ඉද්ධි** යයි විචාරීම සකවාදියාටය. එහි **අධිපපාය ඉද්ධි** යනු අභිප්‍රායෙන් ඉද්ධි වේ. අදහසෙහි සමෘද්ධිය වන ඍද්ධිය යන අර්ථය වේ. **ආමනනා** යයි ලබ්ධිය මත සිට ප්‍රතිඥාව පරවාදියාටය. ඉක්බිති ඔහුට අනිත්‍යාදියේ නිත්‍ය බව යෙදීමට **නිචච පණණා රුකඛා හොනතු** යනාදිය කීය. මෙහි සෙස්ස පැහැදිලිය. ලබ්ධිය පිහිටුවීමේ **සුවණණා ච පනාසි** යයි රජුගේ පින නිසා විය. හුදෙක් තෙරුන්ගේ අධිපපායෙන්ම නොවේ. එහෙයින් සාධක නොවේ.

බුදධ කථා 194

දැන් බුද්ධ කථා නම් වේ. එහි ඒ ඒ කාලවල ශරීර වෙනස්බව ආයු වෙනස්බව ප්‍රභා වෙනස්බව හැර සෙසු බුද්ධ ධර්මයෙන් බුදුවරුන්ගේ බුදුබව කෙරෙහි හීන අතිරේකතා නම් නැත. යමෙකුගේ වනාහි අවිශේෂයෙන් ඇතැයි ලබ්ධි වේ. යම්සේ අන්ධකයන්ගේ මෙනි. ඔවුන් සඳහා **අත්ථි බුදධානං** යයි විචාරීම සකවාදියාගේය. ප්‍රතිඥාව අනෙකාගේය. ඉක්බිති ඔහු බුද්ධ ධර්මයෙහි යෙදවීමට **සතිපටඨානතො** යයි කීය. අනිකා ඒ ආදි වශයෙන් හීනනති රෙකතා නොදක්නේ ප්‍රතික්ෂෙප කෙරේමය.

සබබදිසා කථා 195

දැන් සබබදිසා කථා නම් වේ. එහි සතර දිසාවල යට උඩ වටේ ලෝක ධාතුවල සන්නිවාස වේ. සියළු ලෝකධාතුවල බුදුවරු සිටිති. යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ මහා සංඝිකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. **පුරතථිමාය** යයි විචාළේ ශාක්‍යමුනි සඳහා ප්‍රතික්ෂෙප කරයි. නැවත විචාළේ ලබ්ධි වශයෙන් අන්‍ය ලෝකධාතුවේ සිටීම සඳහා පිළිගනී. **කිං නාමො සො භගවා** යනාදිය ඉදින් ඔබ නොදන්නෙහිද? නාමාදි වශයෙන් ඔහු කියන්න යයි චෝදනාව පිණිස කියන ලදී. මේ උපායෙන් සියළු තැන අර්ථ දතයුතුය.

ධම්ම කථා 196

දැන් ධම්ම කථා නම් වේ. එහි යම්හෙයකින් රූපාදිය රූපාදි ස්වභාවයෙන් නියතය. එය ස්වභාවය අත් නොහරී. එහෙයින් සියළු ධර්ම නියත යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ අන්ධකයින්ගේ ද ඇතැම් උත්තරාපථකයන්ගේ ද මෙනි. ඔවුන් සඳහා **සබ්බෙ ධම්මා** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට ඉදින් ඔබගේ නියතය, මිච්ඡත්ත නියතය හෝ සම්මත්ත නියතය හෝ වේද, මෙයින් අන්‍ය වූ නියතයක් නම් නැතැයි චෝදනා කිරීමට **මිච්ඡත්ත නියතා** යනාදිය කීය. එහි ප්‍රතික්ෂේපය ද ප්‍රතිඥාව ද පරවාදියාටය. **රූපං රූපත්තෙන** යම් අර්ථයකින් නියත යයි කියයි. ඒ අනුව චෝදනා කිරීමට කියන ලදී. එහි අදහස මෙසේය. රූපය රූපාර්ථයෙන් නියතයයි රූපය රූපයම වේ. වේදනාදි ස්වභාවයෙන් යයි නොකිව යුතුය. මෙයින් අන්‍යකාරයකින් ද නොකිව යුතුය. කුමක් හෙයින්ද, රූපාර්ථයෙන් අන්‍ය රූප නැති නිසා. රූප ස්වභාවය රූපාර්ථයයි. රූප ස්වභාවය ද රූපයම වේ. රූපයෙන් අනිකක් නොවේ. වේදනාදියෙන් වනාහි නා නා පැණවීම් සඳහා මේ ව්‍යවහාරයම වේ. එහෙයින් රූපය රූපාර්ථයෙන් නියතයයි කියමින් රූපය නියත යයි කියන ලද්දේ වේ. නියතය මිච්ඡත්ත නියතය හෝ සම්මත්ත නියතය වන්නේය. මෙයින් අන්‍ය වූ නියමයක් නම් නැත. ඉක්බිති කුමක් හෙයින් පිළිගනීද, අර්ථ අන්තර වශයෙනි. **රූපං රූපත්තෙන නියතං** යන මෙහි රූපය රූපයම වේ. මේ අර්ථයෙන් වේදනාදි ස්වභාවය නොවේ. එහෙයින් පිළිගනී. මෙයින් අන්‍ය වූ නියත බවක් නැත. නැවත ඒ නයින්ම චෝදනා කිරීමට **මිච්ඡත්ත නියතං** යනාදිය කීය. ඒ සියල්ල පැහැදිලි වේ. එයින් රූපං යන ලබ්ධිය ද අනුවණින් පිහිටුවන ලද බැවින් නොපිහිටියේම වේ.

කම්ම කථා 197

දැන් කම්ම කථා නම් වේ. එහි යම්හෙයකින් දිට්ඨධම්ම වේදනාදිය දිට්ඨ ධම්ම වේදනාදියෙන් නියත වේ. එහෙයින් සියළු කර්ම නියත යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ ඔවුන්ගේම මෙනි. ඔවුන් සඳහා විචාරීම

සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. දිට්ඨධම්ම වෙදනිය යෝන නියතං යන මෙහි දිට්ඨධම්ම වෙදනිය දිට්ඨධම්ම වෙදනියම වේ. ඉදින් මෙ ආත්මයේම විපාක දීමට හැකිවේ නම් දෙයි. නොඑසේ නම් අහෝසි කර්ම නම් වේයයි මෙම අර්ථය සඳහා ප්‍රතිඥාව සකවාදියාටය. මිථ්‍යත්ත සම්මත්ත නියාම වශයෙන් මෙය අනියතම වේ. සියල්ල යට කියන ලද නයින්ම දතයුතුය.

එක් විසිවැනි වර්ගය නිමියේය.

පරිනිබ්බාන කථා 198

දැන් පරිනිබ්බාන කථා නම් වේ. එහි යම්හෙයකින් රහතන් වහන්සේ සර්වඥ විෂයෙහි සංයෝජන අප්‍රහීනවම පිරිනිවන්පාති. එහෙයින් කිසියම් සංයෝජන ඇතිවම පිරිනිවන් පාන්නේ යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ අන්ධකයින්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. මෙහි සෙස්ස යට කියන ලද නය අනුවය.

කුසල චිත්ත කථා 199

දැන් කුසල චිත්ත කථා නම් වේ. එහි යම්හෙයකින් රහතන් වහන්සේ සිහිය විපුලභාවයට පැමිණ පිරිනිවන් පාන්නේ ද? සති සම්පත්තියෙන්ම පිරිනිවන්පාති. එහෙයින් කුසල සිත පිරිනිවන්පාන්නේ යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ අන්ධකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට යම්හෙයකින් කුසල සිත නම් පුඤ්ඤාභිසංඛාර අභිසංඛරණ වශයෙන් වේ. එහෙයින් ඒ අර්ථයෙන් චෝදනා කිරීමට **අරහා පුඤ්ඤාභිසංඛාරං** යනාදිය කීය. මෙහි සෙස්ස පෙළ අනුව පැමිණවිය යුතුය. **සතෝ සම්පජානෝ** යන මෙය ජවන ක්ෂණයෙහි කිරිය සති සම්පජන්‍ය වශයෙන් නුමුළා මරණ දැක්වීම සඳහා කියන ලදී. කුසල සිත දැක්වීම සඳහා නොවේ. එහෙයින් අසාධක වේ.

ආනෙඤ්ජ කථා 200

දැන් ආනෙඤ්ජ කථා නම් වේ. එහි භාග්‍යවතුන් වහන්සේ චතුර්ථ ධ්‍යානයෙහි සිටියේ පිරිනිවන්පෑහයි සලකා රහතන් වහන්සේ ආනෙඤ්ජයෙහි සිට පිරිනිවන්පාන්නේ යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ ඇතැම් උත්තරාපථකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. **පකති චිත්තෙ** යනු භවංග සිතෙහි. සියළු සංඥී සත්ත්වයෝ භවංග සිතේ සිටියාහු භවංග අවසානයේ චුති සිතින් කළුරිය කරති. මෙසේ ඔහුට මේ අර්ථයෙන් චෝදනා කිරීමට මෙසේ කීය. එහි චතුවෝකාර භවයෙහි රහතන් වහන්සේ ගේ ප්‍රකෘති සිත ද ආනෙඤ්ජ වේ. මේ ප්‍රශ්නය වනාහි පංචවෝකාර භව වශයෙන් උපුරන ලදී. නො වත රෙ වත්තබ්බෙ යයි ද කීය. මෙහි සෙස්ස පැහැදිලිය.

ධම්මාභිසමය කථා 201

දැන් ධම්මාභිසමය කථා නම් වේ. එහි අතීත භවයෙහි සෝවාන් වූයේ මව්කුස වැස නික්මෙන්නා දැක ගැබ වාසය කරන්නේ ධර්මාවබෝධය ඇතැයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ ඇතැම් උත්තරාපථකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. මෙහි සෙස්ස පෙළ අනුව පැමිණවිය යුතු. **සුපිනගතසස චිතතං අබ්බොහාරිකං** යන මෙය පැමිණීම සඳහා කියන ලදී. සුපිනගත වූවහු ප්‍රාණඝාතාදි වශයෙන් අකුසල සිත් පවතී. වස්තු විකොපනය නැතැයි එහි ආපත්ති පැණවීමට නොහැකි වේ. මෙම කරුණින් ඒ අබ්බොහාරිකය අව්‍යාකෘත වේ.

ආසෙවන පච්චය කථා 204

දැන් ආසෙවන පච්චය කථා නම් වේ. එහි යම්හෙයකින් සියළු ධර්ම ක්ෂණික වේ. කිසිවක් මොහොතකුදු සිට ආසේවන ප්‍රත්‍යයෙන් ආසේවනය වන දහමක් නැත. එහෙයින් කිසි ආසේවන ප්‍රත්‍යයෙක් නැත. ආසේවන ප්‍රත්‍යයෙන් උපන් කිසි දහමක් නැතැයි යමෙකුගේ

ලබ්ධි වේ. යම්සේ ඔවුන්ගේමය. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට සූත්‍ර වසයෙන්ම දැනවීමට **නනු වුත්තං භගවතා පාණාතිපාතො** යනාදිය ගෙනෙන ලදී. ඒ සියල්ල පැහැදිලිය.

ඛණික කථා 205

දැන් ක්‍ෂණික කථා නම් වේ. එහි යම්හෙයකින් සියළු සංඛත දහම් අනිත්‍ය වේ. එහෙයින් ඒක චිත්ත ක්‍ෂණිකමය. සමාන අනිත්‍යයෙන් එක් දහමක් වහා බිඳේ. එක් දහමක් කලක් පැවත බිඳේ. මෙහි නියමය කුමක්දැයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ පුබබසේලිය අපරසේලියන්ගේ මෙනි. ඔවුන් සඳහා **එක චිත්තකඛණිකා** යයි විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. **චිත්තෙ මහා පයවි** යනාදියෙහි ඒවායේ එබඳු සටහන් නොදක්නේ ප්‍රතික්‍ෂෙප කරයි. **චකඛායතනං** යනාදිය ඉදින් සියල්ල ඒක ක්‍ෂණික වන්නේ නම් චකඛායතනාදිය චකඛු විඤ්ඤාණාදිය සමග ඉපදී නිරුද්ධ වන්නේ යයි චෝදනා කිරීමට කියන ලදී. අනෙකා මව්කුසට ගියහුගේ විඤ්ඤාණ උත්පත්තිය සඳහා ප්‍රතික්‍ෂේප කරයි. පැවතීම සඳහා ලබ්ධි වශයෙන් පිළිගනී. මෙහි සෙස්ස පැහැදිලිය. **තෙනනි එකචිත්තකඛණිකා** යයි යම්හෙයකින් නිත්‍ය වේද එහෙයින් ඒක චිත්ත ක්‍ෂණිකයයි තමාගේ රුචියෙන් හේතු කියයි. එය නොකියන ලද සමාන වේමය.

දෙවිසි වැනි වර්ගය නිමියේය.

එකාධිපපාය කථා 206

දැන් එකාධිපපාය කථා නම් වේ. එහි කරුණාවෙන් එකම අභිප්‍රාය වේවයි සසරදී එක්වන්නෙමුයි ස්ත්‍රිය සමග බුද්ධ පූජාදිය කොට ප්‍රාර්ථනා වශයෙන් එකම අභිප්‍රාය වේවයි මෙබඳු වූ ස්ත්‍රී පුරුෂ දෙදෙනාම එකම අභිප්‍රාය ඇති මෛථුන ධර්ම සේවන කටයුතු යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ අන්ධකයන්ගේ ද වෛතුල්‍යයන්ගේ ද මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. මෙහි සෙස්ස පෙළ අනුවම පමුණුවා ගතයුතුය.

අරහන්ත වණ්ණ කථා 207

දැන් අරහන්ත වණ්ණ කථා නම් වේ. එහි යහපත් ඉරියව් සහ ආකල්ප ඇති පාප භික්ෂූන් දැක, අමනුෂ්‍යයෝ රහත් වෙසින් මෛථුන ධර්ම සේවනය කරතියි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ ඇතැම් උත්තරා පථකයන්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. මෙහි සෙස්ස පැහැදිලිය.

ඉස්සරියකාමකාරිතා කථා 208

දැන් ඓශ්වර්ය කාමකාරි බව කථා නම් වේ. බෝධිසත්ත්වයා ඡද්දන්ත ජාතකාදියෙහි ඓශ්වර්ය කාමකාරි බව නිසා විනිපාතයට යයි. ගර්භ සයනයට බැසගනී. දුෂ්කර ක්‍රියා කළේය. අනුන් නොතැවීය. අන්‍ය ශාස්තෘන් කෙනෙකුන් උදෙසා යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ අන්ධකයින්ගේ මෙනි. ඔවුන් සඳහා විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. සෙස්ස පළමු කථාවෙහි පැහැදිලි අරුත් වේ. දෙවන කථාවෙහි ඉදධිමා යයි ඉදින් ඓශ්වර්ය කාමකාරි හේතුබවට යන්නේ නම් සෘද්ධියෙන් යන්නේය. කර්ම වශයෙන් නොවේ යයි චෝදනා කිරීමට කියන ලදී. අනෙකා වනාහි පළමුවන ප්‍රශ්නයෙහි භාවනාමය සඳහා ප්‍රතික්ෂේප කරයි. දෙවන ප්‍රශ්නයෙහි පුන්‍ය සෘද්ධි සඳහා පිළිගනී. තුන්වන කථාවේ ඓශ්වර්ය කාමකාරි හේතුබව නම් දුෂ්කර කාර්යයන් මිථ්‍යා දෘෂ්ටියෙන් කරනු ලැබීමය. ඉදින් හේ එය කරන්නේ නම් ශාස්වතාදියට ද ගන්නේ යයි චෝදනා කිරීමට සසසතෝ ලොකෝ යනාදිය කියන ලදී. සතරවන කථාවද මෙම නය ම වේ.

රාගපතිරූපකාදි කථා 209

දැන් රාගපතිරූපකාදි කථා නම් වේ. එහි මෛත්‍රී කරුණා මුදිතා සඳහා රාගය නොව රාග ප්‍රතිරූපකයක් ඇතැයිද ඊර්ෂ්‍යා, මසුරු කුකුස සඳහා ද්වේශය නොව දේශ ප්‍රතිරූපයක් ඇතැයිද හස්තුප්පාද සිත සඳහා මෝහය නොව මෝහ ප්‍රතිරූපකයක් ඇතැයිද දුශ්ශීල පුද්ගලයාට නිග්‍රහයත්

ප්‍රියශීලී භික්ෂූන්ට අනුග්‍රහයන් පාපයට ගැරහීමත් යහපතට ස්තුතියත් ආයුෂ්මත් පිළින්දවච්ඡ තෙරුන්ගේ වසල වාදයත් භාග්‍යවතුන්ගේ කෙලතොල් වාදයත් මොඝපුරිස වාදයත් සඳහා කෙලෙස් නොව කෙලෙස් ප්‍රතිරූපක වේයයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ අන්ධකයින්ගේ මෙනි. ඔවුන් සඳහා සියළු කථාවල විචාරීම සකවාදියාටය. ප්‍රතිඥාව අනෙකාටය. ඉක්බිති ඔහුට යම්හෙයකින් එසසාදි ප්‍රතිරූපකයාගේ එසසාදියෝ නම් නැත. එහෙයින් රාගාදි ප්‍රතිරූපක රාගාදියද නැතැයි චෝදනා කිරීමට **අත්ථි න එසෙසා** යනාදිය කීය. අනිකා ඒවායේ අභාවයෙන් ප්‍රතික්ෂේප කරයි. සෙසු සියළු තැන නොගැඹුරු අරුත් වේමය.

අපරිනිපඵන්න කථා 210

දැන් අපරිනිපඵන්න කථා නම් වේ. එහි 'දුකඛමෙවහි සමෙහානති දුකඛං තිටඨති චෙති ච, නාඤඤත්‍ර දුකඛා සමෙහාති නාඤඤං දුකඛා නිරුජඣති' යන වචනය නිසා දුකම පරිනිෂ්පන්නය. සෙසු ස්කන්ධ. ආයතන, ධාතු, ඉන්ද්‍රිය දහම් අපරිනිෂ්පන්න යයි යමෙකුගේ ලබ්ධිය වේ. යම්සේ ඇතැම් උත්තරාපථකයන්ගේ ද හේතුවාදීන්ගේ ද මෙනි. ඔවුන් සඳහා **රූපං අපරිනිපඵන්නං** යයි විචාරීම සකවාදියාගේය. ප්‍රතිඥාව පරවාදියාගේය. ඉක්බිති ඔහුට ඉදින් රූපය අපරිනිෂ්පන්න වේ නම් අනිත්‍යාදි ස්වභාවය නොවන්නේ යයි චෝදනා කිරීමට **රූපං න අනිචචං** යනාදිය කීය. අනිකා එබඳු රූප වූ රූපයක් නොදක්නේ ප්‍රතික්ෂේප කරයි. සකවාදියා **නනු රූපං අනිචචං** යනාදි වචනයෙන් ඔහුගේ එක් ලබ්ධියක් ප්‍රතික්ෂේප කර දෙවැන්න විචාරන්නේ **දුකඛඤඤත්‍ව පරිනිපඵන්නං** යනාදිය කීය. ඉක්බිති ඔහුගේ ඒ ලබ්ධිය ද ප්‍රතික්ෂේප කිරීමට **නනු යදනිචචං** යනාදිය කීය. එහි අදහස මෙසේය. හුදෙක් නොව පළමු සත්‍ය දුක්මය. යම්කිසිවක් අනිත්‍ය නම් එය දුක්ම වේ. රූපය ද අනිත්‍යය, එහෙයින් එය ද පරිනිෂ්පන්න (හේතුවලින්) ය. මෙසේ ඔබ යම් රූපයක් අපරිනිෂ්පන්න යයි දුකම පරිනිෂ්පන්න යයි ද දන්නෙහිද එය **නො වත රෙ වත්තබෙබ දුකඛඤඤත්‍ව පරිනිපඵන්නං** යයි. වේදනාදි මූලික යෝජනාදියෙහි මෙම නයම වේ. ධම්මායතන ධම්ම ධාතුවල වනාහි නිවන හැර සෙසු දහම්වල වශයෙන් අනිත්‍යතාව දතයුතුය. ඉන්ද්‍රියන් අනිත්‍යම වේ.

මෙපමණකින්.....

පණ්ණාසක සතර - යුත්වන තෙ විසි වගකින්
සඟ හා සවිකතා - දහයෙන් උපරි දෙ සියෙන්

කතාවත් පකරණ - කතා මගැ තෙරපත් වූ
දෙසී මුනිසඳ එහි - අරුත් වැනුමද නිමවී

තෙළෙසින් පමණ වූ - බණවර විසින් පෙළෙහී
සැකසූ මවිසින් එය - තිර පැවතුමට දහමේ

පැමිණි යම් පින ඉන් - සතරාමර ලෝකයා
දැමිරදුන් සදහම් - රසය විඳගනු මැනවී

තෙ සිව් පස් යන ගත් - විජම් පිටකය හොබනා
'පරමත් දීපනිය' - අරුත් වැනුමට පෙළබස්

කළ සිහළ පෙරලිය - බාලසූරිය සැදැහෙන්
ඉන් ලද යම් පිනක් - සව් සතුනට ම වේවා

පරමත්ථ දීපනී නම් පඤ්චපකරණට්ඨ කථාවේ
කථාවත්ථුපකරණ අත්ථවණ්ණනාවට
කළ සිංහල පරිවර්තනය
නිමි.



THE BO-TREE AT ANARAJAPOORA.

ටෙනන්ට් 1859

භදන්ත බුද්ධඝොෂාචාර්‍යපාදයන් අනුරාධපුර
ශ්‍රී මහා බෝධීය අසල ප්‍රදේශයෙහි වැඩවසමින්
සිංහලඨකථා පාලියට පරිවර්තනය කළ බව
බොහෝදෙනාගේ විශ්වාසයයි

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.
දුරකථන: 2734256, 2728468, 2726234 ෆැක්ස්: 2736737
විද්‍යුත් තැපෑල: bcc456@sltnet.lk, info@buddhistcc.com
www.buddhistcc.com

ISBN 978-955-1604-28-8